හදනතාචරිය ධම්මපාල මහා සථවිරපාදයන් විසින් විරචිත

නෙත්තිප්පකරණට්ඨකථා

(සිංහල පරිවර්තනය)



නෙත්තිපපකරණට්ඨකථා සිංහල පරිවර්තනය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි, නෙත්තිපපකරණට්ඨ කථා දෙවෙනි කොටස සිංහලට පරිවර්තනය කරන ලද්දේ පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි විසිනි. උන්වහන්සේ යටගම ශ්‍රී නාගවනාරාමාධිපති සීනාදී සිවුනිකෝරළයේ ප්‍රධාන සංඝනායක විනයාචාර්ය පූජ්‍ය නාලපහ ඉන්දවිමල නායක ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යචරයෙකි. උන්වහන්සේ සසුන්ගත වූයේ 1991 දීය.

උන්වහන්සේ හඟුරන්කෙත මාදන්වල ශ්‍රී ධර්මෝදය පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය ලබා අනතුරුව 1999 වසරේදී ප්‍රාචීන පණ්ඩිත විභාගයෙන් දිවයිනෙන්ම ප්‍රමුඛයා ලෙස භාෂානුයෙන් උසස් ලෙස සමත් වූ රාජකීය පණ්ඩිත උපාධියට හිමිකම් කිහ.

2005 වසරේදී ජේරාදෙනිය සරසවියෙන් ශාස්ත්‍රවේදී පාලි ගෞරව (ප්‍රථම පන්තිය) උපාධිය හිමිකර ගත්හ. උපාධිය හිමිකරගත් ඒ හිමියෝ ජේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ කථිකාචාර්ය වරයෙකි. දැනට ජේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා පර්යේෂණ කටයුතුවල යෙදේ.

වේයන්ගොඩ මාබෝදලේ යටගම ශ්‍රී නාගවනාරාම විහාරවාසී ඒ හිමියෝ දෙහිවල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තන මණ්ඩලයේ ද සේවය කරති. ශාස්ත්‍රීය පර්යේෂණ පොතපතලියන ඒ හිමියෝ බෞද්ධ විනය කර්ම, න්‍යාය බින්දු (පුනර්සංස්කරණ) ආදී ග්‍රන්ථ කිපයකම කතුවරයාණෝද වෙති.

විශාරද දැනුමක්, නිවහල් භාෂා ශම්ප්‍රදායක්ද හිමි විජිත ධම්ම ස්ථවිරයෝ වර්තමාන සංඝ සමාජයට මහඟු සම්පතකි.

Vol XXI

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින්

විරචිත

නෙත්තිපපකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 35

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින්

විරචිත

නෙත්තිපපකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

මැදගම්පිටියේ විජිතධම්ම ස්ථවිර

යටගම ශ්‍රී නාගවනාරාම පුරාණ විහාරවාසී

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ

කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති.

අධීක්ෂණය

පූජ්‍ය හත්තොටුවේ ඉන්දරතන ස්ථවිර

බෙලිඅත්ත/නිහිළුම, සිරි ධම්මානන්ද පරිවෙනාධිපති

රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, ත්‍රිපිටකාචාර්ය,

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256 ෆැක්ස්: 2736737

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

නෙතතිපපකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-38-7

පරිගණක අකුරුකරණය
උපමාලි කුලසේකර - කවුගස්තොට.

පිටකවරය
සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය
අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නො. 342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.
දුරකථනය: 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැනිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘත්තාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජීවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලි පුරිගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පටියන හෝ මයුර රූප පටියන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හිද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශුතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

අටුවා විස්තරය

විනය පිටකය

	පෙළ	අටුවාව	කර්තෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාලි	1 ආණා දෙසනා සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	2 පාචිත්තිය පාළි	2 යථාපරාධ සාසන විනය අට්ඨකථා		
බන්ධක	3 චුල්ල වග්ග පාළි	3 සංවරසංවර කථා		
	4 මහාවග්ග පාළි			
පරිවාර	5 පරිවාර පාළි			
		භික්ඛුපාතිමොක්ඛ කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
		භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකට්ඨ කථා)		

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන	සම්මොහ විනොදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	3 නාමරූප පරිච්ඡේද කථා			
3 කථාවත්තුප්පකරණ			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ				
5 ධාතුකථාප්පකරණ	පරමත්ථදීපනී			
6 යමකප්පකරණ	පඤ්චප්පකරණට්ඨකථා			
7 පට්ඨානප්පකරණ				

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 වොහාරා දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
3 සංයුක්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
4 අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
5 බුද්දක නිකාය			
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 ධම්මපද	ධම්මපදට්ඨ කථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
3 උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
6 විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
7 පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
8 රේර ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
9 රෙරී ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
10 ජාතක	ජාතකට්ඨකථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
11 නිද්දේස (චුල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය 6වන ශ.ව.
12 අපදාන (ථේර-රෙරී)	විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය 7වන ශ.ව.
13 පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී		බුද්ධදත්ත හිමි 5වන ශ.ව.
15 චරියාපිටක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
	විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා		ධර්මපාල ආචාර්ය 5වන ශ.ව.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා		ආනන්ද වනරතන 8වන ශ.ව.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසිනි.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - පේතවත්ථු - තෙර තෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක** මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනි" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනිනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදී. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

රාජකීය පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

සංඥාපනය

1. නෙත්තිප්පකරණය

පශ්චාත් ත්‍රිපිටක සාහිත්‍යයට අයත් ඉතා වැදගත් ධර්ම, ග්‍රන්ථයක් සේ නෙත්තිප්පකරණය හැඳින්විය හැකිය. නෙත්තිප්පකරණ යන තැන ඇති නෙත්ති ශබ්දයෙහි අර්ථ කිහිපයකි. නෙත්ති අටුවාවේදී ධම්මපාල හිමියන් ඉදිරිපත් කර ඇති ප්‍රකටතර අර්ථය සද්ධර්ම නයනාර්ථයයි. එහි අදහස භික්මවිය යුතු ජනයා නවවිධ සද්ධර්මය වෙත පමුණුවන හෙයින් නෙත්ති නම් වන බවයි. විශේෂයෙන්ම එබඳු පුද්ගලයන්ව එලෙස සද්ධර්මයට පමුණුවන හාර, නය, පට්ඨාන යන ධර්ම සමුදාය මේ නෙත්ති යන්නෙන් ගණන් ගැනෙයි. එම හාර, නය ආදිය දේශනා කළ ප්‍රකරණය නෙත්තිප්පකරණ නමින් හැඳින්වේ.

සාම්ප්‍රදායික පිළිගැනීම අනුව මෙහි කතුවරයා මහාකච්චායන මහරහතන් වහන්සේය. උන්වහන්සේ නවාංග සංඛ්‍යාත බුද්ධ වචනය අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද විභාග කරමින් නෙත්තිප්පකරණය දේශනා කොට තිබේ.

හාර - නය - පට්ඨාන වශයෙන් මෙහි කොටස් තුනකි. එමෙන්ම සංගහ වාර හා විභාග වාර වශයෙන් වාර දෙකකි. එයින් සංගහ වාරයට අයත්ව ඇත්තේ ගාථා පසකි. විභාග වාරය තුළ උද්දේස-නිද්දේස හා පටිනිද්දේස යන කොටස් තුන දක්නට ලැබේ. ඒවායින් පටිනිද්දේස වාරය සිව්වැදෑරුම් වේ. හාරවිභංගවාර, හාර සම්පාතවාර, නය සමුට්ඨාන වාර හා සාසනපට්ඨාන වාර වශයෙනි.

2. නෙත්තිප්පකරණ අටුවාව

නෙත්තිප්පකරණයට ලියන ලද අටුවාව නෙත්තිප්පකරණට්ඨ කථා නමින් සම්භාවිතය. මෙම අර්ථකථාව ද්විතීය අර්ථකථාචාරී හදන්ත ධම්මපාල මාහිමියන් අතින් සම්පාදනය වූවකි. ග්‍රන්ථාවසාන ගාථාවල දැක්වෙන ආකාරයට දඹදිව නාග පටුනෙහි වූ ධර්මාශෝක මහාරාජ විහාරයෙහි වාසය කරමින් කටයුතු කළ කලෙක උන්වහන්සේ මෙය

සම්පාදනය කර තිබේ. කෘතිය අවසානයේම ඇති කර්තෘ සන්දර්ශන වාක්‍යයෙහි සඳහන්ව ඇත්තේ උන්වහන්සේ බදරතීර්ථවාසී බවයි. ග්‍රන්ථාවසාන ගාථාවල ඇති නාග පටුන හා බදරතීර්ථය යනු එකක්දැයි නොදනිමු.

ධම්මපාල හිමියන් නෙත්ති අටුවාව රචනා කරන ලද්දේ සද්ධර්ම නෙත්තියේ චිරස්ථිතිය කැමැත්තෙන් ධම්මරක්ඛිත නම් තෙරුන් විසින් කරන ලද ආරාධනය අනුවය. නවංග සාසනයේ අර්ථවර්ණනාව වූ නෙත්තිය ගැඹුරු ඥානයකින් අවබෝධ කරගත යුතු නිසා එය ලිහිල් කරවීම පිණිස තමා එහි අර්ථ සංවර්ණනය කරන බව කතුවරයා ප්‍රකාශ කර තිබේ. එය ඔහුගේ අරමුණ ලෙස වටහාගත යුතුය. කතුවරයාගේම වචන අනුව මෙහි ග්‍රන්ථ ප්‍රමාණය සත්විසි බණවරකි.

නෙත්තිප්පකරණ අටුවාව සම්පාදනය කිරීමේදී ධම්මපාල හිමියන් විසින් අනුගමික ක්‍රමවේදය ද ඉතා වැදගත්ය. ග්‍රන්ථාරම්භක ගාථාවන්හිදී දක්වා ඇති පරිදි දීඝ ආදී නිකාය-ග්‍රන්ථ පස සමගත් පේටකෝපදේශය සමගත් හැකි පරිදි සන්සන්දනය කොට මහාවිහාරවාසී මතය නො ඉක්මවමින් උන්වහන්සේ මේ කෘතිය රචනාකොට තිබේ. ප්‍රමාද සටහන් දුරුකොට පාළි පෙළත් මනාව ආශ්‍රය කරගනිමින් උපදේශ විභාවනය කරමින් මෙම නෙත්ති අර්ථ වර්ණනාව කරන බවට ධම්මපාල හිමියෝම පොරොන්දු වෙති.

සාම්ප්‍රදායික පිළිගැනීම වන නෙත්තිප්පකරණය මහාකච්චායන තෙරුන්ගේ නිර්මාණයක්ය යන්න නෙත්ති අටුවාව ද පිළිගෙන තිබේ. එය මහා ශ්‍රාවක භාෂිතයක් පමණක්ම යන පිළිගැනීමෙන් නො නවතින නෙත්ති අටුවාව විශේෂයෙන්ම සඳහන් කරනුයේ මෙය බුදුරජාණන් වහන්සේ විසින් අනුමෝදන් වූ බවයි. එයින් නෙත්තිප්පකරණයේ විශ්වසනීය භාවය තහවුරු වන බව නෙත්ති අටුවාකාර ධම්මපාල හිමියන් විශ්වාස කළා විය හැකිය.

නව්‍ය වූ අර්ථ

නෙත්තිප්පකරණ අටුවාව විසින් නෙත්තිප්පකරණයට නව්‍ය වූ, අර්ථයක් ඉදිරිපත් කර ඇති බව කිවයුතුය. එනම් 'නවංගස්සපි වණ්ණනා' යන්නයි. ධම්මපාල හිමියන් නෙත්තිප්පකරණය හඳුනාගෙන ඇත්තේ

සුත්ත, ගෙය්‍යාදී නවංග බුද්ධවචනයේ අර්ථ වර්ණනාව ලෙසයි. ග්‍රන්ථාරම්භ ගාථාවලදී සේම නවවිධ සුත්තන්ත පරියෙට්ඨි යන ගාථා කොටසට අර්ථ සැපයීමේ දී ද එම අදහස මතු කරලීමට ධම්මපාල හිමියෝ උත්සාහවත් වී තිබේ.

නෙත්ති ශබ්දයට අර්ථ සැපයීමේදී ඉදිරිපත් කළ සද්ධර්ම නයනාර්ථය ද ඉතා වැදගත්ය. හික්මවිය යුතු සත්ත්වයන් ආර්ය ධර්මයට ගෙනයන නිසා නෙත්ති නම් වන බව ඉන් ප්‍රකාශිතය. ඊට අමතරව ධර්මකථිකයෝ නෙත්තිප්පකරණය උදව් කරගෙන සත්ත්වයන් දර්ශන මාර්ගයට පමුණුවන බව ද නව අර්ථයක් ලෙස ඉදිරිපත් කර තිබේ. එයින් පැහැදිලි වන්නේ නෙත්තිප්පකරණය ධර්මෝපදේශ ග්‍රන්ථයක් සේ ද භාවිත කළහැකි බව එම අටුවාවෙන් පිළිගෙන ඇති බවයි.

විශේෂ විවරණ

නෙත්තිප්පකරණ අට්ඨකථාවෙහි සුවිශේෂී විස්තර වර්ණනා කිහිපයක්ම දක්නට ලැබෙන බව සඳහන් කළයුතුය. නවංග බුද්ධවචනය පිළිබඳ විවරණය ඒ අතර ඉතා වැදගත්ය.

බුද්ධ වචනය අංග නවයක් යටතට බෙදා දැක්වීමේ දී අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් අතින් උද්ගත වූ ඌනතා මගහැරවීමට සමත් අර්ථ විවරණයක් නෙත්ති අටුවාවෙහි දක්නට ලැබේ. බුද්ධඝෝෂ හිමියන් නවංග බුද්ධවචනය ඉදිරිපත් කිරීමේදී එක් එක් අංගයට ඇතුළත් වන දහම් කොටස් සංග්‍රහ කිරීම කෙරෙහි පමණක් අවධානය යොමුකරන ලද නිසා එම විවරණය ආකුලත්වයෙන් පිරී තිබේ. ඒ බව වටහා ගත් ධම්මපාල හිමියෝ, නෙත්තිප්පකරණයෙහි එන 'නවවිධ සුත්තන්ත පරියෙට්ඨි' යන ගාථාර්ධයට අර්ථ සැපයීමේදී සූත්‍රාදි අංග නවයෙහි අන්‍යෝන්‍ය මිශ්‍රිත භාවයක් නොමැති බව පෙන්වාදී තිබේ. ඒ බව සනාථ කිරීම සඳහා නවංගයට අයත් එක් එක් අංගයක සාමඤ්ඤවිධිය හා තබ්භාව නිමිත්ත යන ලක්ෂණ දෙකක් ඇති බව පෙන්වා දී තිබේ. ඒ අනුව සුත්ත යනු සාමාන්‍ය විධියයි. අන්‍ය වූ ගෙය්‍ය ආදිය සගාථකත්වය ආදී (ගාථා සහිත බව) තබ්භාව නිමිති (ඊටම ආවේණික ලක්ෂණය) සහිතව ඒ ඒ අංගයන්හි බැසගෙන පවත්නා හෙයින් විශේෂ විධි නම් වේ. බුද්ධඝෝෂ හිමිපාණන් වහන්සේගේ අටුවාවල දක්නට නොලැබෙන මෙම සංකල්ප ද්වයෙන් නවංග බුද්ධවචන විවරණයට නව ආලෝකයක් වැටී

ඇති බව කිවයුතුය. එහෙත් තුලනාත්මකව විමර්ශනය කර බැලීමේදී මෙම සංකල්ප දෙකින් වුව ද නවංග බුද්ධවචනය සම්බන්ධ අන්‍යෝන්‍ය මිශ්‍රිතභාවය පිළිබඳ ගැටලුව නිරාකරණය නොවන බව අවබෝධ කරගත හැකිය.

නෙත්තිප්පකරණ අටුවාවේ දැක්වෙන බෝධිපාක්ෂික ධර්ම විස්තරය ද ඉතා වැදගත් වූවකි. බෞද්ධ දර්ශනය තුළ ප්‍රකටව ඇත්තේ බෝධිපාක්ෂික ධර්ම තිස්හතකි. එහෙත් මෙහි දී එම සංඛ්‍යාව හතළිස් තුන දක්වා ඉහළ ගොස් තිබේ. ධම්මපාල හිමියන් දක්වා ඇති පරිදි අනිච්චසඤ්ඤා, දුක්ඛ සඤ්ඤා, අනත්ත සඤ්ඤා, පහාණ සඤ්ඤා, විරාග සඤ්ඤා, නිරෝධ සඤ්ඤා යන සංඥා හය සතර සතිපට්ඨානාදී කරුණු තිස්හතට එකතු කළ කල්හි බෝධිපාක්ෂික ධර්ම හතළිස්තුනක් ඉදිරිපත් වෙයි.

විශිෂ්ට වූ නිරුක්ති

නෙත්ති අටුවාව තුළ ඉතා විශිෂ්ට වූ නිරුක්තිකරන රාශියක් ද දක්නට ලැබේ. නිරුක්ති යන පදයට ද එහිදී නිරුක්තියක් ඉදිරිපත්ව තිබේ. 'ආකාරාභිහිතං නිබ්බචනං නිරුත්ති' යනුවෙනි. එවැනි නිරුක්ති විග්‍රහ කිහිපයක් මෙසේය.

i. අපරියොසිතෙ පද වඤ්ඤා අක්ඛරං, පරියායවසෙන අක්ඛරණතො අසඤ්චරණතො
ii. පජ්ජති අත්ථො එතෙනාති පදං
iii. පදාභිහිතං අත්ථං බ්‍යඤ්ජියතීති බ්‍යඤ්ජනං
iv. විවිධානි එකසමීං යෙව අත්ථෙ වචනානි - විවචනානි, විවචනානි එව වෙවචනානි
v. සංකාසනාති සංඛිත්තෙන කාසනා
vi. පකාසනාති පඨමං කාසනා

මෙවන් විශිෂ්ට වූ නිරුක්ති කරන රාශියක් නෙත්ති අටුවාවෙන් සොයාගත හැකිය. ඒවායේ සංක්ෂිප්ත බව හා අර්ථවත් බව ප්‍රශංසාර්හ වෙයි.

අනෙක් අටුවා අතර නෙත්ති අටුවාව

ත්‍රිපිටක අටුවා හා නෙත්තිප්පකරණ අටුවාව සසඳ බැලීමේදී මෙම අටුවාව වඩා වෙනස් වූවක් බව අවබෝධ කරගත හැකිය. විශේෂයෙන්ම බොහෝ අටුවාවල දක්නට ලැබෙන ව්‍යවහාර ලෝකය හා සම්බන්ධ විස්තර වර්ණනා මෙම අටුවාවෙහි දක්නට නොලැබෙන බව කිවයුතුය. උදාහරණ කථා ප්‍රවෘත්ති හෝ උපමා කථා ආදී කථා ශෛලියෙන් යුතු විවරණ ද මෙහි ඇතුළත්ව නැත. එමෙන්ම තත්කාලීන සමාජ ආර්ථික, දේශපාලන හෝ සංස්කෘතික තොරතුරු ද මෙයින් අනාවරණය නොවෙයි. එනිසා වෙනත් කිසිදු අටුවාවකට වඩා වෙසෙස් අටුවාවක් ලෙස නෙත්තිප්පකරණ අටුවාව හඳුනාගත යුතු වෙයි.

මැදගම්පිටියේ විජිතධම්ම හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2008 අප්‍රේල් 04 දින දීය.

පටුන

				පිටු අංකය
01.	සංගහ වාර		වර්ණනාව	1
02	උද්දෙස වාර		වර්ණනාව	17
03.	නිද්දෙස වාර		වර්ණනාව	23
04.	දේශනා හාර	විභංග	වර්ණනාව	47
05.	විචය හාර	විභංග	වර්ණනාව	70
06.	යුතති හාර	විභංග	වර්ණනාව	91
07.	පදට්ඨා හාර	විභංග	වර්ණනාව	103
08.	ලක්ඛණ හාර	විභංග	වර්ණනාව	107
09.	චතුබ්‍යූහ හාර	විභංග	වර්ණනාව	111
10.	ආවට්ට හාර	විභංග	වර්ණනාව	117
11.	විභතති හාර	විභංග	වර්ණනාව	124
12.	පරිවත්තන හා	විභංග	වර්ණනාව	128
13.	වෙවචන හාර	විභංග	වර්ණනාව	130
14.	පඤ්ඤත්ති හාර	විභංග	වර්ණනාව	135
15.	ඔතරණ හාර	විභංග	වර්ණනාව	141
16.	සොධන හාර	විභංග	වර්ණනාව	143
17.	අධිට්ඨාන හාර	විභංග	වර්ණනාව	145
18.	පරික්ඛාර හාර	විභංග	වර්ණනාව	152
19.	සමාරෝපන හාර	විභංග	වර්ණනාව	155
20.	හාර සම්පාත වාර		වර්ණනාව	158
21.	නය සමුට්ඨාන වාර		වර්ණනාව	215
22.	සාසන පට්ඨාන වාර		වර්ණනාව	244

නෙත්තිප්පකරණ අට්ඨකථා
(සිංහල පරිවර්තනය)

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

ඤෙය්‍ය සාගරයේ පරතෙරට ගිය, සියුම් වූ ගැඹුරු වූ විසිතුරු ක්‍රමයෙන් දහම් දෙසන මහා කාරුණික වූ ලෝකනාථයන් වහන්සේට නමස්කාර කරමි.

විද්‍යාචරණ ගුණයෙන් යුක්ත වූ තැනැත්තෝ යමක් කරණ කොටගෙන මේ ලෝකයෙන් ඉවත්ව යෙත්ද ඒ උතුම් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් පුදන ලද ධර්මයට නමස්කාර කරමි.

යම්කෙනෙක් සීලාදී ගුණයන්ගෙන් පිරිපුන්ව මාර්ගඵලයන්හි පිහිටියේ ද පුණ්‍යක්ෂේත්‍ර වූ අනුත්තර වූ ඒ ආර්ය සංඝයාට නමස්කාර කරමි.

මෙසේ රත්නත්‍රයට නමස්කාර කිරීමෙන් ජනිත වූ යම් පිනක් වේද, එහි ආනුභාවයෙන් සියලු තැන නසන ලද අනතුරු ඇති මම.

සද්ධර්ම නෙත්තියෙහි චිරපැවැත්ම කැමති වූ ධම්මරක්ඛිත නම් තෙරුන් විසින් අයදින ලදුව

පදුමුත්තර ලෝකනාථයන් වහන්සේගේ පාමුල පවත්වන ලද ප්‍රාර්ථනාව බලන්නා වූ යමෙකු වෙත ඒ පදවිය පැමිණියේ ද

තාදී ගුණැති බුදුරදුන් විසින් සංක්ෂිප්ත දේශනාව විස්තර විභාග කොට දක්වන්නවුන් අතරින් මේ තෙම අග්‍රයැයි යම් මහාශ්‍රාවක උත්තමයෙක් එතදග්‍රයෙහි පිහිටුවන ලද්දේ ද ඒ ෂඩභිඥාලාභී කෙළෙස් වසඟ කළ විශේෂ විභාගයට පැමිණි ප්‍රතිසම්භිදා ඇති මහා කච්චායන තෙරුන් වහන්සේ සම්බුදුරජුන් විසින් පසසනා ලද සේක. උන්වහන්සේ විසින් දේශනා කරන ලද, ශාස්තෘන් වහන්සේ විසින් අනුමෝදන් වූ යම් නෙත්ති අර්ථ වර්ණනාවක් නවංග සාසනයට සැමදා ඇතුළත් වේද, එයට ගැඹුරු ඤාණ ශක්තියෙන්ම බැසගත යුතු බැවින් කෙසේ හෝ මේ දුෂ්කර අර්ථ සංවර්ණනය කරන්නට සිතමි.

යම්හෙයකින් ශාස්තෘ ශාසනය අර්ථ සංවර්ණනය සමග පවතී ද, ශ්‍රේෂ්ඨ පූර්වාචාර්යයන්ගේ විනිශ්චය ද පවතීමය.

එහෙයින් ඒ විනිශ්චය ඇසුරුකොට පස් නිකායට ද බැසගෙන ශක්ති පරිදි පේටකෝපදේසය සමගත් සසඳ,

ඉතා පිරිසිදු වූ අසංකීර්ණ වූ සියුම් අර්ථ විනිශ්චයක් ඇති, මහාවිහාර වාසීන්ගේ ඉගැන්වීම් නො ඉක්මවමින්

ප්‍රමාද ලේඛනයන් (පමා සටහන්) බැහැරකොට මනාව පාලිය යොදමින් උපදේශය බබුළුවමින් මේ අර්ථ වර්ණනාව කරන්නෙමි.

සත්පුරුෂයනි, මෙසේ මා විසින් අසංකීර්ණව අර්ථය බෙදා දක්වන නෙත්තිප්පකරණයට සකසා ඇහුම්කන් දෙවු.

නෙත්ති යන එහි කවරාර්ථයකින් 'නෙත්ති' නම් වේද? සද්ධර්මයට පමුණුවන අර්ථයෙන් නෙත්ති නම් වේ. යම්සේ තෘෂ්ණාව සත්ත්වයන්ව කාමාදි භවයට පමුණුවන නිසා භව නෙත්ති යැයි කියනු ලැබේ ද මෙසේ

මෙයත් හික්මවිය යුතු සත්ත්වයන් ආර්ය ධර්මය වෙත පමුණුවන නිසා සද්ධර්ම නයනාර්ථයෙන් නෙත්ති යැයි කියනු ලැබේ. නැතහොත් එයින් ගෙනයත් යන අර්ථයෙන් නෙත්ති නම් වේ. ධර්මකථිකයෝ නෙත්තිප්පකරණය කරණ කොටගෙන හික්මවිය යුතු සත්ත්වයන් දර්ශන මාර්ගයට ගෙන යත්, මනාව පමුණුවත් යන අර්ථයයි. මෙහි 'නීයනති' කියා හෝ ගත හැකි අධිෂ්ඨානභූත වූ මේ නෙත්තිප්පකරණයෙහි හික්මවිය යුත්තන් පිහිටුවා නිර්වාණයට පමුණුවත් යන අර්ථයෙන් නෙත්ති නම් වේ. නෙත්ති උපදේශයන් ඇසුරු කිරීමකින් තොරව සූත්‍ර අර්ථයන් පිළිබඳ අවිපරීත අර්ථාවබෝධයක් නොලැබේ. එහෙයින්ම **තසමා නිබ්බායිතුකාමෙන** යනාදිය කියන ලදී. සූත්‍රයන් පිළිබඳ සියලු අර්ථ සංවර්ණනා නෙත්ති උපදේශයන්ට යටත්ය. නෙත්තිය ද සූත්‍රයෙන් පහළ වූවකි. සූත්‍රය සම්මා සම්බුදුන් වෙතින් පහළ වූවකි.

ඒ නෙත්තිප්පකරණ තොමෝ පරිච්ඡේද වශයෙන් තෙවැදෑරුම්ය. හාර පරිච්ඡේද නය පරිච්ඡේද පට්ඨාන පරිච්ඡේද ආදී වශයෙනි. පළමුව හාර විචාරයයි. ඉන්පසු නය විචාරයයි. පසුව පට්ඨාන විචාරයයි. පාලි ව්‍යවස්ථාව අනුව සංගහවාර විභාගවාර වශයෙන් දෙවැදෑරුම් වෙයි. සියලුම නෙත්තිප්පකරණය සංගහ වාර, විභාග වාර වශයෙන් වාර දෙකකටම අයත් වෙයි. එහි සංගහ වාරය මුලින්ම ගාථා පසකින් ප්‍රමාණ කරන ලද්දේය. සියලු ප්‍රකරණාර්ථය **'යං ලොකො පූජයතෙ'** ආදී ගාථා පසකින් නොගන්නා ලද්දක් නම් නැත. මෙහි පට්ඨානය සංග්‍රහ කරන ලද්දේ නොවේද? මූල පද ග්‍රහණයෙන් පට්ඨානය සංග්‍රහ කරන ලද බැවින් එය මෙසේ නොදත යුතුයි. එසේම **අට්ඨාරස මූලපදා කුසිං දසබබං සතිපට්ඨානෙති** යැයි කියනු ලැබේ. මූල පද ස්ථානයෝ අර්ථ ක්‍රම සකසන්නවුන් මෙන් එකිනෙක සංග්‍රහ කරන ලදහ.

විභාගවාරය උද්දේස නිද්දේස පටිනිද්දේස වශයෙන් තෙවැදෑරුම්ය. **ඒවායින් තත්‍ථ කතමෙ සොළස හාරා** යනුවෙන් පටන්ගෙන **භවනති අට්ඨාරස පදානි** යන්න දක්වා ඇති කොටස උද්දේස වාරයයි. **අසසාදාදිනවතා** යනුවෙන් පටන්ගෙන **තෙතතිංසා එතතිකා** නෙතති යන්න දක්වා ඇති කොටස නිද්දේස වාරයයි. පටිනිද්දේස වාරය, හාර විභංග වාරය, හාර සම්පාත වාරය, නය සමුට්ඨාන වාරය, සාසන පට්ඨාන වාරය යනුවෙන් සිව්වැදෑරුම්ය. ඒවා අතරින් **තත්‍ථ කතමෝ දෙසනාහාරෝ** යනුවෙන් පටන්ගෙන **අයං පභාණෙන සමාරොපනාති** යන්න දක්වා

ඇති කොටස හාර විභංග වාරයයි. **තත්ථ කතමෝ දෙසනාහාර සම්පාතෝ** යනුවෙන් පටන්ගෙන **අනුපාදිසෙසා ච නිබ්බාණ ධාතු** යන්න දක්වා ඇති කොටස හාර සම්පාත වාරයයි.

මෙහි දී හාර විභංග හාර සම්පාත වාරයන්ගේ වෙනස කුමක්දැයි කීය. කියනු ලැබේ. යම්තැනක නොයෙක් උදාහරණ සූත්‍රයන්ගෙන් එක හාරයක් දක්වනු ලැබේ ද, මෙය හාරවිභංගවාරය නම් වේ. යම්තැනකදී එක සූත්‍රයක නොයෙක් හාරයන් වැටෙත් ද එය සම්පත්ති වාරය නම් වේ. එය පේටකෝපදේසයෙහි කියන ලද්දේමය.

> **යත්ථ ච සබ්බෙ හාරා - සමපතමානා නයනති සුතනත්ථං**
> **බ්‍යඤ්ජනවිධි පුථුතතා - සා භූමී හාරසම්පාතොති**

සියලු හාරයෝ යම්තැනක වැටෙමින් සූත්‍රාර්ථය ගෙනයත්ද ව්‍යඤ්ජන විධීන් බහුල බැවින් එය හාර සම්පාත භූමි නම් වේ.

නය සමුට්ඨාන සාසන පට්ඨාන වාරයන්ගේ විභාගය ප්‍රකටමය. සාසන පට්ඨාන වාරය වනාහි සංගහ වාරය මෙන් උද්දේස නිද්දේස වාරයන්හි සමානව උද්ධෘත නොකරන ලද්දේය. මහා ශ්‍රාවක භාෂිත මේ නෙත්තිප්පකරණය භාග්‍යවතුන් වහන්සේ විසින් අනුමෝදින යැයි මෙහිදී කීය. මෙය කෙසේ දන්වනු ලැබේද? පෙළින්මය. පෙළට වඩා ප්‍රාමාණික වූ අනෙකක් නැත්තේය. යම් පෙළක් සතර මහාපදේසයන්හි බහාලූ කල විරුද්ධ නො වන්නී ද එය ප්‍රාමාණිකය. එසේම ආචාර්ය පරපුර විසින් නො ගරහන ලද හෙයින් පේටකෝපදේසය මෙන් මේ නෙත්තිප්පකරණය ද (පරපුරින්) ආවේය.

එසේනම් කවර හෙයින් මෙහි නිදානය නො කියන ලද්දේ ද? සුභ සූත්‍රය අනංගණ සූත්‍රය කච්චායන සංයුක්තය ආදී ශ්‍රාවක භාෂිතයන්ගේ නිදානය කියන ලද්දේමය. මේ ඒකාන්තයෙන්ම ශ්‍රාවක භාෂිතයක් නොවේ. බුද්ධ භාෂිතයන්ගෙන් ද පටිසම්භිදාමග්ග, නිද්දේස, ධම්මපද, බුද්ධවංස ආදී ඇතැම් ඒවායේ නිදානය නොකියන ලද්දේය. එපමණකින් ඒවා ප්‍රාමාණික නොවන්නේ නොවේ. මෙහිදී ද මෙසේ දතයුතුයි. සූත්‍ර විනයාදීන්ගේ නිදානය ධර්ම භාණ්ඩාගාරික උපාලි තෙරුන් ආදී මහා ශ්‍රාවකයන් විසින්ම කියන ලද්දේය. මෙයත් මහා ශ්‍රාවක භාෂිතයකි.

(කච්චායන) තෙරුන් හැර වෙනත් කෙනෙකුට අයත් නොවන බැවින් මේ ගැන විචාරය කිරීමෙන් කවර ඵලක් ද? මේ නිදාන ගවේෂණයෙන් කවර ප්‍රයෝජනයක් ද? යම් අර්ථයක් පාලියට විරුද්ධ නොවේ ද? ඒ අර්ථයම මෙහි දී සෙවිය යුතුය. එසේ නැතහොත් පාළියෙන් අර්ථ වර්ණනා කිරීමක් නොමැතිකමින් මේ ප්‍රකරණයට වෙනම නිදාන ප්‍රකාශ කිරීමක් නැත්තේය. පටිසම්භිදාමග්ග නිද්දේස ආදියෙහි මෙනැයි දතයුතුය.

දැන් මේ ප්‍රකරණය පිළිබඳ නන්වැදෑරුම් විවරණ කුශලත්වය දක්වනු පිණිස මේ විභාගය දතයුතුයි. මේ සියලු ප්‍රකරණය සාසනය සෙවීම් වශයෙන් එක්වැදෑරුම්ය. එසේම ආර්ය මාර්ගය සම්පාදනය කරන බැවින් විමුක්ති රස වශයෙන් ද එක්වැදෑරුම්ය. ව්‍යඤ්ජනාර්ථ විචාර භාවයෙන් දෙවැදෑරුම්ය. එසේම සංග්‍රහ විභාග භාවයෙන් ද ධර්ම විනයාර්ථ සංවර්ණනා වශයෙන් ද ලෞකික ලෝකෝත්තර අර්ථ සංග්‍රහ කරන බැවින් ද රූප අරූප ධර්ම අල්වා ගැනීම් වශයෙන් ද ලක්‍ෂණ ලක්‍ෂ්‍ය වශයෙන් ද පවත්ති නිවත්ති වචනයෙන් ද සභාග විසභාග නිර්දේශයෙන් ද සාධාරණ අසාධාරණ ධර්ම විභාගයෙන් ද දෙවැදෑරුම් වේ. පුද්ගලත්‍රය නිර්දේශයෙන් (පුද්ගලයන් තිදෙනෙකු දැක්වීමෙන්), තෙවැදෑරුම් කල්‍යාණ විභාගයෙන්, විශේෂ දැනුම් තුන පිළිබඳ කථනයෙන්, ප්‍රහාණ තුන පෙන්වාදීම් වශයෙන්, ශික්‍ෂා තුන සංග්‍රහ කිරීම් වශයෙන්, ත්‍රිවිධ වූ කෙලෙස් පිරිසිදු කිරීම් වශයෙන් මූලගීති, අනුගීති, සංගීති භේදයෙන්, පිටකත්‍රය සංවර්ණනා කිරීම් වශයෙන්, හාර නය පට්ඨාන ප්‍රභේදයෙන් තෙවැදෑරුම් වේ. සිවු පිළිසිඹියා විෂය වශයෙන් චතුර්විධ නය දේශනා වශයෙන්, ධර්මාර්ථ දේශනා ප්‍රතිවේධ ගම්භීර භාවයෙන් සිවුවැදෑරුම් වේ. අභිඥේය ධර්ම විභාගයෙන්, පඤ්චස්කන්ධ නිර්දේශයෙන් පඤ්චගති ප්‍රමාණයෙන් පඤ්ච නිකායාර්ථ විවරණ වශයෙන් පස්වැදෑරුම්ය. ෂඩ් ආරම්මණ විභාගයෙන් සයවැදෑරුම් වේ. සප්ත විඥාන ස්ථිතීන්ගේ ප්‍රමාණයෙන් සත්වැදෑරුම් වේ. සූත්‍ර ආදී නවාංග නිර්දේශයෙන් නව වැදෑරුම්ය. සූත්‍රාධිෂ්ඨාන විභාගයෙන් තුදුස්වැදෑරුම්ය. සාසන පට්ඨාන ප්‍රභේදයෙන් සොළොස් අටළොස් වැදෑරුම් වේ. චතුරාසීති සහශ්‍ර ධර්මස්කන්ධ විචාරයෙන් අසූහාර දහස් වැදෑරුම් වේ යනාදී ක්‍රමයෙන් ප්‍රකරණ විභාගය දතයුතුය.

එහි සාසන පරියෙට්ඨි භාවනා යනු සියලු නෙත්තිප්පකරණය ශික්‍ෂාත්‍රය සංග්‍රහකර ඇති නවංග සත්‍ථු සාසනයේ අර්ථ සංවර්ණනා

කරන බැවින් යනුයි. අරියමග්ග **සම්පාදනතො** යනු දර්ශන භූමි භාවනා භූමි සම්පාදනය කරන බැවින් යනුයි. ශාසනය නිවන කෙළවර කොට ඇති බැවින් **විමුත්ති රසතො** යි කියන ලදී. භාරබ්‍යඤ්ජන පද කර්ම නය ආදීන්ගේ ව්‍යඤ්ජන විචාරය ඇති බැවිනුත් අර්ථපද අර්ථ නයාදීන්ගේ අර්ථ විචාරය ඇති බැවිනුත් **ව්‍යඤ්ජනාර්ථ විචාර භාවතො** යනුවෙන් කියන ලදී. සියලු පර්යාප්ති ශාසනයට ධර්මවිනය වන බැවින් **ධම්මවිනයාර්ථ සංවණ්ණනතො** යැයි කියන ලදී. නෙත්ති වචනයට ලක්ඛණ වන හෙයිනුත් උදාහරණ සූත්‍රයන්ට ලක්ෂ්‍ය වන හෙයිනුත් **ලක්ඛලක්ඛිභාවතො** යැයි කියන ලදී. **සභාග විසභාග නිද්දෙසතො** සමාන ස්වභාවයෙන් යුත් ධර්මයෝ සභාග නම් වෙති. ප්‍රතිපක්ෂ වූ ධර්මයෝ විසභාග නම් වෙති. එය විමසන ස්වභාව ඇති බැවින් යන අර්ථයයි. **සාධාරණා සාධාරණ ධම්මවිභාගතො** යනු පහාණ එකට්ඨ ජෙකට්ඨතා ආදී සාමාන්‍ය ක්‍රමයෙන් යම් ධර්මයෝ යම් ධර්මයන්ගේ නාම තීරණය කිරීම් ආදියෙන් සාධාරණ වේ ද එයට විරුද්ධ බැවින් අසාධාරණ වේද එයයි. එය විභාග වශයෙන් දෙවැදෑරුම් වෙයි, යන අර්ථයයි. **පුගලතතය නිද්දෙසතො** යනු උග්ඝටිතඤ්ඤු ආදී පුද්ගලයන් තිදෙන දක්වන ලද බැවින් යනුයි. **තිවිධකල්‍යාණවිභාගතො** යනු ආදි කල්‍යාණ ආදී විභාග වශයෙන් යනුයි. **මූලගීති අනුගීති සංගීති** භෙදතො යනු පළමු බුද්ධ වචනය මූල ගීතියයි. ප්‍රකාශ කරන ලද අර්ථයම සංග්‍රහ කරන ලද ගාථා අනුගීති නම් වේ. ඒ ඒ ගාථාව සූත්‍රාර්ථයන් යෙදීම් වශයෙන් විප්‍රකීර්ණ වූ ප්‍රකරණය සංගායනා කිරීම සංගීති නම් වේ. එය තෙරුන්ට පසුව පැවතියේ යැයි දතයුතුය. මේ ත්‍රිවිධ භේදයෙන් තෙවැදෑරුම්ය යන අර්ථයයි. **පඤ්චඛන්ධ නිද්දෙසතො** යනු රූපාදි පංච ස්කන්ධය සීලාදි පංච ධර්මස්කන්ධය යන නිර්දේශයෙන් පස්වැදෑරුම්ය යන අර්ථයයි. **සුතතාධිට්ඨාන විභාගතො** යනු ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ කාය වාක් මනෝ කර්මයන්ගේ වශයෙන් ද සද්ධා ආදී පංච ඉන්‍ද්‍රියන්ගේ වශයෙන් ද තුදුස් වැදෑරුම් වූ සූත්‍රාධිෂ්ඨාන විභාග වශයෙන් තුදුස් වැදෑරුම්ය යන අර්ථයයි. **සෙසං සුවිඤ්ඤෙය්‍යං** යනුවෙන් ප්‍රමාද හෙවත් ප්‍රපංච නොකරන ලදී.

මෙසේ තන් වැදෑරුම්ව බෙදන ලද නෙත්තිප්පකරණය සංගහවාර විභාගවාර වශයෙන් දෙවැදෑරුම්යැයි කියන ලදී. එහි සංගහවාරය පළමුව එයි. එහි ද **යං ලොකෙ පූජයතෙ** යන ගාථාව මුලින්ම එයි. **එහි යං** යනු අනියමාර්ථයේ **දුතියා** (උපයෝග) විභක්ති නිර්දේශයකි. **එහි තසස** යන මෙයින් නියමය දතයුතුය. **ලොකො** යනු කර්තෘ නිර්දේශයයි. **පූජයතෙ**

යනු ක්‍රියා නිර්දේශයයි. **සලොකපාලො** යනු කර්තෘ විශේෂණයයි. **සදා** යනු කාල නිර්දේශයයි. **නමසසති ච** යනු උපචාර වශයෙන් වූ ක්‍රියා නිර්දේශයයි. **නසස** යනු ජටධී විභක්ති නිර්දේශයයි. **ඒතං** යනු ප්‍රථමා විභක්ති නිර්දේශයයි. **සාසනවරං** යනු ප්‍රථමා විභක්ති නිර්දේශයෙන් දක්වන ලද නිදසුනකි. **විදූහි** යනු කරණ විභක්ති වචනයකින් කර්තෘ දැක්වීමකි. **කෙදයං** යනු කර්මය ගැන කියැවෙන ක්‍රියා නිර්දේශයකි. **නර වරසස** යනු ඔහුගේ යැයි නියමකොට දක්වන ලද පදයට සමාන රූප වශයෙන් දැක්වීමකි.

එහි **ලොකියං** යනු මෙයයි. මෙහි පින් පව් හෝ ඒවායේ විපාක ඇත යන අර්ථයෙන් 'ලෝක' නම් වේ. ප්‍රජාව සත්ත්ව කොට්ඨාසය යන අර්ථයයි. ලෝක ශබ්දය වනාහි ජාති ශබ්දයට සමානව විශේෂයකින් තොරව සත්ත්වයන් හැඳින්වීමට යොදයි. කෙසේ වුවත් ලෝක ශබ්දය සංස්කාරයන් බෙදා දැක්වීම් අර්ථයෙහි ද දක්නා ලද ප්‍රයෝග ඇත්තකි. පූජා කිරීමට හේතුවීම් වශයෙන් සත්ත්වලෝක යන වචනයම මෙහි දී ගන්නා ලදැයි දතයුතුය.

පූජයං තෙ යනු පූජා කරයි. බුහුමන් යන අර්ථයයි. ලෝකය පාලනය කරන්නුයි සිව්මහ රජවරු ලෝකපාල නම් වෙති. ලෝකයා නම් ඉන්ද්‍ර, යම, වරුණ, කුවේර (යන සිව්දෙන) ලෝකපාලකයන් යැයි කියත්. ලෝක පාලකයන් සමග සිටිනුයි **සලොකපාලා** නමි. ලොකො යන මෙය තුල්‍යාධිකරණයකි. එසේ නැතහොත් ඓශ්වර්ය, ආධිපත්‍යය ආදියෙන් සත්ත්ව ලෝකය පාලනය කරන බැවින් ආරක්ෂා කරන බැවින් ක්ෂත්‍රිය සිව්මහ රජවරු ද ශක්‍ර, සුයාම, සන්තුසිත, සුනිම්මිත, පරනිම්මිත වසවර්ති, මහා බ්‍රහ්මාදීහු ද ලෝකපාලයෝය. ඔවුන් සමග වූ ඒ ඒ සත්ත්ව කොට්ඨාස සලොකපාල ලෝක යැයි කියන ලදී. නැතිනම් **'දෙව මෙ භිකඛවෙ සුකකා ධම්මා ලොකං පාලෙනති'** යන බුද්ධ වචනයෙන් හිරි ඔතප් දෙක ලෝක පාලකයෝ වෙත්. ඒවායින් යුක්ත වූ ලෝකය සලොකපාල නම්. හිරි ඔතප් දෙකින් යුත් පාපයන්ට ගර්හා කරන, සත්පුරුෂ වූ බෝසත්වරු ධර්මයට කැමැති ඇති නිසා බුදුරදුන් කෙරෙහි පූජසත්කාර කිරීමෙහි යෙදුණාහු වෙත්. **සදා** යනු රෑ ද දහවල ද යන සියලු කාලයයි. එසේ නැතහොත් සදා යනු බුදුරදුන් ධරමාන කාලයේ හා ඉන් පසු කාලයේය. එසේත් නැතිනම් සදා යනු අභිනීහාරයේ (බුදු බව පැතීමේ) පටන් සාසන අන්තර්ධානය දක්වා කාලයත් ඉන්පසු කාලයත්ය. මහාභිනීහාරයේ පටන්ම

මහබෝසත්වරු බුද්ධත්වය නියත බැවින් බුද්ධාංකුරයෙක්ව දෙවියන් සහිත ලෝකයට පූජනීය ද වන්දනීය ද වෙත්. සුමේධ තාපස වූ භාග්‍යවතුන් වහන්සේ යම්සේ කියන ලද ද ඒ ගාථා මෙසේය.

දීපංකරෝ ලොකවිදූ ආනුභීනං පටිගහණෝ
මම කම්මං පකිත්තෙත්වා දක්ඛිණං පාදමුද්ධරී

යෙ තත්‍ථ ආසුං ජිනපුත්තා සබ්බෙ පදක්ඛිණමකංසු මං
නරා නාගා ච ගන්ධබ්බා අභිවාදෙත්වා න පකකමුං

පූජාවන් පිළිගන්නා වූ දීපංකර බුදුරජාණන් වහන්සේ මගේ ක්‍රියාව ප්‍රකාශ කර මා ප්‍රදක්ෂිණා කරමින් වැඩි සේක. එහි සිටි සියලුම බුද්ධ ශ්‍රාවකයෝ ද මා ප්‍රදක්ෂිණා කරමින් වැඩි සේක. මිනිස්සු ද නාගයෝ ද ගාන්ධර්වයෝ ද මා හට වැඳ පිටත්ව ගියහ.

නමස්සති ච යනු කිසිවෙක් කිසිවෙකුට පූජා සත්කාර ආදිය කරන මුත් ඔවුන්ගේ අප්‍රකට ගුණයට නමස්කාර නොකරත්. භාග්‍යවතුන් වහන්සේ සම්බන්ධයෙන් එසේ නොවේ. සත්‍ය ලෙසම පැන නැගුණ කීර්ති ශබ්දයක් ඇති බැවින් දෙවියන් සහිත ලෝකයා භාග්‍යවතුන් වහන්සේට පූජා කෙරෙත්. එසේම නමස්කාර ද කෙරෙත් යන අර්ථයයි. **සදා නරමනුස්සා** යන මෙය යහපත් නොවේ යැයි ඇතැමෙක් කියත්. **නමස්ස** යනු යමෙකුට දෙවියන් සහිත ලෝකයා පූජා කෙරෙත් ද නමස්කාර කෙරෙත් ද ඔහුටය. **එතං** යනුවෙන් දැන් කිවයුතු බුද්ධියෙහි වෙනස්වීම සාමාන්‍යයෙන් දක්වයි. **සාසනවරං** යැයි එය ස්වරූප වශයෙන් දක්වයි. එහි මෙලොව, පරලොව පරමාර්ථයන්ගෙන් සුදුසු පරිදි සත්ත්වයන්ට අනුශාසනය කරයි. මෙයින් (ඔවුන්ව) හික්මවයි යන අර්ථයෙන් සාසන නම් වේ. එයම ඒකාන්ත පැමිණවීම් අර්ථයෙන් අනන්‍ය සාධාරණ ගුණ ඇති බැවින් ද උත්තමාර්ථයෙන් ඒ ඒ පැතුම් සමෘද්ධිමත් වීම් හේතුවෙන් ද පණ්ඩිතයන් විසින් තෝරාගත යුතු බැවින් ද වර නම් වේ. සාසනං එව වරං යන්න සාසනවරං නම්. **විදූහි** යනු යථා ස්වභාවයෙන් කර්මඵලයන් ද කුසලාදී භේදයන් ද ධර්මයන් ද දන්නේනුයි විදූ නම්. (එනම්) පණ්ඩිත මනුෂ්‍යයෝය. ඔවුන් විසින් දතයුතු ඥාණයට සුදුසුය යන අර්ථයෙන් **ඤෙය්‍ය** යැයි යෙදේ. **නරවරසස** යනු උතුම් පුරුෂයාට, අග්‍ර පුද්ගලයාට යන අර්ථයයි.

යමෙක් අනන්‍ය සාධාරණ මහා කරුණා, සබ්බඤ්ඤුත ඤාණ ආදී ගුණ විශේෂ යෝගය කරණ කොටගෙන දෙවියන් සහිත ලෝකයා විසින් පිදිය යුතු, නැමදිය යුතු භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූයේ ද ලෝකයේ ඒ උතුම් පුද්ගලයාට දැන් අප විසින් බෙදිය යුතු හාර නය පටියාන විමසීම්වලට විෂය වූ මේ සාසනය ආදි කල්‍යාණත්වය ආදී ගුණසම්පත්තිය නිසා ශ්‍රේෂ්ඨ වූයේ ද අග්‍ර වූයේ ද උතුම් වූයේ ද වේ. සියුම් නුවණට ගෝචරවන බැවින් පණ්ඩිතවේදනීය ද වේ. යන මෙය කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේගේ එක් ගාථා මාත්‍රයක් පමණක් වූ වචනය ද සත්‍ය, පටිච්ච සමුප්පාද, ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, සතිපට්ඨාන ආදී ස්වභාව ධර්ම වෙන් කිරීමට සමත් බැවින් සොළසහාර පංචනය, දහසය හා විසිඅට වැදෑරුම් පට්ඨාන විමසීමට සුදුසු බැවින් ද ඉතා ගැඹුරු වූ, අර්ථ වශයෙන් ගැඹුරු වූ පරතෙරක් නැති ඉතා සියුම් වූ විෂයක්මය. එහෙයින්ම මේ ධර්මය ප්‍රඥාවන්තයින් සඳහාය. මෝඩයන් සඳහා නොවේ යැයි කියන ලදී.

එසේ නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය දන්නා ක්‍රමයෙන් ලක්ෂණයන් අවබෝධ කිරීම් ප්‍රතිපත්තියෙන් සුක්ඛුත මුඛාදියෙහි බැසගත යුතු බැවින් මෝඩයන්ට සිහිනෙන්වත් විෂය නො වන්නේය යන අර්ථයෙන් **විඤ්ඤූහි වේදිතබ්බෝ** යැයි කියන ලදී. එසේම **'එතු විඤ්ඤූ පුරිසෝ'** යනාදිය කියන ලද්දේය.

ඇතැමෙක් **තං තසස සාසනවරං** යනුවෙන් කියත්. ඔවුන්ගේ අදහස අනුව යං ශබ්දය සාසන ශබ්දය සමග සමාන අධිකරණ ඇත්තකැයි දතයුතුය. යම් උතුම් සාසනයක් ලෝකපාලයන් සහිත ලෝකයා පූජා කෙරේ ද නමස්කාර කෙරේ ද ඒ උතුම් සාසනය ප්‍රාඥයන් විසින් දතයුතුය යන මෙය කියන ලදී. මෙම න්‍යායයෙහි ලෝකපාල ශබ්දයෙන් භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව ද කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ වනාහි ලෝකාග්‍ර බැවින් කර්තෘය. නිෂ්පර්යායෙන් ලෝකපාල වේ. එහෙයින් ඔහුටය යනු ලෝකපාල වූ ශාස්තෘන් වහන්සේටය යන අර්ථයයි. සලොකපාලො යන මෙහි ලෝකපාල ශබ්දය ගුණී භූත වූවක් වුවත් ශාස්තෘ විෂය වූ සාසන ශබ්දය අපේක්ෂා කරන බැවින් අධිපතිභාවයෙන් සම්බන්ධ විෂය වූ ප්‍රධාන වූවක් මෙන් නිර්දේශයට සුදුසුය.

ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් තමා ම ධර්මය පූජා කෙරේ ද? මෙය විරෝධයක් නොවේ. ධර්මගරුක වූ ඒ භාග්‍යවත් බුදුවරු සියලු කල්හි ධර්මය පුදමින්ම වාසය කරත්. 'මම ධර්මයටම සත්කාර කොට ගරුකොට බුහුමන්කොට පූජාකොට එයම ඇසුරුකොට වාසය කරන්නේ නම් මැනව'යි යන මෙය කියන ලද්දේය.

තව ද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මපූජාව සත් සති පූජා ආදියෙන් දීපනය කළයුතුය. ධම්මස්සාමී යනු ධර්මයෙන් දෙවියන් සහිත ලෝවැසියාට ස්වාමී වේ යන අර්ථයයි. ධර්මයට අධිපති යන අර්ථය නොවේ. මෙසේ නමස්කාර කරයි යන වචනය සුදුසු නොවේ. භාග්‍යවතුන් වහන්සේ කිසිවෙකුට නමස්කාර නො කරන්නේ ය. මෙය ද දෝෂයක් නැත. න හි නමස්සති යන පදයට නමස්කාර නොකරයි යන මේ අර්ථයම යෙදේ. එවිට ගරු කිරීමෙන් එයට නතු වූයේය. එයට නැමුනේ ය. එයට බර වූයේය යන මේ අර්ථය ද ලැබේ. භාග්‍යවතුන් වහන්සේ ද සියලු කල්හි ධර්මයට නතු වීම්, නැමීම්, බරවීම් ඇතිව වාසය කරන්නේය යනුයි. මේ අර්ථය ද 'යෙන සුදං ස්වාහං නිවචකපපං විහරාමි' යන මේ ආදී සූත්‍ර පදයන්ගෙන් දීපනය කළයුතුය.

විඤ්ඤූහි නෙයෘං යනුවෙන් ද පාඨයක් වේ. එය පණ්ඩිතයන් විසින් ස්වකීය - පර සන්තානයන්හි පැමිණවිය යුතුය යන අර්ථයයි. එහිදී ස්ව සන්තානයෙහි පැමිණවීම හා අවබෝධ කරගැනීම ද පර සන්තානයෙහි අවබෝධ කරගැනීම ද දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සම්බන්ධ සදේව ලෝකයාගේ පූජනීය වන්දනීය භාවය ද අග්‍ර පුද්ගලභාවය ද කියමින් ගුණ විශිෂ්ටත්වය දීපනය කෙරෙයි. ඒ ගුණ විශිෂ්ටත්වය මහාබෝධියෙන් දතයුතුය. ආශ්‍රවක්ෂය ඤාණයට පදස්ථාන වූ සර්වඥතා ඥානය ද, සර්වඥතා ඥානයට පදස්ථාන වූ ආශ්‍රවක්ෂය ඥානය ද මහාබෝධි යැයි කියනු ලැබේ. නොවෙනස් ධර්ම දේශනා ඇති බැවින් එය තථාගතයන් වහන්සේ කෙරෙහි මනාව පිහිටියේ යැයි දැනෙයි. වාසනා සහිත නිරවශේෂ ක්ලේශ ප්‍රහාණයෙන් ද අනාවරණ ඥානයෙන් ද තොරව එබඳු ධර්ම දේශනාවක් නො පැවැත්වේ. මෙසේ උන්වහන්සේගේ චතුර් වෛශාරද්‍ය යෝගය ද දශබල ෂඩ් අසාධාරණ ඥාන අටළොස් ආවේණික බුද්ධ ධර්මාදි සියලු සර්වඥ ගණ පූරණය ද ප්‍රකාශ කරන ලද්දේ වෙයි. මෙවැනි ගුණ විභූතිය ද

මහා කරුණාව පෙරටු වූ, අභිනීහාර සම්පත්තිය පෙරටු කොට සම්පාදනය කරන ලද සමතිස් පාරමිතා සංඛ්‍යාත පුණ්‍ය ඤාණ සම්භාරය නැතිව නොලැබෙනුයි. හේතු සම්පදාව ද අර්ථ වශයෙන් විභාවනය කරන ලද්දේය. මෙසේ අවස්ථා තුනේදීම සියලු සත්ත්වයාට ඒකාන්තයෙන් හිතදේ ඇති කිරීමට හේතු වූ මුල මැද අග යහපත් වූ නිරවශේෂ වූ භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධගුණයන් මේ ගාථාවෙන් ප්‍රකාශ කරන ලදැයි දතයුතුය.

දෙවැනි නයෙහි දී වනාහි ශික්ෂාත්‍රය තුළ සංග්‍රහ වූ ඵල සහිත වූ ආර්ය මාර්ග ශාසනය ද ඊට අරමුණු වූ අමත ධාතුව ද එයට පැමිණීමේ උපාය ද පූර්වභාග ප්‍රතිපත්ති ශාසනය ද එය පරිදීපනය කිරීම ද පරියත්ති ශාසනය ද සුදුසු පරිදි සත්‍යාභිසමය කිරීම වශයෙන් අවබෝධ කරමින් ස්වාඛ්‍යාතාදී ගුණ විශේෂයෙන් යුක්ත වූ ධර්මය මෙනෙහි කරමින් සකස් කොට ඇසීම් දැරීම් විමසීම් ආදියෙන් පුහුණුව ඇති කරමින් සදේව ලෝකයා පූජා කෙරෙයි යනුයි. ලෝකනාථයන් වහන්සේ ද සම්මා සම්බෝධියට පැමිණීමෙන් පසු විනේය ජනයන්ට සකසා දහම් දෙසමින් 'අරියං වෝ භික්ඛවෙ සම්මා සමාධිං දෙසිසසාමි' 'මගගානටයංගිකො සෙටෙයා' 'යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා වා අසංඛතා වා විරාගො තෙසං අගගමක්ඛායති' 'ඛයං විරාගං අමතං පණීතං' 'එකායනෝ අයං භික්ඛවෙ දෙසෙසසාමි ආදි කල්‍යාණං' ආදී වචනයන්ගෙන් ස්තුති කිරීමෙන් ද පදන්නේ නම් වේ. එහෙයින් මෙහි කියනු ලබන උතුම් ශාසනයේ පූජනීය භාවය නිරවශේෂ වශයෙන් ධර්ම ගුණයන් බබුළුවන්නේය. නොයෙක් සූත්‍ර පදයන්ගෙන් වදාරන ලද ආර්යභාව නියාන, ඛයවිරාග, මදනිම්මදන, අසංඛත, ස්වාක්ඛාත ආදි කල්‍යාණත්ව ආදී යම් ධර්ම ගුණයක් වේ නම් ඒ අනේක වූ ධර්ම ගුණයන් නිරවශේෂ වශයෙන් මේ ගාථාවෙන් ප්‍රකාශ කරන ලදැයි දතයුතුය.

යම් හෙයකින් ආර්ය සත්‍යාවබෝධයෙන් මුලින් උපුටා දමන ලද මෝහය ඇති, මෝඩකම ඉක්මවීමෙන් පරමාර්ථ වශයෙන් නුවණැති වූ එහෙයින්ම වඩන ලද ලෝකෝත්තර මාර්ගය ඇති, සාක්ෂාත් කරන ලද මහණකමෙහි ප්‍රතිඵල ඇති ආර්ය පුද්ගලයෝ විශේෂයෙන්ම විදූ යැයි කියනු ලැබෙත්. යම්හෙයකින් ඔවුහු තත්වූ පරිදි දෙසන ලද සාසනය පරමාර්ථ වශයෙන් දැනගන්නට ද පරසන්තානයන්ට පමුණුවන්නට ද හැකිවෙත්. අෂ්ටාර්ය පුද්ගලයන්ට අයත් පරමාර්ථ සංඥා ද මෙහි දී ගත්

බැවින් යම් සඟ ගුණයන් සුපටිපන්න ආදී නොයෙක් සූත්‍ර පදයන්ගෙන් වර්ණනා කරන ලද ද ඒ ආර්ය සඟ ගුණ ද නිරවශේෂ වශයෙන් මෙහි ප්‍රකාශ කරන ලදැයි දතයුතුය.

මෙසේ පළමු ගාථාවෙන් අධිකවම රත්නත්‍රයේ ගුණ ප්‍රකාශනය කොට දැන්

සබබ පාපසස අකරණං - කුසලසස උපසම්පදා
සචිත්තපරියොදපනං - එතං බුද්ධාන සාසනං

'සියලු පව් නොකිරීම, කුසලයන් රැස්කිරීම
සිය සිත පිරිසිදු කිරීම යන මෙය බුද්ධානුශාසනයයි.'

යන වචනයෙන් සංක්ෂිප්තව ශික්ෂාත්‍රය සංග්‍රහ ශාසනය දක්වයි. එය වනාහි ශික්ෂාත්‍රය ඤාණවිශේෂ විෂයභාව භේදයෙන් ද අවස්ථා භේදයෙන් ද ත්‍රිවිධ වෙයි. ඒ කෙසේද? සුතමය ඤාණයට ගෝචර වූ යමක් වේ නම් එය පරියත්ති සද්ධර්මය යැයි කියනු ලැබේ. චින්තාමය ඤාණයට ගෝචර වූ කරුණු පරීක්ෂා කිරීම්, තම ලබ්ධිය හා සමානයැයි කැමතිවීම් ආදියෙන් ගතයුතු ආකාර ඇති විමුක්ති ආයතන විශේෂය පටිපත්ති සද්ධර්මය යැයි කියනු ලැබේ. විදර්ශනා ඤාණාදිය සමග වූ භාවනාමය ඤාණයට ගෝචර වූ යමක් වේ නම් එය පටිවේධ සද්ධර්මය යැයි කියනු ලැබේ. මේ ත්‍රිවිධ වූම සාසනය සාසනවරං යන පදයෙන් සංග්‍රහ කොට එහි යමක් ප්‍රථමව වේ ද එය අනෙක් ඒවා අවබෝධ කරගැනීමට උපායකැයි සියලු සාසනයට මූල්වීයැයි සිය ප්‍රකරණයේ විෂයය වූ පර්යාප්ති සාසනයම පළමුව සංක්ෂේප වශයෙන් බෙදා දක්වමින් දවාදසපදානි යන ගාථාව කීවේය.

එහි දවාදසා යනු ගණන් පිරිසිදීමයි. (නියම කිරීමයි) **පදානි** යනු නියම කරන ලද ධර්ම නිදර්ශනයයි. ඒවායින් බ්‍යඤ්ජන පදයේදී මොවුන්ගෙන් අර්ථය ගමන් කෙරේනුයි පද නම්. අර්ථ පදයන් වනාහි ගමන් කරයි. දැනගනීනුයි පද නම් වේ. දෙකම හෝ දෙපරිදිව හෝ යෙදිය යුතුය. බ්‍යඤ්ජන පදයන් ද නොවෙනස්ව පිළිපැදිය යුතු බැවිනි. අර්ථ පදයන් උතුරු විශේෂ අධිගමයන් ලැබීමට හේතු වන බැවිනි. ඒ පදයන් විශේෂයෙන්ම පාලියෙහිම ප්‍රකට වන්නේය. එහිදීම ඒවා වර්ණනා

කරන්නෙමු. අර්ථ ප්‍රකාශ කිරීම් අර්ථයෙන් සූත්‍ර නම් වේ. සංග්‍රහයන්හි මෙය කියන ලදී.

> **අත්‍ථානං සූචනතො සුවුත්තතතො සවනකොථ සුදනතො**
> **සුත්තාණා සුත්ත සහාගතො ච සුත්තං සුත්තනති අකඛනති**

අර්ථයන් සූචනය කරන බැවින් ද මනාව ප්‍රකාශ කරන ලද බැවින් ද ප්‍රසව කරන බැවින් ද වගුරුවන බැවින් ද ආරක්ෂා කරන බැවින් ද නූලක බඳු ආකාර ඇති බැවින් ද සූත්‍රය සූත්‍ර යැයි කියනු ලැබේ.

එයට එහිදී සූත්‍ර පිටක වශයෙන් ආවේය. මෙහි දී පිටකත්‍රය වශයෙන්ම යෙදිය යුත්තය. **දවාදස පදානි සුත්තං** යැයි යමක් කියන ලදද ඒ පර්යාප්ති සාසනය යන අර්ථයයි. **තං සබබං** යනු ඒ සූත්‍රය යැයි කියන ලද සියලු බුද්ධ වචනයයි. **බ්‍යඤ්ජනඤ්ච අත්‍ථො ච** යනු බ්‍යඤ්ජනය ද එහි අර්ථය ද යන දෙකයි. යම්හෙයකින් ද්වාදස පදානි සුත්තං යැයි කියන ලදද ඒ මේ සඳහායි. මෙය කියන ලද්දේ වෙයි. අර්ථ සූචනාදියෙන් සූත්‍රය ද පර්යාප්ති ධර්මය ද ඒ සියල්ල ද අර්ථ වශයෙන් දොළොස් පදයෙකි. බ්‍යඤ්ජනපද හය ද අර්ථපද හය ද වශයෙනි. එසේ නැතහොත් සාසනවරං යනුවෙන් යමක් කියන ලද ද ඒ සියලු සූත්‍රය පර්යාප්ති සාසනයම අදහස් කරන බැවිනි. අර්ථ වශයෙන් පද දොළසකි. බ්‍යඤ්ජන අර්ථ පද සමූහය බැවින් 'බ්‍යඤ්ජනඤ්ච අත්‍ථො ච' යනුවෙන් කියන ලදී. **තං විඤ්ඤෙය්‍යං උභයං** යනු යම් බ්‍යඤ්ජනයක ද අර්ථයක ද වචනයන් කිවයුතු බැවින් සම්බන්ධාර්ථයේ සූත්‍ර ව්‍යවහාරයකි. ඒ දෙකම ස්වරූප වශයෙන් දතයුතුය. එහි බ්‍යඤ්ජනය කෙතෙක් ද? අර්ථය කෙතෙක් ද? එහෙයින්ම **කො අත්‍ථො බ්‍යඤ්ජනං කතමං** යැයි කියන ලදී.

මෙසේ සාසනවරං යැයි කියන ලද සූත්‍රයේ පර්යාප්ති භාවය ද ඒ පිළිබඳ අර්ථ බ්‍යඤ්ජන භාවයෙන් දතයුතු බව ද දක්වා දැන් එය රැස් කිරීමේ උපාය වූ නෙත්තිප්පකරණය පදාර්ථ විභාගයෙන් දක්වන්නට **සොළසහාරා** යන ගාථාව කීවේය. එහි සොළොස් හාරයන් මෙහි ඇත්තේනුයි සොළසහාරා නම්. **පඤ්චනයා අට්ඨාරස මූලපදා** යන මෙහි ද මේ ක්‍රමයමය. එසේ නැතහොත් හාරයන් සොළසක් නිසා සොළසහාර නම්. අනෙකෙහි ද මෙසේමය. **නෙත්ති** යනුවෙන් හාර නය මූලපදයෙන්ම සංක්ෂේපයෙන් ද විස්තරාත්මකව ද ප්‍රකාශ කරන ලදී. **සාසනසස පරියෙට්ඨී**

යනු සාසනයාගේ අර්ථ පර්යේෂණයයි. පර්යාප්ති ශාසනයේ අර්ථ සංවර්ණනාව යන අර්ථයයි. නැතහොත් සියලුම ශාසනයාගේ අර්ථ විමසීම යන අර්ථයයි. පටිපත්ති, පටිවේධ සාසනයන් ද නෙත්ති නය අනුසාරයෙන් ලබන්නේය. **මහා කච්චානෙන** යන්නෙහි කච්ච යනු පැරණි ඍෂිවරයෙකි. ඔහුගේ වංසයට අලංකාරයක් වූ යම් මහා තෙරනමක් වේ ද හේ කච්චාන යැයි කියනු ලැබේ. මහා මොග්ගල්ලාන යන්න මෙන් මහා කච්චානො යනු පූජා වචනයකි. **කච්චායන ගොත්ත නිද්දිට්ඨා** යනුවෙන් ද පාඨයක් ඇත. මේ ගාථාව ද නෙත්තිය සංගායනා කරන්නවුන් විසින් ප්‍රකරණාර්ථ සංග්‍රහ වශයෙන් තබන ලදැයි දතයුතුය. යම්සේ මෙය හාර විභංග වාරයේ දී ඒ ඒ හාර නිද්දේස නිගමනයේ දී **තෙනාහ ආයස්මා** යනාදී වචනය තුළ දක්නට ලැබේ.

හාර ආදීන්ගේ එකතුව වූ නෙත්තිය ව්‍යඤ්ජනාර්ථ සමුදාය වූ සූත්‍රයෙහි කුමකින් පරීක්ෂා කෙරේ ද? විමසීමේ දී **හාරබ්‍යඤ්ජන විචයෝ** යැයි කියන ලදී. එහි හාර දහසයට මූලපද නිර්ධාරණයෙන් ව්‍යඤ්ජන මුඛයෙන්ම සූත්‍රයේ සංවර්ණනය වෙයි. මූල පද සංඛ්‍යාත ස්වභාව ධර්ම නිර්ධාරණ මුඛයෙන් න්‍යායක් මෙන් නොවේ. ඔවුහු සූත්‍රයේ ව්‍යඤ්ජන විචය යැයි කියන ලදී. අර්ථ නය වනාහි කියන ලද පරිදි අර්ථ මුඛයෙන්ම සූත්‍රයේ අර්ථ පිළිගැනීමෙන් වේයැයි **නයා තයෝ ච සුත්තන්තෝ** යි කියන ලදී. මේ විමර්ශනය අන්‍යයාගෙනුත් පැමිණෙන්නේය. **කිසිවෙක් නයෝ ච** යනුවෙන් ද කියවත්. එය සුන්දර නොවේ. **උභයං පරිගගහිනං** යනු හාර ද නය ද යන දෙකයි. සූත්‍රයේ අර්ථ වෙන්කිරීම් වශයෙන් හාත්පසින් ගන්නා ලද, සර්ව ප්‍රකාරයෙන් සූත්‍රයේ යොදන ලද යනුයි. **වුචචති සුත්තං** යනු වර්ණනා කරයි යනුයි. කෙසේද? **යථා සුත්තං** යනු සූත්‍රයට ගැලපෙන යනුයි. යම් සූත්‍රයක් යම්සේ වර්ණනා කළ යුතු ද එසේ වර්ණනා කෙරෙයි යන අර්ථයයි. යම් යම් සූත්‍රයක් කියා හෝ යථාසුත්තං කියා හෝ යනු සියලු සූත්‍රය යන අර්ථයයි. නෙත්ති නයින් වර්ණනා කරන්නට නොහැකි සූත්‍රයක් නම් නැත.

'සාසන වරං විදූහි ඤෙය්‍යං' යනුවෙන් දැන් යමක් කියන ලද ද නෙත්ති සංවර්ණනාවෙහි විෂය වූ එහි පර්යාප්ති ධර්මයම වෙනත් ආකාරයකින් නියමකොට දක්වන්නට **යා චෙව** ආදිය කියන ලදී. එහි අර්ථයන්හි ඇති කරන ලද පිරිසිදීම් ඇති ව්‍යඤ්ජන පබැඳුම දේශනාවයි. යමක් පාඨය යැයි කියනු ලැබේ ද ඒ මෙයමය. එම දේශනාවෙන් පුබුදුවන

ලද බැවින් ඒ අර්ථය දේශනා කරන ලදී. ඒ දෙකම විමුත්තිය ප්‍රධානකොට පුහුණු කරන්නාගේ අනුපාදා පරිනිර්වාණය කෙළවර කොට ඇති සම්පත්වලට හේතුවන බැවින් ඒකාන්තයෙන් යුතුය. ඒ දෙකින් තොර වූ න්‍යායක් නොමැති බැවින් ඒ දෙකම දතයුතු යැයි මේ අර්ථය දක්වයි. **යා චෙව -පෙ- විඤ්ඤායඞං** යනුවෙනි. **තත්‍ර** යනු එය දැනගැන්මෙහි, සාධනය කළයුත්තෙහි, ඉපිදවිය යුත්තෙහි යනුයි. එය සත්තමී විභක්ති වචනයකි.

අයමානුපුබ්බි යනු මේ කියනු ලබන අනුපිළිවෙලයි. හාර නය ආදීන්ගේ අනුක්‍රමයයි. අනුපිළිවෙලින් කියනු ලබන හාර නය යන අර්ථයයි. **නවවිධ සුතනනනපරියෙටඨී** යනු සූත්‍ර ආදී වශයෙන් නවංග ශාසනයේ පර්යේෂණය අර්ථ විචාරණය යන අර්ථයයි. නවවිධ සුතනනත පරියෙටඨියා අයං ආනුපුබ්බි යන මෙය ඡටඨී අර්ථයේ පඨමා විභක්තියයි. නැතහොත් ආනුපුබ්බි යනු කරණාර්ථයේ පඨමා විභක්තියයි. කියන ලද පිළිවෙලින් දැන ගැනීමෙහි, සාධනය කළ යුත්තෙහි කියනු ලබන හාර නය ආදියේ අනුපිළිවෙලින් මේ නවවැදෑරුම් සූත්‍රාන්තයේ අර්ථ පර්යේෂණය යන මෙය කියන ලද්දේ වෙයි.

මෙහි දී කියන ලදී. මෙහි කෙසේ නම් ගෙය්‍ය ආදීන්ගේ සූත්‍රභාවය වේද? ඔවුන්ගේ සූත්‍ර භාවයෙහි නවංග භාවය කෙසේ වේද? සංග්‍රහයන්හි 'සගාථකං සුතතං ගෙය්‍යං නිගගාථකං සුතතං වෙය්‍යාකරණං' යනුවෙන් යමක් කියනු ලැබේ ද ඒ මෙයයි. එසේ ඇති කල්හි සූත්‍රාංගයම නොවන්නේය. එසේ වුවත් සූත්‍රාංගය වෙනම වන්නේය. මංගල සූත්‍රාදියේ සූත්‍ර සංග්‍රහය නොවන්නේය. ගාථා බැවින් ධම්මපදාදියේ මෙන් ගෙය්‍ය සංග්‍රහය හෝ වන්නේය. ගාථා සහිත බැවින් සගාථක වර්ගය මෙනි. එසේම උභතෝ විභංග ආදියෙහි ගාථා සහිත කොටස්හි ද වේ. කියනු ලැබේ.

සුතනනනි සාමඤඤවිධි විසෙසවිධයෝ පරෙ
සනිමිතතා නිරුළහතතා සහනාඤඤන නාඤඤතෝ

සූත්‍රය යනු සාමාන්‍ය විධියයි. විශේෂ විධිය අනෙකකි. නිමිති සහිත බව නිරුළ්හත්වය, අනෙකක් සමග පවත්නා බව හා එසේ නොමැති බව ආදී වශයෙනි.

සියලුම බුද්ධ වචනයට සූත්ත යන මේ යෙදීම සාමාන්‍ය විධියයි. එසේම 'එතතකං තසස භගවතො සුතතාගතං සුතත පරියාපතනං' 'සාවත්ථියා සුතත විහංගෙ' 'සකවාදෙ පඤ්චසුතත සතානි' ආදී වදන්වලින් විනය අභිධම්ම පර්යාප්ති විශේෂයේ ද සූත්‍ර ව්‍යවහාරය දක්නට ලැබේ. එහි එකදේශයක ගෙය්‍යාදී විශේෂ විධිය ඒ ඒ නිමිත්තෙන් පිහිටුවන ලදී. එසේම ගෙය්‍යයේ ගාථා සහිත බව ඊට නිමිති වේ. ලෝකයා ද ශ්ලෝක සහිත ගාථා සහිත චූර්ණිකා ඇති දෙය ගෙය්‍ය යැයි කියත්. ගාථා නැති කල්හි විමසා විසඳන ස්වභාවයක් වේ. වෙය්‍යාකරණයේ විමසා විසඳීම ව්‍යාකරණ යැයි කියනු ලැබේ. ව්‍යාකරණයම ව්‍යාකරණ නම් වේ. මෙසේ ඇති කල්හි සගාථකාදීන්ගේ ප්‍රශ්න විසඳීම් වශයෙන් පැවති වෙය්‍යාකරණ භාවයක් පැමිණේ ද? නොපැමිණේ. ගෙය්‍ය ආදී නම්වල අවකාශ රහිත බැවින් ගාථා නැති කල්හි යන විශේෂිතත්ත්වය ම වේ. එසේම තනිකර ගාථා බන්ධන වූ ධම්මපද ආදියේ ගාථා සහිත වූ සොමනස් සහගත ඤාණයෙන් උපන් ගාථාවලින් යුක්ත, වුතතං හෙතං ආදී වචන සම්බන්ධය ඇති අද්භූත ධර්ම යුත් සූත්‍ර විශේෂයන්හි පිළිවෙලින් ගාථා උදාන ඉති වුත්තක අබ්භූතධම්ම යන නම් පිහිටියේය. ගාථා බන්ධනයක් එසේ ඇති කල්හිත් භාග්‍යවතුන් වහන්සේගේ අතීත ආදී ජාතිවල චරියානුභාවය ප්‍රකාශ කරන සූත්‍රවල ජාතක නාමය වේ. ප්‍රශ්න විසඳීම් ස්වභාවයක් හා ගාථා සහිත බවක් ඇති කල්හිත් ඇතැම් සූත්‍රවල ඤාණයේ ලැබීම ඇති බැවින් වේදල්ල සඤ්ඤාව පිහිටියේය. මෙසේ ගාථා සහිත බව ආදී ඒ ඒ නිමිත්තෙන් ඒ ඒ සූත්‍ර විශේෂයන්හි ගෙය්‍ය අංගය ආදී නාමයන් පිහිටියේ යන විශේෂ විධිය සූත්‍රාංගයෙන් අන්‍ය වූ ගෙය්‍යාදියයි.

මෙහි ගෙය්‍ය අංග ආදී නිමිති රහිත යම් සූත්‍රයක් වේ ද, ඒ සූත්‍රාංගය විශේෂ නාම පරිහාරයෙන් සාමාන්‍ය නාමයෙන් පවත්නේය. සගාථක සූත්‍රය ගෙය්‍ය නොවේ ද? නිග්ගාථක සූත්‍රය වෙය්‍යාකරණ නොවේ ද? සූත්‍රාංගයක් නො ලැබේ යන චෝදනාවක් වේ. එය මුලින් කී දෙය වෙනස් වීමක්ම ද? එසේ නොවේ. එම චෝදනාව පිරිසිදු කරන ලද බැවිනි. මීට පෙර 'ගාථා විරහෙ සති පුචඡා විස්සජ්ජන භාවො වෙය්‍යාකරණසස තබභාව නිමිතතං' යනුවෙන් (එම චෝදනාව) ශෝධනය කරන ලද්දේමය.

ගාථා භාවයෙන් මංගල සූත්‍රාදියේ සූත්‍ර සංග්‍රහයක් නොවන්නේ යැයි යමක් කියන ලද ද එය ද සාමාන්‍ය දෙයක් (පොදු බවක්) නොවේ.

සාමාන්‍ය දෙයක් (පොදු බවක්) නොවේ. සාමාන්‍ය දෙය නම් මංගල සූත්‍රාදියේ සූත්‍ර භාවයයි. ඒවා ධම්මපද බුද්ධවංස ආදිය මෙන් ගාථා භාවයෙන් ප්‍රකට වූයේ නැත. නුදෙක් සූත්‍ර භාවයෙන්ම ප්‍රකට විය. එහෙයින්ම අටුවාවේදී 'සුත්ත නාමකං' යන නම් ගැන්වීම කරන ලදී. කෙසේ ද? ගාථා සහිත බැවින් ගෙය්‍ය සංග්‍රහය හෝ වන්නේය යන යමක් කියන ලද ද එයයි. එපමණක් නොවේ. යම් හෙයකින් සහතාඤ්ඤන යන තැන ගාථාවන් සමග වූ සගාථකත්වය ගැනේ. සහභාවය නම් අර්ථයෙන් අනෙකකින් වේ. යමක් ගාථා සමග යැයි කියන්නේ නම් මංගල සූත්‍රාදියේ ගාථා විනිර්මුක්ත කිසිදු සූත්‍ර ප්‍රදේශයක් නැත. කිසියම් සමුදායයක් නැත. උභතෝ විභංග ආදියේ ගාථා සහිත ප්‍රදේශයේ (කොටසේ) ගෙය්‍ය සංග්‍රහය වන්නේය යන යමක් කියන ලද ද එය ද අනෙක් ක්‍රමයකින් නොවේ. ජාතකාදියේ ඇතුළත් බැවින් ඒ ගාථා අන්‍ය වේමය. එහෙයින් ඒවා කරණ කොටගෙන උභතෝ විභංග ආදිනන්ගේ ගෙය්‍යාංගත්වයක් නොමැත්තේය. මෙසේ සූත්‍රාදි අංගයන්ගේ එකිනෙකට ඇති සංකර භාවය දතයුතුය. යම් හෙයකින් සියලුම බුද්ධ වචනය කියන ලද පරිදිම අර්ථයන් ප්‍රකාශ කරන අර්ථයෙන් සුත්ත යැයි කියනු ලැබේ. එහෙයින් 'නවවිධ සුතතනත පරියෙටඨි' යැයි කියන ලදී.

සංගහ වාර වර්ණනාව නිමි.

2.

මෙසේ සංග්‍රහ වාරයෙන් සංක්ෂේපව දක්වන ලද හාර ආදිය දැන් (විස්තර) බෙදීම් වශයෙන් දක්වන්නට **තත්‍ථ කතමෙ සොළසහාරා** යනාදි දේශනාව අරඹන ලද්දේය. එහි **තත්‍ථ** යනුවෙන් යමක් කියන ලද ද 'සොළසහාරා නෙතති' යන ඒ වචනයෙහි හෝ ඒ ගාථාවෙහි හෝ යම් හාර නය මූලපදයන් උපුටන ලදනම් ඒවායේ යන අර්ථයයි. **කතමෙ** යනු ප්‍රශ්න වචනයකි. මේ ප්‍රශ්න කිරීම පස්වැදෑරුම්ය. අදිටඨජෝතනා විචාරණය, දිටඨ සංසන්දන විචාරණය, විමතිවෙඡදනා විචාරණය, අනුමති විචාරණය, කථෙතු කම්‍යතා (කරුණු දක්වනු කැමැත්තෙන් කරන) විචාරණයයි.

සොළසා යනු ගණන් වශයෙන් පිරිසිඳ දැක්වීමයි. එම පදයෙන් හාරයන් පිළිබඳ එයින් උඩට හෝ යටට හෝ එකතුවක් නැතැයි ප්‍රමාණයම දක්වයි. ඒ ප්‍රමාණය ද පසුව ප්‍රකට වන්නේය. **හාරා** යනු ගණන් වශයෙන් පිරිසිඳින ලද දේ සාමාන්‍ය වශයෙන් දැක්වීමයි. **දෙසනා විචයෝ** යනාදිය ස්වරූපය දැක්වීමයි.

එහි කවර අර්ථයකින් හාර නම් වේද? සූත්‍ර, ගෙය්‍ය ආදී විෂයයන් පිළිබඳ අඥාන (නොදැනුම්) සැක විපර්යාසයන් යන මේවායින් හෝ මෙහිදී හෝ දුරු කෙරේනුයි යන අර්ථයෙන් හාර නම් වේ. තමන් හෝ ගෙන යයි. නැතහොත් ඒවා හරණ මාත්‍රයක්මය යන අර්ථයෙන් හාර නම් වේ. ඵලූපචාරාර්ථයෙනි. එසේ නැතහොත් ධර්ම සංවර්ණක, ධර්ම ප්‍රතිග්‍රාහයකන් විසින් ධර්ම පිළිබඳ දීම් ගැනීම් වශයෙන් ගෙනයනු ලැබේ. ව්‍යවහාර කරනු ලැබේ යන අර්ථයෙන් හාර නම් වේ. එසේ නැතහොත් හාරයක් මෙන්ය යන අර්ථයෙන් හාර නම් වේ. යම්සේ නොයෙක් රුවන්වැල් සමූහයක් හාර සංඛ්‍යාත වූ තමන්ගේ අවයව වූ රුවන් ස්පර්ශයෙන් හටගනු ලබන ආශ්වාද සැපය බවට පත්වී එය විඳිනු ලබන ජනයාගේ ශ්‍රීෂ්ම පරිදාහයෙන් හටගත් ශරීර සන්තාපය සමනය කෙරෙයි ද මෙසේ මෙයින් ද නන්වැදෑරුම් පරමාර්ථ නැමැති රුවන් ප්‍රබන්ධ වූ සංවර්ණනා විශේෂයෝ තමාගේ අවයව වූ පරමාර්ථ රත්නාධිගමයෙන් උපදවනු ලබන නිවන් සැපය කාමරාග ආදී කෙලෙස්වලට හේතු වූ ධර්ම ප්‍රතිග්‍රාහක ජනයාගේ සිත්තැවුල් සමනය කෙරේ. එසේ නැතහොත් දුරුකෙරෙත්. අඥානාදීන්ගේ හාරය බැහැර කෙරෙත් හෝ ප්‍රකාශ කෙරෙත් නුයි හාර නම් වේ. එසේ නැතහොත් ශ්‍රාවක ජනයාගේ සිත ගන්නා බැවින් සතුටු කරන බැවින් හාර නම් වේ. ඒ නිරුක්ති න්‍යායයෙහි 'භවයන්හි වමාරන ලද ගමන් ඇති බැවින් භගවා' වන ආකාරයෙනි. මේ වනාහි හාරයන්ගේ සාධාරණ වූ අර්ථයයි.

අසාධාරණ වශයෙන් වනාහි මෙයින් සූත්‍රාර්ථය දේශනා කරනු ලැබේ. වර්ණනා කරනු ලැබේනුයි දේශනා නම් වේ. දේශනාව සමග එකට නැසිරෙන හෙයින් හෝ ඉදේශනා නමි. අනෙක් හාරයෝ දේශනා සංඛ්‍යාත වූ සූත්‍රයේ අර්ථ සංවර්ණනා කරන හෙයින් දේශනා සහචාරී නොවේ ද? මෙය සත්‍යයකි. මෙම හාරය බොහෝසෙයින්ම පෙර කියන ලද පරිදිම දන්වනු ලබන්නේ දේශනාව සමග හැසිරේනුයි කිය යුතු බවට සුදුසු වේ. එයින් අන්‍ය වූ ආශ්වාද ආදීනව නිස්සරණ ආදී ඉදිරිපත් කිරීම්

රහිත වූ සූත්‍ර දේශනාවක් නැත. මේ හාරය ආශ්වාද ආදීනව නිස්සරණ ආදී ඉදිරිපත් කිරීම විභාවනය කිරීම ලක්‍ෂණ කොට ඇත්තේය. මෙයින් හෝ මෙහිදී හෝ පද ප්‍රශ්නාදිය විමසනු ලැබේ. නැතහොත් ඒවා පිරික්සනු ලැබේනුයි විචය නම් වේ. පෙළෙහි වනාහි පිරික්සානුයි විචය වේ යන මේ අර්ථය දක්වන ලදී.

යුත්ති යනු පහළවීමයි. සාධන යුක්තියයි. මෙහි වනාහි යුක්ති විචාරණය යුත්ති නමින් ගැනේ. උත්තරපද ලෝපයෙනි. රූපභවො යන්න රූප වන්නා සේය. නැතහොත් යුක්තිය සමග සහචාරී වීමෙනි. මෙහි ද දේශනා හාරයෙහි කී පරිදි අර්ථය විස්තර කළ යුතුය. පදථ්‍යානං යනු ආසන්න කරුණයි. මෙහි ද පදථ්‍යාන විචාරණය ආදිය කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. මෙයින් හෝ මෙහි හෝ ඒක ලක්‍ෂණ ඇති ධර්ම අභාෂිත වුවත් එකම වචනයෙන් සලකුණු කෙරෙත් නුයි ලක්ඛණ නම් වේ. මෙයින් හෝ මෙහි හෝ අර්ථයන් විසුරුවා හරී. විභාග වශයෙන් එකතු කෙරේනුයි බ්‍යූහ නම් වේ. නිර්වචනාදී සූත්‍රයෙහි දක්වනු ලබන සතරේ එකතුව චතුබ්‍යූහ නම් වේ. මෙහි සිව්වැදෑරුම් බ්‍යූහයන් ඇත්තේනුයි චතුබ්‍යූහ නම් වේ. මෙයින් හෝ මෙහි හෝ සභාග විසභාග ධර්මයෝ පෙරළනු ලැබෙත්නුයි හෝ ඒවායේ පෙරළීම හෝ ආවට්ට නම් වේ. මෙයින් හෝ මෙහි හෝ සාධාරණ අසාධාරණ සංකිලේස වෝදාන ධර්මයන්ගේ භූමිභූ විභාග කෙරෙත්නුයි විභත්ති නම්. එම ධර්මයන් භූමි වශයෙන් බෙදීම හෝ විභත්ති නම්. ප්‍රතිපක්‍ෂ වශයෙන් පෙරළෙත්. සූත්‍රයේ දක්වන ලද ධර්මයන්ගේ පරිවර්තනය එහි වෙත්නුයි පරිවත්තන නම් වේ. විවිධ වචන එකම අර්ථයක ප්‍රකාශ වීම මෙහි ඇත්තේනුයි විවචන නම්. විවචනයම වෙවචන නම් වේ. මෙයින් විවිධ වූ අර්ථ කියනු ලැබේනුයි විවචන නම් වේ. සෙස්ස කියන ලද පරිදිම වේ. ප්‍රකාරයන්ගෙන් හෝ ප්‍රභේද වශයෙන් හෝ මෙයින් අර්ථ ප්‍රකාශ කෙරේනුයි පඤ්ඤත්ති නම් වේ. මෙයින් හෝ මෙහි හෝ සූත්‍රාගත ධර්මයන් ප්‍රතීත්‍ය සමුත්පාදාදියෙහි බස්සවත්, ප්‍රවේශ කරවත්නුයි ඔතරණ නම් වේ. මෙයින් හෝ මෙහි හෝ සූත්‍රයෙහි පද පදාර්ථ ප්‍රශ්නාරම්භයන් ශෝධනය කෙරේ. තැන්පත් වේනුයි සෝධන නම් වේ. මෙයින් හෝ මෙහි හෝ සාමාන්‍ය විශේෂ ලක්‍ෂණ ඇති ධර්මයෝ සියල්ල ඇතුළත් නොකොට අධිෂ්ඨාන කෙරේ. අනුව ක්‍රියා කෙරේනුයි අධිට්ඨාන නම් වේ. ඵලය සකසයි මනාව සංස්කරණය කරයි යන අර්ථයෙන් පරික්ඛාර නම් වේ. හේතු ප්‍රත්‍යයෝයි. පරිස්කාරය ප්‍රකාශ කෙරේනුයි පරික්ඛාරය හාරයක් වේ. පරිස්කාරයට

විෂය බැවින් හෝ පරිස්කාරයට සහචාරී බැවින් හෝ පරික්ඛාර නම්. මෙයින් හෝ මෙහි හෝ ධර්මයන් පදට්ඨානාදී කරුණුවලින් නංවනු ලැබෙත්නුයි සමාරෝපන නම්. සියලු තන්හි භාවසාධන වශයෙන් ද අර්ථය සම්භ වේ. ඊට අදාළව යෙදිය යුතුය.

නසස යනු පෙර කියන ලද හාර උද්දේශයේය. **අනුගීති** යනු ප්‍රකාශ කරන ලද අර්ථයේම සුබ ග්‍රහණය පිණිස ඊට අනුව පසුව ගායනා කරන ගාථාවන්ය. ඒවා අතරින් අවසාන ගාථාවේ **අත්ථතො අසංකිණ්ණා** යනු පදාර්ථයෙන් අමිශ්‍රිත වූ යනුයි. එහෙයින් ඉදින් සමහර හාරයෝ ඔවුනොවුන්ට මිශ්‍ර වූවාහු මෙන් දක්නා ලැබෙති. එසේ වුවත් ඔවුන්ගේ අර්ථ වශයෙන් මිශ්‍ර බවක් නැතැයි දක්වනු ලැබේ. ඔවුන්ගේ ඒ අමිශ්‍රිත භාවය ලක්ඛණ නිර්දේශයෙහි ප්‍රකට වේ. **එතෙසඤ්චව** යනු මේ සොළොස් හාරයන්ගේ යම් සේ අමිශ්‍ර බවක් වේ ද එසේම වේ යනුයි. කුමක් වේ ද? **විත්ථාරතයා** යනු විස්තර වශයෙනි. **නය විභත්ති** යනු න්‍යායෙන් උපායෙන් වූ විභාගයයි. මෙයින් ඒ අසංකීර්ණ භාවය බබුළුවයි. ඇතැමෙක් **විත්ථාරකයා** යනුවෙන් කියවත්. එය යහපත් නොවේ. මේ ගාථාව කිසිදු පොතක නැත.

මෙසේ හාරයන් දක්වා දැන් නය දක්වන්නට **නසං කතමෙ** යන ආදිය කියන ලදී. එහි නයං යන්න විවරණය කෙරේ. සංක්ලේශයන් ද කෙලෙස් දුරුකරන සිත් ද, විභාග වශයෙන් ප්‍රකාශ කෙරේ නුයි නය නම් වේ. මේවායින් ඒ කෙලෙස් ගෙන යයි යන අර්ථය මෙහි ඇත්තේනුයි නය නම්. නයන මාත්‍රයම හෝ නය නම් වේ. ධර්ම කථිකයන් කරණ කොටගෙන තමන්ම සූත්‍රයේ අර්ථ රැස්කිරීම පිණිස පමුණුවානුයි නය නම් වේ. එසේ නැතහොත් නය මෙන්ය යන අර්ථයෙන් නය නම් වේ. යම් සේ එකන්ත ආදී න්‍යායන් මනාව අවබෝධ කරගනු ලබන්නේ පච්චය ධර්ම හා පච්චයුප්පන්න ධර්මයන් පිළිබඳ යථාක්‍රම වූ සම්බන්ධ, විභාග, ව්‍යාපාර විරහ අනුරූප ඵලභාවයන් දැක්වීමෙන් සම්මුති හා පරමාර්ථ සත්‍යයන්ගේ ස්වභාවය අමිශ්‍රව ප්‍රකාශ කරන්නාහු පරමාර්ථ සත්‍යාවබෝධය පිණිස පවතිත් ද එසේ මේ න්‍යායන් ද කෘෂ්ණශුක්ල සප්‍රතිභාග (කළු සුදු විරුද්ධ) ධර්ම විභාගයන් දැක්වීමෙන් නොවෙනස් වූ සූත්‍රාර්ථයන් අවබෝධ කරගැනීමට හැකි වූවාහු වෙනෙය්‍ය (හික්මවිය හැකි) ජනයාගේ චතුරාර්ය සත්‍යාවබෝධය පිණිස පවතිත්. එසේ නැතහොත් පරියත්ති අර්ථය ගෙනයන බැවින්, කෙලෙසන බැවින්, නසන

බැවින් නය නම් වේ. නිරුත්ති න්‍යායයෙනි. **නන්දියාවටෝ** යන ආදියෙහි නන්දියාවට්ටයට මෙන් මෙයට ආවර්තනයක් ඇත යන අර්ථයෙන් නන්දියාවට්ට නම් වේ. නන්දියාවර්තය යම්සේ ඇතුළත පිහිටි ප්‍රධාන අවයවයෙන් පිටත කැරකෙයි ද මේ න්‍යාය ද එවැනිය යන අර්ථයයි. එසේ නැතහොත් නන්දි නම් වූ තෘෂ්ණාවේ ප්‍රමෝදයට හෝ ආවර්තනය වේනුයි නන්දියාවට්ට නම් වේ. සංක්ලේෂ පක්ෂයෙහි වූ ලෝභාදී ත්‍රිවිධ අවයවයන්ගෙන් ද වොදාන (පිරිසිදු) පක්ෂයෙහි වූ අලෝභාදියෙන් ද උතුම් වූ දෙය බබළන්නේ නුයි තිපුකබල නම් වේ. විගතතෘෂ්ත ජව පරාක්‍රමාදී විශේෂ යෝගයෙන් සිංහයකු බඳු වූ භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේගේ වික්‍රීඩිත සංඛ්‍යාත දේශනා වාග් කර්ම විහරණය නම් කොට විපර්යාසයට ප්‍රතිපක්ෂ වූ දෙය පරිදීපනය කරන හෙයින් සිංහයාගේ වික්‍රීඩිතය මෙහි පිහිටියේනුයි සීහවික්කීළිත න්‍යාය නම් වේ. බල විශේෂ යෝගය ප්‍රකාශ කරන හෙයින් හෝ සිංහයාගේ වික්‍රීඩිතය හා සමාන නිසා හෝ මේ න්‍යායය සීහවික්කීළිත නම් වේ. මෙහි බල විශේෂ යනු ශ්‍රද්ධාදි බලයන්ය. නැතහොත් දශබලයන්ම වේ. අර්ථ නය තුනෙහි දිශා භාවයෙන් කුශලාදී ධර්මයන් සලකා බැලීම දිසාලෝචන නම් වේ. එසේ සලකා බලන ලද ඒ දිශා ධර්මයන්ගේ අර්ථ නයත්‍රයාගේ යෙදීමෙන් පමුණුවන හෙයින් හෙන්ඩුවක් වැනිනුයි අංකුස නම් වේ. ගාථාවන්හි සූත්‍රාර්ථය ලකුණු කෙරෙයි. ප්‍රකාශ කෙරේනුයි ලඤ්ඡක නම් වේ. න්‍යාය වූයෙත් ලඤ්ඡක වූයේත් එයමැයි **නයලඡක** නම්. **ගතා** යනු දන්නා ලද්දේය යන අර්ථයි. නැතහොත් එයම පාඨය වේ. ශේෂය කියන ලද පරිදිම දතයුතුය.

මෙසේ න්‍යායයන් ද උදෙසා දැන් මූලපද උදෙසන්නට **තත්‍ථ කතමානි** යන ආදිය ආරම්භ කළේය. එහි න්‍යායන්ගේ පටිඨාන භාගයන් නොපිහිටි බැවින් ඒ මූලයන් ද අධිගමූපාය භාවයෙන් කොටස් ඇති බැවින් පදයන් ද කියවේනුයි මූලපද නම්. කොසල්ල සම්භූතාර්ථයෙන් හෝ නින්දිත වූ පාපිධර්මයන් සොලවන හෙයින් දුරුකරන හෙයින් හෝ කෘශ වූ රාගාදීන් සිඳ දමන හෙයින් හෝ කුශ තණ මෙන් සිඳ දමන හෙයින් හෝ පූර්ණ වූ ඥානයෙන් සිඳ දැමිය යුතු පැවැත්විය යුතු හෙයින් හෝ කුසල නම් වේ. ඊට ප්‍රතිපක්ෂ වූ හෙයින් අකුසල යැයි පදාර්ථය දතයුතුය.

මෙසේ සංඛ්‍යා පිරිසිඳීම් වශයෙන් ද ජාති භේද වශයෙන් ද මූලපදයන් දක්වා දැන් ස්වරූප වශයෙන් දක්වන්නේ සංකිලෙස පක්‍ෂයම පළමුව උදෙසයි. **තණ්හා** ආදියෙන්, එහි තැති ගනී. හාත්පසින් තැති ගනී යන අර්ථයෙන් තණ්හා නම් වේ. නොවිදිය යුතු දේ විඳියි. විඳිය යුතු දේ නොවිඳියි යන අර්ථයෙන් අවිජ්ජා නම්. නැතහොත් විද්‍යාවට ප්‍රතිපක්‍ෂ වූයේ අවිජ්ජාවයි. ඊට ලෝභ කෙරෙයි. තෙමේ ම හෝ ලෝභ කරයි. ලෝභීමාත්‍රයක්ම හෝ වේ නුයි ලෝභ නම්. ද්වේෂ, මෝහයන් පිළිබඳව ද මේ ක්‍රමයම යෙදේ. අශුභයෙහි සුභ යැයි පැවති සංඥාව සුභ සංඥාවයි. සුබ සඤ්ඤාදියේ ද මෙම ක්‍රමයෙන්ම අර්ථය දත යුතුය. **සංගහං** යනු ගණනයි. **සමොසරණං** යනු ආරෝපණය කිරීමයි. විරුද්ධ ධර්මයන් සමනය කෙරේනුයි සමථ නම් වේ. අනිත්‍යාදී වූ විවිධ ආකාරයන්ගෙන් දක්නේනුයි විපස්සනා නම් වේ. අලෝභාදිහු ලෝභාදියට ප්‍රතිපක්‍ෂ වශයෙන් දත යුතුය. අසුභයෙහි සුභයැයි පැවති සංඥාව අසුභ සංඥාවයි. එනම් කායානුපස්සනා සතිපට්ඨානයයි. එම දේශනාව සංඥා ශීර්ෂයෙන්ය. දුක්ඛ සංඥාදියේ ද මෙම ක්‍රමයමැයි. **ඉදං උද්දානං** යන මෙය ප්‍රකාශ කරන ලද අර්ථය විප්‍රකීර්ණ භාවයෙන් නැසෙන්නට නොදී මත්තට ප්‍රදානය කිරීම, රැකගැනීම උද්දානයි. සංග්‍රහ වචනයක් යන අර්ථයයි. **චතතාරෝ විපල්ලාසා** යන පාඨයක් ද වේ. **කිලෙස භූමි** යනු සියලු අකුශල ධර්මයන් රැස්වීමට ස්ථාන බැවින් සංකිලෙස භූමියයි. **කුසලානං යානි නීණි මූලානි** කුසලානි යැයි ද කියවත්. **සතිපට්ඨානා** යනු අසුභ සංඥාදීන් සඳහා කියන ලදී. ඉන්ද්‍රියභූමි යනු ශ්‍රද්ධාදි විමුක්තිය පිණිස මුහුකුරා යැවිය යුතු ඉන්ද්‍රියන් රැස්වන බැවින් කියන ලදී. **යුඤ්ජනති** යනු යොදවත් යනුයි. **බො** යනු පද පූරණාර්ථයේ හෝ අවධාරණාර්ථයේ නිපාතයකි. එයින් මේවාමය යන අර්ථය දක්වයි. දහඅටක්මය යනු හෝය. මූලපදා යනු මූලපදානි යන්නේ ලිංග විපර්යාසය හෝ විය හැකි.

උද්දේස වාර වර්ණනාව නිමි.

3.

මෙසේ උදෙසූ කල්හි හාරාදිය නිර්දේශ කරන්නට **තත්‍ථ සංඛෙපතො** යන ආදිය ආරබ්ධය. එහි **තත්‍ථ** යනු ඒ උද්දේස පාඨයෙහිය. **සංඛෙපතො නෙත්තිකිත්තනා** යනු කෙටියෙන් නෙත්තිප්පකරණය කියන ලදී යනුයි. හාර නය මූල පදයන්ගේ ස්වරූපය දැක්වීම උද්දේස පාඨයෙන් කරන ලදී. මෙහිදී ද නාරනයාදියේ :-

සාමඤ්ඤතො විසෙසෙන පදතො ලකඛණං කමො
එතතාවතා ච හෙත්‍වාදී වෙදිතබ්බානි විඤ්ඤුනා

පදාර්ථය, ලක්‍ෂණය, ක්‍රමය හේත්‍වාදී ප්‍රමාණය, සාමාන්‍ය වශයෙන් ද විශේෂ වශයෙන් ද නුවණැත්තා විසින් දතයුතුය.

ඒවායින් අවිශේෂ වශයෙන් ද විශේෂ වශයෙන් ද හාර නය ආදියේ අර්ථය දක්වන ලදී. ලක්‍ෂණාදියෙහි වනාහි අවිශේෂ වශයෙන් සියලුම හාරයෝ ද න්‍යායයෝ ද පිළිවෙලින් ව්‍යඤ්ජනාර්ථ මුඛයෙන් නවංග සාසනයේ අර්ථ සංවර්ණන ලක්‍ෂණයයි. විශේෂ වශයෙන් වනාහි ඒ ඒ හාරයේ ද න්‍යායයේ ද ලක්‍ෂණ නිද්දේසයේදීම ප්‍රකාශ කරන්නෙමු. ක්‍රමාදිය ද යම්හෙයකින් ඒවායේ ලක්‍ෂණ දත්කල්හි දැනගත යුතු වෙත්. එහෙයින් ඒවා ද නිද්දේසයට පසු ප්‍රකාශ කරන්නෙමු. **අසසාදාදීනවතො** යන යම් ආරම්භක නිද්දේස ගාථා වේ ද ඒවායේ අසසාදාදීනවතා යන තැන අස්සාදො ආදීනවතා යනු පද විභාගයයි. ආදීනවතා යනු ද ආදීනවයමය. ඇතැමෙක් අස්සාදාදීනවතො යැයි කියවත්. එය යහපත් නොවේ. එහි ආශ්වාද කෙරේනුයි **අසසාද** නම්. සුඛය ද සොම්නස ද යන දෙකයි. එය 'යං භිකඛවෙ පඤ්චුපාදානකඛන්ධෙ පටිච්ච උපජජති සුඛං සොමනසසං අයං පඤ්චසු උපාදානකඛන්ධෙසු අසසාදො' යැයි (මහා දුකඛකඛන්ධ සූත්‍රයේදී) කියන ලදී. සුඛය ද සොම්නස ද මෙසේ ඉෂ්ටාරම්මණය ද හඟවයි. එය ද 'සො තදසසාදෙති තං නිකාමෙතීති. රූපං අසසාදෙති අභිනන්දති. තං ආරබ්භ රාගො උපජජති. සංයොජනීයෙසු භිකඛවෙ ධම්මෙසු අසසාදානුපසසිනො' යැයි කියන ලදී. මෙයින් ආශ්වාද කෙරේ නුයි හෝ **අසසාද** නම්. තණ්හාවයි. හේතුව

වූ තෘෂ්ණාවෙන් පුද්ගලයා සුඛය ද සුඛ සහගත අරමුණ ද ආශ්වාදනය කෙරේ. තෘෂ්ණාව යම්සේ ද විපල්ලාසයෝත් මෙසේමය. සත්ත්වයෝ විපර්යාස වශයෙන් අනිටු අරමුණ ද ඉෂ්ටාකාරයෙන් ආශ්වාදනය කෙරෙත්. මෙසේ වේදනාවේ ද සියලු තෙභූමක සංස්කාරයන්ගේ ද තණ්හාවේ ද විපල්ලාසයන්ගේ ද ආශ්වාද විචාරය දත යුතුයි. දුක්ඛ අදුක්ඛ අසුඛ වේදනාවන්ගේ ආශ්වාදනීයත්වය කෙබඳු ද? විපර්යාස වශයෙන් ද සුඛ පර්යාය සද්භාවයෙන් ද එය වේ. එහෙයින්ම 'සුඛා බො ආවුසො විසාඛ වෙදනා ඨිතිසුඛා විපරිනාම දුක්ඛා, දුක්ඛාවෙදනා ඨිති දුක්ඛා විපරිනාම සුඛා, අදුක්ඛමසුඛා වෙදනා ඤාණ සුඛා අඤ්ඤාණ දුක්ඛා' යයි (චුලලවෙදල්ල සූත්‍රයේදී) කියන ලදී. එහි වේදනාවට අෂ්ටශත (එක්සිය අටක්) පර්යාය වශයෙන් ද, තෙභූමක සංස්කාරයන්ට නිකෙඛප කාණ්ඩ, රූප කාණ්ඩ වශයෙන් ද, තෘෂ්ණාවට සංකිලෙස වස්තු විභංගයෙහි ද නිකෙඛප කාණ්ඩයේ ද තණ්හා නිර්දේශ වශයෙන් ද, විපල්ලාසයන්ට සුභ සංඥා ආදී වශයෙන් දෙසැටක් වූ දෘෂ්ටි වශයෙන් ද විභාගය දතයුතුයි. ආදීනවය නම් දුක් වේදනාවයි. තෙවැදෑරුම් වූ දුක්ඛ භාවයයි. එසේ නැතහොත් සියලුම තෙභූමික සංස්කාරයෝ ආදීනවයෝය. අදින වූ ඉතා කෘපණ වූ පැවැත්ම පවතිනුයි **ආදීනව** නම්. දිළිඳු මනුෂ්‍යයාය. අනිත්‍යාදියෝගයෙන් තෙභූමක ධර්මයෝ මෙවැනි ස්වභාව ඇත්තාහ. යම්හෙයකින් එහි ආදීනවානුපස්සනය අරඹන ලද විදර්ශනාව ඇත්තවුන්ගේ භූත නය යැයි කියනු ලැබේ. එසේ ද කියන ලදී. 'යං හිකඛවෙ පඤ්චුපාදානකඛන්ධා අනිචචා දුක්ඛා විපරිනාමධම්මා. අයං පඤ්චසු උපාදානකඛන්ධෙසු ආදීනවො' යනුවෙනි. එහෙයින් දුක්ඛ සත්‍යය නිර්දේශ වූ ජාති ආදී අනිත්‍යාදියේ ආදීනවය දෙසාළිස් ආකාර වශයෙන් බෙදා නිර්දේශ කළයුතුය. මෙය කරණ කොටගෙන යේනුයි **නිස්සරණ** නම් වේ. ආර්ය මාර්ගයයි. නැතහොත් නික්මේ නුයි **නිස්සරණ** නම් වේ. නිවනයි. දෙකම සාමාන්‍ය නිර්දේශයෙන් හෝ එකකින් හෝ යෑම වේ යැයි කියන ලද්දේ වෙයි. පි ශබ්දය පළමු පදවල ද පසුපදවල ද එක්කිරීම අර්ථයයි. එහිදී ආර්ය මාර්ග පක්ෂයෙහි සතිපට්ඨාන ආදී සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේත් කායානුපස්සනා ආදියේත් නිස්සරණය ඊට ඇතුළත් ප්‍රභේද ලෙසින් බෙදා දැක්විය යුතුය. නිර්වාණ පක්ෂයෙහි දී අසංඛත ධාතුවේ නිෂ්පර්යාය විභාගයක් කෙසේවත් නැත. පර්යාය වශයෙන් වනාහි සොපාදිසේස නිරුපාදිසේස භේදයෙන් (විභාගයක් ඇත.) යම්හෙයකින් එය නිදහස් වූයේ ද පටිසම්භිදා මග්ගයෙහි දක්වන ලද ඒ චක්ඛු ආදී සදොර, රූපාදි අරමුණු හය, ඒ ඒ දොරවුවෙහි පැවති සයක්

සයක් වූ විඤ්ඤාන, ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, තෘෂ්ණා, විතර්ක, විචාරයන්, පඨවි ධාතු ආදී ධාතු සය, දස කසිණ, කෙස් ආදී දෙතිස් ආකාර ඇති අසුභයන්, පංචස්කන්ධය, දොළොස් ආයතන, අටළොස් ධාතු, ලෞකික ඉන්ද්‍රිය, කාමධාතු ආදී ත්‍රිවිධ ධාතු, කාම භව ආදී ත්‍රිවිධ භවයන්, අපපමඤ්ඤා හා ආරුප්‍ය වූ ධ්‍යාන සතර, ද්වාදශ පටිච්ච සමුප්පාද අංග යන මේ ආදී සංඛත ධර්මයන්ගේ නිස්සරණ භාවයෙන් ද බෙදා දැක්විය යුතුයි. **ඵලං** යනු දේශනා ඵලයයි. ඒ කුමක් ද? දේශනාවෙන් යමක් නිෂ්පාදනය කෙරේ ද එයයි. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවෙන් නිර්වාණාධිගමය නිෂ්පාදනය නො කෙරේ ද? නිවන ද නිස්සරණය ද මෙයින් කියන ලද්දේමය. මෙය සත්‍යයකි. එය ද පරම්පරා වශයෙනි. මෙහි දී වනාහි ප්‍රත්‍යවේක්ෂා කරන තැනැත්තාගේ දේශනා ඵලය අදහස් කරන ලදී. එය වනාහි සුතමය ඤාණයයි. ආර්ය මාර්ගයට පූර්ව භාගයෙහි වූ ප්‍රතිපත්ති වූ අර්ථ ධර්ම ඥාන ආදී ෂඩ්විධ විශුද්ධීන්ය. එකෙණෙහි ආර්ය මාර්ගයට නොපැමිණි පුද්ගලයාට වෙනත් විටෙක එය ලැබීමට හේතු වූ සම්පත්ති භව හේතුවක් වන්නේය. එහෙයින් **අතනානුදිටඨිං ඤාණවව එවං මවවුතරෝ සියා** යයි ද **ඉදං ඵලං** යයි ද **ධමෙමා භවෙ රකඛති ධම්මචාරිං** යයි ද **ඉදං ඵලං** යයි ද කියනු ලැබේ.

මේ ක්‍රමයෙන් දෙවියන් කෙරෙහි ද මිනිසුන් කෙරෙහි ද ආයුෂය, වර්ණය, බලය, සැපය, යසස, පිරිවර ආධිපත්‍යය යන සම්පත්තීහු, උපධි සම්පත්, චක්‍රවර්ති ශ්‍රීය, දිව්‍යරාජ්‍යශ්‍රීය, සතර වැදෑරුම් සම්පත් චක්‍රය, සීල සම්පත්තිය, සමාධි සම්පදාව, ත්‍රිවිද්‍යා, ෂඩභිඥා, චතු ප්‍රතිසම්භිදා, ශ්‍රාවක බෝධිය, ප්‍රත්‍යේකබෝධිය, සම්මා සම්බෝධිය යන සියලු සම්පත් පුණ්‍ය සම්භාර හේතුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව කරණ කොටගෙන සාධනය කළයුතු බැවින් ඵලය යැයි දතයුතුයි.

උපායෝ යනු ආර්ය මාර්ගයට සමීප කරුණ පූර්වභාග ප්‍රතිපදාවයි. එය වනාහි පළමු පළමු හා පශ්චිම පශ්චිම අධිගමයන්ට උපාය බැවින් පරපුර කරණ කොටගෙන මාර්ග නිර්වාණාධිගමයට ද හේතුවන බැවින් උපාය නම් වේ. යමක් මූලින් කියන ලද ඵලය අවබෝධ කරගැනීමට උපාය ප්‍රතිපත්තිය වේ ද, ඇතැමෙක් විදර්ශනාව සමග ඒ මාර්ගය උපාය යැයි කියත්. ඔවුන්ගේ අදහස අනුව නිස්සරණ යනු නිවනමැයි කියන ලද්දේ වන්නේය. ඵලය මෙන් උපාය ද පූර්වභාගය යැයි කියන ලද්දේ වන්නේය. **සබබෙ ධම්මා** -පෙ- **විසුදධියාති අයං උපයෝ** යි යමක් කියනු

ලැබේ ද, මෙහි ද පූර්වභාග පටිපදාවම ගෙනහැර දක්වන ලදැයි දැනගන්නට පුළුවන. යම්හෙයකින් **තෙ පහාය තරෙ ඔඝං, ඉදං නිසඝරණං** යි ආර්ය මාර්ගයේ නිස්සරණ භාවය කියනු ලැබේ ද ඒ ආර්ය මාර්ගයම ඕඝතරණය වේ. **ආණතති** යනු හික්මවිය යුතු ජනයාගේ හිතසිද්ධිය පිණිස මෙසේ පිළිපදින්න යනුවෙන් වූ අණ දීමට සුදුසු භාග්‍යවතුන් වහන්සේගේ විධානයයි.

එසේම **සුඤඤතො ලොකං අවෙකඛසසු මොඝරාජා ති ආණතති** යි කියනු ලැබේ. **යොගිනං** යනු චතුසත්‍ය කර්මස්ථාන භාවනාවෙහි යෙදුණු විනේය ජනයාගේය. **අභාය** යනු වචන ශේෂයකි. **දෙසනා හාරො** යනු මුලින් කියන ලද මේ ආශ්වාද ආදියේ බෙදීම් ලක්ෂණය වන සංවර්ණනා විශේෂය දේශනා හාර නම් වේය අර්ථයයි. මෙහිදී කියන ලදී. ඒ ඉතිරි වූ ආශ්වාද ආදියේ කවර වචනයක් දේශනාහාරය වේ ද? නැතහොත් එක් පිරිසකගේ ද? ඉතිරි නොවූ දෙයෙහිමය. යම් සූත්‍රයක ආශ්වාද ආදීනව නිස්සරණයන් ස්වරූප වශයෙන් ආයේ ද එහි කිවයුතු දෙයක් නැත. යම් සූත්‍රයක ස්වරූප වශයෙන් නොව ඒකදේශ වශයෙන් පැමිණියේ ද එහි නොපැමිණි දෙය අර්ථ වශයෙන් වෙන්කොට හාරය යෙදිය යුතුය. මේ අර්ථය දේශනාහාර විභංගයෙහි එන්නේයැයි මෙහි දී විස්තර නොකරන ලදී.

යං පුචඡිතං යනු යම් විමසීමකි. **විචයමානා** යනු වචන ශේෂයකි. **විසසජඡිතං අනුගීති** යන මෙහිද මේ ක්‍රමයමැයි. එහි **විසසජඡිතං** යනු විසඳීමයි. එය ඒකංස ව්‍යාකරණ ආදී වශයෙන් සිව්වැදෑරුම් ව්‍යාකරණයයි. **ච** ශබ්දය සම්පිණ්ඩනය කිරීම අර්ථයයි. එයින් ගාථාවෙහි නොකියන ලද පදාදිය ගණන් ගැනෙයි. ඒ ඇසීම හා විසඳීම කවරක ද? සූත්‍රයේ යැයි කියන ලදී. මෙයින් සූත්‍රයේ ආ පුච්ඡා විස්සජ්ජනය විමසිය යුතුයයි දක්වයි. **යා ච අනුගීති** යි කියන ලද අර්ථයේම යම් පසු ගායනයක් වේ ද එය අනුගීති නම්. සංග්‍රහ ගාථාවයි. විමසීමට අනුරූප වූ හෝ ගීතියයි. මෙයින් පෙර පසුව ගන්නා ලදී. යමක් පුච්ඡානුසන්ධි යයි කියනු ලැබේ ද ව්‍යාකරණයේ පිළිවිසීම් අනුරූපතාව මෙහි පුබ්බාපර නම් වේ.

පුරිමං සුතතසස යන පදය මුල බලමින් නැවත සූත්‍රයේ යැයි කියන ලදී. එයින් සූත්‍රයට ආශ්‍රය වූ ආශ්වාද ආදිය අල්ලා ගනී. මෙපමණකින් විචය හාරයේ විෂය නිරවශේෂ වශයෙන් දක්වන ලද්දේ

වෙයි. එසේම විචයහාර විභංගයෙහි **පදං විචිනති** -පෙ- **අනුගීතිං විචිනති** යි කියනු ලැබේ. ඒ සූත්‍රයෙහි සියලු පදයන්ගේ අනුපිළිවෙළින් අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද වූ විමසීම පදවිචයයි. මේ පෘථග්‍යාවයි. අදිටඨජෝතන, දිටඨ සංසන්දන, විමතිවෙච්ඡේදන, අනුමති පුවඡන, කථෙතු කම්‍යතා පුවඡන, සත්‍ථාධිටඨාන, ධම්මාධිටඨාන, එකාධිටඨාන, අනෙකාධිටඨාන, සම්මුති විසය, පරමත්‍ථ විසය, අතීත විසය, අනාගත විසය, වර්තමාන විසය යනාදියෙන් පුච්ඡා විචය දතයුතුය. මේ විසඳීමයි. ඒකංස ව්‍යාකරණය, විභජ්ජ ව්‍යාකරණය, **පටිපුච්ඡා** ව්‍යාකරණ, ඨපනය, සාවසේස, නිරවසේස, **සඋත්තර, අනුත්තර,** ලෞකිය, ලෝකුත්තර යනාදියෙන් විස්සජ්ජන **විචය වේ.**

මේ විමසීම මේ සමග ගැළපෙයි. මෙය සමග නොගැළපෙයි යනුවෙන් විමසන ලද අර්ථය ගෙනවුත් විචයය පූර්වාපරව සසඳ විමසීම පුබබාපර විචයයි. මේ අනුගීතියයි. වුත්තත්‍ථ සංගහ අවුත්තත්‍ථ සංගහ, තදුභයත්‍ථ සංගහ, කුසලත්‍ථ සංගහ, අකුසලත්‍ථ සංගහ ආදියෙන් අනුව ගැයීම අනුගීති විචයයයි. ආශ්වාදාදියෙහි සුබ වේදනාවෙහි ඉෂ්ට අරමුණු අනුභව කිරීම් ලක්‍ෂණය යනාදියෙන්, තෘෂ්ණාවෙන් අරමුණ ගැනීම් ලක්‍ෂණය ආදියෙන්, විපර්යාසයන්ගේ වෙනස්ව ගැනීම් ලක්‍ෂණය ආදියෙන්, ඉතිරි තෙහුමක ධර්මයන්ගේ ඇති ස්වභාව ලක්‍ෂණය ආදියෙන් සියලු දෙවිසි තිකවල ද දුක එකසිය විසිදෙකෙහිද ලැබෙන පද ලෙසින්, ඒ ඒ ආශ්වාද අර්ථ විශේෂ වෙන්කිරීම අස්සාද විචයයි. දුක් වේදනාවෙන් අනිටු දේ අනුභව කිරීම් ලක්‍ෂණයේ ආදියෙන්, දුක්ඛ සත්‍ය ධර්මයන්ගේ ප්‍රතිසන්ධි ලක්‍ෂණය ආදියෙන්, අනිත්‍ය බව ආදියේ අග මුල ඇති බැවින් අනිත්‍යය යන කථාවේ අනිත්‍යය යනාදියෙන්, සියලු ලෞකික ධර්මයන්ගේ සංකිලෙස භාගිය, හාන භාගිය බව ආදී වශයෙන් ආදීනව කීම තුළින් ලාමක භාවය වෙන් කිරීමෙන් ආදීනව විචය වෙයි.

නිස්සරණයට කරුණු වූ ආර්ය මාර්ගයට පැමිණෙන හෙයින් කායානුපස්සනා ආදී වූ පූර්වභාග ප්‍රතිපදා විභාග විශේෂයන් නිර්ධාරණය කිරීම් වශයෙන් ද යන මේ ක්‍රමයෙන් නිස්සරණ සෙවීම වේ. ඵලාදීන්ගේ ඒ ඒ සූත්‍ර දේශනා මගින් සාධනය කළයුතු ඵලයෙහි ද ඊට උපාය වූ ඒ ඒ සූත්‍ර වචනයේ ද විභාගය නිර්ධාරණය කිරීම් වශයෙන් සෙවීම් දතයුතුයි. මෙසේ පදයන් පිළිබඳ ඇසීම් විසඳීම් පූර්වාපර අනුගීතීන්ගේ ආශ්වාද

ආදීනවයන් ද විශේෂ නිර්ධාරණ, වශයෙන්ම සෙවීම් ලක්ෂණය විචයහාරය යැයි දතයුතුයි.

සබෙබසං යනු දහසයෙහිය. **භූමි** යනු ව්‍යඤ්ජනය සඳහා කියන ලදී. ව්‍යඤ්ජනය වනාහි මූලපදයන් මෙන් නයවලට හා හාරයන්ට භූමි වෙයි. ප්‍රවෘත්ති ස්ථානයකි. ඒවායේ ව්‍යඤ්ජන විචාරභාවය නිසාය. **හාරා ව්‍යඤ්ජන විචයෝ** යැයි කියන ලද්දේමය. පේටකෝපදේශයේ ද 'යඤ්ච සබෙබ හාරා, සම්පතමානා නයනති සුතතපථං ව්‍යඤ්ජන විධි පුථුතතා' යැයි කියන ලදී. **ගොචරෝ** යනු සූත්‍රාර්ථයයි. සූත්‍රයේ පදාර්ථයන් උපුටා දැක්වීම් මුඛයෙන් හාරයන් යෙදීමයි. **තෙසං** යනු ව්‍යඤ්ජනාර්ථයන්ගේය. **යුත්තායුත්තපරිකබා** යනු සුදුසු දෙයෙහි ද නුසුදුසු දෙයෙහි ද විමසා බැලීමයි. **යුත්තායුත්ති පරිකබා** යයි ද පාඨයක් වේ. යුක්ති අයුක්තීන්ගේ විචාරය යන අර්ථයයි. ඔවුන්ගේ යුක්තායුක්තභාවය දැනගැනීම කෙසේ වේ ද? සතර මහාපදේශයන් නොනැසීමෙනි. එහි ව්‍යඤ්ජනයන්ගේ ස්වභාව නිරුක්ති භාවය ද අධිප්‍රේතාර්ථය ප්‍රකාශ කරවන බව ද යුක්ත භාවයයි. සූත්‍ර විනය ධර්මතාවන්ගෙන් අර්ථය නොනැසීමයි. මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය වනාහි පසුව ප්‍රකට වන්නේය. **හාරෝ යුත්තීති නිද්දිට්ඨෝ** යනු මෙසේ සූත්‍රයෙහි ව්‍යඤ්ජනාර්ථයන්ගේ යුක්තායුක්ත භාවය විභාවනය කරන ලක්ෂණය **යුත්ති හාරය** යැයි දතයුතුය යනුයි.

ධම්මං යනු සූත්‍රාගත යම්කිසි කුසලාදී ධර්මයක් කියන ලදී. **තස්ස ධම්මස්ස** යනු ඒ කුසලාදී ධර්මයටය. **යං පදට්ඨානං** යනු යෝනිසෝ මනසිකාර ආදී වූ සූත්‍රයේ ඇති හෝ නොමැති යම් කරුණක් සම්භවයෙන් උදුරා කිය යුතුය යන අදහසයි. **ඉති** යනු මෙසේය. කියන ලද ක්‍රමයෙන් යන අර්ථයයි. **යාව සබ්බධම්මා** යනු ඒ සූත්‍රයේ ආ යම් පමණ කරුණු වේ ද ඒ සියල්ලේම ද යථානුරූපී වූ පදස්ථානය උදුරා කියයුතුය යන අදහසයි. එසේ නැතහොත් **යාව සබබ ධම්මා** යනු සූත්‍රාගත ධර්මයේ යම් පදස්ථානයක් වේ ද එහි ද යම් පදස්ථානයක් යැයි සම්භවයෙන් සියලු ධර්මයෝ යම් පමණක් පදස්ථාන විචාරය කළයුතුය යන අර්ථයයි. **එසෝ හාරෝ පදට්ඨානෝ** යනු සූත්‍රයේ ආ කරුණුවලට පදස්ථාන වූ ධර්මයෝ ඒවාට ද පදස්ථාන වූහයි සම්භ වන බැවින් පද ස්ථාන වූ ධර්මයන් නිර්ධාරණය කරන ලක්ෂණය **පදට්ඨාන** නම් වේ. **හාරය** යන අර්ථයයි.

වුත්තමහි එකධමෙම යනු කුසලාදි වූ හෝ ස්කන්ධාදී වූ හෝ යම්කිසි එක් කරුණක් කියවෙන සූත්‍රයක ස්වරූප වශයෙන් හෝ නිර්ධාරණ වශයෙන් හෝ කියන ලද දෙයෙහිය. **යෙ ධම්මා එක ලකඛණා කෙචි** යනු යම්කිසි ධර්මයෝ කුශලාදිභාවයෙන් හෝ රූපස්කන්ධාදී ස්වභාවයෙන් හෝ ඒ ධර්මය හා සමාන ලක්‍ෂණ ඇති යනුයි. **වුත්තා භවන්ති සබෙබ** යනු ඒ සියල්ලම කුශලාදී ස්වභාව හෝ ස්කන්ධාදී ස්වභාව හෝ ඇති ධර්මයෝ සූත්‍රයේ නොකියන ලද මුත් ඒ සමාන ලක්‍ෂණ ඇති බැවින් කියන ලද්දෝ වෙත්. රැගෙන වර්ණනා කිරීම් වශයෙන් යන අදහසයි. මෙහි ද **එකලකඛණා** යනු හේතු වශයෙන් ද සමාන ප්‍රතිඵල වශයෙන් ද සමාන අරමුණු වශයෙන් ද මේ ආදී වූ නොකියන ලද දෙයෙහි ද කියන ලද දෙයෙහි මෙන් නිර්ධාරණය දතයුතුයි.

සො හාරො ලකඛණො නාම යැයි මෙසේ සූත්‍රයේ නොආ කල්හි ද ධර්මයේ කියන ලද ආකාරයෙන් පැමිණි කල්හි මෙන් නිර්ධාරණය කොට යම් සංවර්ණනාවක් වේ ද එය **ලකඛණා** නම් **හාරය** යන අර්ථයයි.

නෙරුත්තං යනු නිරුක්තියයි. පද නිර්වචනය යන අර්ථයයි. **අධිපපායො** යනු බුදුවරුන්ගේ හෝ ශ්‍රාවකයන්ගේ ඒ සූත්‍රය දේශනා කළ අයගේ අදහසයි. **බ්‍යඤ්ජනං** යනු ව්‍යඤ්ජනයෙනි. එය කරණාර්ථයේ ප්‍රථමා වචනයකි. ඒකාන්තයෙන් සියලු හාරයෝ බ්‍යඤ්ජන විචය වේ. විශේෂ වශයෙන් මෙය වනාහි ව්‍යඤ්ජන වාරයෙහිම අර්ථ සෙවීම කොට ව්‍යඤ්ජනය යැයි කියන ලදී. එහෙයින්ම **බ්‍යඤ්ජනෙන සුත්තස්ස නෙරුත්තඤ්ච අධිපපායො ච නිදානඤ්ච පුබබාපරානුසන්ධිච ගවෙසිතබබා** යැයි කියනු ලැබේ. **අථ** යනු පද පූරණ නිපාත මාත්‍රයකි. **දෙසනා නිදානං** යනු, ඵලය ගෙන දෙයි යනු **නිදානයයි**. කාරණයයි. යම් කරුණකින් දේශනාව පැවැත්තේ ද එය දේශනාවේ ප්‍රවෘත්ති නිමිත්තය යන අර්ථයයි. **පුබබාපරානුසන්ධි** යනු පූර්වයෙන් ද පසුව ද වූ අනුසන්ධියයි. පුබබාපරෙන **සන්ධි** යැයි ද පාඨයකි. සූත්‍රයේ මුල් කොටස පසු කොටස හා සසඳ ප්‍රකාශ කිරීම යන අර්ථයයි. සංගීති වශයෙන් හෝ පූර්වාපර වූ වෙනත් සූත්‍රවලින් සංවර්ණනා කරනු ලබන සූත්‍රයේ සැසඳීම පූර්වාපර අනුසන්ධියයි. පූර්ව පදය හා පර පදය අතර යම් සම්බන්ධයක් වේ නම් මෙය ද පූර්වාපර අනුසන්ධියයි. **එසො හාරො චතු බ්‍යූහො** යනු මෙසේ නිර්වචන අධිප්‍රායාදී සතරේ විභාවන ලක්‍ෂණය **චතුබ්‍යූහ හාර** නම් වේ යන අර්ථයයි.

එකමහි පදට්ඨානෙ යනු ආරම්භ ධාතු ආදී වූ එකෙක්හි පරක්කම ධාතු ආදීන්ගේ පදස්ථාන වූ ධර්මයක් දේශනාවට නැංවුණු කල්හිය. **පරියෙසති සෙසකං පදට්ඨානං** යනු එය අසමාන බැවින් නොගැන්මෙන් හෝ සෙස්ස ප්‍රමාදාදීන්ගේ සමීප කරුණු නිසා පදස්ථාන භූත වූ දක්ෂ බව ආදී වෙනත් ධර්මයක් සොයයි. ප්‍රඥාවෙන් ගවේෂණය කරයි. සොයා සංවර්ණනාව හා යොදමින් දේශනා කිරීමයි. **ආවට්ටති පටිපකෙබ** යනු වීර්යාරම්භාදී මුඛයෙන් පටන්ගත් සූත්‍රය කියන ලද ක්‍රමයෙන් ප්‍රමාදාදි වශයෙන් දක්වමින් දේශනාවට ප්‍රතිපක්ෂ බැවින් කැරකෙයි. **ආවට්ටො නාම සො හාරො** යනු දේශනාවෙන් ගන්නා ලද ධර්මයන් සභාග විෂභාග ධර්ම වශයෙන් කැරකෙන ලක්ෂණය **ආවට්ට හාර** නමැයි යන අර්ථයි.

ධම්මං යනු ස්වභාව ධර්මයයි. එය කුසල ආදී වශයෙන් නන් වැදෑරුම්ය. **පදට්ඨානං** යනු යමක පිහිටියාහු, උතුරු ගුණ විශේෂයන් ලබයි නම් ඒ විශේෂ අධිගමයට කරුණු වන දේය. **භූමිං** යනු පෘථග්ජන භූමිය දර්ශන භූමිය යන මේ ආදී වූ භූමියයි. **විභජතෙ** යනු විභාග වශයෙන් කියයි යනුයි. **සාධාරණෙ** යනු දර්ශන ප්‍රහාතව්‍ය ආදී නාම වශයෙන් හෝ පෘථග්ජන සෝවාන් ආදී වස්තු වශයෙන් හෝ සාධාරණ දෙයෙහිය. අවිශිෂ්ට වූ සමාන වූ යන අර්ථයයි. කියන ලද ක්‍රමයෙන් අසාධාරණයන් දතයුතුයි. **නෙයෙහා විහනති** යනු ප්‍රකාශ කරන ලද ධර්මාදීන්ගේ බෙදීමයි. මෙම හාරය විහත්ති යැයි දතයුතුය යන අර්ථයයි. එහෙයින් අපිරිසිදු ධර්මයන් ද පිරිසිදු ධර්මයන් ද සාධාරණ අසාධාරණ වශයෙන් ද පදස්ථාන වශයෙන් ද භූමි වශයෙන් ද බෙදා දක්වන ලක්ෂණය **විහනති හාරය** යැයි දතයුතුය.

නිද්දිට්ඨො යනු කියන ලද්දෙහිය. සූත්‍රයේ ආ හෝ සංවර්ණනා කරන ලද දෙයෙහිය. **භාවිතෙ** යනු යම්සේ උපන්නා හා සමාන දේ උපන්නේ යැයි කියනු ලැබෙත් ද මෙසේ භාවිතයට සමාන වූ යනුයි. **පහිණො** යන මෙහි ද මේ ක්‍රමයමැයි. **පරිවත්තති පටිපකෙබ** යනු කියන ලද ධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ යමක් වේ ද ඒවාට අනුව පරිවර්තනය වෙයි යන අර්ථයයි. මෙසේ නිර්දේශ කරන ලද ධර්මයන්ට ප්‍රතිපක්ෂව පෙරලෙන සුලු ලක්ෂණය **පරිවත්තන හාරය** යැයි දතයුතුය.

එකම අර්ථයක විවිධ වචන යෙදීම විවචන නම්. විවචනයන්ම

වෙවචන නම් වේ. පර්යාය ශබ්ද යන අර්ථයයි. ඒ වේවචනයන්ය. **බහූනි** යනු නොයෙක් යනුයි. **තු** ශබ්දය අවධාරණයෙහිය. එහෙයින් බොහෝ පර්යාය ශබ්දයෙන් වේවචනභාරය යෙදීමේදී කිවයුතුය. කිහිපයක් යැයි නොදක්වයි. **සුතෙන වුත්තානි** යනු නවවැදෑරුම් සූත්‍රාන්ත සංඛ්‍යාත ත්‍රිපිටක බුද්ධවචනයෙහි කියන ලද්දේය. මෙහිදී ද **තු** ශබ්දයේ අර්ථය ගෙනවුත් යෙදිය යුතුය. එහෙයින් පෙළෙහි ආ වේවචනයන්ම ගතයුතු යැයි කියන ලද්දේ වෙයි. **එකධම්මසස** යනු එක් පදාර්ථයකය. **යො ජානාති සුතත්විදූ** යනු යම් සේ ගිතෙල් ගැන දනිහිදැයි කී කල්හි ගිතෙලින් විචාරහි ද ගිතෙල් දෙවු යැයි අණකරයි යන අර්ථයයි. මෙසේ සූත්‍රයෙහි දක්ෂ යම් ධර්ම කථිකයෙක් එක් පදයක බොහෝ පර්යාය ශබ්ද විමසයි ද විභාවනය කරයි ද යොදයි ද යන අර්ථයයි. **වෙවචනො නාම සො හාරො** යනු ඒ අර්ථය ගැන කියන ලද ආකාර ඇති පර්යාය ශබ්ද යෙදීම් ලක්ෂණය වේවචන හාර නම් වේ. එහෙයින් එක් අර්ථයක නොයෙක් පර්යාය ශබ්ද යෙදීම් ලක්ෂණය **වෙවචන හාර** නම් වේ.

ධම්මං යනු ස්කන්ධාදී ධර්මයෝය. **පඤ්ඤත්තිනිහි** යනු පණවන ලද ප්‍රකාර වශයෙන් හඟවන ලද හෝ අසංකර වශයෙන් තබන ලද දේවලින් යනුයි. **විවිධාහි** යනු බහාතැබීම ආදී වශයෙන් නන් වැදෑරුම් ලෙසිනි. **සො ආකාරො** යනු එකම අර්ථයට නික්ඛිප්ප ප්‍රභව ප්‍රඥප්ති ආදී වශයෙන් නොයෙක් ප්‍රඥප්තීන්ගෙන් පනවන ආකාරයයි. **ඤෙය්‍යා පඤ්ඤත්ති නාම හාරො** යනු පඤ්ඤත්ති නම් හාරය යැයි දතයුතුය යනුයි. එහෙයින් එක් එක් ධර්මය නොයෙක් ප්‍රඥප්තීන්ගෙන් පැනවිය යුතු ආකාරය ප්‍රකට කරන ලක්ෂණය පඤ්ඤත්ති හාරය යැයි දතයුතුය.

පටිච්චුපපාදො යනු ප්‍රතීත්‍ය සමුත්පාදයයි. **ඉන්ද්‍රියබන්ධා** යනු ඉන්ද්‍රියයෝ ද ස්කන්ධයෝ ද යනුයි. **ධාතු ආයතනානි** යනු ධාතූහු ද ආයතනයෝ ද යනුයි. **එතෙහි** යනු දොළොස් පදයක් ඇති යම් ප්‍රත්‍යයාකාරයක් වේ ද යම් දෙවිසි ඉන්ද්‍රියයෝ වෙත් ද යම් පංචස්කන්ධයක් වේද යම් අටළොස් ධාතූහු වෙත් ද යම් දොළොස් ආයතනයක් වේ ද ඒවායින් සූත්‍රාගත පදාර්ථවලට අනුව නිර්ධාරණය කරන යනුයි. **ඔතරති යො** යනු යම් සංවර්ණනා න්‍යායක් බැස ගනී ද එයයි. පටිච්චසමුප්පාදාදියට අනුප්‍රවේශ වේ යන අර්ථයයි. **ඔතරණො නාම සො හාරො** යනු පෙර කියන ලද යම් සංවර්ණනා විශේෂයක් වේ ද එය ඔතරණ හාර නම් වේ. මෙහි **ච** ශබ්දයෙන් සුඤ්ඤතමූල ආදී ගාථාවෙහි නොකියන ලද

කරුණු වලද සංග්‍රහය දතයුතුය. මෙසේ පටිච්චසමුප්පාද ආදී ප්‍රමුඛ වූ සූත්‍රාර්ථවල ඔතරණ ලක්‍ෂණය **ඔතරණ හාරය** නම් වේ යැයි දතයුතුය.

විසඤ්ඡනමහි යනු බුද්ධාදීන් විසින් විවරණය කරන ලද විට යනුයි. **පඤ්හෙන** යනු දැනගන්නට කැමති අර්ථයේය. **ගාථායං** යනු ගාථාවට නගන ලද්දෙහිය. මෙය ද විමසන්නාහු ගාථා බන්ධන වශයෙන් විමසතියි කියන ලදී. **යමාරමභාති** යනු ඒ ගාථාව යම් අර්ථයක් අරභයා / හේතු කරගෙන විමසන ලද ද ඒ අර්ථයේය. **සුද්ධාසුද්ධපරිකබා** යනු පදය ශෝධනය කරන ලදී. ආරම්භය ශෝධනය නොකරන ලදී. පදය ද ශෝධනය කරන ලදී. ආරම්භය ද ශෝධනය කරන ලදැයි මෙසේ පා දාදීන්ගේ ශෝධිත අශෝධිත භාවය විමසීමයි. **හාරෝ සෝ සොධනෝ** නාම යනු කියන ලද පරිදි සොධන විචාර හාරයයි. මෙසේ සූත්‍රයේ පද පදාර්ථ ප්‍රශ්න ඇරඹුම් ආදියේ ශෝධන ලක්‍ෂණය **සොධන හාරය** යැයි දතයුතුයි.

එකනතාය යන්න (මෙසේ විග්‍රහ වේ.) එක් දෙයක ස්වභාවය එකත්ත නම් වේ. එකක් බවම එකත්තතා නම්. ඒ ඒකත්තතාවෙන්ය. මෙහි ඒක ශබ්දය සමාන ශබ්ද පර්යායකි. එහෙයින් සමානත්‍වයෙන් යන අර්ථයයි. විශිෂ්ට වූ ප්‍රමාණය විමත්ත නම්. විමත්ත බව ම වේමත්ත නම්. එහි ස්වරූපය වෙමත්තතාවයි. ඒ වේමත්තතාවෙනි. විශේෂයෙන් යන අර්ථයයි. **තෙ න විකපපයිතබබා** සාමාන්‍යයෙන් ද ජාති ජරා කාම තණ්හා භව තණ්හා ආදී වශයෙන් විශේෂයෙන් ද සූත්‍රයෙහි දේශනා කරන ලදී. මෙහි ඒ සාමාන්‍ය භාවය නම් කුමක් ද? කවර නම් විශේෂයක් ද? මෙසේ සාමාන්‍ය විශේෂතා දැක්වීම් වශයෙන් විකල්පනය නොකළ යුතුය. කවර හෙයින් ද? සාමාන්‍ය විශේෂ කල්පනයෙන් ව්‍යවහාරත්‍වයෙන් කාල දිශා විශේෂයන්ගේ අනවස්ථානයෙන් මෙන් අපේක්‍ෂාවන් සිද්ධවන බැවිනි. යම්සේ වනාහි අද ඊයේ හෙටයැයි කියනු ලබන්නේ කාල විශේෂයෝ නොවෙනස් ස්වභාව ඇත්තෝය. පෙරදිග පැසුළු දිග යැයි කියනු ලබන්නේ දිශා විශේෂය ද කියවේ. සාමාන්‍ය විශේෂ දෙක ද මෙබඳුය. එසේම මේ දුක යැයි කියනු ලබන්නේ ජාති ආදිය අපේක්‍ෂාවෙන් සත්‍යාපේක්‍ෂාවෙන් විශේෂ වෙයි. සමුදය ආදියේ ද මේ ක්‍රමයමැයි. **එසො හාරෝ අධිට්ඨානෝ** යනු මෙසේ සූත්‍රාගත ධර්මයන් අවිකල්පන වශයෙන් සාමාන්‍ය විශේෂතා දැක්වීමේ ලක්‍ෂණය අධිට්ඨාන නම් හාරය නමැයි යන අර්ථයයි.

යෙ ධම්මා යනු අවිද්‍යා ආදී වූ යම් ප්‍රත්‍ය ධර්මයක් වේ ද ඒවාය. **යං ධම්මං** යනු සංස්කාර ආදී වූ යම් ප්‍රත්‍යුත්පන්න (හේතුවලින් හටගත්) ධර්මයක් වේ ද, ඒවාය. **ජනයනති** යනු නිපදවත් යනුයි. **පච්චයා** යනු සහජාත ප්‍රත්‍ය වශයෙන් වූ ස්වභාවයෙනි. **පච්චයා** යනු සහජාත ප්‍රත්‍ය වශයෙන් වූ ස්වභාවයෙනි. **පරම්පරතො** යනු පරම්පර ප්‍රත්‍ය ස්වරූපයෙනි. අනුරූපව සන්තානයේ ගැටීම් වශයෙන් ප්‍රත්‍ය වී යන අර්ථයයි. උපනිශ්‍රය කෙළවරම මෙහි දී අදහස් කරන ලදී. පළමුවැන්නෙහි ඉතිරි වූ ප්‍රත්‍ය ස්වරූපයයි. **හෙතුම්වකඩඪයිත්වා** යනු කියන ලද ප්‍රත්‍ය සංඛ්‍යාත වූ ජනක ආදී වශයෙන් වෙන් වූ ඒ හේතුව ඇදගෙන සූත්‍රයෙන් උපුටා යම් සංවිර්ණනා සංඛ්‍යාත විවරණය කෙරෙයි ද එයයි. **එසො හාරො පරිකඛාරො** යනු මෙසේ සූත්‍රයෙහි ආ ධර්මයන් පරික්ඛාර සංඛ්‍යාත හේතු ප්‍රත්‍යයෙහි නිර්ධාරණය කොට වර්ණනා කිරීම ලක්ෂණයයි. **පරිකඛාර** හාරෝ යන අර්ථයයි.

යෙ ධම්මා යනු යම් සීලාදී ධර්මයක් වේ ද එයයි. **යං මූලා** යනු සමාධි ආදී වූ යමක මූල හේතුව වූ යනුයි. ඒවා ඒ සමාධි ආදීන්ට හේතුවන බැවිනි. **සමාරොපයිතබබා** යනු සම්බන්ධයයි. **යෙ චෙකඛා පකාසිනා මුනිනා** යනු රාග විරාග වෙතො විමුත්ති සෙකඛඵල කාමධාතු සමතික්කමන ආදී ඒකාර්ථවත් යම් ශබ්දයක් අනාගාමී ඵලය පිණිස බුද්ධ මුනීන්ද්‍රයන් විසින් දක්වන ලද ද එය යනුයි. ඒවා අනෙකාන්‍ය වූ සමාන වචන ලෙස දැක්විය යුතුය යන සම්බන්ධයයි. මෙහි සමාරෝපණය යනු සූත්‍රයෙහි කියන ලද පරිදි හෝ නිර්ධාරණය කිරීම් වශයෙන් හෝ ගනු ලබන ශික්ෂාත්‍රය සංඛ්‍යාත වූ සීලාදී කොටස් තුනට සමාන වචන දැක්වීම් වශයෙන් භාවනා පරිපූර්ණත්වය පිළිබඳ ප්‍රකාශ කථනයයි. භාවනා පරිපූර්ණත්වය ද ප්‍රහාණය කළ යුතු දේ ප්‍රහානය කිරීමෙන් වූ ප්‍රහාණ සමාරෝපණය ද අර්ථ වශයෙන් දක්වන ලද්දේම වේ. **එස සමාරොපනො හාරො** යනු සූත්‍රාගත ධර්මයන් පිළිබඳ මේ පදවියාන වෙවචන භාවනා ප්‍රහාණ සමාරෝපනයන් විමසීමේ ලක්ෂණයයි. **සමාරොපන** නම් හාරය යන අර්ථයි.

මෙසේ ගාථා පබැඳීම් වශයෙන් සෝළස (16) හාරයන් දක්වා දැන් නය දක්වන්නට **තණහඤඤව** යනාදිය කියන ලදී. එහි **තණහඤඤව අවිජජමපි ච** යනු සූත්‍රයෙහි ආ අර්ථ වශයෙන් හෝ නිර්ධාරණය කිරීම් වශයෙන් හෝ ගන්නා ලද තෘෂ්ණාව හා අවිද්‍යාවයි. **යො නෙති** යනු

සම්බන්ධයයි. **යො** යම් සංවර්ණනා විශේෂයක් වේ ද එය **නෙති** පමුණුවයි. සංකිලේස පක්ෂයට පමුණුවයි. සංකිලේස වශයෙන් සූත්‍රාර්ථය යොදයි යන අධිප්‍රායයි. **සමථෙන** සමාධියෙන්. **විපසසනාය** ප්‍රඥාවෙන් යමෙක් පිරිසිදු බවට පමුණුවනුයේ තණ්හාව ද අවිද්‍යාව ද භවයට මුල්වන බැවින් සමුදය සත්‍යයයි. ඉතිරි තෙභූමක ධර්ම දුක්ඛ සත්‍යයයි. සමථය හා විදර්ශනාව මාර්ග සත්‍යයයි. එයින් පැමිණිය යුතු අසංඛත ධාතුව නිරෝධ සත්‍යයයි. මෙසේ යමෙක් මේ සිව්සස් දිනා ද එය **සවෙභි යොඡයිත්‍වා** (යනුයි.) නම් වේ. මේ නය නන්දියාවට්ට නම් වේ. යමක් තෘෂ්ණා අවිද්‍යාවන්ගෙන් සංකිලේස පක්ෂය වූ සූත්‍රාර්ථයට ද සමථ විදර්ශනාවන්ගෙන් වොදාන පක්ෂයට ද චතුසත්‍ය යෙදීම් මුඛයෙන් චක්ඛු ලක්ඛණයට ද යොමු වේ ද මේ සංවර්ණනා විශේෂය නන්දියාවට්ට නයය යන අර්ථයයි. මෙහි දී නයෙහි භූමිය ගාථාවේ දී නයො යැයි කියන ලදී. එහෙයින් සංවර්ණනා විශේෂයකැයි කියන ලදී. අර්ථ නය සංවර්ණනාව නොවේ. චතු සත්‍යය අවබෝධ කරන්නහුට අනුරූප වූ පූර්ව භාගයෙහි අනුව බැසගන්නා නය අර්ථ නය නම්. එහි උග්ඝටිතඤ්ඤු ආදීන්ගේ වශයෙන් තෘෂ්ණා ආදි ආකාරයෙන් යම් නය භූමි රචනයක් වේ ද එහි නය වොහාරය වේ.

අකුසලෙ යනු දොළොස් සිතකින් සංග්‍රහ වූ සියලු අකුශල ධර්මයන්හිය. **සමූලෙහි** යනු සිය මූලයන්ගෙනි. ලෝභ ද්වේෂ මෝහයන්ගෙන් යන අර්ථයයි. **කුසලෙ** යනු චතුභූමක සියලු කුසල ධර්මයන්හිය. **කුසල මූලෙහි** යනු අලෝභ ආදි කුසල මූලයන්ගෙනි. **යො නෙති** යනු කුශලාකුශල ගෙන යනු ලබන්නේ මායා මිරිඟු ආදිය මෙන් නොවූ දෙයක් නොවේයැයි භූතය ද පටසට ආදිය මෙන් සම්මුති සත්‍ය මාත්‍රයක් නොවේ යන තථ්‍ය ද අකුසලයේ ඉෂ්ට විපාක බැවින් ද කුසලයේ අනිටු විපාක බැවින් ද විපාකය ඇතිවිට විවාදයක් නැති බැවින් අවිතථ්‍ය ද (පමුණුවයි) ගෙනයයි. මෙසේ මේ ත්‍රිවිධ පදයන්ගේ කුසල අකුසල විශේෂණත්වය දතයුතුය. එසේ නැතහොත් අකුසල මූලයන්ගෙන් අකුසලයන් ද කුසල මූලයන්ගෙන් කුසලයන් ද ගෙනයනු ලබන්නේ මේ නය භූත තථ අවිතථ යන දේ ගෙනයනු ලබයි. සිව්සස් නිර්ධාරණය කොට යොදයි යන අර්ථයයි. දුක්ඛාදිය බාධකාදිය ඇති බැවින් අන්‍යථා භාවයක් නැති නිසා භූතයන් සත්‍ය බැවින් තථ වේ. නොබොරු බැවින් අවිතථ්‍ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ද 'මහණෙනි, තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ මේ කරුණු සතරක් වෙති'යි කියන ලදී. **නිපුකබලං නං**

නයං ආහු යනු යම් නය ලක්ෂණයක් අකුසල මූලයන්ගෙන් සංකිලෙස පක්ෂය ද කුසල මූලයන්ගෙන් වොදාන පක්ෂය ද චතුසත්‍යයෝජන මුඛයෙන් සූත්‍රාර්ථය ද සංවර්ණනා විශේෂ වේ ද එය තිපුකඛල නය යැයි කියති යන අර්ථයයි.

විපල්ලාසෙහි යනු අසුභයෙහි සුභය ආදී වශයෙන් පැවති සතර විපර්යාසයන්ගෙන්ය. **කිලෙසෙ** යන තැන කෙළෙසත්, බාධා කරත්නුයි කිලෙස නම් වේ. සංකිලිෂ්ට ධර්මයෝය. **සංකිලේස** පක්ෂය යන අර්ථයයි. ඇතැමෙක් **සංකිලෙසෙ** යැයිද **කියත්. කෙලෙස්** සහිතව යන අර්ථයයි. **ඉන්‍ද්‍රියෙහි** යනු සද්ධා **ආදී ඉන්‍ද්‍රියයන්ගෙනි. සද්ධමෙම** යනු ප්‍රතිපත්ති-ප්‍රතිවේධ ධර්මයෙහිය. වොදාන පක්ෂය යන අර්ථයයි. **එනං නයං** යනු යම් නය ලක්ෂණයක් සුභ සඤ්ඤා ආදී විපර්යාසයන්ගෙන් සියලු සංකිලේශ පක්ෂය ද සද්ධින්‍ද්‍රිය ආදියෙන් වොදාන පක්ෂය ද චතුසත්‍ය යෝජනා වශයෙන් සංවර්ණනා විශේෂයක් වේ ද, එයයි. මේ නය **නයවිදූ** සද්ධර්ම නය පිළිබඳ දක්ෂයෝ හෝ අර්ථනය පිළිබඳ දක්ෂයෝ සිහවික්කිළිත නය යැයි කියත් යන අර්ථයයි.

වෙය්‍යාකරණෙසු යනු ඒ ඒ අර්ථ නය යෙදීම පිණිස කරන ලද සූත්‍රයේ අර්ථ විසඳීම්වලය යන අර්ථයයි. එහෙයින්ම **තහිං තහිං** යැයි කියන ලදී. **කුසලාකුසලා** යනු පිරිසිදු කිරීමෙහි දක්ෂ, කෙලෙසන සුළු ඒ ඒ නයට දිශා වූ ධර්මයෝය. **චුනතා** යනු සූත්‍රයෙන් නිර්ධාරණය කොට කියන ලද යනුයි. **මනසා වොලොකයතෙ** යනු ඒ පෙර කියන ලද ධර්මයන් සිතින්ම මේ පළමු දිශාවය. මේ දෙවන දිශාවය ආදී වශයෙන් ඒ ඒ නය දිශා භාවයෙන් සලකා බලයි යනුයි. විමසා බලයි යන අර්ථයයි. **ඔලොකයතෙ තෙ අබභි** යනුවෙන් ද පාඨයක් වේ. එහි **තෙ** යනු ඒ පෙර කියන ලද ධර්මයන්ය. **අබභි** යනු අභ්‍යන්තරයයි. සිතින් යන අර්ථයයි. **නං වු දිසාලොචනං** ආහු යන මෙහි ඔලොකයතෙ යනු මෙහි යම් ඒ බැලීමක් වේ ද එය දිශාලෝචන නය නමැයි කියත් යනු අවධාරණ අර්ථයේ නිපාතයකි. එහෙයින් මේ නය ඔලොකනයක්මය. (බැලීමක්ය) කිසියම් අර්ථ විශේෂයක් නොදක්වයි.

ඔලොකෙත්වා යනු පඨම ආදී දිශා වශයෙන් සලකා බලා යනුයි. **දිසාලොචනෙන** යනු උපකාර වූ දිශාවන් බලන ඇසින්ය. යම් විධියකින් ඒ ඒ අර්ථ නය යොදනු පිණිස දිශාවන් බලත් ද එම විධිය දිශා විලෝචනයයි.

මෙසේ හෝ එහි අර්ථය දතයුතුයි. **උකබ්බිය** යනු උපුටා යනුයි. දිශාභූත ධර්මය සූත්‍රයෙන් නිර්ධාරණය (වෙන්) කොට යන අර්ථයයි. **උකබ්බිය යො සමානෙති** යැයි ද කියත්. එහි අර්ථය යමක් ඒ දිශාභූත ධර්මයන්ගේ ගෙන ඒම කෙරේ ද එය යනුයි. **යං** යනු ක්‍රියා පරාමර්ශනය කරන්නක් හෝ වේ. **සමානෙති** යනු ඒ ඒ අර්ථය යෙදීම් වශයෙන් එකවිට මනාව අර්ථය ගෙනඑයි යනුයි. කවරහු ගෙන එත් ද? සියලු කුසල අකුසලයන්ය. ඒ ඒ නයට දිශා වූ දෙයෙහිය. **අයං නයො** යන්නෙහි සමානෙති යන මෙහි යම් ඒ ඒ නය දිශා භූත ධර්මයන්ගේ ගෙනඒමක් වේ ද එය **අංකුසො** නාම නය වේය යන අර්ථයයි. එය ද වොහාර නය කම්ම නය යැයි දෙවැදෑරුම්ව කියනු ලැබේ.

මෙසේ හාරයන් ද නයායන් ද දක්වා දැන් ඔවුන්ගේ යෙදුම් ක්‍රමය දක්වමින් **සොළසහාරා පඨමං** යනාදිය කිවේය. එහි පළමුව සෝළස හාරයන් යෙදිය යුතුය යන වචන ශේෂයකි. ව්‍යඤ්ජන සෙවීම් වශයෙන් හාර සංවර්ණනය පළමුව කළයුතුය යන අදහසයි. **දිසාලොචනතො** යනු දිශාවන් බැලීමෙනි. මෙයම පාඨයක් හෝ වේ. **අංකුසෙන හි** යන තැන හි ශබ්දය නිපාත මාත්‍රයකි. සෙසු පදයන්ගේ අර්ථ ප්‍රකටමය.

දැන් යම් ව්‍යඤ්ජන පදයන්ගේ ද අර්ථ පදයන්ගේ ද වශයෙන් **දවාදසපදානි සුත්තං** යැයි කියන ලද ද ඒ පදයන් දක්වන්නට **අක්ඛරංපදං** යන ආදිය කියන ලදී. එහි නොරක්නා ලද පදයෙහි ඇති වර්ණය අක්ෂරය නමි. පර්යාය වශයෙන් ක්ෂය නොවන බැවින් හා වෙන තැනකට නොහැසිරෙන බැවිනි. වර්ණය පිළිබඳ සමාන වචනයක් විද්‍යමාන නොවේ. එහෙයින් **වණ්ණො** යන තැන කවර අර්ථයකින් වර්ණ නම් වේ ද? අර්ථ සංවර්ණනා අර්ථයෙනි. ස්වල්ප වේලාවක් උසුරුවන හෙයින් වර්ණයම පූර්වාපර වශයෙන් පැවතියේ පදයක මුලින්ම ගනු ලබන්නේ සම්බන්ධය ඇති පරිදි ඒ ඒ අර්ථය ප්‍රකාශ කරයි. එක් අකුරක් හෝ පදයක් අකුරකි. ඇතැමෙක් මනසින් දෙසූ දෙය වචනයෙන් ව්‍යවහාර කරන හෙයින් අක්ෂර නම් වෙතැයි කියති. **පදං** මෙයින් අර්ථය සංස්කරණය කෙරෙයි යන අර්ථයෙන් පද නම් වේ. එය නාමපදය, ආඛ්‍යාත පදය, උපසර්ග පදය නිපාත පදය යැයි චතුර්විධය. එහි එසෙසා, වෙදනා, චිතතං යන මේ ආදි සත්ව ප්‍රධාන දේ නාමපද නම් වේ. ඵුසති, වෙදයති, විජානාති යන මේ ආදි ක්‍රියා ප්‍රධාන දේ ආඛ්‍යාත පද නම් වෙමු. ක්‍රියා විශේෂණ ග්‍රහණ නිමිති වශයෙන් 'ප' යන මේ ආදිය උපසර්ග පද නම් වේ.

ක්‍රියාවේ ද සත්ත්වයන්ගේ ද ස්වරූප විශේෂය ප්‍රකාශ කිරීමට හේතු වූ 'එව' යන මේ ආදිය නිපාත පද නම් වේ. **බ්‍යඤ්ජනං** යනු පදයට හිත වූ අර්ථය බබුළුවන්නේ නුයි බ්‍යඤ්ජන වෙනැයි කෙටියෙන් කියන ලදී. වාක්‍යය (යනු) එය අර්ථ වශයෙන් වූ පද සමුදාය යැයි දතයුතුය. පද මාත්‍රයක් ඇසීමේ දී වුවත් අධිකාරාදි වශයෙන් ලැබෙන වෙනත් පදයන්ගෙන් එකට එකතු කොට අර්ථ ප්‍රතිපාදනය වෙනැයි වාක්‍යයම අර්ථය (බබුළුවයි) ප්‍රකාශ කරයි.

නිරුත්ති යනු ආකාරයට හිත වූ නිර්වචනය නිරුත්ති නම් වේ යනුයි. **නිද්දෙසො** යනු නිර්වචනය විස්තර කිරීමයි. නිරවශේෂව දේශිත බැවින් නිද්දේස නම්. පදයන්ගේ යුත් වාක්‍යයේ විභාගය ආකාරයයි. ඉදින් මෙසේ පද වශයෙන් ආකාරයේ කවර විශේෂයක් ද? නො අවසන් කරන ලද හෝ නොබෙදන ලද වාක්‍යයේ ඒ ඒ අවයව පද නම්. උච්චාරණ වශයෙන් අවසන් වූ හෝ බෙදන ලද හෝ වාක්‍යයේ ඒ ඒ අවයවය ආකාරයයි. සවැනි වචනය මෙයටය යන අර්ථයෙන් **ආකාර ඡට්ඨ වචනං** යි යෙදේ. බ්‍යඤ්ජන පදයයි. මෙහි ද බ්‍යඤ්ජනං යනු මේ පදයට අනතුරුව කිවයුතු ආකාර පදය නිද්දේස පදයට අනතුරුව කියන බැවින් ආකාර ඡට්ඨ වචනං යැයි කියන ලදී. පදානුපූර්වත්වය කැමතිවන්නවුන් විසින් එය බ්‍යඤ්ජන පදයන්ට අනතුරුවම කළ යුතුය. එසේම 'බ්‍යඤ්ජන අප්‍රමාණය. ආකාරයන් අප්‍රමාණයැයි' කියනු ලැබේ. බ්‍යඤ්ජනයන්ගෙන් විවරණය කරයි. ආකාරයන්ගෙන් විභජනය කෙරේයැයිද කියනු ලැබේ. කිසිවෙක් **ආකාර පද බ්‍යඤ්ජන නිරුත්තියො ච නිද්දෙසො** යැයි ද කියත්. **එතනාව බ්‍යඤ්ජනං සබබං** යනු යම් මේ අක්ෂරාදියක් දක්වන ලද ද එපමණ සියලු ව්‍යඤ්ජනය. මේවායින් සංග්‍රහ නොකරන ලද ව්‍යඤ්ජනයක් නම් නැත යන අර්ථයයි.

සංකාසනා යනු කෙටියෙන් ප්‍රකාශ කිරීමයි. **පකාසනා** යනු පළමුව ප්‍රකාශ කිරීමයි. ප්‍රකාශ කරයි බබළවයි යන අර්ථයයි. මේ පද දෙකින් අක්ෂර පදයන් මගින් බබුළුවනු ලබන අර්ථාකාරය ගන්නා ලදී. යම්හෙයකින් අක්ෂරයන් මගින් ශබ්දකරන විට අසන්නවුන්ගේ විශේෂාවධානය කරන ලද බැවින් පද කෙළවර පදාර්ථ ප්‍රතිපාදනය වෙයි. එසේම කියනු ලැබේ. එහි භාග්‍යවතුන් වහන්සේ අකුරුවලින් කෙටියෙන් ප්‍රකාශ කරයි. පදයන්ගෙන් ප්‍රකාශ කරත් යනුයි.

අකුරුවලින් ද පදවලින් ද වැසුම් හරිතැයිද (කියන ලදී) **විවරණා** යනු විස්තර කිරීමයි. විභජනය ද ප්‍රකට කිරීම ද පැනවීම ද විභජනුත්තානි කම්මපඤ්ඤත්ති නම්. එහි විභජනා යනු විභාග කිරීමයි. දෙකින්ම නිර්දේශය කියන ලදී. මෙහි දී පූර්ව නයායෙන්ම ඛඤ්ඣන ආකාරයන්ගෙන් දක්වනු ලබන අර්ථාකාරය දක්වන ලදැයි දතයුතුය. **උත්තානී කම්මං** යනු ප්‍රකට කිරීමයි. ඒ ඒ ප්‍රකාරයන්ගෙන් හැඟවීමයි. **පඤ්ඤත්තනං** යනු දෙකකින් ඉදිරිපත් කිරීමයැයි කියයි. මෙහිද නිරුක්ති නිර්දේශ සංඛ්‍යාත වූ ඛඤ්ඣන පදයන්ගෙන් දක්වනු ලබන අර්ථාකාරය කියන ලදී. යමෙක් නැවත දක්වනු ලැබේ ද එය කියන ලදී. **එත්තෙහි** යනු ඒවායින්ම සංකාසනාදියෙන් තොර වූ දේශනාර්ථයක් නොමැති හෙයිනි. **අත්ථා** යනු සූත්‍රාර්ථයයි. **කම්මං** යනු උද්ඝාටන ආදී කර්මයයි. දේශනාවේ පවත්නා සූත්‍රාර්ථයෙන් උග්ඝටිතඤ්ඤු ආදී හික්මවිය යුතු පුද්ගලයන්ගේ චිත්ත සන්තානයේ ප්‍රබෝධ කිරීම ඇතිවීමයි. ඒ සූත්‍රාර්ථය ද සංකාසනා ආදි ආකාර ඇත්තේය. එහෙයින් 'අත්ථා කම්මඤ්ච නිද්දිට්ඨං' යැයි කියන ලදී.

නිණි යන්න ලිංග විපර්යාසයෙන් කියන ලදී. තයෝ යැයි කියන ලදී. **නවහි පදෙහි** යනු නව කොටසකින් යනුයි. **අත්ථා සමායුත්තෙනා** යනු අර්ථය මනාව යෙදුණේය යනුයි. එය නැතිව නොපවතී (යනුයි) චතුසත්‍ය ප්‍රකාශ කරන බැවින් සියලු බුද්ධ වචනයට ද චතුසත්‍ය යෙදීම් වශයෙන් පවත්නා බැවින් අර්ථ නයායන්ට ද සියලු පාළි අර්ථය අර්ථනයත්වය සංග්‍රහ කරන ලද බැවින් සංකාසනාදි ආකාර විශේෂය පවතී.

දැන් දක්වන ලද පරිදි දේශනාහාරාදියෙන් යුත් නෙත්තිප්පකරණයේ පදාර්ථයන් පහසුවෙන් ගැනීම පිණිස ගණන් වශයෙන් පිරිසිඳ දක්වනුයේ **අත්ථසස** යනාදිය කියන ලදී. එහි **චතුබ්බිසා** යනු සොළොස් හාරයන් ෂඩ්විධ ඛඤ්ඣන පදයන් කර්ම නයාය දෙක යන මේ විසිහතරයි. **උභයං** යනු ෂඩ්විධ අර්ථපද ත්‍රිවිධ අර්ථ නයාය යන මේ නවවිධ භේද, මුලින් කියන ලද චතුර්විංශවිධ භේද යන මේ දෙකයි. **සංකලයිත්වා** යනු සම්පිණ්ඩනය කොට යනුයි. **සංඛෙපයතො** යනු ද පාඨයකි. එක් කරන්නහුට යන අර්ථයයි. **එතනිකා** යනු එපමණ යනුයි. මෙයින් වෙනත් වූ කිසියම් නෙත්ති පදාර්ථයක් නැත යන අර්ථයයි.

මෙසේ තෙතිස් පදයකින් යුතු නෙත්ති සූත්‍රයේ අර්ථ පර්යේෂණය

පිණිස **සොළසහාරා පයමං** යැයි නයවලින් පළමුව හාරයන් සංවර්ණනා කළ යුතුයැයි හාරනය පිළිබඳ යම් සංවර්ණනයක් දක්වන ලදද එය මේ හාර නයවල දේශනා ක්‍රමයෙන්ම සිද්ධ වේ. මෙසේ සිද්ධ වූ කල්හි, මේ ආරම්භය මේ අර්ථය බබුළුවයි. මේ සියලු හාරයන් ද නය ද මේ දක්වන ලද ක්‍රමයෙන්ම සූත්‍රයන් සංවර්ණනා කිරීම් වශයෙන් යෙදිය යුතුයි. පිළිවෙල ඉක්මවා නොයෙදිය යුතුය. මෙහිදී මේ හාරයන් සහ නය මේ ක්‍රමයෙන් දේශනා කිරීමේ හේතුව කුමක්ද? ඉදින් මේ අනුයෝගය කිසිතැනෙක දී අනුක්‍රමයෙන් බැස නොගනියි. එසේ වුවත් ධර්ම දේශනාවේදී ඇසුරු කරගත් ඵලය හා ඊට හේතු වූ ශරීර ඇත්තවුන්ගේ ආශ්වාදාදිය පැහැදිලි කරන ස්වභාව ඇති බැවින් ද ප්‍රකෘතියෙන් සියලු සූත්‍රයන්ට අනුරූප යැයි මනාව දැනගත හැකි බැවින් ද අන්‍ය වූ සංවර්ණනා විශේෂයන් වූ විචය හාර ආදිය පිහිටුවන බැවින් ද පළමුව දේශනා හාරය දක්වන ලදී.

පදයන් විමසීම විසඳීම පූර්වාපර අනුගීතීන් සමග දේශනාහාර පදාර්ථයන්ගේ රැස්කරන ස්වභාව ඇති බැවින් ඊට අනතුරුව විචයහාරය වේ. එහෙයින් ම **පදං විචිනති** -පෙ- **ආණතිං විචිනති අනුගීතිං විචිනති**' යැයි කියන ලදී.

විචය හාරයෙන් රැස්කරන ලද අර්ථයන්ගේ යුක්තායුක්තිය විමසීම යුතුයැයි යුක්ති විචාරණ භාවයෙන් විචය හාරයට අනතුරුව යුක්ති හාරය කියන ලදී. එහෙයින් **විචයෙන හාරෙන විචිනිත්වා යුතනි හාරෙන යොජෙතබබං** යනුවෙන් කියනු ලැබේ.

යුක්තායුක්ත අර්ථයන්ගේ ම උත්පත්තියට අනුරූප වූ කරුණු රැසින් නිර්ධාරණ ලක්ෂණය වූ පදස්ථාන ගැන සිතීම කළ යුතුයැයි යුක්ති හාරයට පසුව පදට්ඨාන හාරය දක්වන ලදී. එහෙයින් **යො කොචි උපනිසසයො යො කොචි පචචයො ච සබෙබා සො පදට්ඨානං** යැයි කියනු ලැබේ.

යුක්තායුක්තයන්ට හේතු වූ දෙයින් ගන්නා ලද ස්වභාව ඇති නොකියන ලද ධර්මයන්ම ඒක ලක්ෂණ ඇති බැවින් ගැනීම කළ යුතුයැයි දක්වන්නට පදට්ඨාන හාරයට අනතුරුව ලක්ඛණ හාරය කියන ලදී. එහෙයින්ම ලක්ඛණහාර විභංගයේ දී **අවිජ්ජාපචචයා සංඛාරා** ආදියෙන්

පටිච්චසමුප්පාදය දක්වා **එවං යෙව ධම්මා එකලක්ඛණා** යනාදිය කියන ලදී.

අර්ථ වශයෙන් නිර්ධාරණය කරන ලද ධර්මත්ගේ ද නිර්වචන පැවතිය යුතුය. සූත්‍රයේ ස්වරූප වශයෙන් නොආ බව දැක්වීමට ලක්ඛණ හාරයට පසුව චතුබ්‍යූහ හාරය කියන ලදී. මෙසේ නිරවශේෂව අර්ථාවබෝධය වේ. මෙසේ කොට 'භික්ෂුව යම්විටෙක අර්ථ නාමය දනී ද ධර්මයේ නාමය දනී ද ඒ ඒ තැන ඒ ඒ කරුණු ආරෝපණය කරයි යැයි අනවශේෂ පරියාදානය (ග්‍රහණය) කියනු ලබයි. එසේම 'නැවත නැවත ගැබට පැමිණෙයි' යන මෙහිද 'යමෙක් ජරාමරණ පිළිකුල් කරනු කැමැත්තේ වන්නේ ද ඔවුහු භෝජනයෙහි පමණ දන්නෝ වන්නාහුය. ඉන්‍ද්‍රියන් පිළිබඳ වසන ලද දොරටු ඇත්තෝ වන්නාහුය' ආදී වශයෙන් සම්‍යක් ප්‍රතිපත්තිය අදහස් කිරීම වශයෙන් කියනු ලබයි.

නිර්වචන අධිප්‍රායය නිදාන වචනයන් සමග සූත්‍රයේ පදාර්ථයන්හි සූත්‍රාන්තර සන්සන්දන සංඛ්‍යාත පූර්වාපර විචාරය දැක්වූ කල්හි ඒ සහාග විසහාග ධර්මයන්ගේ අනතුරු යෙදීම පහසුවෙන් දේශනා කරන්නට හැකියැයි චතුබ්‍යූහ හාරයට පසුව ආවට්ට හාරය කියන ලදී. එහෙයින්ම **ආරභථ නික්කමථ** යන ගාථාවේ ආරම්භය නික්මීම බුද්ධශාසන යෝග කම්පනයන්ගෙන් වීර්ය සමාධිය ප්‍රඥා ඉන්‍ද්‍රිය නිර්ධාරණය කොට ඊට සුදුසු වූ මූලය ප්‍රමාදයැයි සූත්‍රාන්තරයන්හි දක්වන ලද ප්‍රමාදය පෙරලන ලදී. (ආවර්තනය කරන ලදී.)

සහාග විසහාග ධර්මයන් පරිවර්තනය කිරීමෙහි යෙදූ කල්හි සාධාරණ අසාධාරණ වශයෙන් සංකිලේස වොදාන ධර්මයන් පදස්ථාන වශයෙන් ද භූමි වශයෙන් ද විභාග කිරීම පහසුවෙන් යෙදිය හැකියයි ආවට්ටන හාරයට අනතුරුව විභත්ති හාරය කියන ලදී. යම් හෙයකින් විභත්ති හාර විභංගයෙහි **කතමෙ ධම්මා සාධාරණා. දෙව ධම්මා සාධාරණා නාම. සාධාරණ චතූ සාධාරණා** යැයි ඇරඹී මිථ්‍යාත්ම නියත සත්ත්වයන්ගේ ද අනියත සත්ත්වයන්ගේ ද දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු කෙලෙස් සාධාරණය. පෘථග්ජනයාට ද සෝතාපන්නයාට ද කාමරාග ව්‍යාපාදයන් සාධාරණය ආදී වශයෙන් සහාග විසහාග පර්යායයෙන්ම ධර්මයන් බෙදා දක්වන්නේය.

සාවද්‍ය අනවද්‍ය ධර්මයන්ගේ සප්‍රතිභාග භාවය ඒවා විභාග කළවිට සූත්‍රාගත ධර්මයන් පහසුවෙන් ප්‍රතිපක්ෂ වශයෙන් පරිවර්තනය කරන්නට හැකියැයි විභත්ති හාරයට අනතුරුව පරිවර්තන හාරය කියන ලදී.

එහෙයින්ම සම්මා දිට්ඨිය ඇති පුද්ගලයාගේ මිථ්‍යා දෘෂ්ටිය දිරා ගියේ යැයි බෙදා දැක්වූ ස්වභාවයෙහිම ධර්මයන් පරිවර්තන හාර විභංගයෙහි ගෙනහැර පාන්නේය.

ප්‍රතිපක්ෂව පැවති ධර්මයෝ ද පර්යාය වචනයන්ගෙන් අවබෝධ කටයුතුය. සූත්‍රයේ ආ දෙයින්ම නොවේ යැයි දක්වන්නට පරිවර්තන හාරයට අනතුරුව වෙවචන හාරය කියන ලදී.

මෙසේ ඒ ධර්මයෝ සමාන ශබ්ද වශයෙන් ද විභාවනය කරන ලදහයි පර්යාය වශයෙන් ප්‍රකාශ කරන ලද ධර්මයන්ගේ ප්‍රභේද වශයෙන්, ප්‍රඥප්ති වශයෙන් බෙදා දැක්වීම පහසුවෙන් දැනගත හැකියයි වේවචන හාරයට අනතුරුව ප්‍රඥප්තිහාරය කියන ලදී. එහෙයින්ම සූත්‍රාගත ධර්මයන්ගේ පර්යාය ප්‍රඥප්ති විභාගය සුබෝධකරව පඤ්ඤත්තිහාර විභංගයෙහි කියනු ලැබේ.

ප්‍රභවය අවබෝධය ආදි ප්‍රඥප්ති විභාග මුඛයෙන් පටිච්චසමුප්පාද චතුසත්‍ය ආදි ධර්ම විභාගයන් කළ කල්හි සූත්‍රාගත ධර්මයන් පිළිබඳව පටිච්චසමුප්පාදාදි වශයෙන් අවධාරණය කරන්නට හැකියැයි දක්වන්නට පඤ්ඤත්තිහාරයට අනතුරුව ඔතරණ හාරය කියන ලදී. එහෙයින්ම **උද්ධං අධෝ** යන ගාථාව උදෙසා **විපපමුත්තෙනා** යන පදයෙන් අශෛක්ෂ වූ විද්‍යාව නිර්ධාරණය කොට **විඡ්ජූපපාදා අවිජ්ජා නිරොධෝ** යනාදි වශයෙන් පටිච්චසමුප්පාදය ගෙනහැරපාන්නේය.

ධාතු ආයතනාදියෙහි බැසගත් සූත්‍ර පදාර්ථයන් පිළිබඳ විමසීම් ඇරඹීම් විශෝධනයන් පහසුවෙන් සම්පාදනය කරන්නට හැකියැයි ඔතරණ හාරයට අනතුරුව සොධන හාරය කියන ලදී. එහෙයින්ම 'යම් තැනක මෙසේ ශුද්ධ වූ ආරම්භයක් වේ ද, ඒ ප්‍රශ්නය විසඳන ලද්දේය' යනාදිය කියනු ලැබේ.

සූත්‍රයේ පද හා පදාර්ථයන් විශෝධනය කළ කල්හි එහිදී ලැබෙන

සාමාන්‍ය විශේෂත්වය දක්වන්නට පහසු වේයැයි ශෝධන හාරයට අනතුරුව අධිට්ඨාන හාරය දක්වන ලදී. සොධනය අධිට්ඨාන හාරයට බොහෝ උපකාර වේ. එහෙයින්ම 'ඉදින් එකක් වශයෙන් හෝ වෙනස්ව හෝ යම් යම්සේ විමසනු ලැබේ ද ඒ ඒ අයුරින් විසඳිය යුතුයැ'යි කියනු ලැබේ.

සාමාන්‍ය විශේෂ වශයෙන් වූ සාධාරණ අසාධාරණ ලක්‍ෂණ ප්‍රකාශ කළ කල්හි පරිෂ්කාර සංඛ්‍යාත සාධාරණ අසාධාරණරූපී වූ ප්‍රත්‍ය හේතු රාශියේ ප්‍රභේදය මනාව අවබෝධ කරගත හැක්කේ යැයි අධිට්ඨාන හාරයට පසුව පරික්බාර හාරය කියන ලදී. එහෙයින්ම 'අසාධාරණ ලක්‍ෂණ හේතුවයි. සාධාරණ ලක්‍ෂණය ප්‍රත්‍යයයි' කියනු ලබයි. නිදසුන් මෙසේය. කෙසේ වන්නේ ද? යම්සේ අංකුරයක නිපැයීමට බීජය අසාධාරණ වේ ද පඨවි, ආපෝ, ලක්‍ෂණ සාධාරණ වේ ද එසේය.

අසාධාරණ වූ ද සාධාරණ වූ ද කරුණු දැක්වූ කල්හි ඒ පිළිබඳ ස්වකීය ඵලයන්හි කාරණ ආකාරය ද ඒ හේතුඵලයන්ගේ ප්‍රභේද වශයෙන් දේශනා කරන ආකාරය ද වැඩිය යුතු ප්‍රහාණය කළ යුතු කරුණුවල වර්ධනය හා ප්‍රහාණය ද නිර්ධාරණය කොට කියනු ලබන සූත්‍රාර්ථය සත්‍ය ලෙස මනා අවබෝධය පිණිස පවතී යැයි පරික්බාර හාරයට අනතුරුව සමාරොපන හාරය දක්වන ලදී. මෙය හාරයන්ගේ අනුක්‍රම හේතුවයි.

අර්ථ නය තුන පිළිබඳ උපදේශය න්‍යායන් පිළිබඳ වෙනෙයත්‍වය තුළ නොයොදන ලද බැවින් ඒ ක්‍රමයෙන්ම නන්දියාවට්ට ආදී ත්‍රිවිධ අර්ථනය ක්‍රමය දතයුතුය. උග්ඝටිතඤ්ඤු ආදී ත්‍රිවිධ වෙනෙය්‍යයන් (හික්මවිය යුතු පුද්ගලයන්) නන්දියාවට්ට ආදිය ප්‍රයෝජනයට ගනිත්. එහෙයින් ඒවා උද්දේස නිද්දේස පටිනිද්දේසයන් මෙන් පිළිවෙලින් ඔවුන්ගේ උපකාරය පිණිස පවතින්නේ ය. එහෙයින්ම ඒවායේ සතරක් වූ ද සයක් වූ ද අටක් වූ ද මූලපද නිර්දේශ කරන ලදී. අර්ථ නයත්‍වය ඇති කරන ඉතිරි නය දෙකෙහි භූමිය පිළිබඳ සලකා බැලීම ඊට සමානයැයි මේ කාරණයෙන් උද්දේස ක්‍රමය දතයුතුය. නොසලකා බලා ගෙනහැර දක්වන්නට නොහැකිය.

මෙපමණ වූ හාරයන්ගේ අර්ථනයත්‍වය සහිත වූ මෙපමණ වූ

ආකාර විශේෂයන්ගෙන් සූත්‍රාර්ථය නිර්ධාරණය කරනු ලබන්නේ විනේයයන්ට පළමු භූමියෙහි අනුත්තර වූ සමාධිය ලැබීම පිණිස ප්‍රමාණවත් යැයි දතයුතුය. දර්ශන භූමි ශ්‍රවණ උත්පත්ති අර්ථයෙන් නෙත්තිප්පකරණ දේශනය වේ. එසේ නැතහොත් එයට ඇතුළත් වූ බැවින් සූත්‍රයේ සියලු සංවර්ණනා විශේෂයන් සතුව මෙපමණ හාරයන් ඇති බව දතයුතුයි. සූත්‍රයේ සංවර්ණනා විශේෂයන් යම් පමණක් වේ ද, ඒ සියල්ල නෙත්තිඋපදේශයට අයත්යැයි යන මේ අර්ථය කියන ලදී.

එසේම සූත්‍රය පිළිබඳ කිසියම් සංවර්ණනා ප්‍රකාරයන් ද දක්වනු ලැබේ. ඒ මෙසේය. සූත්‍රයේ හටගැනීම කිවයුතුයි. අධිප්‍රායය දැක්විය යුතුය. නන් අයුරින් පදාර්ථ සංවර්ණනා කළ යුතුයි. විධි අනුවාදය ද දතයුතුයි. විරෝධය නැංවිය යුතුය. අනුසන්ධියට අනුරූපව නිගමනය කළ යුතුය. එසේම අර්ථ කියන්නා විසින් සූත්‍රයේ ප්‍රයෝජනය පිණ්ඩාර්ථය පදාර්ථය අනුසන්ධි වොදානා පරිහාරයන් ද කිවයුතුය. එසේම උදාහරණ, පදවිග්‍රහ, පදාර්ථ චාලනය හා සමීප කිරීම ද කිවයුතුය.

එසේම ත්‍රිවිධ කථාව, ඒකනාළිකාව, චතුරස්සය හා නිස්සන වත්තිකය ද (කිවයුතුය.) එහි පෙළ ප්‍රකාශ කොට එක් එක් පදයක අර්ථ කථනය දැක්වීම එක නාළිකාව නම් වේ. ප්‍රතිපක්ෂ දෙය දක්වා (ඒ) ප්‍රතිපක්ෂ දෙය පිළිබඳ උපමාව දක්වා, සපක්ෂ දෙය දක්වා (ඒ) සපක්ෂ දෙය පිළිබඳ උපමාව දක්වා අර්ථකථනය කිරීම චතුරස්සය නම් වේ. විසභාග ධර්ම වශයෙන්ම කෙළවරට ගොස් නැවත සභාග ධර්ම වශයෙන්ම කෙළවරට යාම නිස්සනවත්තිකා නම් වේ.

භේද කථනයෙන් ද තත්ථ කථනයෙන් ද පර්යාය වචනයන්ගෙන් ද සූත්‍රය සංවර්ණනා කළ යුතුය යන මේ ආදියයි. ඒ පිළිබඳ අවරෝධය මෙහිම වේ. මෙහිදී ඒවා හාර කිහිපයක සංගෘහීත බැවිනි.

යම්හෙයකින් නය පිළිබඳව උග්ඝටිතඤ්ඤු ආදි ත්‍රිවිධ විනේය පුද්ගලයෝ සත්‍යාවබෝධයට භාග්‍යවත් වෙති. ඒ සඳහා ද අර්ථනය දේශනාව පවතී. එහෙයින් සංකිලෙස වොදාන ධර්මයන් ඇතිකල්හි ද කියන ලද පරිදි මූලපද භේද වශයෙන් වර්ධනය කොට බෙදිය යුතු ප්‍රකාරයෙහි ද එසේම මූලපද වර්ධනය නොකොට වේනෙයභව වශයෙන්ම මෙපමණක් දේ කියන ලදී. නවයක් නවයක් වූ මූලපදයන්හි

සියලු සංකිලෙස වොදාන ධර්මයන් ඇතුළත් වන බැවින් ඒවා නොවැඩිය යුතුය. වෙනෙයත්‍රය බලපවත්වන බැවින් අත්හැරීම ද නොකළ යුතුය. නය පිළිබඳ මෙපමණ දේ දතයුතුය.

කර්ම නය පිළිබඳ ආලෝචන සමානයන (සලකා බැලීම හා පැමිණවීම) ඇති හෙයින් අන්‍ය වූ ප්‍රකාරයක් දක්නා නොලැබෙන නිසා මෙපමණක්ම වේ. හෙත්වාදි යන මෙහි ආදි ශබ්දයෙන් ඵලභූමිය හේතුවෙන් සහාග විසහාග ලක්ෂණ නය ආදිය ගන්නා ලදී.

ඒවායින් හේතු යනු කාරණයයි. යමෙක් ධර්මයැයි ද කියනු ලැබේ. එය වනාහි ප්‍රත්‍ය භාවයෙන් ඒකවිධය. කාරකය. සම්පාපකය යැයි ද්විධය. නැවත කාරකය, ඤාපකය, සම්පාපකය යැයි ත්‍රිවිධය. හේතුහේතු, පච්චය හේතු, උත්තමහේතු, සාධාරණ හේතු යැයි චතුර්විධය. පච්චය ධර්මය, කුසලය, අකුසලය, ශබ්දය, ආර්ය මාර්ගය යැයි පංචවිධය. එසේම සහාග හේතු, අසහාග හේතු, අජ්ඣත්තික හේතු, බාහිර හේතු, ජනක හේතු, පරිග්ගාහක හේතු, සාධාරණ හේතු, අසාධාරණ හේතු, සමනන්තරහේතු, පරම්පර හේතු, සහජාත හේතු, අසහජාත හේතු, සාසව හේතු, අනාසව හේතු යනාදි වශයෙන් අනෙකවිධ යැයි දතයුතුය.

හේතුවෙන් උපන් බැවින් ඵලය ද එක්වැදෑරුම්ය. සම්පාපක (පැමිණවිය යුතු) හේතු වශයෙන් ලැබිය යුතු වුව ද ඵල පර්යාය ලබත්නුයි උපදවිය යුතු අවබෝධ කළයුතු බැවින් දෙවැදෑරුම්ය. දැනගත යුතු, උපදවිය යුතු, පැමිණිය යුතු බැවින් තෙවැදෑරුම්ය. හේතුවෙන් හටගත්, විපාක, ක්‍රියා වචනාර්ථ නිර්වාණ වශයෙන් පස්වැදෑරුම්ය. සහාග හේතුවෙන් උපන් දෙය අසහාග හේතුවෙන් උපන් දෙය යන මේ ආදි වශයෙන් අනේකවිධ යැයි දතයුතුයි. එසේම ලෞකික ලෝකුත්තර වශයෙන් ද ප්‍රභේදගතය. එහි ලෝකුත්තර යනු චතුර්විධ ශ්‍රමණ ඵලයන්ය. ලෞකික ඵලය කායික හා මානසික වශයෙන් දෙවැදෑරුම්ය. එහි කායික යනු පංචද්වාරිකයයි. ඉතිරිය මානසිකය. ඒ ඒ සූත්‍ර දේශනාවෙන් යමක් සාධනය කළයුතු නම් එය ද ඵලයයි.

භූමිය ද සාසව භූමිය, අනාසව භූමිය, සංඛත භූමිය, අසංඛත භූමිය, දස්සන භූමිය, භාවනා භූමිය, පුථුජ්ජන භූමිය, සෙඛ භූමිය, අසෙඛ භූමිය, සාවක භූමිය, පච්චේක බුද්ධ භූමිය, සම්මා සම්බුද්ධ භූමිය, ධ්‍යාන

භූමිය, අසමාහිත භූමිය, පටිපජ්ජමාන භූමිය, පටිපන්න භූමිය, පළමු භූමිය, සතරවැනි ධ්‍යානය දක්වා වූ භූමිය, කාමාවචර භූමිය, ලෝකුත්තර භූමිය දක්වා වූ භූමිය යැයි නන්වැදෑරුම්ය. එහි ස්වල්ප වූ මහද්ගත ධර්ම සාසව භූමියයි. අප්‍රමාණ ධර්මයෝ අනාසව භූමියයි. නිවන හැරුණු කොට සියලු ස්වභාවධර්ම සංඛත භූමියයි. හේතුවලින් හට නොගත් ධර්ම අසංඛත භූමියයි. පළමු මාර්ගඵල ධර්ම දස්සන භූමියයි. සෙසු මාර්ගඵල ධර්ම භාවනා භූමියයි. හීන මධ්‍යම ධර්ම පුථුජ්ජන භූමියයි. සතර ආර්ය මාර්ග ධර්ම ද ඊට යටින් වූ ත්‍රිවිධ ඵල ධර්ම ද සේඛ භූමියයි. අග්‍රඵල ධර්මයෝ අසෙඛ භූමියයි. ශ්‍රාවක ප්‍රත්‍යෙක බුද්ධ හා බුද්ධ ධර්මයෝ සාවකාදී භූමීහුය. ධ්‍යාන ධර්මයෝ ධ්‍යාන භූමියයි. ධ්‍යානවලින් තොර වූ ධර්ම, අසමාහිත භූමියයි. මාර්ග ධර්මයෝ පටිපජ්ජමාන භූමියයි. ඵල ධර්මයෝ පටිපන්න භූමියයි. ඵලයන් සමග සතර මාර්ගයන් ද පඨමාය භූමියා පතතියා' යනාදී වචන අනුව ඊට අයත් නොවූ ධර්ම ද කාමාවචර ආදී ධර්මයෝ කාමාවචර භූමියයි. යම් ධර්මයක් ඒ ඒ හාර නයවල පිහිටුවීම් වශයෙන් සූත්‍රයන්හි නිර්ධාරණය කරනු ලැබේ ද ඒවා ද භූමිහු යයි දතයුතුය.

උපනිසා යනු දැඩි කරුණකි. යමක් හේතුප්‍රත්‍යයයි කියනු ලැබේ ද එයයි. යමක් සඳහා සූත්‍රයෙහි දුක නිසා (හේතු කරගෙන) සද්ධාව වේ. සද්ධාව නිසා සීලය යයි ද විමුත්තිය නිසා විමුත්ති ඤාණ දර්ශනය යැයි ද කියන ලද ද එයයි. තව ද උපනිසා යනුවෙන් ඒ ඒ කාලයේ සිද්ධාන්තයන්ට හෘදය වූ අභ්‍යන්තරය කියනු ලැබේ. මෙහිදී නෙත්ති හෘදයයි. ධර්ම කථිකයෝ යමක් මනාව ග්‍රහණය කරන්නාහු ඒ ඒ සූත්‍රාගත ධර්ම මුඛයෙන් සියලු හාර නය යෙදීමට සමත් වෙත්. මේ නෙත්ති හෘදය යනු කුමක් ද? එනම් විසිඅට වැදෑරුම් පට්ඨාන විභාගය සහිත වූ මේ තෙතිස් ප්‍රකරණ පදාර්ථ දහසයේ විෂයය නිමිති සහිත බෙදීමෙන් අසංකීර්ණව විසඳන ලදී. ඒ මෙසේය. ආශ්වාස ආදිය දේශනාහාරයේ විෂයයයි. එය ආශ්වාදාදිය විභාවනය කරන ලක්ෂණ සහිත (ඇති) බැවිනි. එහි ආශ්වාදය සුඛය සෝමනස්සය යන මේ ආදී විභාගයයි. එහි නිමිත්ත ඉෂ්ට වූ අරමුණු ආදියයි. මේ අර්ථය දේශනා හාර විචය හාර නිර්දේශ වර්ණනාවේදී විස්තර වශයෙන් ප්‍රකාශ කරන ලද්දේමය. සූත්‍රාගත ධර්මය පිළිබඳ සභාග විසභාග ධර්මයන්ගේ ආවර්තන විෂය ආවට්ටන හාර නම් වේ. ඒ දෙකම ආවර්තනය ලක්ෂණය කොට ඇති බැවිනි. සූත්‍රාගත ධර්මයන්ගේ විරුද්ධ ධර්ම විෂය පරිවර්තන හාරයයි. ප්‍රතිපක්ෂ ධර්මයන්

පරිවර්තන ලක්ෂණයන් සහිත බැවිනි. පදස්ථාන පරිෂ්කාර හාරයන්හි ආසන්න කාරණය ද උපනිශ්‍රය කාරණය ද පදට්ඨාන නම් වේ. හේතු පරික්ඛාරය යන මෙය ඔවුන්ගේ විශේෂයයි. සභාග විසභාග ධර්මයෝ ද ඒ ඒ ධර්මවලට අනුකූල වූ ද විරුද්ධ වූ ද ධර්මයෝ ද පිළිවෙලින් දතයුතුයි. ඒ මෙසේය. සම්මා දිට්ඨියට සම්මා සංකප්පය සභාග වෙයි. මිච්ඡා සංකප්පය විසභාග වෙයි. මේ ක්‍රමයෙන් සියල්ල සභාග විසභාග වශයෙන් දතයුතුය.

ලක්ෂණය යනු ස්වභාවයයි. එය හාර නය නිද්දේසයේ දී පැහැදිලි කරන ලද්දේමය. හේතු ආදි විශේෂයන්ගෙන් මිදුණු හාර නයවල යම් යෝජනා නිබන්ධයක් වේ නම් එය නය නම් වේ. ලක්ඛණ හාරයෙහි මෙසේ කියන ලදී. මෙසේ යම් ධර්මයෝ ඒක ලක්ෂණ ද (ඒවා කෘත්‍ය වශයෙන් ම කියන ලදි.) (ඒවා) කෘත්‍ය වශයෙන් ද ලක්ෂණ වශයෙන් ද සාමාන්‍ය වශයෙන් ද (කියන ලදී.) එසේම විචය හාරයෙන් එකතුකොට යුත්ති හාරයෙන් යෙදිය යුතුය. එසේම සොධන හාර ආදියෙහි ශුද්ධ වූ ආරම්භයක් වෙයි ද ඒ ප්‍රශ්නය විසඳන ලද්දේය යන මේ ආදියයි. එකත්ත ආදි නය ද මෙහි නය යනුවෙන් ගතයුතුය.

මෙසේ හේතුඵල ආදිය සලකා බලා ඒවායේ වශයෙන් ඒ ඒ සූත්‍රයේ ලැබෙන පදාර්ථයන් නිර්ධාරණ කිරීම් වශයෙන් ලක්ෂණ අනුව මේ හාර සහ නය යෙදිය යුතුයි. විශේෂ වශයෙන් වනාහි පදට්ඨාන පරික්ඛාර හාරයන් හේතු වශයෙන්ය. දේශනා, විචය, චතුබ්‍යූහ, සමාරොපන හාරයන් හේතුඵල වශයෙනි. එසේම වෙවචන පඤ්ඤත්ති ඔතරණ සොධන හාරයන් ඵල වශයෙන් හෝ යෙදිය යුතුයැයි කිසිවෙක් කියත්. විහත්ති හාරය හේතු හා භූමි වශයෙනි. පරිවත්තන හාරය විසභාග වශයෙනි. ආවට්ට හාරය සභාග හා විසභාග වශයෙනි. ලක්ෂණ යුක්ති අධිෂ්ඨාන හාරයන් නය වශයෙන් යෙදිය යුතුය. මෙපමණකින් යමක් කියන ලද ද සාමාන්‍ය වශයෙන් ද විශේෂ වශයෙන් ද පදාර්ථය ලක්ෂණය ක්‍රමය හේතු ආදි මෙපමණ දේ නුවණැත්තා විසින් දතයුතුය යන මේ ගාථාව කියන ලද අර්ථ ඇත්තේ වෙයි.

නිද්දේස වාර වර්ණනාව නිමි.

4.

සුවසේ ග්‍රහණය කරගනු පිණිස ගාථා බැඳීම් වශයෙන් මෙසේ හාරාදිය ස්වරූප වශයෙන් දක්වා දැන් ඒවායින් හාරයන් පළමුව පටිනිද්දේස වශයෙන් බෙදා දක්වන්නට **තත්‍ථ කතමෝ දෙසනාහාරෝ** යනාදිය අරඹන ලදී. එහි **කතමෝ** යනු කියනු කැමති විමර්ශනයයි. **දෙසනාහාරෝ** යනු ඇසිය යුතු (ධර්මය) කරුණ දක්වාලීමයි. කෙසේ වුවත් දේසනා හාරය නිද්දේස වාරයේදී ස්වරූප වශයෙන් දක්වන ලදී. පටිනිද්දේසයේ විෂය දක්වමින් **අසසාදාදීනවතා** යන ගාථාව ඒකදේශයකින් ස්පර්ශ කෙරෙයි. මේ දේශනාහාරය පූර්වාපර අපේක්‍ෂා ඇත්තකි. එහි පූර්වාපේක්‍ෂකත්වයෙහි **කතමෝ දෙසනාහාරෝ** යැයි විමසා **අසසාදාදීනවතා** යැයි ස්වරූප වශයෙන් දක්වන ලද්දෙහි නිගමනය වෙයි. පරාපේක්‍ෂකත්වයෙහි වනාහි **අයං දෙසනාහාරෝ කිං දෙසයති** යනු වර්ණනා කරයි යනුයි. විස්තර කරයි යන අර්ථයයි. දැන් මෙයින් දේශනා කළයුතු ධර්ම ස්වරූප වශයෙන් දක්වමින් **අසසාදං** යනාදිය කීවේය. එය පෙර කියන ලද නය අනුව ප්‍රකට කරන ලද්දේමය. එහෙයින් මින් පසුද නොකියන ලද දෙයම වර්ණනා කරමු. මේ හාරය කොතැනක ආ ආශ්වාදාදිය වර්ණනා කෙරේදැයි ගැටළුව සිහිකොට දේශනා හාරයෙන් වර්ණනා කළ යුතු ධර්මය දක්වමින් **ධම්මං වො භික්ඛවෙ දෙසෙසසාමි** යනාදී සියලු පර්යාප්ති ධර්මය සංග්‍රහ කරන භාග්‍යවතුන් වහන්සේගේ ඡඡක්ක දේශනාව ඒකදේශයකින් දක්වාලයි.

එහි **ධම්මං** යන මේ ධම්ම ශබ්දය පර්යාප්ති, සත්‍ය සමාධි, ප්‍රඥා, ප්‍රකෘති, පුණ්‍ය, ආපත්ති, ඤෙය්‍ය ආදී බොහෝ අර්ථවල දක්නා ලද ප්‍රයෝග ඇත්තකි. ඒ එසේමය. 'ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති' ආදියෙහි පර්යාප්ති ධර්මයේ දක්නා ලැබේ. 'දිට්ඨධම්මෙමා පතතධම්මෙමා' යනාදිය සත්‍යයෙහි (දක්නා ලැබේ) 'එවං ධම්මා තෙ භගවතො අහෙසුං' යනාදිය සමාධියෙහි (දක්නා ලැබේ) 'සචචං ධම්මෙමා ධිතී චාගො' යන මේ ආදිය ප්‍රඥාවෙහි (දක්නා ලැබේ.) 'ජාති ධම්මානං භික්ඛවෙ සතතානං' යනාදිය ප්‍රකෘතියෙහි (දක්නා ලැබේ) 'ධම්මෙමා හවෙ රක්ඛති ධම්මචාරී' යනාදිය පුණ්‍ය අර්ථයෙහි දක්නා ලැබේ. 'චතතාරො පාරාජිකා ධම්මා' යන මේ ආදිය ආපත්තියෙහි දක්නා ලැබේ. 'කුසලා ධම්මා අකුසලා ධම්මා' ආදිය ඤෙය්‍යාර්ථයෙහි දක්නා ලැබේ. මෙහි වනාහි පර්යාප්ති අර්ථයෙහි

දතයුතුය. වො යන තැන මේ වො ශබ්දය 'හඤ්දානි භික්ඛවෙ පවාරයාමි වො' යන මෙතැන උපයෝගාර්ථයේ ආයේය. 'සනනිපතිතානං වො භික්ඛවෙ අම්හාකං කරණීයං' යනාදියෙහි (වො ශබ්දය) කරණාර්ථයෙහි ආයේය. 'යෙහි වො අරියා පරිසුද්ධකාය කම්මනතා' යනාදියෙහි (වො ශබ්දය) පද පූරණාර්ථයෙහි ආයේය. 'ආරොචයාමි වො භික්ඛවෙ' යනාදියෙහි (වො ශබ්දය) සම්ප්‍රදානාර්ථයෙහි ආයේය. මෙහි ද සම්ප්‍රදානාර්ථයෙහිම යැයි දතයුතුය. සිඟිමි ස්වභාවය ආදි ගුණ යෝගයෙන් භික්ඛු නම් වේ. බිඳුණු කෙළෙස් ඇති බව ආදී ගුණයෝගයෙන් හෝ භික්ඛු නම් වේ. එසේ නැතහොත් සංසාර බිය දක්නේනුයි භික්ඛු නම් වේ. **භික්ඛවෙ** යනු ඔවුන්ට ආමන්ත්‍රණයකි. එයින් ඔවුන්ව ධර්මශ්‍රවණයෙහි යොදවමින් තමාගේ මුවට අභිමුඛ කෙරෙයි. **දෙසෙසසාමි** යනු කියන්නෙමි යනුයි. එහෙයින් මම ධර්මේශ්වර බැවින් ඔබලාට අන් කිසිවක් නොකරමි. අනාවරණ ඤාණයෙන් සියලු ඥෙය්‍ය ධර්මය ප්‍රත්‍යක්ෂ කරවීමට ධර්මය දේශනා කරන්නෙමි'යි දැන් පවත්වනු ලබන ධර්මදේශනය දනියි. 'ආදි කල්‍යාණං' යනාදියේ ආදියේ යහපත් වූයේ ආදි කල්‍යාණයයි. ආදි කල්‍යාණය මොහුට ඇත යනු හෝ **ආදි කල්‍යාණං** නම්. සෙසු පද දෙකෙහි ද මේ ක්‍රමයමය. එහි සීලයෙන් ආදි කල්‍යාණය ඇතිවේ. සමාධියෙන් **මජෙඣ කල්‍යාණය** ඇති වේ. ප්‍රඥාවෙන් **පරියොසාන කල්‍යාණය** ඇතිවේ. බුදුන් මනාව අවබෝධ කරගත් බැවින් ආදියෙහි යහපත්ය. ධර්මය මනා ලක්ෂණවලින් යුත් බැවින් මධ්‍යයේ යහපත්ය. සංඝයා මනා ප්‍රතිපත්ති ඇති බැවින් කෙළවර යහපත්ය. එසේ නැතහොත් උග්ඝටිතඤ්ඤයා හික්මවන බැවින් ආදියෙහි යහපත්ය. විපඤ්චිතඤ්ඤයා හික්මවන බැවින් මධ්‍යයෙහි යහපත්ය. නෙය්‍ය පුද්ගලයා හික්මවන බැවින් කෙළවර යහපත්ය. මේ අර්ථයම මෙහිදී අධිප්‍රේතය. අර්ථ සම්පත්තියෙන් යුතු බව **සාත්‍ථ** නම් වේ. ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බව **සබ්‍යඤ්ජන** නම් වේ. සංකාසනාදි අර්ථ පද සය සමග යෙදීම හෝ **සාත්‍ථ** නම් වේ. අක්ෂර ආදි ව්‍යඤ්ජන පද සය සමග යෙදීම සබ්‍යඤ්ජන නම් වේ. මේ අර්ථයම මෙහිදී අධිප්‍රේතය. පැමිණවිය යුතු දෙයක් නොමැති බැවින් ඒකාන්තයෙන් පරිපූර්ණ වූයේ නුයි **කෙවල පරිපුණණ** නම්. බැහැර කළයුතු දෙයක් නොමැති බැවින් **පරිසුද්ධ** නම්. සීලාදී වූ ධර්මස්කන්ධ පහ පරිපූර්ණ වූ බැවින් හෝ **පරිපුණණ** නම් වේ. සතර ඕඝයන් තරණය පිණිස පැවති හෙයින් ලෝකාමිෂයන් කෙරෙහි අපේක්ෂාවක් නොමැති බැවින් ද **පරිසුද්ධ** නම් වේ. බ්‍රහ්ම වූ ශ්‍රේෂ්ඨ වූ උතුම් වූ බුදුන්ගේ හෝ ශ්‍රේෂ්ඨයන්ගේ හෝ ආර්යයන්ගේ හෝ චර්යාව වූ ත්‍රිවිධශික්ෂා සංග්‍රහ

සංඛ්‍යාත ශාසනය **බ්‍රහ්මචරිය** නම් වේ. **පකාසයිසසාමි** මනාව දක්වන්නෙමි යන අර්ථයයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ප්‍රකාශ කරන ලද ශාසන ධර්මය යම් ආශ්වාද ආදියෙක දැක්වීම් වශයෙන් පැවැත්තේ ද ඒ ආශ්වාද ආදිය දේශනා හාරයේ විෂය වූවාහු යම් යම් පාඨයක විශේෂ සහිතව කියන ලද ද ඒ ඒ තැනින් නිර්ධාරණය වෙන්කොට උදාහරණ වශයෙන් මෙහි පමුණුවා දක්වන්නට **තත්‍ථ කතමො අසසාදො** යනාදිය ආරම්භ කරන ලදී. එහි **කාමං** යනු තෙහුමක ධර්ම සංඛ්‍යාත මනාප වූ රූපාදි වස්තු කාමයයි. **කාමයමානසස** යනු කැමැත්තාටය. **තසස වෙ තං සමිජ්ඣති** යනු ඒ කැමැති වන්නා වූ සත්ත්වයාට ඒ කාම සංඛ්‍යාත වූ වස්තුව ඉදින් සමෘද්ධ වේ යනුයි. ඉදින් ඔහු එය ලබන්නේ යැයි කියන ලදී. **අදධා පීති මනො හොති** ති එක් අතකින් සතුටු සිත් ඇත්තේ වේ යනුයි. **ලදධා** යනු ලැබ යනුයි. මවෙචා යනු සත්ත්වයායි. **යදිවජති** යනු යමක් කැමති වේ ද යනුයි. මෙය මෙහි සංක්ෂිප්ත විස්තරයයි. විස්තරය වනාහි නිද්දේසයේ කියන ලද ක්‍රමයෙන් දතයුතුය. **අයං අසසාදො** යනු සමෘද්ධිමත් වූ යම් අදහසකින් කැමතිවන ලද ලාභයෙහි ප්‍රීතිමනස් සංඛ්‍යාත සොම්නස් වේ ද එය ආශ්වාදනය කළ යුතු බැවින් ආශ්වාද නම් වේ යනුයි.

තසස වෙ කාමයමානසස යනු කාමයන් කැමති වන ඒ පුද්ගලයාගේය. නැතහොත් කාමයෙන් ගමන් කරවනු ලබන්නාගේය. **ඡන්දජාතසස** යනු හටගත් තෘෂ්ණා ඇති තැනැත්තාගේය. **ජනතූනො** යනු සත්ත්වයාගේය. **තෙ කාමා පරිහායනති** යනු ඒ වස්තුකාමයෝ කිසියම් අනතුරකින් විනාශ වේනම් යනුයි. **සලලවිද්ධොව රුප්පති** යනු එකල්හි යකඩින් කරන ලද උලින් විදින ලද්දකු මෙන් පීඩාකරනු ලැබේ යන අර්ථයයි. **අයං ආදීනවො** යනු යම් මේ කාමයන්ගේ විපරිණාම අන්‍යථාභාවයෙන් කැමැත්තා වූ සත්ත්වයාගේ දොම්නස් උපත නැසීමක් වේ ද ඒ ආදීනවයයි.

යො කාමෙ පරිවජෙජති යනු යම් භික්ෂුවක් කියන ලද කාමයන් ඒ පිළිබඳ ඡන්දරාගය වික්බම්භනයෙන් හෝ මුලින් උපුටා දැමීමෙන් හෝ සියලු කොටසින් දුරුකෙරේ ද එයයි. උදාහරණ කුමක් ද? **සපපසෙසව පදා සිරො** යනු යම්සේ කිසියම් ජීවත්වනු කැමති පුරුෂයෙක් ඉදිරිමගෙහි

කළු සර්පයෙකු දැක සිය පයින් ඒ සර්පයාගේ හිස දුරු කෙරෙයි ද එයයි. **සො ඉමං -පෙ- සමති වතතති** යනු ඒ භික්ෂුව සියලු ලෝකය පතුරුවා සිටි බැවින් ලෝකයෙහි විසත්තිකා සංඛ්‍යාත වූ මේ තෘෂ්ණාව සිහි ඇතිව ඉක්මවා සිටියි යනුයි. **ඉදං නිසසරණං** යනු යම් මේ විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාවෙන් නිවන අරමුණු කර ඇති ආර්ය මාර්ගයෙන් ඉක්මවා සිටීම් නම් වූ මේ ගමනයි. (නිෂ්ක්‍රමණයයි.)

බෙතතං යනු කේදාර ආදී කුඹුරයි. **වත්ථුං** යනු ගෘහ වස්තු ආදී වස්තුවයි. **හිරඤඤං වා** යනු කහවණු සංඛ්‍යාත වූ ද ස්වර්ණ සංඛ්‍යාත වූ ද අමුරන්ය. වා ශබ්දය විකල්පාර්ථයයි. එය සියලු පදවල යෙදිය යුතුය. **ගවාසසං** ගවයන් ද අශ්වයන් ද ගවාස්සං නම් වේ. **දාසපොරිසං** දාසයන් ද පුරුෂයන් ද දාසපොරිසං නම් වේ. **ථියො** යනු ස්ත්‍රීන්ය. බන්ධු යනු ඥාති බන්ධූන්ය. **පුථුකාමෙ** යනු මනාප වූ රූප ආදි වූ අනෙක් බොහෝ කාම ගුණයන්ය. **යො නරො අනුගිජඣති** යනු යම් සත්ත්වයෙක් අනුව කැමති වේද එයයි. ප්‍රාර්ථනා කරයි යන අර්ථයයි. **අයං අසසාදො** ඉදින් කුඹුරු ආදියේ ලෝලත්වය මෙය ආශ්වාදනය කරයි යනුයි. මෙය මෙයින් වස්තු කාමයන් ආශ්වාදනය කෙරෙයිනුයි ආශ්වාද නම් වේ.

අබලා නං බලීයනති කුඹුරු ආදි වූ භේද ඇති කාමයෙහි ලොල්වන ඒ පුද්ගලයා කුශලයන් විසින් ප්‍රහාණය කළයුතු බැවින් අබල සංඛ්‍යාත වූ කෙලෙස් මැඩ පවත්වත්. අභිභවනය කෙරෙත්. බල රහිත බැවින් අභිභවනය කරත් යන අර්ථයයි. **මදදනෙත නං පරිසසයා** කාමයන්හි ගිලුණු කාමයන් සොයන ඔහු රකින්නහු ද සිංහ ආදිහු ද ප්‍රකට උත්සාහ ඇති කාය දුශ්චරිතාදිය ද අප්‍රකට උත්සාහ ඇති දේ ද මඩිත්. **තතො නං -පෙ- දකං** යනු ඉන්පසු ප්‍රකට අප්‍රකට ඒ උත්සාහවලින් මඩනා ලද ඒ පුද්ගලයා ජාති ආදි දුක මුහුදෙහි බිඳුණු නැවට දිය පිරෙන්නට වූ විට උත්සාහ කරන්නාක් මෙන් (උත්සාහය සොයනු ලැබේ) අනුව යයි යන අර්ථයයි. **අයං ආදීනවො** යම් මේ තෘෂ්ණා දුශ්චරිත සංකිලේශයන්ට හේතු වූ ජාති ආදි දුක් රස අනුව බැඳීම මේ ආදීනවයයි.

තසමා යනු යම්හෙයකින් කියන ලද පරිදිම කාමලෝලියා තුළ දුක්ඛ බන්ධනයක් වේ නම් එයිනි. **ජනතු** යනු සත්ත්වයාය. **සදා සතො** යනු පෙරයම පැසුළුයම මුළුල්ලේ නිදිවැරීමෙන් සිහි ඇතිව යනුයි. **කාමානි පරිවජජයෙ** යනු රූපාදී වස්තුකාමයන් පිළිබඳ සියලු ආකාරයෙන්

පවත්නා ක්ලේශ කාමය වික්ඛම්භන වශයෙන් ද සමුච්ඡේද වශයෙන් ද නූපදවමින් කාමයන් දුරු කරන්නේය. අත්හරින්නේය යනුයි. **තෙ පහාය තරෙ ඔඝං** යනු මෙසේ ඔවුහු ඒ කාමයන් දුරුකොට ඒවා ප්‍රහාණය කරන ආර්ය මාර්ගයෙන්ම සතර ඕඝයන් තරණය කරන්නේය යනුයි. තරණය කරන්නට හැකි වන්නේය යන අර්ථයයි. **නාවං සිත්‍වාව පාරගූ** යනු යම්සේ පුරුෂයෙක් වතුර පැමිණීමෙන් බර වැඩි වූ නැවක ජලය පිටතට ඉස අඩු බර ඇති නැවෙන් පහසුවෙන්ම එතෙර වන්නේ ද එයයි. පරතෙරට යන්නේ ය යනුයි. මෙලෙසම ආත්මභාව නැමැති නැවෙන් කෙලෙස් නැමැති දිය බර ඉස, සැහැල්ලු වූ ආත්ම භාවයෙන් එතෙර වන්නේ ය. රහත් බවට පත්වීමෙන් එතෙර නම් නිවන කරා යන්නේ ය. අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පෑමෙහි යන අර්ථයයි. **ඉදං නිසසරණං** යනු කාමයන් ප්‍රහාණය කිරීම් ස්වරූපයෙන් සතරඕඝයන් තරණය කොට අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් යම් (නිර්වාණයක්, නිවීමක්) වේ ද එය සියලු සංඛතයන්ගේ නිෂ්ක්‍රමණත්වයෙන් නිස්සරණ නම් වේ යනුයි.

ධම්මෝ යනු දානාදි පුණ්‍ය ධර්මයයි. **භවෙ** යනු නිපාත මාත්‍රයකි. **රකඛති ධම්මචාරිං** යනු යමෙක් අප්‍රමාදීව ඒ ධර්මයේ හැසිරෙයි ද ඒ ධර්මයේ හැසිරෙන්නා මෙලොව පරලොව යන භේදයෙන් දෙවැදෑරුම් වූ අනර්ථයෙන් රකියි පාලනය කරයි යන අර්ථයයි. **ඡත්තං මහන්තං යථවස්ස කාලෙ** යනු වර්ෂා කාලයේ වැසි වසිද්දී දක්ෂ පුරුෂයකු විසින් දරන ලද මහා කුඩයක් යම්සේ ඔහුව වර්ෂාවට තෙමීමෙන් රකියි ද, එහි යම්සේ ඒ ඡත්‍රය අප්‍රමාදීවී තමා රක්නේ වර්ෂාදියෙන් ආවරණය වූයේ ආරක්ෂා කෙරේ. මෙසේ ධර්මය ද එය රකින්නාවම රකියි යන අදහසයි. **එසා -පෙ- චාරී** යනු මෙයින් කියන ලද්දා වූ ම අර්ථය අතිශයින් ප්‍රකට කෙරෙයි. එය මනාව දතයුත්තේමය. **ඉදං ඵලං** මෙලොව වශයෙන් වූ ද පරලෝ වශයෙන් වූ ද අනර්ථයන්ගෙන් එනම්, ධර්මය පිළිබඳ යම් රක්ෂණයක් කියන ලද ද රක්ෂණය කෙළවර අභ්‍යුදයෙහි නිපැත්මක් වේ ද ඒ නිෂ්ක්‍රමණය ස්පර්ශ නොකොට දේශනාවෙන් උපදවිය යුතු බැවින් ඵලය නම් වේ.

සබ්බෙ ධම්මො යනු සියලු සංඛත ධර්මයෝය. **අනත්තා** යනු මොවුන් පිළිබඳව කරවන විඳවන ස්වභාව ඇති ආත්මයක් නැත යනුයි. තමා ම හෝ ආත්මය නොවේනුයි අනත්තා නම් වේ. **ඉති** යනු මෙසේය. **යදා පඤ්ඤාය පසසති** යනු යම් කලෙක විදර්ශනාවට උත්සුක කරමින්

අනත්තානුපස්සනා සංඛ්‍යාත වූ ප්‍රඥාවෙන් බලයි යනුයි. **අථ නිබ්බිඤ්ඤති දුකෙඛ** යනු අනතුරුව අනත්තානුපස්සනාවට මුලින්ම අනිත්‍යත්වය හා දුක්ඛත්වය මනාව දක්නා ලද බැවින් නිබ්බිදානුපස්සනා වශයෙන් විදර්ශනාවට ගෝචර වූ පංචස්කන්ධ සංඛ්‍යාත දුකෙහි කළකිරෙයි. කළකිරීමට පැමිණෙයි යනුයි. **එස මගෙගා විසුදධියා** යනු කියන ලද ලක්ෂණ ඇති යම් නිබ්බිදානුපස්සනාවක් සියලු කෙලෙස් පිරිසිදු කරන බැවින්, විශුද්ධි සංඛ්‍යාත ආර්ය මාර්ගය පිළිබඳව අතිශයින් පිරිසිදු වූ හෝ අමෘත ධාතුව පිණිස වූ මාර්ග උපාය යනුයි. **අයං උපායෝ** යනු අනත්තානුපස්සනා මුඛයෙන් සියලු සසරෙහි යම් ඒ නිර්වේදයක් කියන ලදද එය විශුද්ධිය පිණිස අධිගම හේතුවක් බැවින් උපායක් වේ යනුයි.

චකඛුමා -පෙ- පරිවජජයෙ යනු මේ ගාථාවේමය. සංක්ෂේප අර්ථයයි. යම්සේ ඇස් ඇති පුරුෂයෙක් සිරුර උසුලද්දී චණ්ඩ බැවින් විෂම භූමි ප්‍රදේශ හෝ විෂම වූ හස්ති ආදීන් හෝ දුරුකෙරේ ද මෙසේ (මේ) ලෝකයේ ප්‍රඥාවත් පුරුෂයා නුවණැති බැවින් හිත අහිත දේ දන්නේ පාපී වූ ලාමක වූ දුශ්චරිතයන් දුරුකරන්නේය. **අයං ආණතති** යනු පාපයන් දුරුකළ යුතුය යන ධර්මරාජ වූ භාග්‍යවතුන් වහන්සේගේ යම් මේ ආඥාවක් වේ ද ඒ ආඥාවයි.

මෙසේ වෙන්වෙන්ව සූත්‍රයන්හි ආ ඵල උපාය ආඥාවන් උදාහරණ ලෙසින් දක්වා දැන් ඒවා එක්ව ආ බව දක්වන්නට **සුඤඤතො** ආදි ගාථාව කියන ලදී. එහි **සුඤඤතො ලොකං අවෙකඛසසු මොඝරාජ** යනු ආඥාවයි. මොඝරාජ සියලු සංස්කාර ලෝකය තමාට අයත් නොවන බව සැලකීම් වශයෙන් හෝ හිස් බව දැකීම් වශයෙන් හෝ හිස්යැයි බලව යන මේ ධර්මරාජයන්ගේ වචනය විධානයක් බැවින් ආඥාවකි. සැමදා සිහිකිරීමෙන් ඒ ශූන්‍යතා දර්ශනයට පැමිණෙයි (යන අරුතින්) **සදා සතොනි උපායො** යැයි කියන ලදී. **අතනානුදිටඨිං ඤහචච** යනු විසිවැදෑරුම් වස්තු ඇති සක්කාය දර්ශනය උදුරා, මුලිනුපුටා යනුයි. **එවං මචචුතරො සියානි ඉදං ඵලං** යනු මෙසේ කියන ලද ක්‍රමයෙන් යම් මාර විෂය තරණය කිරීමක් මාරයාගේ විෂය ඉක්මවීමක් වේ ද එහිය. යම් පූර්වභාග ප්‍රතිපදාවට පැමිණීමක් වේ ද එය දේශනාවේ ඵලය යන අර්ථයයි. යම්සේ ආශ්වාදාදිය සූත්‍රයේ කිසිතැනක ස්වරූප වශයෙන් ද කිසිතැනක නිර්ධාරණය කළයුතුව ද කිසිතැනක වෙන් වෙන්ව ද කිසිතැනක එක්ව ද දක්වන ලදී. ඵල ආදිය එසේ නොවේ. ඵල ආදිය

වනාහි සූත්‍රයේ සියලු තැන් හෝ ගාථාවල හෝ එක්ව දැක්විය යුතුයැයි මේ න්‍යාය දැක්වීම පිණිස වෙන් වෙන්ව ගෙනහැර දක්වා නැවතත් 'සුඤ්ඤතො ලොකං' යනාදියෙන් එක්ව උදාහරණ කරන ලදැයි දතයුතුය.

මෙසේ ආශ්වාද ආදිය උදාහරණ වශයෙන් ස්වරූපීව දක්වා දැන් එහි පුද්ගල විභාගයෙන් දේශනා විභාගය දක්වන්නට **තත්‍ර භගවා** යනාදිය කියන ලදී. එහි ගමනා ලද්ද සට්ටන මාත්‍රයකි. දෘෂ්ට මාත්‍රයකි. යමක නිද්දේස පටිනිද්දේසයෝ නොකරන ලද්දාහු ද එය නොදනීනුයි උග්ඝටිතඤ්ඤු නම් වේ. උද්දේස මාත්‍රයෙන් ප්‍රභේද සහිත වූ විස්තර සහිත වූ අර්ථය අවබෝධ කරයි යන අර්ථයයි. ගටනා ලද හෝ වලනය කරන ලද හෝ නගන ලද යන අර්ථයයි. එය දන්නේනුයි උග්ඝටිතඤ්ඤු නම්. ධර්මය දේශනා කරනු ලබන්නේ දේශකයා කෙරෙන් දේශනාවට බඳුන් වූ දෙය සංක්‍රමණය වන්නාක් මෙන් වෙයි. මොහු සොලවන ලද ඒ දෙය දනීයි යන අර්ථයයි. සොලවන ලද දෙයම ගටනා ලද දෙයයි. ශාස්වත ආදි ආකාරයෙහි වනාහි හික්මවිය යුත්තන්ගේ අභිප්‍රායට බුදුරදුන්ට ආවේණික වූ ධර්මදේශනාව එකෙණෙහිම පතිත වූයේම වලනය පිණිස පවතී. එයින් පරම්පරානුවර්තනය වන බැවිනි. එහිදී ආශ්‍රවයන් ගැටුණු කල්හි වලනය වූ කල්හිම මොහු ධර්මය දැනගන්නේනුයි උගඝටිතඤ්ඤු නම්. ඒ උග්ගටිතඥ පුද්ගලයාට **නිස්සරණය** දේශනා කරයි. එක් දේශනයකින්ම ඔහුට අර්ථසිද්ධිය වන බැවිනි. අවබෝධ කළ විස්තර කළ, නිර්දේශ කළ දේ දනීනුයි විපඤ්චිතඤ්ඤු නම්. මදව හෝ හෙමින් හෝ අවබෝධ කළ ධර්මය දනීනුයි විපඤ්චිතඤ්ඤු නම් වේ. ඒ විපඤ්චිතඤ්ඤු පුද්ගලයාට ආදීනවය ද නිස්සරණය ද දේශනා කරයි. ඉතා කෙටි නොවූ විස්තර නොවූ දේශනාවෙන් ඔහුට අර්ථසිද්ධිය වන බැවිනි. පටිනිද්දේසයෙන් ධර්මයේ අර්ථය පැමිණවිය යුතුය යන අර්ථයෙන් නෙය්‍ය නම් වේ. මෘදු ඉන්ද්‍රිය ඇති බැවින් හෝ විරුද්ධ ලෙස ග්‍රහණය කරගන්නා බැවින් හෝ පැමිණවිය යුතුය අනුව ගෙනයා යුතුය යන අර්ථයෙන් නෙය්‍ය නම් වේ. ඒ නෙය්‍ය පුද්ගලයාට ආශ්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දේශනා කරයි. අනවශේෂ වූ දේශනයෙන්ම ඔහුට අර්ථ සිද්ධිය වන බැවිනි. මේ එහි පෙළයි.

උග්ඝටිතඤ්ඤු පුද්ගලයා යනු කවරේ ද? යම් පුද්ගලයෙකුට දක්වන ලද විටම ධර්මාවබෝධය වේ ද, මේ පුද්ගලයා උග්ඝටිතඤ්ඤු යැයි කියනු ලැබේ. විපඤ්චිතඤ්ඤු පුද්ගලයා යනු කවරේ ද? කෙටියෙන් කියන

ලද්දෙහි විස්තර වශයෙන් අර්ථ බෙදා දක්වන කල්හි යම් පුද්ගලයෙකුට ධර්මාවබෝධය වේ ද මේ පුද්ගලයා විපඤ්චිතඤ්ඤූ යැයි කියනු ලැබේ. නෙය්‍ය පුද්ගලයා යනු කවරේ ද? උදෙසන, විමසන, නුවණින් මෙනෙහි කරන, කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කරන, සේවනය කරන, භජනය කරන, පයුරුපාසන කරන යම් පුද්ගලයෙකුට අනුපිළිවෙලින් ධර්මාවබෝධය වේ ද මේ පුද්ගලයා නෙය්‍ය යැයි කියනු ලැබේ.

පද පරම පුද්ගලයා නෙත්ති ප්‍රතිවේධයට බඳුන් නොවේයැයි (නොවන බැවින්) මෙහිදී නොගන්නා ලදැයි දතයුතුය. මෙහිදී ද අස්සාද, ආදීනව, නිස්සරණ, අස්සාදය ද ආදීනවයද අස්සාදය ද නිස්සරණය ද ආදීනවය ද නිස්සරණය ද අස්සාදය ද ආදීනවය ද නිස්සරණය ද යන මේ පටියාන නය සත වෙයි. ඒවායින් තෙවැනි, සවැනි (හා) සත්වැනි ඒවා හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීමෙහි සමර්ථ බැවිනන් ගන්නා ලද්දේය. ඉතිරි සතර නොගන්නා ලද්දේය. හුදු ආශ්වාදයෙන් හෝ ආදීනවයෙන් හෝ ඒ දෙකින්ම හෝ ප්‍රකාශ කිරීමෙන් හික්මවිය යුතු පුද්ගලයන්ගේ හික්මවීම ඇති නොවේ. කෙලෙස් ප්‍රහාණය ගැන කීමෙන්ම ඇති වේ. පස්වැනි වූ ආදීනවය ප්‍රකාශ නොකිරීමෙන් නිස්සරණයේ උපාය රහිත බව ඇතිවේ. භාග්‍යවතුන් වහන්සේගේ විමුක්ති රසයෙන් යුතු දේශනාව විමුක්තිය ද ඊට උපාය ද ස්පර්ශ නොකරමින් නො පවතී. එහෙයින් මේ නය සතර උපුටන නො ලද්දේ යැයි දතයුතුය. ඉදින් පද පරම පුද්ගලයාගේ වශයෙන් පැවති සංකිලේසභාගිය හෝ වාසනාභාගිය හෝ ඒ දෙකෙහිම පිහිටි හෝ දේශනාව හෝ සූත්‍රයෙන් කොටසක් හෝ ගාථාවක් හෝ ඒ නයවලින් මෙවැනි දෙයක් උදාහරණ වශයෙන් උපුටයි. මෙසේ ඇතිකල්හි සප්තවිධ නයවලම ගැනීම සිදුවන්නේය. හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම යනු ඔවුන්ගේ සිත තුළ ආර්යමාර්ගය ඉපදවීමයි. එය කියන ලද නයවලින්ම මිස ඉතිරි ඒවායින් නොවේ. අනෙක් ඒවා මෙහිදී නොකියන ලද්දේය. යම්හෙයකින් පෙටකෝපදේශයෙහි 'එහි ආශ්වාදය ද ආදීනවය ද කවරේ ද?' (යනුවෙන් ප්‍රශ්න කරන ලදී.)

> යානි කරොති පුරිසො නානි පසසති අතතනි
> කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං

පුරුෂ තෙමේ යම් දෙයක් කරයි ද ඒවා තමා කෙරෙහි දකියි. යහපත් දේ කරන්නා යහපත දකියි. පව් කරන්නා පාපය දකියි.

එහි යහපත් දේ කරන්නා යම් යහපතක් විඳියි ද එය ආශ්වාදයයි. පව් කරන්නා යම් පාපයක් විඳියි ද එය ආදීනවයයි. 'මහණෙනි, මේ ලෝක ධර්ම අටකි. කවර අටක්ද? ලාභො යනාදියයි. එහි ලාභය, යසස, සැපය, ප්‍රශංසාව යන මෙය ආශ්වාදයයි. අලාභය, අයසය, දුක, නින්දාව යන මෙය ආදීනවයයි.

එහි ආශ්වාදය ද නිස්සරණය ද කවරේ ද?

සුබො විපාකො පුඤ්ඤානං අධිපපායොව ඉජ්ඣති
විපඤ්ච පරමං සන්තිං නිබ්බානවධිගච්ඡති

'පින්වල සැප විපාකය ද අධිප්‍රාය ද සමෘද්ධ වෙයි. පරම ශාන්තිය වූ නිවන ද වහා අවබෝධ කෙරෙයි' යන මෙය ආශ්වාදය ද නිස්සරණය ද වේ. 'මහණෙනි, මහා පුරුෂයාගේ මහා පුරුෂ ලක්ෂණ තිස්දෙකක් වේ. යම් ලක්ෂණවලින් යුක්ත වූ මහා පුරුෂයාට ගති දෙකක් මිස අනෙකක් නොවේ -පෙ- වැසුම් හරින ලද්දේ වේ' යන සියලු ලක්ෂණ සූත්‍රයයි. ආශ්වාදය ද ආදීනවය ද මෙයයි.

එහි ආදීනවය ද නිස්සරණය ද කවරේද?

භාරා හවෙ පඤ්ච බන්ධා භාරහාරෝ ච පුග්ගලෝ
භාරාදානං දුඛං ලොකෙ භාරනික්ඛෙපනං සුඛං
නික්ඛිපිත්වා ගරුං භාරං අඤ්ඤං භාරං අනාදිය
සමූලං තණ්හමබ්භුය්හ නිවජාතො පරිනිබ්බුතො

'ඒකාන්තයෙන් පංචස්කන්ධය භාර නම් වේ. භාරය ගෙන යන පුද්ගලයෙක් ද වේ. ලෝකයේ භාරය ගැනීම දුකකි. භාරය ඉවත් කිරීම සැපයකි. ගරු භාරය ඉවත්කොට වෙනත් බරක් නොගෙන, තණ්හාව මුල් සහිතව ඉවත්කර, තෘෂ්ණා රහිතව පිරිනිවියේය' යන මෙය ආදීනවය හා නිස්සරණයයි.

එහි ආශ්වාදය ද ආදීනවය ද නිස්සරණය ද කවරේ ද?

කාමාහි චිත්‍රා මධුරා මනොරමා
විරූප රූපෙන මථෙනති චිත්තං
තසමා අහං පබ්බජිතොම්හි රාජ!
අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො

'කාමයෝ වනාහි විසිතුරුය. මිහිරිය. මනරමය. විරූපී ස්වරූපයෙන් සිත කළඹත්. රජතුමනි, එහෙයින් මම පැවිද්දෙක්මි. නිදොස් වූ පැවිදි බවම උතුමය'

යන මෙම ගාථාව ආශ්වාදය ද ආදීනවය ද නිස්සරණය ද ප්‍රකාශ කරන ලදී. එහෙයින් ඒ න්‍යායන් ද මෙහිදී නිර්ධාරණය කොට දතයුතුය. ඵල ආදියෙහි ද මේ නය ලැබේමය. ජේටකෝපදේශයෙහි යම්හෙයකින් කියන ලද ද?

එහි ඵලය ද උපාය ද කවරේ ද? සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො ආදි ගාථාවයි. ඵලය ද උපාය ද මෙයයි. එහි ඵලය ද ආඥාව ද කවරේද?

සචෙ භායථ දුක්ඛස්ස සචෙ වො දුක්ඛමප්පියං
මාකත්‍ථ පාපකං කම්මං ආවි වා යදි වා රහො

'ඉදින් දුකට බියවෙවු ද? ඉදින ඔබලාට දුක අප්‍රියද, එළිපිට හෝ රහසිගතව හෝ පව්කමක් නොකරමු' යන මෙය ඵලය හා ආඥාවයි.

එහි උපාය හා ආඥාව කවරේ ද?

කුම්භූපමං කායමිමං විදිත්වා - නගරූපමං චිත්ත මිදං ඨපෙත්වා
යොධෙථ මාරං පඤ්ඤායුධෙන - පිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා

'මේ සිරුර කළයක් මෙනැයි දැන, මේ සිත නගරයක් මෙනැයි සිතා ප්‍රඥාව නමැති ආයුධයෙන් මාරයාට පහර දෙව්. දිනන ලද්ද රැක ගන්නේය. නො ඇලුණු පුද්ගලයෙක් වන්නේය' යන මෙය උපාය හා ආඥාවයි.

මෙසේ ඵල ආදිය පිළිබඳව දුක (දෙක බැගින්) වශයෙන් ද උදාහරණ

දතයුතුයි. මෙහි ද 'යමෙක් නිස්සරණ දේශනාවෙන් හික්මවිය යුතු ද ඔහු උග්ඝටිතඤ්ඤු වේ' යනාදියෙන් යම්සේ දේශනා විභාගයෙන් පුද්ගල විභාග සිද්ධිය වේ ද මෙසේ 'භාග්‍යවතුන් වහන්සේ උග්ඝටිතඤ්ඤු පුද්ගලයාට නිස්සරණය දේශනා කරයි' යනාදියෙන් පුද්ගල විභාගයෙන් දේශනා විභාගය ලැබේ යැයි එය එසේ දක්වන ලදී.

මෙසේ යම් පුද්ගලයන්ගේ වශයෙන් දේශනා විභාගය දක්වන ලද්දේ ද ඒ පුද්ගලයන් ප්‍රතිපදා විභාගයෙන් බෙදා දක්වන්නට 'චතසෙසා පටිපදා' යනාදිය කියන ලදී. එහි පටිපදාව අවබෝධ කළේය. විභාගය ප්‍රතිපදාව බවට පත්කරන ලද්දේ වන්නේ යැයි **චතසෙසා පටිපදායි** කියන ලද්දේය. ඒ මේ ප්‍රතිපදාව ද සමථ විදර්ශනා ප්‍රතිපත්ති වශයෙන් දෙවැදෑරුම් වෙයි. කෙසේ ද? සමථ පක්ෂයෙහි පළමුකොට ප්‍රථම යොමුකිරීමේ පටන් යම්තාක් ඒ ඒ ධ්‍යානයේ උපචාරය උපදී ද ඒ තාක් පැවති සමථ භාවනාව පටිපදා යැයි කියනු ලැබේ. උපචාරයේ පටන් යම්තාක් අර්පණාව වේ ද, ඒ තාක් පැවති ප්‍රඥාව අභිඤ්ඤා යැයි කියනු ලැබේ. ඒ මේ පටිපදාව ඇතැම් කෙනෙකුට දුක් සහගත වෙයි. නීවරණ ආදී විරුද්ධ ධර්මයන් හා හැසිරීම් බහුල බැවින් දුකකි. සැප නොවන සේවනය යන අර්ථයයි. ඇතැම් කෙනෙකුට මඳ වූයේ ශීඝ්‍ර නොවූ පැවතුම් ඇත්තේ දන්ධ (අඥාන) වූයේ වෙයි. ඇතැම් කෙනෙකුට මඳ නොවූයේ ශීඝ්‍ර පැවතුම් ඇත්තේ ඉක්මන් වූයේ වෙයි. එහෙයින් යමෙක් මූලින්ම කෙලෙස් යටපත් කරනුයේ සංඛාර සහිත වූ ප්‍රයෝග සහිත වූ දුකින් ක්ලාන්ත වෙමින් යටපත් කරයි. ඔහුගේ ප්‍රතිපදාව දුක්ඛදායක වෙයි. යමෙක් යටපත් කරන ලද කෙලෙස් ඇතිව අර්පණා පරිවාසය වසමින් බොහෝ කලකින් අංග පහළවීමකට පැමිණෙයි ද ඔහුට දන්ධාභිඤ්ඤ පටිපදාව වේ. යමෙක් වහාම අංග පහළවීමට පැමිණෙයි ද ඔහුට බිප්පාභිඤ්ඤා නම් පටිපදාව වේ. යමෙක් කෙලේස යටපත් කරමින් ක්ලාන්ත නොවනුයේ සැපසේ යටපත් කෙරෙයි ද ඔහුට සුඛපටිපදාව වේ. විදර්ශනා පක්ෂයෙහි වනාහි යමෙක් රූපාරූප මුඛයෙන් විදර්ශනාවට බැසගනුයේ සතරමහා භූතයන් අල්ලාගෙන උපාදාය රූප අල්ලාගනී ද අරූපයන් අල්ලාගනී ද රූපාරූප අල්ලා ගන්නේ දුකසේ වෙහෙසෙමින් අල්ලාගත හැකිය. ඔහුට දුක්ඛ ප්‍රතිපදාව වේ. අල්ලාගත් ස්වරූප ඇති රූපය වනාහි විදර්ශනා පරිවාසයෙහි මාර්ග පහළ කිරීමට පමා බැවින් දන්ධාභිඤ්ඤා නම් වේ. යමෙක් රූපාරූප අල්ලාගෙන නාමරූපයන් නියම කරනුයේ දුකසේ වෙහෙසෙමින් නියම කරයි. නියම කරන ලද නාමරූපයන්හි විදර්ශනා පරිවාසය වසමින්

බොහෝ කලකින් මාර්ගය උපදවන්නට හැකිවෙයි. ඔහුට ද පමා වූ අභිඤ්ඤා ඇති දුක්ඛ ප්‍රතිපදාව වෙයි. අනෙක් පුද්ගලයා නාමරූපයෙන් ද නියමකොට ප්‍රත්‍යයන් අල්ලාගන්නේ දුකසේ වෙහෙසෙමින් අල්ලා ගනී. ප්‍රත්‍යයන් අල්ලාගෙන විදර්ශනා පරිවාසය වසන්නේ බොහෝ කලකින් මාර්ගය උපදවයි. මෙසේ ද දන්ධාභිඤ්ඤ වූ දුක්ඛ ප්‍රතිපදාව වේ. අනෙකෙක් ප්‍රත්‍යයන් අල්ලාගෙන ලක්ෂණ අවබෝධ කරනුයේ දුකසේ වෙහෙසෙමින් අවබෝධ කරයි. අවබෝධ කළ ලක්ෂණ ඇතිව විදර්ශනා පරිවාසය වසනුයේ බොහෝ කලකින් මාර්ගය උපදවයි. මෙසේ ද දන්ධාභිඤ්ඤ වූ දුක්ඛ ප්‍රතිපදාව වේ.

අනෙක් ලක්ෂණයන් ද අවබෝධ කොට තීක්ෂණ වූ ශූර වූ මනාව උපන් විදර්ශනා ඤාණය උසුලන කල්හි උපන්නා වූ විදර්ශනා තෘෂ්ණාව මැඩපවත්වනුයේ දුකසේ වෙහෙසෙමින් මැඩපවත්වයි. තෘෂ්ණාව මැඩපවත්වා විදර්ශනා පරිවාසය වසනුයේ බොහෝ කලකින් මාර්ගය උපදවයි. මෙසේ ද දන්ධාභිඤ්ඤ වූ දුක්ඛ පටිපදාව වේ. මේ උපායෙන් ඉතිරි ත්‍රිවිධ ප්‍රතිපදාව ද දතයුතුය.

චතතාරෝ පුගගලා යනු පෙර කියන ලද පටිපදා විභාගයෙන් (දැක්වූ) චතුර්විධ ප්‍රතිපන්නක පුද්ගලයෝය. ඒ පටිපදා විභාගය හේතු, උපාය, ඵලයන් සමග දක්වන්නට 'තණහා චරිතො' යනාදිය කියන ලදී. එහි **චරිතං** යනු චර්යාවයි. පැවැත්ම යන අර්ථයයි. තණ්හාවෙන් උපන් චරිතයක් මොහුට ඇත යන අරුතින් තණ්හා චරිත නම් වේ. තණ්හාව පිණිස පැවති හෝ චරිතය තණ්හා චරිතයයි. ලෝභ සහගත අදහස යන අර්ථයයි. **දිටඨි චරිතො** යන මෙහිදී මේ ක්‍රමයමැයි. **මන්දො** යන මෙහි මන්දිය යනු අවිද්‍යාවයි. එයින් යුක්ත වූයේ මන්ද නම්. මෝහය අධිකව පවති යන අර්ථයයි. **සතින්ද්‍රියෙන** යන සතියෙන් ආධිපත්‍යය කරනු ලබන්නේ ඔහුගේ සතින්ද්‍රියම විශද වෙයි. යම්හෙයකින් තණ්හා චරිත ඇති බැවින් පූර්වභාගයෙහි කුසීතභාවයෙන් යුත් බැවින් වීර්යය බලවත් නොවෙයි. මෝහාධික බැවින් ප්‍රඥාව බලවත් නොවෙයි. ඒ දෙකින්ම සමාධිය බලවත් නොවෙයි. එහෙයින් මොහුගේ සතින්ද්‍රියම විශද වේයැයි කියන ලදී. එහෙයින්ම 'සතිපට්ඨානෙහි නිසසයෙහි' යි කියන ලදී. තෘෂ්ණා චරිත ඇති බැවින් මොහුගේ කෙලෙස් යටපත් කිරීම පහසු නොවේ යන අර්ථයෙන් දුක්ඛ පටිපදාව වේ. අවිශද වූ ඥාන ඇති බැවින් දන්ධාභිඤ්ඤ වේයැයි මුලින් කියන ලද නය රැගෙන යෙදිය යුතුය. **නියාති** යනු

ආර්ය මාර්ගය කරණකොටගෙන සසර දුකින් නික්මෙයි යනුයි. **උදපෙථා** යනු උද අපථ යන පද දෙකයි. උදාර ප්‍රඥාව යන අර්ථයයි. ප්‍රඥාව සහාය කොටගෙන ලැබෙන ප්‍රතිලාභයෙන් ඔහුගේ සමාධිය තියුණු වෙයි. සම්ප්‍රයුක්ත ධර්ම කෙරෙහි ආධිපත්‍යය පවත්වයි. එහෙයින්ම **සමාධින්ද්‍රියෙන** යැයි කියන ලදී. විශද වූ ඥානය ඇති බැවින් බිප්පාභිඤ්ඤයෙන් යැයි කියන ලදී. ධ්‍යානයන් සමාධිය ප්‍රධානකොට පවත්නා බැවින් ඇසුරුකරන ධ්‍යානයන්ගෙන් යන මේ විශේෂයයි. සෙස්ස පූර්වය හා සමානමය.

දෘෂ්ටි චරිත ඇති **බැවින් අනිර්යාණික** වූ මාර්ගය ද නෛර්යාණික යැයි සිතමින් එහි උත්සාහ බහුල බැවින් වීර්යාධික වෙයි. වීර්යාධික බැවින්ම මොහුගේ කෙලෙස් යටපත් කිරීම පහසු යැයි සුබ පටිපදාව අවිශද වූ ඥාන ඇති බැවින් දන්ධාභිඤ්ඤා වේ ය යන මේ අර්ථය 'දිට්ඨි චරිතො මන්දෝ' යන ආදියෙන් දක්වයි. සෙස්ස කියන ලද්දේමය. **සච්චෙහි** යනු ආර්ය සත්‍යයන්ගෙනි. පූර්වභාග ඥානය ස්පර්ශ කරන බැවින් සත්‍යයෝ ලෞකික වෙති. මාර්ග ඥානය නිශ්චය කරන බැවින් ද අභිසමයාර්ථය ඇති බැවින් ද ලෝකෝත්තර භාවය ඇසුරු කරත්. සෙස්ස කියන ලද නය අනුවම වේ. මෙහි ද දෘෂ්ටි චරිතයා මහා ප්‍රඥා ඇති උග්ඝටිතඤ්ඤු පුද්ගලයාය. තෘෂ්ණා චරිතයා මන්ද වූ (අඥාන වූ) නෙය්‍ය පුද්ගලයාය. ඉතිරි දෙදෙනා විපඤ්චිතඤ්ඤූ පුද්ගලයා යැයි (දතයුතුයි.) මෙසේ යම් හික්මවිය යුතු පුද්ගලයකු පිළිබඳව පූර්ව දේශනා විභාගය දක්වන ලද්දේ ද ඒ හික්මවිය යුතු පුද්ගලයාම මේ පටිපදා විභාගයෙන් දක්වන ලදැයි දතයුතුය.

දැන් ඒ හික්මවිය යුතු පුද්ගල විභාගය අර්ථ නය යෙදීමෙන් විෂය කොට දක්වන්නට 'උභො තණ්හා චරිතා' යනාදිය කියන ලදී. තෘෂ්ණාව සමාධියට ප්‍රතිපක්ෂ බැවින් තෘෂ්ණා චරිතයා පිරිසිදු වනුයේ සමාධියෙන් පිරිසිදු වේයැයි (දක්වමින්) **සමථ පුබ්බංගමාය** යන්න කීවේය.

සමථ විදර්ශනා දෙක එකට යෙදී වර්ධනය වේය යන වචනයෙන් **සම්මා** සමාධියෙන් නෛර්යාණික වූ සම්මා දිට්ඨිය සහිතමය. **සම්මා** සමාධියෙන් ම නොවේ යැයි දැක්වීමට **සමථ පුබ්බංගමාය විපස්සනාය** යැයි කියන ලදී. **රාගවිරාගා චෙතො විමුත්තිං** යන්න අරහත් ඵල සමාධිය යැයි සංග්‍රහයන්හි කියන ලදී. මෙහි දී අනාගාමිඵල සමාධිය කියනු

ලැබේ. හෙතෙම සමාධිය පරිපූර්ණ කරන්නෙක් වෙයි. එහි රඤ්ජනාර්ථයෙන් රාග නම් වේ. ඔහු මෙයින් නොඇලේනුයි රාගවිරාග නම්. ඒ රාග විරාගයෙනි. රාගයෙන් පහවීමෙන් යන අර්ථයයි.

චෙතෝ විමුත්තියා යනු තැන සිතානුයි චිත්ත නම් වේ. ඒ කාරණයෙන් මෙහි සමාධියැයි කියනු ලැබේ. 'චිත්තං පඤ්ඤඤ්ච භාවයං' යනු උදාහරණයි. සංසිදීම් වශයෙන් ප්‍රතිපක්ෂ බැවින් මිදේනුයි විමුත්ති නම් වේ. එයින් හෝ මිදුනේ එයින් හෝ මිදීම විමුත්ති නම්. යම්සේ ලෞකික කථාවෙහි සංඥාව ද සිත ද දේශනා ශීර්ෂය වේ ද එමෙන් සමාධිය ම ප්‍රධාන වෙයි. උදාහරණ මෙසේ කියන ලදී. 'නානත්ත කායා නානත්තසඤ්ඤිනෝ යයි ද කිං චිත්තෝ ත්වං භික්ඛු' යැයි ද වශයෙනි. මෙසේ ලෝකුත්තර කථාවේදී ප්‍රඥා සමාධිය ද 'පංචඨානිකෝ සම්මා සමාධි'යි ද සමථවිපස්සනං යුගනද්ධං භාවෙතී'යි ද කියන ලදී. ඒවායින් මෙහි රාගයට ප්‍රතිපක්ෂ බැවින් ද සමථය පෙරටුකර ඇති බැවින් එම වචනයෙන් ද චේතෝ ග්‍රහණයෙන් සමාධිය කියන ලදී. එසේම විමුක්ති වචනයෙන් ද කියන ලදී. එහෙයින් **සමාධියෙව** යැයි කියන ලදී. සිත ද එයමය. විමුක්තිය ද එයමය යැයි චෙතෝ විමුත්ති නම්. එසේ නැතහොත් කියන ලද ආකාර ඇති සිතට ප්‍රතිපක්ෂ වූ විමුක්ති විමෝක්ෂය චෙතෝ විමුක්තිය චෙතෝ විමුත්තියයි. ඵල විඤ්ඤාණය වූ සිතට ප්‍රතිපක්ෂ වූ විමුක්ති විමෝක්ෂය මෙහි වේනුයි චෙතෝ විමුත්ත නම් සමාධියමය. **පඤ්ඤා විමුත්තියා** යනු මෙහිදී ද මේ න්‍යාය හමුවන පරිදි යෙදිය යුතුය. දෘෂ්ටිය ස්වකීය විෂයයෙහි ප්‍රඥාව හා සමානව පවතී යැයි දෘෂ්ටි චරිතයා පිරිසිදු වන්නේ ප්‍රඥා මුඛයෙන් පිරිසිදු වන්නේයැයි **උභෝ දිට්ඨිචරිතා** විපස්සනා යනාදිය කීවේය. අවිද්‍යා විරාගයෙන් පඤ්ඤා විමුක්තිය වේයැයි රහත්ඵලයෙන් වූ ප්‍රඥා සමථය ගැනීමෙන් ඊට ප්‍රතිපක්ෂ වශයෙන් තෘෂ්ණාව ද විදර්ශනාව ගැනීමෙන් අවිද්‍යාව ද නිර්ධාරණය කොට පළමු නය පිළිබඳ භූමිය පහසුවෙන් දක්වන්නට හැකියයි **යෙ සමථ -පෙ- භාතබ්බා** යන්න කියන ලදී. එහි **සමථ පුබබංගමා පටිපදා** යනු පළමු ප්‍රතිපදා දෙක ද අන්‍ය වූ විදර්ශනාව ද පූර්වංගමය යැයි දතයුතුය යනුයි. භාතබ්බා යනු යැවිය යුතු යනුයි. පැමිණවිය යුතු යන අර්ථයයි. විදර්ශනාවෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම සංඥාවන්ගේ අභාවයෙන් ද දුක්ඛ සංඥාව පිරිවරකොට ඇති බැවින් ද අසුභ සංඥාවෙන් මේ සතර සංඥාවන් දක්වන ලද්දාහු වෙත්. ඊට ප්‍රතිපක්ෂව ද විපර්යාස සතරක් වේයැයි සියලු

සීහවික්‍රීඩිත න්‍යායයේ භූමිය සුවසේ දක්වන්නට හැකියයි 'යෙ විපසසනා -පෙ- භාතබබා'යි කියන ලදී.

මෙසේ ප්‍රතිපදා විභාගයෙන් හික්මවිය යුතු පුද්ගලයන්ගේ බෙදීම දක්වා දැන් එය ඥාන විභාගයෙන් දක්වනුයේ යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව යම්තාක් හික්මවිය යුතු පුද්ගලයන්ගේ හික්මවීම ප්‍රයෝජන කොට ඇත්තේය. එහෙයින් ඒ සුතමය ආදී ත්‍රිවිධ ප්‍රඥාවන්ගේ විනයනය ද අනුක්‍රමයෙන් ඉපිදවීමයි. යම්සේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවේ පවත්නා භාවය පැහැදිලි කිරීම ද හාර නය ව්‍යාපාරයයි. එහෙයින් මේ හාරයේ පැවතුම් ප්‍රකාරය පළමුව විමසා යම් පුද්ගල විභාග දැක්වීමකින් දේශනාවට බඳුන් වන්නා බෙදා දක්වා ඒ දේශනාවේ දේශනා හාරය නියෝජනය කරනු කැමතිව එය දක්වන්නට **ස්වායං හාරෝ කත්‍ථ සමුට්ඨිතෝ** යනාදිය කීවේය. එහි **තසස** යනු යම් ඒ පුද්ගලයෙක් නුසුදුසු කාල අටෙන් මිදුනේ කන් යොමු කිරීම කෙළවර සම්පත්තීන්ගෙන් යුක්ත වී ද ඔහුටය. **සත්‍ථා** යනු මෙලොව පරලොව පරමාර්ථයන් පිළිබඳව සුදුසු පරිදි අනුශාසනා කරන හෙයින් සත්‍ථා නම් වූ යනුයි. **ධම්මං** අනුශාසනා පරිදි පිළිපදිනු ලබන කල්හි අපායන්හි නොවැටෙන කල්හි දරනු ලැබෙනුයි ධම්මං නම් වේ. ඒ ධර්මයයි. දෙසෙති යනු සංක්ෂේප විස්තාර න්‍යායන්ගෙන් ප්‍රකාශ කරයි. කියයි යනුයි. **අඤ්ඤතරෝ** යනු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක්තරා අයෙකි. **ගරුටඨානියෝ** යනු සීල සුත ආදී ගුණ විශේෂ යෝගයෙන් ගරු කළයුතු යනුයි. **සබ්‍රහ්මචාරී** (යන්නෙහි) ශ්‍රේෂ්ඨාර්ථයෙන් සියලු ශාස්තෘ ශාසනය බ්‍රහ්මයැයි කියනු ලැබේ. එකවිට හෝ සමග සසුනේ හැසිරෙයි. පිළිපදිනුයි සබ්‍රහ්මචාරී නම් වේ. **සඳ්ධං පටිලභති** යනු යමෙක් මෙබඳු ධර්මය දේශනා කෙරේ ද ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධය යනුවෙන් තථාගතයන් වහන්සේ කෙරෙහි ද යමක් මෙසේ ඒකාන්තයෙන් පරිපූර්ණ වූයේ, පරිශුද්ධ වූයේ ද ඒ ධර්මය ස්වාක්ඛාතය ආදී වශයෙන් ධර්මය කෙරෙහි ද ශ්‍රද්ධාව ලබයි. උපදවයි යන අර්ථයයි. **තත්‍ථ** යනු අසන ලද පරිදි උගත් පරිදි ඒ ධර්මයෙහිය. **වීමංසා** යනු පාළියේ ද පාළි අර්ථයේ ද විමසීම් ප්‍රඥාවයි. සෙස්ස ඊටම සමාන වචනයකි. එය වනාහි කියන ලද වීමංසනයෙහි හැකීමට නොපැමිණ උත්සාහ වශයෙන් උත්සාහ කිරීමයි. මැනීම් වශයෙන් තුලනය කිරීමයි. **පිරික්සීම් වශයෙන් උපපරික්ඛා** යැයි ද කියන ලදී. එසේ නැතහොත් විමසානුයි වීමංසා නම් වේ. ඒ පද හා පදාර්ථ විමසන ප්‍රඥාවයි. **උසසාහනා**

යනු වීර්යයෙන් උපස්ථම්භනය කරන ලද ධර්මයේ ධාරණය හා පරිචය සාධනය කරන ප්‍රඥාවයි. **තුලනා** යනු පදයක් හා වෙනත් පදයක් ද දේශනාවක් හා වෙනත් දේශනාවක් ද තුලනය කොට සසඳ ගන්නා ප්‍රඥාවයි.

උපපරික්ඛා යනු මහාපදේසවල බහා පාළියේ ද පාළි අර්ථයේ ද පිරිසුම් ප්‍රඥාවයි. තමාට හිත වූ ද අනුන්ට හිත වූ ද දේ කැමැත්තවුන් විසින් අසනු ලැබෙනුයි සුත නම්. කාල තීරණය නොමැතිකමින් දුර්ධං නම් වේ. ඒ කුමක්දැයි අධිකාර වශයෙන් හෝ සමර්ථ බැවින් හෝ පර්යාප්ති ධර්මය යැයි දක්වයි. එසේ නැතහොත් ශ්‍රවණය සුත නම් වේ. ශ්‍රෝත ද්වාරය අනුසාරයෙන් පර්යාප්ති ධර්මයේ සෙවීම යන අර්ථයයි. ශ්‍රුත හේතුවෙන් උපන් බැවින් **සුතමයී** නම් වේ. ප්‍රකාර වශයෙන් දනියි නුයි **පඤ්ඤා** නම් වේ. යම් විමසීමක් වේ ද මෙය සුතමය ප්‍රඥාව යැයි වෙන්වෙන්ව යෙදිය යුතුය. **තථා** යනු යම්සේ සුතමය ප්‍රඥාව වීමංසා ආදී පර්යාය හා විභාග ඇත්තේ ද එසේය. **චින්තාමයී** ප්‍රඥාව ද යන අර්ථයයි. සුතමය ප්‍රඥාව යම්සේ ස්වල්ප වූයේ අනවස්ථිත වේ ද (එක් අරමුණක නොපිහිටන්නේ ද) චින්තාමය ප්‍රඥාව ද මෙසේ යැයි දක්වයි. **සුතෙන නිසසයෙන** යනු පර්යාප්ත ධර්මය ඇසීමෙන් හෝ ශ්‍රවණය කිරීමෙන්, ආශ්‍රය කිරීමෙන් යනුයි. ඉපැම්හුත ලක්ෂණයේ කරණ විභක්ති වචනයකි. කියන ලද පරිදි අසන ලද, ආශ්‍රය කළ යන අර්ථයයි. **වීමංසා** යන ආදියෙහි මේ සීලයයි. මේ සමාධියයි. මේ රූප අරූප ධර්මයෝයි. මේ පංචස්කන්ධයයි. ආදි වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවය විමසන ප්‍රඥාව වීමංසාවයි. ඒ ධර්මයන්ගේම වචනාර්ථය මුදාහැර ස්වභාව රස සහිත ලක්ෂණය තුලනය කර මෙන් ගන්නා ප්‍රඥාව තුලනයයි. ඒ ධර්මයන්ගේම ස්වලක්ෂණය අත්නොහැර අනිත්‍යාදිය නසන සප්‍රත්‍ය ආදී ආකාරයන් ද තර්කකොට විතර්ක කොට පිරිසන ප්‍රඥාව උප පරික්ඛාවයි. එසේ පිරික්සන ලද ධර්මයන් එළඹ සිටි විරුද්ධ ග්‍රහණයකදී මෙන් ඒවා එසේයැයි බැලීමට සුදුසු කොට සිතින් අනුව බැලීම **මනසානුපෙකඛණා** වයි. මෙහිදී ද සුතමය ප්‍රඥාව යම්සේ ද අසන ලද ධර්මය දැරීම් පිරිවිසීම් වශයෙන් පවත්නේ යම්සේ උත්සාහ ඇතිවූයේ ද (එය) උත්සාහය යැයි කීමට සුදුසුය. චින්තාමයී ප්‍රඥාව එසේ නොවේයැයි මෙහි උස්සාහනායි පදයක් නොකියන ලදී. සිතීම **චින්තා** නම්. දැනීම යන අර්ථයයි. සෙස්ස කියන ලද ක්‍රමයටමය. **ඉමාහි දවීහි පඤ්ඤාහි** යනු ඉහත කියන ලද හේතුභූත වූ ප්‍රඥා දෙකිනි. සුතමය - චින්තාමය

ඤාණයන්හි පිහිටියේ විදර්ශනාව අරඹන්නේ යැයි **ඉමාසු දිට්සු පඤ්ඤාසු** යි ද කියත්. ඒවායින් ජාතාසු උප්පන්නාසු කියා හෝ ඉතිරි වචනය යෙදිය යුතුය. **මනසිකාර සම්පයුත්තසස** යනු රූප අරූප පිරිවර ආදී මනසිකාරයන්හි යෙදුණු යනුයි. **යං ඤාණං උපජ්ජති** යනු කියන ලද ක්‍රමයෙන් මනසිකාර ප්‍රයෝගයෙන් දිට්ඨි විසුද්ධි කංඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි පටිපදා ඤාණදස්සන විසුද්ධි යන විසුද්ධීන් සම්පාදනය කිරීමෙන් විදර්ශනාවේ උත්සුක වූ පුද්ගලයාට ඤාණදස්සන විසුද්ධි සංඛ්‍යාත වූ යම් ආර්යමාර්ග ඥානයක් උපදී ද එයයි. මේ භාවනාමය පඤ්ඤාව යන සම්බන්ධයයි. එය වනාහි 'දසසන භූමියං වා භාවනා භූමියං වා' යනුවෙන් දස්සන භාවනා යි දෙවැදෑරුම් වෙතැයි කියන ලදී. ඉදින් දස්සන යැයි කියනු ලැබේ ද (එවිට) එහි කෙසේ භාවනාමය ප්‍රඥාව වේ ද? භාවනාමය වූ ඒ පළමු ඤාණයම නිර්වාණ දර්ශනයෙන් දස්සන යැයි කියන ලදී. එහෙයින් සඵල වූ පළමු මාර්ගය දස්සනභූමියයි. සෙසු ශෛක්ෂ අශෛක්ෂ ධර්මයෝ භාවනා භූමියයි. දැන් මේ ත්‍රිවිධ ප්‍රඥාව වෙනත් වචනවලින් දක්වන්නට 'පරතො සොසා' යනාදිය කියන ලදී. එහි **පරතො** යනු තමාගෙන් නොවේ යනුයි. වෙනත් අයෙකුගෙන් හෝ ශාස්තෘන් වහන්සේගෙන් හෝ ශ්‍රාවකයෙකුගෙන් හෝ යන අර්ථයයි. **සොසො** යනු ඔවුන්ගේ දේශනා ශබ්දයෙනි. දේශනා හේතුවෙන් යන අර්ථයයි. එසේ නැතහොත් අනුන්ගෙන් වන ඝෝෂය මොහුට ඇත්තේනුයි පරතොඝෝස නම්. ඒ සුතමය ප්‍රඥාව යැයි යෙදිය යුතුය. **පවවතත සමුටඨිතා** යනු වෙන්වෙන්ව ඒ ඒ ආත්මයෙහි හටගත් යනුයි. **යොනිසො මනසිකාරා** යන ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව ග්‍රහණාදියෙන් කියන ලද ආකාර ඇති උපායයෙන් පැවති මනසිකාරයන්ය. **පරතො සොසෙන** යනු හේතුභූත වූ පරතො ඝෝෂයෙන් යනුයි. සෙස්ස කියන ලද නය අනුවම වේ.

දැන් යම් අර්ථයක් පිණිස මේ ප්‍රඥාවන් උද්ධරණය කරන ලද ද ඒ හික්මවිය යුතු පුද්ගලයන්ගේ විභාගයම යොදා දක්වන්නට 'යස්සා' යනාදිය කියන ලදී. එහි **ඉමා** දෙව යි ගණන් වශයෙන් කියා නැවත 'සුතමයී ද චින්තාමයී' දැයි ඒවා ස්වරූප වශයෙන් දක්වාලයි. **අයං උග්ඝටිතඤ්ඤු** යනු මොහු සුතමය - චින්තාමය ඤාණයන්ගෙන් ආසය ප්‍රයෝග ප්‍රබෝධය උපදවන ලද බැවින් උදෙසීම් පමණකින්ම දන්නා බැවින් උග්ඝටිතඥ යැයි කියනු ලැබේ යනුයි. **අයං විපඤ්චිතඤ්ඤු** යනු චින්තාමය ඤාණයෙන් අභිප්‍රාය පරීක්ෂා නොකරන ලද බැවින් උද්දේස

නිද්දේසවලින් පරීක්ෂා නොකරන ලද බැවින් උද්දේස නිද්දේසවලින් දන්වන බැවින් විපඤ්චිතඤ්ඤූ නම් වේ. **අයං නෙය්‍යෝ** යනු සුතමය ඤාණය නොමැතිකමින් නිරවශේෂව විස්තර දේශනාව වෙත පැමිණවිය යුතු හෙයින් නෙය්‍ය නම් වේ යනුයි.

මෙසේ දේශනා ප්‍රතිපදා ඤාණ විභාගයන්ගෙන් දේශනාවට බඳුන් වූ වෙනෙය්‍යත්වය (හික්මවිය යුතු බව) බෙදා දක්වා දැන් එහි පැවති භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාවෙන් දේශනා හාරය නිර්ධාරණය කොට යොදන්නට 'සා යං ධම්මදෙසනා' යනාදිය අරඹන ලදී. එහි **සායං** යනු සා අයං යන පද දෙකයි. යම් පෙළක් පෙර දී 'ධම්මං වො භිකඛවෙ දෙසෙසාමි' යනාදියෙන් පටිනිද්දේසවාරයට මුලින් දේශනා හාරයේ විෂය ස්වරූපයෙන් දමන ලද ද එයම මෙහිදී දේශනාහාරය නියෝජනය කරන්නට (දක්වා) 'සායං ධම්ම දෙසනා' යනුවෙන් පරාමර්ශනය කරයි. **කිං දෙසයති** යනු කියනු කැමැත්ත වශයෙන් දේශනාවේ පිණ්ඩාර්ථය විමසා එය ගණනින් පිරිසිඳ සාමාන්‍ය වශයෙන් දක්වයි. **චතසාරි සචචානි** යනු සත්‍යයෙන් තොර වූ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවක් නැත යනුයි. එහි ද චතු-සත්‍යය පිණ්ඩාර්ථයයි. ප්‍රවෘත්ති, ප්‍රවෘත්තක, නිවෘත්ති යන උපායෙන් මිදුණු ඤාණයේ අභාවයෙන් (මේ) සතර (සත්‍යය) නොවෙනස්වන ස්වරූපයෙන් සත්‍යයැයි දතයුතුය. ඒවා දුක්ඛ සමුදය නිරෝධ මාර්ග යැයි ස්වරූප වශයෙන් දක්වයි. එහි නොයෙක් උපදවයන්ට ආධාර බැවින් නින්දිත වූ ද අඥානයන් විසින් සිතන ලද ස්ථිර සුභ සුඛ භාවයන්ගෙන් තොර වූ හෙයින් හිස් වූ ද දුකයි. සෙසු ප්‍රත්‍ය එකතුවෙහි දුකට උත්පත්ති කාරණ හෙයින් සමුදයයි. සියලු ගතින්ගෙන් ශූන්‍ය වූ බැවින් මෙහි සසර හැසිරීම් සංඛ්‍යාත දුක් නැවැත්මක් නැත. මෙය අවබෝධ කළ කල්හි සසර සැරිසැරීම් සංඛ්‍යාත දුක්ඛරෝධයේ අභාවය ද නිරෝධයයි. ඇති නොවූ නිරුද්ධ වූ ප්‍රත්‍ය ඇති බැවින් හෝ නිරෝධය වේ. මරමින් යෙයි. (යන අර්ථයෙන් හෝ) නිවන කැමැත්තවුන් විසින් පිරික්සනු ලැබෙනුයි මග්ග නම්. එහි සමුදයෙන් ආශ්වාදය ද දුක්ඛයෙන් ආදීනවය ද මාර්ග නිරෝධ දෙකින් නිස්සරණය ද (ප්‍රකාශ වේ) මෙසේ යම් සූත්‍රයක චතුසත්‍යය ස්වරූප වශයෙන් ආයේ ද එහි කියන ලද පරිද්දෙන් ද, යම් සූත්‍රයක චතුසත්‍ය ස්වරූප වශයෙන් නො ආයේ ද එහි අර්ථ වශයෙන් ද, චතුසත්‍ය උපුටා ඒවායේ වශයෙන් ආශ්වාදාදිය නිර්ධාරණය කළ යුතුය. යම්තැනක ආශ්වාදාදිය ස්වරූප වශයෙන් ආයේ ද එහි කිවයුත්තක් නැත. යම්තැනක නොආයේ ද එහිදී

අර්ථ වශයෙන් උපුටා ඒවායේ වශයෙන් චතුසත්‍ය නිර්ධාරණය කළයුතුය. මෙහි වනාහි ආශ්වාද ආදිය උදාහරණ වශයෙන් ස්වරූපීව දැක්වූයේ යැයි ඒවායින් සත්‍ය වෙන්කර දක්වන්නට 'ආදීනවො ච' යන ආදිය කියන ලදී. එහි 'සංඛිත්තව පංච උපාදාන ස්කන්ධයන්ම දුකය' යන වචනයෙන් තෘෂ්ණාව හැර තෙභූමක ධර්මයෝ දුක්ඛ සත්‍යයයි. ඒවා ද අනිත්‍ය ආදී ස්වභාව ඇති බැවින් ආදීනවය ද ඵලය ද දේශනාවෙන් සාධනය කළයුතුය. එහි යම් ලෞකික දෙයක් වේ ද ඒ සඳහා 'ඵලඤ්ච දුකඛං' යන්න කියන ලදී. තෘෂ්ණා විපර්යාසයන්ගේ ද ආශ්වාදයයි කැමති වූ බැවින් ඒ සඳහා **අසසාදො සමුදයො** යැයි කියන ලදී. විදර්ශනාව සමග ආර්යමාර්ග දේශනාව ද දේශනා ඵලය අවබෝධයට උපායකොට **උපායො ආණතති ච** මගෙහා යැයි කියන ලදී. නිස්සරණ පදයෙහි ද ආර්ය මාර්ග නිර්ධාරණය කළයුතුය. මේ සත්‍ය විභාගය ආකුලයැයි නොඳත යුතුය. යම්සේ සච්ච විභංගයේ දී තෘෂ්ණාව ද අවශේෂ වූ කෙළෙස් ද අවශේෂ වූ අකුසල ද ආශ්‍රව සහිත වූ කුසල මූලයන් ද ආශ්‍රව සහිත වූ කුසල ධර්ම ද සමුදය සත්‍යය වශයෙන් බෙදන ලද ද ඒවා මෙහිදී ද දතයුතුය. **ඉමානි චතතාරි සචචානි** යනු නිගමනයයි. **ඉදං ධම්ම චකකං** යනු භාග්‍යවතුන් වහන්සේගේ චතුසත්‍ය වශයෙන් පැවැත්වූ යම් ඒ සාමුක්කංසික ධර්මදේශනාවක් වේ ද ඒ ධර්මචක්‍රයයි.

දැන් ඒ ධර්මදේශනාවේ ධර්මචක්‍රභාවය සච්ච විභංග සූත්‍රය ලෙසින් දක්වන්නට 'යථාහ භගවා' ආදිය කියන ලදී. එහි **ඉදං දුකඛං** යනු මේ ජාත්‍යාදි බෙදීම සංක්ෂේප වශයෙන් පංච උපාදානස්කන්ධ සංග්‍රහ වූ තෘෂ්ණාවර්ජිත තෙභූමක ධර්මයෙන් හටගත් දුකෙහි අධිෂ්ඨාන භාවයෙන් ද දුක්ඛදුක්ඛාදී භාවයෙන් ද දුක්ඛ ආර්ය සත්‍යය යන අර්ථයයි. **මෙ** යනු භාග්‍යවතුන් වහන්සේ තමාව දක්වයි යනුයි. **බාරාණසියං** යනු බරණැස නම් නගරයට නුදුරෙහි යනුයි. පසේබුදු ඍෂිවරුන්ට අහසින් බැසීමට ස්ථාන වූ බැවින් **ඉසිපතන** නම් වේ. එහි මුවන්ට අභය දුන් බැවින් **මිගදාය** යැයි ලබන ලද නම් ඇති අසපුවේ එතෙර වෙයි. ඉක්මවයි. අභිභවනය කරයි යන අර්ථයෙන් උත්තර නම් වේ. මෙයට වඩා උත්තර කෙනෙක් නැතැයි **අනුත්තර** නම් වේ. නොවැඩි හෝ අසමාන යන අර්ථයයි. කෙසේ නමුත් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව නන්වැදෑරුම් දෙව්මිනිස් පිරිසෙහි නොයෙක් සිය ගණන් වාර ඔවුන්ට ආර්ය සත්‍යාවබෝධය සම්පාදනය කිරීම් වශයෙන් පැවැත්තේය. එසේ වුවත් සැමට පළමුව අඤ්ඤා කොණ්ඩඤ්ඤ ප්‍රමුඛ වූ අටළොස් කෙළක්

පමණ වූ බඹුන්ට චතුසත්‍යය අවබෝධ කරවන සුලු යම් ධර්ම දේශනාවක් වේද, ඊට අධිකාර්ථව ධම්මචක්ක යන සංඥාව ඇතැයි **ධම්මචකකං පවතතිතං** යැයි කියන ලදී. එහි සතිපටඨාන ආදී ධර්මයම් පැවතීම් අර්ථයෙන් චක්‍රයක් වෙතැයි ධම්මචක්ක නම් වේ. චක්‍රය කියා හෝ ආඥාව කියා හෝ (ගතහැකිය) ධර්මයෙන් වියුක්ත නොවූ බැවින් ධර්මය වූයේත් එයමය. චක්‍රය වූයේත් එයමය යැයි ධම්මචක්ක නම් වේ. ධර්මයෙන් යුක්තියෙන් චක්‍රයකැයි ධම්මචක්ක නම් වේ. උදාහරණ මෙසේ කියන ලදී. ධර්මය ද චක්‍රය ද පවත්වන්නේ නුයි ධම්මචක්ක නමි. චක්‍රය ද ධර්මය ද පවත්වන්නේ නුයි ධම්මචක්ක නමි. ධර්මයෙන් ප්‍රවර්තනය කෙරේනුයි ධම්මචක්ක නමි.

අපපතිවතතියං යනු ධර්මේශ්වර වූ භාග්‍යවතුන් වහන්සේගේ සම්මා සම්බුද්ධ භාවයෙන් ද ධර්මචක්‍රයේ අනුත්තර භාවයෙන් ද වැළැක්විය නොහැකි යනුයි. කවරෙකු විසින් නොපෙරළිය හැකි ද? **සමණෙන වා** යනාදිය (ඒ සඳහා) කියන ලදී. එහි **සමණෙන** යනු පැවිද්දට පැමිණියහු විසින්ය. **බ්‍රාහමණෙන** යනු උපතින් බමුණෙකු වූ අයෙක් විසින්ය. පරමාර්ථ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට විරුද්ධ සිතක් නම් නැත. **දෙවෙන** යනු කාමාවචර දෙවියන් විසිනි. **කෙනචි** යනු ඉතිරි වූ යම්කිසි පිරිවරකිනි. මෙපමණකින් අෂ්ටවිධ පිරිසෙහි නිරවශේෂ වූ ගණනය දතයුතුය. **ලොකසමිං** යනු සත්ත්ව ලෝකයෙහිය. **තතථ** යනු ඒ චතුසත්‍ය ධර්මදේශනාවෙහිය. **අපරිමාණා පදා අපරිමාණා අකඛරා** යනු පිළිවෙල ඉක්මවූ වචනයයි. බොහෝසෙයින් පද සංග්‍රහකරන ලද අක්ෂර යැයි දක්වනු පිණිස (කියන ලදී) පදා අක්ඛරා ව්‍යඤ්ජනා යනුවෙන් ලිංග වෙනස්කිරීම කරන ලදැයි දතයුතුය. **අතථසස** යනු චතු සත්‍ය සංඛ්‍යාත අර්ථයටය.

සංකාසනා යනු කෙටියෙන් ප්‍රකාශ කළයුතු ආකාරයයි. සෙසු තැන්වල ද මේ ක්‍රමයමැයි. **අතථස්ස** යනු සම්බන්ධාර්ථයේ ඡට්ඨී විභක්ති වචනයකි. **ඉතිපිදං** යන තැන ඉති යනු ප්‍රකාරාර්ථයයි. පි ශබ්දය සම්පිණ්ඩනාර්ථයයි. මේ මේ ආකාරයෙන් මේ දුක්ඛ ආර්ය සත්‍යය දතයුතුයි යන අර්ථයයි. ඒ ජාත්‍යාදිභේදයෙන් කියන ලද දුක්ඛ සත්‍යයේ අනේක ප්‍රභේදත්වය එය ප්‍රකාශ කරන අක්ෂරපද ආදියේ උක්තප්‍රකාර අප්‍රමාණත්වය ද සමර්ථනය කරයි. **අයං දුකඛසමුදයො** යනු මෙය කාම තණ්හා ආදී භේද ඇති තෘෂ්ණාව සසරට මූලකාරණ වූ හෙයින් කියන ලද පරිදි දුකෙහි නිපැත්මට හේතුවන බැවින් දුක්ඛසමුදය වේ යනුයි.

අයං දුක්ඛනිරොධො යනු සියලු සංඛතවලින් නිදහස් වූ මේ අසංඛත ධාතුව කියන ලද පරිදි දුකෙහි නූපදවීම් නිවීම්වලට හේතු වූ බැවින් දුක්ඛ නිරෝධය වේ යනුයි. **අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා** යනු මේ සම්මා දිට්ඨි ආදී වූ අංග අටෙහි එකතුව දුක්ඛ නිරෝධ සංඛ්‍යාත වූ නිවනට යයි. අරමුණු වශයෙන් ඊට අභිමුඛ වූ බැවින් දුක්ඛ නිරෝධයට පැමිණීමට ප්‍රතිපදාවක් ද වේ යැයි දුක්ඛ නිරෝධගාමිනී පටිපදා නම් වේ. සමුදය සත්‍යයෙහි එකසිය අටක් වූ තෘෂ්ණා භේදයන්ගෙන් ද නිරෝධ සත්‍යයෙහි මදය යටපත්කිරීම් ආදී පර්යායයන්ගෙන් ද මාර්ග සත්‍යයෙහි සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගෙන් ද **ඉතිපිදං යන පදයේ** අර්ථය බෙදා දතයුතුය. සෙස්ස කියන ලද ක්‍රමයටමය.

මෙසේ **දවාදස පදානි සුතතං** යන ගාථාවෙන් සියලු සාසනයේ අර්ථපද සය, ව්‍යඤ්ජන පද හය වශයෙන් යම් දොළොස් පදයක් කියන ලද ද එයම 'ධම්මං වො භික්ඛවෙ දෙසිසසාමි' ආදියෙන් දේශනා හාරයේ විෂය දැක්වීම් වශයෙන් ඡඡක්ක සූත්‍රය එක් දෙසෙකින් උදෙසා ධම්මචක්ක පවත්තන සූත්‍රයෙන් ඒ අර්ථයේ සංග්‍රහ කරන ලද ආකාරය දැක්වීම් ස්වරූපයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සියලු වචන චතුසත්‍ය දේශනාව බව ද ඒ සඳහා චතුසත්‍ය භාවය පැහැදිලි කරමින් 'ඉදං දුක්ඛනති මෙ බාරාණසියං' ආදියෙන් සච්ච විභංග සූත්‍රය උද්දේස වශයෙන් දක්වා 'තත්‍ථ අපරිමාණා පදා' ආදියෙන් ව්‍යඤ්ජන-අර්ථ පදයන් බෙදමින් දොළොස් පදයක් බව දක්වා දැන් ඔවුන්ගේ අන්‍යොන්‍ය විෂය විෂයී භාවයෙන් සම්බන්ධය දක්වන්නට **'තත්‍ථ භගවා අතඛරෙහි සංකාසෙති** යනාදිය කියන ලදී. යම් හෙයකින් අකුරුවලින් කෙටියෙන් දක්වනු ලබන අර්ථය පදය කෙළවර වෘක්‍ෂය අවසන් නොවූ බැවින් පදයෙන්ම ප්‍රකාශ කරන ලද්දේ දක්වන ලද්දේ වෙයි. එහෙයින් **පදෙහි පකාසෙති** යැයි කියන ලදී. වාක්‍යය කෙළවර ඒ අර්ථය විවරණය කරන ලද්දේ විවෘත කරන ලද්දේ වනැයි **ඛ්‍යඤ්ජනෙහි විවරති** යි කියන ලදී. යම්හෙයකින් (ඒ ඒ) ප්‍රකාරයන්ගෙන් වාක්‍යභේදය ඇතිකළ කල්හි ඒ අර්ථය බෙදන ලද්දේ වේ. එහෙයින් **ආකාරෙහි විභජති** යි කියන ලදී. එසේම වාක්‍යයේ අවයව පිළිබඳව වෙන් වෙන්ව නිර්වචන විභාග කළ කල්හි ඒ අර්ථය ප්‍රකට වන්නේයැයි **නිරුත්තිහි උත්තානි කරොති** යි කියන ලදී. කරන ලද නිර්වචන ඇති වාක්‍ය අවයවයන්ගෙන් ද විස්තර වශයෙන් නිරවශේෂීව දේශනා කිරීමෙන් ද භික්ෂුවිය යුත්තන්ගේ චිත්ත සන්තෝෂය ද බුද්ධියේ මුවහත් කිරීම ද කරන ලද්දේ වනැයි **නිදෙසෙහි පඤ්ඤපෙති** යි කියන

ලදී. මෙහිදී ද අකුරුවලින්ම සංක්ෂේප ප්‍රකාශ කරන්නේ යැයි අවධාරණය නොකොට අකුරුවලින් සංක්ෂේපව ප්‍රකාශ කරන්නේම යැයි මෙසේ අවධාරණය දතයුතුය. මෙසේ ඇතිවිට අර්ථ පදයන්ගේ නොයෙක් නොයෙක් වාක්‍යවලට විෂය වීම ද සිද්ධ වූයේ වෙයි. එහෙයින් එක් අනුසන්ධියක් ඇති සූත්‍රයක අර්ථ පද හයක්ම වේ. නොයෙක් අනුසන්ධි ඇති සූත්‍රයෙහි වනාහි අනුසන්ධියෙක අනුසන්ධියෙක අර්ථපද සය බැගින් නිර්ධාරණය කළයුතුය.

අකඛරෙහි ච පදෙහි ච **උගඝාටෙති** ආදියෙන් ඛ්‍යඤ්ජන පදයන්ගේ කටයුතු සාධනය දක්වයි. හික්මවිය යුතු අය හික්මවීමම ඒවායේ කෘත්‍යයයි. (ව්‍යාපාරයයි.) සත්‍යාවබෝධයට නුසුදුසු බැවින් පද පරමයා මෙහිදී නොකියන ලදී. නෙය්‍ය යන හැඟීමෙන් ම මෙහිදී ඔහුගේ ගැනීම වේ. සෙඛ යන ගැනීමෙන් කල්‍යාණ පෘථග්ජනයා මෙනැයි දතයුතුය. **අකඛරෙහි** යන ආදියෙහි කරණ සාධනයෙහි කරණ විභක්ති වචනයක් මිස හේතු අර්ථයේ වචනයක් නොවේ. අක්ඛර ආදිය උද්ඝාටන (ඉවත්කිරීම) ආදී අර්ථයන්මය. උද්ඝටනාදිය අක්ඛරාදි අර්ථය ඇත්තේ නොවේ. ක්‍රියාවේ යම් අර්ථයක් වේ ද එය හේතුවයි. ආහාරය නිසා වාසය කරන්නේ යම්සේ ද එසේය. **උගඝාටෙති** යනු කන් යොමුකොට එකඟ වූ සිත් ඇති විනේය පුද්ගලයන්ට සංක්ෂෙප කිරීම් වශයෙන් අකුරුවලින් විශේෂය ඇදගනුයේ යම්සේ පද කෙළවර අභිප්‍රාය අවබෝධ වෙයි ද එසේ කැමති පරිදි සංක්ෂේපයෙන් අර්ථය ප්‍රකාශ කරයි. උදෙසයි යන අර්ථයයි. **විපඤ්චයති** යනු උදෙසන ලද පරිදි අර්ථය නිර්දේශ කරයි යනුයි. **විභාරෙති** යනු විස්තර කරයි යන අර්ථයයි. විස්තරකොට කියයි හෝ යනු ද වේ. ප්‍රතිනිර්දේශ කරයි යන අර්ථයයි. යම් හෙයකින් මෙහි **උගඝාටෙති** යි උද්දේසය අදහස් කරන ලදද ඒ උද්දේසයම දේශනාවේ ආරම්භයයි. එහෙයින් උගඝාටනා ආදියි කියන ලදී. එසේම අවබෝධ කිරීම නිර්දේශයයි. විස්තර කිරීම පටිනිර්දේශයයි. නිද්දේස පටිනිද්දේස දෙක ද දේශනාවේ මැද සහ අවසානයයි. එහෙයින් **විපඤ්චනා මජ්ඣෙ විභාරණා පරියොසානං** යි කියන ලදී.

මෙසේ **අකඛරෙහි සංකාසෙති** ආදියෙන් ඛ්‍යඤ්ජන පද හයෙහි ව්‍යාපාරය දක්වා දැන් අර්ථ පදයන්ගේ ව්‍යාපාරය දක්වන්නට 'සොයං ධම්මවිනයො' යනාදිය කියන ලදී. එහි සීලාදී ධර්මයම පර්‍යාප්ති අර්ථය වූ විනේය ජනයන් හික්මවීමෙන් ධම්මවිනය වෙයි. **උගඝටියනෙතා** යනු

උදෙසනු ලබන යනුයි. **තෙන** යනු උද්සවිතඤ්ඤ පුද්ගලයා හික්මවීමෙනි. **විපඤ්චියනෙනා** යනු නිර්දේශ කරනු ලබන්නායි. **විහාරියනෙනා** යනු පටිනිද්දේස කරනු ලබන්නායි.

මෙපමණකින් 'ධම්මා වෝ භික්ඛවෙ දෙසෙසාමි'යි උදෙසන ලද පෙළින් ත්‍රිවිධ වූ කල්‍යාණ භාවය දක්වා දැන් අර්ථ ව්‍යඤ්ජනය සම්පත්තිය දක්වන්නට 'ඡ පදානි අත්ථෝ' යනාදිය කියන ලදී. එය මනාව දතයුතුයි. 'තෙනාහ භගවා' ආදියෙන් දේශනා හාරයේ විෂයත්වයෙන් දක්වන ලද පෙළ නිගමන වශයෙන් දක්වයි. 'ලොකුත්තරං' යනාදිය කෙවල පරිපුණ්ණං පරිසුද්ධං යන පදයන්ගේ අර්ථ විවරණයයි. එහි **උපථයිතං සබ්බවිසෙසානං** යනු සියලු උත්තරි මනුෂ්‍ය ධර්ම සංඛ්‍යාත විශේෂයන්ගේ හෝ අධිශීල ශික්ෂා ආදී විශේෂයන්ගේ පිහිටීම ස්ථානය යි. 'ඉදං නෙසං පදකකනතං' යනාදියේ මෙන් මෙහි ශබ්ද සිද්ධිය දතයුතුයි. **ඉදං වුවවනි තථාගත පදං ඉනිපි** යනාදියෙහි මේ ශික්ෂා තුනකින් සංග්‍රහ වූ සාසන බ්‍රහ්මචර්යය තථාගත නමැති ගඨඛහස්තියාගේ ප්‍රතිපත්ති දේශනා ගමනයන්ගෙන් කෙලෙස් ගහනය යටපත්කොට ගිය මග යැයි ද යනුයි. එහෙයින් අරමුණු වැඩීම් ඇසුරුකිරීවලින් සේවනය කළ (යන අර්ථයි.) භජනය කළ යන අර්ථය ද ලැබේ. එහි මහා වජ්‍රඥාන සර්වඥතා ඥානයන්ගෙන් සලකුණු කරන ලද, තෙත්‍රිභූමක ධර්මයන් සලකුණු කරන තැන යැයි ද කියනු ලැබේ යන අර්ථයයි. **අනොවෙනං** යනු යම් හෙයකින් තථාගත ආදි වශයෙන් කියනු ලැබේ ද එහෙයින් මේ කාරණයෙන්ම ශ්‍රේෂ්ඨ වූ සියලු සත්ත්වයන්ට උතුම් වූ භාග්‍යවතුන් වහන්සේගේ යනුයි. බ්‍රහ්ම වූ හෝ සියල්ලට ශ්‍රේෂ්ඨ වූ හෝ චර්යාව යැයි හැඟෙයි. යම්තාක් දෙව් මිනිසුන් විසින් මනාව ප්‍රකාශ කරන ලද බැවින් කියන ලද ආකාරයන්ගෙන් හැඟෙයි. **තෙනාහ භගවා** යි කියන ලද අර්ථය සම්බන්ධ පෙළ නිගමන වශයෙන් දක්වයි.

අනුපාදා පරිනිර්වාණය පිණිස වූ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවෙන් දේශනාහාරය ආර්ය මාර්ගයට පැමිණීම සඳහායැයි දක්වන්නට 'කෙසං අයං ධම්මදෙසනා'යි විමසා **යොගීනං** යැයි කිවේය. චතු සත්‍ය **කර්මස්ථාන** වර්ධනය පිණිස යෙදුණු යෝගියාටය. ඔවුන්ට මේ දේශනාහාරය මෙහෙයවතැයි යන මේ වචනය දේශනාහාර විභංගයේ අනුසන්ධිය අනුව මනාව තබන ලද බව දක්වන්නට ප්‍රකරණය (නෙත්තිය) සංගායනා කරන්නවුන් විසින් තබන ලදැයි දතයුතුය. එහෙයින්ම 'තෙනාහ

ආයසමා මහාකච්චායනෝ' යි කියන ලදී. **නියුත්තෝ** යනු පාළියෙන් ආස්වාදාදි පදාර්ථයන් නිර්ධාරණය කොට යොදන ලද්දේය යන අර්ථයයි.

දේශනා හාර විභංග වර්ණනාව නිමියේය.

එහි විචයහාරය කවරේ ද? යනාදිය විචයහාර විභංගයයි. මේ එහි පූර්වයෙන් නොකියන ලද පද වර්ණනාවයි. **කිං විචිනති** යන මෙහි විචිනති යන මේ පදයෙන් විචය ශබ්දයේ කර්තෘ නිර්දේශය දක්වයි. 'කිං' යන මෙයින් එම හාරයේ විෂය විමසන ලද්දේයැයි එහි විෂය දක්වන්නට 'පදං විචිනති' යනාදිය කියන ලදී. එහි **පදං විචිනති** යනු මුල පටන් නිගමනය තෙක් සූත්‍රයේ සියලු පද සොයයි යනුයි. මෙම සෙවීම ශබ්ද වශයෙන් හා අර්ථ වශයෙන් දෙවැදෑරුම්ය. ඒ දෙකින්, මේ නාමපදයකි. මේ ආඛ්‍යාත පදයකි. මේ උපසර්ග පදයකි. මේ නිපාත පදයකි. මේ ස්ත්‍රී ලිංගයකි. මේ පුරුෂ ලිංගයකි. මේ නපුංසක ලිංගයකි. මේ අතීත කාලයයි. මේ අනාගත කාලයයි. මේ වර්තමාන කාලයයි. මේ කර්තෘ සාධනයකි. මේ කරණ සාධනයකි. මෙය කර්ම සාධනයකි. මෙය අධිකරණ සාධනයකි. මෙය පච්චත්ත (පඨමා) වචනයකි. මෙය උපයෝග (දුතියා) වචනයකි. මේ භුම්ම (සත්තමී) වචනයකි. මෙය ඒකවචනයකි. මෙය බහුවචනයකි යන මේ ආදී බෙදීම් වචනයක් වේ ද එය ශබ්ද වශයෙන් පද සෙවීමයි. ඒ මේ පද විචය නොවෙනස් වන ස්වභාව නිරුක්තිය ස්වලක්ඛණයෙන්ම පැමිණේයැයි දතයුතුය. අර්ථ වශයෙන් වූ විචය වනාහි ඒ ඒ පදයෙන් කිවයුතු අර්ථ සංවර්ණනාවයි. ඉදින් පෘච්ඡා (විමසීම්) වශයෙන් පැවති පදය, එහි ද, එහි අර්ථයේ ද විමසිය යුතු බව විවේචනය කළ යුතුයැයි මේ අර්ථය දක්වමින් 'පඤ්හං විචිනති' යන ආදිය කීවේය.

යම්හෙයකින් සියලු දේශනාහාරය විචය හාරයට විෂය වූ සූත්‍රයේ සෙවීම කොට පවතී. එහෙයින් 'අසඝාදං විචනති' යනාදිය කියන ලදී. යම්හෙයකින් **අනුගීතිං** යන මෙහි අනුරූප වූ ගීතිය අනුගීතිය වේ යන මේ අර්ථය කැමති වන ලද්දේය. එහෙයින් සොයනු ලබන සූත්‍ර පදයට අනුරූප වශයෙන් සූත්‍රාන්තර පදයන් ද අර්ථ උපුටා ගැනීම් වශයෙන් හෝ පද උපුටා ගැනීම් වශයෙන් හෝ රැගෙන විවේචනය කළයුතුයැයි

දක්වමින් **සබෙබ නව සුත්තනෙත විචනති** යනාදිය කිවේය. නව සුත්තනෙත යනු සූත්‍ර ගෙය්‍ය ආදි නව සූත්‍රයන්හිය. ලැබෙන පරිද්දෙන් ගනියි යන අදහසයි. මේ විචයහාරයේ පදාර්ථ දැක්වීමයි.

මෙසේ නිද්දේසවාරයේ දී විචයහාරය සංක්ෂේප වශයෙන් දක්වන ලදැයි එය විභාග වශයෙන් නිර්දේශ කර පටිනිද්දේස වශයෙන් බෙදා දක්වනුයේ යම් හෙයකින් පදවිචය සූත්‍රයේ පදයක් පාසා පැවතිය යුතු බැවින් ඉතා බරය, පහසු නොවේ යැයි එය ස්පර්ශ නොකර ප්‍රශ්න විසඳන විචයයෙහි පළමුව දක්වමින් 'යථා කිං හවෙ' යනාදිය කිවේය. එහි **යථා කිං හවෙ** යනු යම් ආකාරයකින් ඒ හාරය පැවැත්විය යුතු ද ඒ ප්‍රකාරය කිම වන්නේ ද යනුයි. කෙබඳු වන්නේ ද යන අර්ථයයි. **යථා කිං හවෙය්‍ය** යන පාඨයක් ද වේ. නැවත **යථා** යනු නිපාත මාත්‍රයකි. ආයසමා යනු ප්‍රියවචනයකි. අජිතො යනු බාවරී බ්‍රාහ්මණයාගේ ශිෂ්‍ය වූ දහසය දෙනාගෙන් එක්තරා අයෙකි. **පාරායනෙ** යන පදයේ පාර යන්නෙන් නිවන ගැන ප්‍රකාශ වේ. එය අවබෝධ කරගැනීමේ උපාය දේශනා කරන බැවින් කෙසේ හෝ භාග්‍යවතුන් වහන්සේගේ සියලු වචන පාරායන යැයි කියන්නට සුදුසුය. සංගීති කාරකයන් විසින් වත්ථුගාථා අනුගීති ගාථා ආදිය සමග අජිත සූත්‍රය ආදි සූත්‍ර දහසයට මේ නම කරන ලදැයි ඒවාටම පාරායන සංඥාව වෙතියි පාරායනයෙහි කියන ලදී. ඇතැමෙක් **පාරායනිකො** යැයි කියත්. ඔවුහු තාපස පැවිද්දෙන් පැවිදිවීමට පෙර පාරායනය හදාරමින් සැරිසැරූහ. එහෙයින් මෙයත් පාරායනය පවත්වතැයි **පාරායනිකො** යැයි කියන ලදී. **පුචඡති** යැයි කුමක් නිසා කියන ලද ද? ඇසීමෙන් උපන් බැවින් ඉක්මවූයේ නොවේ ද? මෙය සත්‍යයකි. විමසීම් ආකාරය බුද්ධිය වෙනස්කොට කියන ලදී.

මේ විමසීම ද, අදිටඨජොතනා (නොදක්නා ලද්දහුගේ ප්‍රකාශය විමසීම) දිටඨසංසන්දනා (දක්නා ලද්දහුගේ ප්‍රකාශය සැසඳීම) විමතිච්ඡේදන (විමතිය දුරුකරන විමසීම) අනුමති (අනුමැතිය විමසීම) කථෙතුකම්‍යතා (කියනු කැමති දෙය විමසීම) එකංසව්‍යාකරණ (සෘජුව විමසීම) විභජ්ජ ව්‍යාකරණ (බෙදා දක්වා විමසීම) පටිපුච්ඡා ව්‍යාකරණ (ප්‍රතිප්‍රශ්න නගා විමසීම) ඨපනීය (පිළිතුරු නොදීම) ධම්මාධිට්ඨාන, සත්තාධිට්ඨාන යැයි නන්වැදෑරුම්ය. එහෙයින් මේ විමසීම අදිට්ඨජෝතනා ආදියෙන් ලැබෙන පරිදි විමර්ශනය කළ යුතුය. මෙහි පඤ්හා විභාගය යම්සේ ද එසේ විස්සජ්ජන විභාගය ද විස්සජ්ජන විචයයෙහි දී ලැබෙන පරිදි කිය යුතුය.

විස්සජ්ජනය පෘච්ඡාවට සමානකම් ඇත්තේය. මෙහිදී විමතිච්ඡේදන සත්තාධිට්ඨාන පුච්ඡාව ගෙනහැර දක්වා එහි විමසීම් ආකාරය දක්වන්නට 'කෙනස්සු නිවුතෝ ලොකෝ' යනාදිය කීවේය.

එහි **කෙන** යනු කර්තෘ කාරකයේ කරණ විභක්ති වචනයකි. **සු** යනු නිපාත මාත්‍රයකි. නැතහොත් **සූ** යනු සංශයාර්ථයේ නිපාතයකි. එයින් මෙම ප්‍රශ්නයේ සැක දුරු කරන විමසීම් ස්වරූපය දක්වාලයි. **නිවුතෝ** යනු වසන ලද යනුයි. **ලොකෝ** යනු සත්ත්ව ලෝකයයි. **ඉචචායසමා අජිතෝ** යනු සංගීතිකාරක භික්ෂූන්ගේ වචනයකි. **නපජකාසති** යනු නොපැනේ යනුයි. **කිසසාභිලෙපනං බ්‍රූසි** යනු මේ ලෝකයේ අභිලෝපනය (ලාටුව) කිමකැයි කියහි ද යනුයි. **කිංසාභිලෙපනං** යනු ද පාඨයකි. එහි කිංසු අභිලෙපනං යන පද විභාගය වේ. **පදානි** යන තැන මේවායින් අර්ථය සංස්කරණය කෙරෙනුයි පදානි නම්. වාක්‍යයෝය. **පුචඡිතානි** යනු විමසීම් වශයෙන් කියන ලද යන අර්ථයයි. දැනගන්නට කැමති වූ අර්ථය එකක්මයැයි එක් ප්‍රශ්නයකැයි කියන ලදී. එහි **එකවසතු පරිගහා** යනුවෙන් හේතුව ප්‍රකාශ කරන ලදී. කෙසේ වුවත් වැළකීම්, ප්‍රකාශ නොකිරීම්, ආලේප කිරීම්, මහා බිය සංඛ්‍යාත වූ විමසීමෙන් ගන්නා ලද මේ අර්ථ සතරකියි මෙය කියන ලදී. ඒවා ලොව වෙත එකක් සේ ගුණීභූත විය. ලෝක ප්‍රධාන භාවයෙන් ගන්නා ලද නිසා ඊට අදාළව මේ එකම ප්‍රශ්නයකි යනුයි. එහෙයින්ම ලොකාධිට්ඨානං යනාදිය කියන ලදී. ඒ ලෝකය යනු කවරක්ද? 'ලොකෝ තිවිධෝ' යන ආදිය කීවේය. එහි රාගාදි කෙලෙස් බහුල බැවින් කාමලෝකවල හැසිරෙන සත්ත්වයෝ **කිලෙස ලොකයයි**. ධ්‍යාන අභිඥා බුද්ධි ඇති රූපාවචර සත්ත්වයෝ **භව ලෝකයයි**. ආනෙඤජ සමාධිය බහුල බැවින් පිරිසිදු වූ ඉන්ද්‍රිය ඇති අරූපාවචර සත්ත්වයෝ **ඉන්ද්‍රිය ලෝකයයි**. එසේ නැතහොත් කිලිටිවීම කිලේසයයි. විපාක දුක යන අර්ථයයි. එහෙයින් දුක් බහුල බැවින් අපායවල සත්ත්වයෝ කිලෙස ලෝකයයි. එයින් අන්‍ය වූ සත්ත්වයෝ සම්ප්‍රාප්ත භව ඇති බැවින් භව ලෝකයයි. එහි යමෙක් විමුක්තිය මෝරාගිය ඉන්ද්‍රියවලින් යුක්ත වූවාහු ද එය ඉන්ද්‍රිය ලෝකය යැයි දතයුතුය. ඇතුළත් වූ ධර්මයන්ගේ වශයෙන් ලෝක ව්‍යවහාරය ඇති නිසා ආර්ය පුද්ගලයෝ මෙහිලා සංග්‍රහ නොකරති.

අවිජජාය නිවුතෝ ලොකෝ යනු අංග සතරකින් යුක්ත වූ අඳුරෙන් මෙන් රථ, ඝට ආදී ධර්ම ස්වභාව වසන ලක්ෂණ ඇති අවිද්‍යාවෙන්

ලෝකය වටකරන ලද්දේ, වසන ලද්දේ යනුයි. **විචිකිච්ඡා** යනු සැකයට හේතුවයි. විචිකිච්ඡා මච්ඡරිය යැයි සංග්‍රහයෙහි කියන ලදී. **පමාදා** යනු ප්‍රමාද හේතුවයි. **ජපපාභිලෙපනං** යන තැන ජපපා යනු තෘෂ්ණාවයි. මේ ලෝකයේ වඳුරාට වඳුරු ලාවට මෙන් අභිලේපනය කිලේසය යැයි කියමි. **දුකඛං** යනු ජාති ආදි වූ සසර දුක්ය. මේ පදාර්ථයයි. සෙස්ස පාළියෙන්ම හැඟවෙයි. මේ පද සතර පෘච්ඡා ගාථාවල කියන ලදී. **ඉමෙහි** යනු විස්සජ්ජන ගාථාවෙහි කියන ලද මේ පද සතරින් විසඳන ලදී යනුයි. කෙසේ ද? 'පඨමං' යනාදිය කියන ලදී. එයින් පිළිවෙලින් පුච්ඡා විස්සජ්ජනයන් දතයුතුයැයි දක්වයි.

දැන් පිළිවෙලින් ඒ විමසීම ද විසඳීම ද (පුච්ඡාව හා විස්සජ්ජනය) ස්වරූප වශයෙන් දක්වන්නට ගාථාවේ ද අර්ථය විවරණය කරන්නට 'කෙනස්සු' යනාදිය කියන ලදී. එහි **නීවරණෙහි** යන පදයෙන් කියන ලද අර්ථයම ප්‍රකට කොට දක්වන්නට 'අවිජ්ජා නීවරණාහි සබෙබ සත්තා' යනාදිය කියන ලදී. මෙහි ද 'යථාහා' යනාදියෙන් වෙනත් සූත්‍රාන්තයන් දැක්වීමෙන් මේ පඤ්ච විස්සජ්ජන විචයයෙහි අනුගීති විචයය දක්වන්නේ යැයි දතයුතුය. එහි **පරියායතො** යනු කාරණා වශයෙන් යනුයි. නීවරණ සංඛ්‍යාත කාමච්ඡන්දාදියේ ද හේතු වශයෙන් ද ආවරණ වශයෙන් ද එකම නීවරණයක් ප්‍රකාශ කරමි. අනෙක් නීවරණ ස්වභාවයන්ගේ අභාවයෙන් යන අර්ථය නොවේ. යම්සේ අවිද්‍යාව ඇති කල්හි නීවරණයන්ගේ පැවැත්ම වේ ද එසේ අවිද්‍යාව නැති කල්හි නීවරණ නැතැයි දක්වන්නට **සබබසො** යනාදිය කියන ලදී. **තෙ** යනු අවිද්‍යාවෙන් වටකරන ලද ලෝකය යන පදයෙනි. **පඨමසස පදසස** යනු ලෝකය කවරකින් වටකරන ලද්දේ ද යන පදයේය. **යුත්තා** යනු යෝජිත හෝ අනුරූප වූ හෝ යන අර්ථයයි. මෙයින් විසඳිය යුතු පදයේ පෘච්ඡානුරූපත්වය දක්වන ලදැයි ද පූර්වාපර විමසීම කියන ලදැයි ද දතයුතුය.

යො පුගගලො නීවරණෙහි නිවුතො යනාදියෙන් සැකයෙන් (තෘෂ්ණාවෙන්) ප්‍රමාද වූ පුද්ගලයන්ගේ අවිද්‍යාවට හේතුව දක්වයි. වටකරන ලද්දේම ප්‍රකාශ නොවේ. **විචිකිච්ඡා** යනු විචිකිච්ඡාවයි. එහෙයින්ම **විචිකිච්ඡා නාම වුචචති විචිකිචඡා** යි කියන ලදී. මේ එහි පද සිද්ධියයි. යම්සේ මිථ්‍යා දෘෂ්ටි සම්‍යක් දෘෂ්ටිහු නිත්‍යය අනිත්‍යය ආදියෙන් එක් අංශයක් ගැනීම් වශයෙන් පවතිත් ද මෙය එසේ නොවේ. මෙය වනාහි නොයෙක් අංශ ගැනීම් වශයෙන් නිත්‍ය ද? අනිත්‍ය ද ආදියෙන් විවිධ හෝ විරුද්ධ

හෝ දෙය කැමති වෙයි. සොයයි යන අර්ථයෙන් විචිකිච්ඡා නම් වේ. **සො විචිකිච්ඡතෙතා** යනාදියෙන් ප්‍රකාශ නොවූ දෙයෙහි සැකයෙන් පමා වූවන්ගේ හේතුව විවෘත කරයි.

සුකෙක ධමෙම න උපාදියති යනු බාරගෙන නො පවතී යනුයි. **නපපකාසනති** යනු තමාගේ සිතෙහි කුසල් දහම් අල්ලා ගැනීමක් නැතිව ඒ පුද්ගලයා ලොවෙහි ප්‍රකටව කටයුතු නොකරයි යන අර්ථයයි. **අභිලිමපති** යනු වඳුරු ලාවිටක් වඳුරෙකු දැව ගල් ආදියේ අලවන්නාක් මෙන් පුරුෂයාව රූපාදි (පස්කම්) විෂයෙහි අලවයි යන අර්ථයයි. **ආසතති බහුලසස** යනු තෘෂ්ණා බහුල පුද්ගලයාටය. එවං **අභිජපපාති කරිසසා** යනු මෙසේ මැඩගෙන නැගෙන තැන යන මේ කාරණයෙනි. **තසෂ** යනු ඒ තෘෂ්ණාවෙනි. **ලොකො අභිලිතෙතා** ලාටුවෙන් තැවරුවාක් වැනි වෙයි යන අර්ථයයි. මෙයින් බිය වේනුයි භය නම් වේ. මහත් වූ භය මහබභය නම්. එහෙයින්ම 'දුක්ඛමස්ස මහබ්භයං' යැයි කීවේය. දුක්ඛං දොමනස්සං යැයි දුකම බෙදන ලදී. සියලු දුක බෙදා දක්වන්නට **කිසෙසා දුකඛතා** ආදිය කියන ලදී. **ඔධිසො** යනු කිසිවිටෙක ආත්ම උපක්‍රමය මුල් කරගෙන කිසිවිටෙක පර උපක්‍රමය මුල්කරගෙන යනාදී විභාග ක්‍රමයෙනි. විශේෂයෙන් දුක්ඛ දුක්ඛතාවෙන් නිදහස් වූ රූපාවචරයෝයි.

තථා හි ඔධිසො කදාචි කරහචි යන්න ඇද ගනී. විශේෂයෙන් විපරිණාම දුක්ඛතාවෙන් නිදහස් වූ උපේක්ෂා සමාපත්තීන් බහුලකොට ඇති අරූපාවචර සත්ත්වයෝය. **අපපාබාධා** යන මෙය දුක්ඛ දුක්ඛතාවෙන් නිදහස් වූවහුට හේතු වචනයකි. **දීසායුකා** යනු විපරිණාම දුක්ඛතාවෙන් අරූපී දෙවිවරුය. විශේෂයෙන් ලෝකයේ දීර්ඝ ආයු ඇත්තෝ යන මෙය ද අත්‍යන්ත වූ නිදහස් වීමයි. යම්හෙයකින් දුක් වේදනාව ද සංඛතයක් බැවින් අනිත්‍යතා ආදි සංස්කාර දුක්ඛ ස්වභාවයමය. එහෙයින් යම්තාක් අත්‍යන්ත වූ නිදහස්වීම වේද එය ඉතිරි නොකොට ගැනීම් වශයෙන් සංගණනය කොට දක්වන්නට **සංඛාර දුකඛතාය පන** යනාදිය කීවේය. එහි අල්ලා ගනිනුයි උපාදි නම්. විපාක රාශිය වූ කටත්තා කර්ම රූපයයි. උපාදිස්සයේ ඉතිරිය උපාදිසේසයයි. මෙහි එය නැත්තේනුයි අනුපාදිසේස නම්. එනම් නිර්වාණ ධාතුවයි. ඒ **අනුපාදිසේස නිර්වාණ ධාතුවෙනි.** මෙය ඉපැමිහුත ලක්ෂණයේ කරණ විභක්ති නිරූපණයකි. නිබ්බාණ ධාතු යනු නිවීම් මාත්‍රයකි. **තසමා** යනු සියලු ලෝකයේ ව්‍යාප්ත වූ සියල්ල සංග්‍රහ වූ යම් සසර දුකක් වේ ද එයිනි. **ලෝකසසා** යනු සම්බන්ධාර්ථයේ

ඡට්ඨී විභක්ති වචනයකි. එයින් දුක්ඛමස්ස යන පදයේ අර්ථය දක්වයි. මෙසේ මේ ලෝකයේ නීවරණාදිය නොදන්නා විසින් අන්‍ය සමයන් පිළිබඳ පුහුණුවෙන් හෝ සැකය දැකීමෙන් හෝ ඍජුවම විවරණය කළයුතු බැවින් සත්තාධිට්ඨාන පෘච්ඡාව කරන ලදී. එය ද නොදන්නා හෝ සැක කරන්නා පිළිබඳ නීවරණ ආදී විෂය අනුව සිව්වැදෑරුම්ය. පෙළෙහි වනාහි ලෝකයා නීවරණ ආදියේ ආධාර භාවයෙන් ගාථාවෙහි එක් ප්‍රශ්නයක් ලෙස කියන ලදැයි දක්වන ලදී. මේ මෙහි පෘච්ඡා විචයයි. විස්සජ්ජන විචයය ද අදිට්ඨජොතනි විස්සජ්ජනය විමතිච්ඡේදනි විස්සජ්ජනය යනාදි වශයෙන් පෘච්ඡා විචයයෙහි කියන ලද ක්‍රමය අනුව දතයුතුය.

මෙසේ එක් ආධාරයක් ඇති පෘච්ඡාව දක්වා දැන් නොයෙක් ආධාර ඇති පෘච්ඡාව දක්වන්නට **සවනති සබබධි** ආදිය කියන ලදී. එහි **සවනති** යනු ගලාබසී යනුයි. **සබබධි** යනු රූපාදී සියලු ආයතනයන්හිය. **සොතා** යනු තෘෂ්ණා ආදී සැඩපහරවල්ය. **කිං නිවාරණං** යනු ඔවුන්ගේ කවර ආවරණයක් ද? කවර රක්ෂාවක්ද? යනුයි. **සංවරං බ්‍රූහි** යනු නීවරණ සංඛ්‍යාත ඔවුන්ගේ සංවරය කියහි යනුයි. **කෙන සොතා පිථීයරෙ** යනු කවර ධර්මයකින් තෘෂ්ණා ආදී සැඩපහරවල් වසනු ලැබේ ද යනුයි. වෙන්කරත් යන මෙය මෙහි පදාර්ථයයි. සෙස්ස පාළි වශයෙන්ම ප්‍රකට වන්නේය. **තෙ දෙව පඤ්හා** යනු ඉදින් මේ ගාථාවේ විමසීම් වශයෙන් පැවති පද සතර ද වාක්‍ය සතර ද දැනගන්නට කැමති වූ අර්ථයේ ද්විධත්වයෙන් වූ ඒ ප්‍රශ්න දෙකයි. කවර හෙයින් ද? **ඉමෙහි බවභාධිවචනෙන පුච්ඡිතා** යි කියන ලදී. මේ එහි සංක්ෂේපාර්ථයයි. ඒ ගාථාවෙන් ගන්නා ලද මේ අර්ථ දෙක යම්හෙයකින් බහු යන්න අරභයා පැවති වචනයෙන් විමසන ලද ද එහෙයින් ඒ ප්‍රශ්න දෙකයි. එකතො උපරි බහු යනු ශාසනික ව්‍යවහාරයයි. පෘච්ඡාවේ ඒ අර්ථ දෙකක් විෂය කරගත් බව විවෘත කරන්නට **එවං** යන ආදිය කියන ලදී. එහි අර්ථයයි. ඤාති ව්‍යසන සංඛ්‍යාත වූ යම් ප්‍රාණවධ ආදියකින්ම හෝ දුගතියට හේතු වූ ආපදාවලින් හෝ එකවිට හෝ සමග හෝ සියලු අයුරින් හෝ මේ ලෝකයා පැමිණියේ ද බැසගත්තේ ද එය නිමිති වූ දස වැදෑරුම් ක්ලේශ වස්තූන්ගෙන් කිලිටි වූයේ ද ඊට පැමිණි ආකාරය ද කිලිටි වූ ආකාරය ද මෙනෙහි කොට **එවං සමාපන්නස්ස එවං සකිලිටඨස්ස** යැයි කියන ලදී. මෙයින් පිරිසිදු වේ ශුද්ධ වේනුයි වොදානං නම්. මෙය කරණකොට සමථ විදර්ශනාවෙන් ද නිමිත්තෙන් ද පැවැත්මෙන් ද නැගී සිටීනුයි

වුටයාන නම් වේ. ආර්ය මාර්ගයයි. **අසමාහිතස්ස** යනු නොයෙක් අරමුණුවල විසිරුණු සිතටය. **සවනති** යනු පවතිත් යනුයි. **අභිඤ්ඤා** යනාදිය අසමාධාන හේතුව දැක්වීමයි. එහෙයින්ම **එවං අසමාහිතස්ස** යනුවෙන් කියන ලදී. **යථා හ භගවා** යනාදියෙන් මෙහිද අනුගීති විචය දක්වයි. කන්වල ශ්‍රවණය බොහෝසෙයින් අනුව පැවතීම් වශයෙන්ම යැයි (දැක්වීමට) **සවති මනාපියෙසු රූපෙසු** යි කියන ලදී. මෙහි ද චක්ඛු ආදිය ශ්‍රෝතයන්ගේ දොරටු වශයෙන් පවතිනුයේ උපචාර වශයෙන් තමන් අසන්නාක් මෙනැයි කියන ලදී. **ඉති** යනු මෙසේය. **සබබ** යනු සියල්ල හා සමාන වූ යනුයි. **සබබථා** යනු සර්වප්‍රකාරයෙන් යනුයි. **ඉදං** වොදානං යනු මේ නැගී සිටීම් පීඩාවකැයි කියන ලදී. පරියුට්ඨාන ප්‍රහාණ වශයෙන් වන පිරිසිදු බවයි.

විසඳුම් ගාථාවෙහි **සති තෙසං නිවාරණං** යනු විදර්ශනාවෙන් යුතු සිහිය කුසල - අකුසල ධර්මයන්ගේ ස්වභාව සොයමින් ඒ ශ්‍රෝතයන්ගේ වැළැක්වීමයි. **සොතානං සංවරං බ්‍රූමි** යනු එම සතියම ශ්‍රෝතයන්ගේ සංවරය යැයි කියමි යනුයි. **පඤ්ඤායෙතෙ පිථීයරෙ** යනු රූපාදියෙහි අනිත්‍යතාව පිළිබඳ අවබෝධය සාධනය කරන මාර්ග ප්‍රඥාවෙන් මේ ශ්‍රෝතයෝ හැම අයුරින් වසත් යනුයි. උපදින්නට නොදීම් වශයෙන් මුල් සුන් කරත් යන අර්ථයි. **නාවිඤ්ඤති** යනු දැඩි ලෝභය ආදී ප්‍රවෘත්ති ද්වාර භාවයෙන් සිත හෝ පුද්ගලයා නොඇදී යනුයි. මෙහිදී අනුසය ප්‍රහාණයෙන් වසා දැමීම අදහස් කරන ලදැයි **පඤ්ඤාය අනුසයා පහියනති** යි කියන ලදී. යම්හෙයකින් අනුසය නැතිකල්හි අනුසය නිමිත්තේ නැගී සිටීම නොවේ යැයි 'අනුසයෙසු' යනාදිය කියන ලදී. දැන් ඒ අර්ථයම උපමාවෙන් දක්වමින් **තං යථා බන්ධනතස්ස** යනාදිය කියන ලදී.

මෙහි ද ශ්‍රෝතයන්ගේ වැළකීම් සංඛ්‍යාත වූ සංවර පිධානය ද නොදන්නා විසින් හෝ එහි සැක ඇත්තා විසින් ඒකාන්ත බැවින් ධම්මාධිට්ඨාන පුච්ඡාව කරන ලදැයි මෙහි දී පෘච්ඡාවිචය කියන ලද ක්‍රමයෙන්ම විස්සජ්ජන විචය ද දතයුතුය. මෙහි ද යම් අදහසකින් **කෙනසසු නිවුතො ලොකො** යන ගාථාවෙන් නිවරණාදි සතර විමසිය යුතු කල්හි **එකො පඤ්ඤා** යි කියන ලදී. එයින් පළමුකොටම ශ්‍රෝතයන්ගේම සංවරය ද ආවරණය ද විමසන ලදැයි ශ්‍රෝතයන් ඒකාර්ථ වශයෙන් ගෙන පෘච්ඡාවේ එක් ආධාරයක බැවින් **එකොපඤ්ඤා** යැයි

කිවයුතු වන්නේ ය. ශ්‍රෝතයන් අධික බැවින් බොහෝ යැයි කිවයුතු වන්නේ ය. යම් පමණ ශ්‍රෝතයෝ වෙත් ද එපමණ ප්‍රශ්නයෝ ද වෙත්. **යම් අදහසකින් සවනනි සබබධි සොතා** යි ගාථාවෙහි ශ්‍රෝතයන් ස්පර්ශ නොකර සංවර විධානයන්ගේ වශයෙන් ප්‍රශ්න දෙකකැයි කියන ලදී. එහෙයින් පළමු ගාථාවෙන් නීවරණයන්ගේ ලෝකාධාර භාවය ඇතිකල්හි ලෝකය ස්පර්ශ නොකොට නීවරණාදීන්ගේ විභාගයෙන් ප්‍රශ්න සතරකැයි කිවයුතු යැයි මේ නය දක්වන ලදැයි දතයුතුය.

දැන් යම්හෙයකින් විමසනු ලබන්නේ හුදෙක් පෙර තමා විසින් රචිත නියමයෙන් ම නො විමසයි. ඉක්බිතිව දේශනා කාලයෙහි කියන ලද ධර්මයේ අනුසන්ධිය ගෙන ද විමසයි. එහෙයින් එහි අධිසන්ධිය පෘච්ඡාවෙන් විවේචනය කළයුතු ආකාරය දක්වමින් **යානි සොතානි** යන ගාථාවට අනතුරුව **පඤඤාවෙව සති ච** යන ගාථාව කීවේය. මේ එහි සංක්ෂේප අර්ථයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද යම් මේ ප්‍රඥාවක් වේ ද යම් සතියක් වේ ද ඉන් අන්‍ය වූ යම් නාමරූපයක් වේ ද යම් සතියක් වේ ද ඉන් අන්‍ය වූ යම් නාමරූපයක් වේ ද යම් සතියක් වේ ද ඉන් අන්‍ය වූ යම් නාමරූපයක් වේ ද ඒ සියල්ලම කවර තැනක නිරුද්ධ වේ ද? මෙය විමසන ලද මට කියන්න. විස්සජ්ජන ගාථාවෙහි වනාහි යම්හෙයකින් ප්‍රඥා සති දෙක නාමයක් ලෙසම සංග්‍රහ කරත් ද, එහෙයින් ඒවා වෙනම නොකියන ලදී. මෙය ද මෙහි සංක්ෂේප අර්ථයකි. අජිතය, ඔබ 'කත්‍ථතං උපරුජ්ඣති' යන අනතුරු ගාථාවෙන් මගෙන් යම් ඒ ප්‍රශ්නයක් අසන ලද ද යම්තැනක එය ඉතිරි නැතිව ආවරණය කෙරේ ද එය ඔබට කියමි. ඒ ඒ විඤඤාණයේ නිරෝධයෙන් එකවිටම පෙර පසු නොවී එය මෙහිදී ආවරණය වේ. විඤඤාණයේ නිරෝධයෙන් මෙහිදීම නිරුද්ධ වේ. මේ විඤඤාණ නිරෝධය එහි නිරෝධය නො ඉක්මවා යැයි කියන ලදී.

අයං පඤඤා අනුසන්ධිං පුච්ඡති යන අනතුරු ගාථාවෙන් ශ්‍රෝතයන්ගේ පරියුට්ඨාන, අනුසය, ප්‍රහාණ කෘත්‍ය සමග සතිය ද ප්‍රඥාව ද කියන ලදී. ඒ අසා එය ප්‍රහාණය කිරීමේ දී ප්‍රඥාව හා සතිය ඇතිකල්හි ඒවා ඇසුරුකොට නාමරූපයන් විය යුතුය. එසේ ද ඇතිකල්හි සුදුසුමය. මේ සනනිශ්‍රිය වූ ප්‍රඥා ස්මෘතීන්ගේ අශේෂ නිරෝධය කවර තැනක වේ ද යන මේ අදහසින් මේ විමසීම කරන ලදැයි අයං පඤඤා -පෙ- ධාතුං යි කියන ලදී.

යම් ප්‍රතිපදාවක් කරණ කොටගෙන අනුපාදිසේස නිර්වාණ ධාතුව ලබත් ද ඒ චතුසත්‍ය කර්මස්ථාන වැඩීම් සංඛ්‍යාත වූ ප්‍රතිපදාව විෂය සමග දක්වන්නට **තීණිසචචානි** යනාදිය කියන ලදී. එහි **සංඛතානි** යනු දැනගෙන, පැමිණ ප්‍රත්‍යයන්ගෙන් කරන ලදැයි සංඛත වේ යනුයි. **නිරොධ ධම්මානි** යනු නොපෙනීම් ස්වභාවයයි. **දුකඛං සමුදයො මගෙහා** යනු ඒවායේ ස්වරූපය දැක්වීමයි. නිරෝධය කෙසේදැයි දක්වන්නට **නිරොධො අසංඛතො** යැයි කියන ලදී. විෂය සමග ප්‍රහාණය කළයුතු හා ප්‍රහාණය කරන ස්වභාව ඇති ආර්ය සත්‍යයන්හි ප්‍රහායක විභාග මුඛයෙන් පහාතබ්බ විභාගය දක්වන්නට තතථ **සමුදයො** යනාදිය කියන ලදී. එහි **අවිජාවසේසා** යනු දර්ශන මාර්ගයෙන් ප්‍රහීණව ඉතිරි වූ අවිජ්ජාව යන අර්ථයයි. මේ සේස ශබ්දය කාමච්ඡන්ද, ව්‍යාපාද, මාන උද්ධච්ච යන මෙහි ද යෙදිය යුතුය. අවිද්‍යාව යම්සේ ද එසේ මේ අපායට යන සුළු ධර්මයෝ ද පළමු මාර්ගයෙන් ප්‍රහාණය වෙත්මය. **අවිජා නිරවසෙසා** යනුවෙන් ද පාඨයක් වේ. මෙහි ද කියන ලද පරිදි කාමච්ඡන්ද ආදි පදයන්හි ද නිරවසේස ශබ්දය යෙදිය යුතුය. පූර්ව වූ මාර්ග දෙකෙන් කාමච්ඡන්දාදීහු සාවශේෂීව වේ. **තෙධාතුකෙ ඉමානි දසසංයොජනානි** යන මෙහි **තෙ ධාතුකෙ** යනු සංයෝජනයන්ගේ විෂය දැක්වීමයි. එහි වනාහි ඒවා සංයෝජන වශයෙන් පවතිත්. **අනඤඤතඤඤසසාමිතින්ද්‍රියං** අධිපතියාය යනු ඒ ප්‍රහායක බවට පැමිණ යනුයි. **යං පන** යන මෙහි යං යනු හේතු අර්ථයේ නිපාතයකි. **ඉදං චයෙ ඤාණං** යනු හේතුව වූ යම් ඤාණයකින් මගේ උත්පත්තිය ක්‍ෂය වූයේ යැයි තමන්ගේ උපතේ ක්‍ෂයත්වය දනී ද මෙසේ ඒ ප්‍රත්‍යවේක්ෂණයට නිමිති වූ අර්හත් ඵල ඤාණය චයෙ ඤාණය නම් වේ යනුයි.

නාපරං ඉත්ථත්තායාති පජානාති යන මෙහි ද යං යන නිපාතය රැගත යුතුය. යං නාපරං ඉත්ථත්තායාති පජානාති ඉදං අනුපපාදෙ ඤාණං යන මෙහි ද පෙර කියන ලද ක්‍රමයෙන්ම අර්හත් ඵල ඤාණ වශයෙන් අර්ථය යෙදිය යුතුය. අත්ථසාලිනියේ දී ඛයෙ ඤාණය කෙලෙස් ක්‍ෂය කරන බැවින් අරියමගෙ ඤාණය යැයි කියන ලදී. අනුප්පාදෙ ඤාණය ප්‍රතිසන්ධි වශයෙන් හටනොගත් ඒ ඒ මාර්ග වර්ජන කෙලෙස්වල නූපදීම් කෙළවර උපන් අරියඵලෙ ඤාණය යැයි කියන ලදී. මෙහිදී වනාහි දෙකම අර්හත් ඵල ඤාණය වශයෙන්ම බෙදන ලදී. එහෙයින්ම **ඉමානි දෙඤාණානි අඤඤතාවින්ද්‍රියං** යැයි ද **ආරම්මණ සංකෙතෙන දෙ නාමාන ලභනති** යැයි ද කියන ලදී. අඤඤින්ද්‍රිය යටින් වූ තුන් ඵලයෙහි ද

උඩින් වූ තුන් මගෙහි ද ඉපැත්මෙන් නැවත නැවත උපදින්නේ ද අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මෙන් අග්‍රඵල උත්පත්තිය වූ පළමුඵල උත්පත්තියෙන් වූ අනුත්පාද නිරෝධයෙන් නිරුද්ධ වේ යැයි **යඤ්ච අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං** යනාදිය කියන ලදී. මෙයින් ප්‍රහාතව්‍ය ධර්ම මෙන් දර්ශන භාවනාවන්ගෙන් අග්‍රඵල උත්පත්තියෙන් ඉන් අවශේෂ වූ ඵලධර්මයෝ ද අනුත්පාද නිරෝධයෙන් නිරුද්ධ වෙත්. තෙහුමක ධර්ම ගැන කවර වාදයක්දැයි දක්වයි. එක් ප්‍රඥාවක් අඤ්ඤතාවින්ද්‍රියට අයත්ය. ඉදින් එකක් නම් කවර හෙයකින් දෙපරිදියැයි කියන ලද ද? **අපිච** යනාදිය කියන ලදී. **ආරම්මණ සංකෙතෙන** යනු මේ අරමුණු සංඥාවෙන් බයෙ ඤාණය නුපදවයි යනුයි. සා පජානනටෙඨන ඤඤ්ඤා යනු පෙර ශ්‍රෝතයන්ගේ වැසීම් කෘත්‍ය ඇති යම් ප්‍රඥාවක් දක්වන ලද ද ඒ ප්‍රඥාව දැනගැනීම් ස්වභාවයෙනි. අනෙක් ප්‍රඥාව වනාහි අරමුණ දක්නා ලද පරිදි, ගන්නා ලද පරිදි වේ. මතක්කර දීම අර්ථයෙන්, බැසගැනීම් අර්ථයෙන් **සති** නම් වේ.

මෙසේ **පඤ්ඤා චෙව සති ච** යන පදයේ අර්ථය විවරණය කොට දැන් **නාමරූපං** යන පදයේ අර්ථය විවරණ කරමින් **තත්‍ථ යෙ පඤ්චුපාදානක්ඛන්ධා ඉදං නාම රූපං** යැයි කියන ලදී. නාමරූප ද විභාග වශයෙන් දක්වමින් සුවසේ ග්‍රහණය කර ගැනීම පිණිස ප්‍රකට නාමරූපයන්ම දක්වන්නට **තත්‍ථ යෙ** යනාදිය කියන ලදී. නාමරූප ද විභාග වශයෙන් දක්වමින් සුවසේ ග්‍රහණය කරගැනීම පිණිස ප්‍රකට නාමරූපයන්ම දක්වන්නට **තත්‍ථ යෙ** යනාදිය කියන ලදී. එය ගැනීමෙන්ම එක්ව හැසිරීම් ආදියෙන් ඉන් අන්‍ය වූ චිත්ත චෛතසික රූපධර්මයෝ ද ගන්නා ලද්දාහු වෙති. මෙහි නාමග්‍රහණයෙන් ස්කන්ධ තුනම ගන්නා ලදැයි (දැක්වීමට) **නාමරූපං විඤ්ඤාණ සම්පයුත්තනං** යි කියන ලදී. බොහෝ ජනයා විභාග නොකොට ගන්නා ස්වභාවය සඳහා කියන ලදැයි දතයුතුය.

ගාථාවෙන් අනුපාදිශේෂ නිර්වාණ ධාතුව අසන ලදැයි එය චතුර් ඍද්ධිපාද මුඛයෙන් ආර්යමාර්ග අවබෝධයෙන් කිය යුතුයැයි දක්වන්නේ ඉද්ධිපාද භාවනාව මූලහේතු වූ ඉන්ද්‍රිය සති ප්‍රඥා දෙකින් වෙන් කරන්නට **තත්‍ථ සති ච පඤ්ඤාව චතත්‍තාරි ඉන්ද්‍රියානි** යි කියන ලදී. කුසලා කුසල ධර්මයන්ගේ ස්වභාවය සොයනු ලබන්නේ සතිය සිද්ධවන්නේ යැයි ඒකාන්තයෙන් සමාධිය උපදවයි. සතිය ගැනීමෙන් මෙහි පරියුට්ඨාන ප්‍රහාණය අදහස් කරන ලදැයි **සති දෙව ඉන්ද්‍රියානි සතින්ද්‍රියඤ්ච සමාධි**

ඉන්ද්‍රියඤ්ච යි කියන ලදී. එසේ අනුසය නැති කිරීම සිදුකරන ප්‍රඥාව සිද්ධවන්නේ චතුර්විධ සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් තොරව සිද්ධ නොවන්නේ යැයි (දැක්වීමට) **පඤ්ඤා දෙව ඉන්ද්‍රියානි පඤ්ඤින්ද්‍රියානි විරියින්ද්‍රියඤ්ච** යි කියන ලදී. **යා ඉමෙසු චතූසු ඉන්ද්‍රියෙසු** යනු මේ සති ආදී සතර ඉන්ද්‍රියන් කෙරෙහි ආශ්‍රය හේතුවෙන් අධිෂ්ඨාන වූ ඒ හා උපන්නා වූ ම යම් විශ්වාසයක් වේ නම් එයයි. **ඉමෙහි චතූහි ඉන්ද්‍රියෙහි** යැයි ද පෙළක් වේ. එයින් මේ ඉන්ද්‍රිය සතරින් යුක්ත වූ යන වචන ශේෂය ලැබේ. අරමුණෙහි පැහැදීම් ලක්ෂණ ඇති ශ්‍රද්ධාව කරනු කැමති ස්වභාව ඇති ඡන්දයේ විශේෂ ප්‍රත්‍යය වේයැයි **යා සද්ධාධිපතෙය්‍යා චිත්තෙකග්ගතා අයං ඡන්දසමාධි** යි කියන ලදී. **සමාහිතෙ චිත්තෙ** යනු විදර්ශනා සමාධියෙන් එකඟ වූ සිතෙහිය.

ඉදං පහාණං යනු විෂ්කම්භන ප්‍රහාණය සිදුකරන සමාධි ප්‍රහාණය යැයි කියන ලදී. මෙයින් දුරුකෙරේ යන අර්ථය ඇති කොටයි. **පධානං** යැයි පාඨයක් ද වේ. අග්‍රය යන අර්ථයයි. යම්සේ සමාධිය එකඟතාව යැයි කියනු ලැබේ ද එයයි.

අසසාසපසසාසා යනාදියෙන් කාය වාග් මනෝ සංස්කාර ශීර්ෂයෙන් හේතුසංඛ්‍යාත විරිය සංස්කාර ද ගන්නා ලදී. ඒවා වනාහි භාවනා නිපැත්ම යම්තාක් ද ඒ තාක් එකම රසයෙන් සරණ වන බැවින් ද සංකල්පනය කළයුතු බැවින් ද **සරසංකප්පා** යි කියන ලදහ. මාගේ භාවනාව මෙසේ වේවායි යම්සේ සිතන ලද ද එසේ පැවතීමෙන් හේතුරහිත බැවිනි. **තදුභයං** යනු ඡන්දසමාධි සංඛ්‍යාත වූ ද පධාන සංඛාර සංඛ්‍යාත වූ ද වීර්යය යන දෙකයි. (ඒ) දෙකට උපචාර වශයෙන් වෙනකක් මෙන් කොට **ඡන්දසමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං** යි කියන ලදී. නොබිඳුන දෙය ද උපචාර වශයෙන් බිඳුනක් මෙන් කොට ව්‍යවහාර කරත්. සීලාපුත්තකයාගේ ශරීරය මෙනි.

එහි සමෘද්ධ වේනුයි **ඉද්ධි** නම් වේ. සමෘද්ධ වේ නිපැයේ යන අර්ථයයි. එයින් සත්ත්වයෝ වර්ධනය වේ හෝ සමෘද්ධ වූවානු වර්ධනය වූවානු උසස් බවට ගියානු වෙතැයි හෝ **ඉද්ධි** නම් වේ. මෙයින් යේනුයි **පාද** නම් වේ. පළමු අර්ථයෙන් ඉද්ධි වූයේත් පාද වූයේත් එයමය (යන අර්ථයෙන්) ඉද්ධිපාද නම් වේ. ඉද්ධි කොටස යන අර්ථයයි. දෙවැනි අර්ථයෙන් ඍද්ධියෙන් යෑමට ප්‍රතිෂ්ඨා වූ අධිගමූපාය (යන අර්ථයෙනි.)

ඉද්ධිපාද නම් වේ. එය කරණ කොටගෙන මතුමත්තෙහි විශේෂ සංඛ්‍යාත වූ ඉද්ධියට යයි. පැමිණෙයි. **විවෙකනිස්සතං** යනු තදංගවිවේක නිශ්‍රිත වූ ද සමුච්ඡේද විවේක නිශ්‍රිත වූ ද නිස්සරණ විවේක නිශ්‍රිත වූ ද ඉද්ධිපාද වර්ධනය කරයි යන අර්ථයයි. එසේම මේ ඉද්ධිපාද භාවනාවේ යෙදුණු යෝගියා විදර්ශනා ක්ෂණයෙහි කෘත්‍ය වශයෙන් තදංග විවේකය ඇසුරු කළා වූ ද අදහස් වශයෙන් නිස්සරණ විවේකය ඇසුරු කළා වූද (ඉද්ධිපාදය වඩයි) මාර්ගක්ෂණයෙහි දී කෘත්‍ය වශයෙන් සමුච්ඡේද විවේකය ඇසුරු කළා වූ ද අරමුණු වශයෙන් නිස්සරණ විවේකය ඇසුරු කළා වූ ද ඉද්ධිපාදය වඩයි. **විරාග නිස්සිතං** යනාදියෙහි ද මේ ක්‍රමයම වේ. විරාගාදිය විවේකය ප්‍රයෝජන කොට ඇත්තාහුමය. මෙහිදී හුදෙක් අත්හැරීම (වොස්සග්ගය) පරිච්චාග වොස්සග්ගය, පක්ඛන්දන වොස්සග්ගය යැයි දෙවැදෑරුම්ය.

එහි පරිච්චාග වොස්සග්ගය යනු විදර්ශනා ක්ෂණයෙහි තදංග වශයෙන් ද මාර්ගක්ෂණයෙහි සමුච්ඡේද වශයෙන් ද කෙලෙස් ප්‍රහාණය කිරීමයි. පක්ඛන්දන වොස්සග්ගය යනු විදර්ශනා ක්ෂණයෙහි ඊට නැමීම් වශයෙන් ද මාර්ග ක්ෂණයෙහි අරමුණට උපකාර වශයෙන් ද නිර්වාණයට පැනගැනීමයි. ඒ දෙකම මේ ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූ අර්ථ සංවර්ණනා ක්‍රමයෙහි යෙදෙයි. එසේම මේ පළමු ඍද්ධිපාදය කියන ලද ආකාරයට කෙලෙස් දුරුකරයි. නිවනට ද පැන ගනියි. **වොසසගග පරිනාමිං** යනු මේ වචනයෙන් අත්හැරීම පිණිස නැමෙන්නා වූ ද නැමුණා වූ ද මුහුකුරවන්නා වූද මුහුකුරා ගියා වූ ද යන අර්ථයයි. මේ ඍද්ධිපාද භාවනාවෙහි යෙදුණු යෝගියා, යම්සේ පළමු ඍද්ධිපාදය කිලෙස පරිච්චාග වොස්සග්ගය පිණිසත් නිබ්බාණ පක්ඛන්දන වොස්සග්ගය පිණිසත් විපාක දෙයි ද යම්සේ මුහුකුරා යේ ද එසේ එය වර්ධනය කරයි. සෙසු ඉද්ධිපාදවලදීත් මේ ක්‍රමයමය. මේ වනාහි විශේෂයයි. මෙසේය. ඡන්දය ප්‍රධානකොට පැවති සමාධිය ඡන්ද සමාධියයි. මෙසේ වීරිය චිත්ත වීමංසාව ප්‍රධානකොට පැවති සමාධිය වීමංසා සමාධියයි. හුදෙක් සතර ඍද්ධිපාදයම සමාධිඤාණය මුල්කොට ඇත්තේ නොවේ. එහෙයින් සියල්ලම යැයි දක්වන්නට **සබ්බා සමාධි ඤාණ මූලකා ඤාණ පුබ්බංගමා ඤාණානුපරිවත්තී** යැයි කියන ලදී.

ඉදින් මෙසේනම් කවර හෙයකින් එයම වීමංසා සමාධිය යැයි කියන ලද ද? වීමංසාව ප්‍රධානකොට පැවති හෙයිනැයි මේ අර්ථය කියන

ලදී. එහි පූර්වභාග ප්‍රඥාවෙන් ඤාණ මූලකය වේ. අධිගම ප්‍රඥාවෙන් ඤාණ පූර්වංගමය වේ. ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාවෙන් ඤාණානුපරිවර්තනය වේ. එසේ නැතහොත් පූර්වභාග ප්‍රඥාවෙන් ඤාණමූලකය වේ. උපචාර ප්‍රඥාවෙන් ඤාණ පූර්වංගමය වේ. අර්පණා ප්‍රඥාවෙන් ඤාණානු පරිවර්තනය වේ. නැතහොත් උපචාර ප්‍රඥාවෙන් ඤාණ මූලකය වේ. අර්පණා ප්‍රඥාවෙන් ඤාණ පූර්වංගමය වේ. අභිඥා ප්‍රඥාවෙන් ඤාණානුපරිවර්තනය වේයැයි දතයුතුය. **යථාපුරෙ** යනු යම්සේ සමාධියට පෙර පුබ්බේ නිවාසානුස්සති ඤාණයට අනුව පැවතීම් වශයෙන් පෙර අතීත ජාතින්හි, අසංඛ්‍ය වූ සංවෘත, විවෘත කල්පයන්හි තමාගේ ද අනුන්ගේ ද ස්කන්ධයන් ද ස්කන්ධ හා සබැඳි දේ ද නොදන්නේ නම් නැත. **තථා පච්ඡා** යනු සමාධිය අනාගතංස ඤාණයට අනුව පැවතීම් වශයෙන් අනාගත ජාතින්හි ද අසංඛ්‍ය වූ සංවෘත විවෘත කල්පයන්හි ද තමාගේ ද අනුන්ගේ ද ස්කන්ධයන් ද ස්කන්ධ හා සබැඳි දේ ද නොදන්නේ නම් නැත යන අර්ථයයි. **යථා පච්ඡා** යනු යම්සේ සමාධිය චේතොපරිය ඤාණයට අනුව පැවතීම් වශයෙන් අනාගතයේ සත්ත්වයෙක අනෙක් සත්ත්වයන්ගේ චිත්තය නොදත්තේ නම් නොවේ යන අර්ථයයි. **තථාපුරෙ** යනු අතීතයේ සත්ත්වයෙක අනෙක් සත්ත්වයන්ගේ සිත නොදත්තේ නොවේ යන අර්ථයයි.

යථා දිවා යනු යම්සේ දහවල් කාලයේ හිරු එළියෙන් අඳුර දුරුවීමෙන් ඇස් ඇති සත්ත්වයන්ගේ ඇස් හමුවට පැමිණි ඇසින් දතයුතු රූපය මනාව දතහැකි ද (එමෙන්ය යනුයි) **තථා රත්තං** යනු එසේ රාත්‍රී භාගයෙහි චතුරංග සමන්නාගත අන්ධකාරය පවතිද්දී සමාධියේ දිබ්බචක්ඛු ඤාණයට අනුව පැවතීම නිසා නොදත් රූපායතනයක් නැත යනුයි. **යථා රත්තිං තථා දිවා** යනු රාත්‍රියේ යම්සේ ද දහවල ද එසේ, ඉතා සියුම් වූ, කිසිවකින් නොවැසුණු ඉතා දුර වූ යමක් වේ ද ඒ සියලු රූප නොදත්තේ නොවේ යනුයි. යම්සේ රූපායතනයෙහි කියන ලද ද එසේ සමාධියේ දිබ්බසොත ඤාණයට අනුව පැවතීම නිසා ශබ්දායතනයෙහි ද පමුණුවාගත යුතුය. එහෙයින්ම **ඉති විවටෙන චෙතසා** යනාදිය කියන ලදී. එහි අපරියොනද්ධෙන යනු අභිඥා ඥානයට බාධා කරන කෙලෙස්වලින් බැස නොගත් නොවැසුණු බැවින්ම ප්‍රභාස්වර වූ සිතයි. එයින්ම සමාධියේ ඉද්ධිවිධ ඤාණයට අනුව වූ පැවතීම ද කියන ලදමැයි දතයුතුය. **පඤ්ඤින්ද්‍රියානි** යනුවෙන් ඉද්ධිපාදවලින් යුතු ශෛක්ෂයාගේ පංචඉන්ද්‍රිය අදහස් කරන ලදැයි කියන ලදී. කුසලයෝ යැයි (කියන ලදී.) **චිත්තසභාගූනි** යනාදිය

ඒවායේ විඤාන නිරෝධයෙන් නිරෝධ දර්ශනය සඳහා අරඹන ලදී. **නාමරූපඤ්ච** යනාදිය ද එසේය. එයින් හුදු පංච ඉන්ද්‍රියම දක්වන්නේ නොවේ. එසේනම් නාමරූප ද විඤ්ඤාණයට හේතු වූ විඤ්ඤාණ නිරෝධයෙන් නිරුද්ධ වේයැයි (දක්වයි.) **තසස** යනු විඤ්ඤාණයේය. **හෙතු** යනු තෘෂ්ණා අවිද්‍යා ආදියයි. **අනාහාරං** යනු පදයේ අර්ථ විවරණයයි. **අනභිනඳිතං** යනු සතුටට හේතු වූ තණ්හාව ප්‍රහීණ වූ බැවින්ම නොපතන ලද යනුයි. එහෙයින්ම ඒ ප්‍රතිසන්ධි නොවන විඤ්ඤාණය නිරුද්ධ වෙයි. විඤ්ඤාණය යම්සේ ද නාමරූප ද එසේය. විඤ්ඤාණ සංඛ්‍යාත වූ හේතුවේ ප්‍රත්‍යයේ අභාවයෙන් ද ඊට ප්‍රත්‍ය වූ සංස්කාර ආදීන්ගේ අභාවයෙන් ද අහේතු අප්‍රත්‍ය වේ. සෙස්ස ප්‍රකටමය. ඇසීම් විසඳීම් විනිශ්චය ද කියන ලද ක්‍රමය අනුසාරයෙන් දතයුතුයි.

මෙසේ අනුසන්ධි විමසීම ද දක්වා යටින් සත්තාධිට්ඨානය ද ධම්මාධිට්ඨානය ද පිළිබඳ විමසීම වෙන වෙනම දක්වන ලදැයි දැනී එය දක්වන්නට **යෙ ච සංඛ්‍යාත ධම්මාසෙ** යනාදිය ආරම්භ කෙරිණ. මේ එහි පදාර්ථයයි. **සංඛාත ධම්මා** යනු අනිත්‍යාදි වශයෙන් විමසන ලද ධර්මයෝයි. මෙය රහතුන්ට වෙනත් නමකි. **සෙකඛා** යනු සීල ආදිය හික්මවන අවශේෂ ආර්ය පුද්ගලයෝය. **පුථු** යනු බොහෝ සත්ත්වයෝය. **තෙසං මෙ නිපකො ඉරියං පුථෙථා පබ්‍රූහි** යනු ඒ ශෛක්ෂ අශෛක්ෂයන්ගෙන් දක්ෂ වූ පණ්ඩිත වූ ඔබ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතිපත්තිය විමසන ලද්දේ මට කියහි යනුයි. සෙස්ස පාලි වශයෙන්ම හැඟවෙයි. **කිසසා** යනු කවර හේතුවක් ද යනුයි. කවර කාරණයකින් ද යන අර්ථයයි. **සෙකඛාසෙකඛ විපසසනා පුබබංගමපහාණ යොගෙන** යනු ශෛක්ෂයන් ද අශෛක්ෂයන්ද විදර්ශනා පූර්වංගම ප්‍රහාණයන් ද පිළිබඳ ඇසීමෙනි. විමසීම් විධියෙන් යන අර්ථයයි.

විසඳුම් ගාථාවෙහි **කාමෙසු නාභිගිජෙඣය්‍ය** යනු වස්තු කාමයන්හි ක්ලේශ කාමයෙන් නො ඇලෙන්නේය යනුයි. **මනසා නාවිලො සියා** යනු ව්‍යාපාද විතර්ක ආදිය ද කාය දුශ්චරිත ආදිය ද සිතේ කැළඹීම ඇතිකරන ධර්මයන් ද ඉවත් කරමින් සිතින් නොකැළඹුණු අයෙක් වන්නේය යනුයි. යම්හෙයකින් වනාහි අශෛක්ෂ පුද්ගලයා සියලු ධර්මයන් අනිත්‍යාදි වශයෙන් තුලනය කරන ලද බැවින් සියලු ධර්මයන්හි ද කායානුපස්සනා සති ආදියේ ද දක්ෂ වූයේ සිහි ඇතිව සියලු කෙලෙස් බිඳ දමන ලද බැවින් උතුම් භික්ෂුත්වයට පැමිණියේ ද වී සියලු

ඊර්යාපථයන්හි පවතී ද එහෙයින් **කුසලෝ -පෙ- පරිබ්බජේ** යි කියන ලද්දේය යන මෙය සංක්ෂේපාර්ථයයි. එහි විමසීම් ගාථාවෙහි **නිපකෝ** යැයි යම් පදයක් කියන ලද ද එය භාග්‍යවතුන් වහන්සේ සඳහා කියන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රඥාව උසස් බවේ පරතෙරට පැමිණියේ අනාවරණ ඤාණ දර්ශනයෙන් බැබලවිය යුතුයයි අනාවරණ ඤාණය පළමුව කර්ම ද්වාර භේදයන්ගෙන් බෙදා ශෛක්ෂ අශෛක්ෂ ප්‍රතිපදාව දක්වන්නට **භගවතෝ සබ්බං කායකම්මං** ආදිය කියන ලදී. එයින් සියලු තැන නොවළක්වන ලද ඤාණ දර්ශනයෙන් තථාගතයන් වහන්සේගේ ශෛක්ෂ අශෛක්ෂ ප්‍රතිපත්ති දේශනා කුශලත්වයම දක්වයි. එහි **කොච** යනු කොහි ද යනුයි. කවර විෂයෙහි ද යන අර්ථයයි. **අනිච්චං දුක්ඛං අනත්තා** යනුවෙන් ඒ විෂය දක්වයි. ඤාණ දර්ශනය උපදිනුයේ සියලු සංඛත, අනිත්‍ය, දුක්ඛ සියලු ධර්ම අනාත්මයැයි උපදී යන මෙය කියන ලද්දේ වෙයි. එහිදී ඒ විෂයයෙහි යම් හෙයකින් නොපැවැත්ම වේ ද එය වැළැක්වීම (විනාශ කිරීම) වේ.

මෙයින් ලක්ෂණත්‍රය පිළිබඳ අවබෝධයේ සම්පූර්ණ නොකළ හැකි බව ද අනන්‍ය සාධාරණත්වය ද දක්වයි. ලක්ෂණත්‍රය දැක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ චතුසත්‍ය අවබෝධය ද සම්මා සම්බෝධිය ද පණ්ඩිතයෝ දැනගනිත්. **අඤ්ඤාණං අදස්සනං** යි ඒ විනාශ කිරීම ස්වරූප වශයෙන් දක්වයි. ෂඩ් අරමුණු ස්වභාවයෙන් වසා දමන මෝහය ඤාණ දර්ශනයේ විනාශය යැයි යම් විෂයයෙක්හි ඤාණ දර්ශනය නිපැත්මට සුදුසු ද එහිදීම එහි විනාශය විය යුතුයයි **යං අනිච්චෙ දුක්ඛෙ අනත්තනියෙ ච** යි කියන ලදී. **යථා ඉධ පුරිසෝ** යනාදිය උපමා දැක්වීමයි. මේ එහි උපමා සැසඳීමයි. සියලු ලෝකය පුරුෂයා වැනිය. ෂට් අරමුණු තාරකා රූප වැනිය. ලෝකයේ චක්ෂු විඥානාදිය මගින් සුදුසු පරිදි ෂට් අරමුණු දැනගැනීම ඒ පුරුෂයාගේ තාරකා රූප දර්ශනය මෙනි. රූපාදි අරමුණු කෙසේ හෝ දැනගන්නා වූ ලෝකයාගේ අනිත්‍යාදි ලක්ෂණත්‍රය පිළිබඳ අනවබෝධය තාරකාරූප දකින ඒ පුරුෂයාගේ මෙපමණ සිය ගණනකි. මෙපමණ දහස් ගණනකි යනාදී ගණන් සංකේතයකින් නොදැන්ම මෙනි.

දැන් භාග්‍යවතුන් වහන්සේ විසින් යම් පදයකින් ආයුෂ්මත් අජිතයන්ගේ ශෛක්ෂ ප්‍රතිපදාව කියන ලද ද ඒ පදයන්ගේ අර්ථය බෙදා දක්වන්නට **තත්‍ථ සෙකෙඛන** යනාදිය කියන ලදී. එහි **තත්‍ථ** යනු නිපාත මාත්‍රයකි. ඒ විසඳීමෙහිය. **සෙකෙඛන** යන තැන මොහුගේ ශික්ෂාව සීල

යනුයි සෙකඛ නම් වේ. ඒ ශෛක්ෂයාගෙන්ය. **දවීසු ධමෙමසු** යනු දෙවැදෑරුම් ධර්මයන්හි යන අදහසයි. **පරියුටයානියෙසු** යනු දෝෂයෙන් නැගිටින ලද්දහු විසින් යම්තැනක පෙරළිය යුතු ද ඒ ආඝාත (වෛර) වස්තූන්හිය යන අර්ථයයි. **පටිඝටයානියෙසු** යිද පාඨයකි. එයම අර්ථයයි. මෙහි ද ගිජුබව වළක්වන චෝදනාවෙහි ගෙඩ නිමිත්ත වූ ද්වේෂය ගිජුබව ඇති කල්හි වේයැයි එයින් ද සිත රැකිය යුතු බව නිර්ධාරණය කොට කියන ලදී.

යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයන්හි නො ඇලෙන්නේ යැයි කියන ලද ද එහෙයින් **තසා යා ඉචඡා** යනාදියෙන් ගිජුවීම් වශයෙන් නිර්දේශය කරන ලදී. එසේ නැතහොත් ද්වේෂයෙන් සිත රැකිය යුතු බැවින් ගාථාවේ දෙවැනි පාදයෙන් කියන ලදමැයි දතයුතුය. දෙවැනි පාදයෙන් සෙසු ක්ලේශ පාරිශුද්ධ ධර්මයෝ දක්වන ලදහ. එසේම උපන් නූපන් භේදයෙන් සම්මා වායාමයේ විෂයභාවයෙන් සියලු සංකිලෙස වොදාන ධර්මයන් සතරවැදෑරුම්ව බෙදා **සම්මප්පධාන** ස්වරූපයෙන් ශෛක්ෂ ප්‍රතිපදාව මස්තකයට පමුණුවා දක්වන්නට **සෙකෙඛා අභිගිඤඤනෙනා** යනාදිය කියන ලදී. එහි **අනාවිල සංකපෙපා** යනු කැළඹුණු කාම සංකල්පාදියේ නොමැතිකමින් නොකැළඹුණු සංකල්ප ඇති යනුයි. එයින් ම ද ගිජු නොවූයේ වෑයම් කරයි. වීර්යය පවත්වයි. කෙසේ වෑයම් කරයිද? **සො අනුපපනනානං** යනාදිය කියන ලදී. එහි **සො** යනු මතු විශේෂත්වය පිණිස පිළිපදිනු ලබන ශෛක්ෂයාය. **අනුපපනනානං** යනු නූපන් දේවල යනුයි. **පාපකානං** යනු ලාමක වූ දේවලය. අකුසලානං ධම්මානං යනු අකුසලින් හටගත් ධර්මවලය. **අනුපපාදාය** යනු නූපදනා පිණිසය.

ඡඳං ජනෙති යනු කත්තුකම්‍යතා සංඛ්‍යාත වූ කුසල ඡන්දය උපදවයි යනුයි. **වායමති** යනු ප්‍රයෝග පරාක්‍රමය කෙරෙයි යනුයි. **විරියං ආරභති** යනු කායික හා චෛතසික වීර්යය කරයි යනුයි. **චිතතං පගණහාති** යනු එක්ව හටගත් ඒ උත්සාහයෙන්ම සිත ඔසවයි යනුයි. **පදහති** යනු ප්‍රධන් වීර්යය කරයි යනුයි. වායමති ආදි වූ පද සතර ආසේවනය භාවනය බහුලීකරණය **සත්ත ක්‍රියාව** සමග යෙදිය යුතුය. **උපපනනානං පාපකානං** යනු (උපන් පාපයන්ගේය) **අනුපපනනානං** යනු නොපැවතුම් බවට පැමිණි ධර්මයන්ගේය. **පහාණාය** යනු දුරුකිරීම පිණිසයි. **උපපනනානං** යනු නිපන්නවුන්ගේය. **ඨිතියා** යනු පැවතීම පිණිසය. **අසම්මොසාය** යනු

නොනැසීම පිණිසය. **භියෝභාවාය** යනු නැවත නැවත වනු පිණිසය. වෙපුල්ලාය යනු විපුලත්වය පිණිසය. භාවනාය යනු වැඩීම සඳහාය. පාරපූරියා යනු පරිපූර්ණත්වය සඳහා යැයි යන මෙය පදාර්ථයයි.

කතමෙ ච අනුපපනනා යනාදිය යම්බඳු කුසල ධර්මයෝ ද අකුසල ධර්මයෝ ද නූපන්නාහු ද යම් බඳු ඒවා (කුසලාකුසල ධර්මයෝ) උපන්නාහු ද ඒවා දක්වන්නට ඇරඹිණි. එහි **ඉමෙ අනුපපනනා** යනු මේ කාම විතර්කාදිය නොහැසිරීම් වශයෙන් හෝ නොසිදුවූ අරමුණු වශයෙන් හෝ නූපන්නාහු යනුයි. වෙනත් අයුරකින් කෙළවරක් නැති සසරෙහි නූපන් අකුසලයක් නම් නැත. මෙහි විතර්ක තුන ප්‍රහාණ කිරීම් සංඛ්‍යාත නිදර්ශන මාත්‍රය දතයුතුයි. **අකුසල මූලානි** අනුසයම සියලු අකුසලයන්ගේ මූලය බැවින් මෙසේ කියන ලදී. ලෝභාදිය නොවේමය. මොවුහු උපන්නාහු භූමිලද්ධ උපන්න, අසමුග්ඝාටිත උප්පන්න යනාදී ඉපදීම් පර්යාය ස්වභාවයෙන් නාම වශයෙන් උපන්නාහු නම් වෙත්. වර්තමාන භාවයෙන් නොවේ යන අර්ථයයි. **ඉමෙ අනුපපනනා කුසලා ධම්මා** යනු සෝතාපන්නයාට මේ ශ්‍රද්ධාදිය සෝවාන් ඵලය සාක්ෂාත් කිරීම පිණිස පිළිපන්නාට නූපන් කුසල් දහම් නම් වේ.

පුථුජ්ජනානං යැයි දක්වන්නේ නම් කවර වාදයක් ද? මෙහි කුසල ශබ්දය බාහිතික සූත්‍රයේ දී මෙන් නිවැරදි ක්‍රමයයි දතයුතුය. **ඉමෙ උපපනනා කුසලා ධම්මා** යනු මේ ශ්‍රද්ධාදිය පළමු මාර්ගයේ දී සෝවාන්ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් පුද්ගලයාට උපන්නා වූ කුසල ධර්මයන් නම් වේ. සතිපට්ඨාන භාවනාවේ දී මනාව විග්‍රහ කළ කාම විතර්කය යැයි (දැක්වීමට) **යෙන කාමවිතකකං වාරෙති ඉදං සතින්ද්‍රියං** යි කියන ලදී. නිවැරදි සැපයට ස්ථාන වූ අවික්ඛේප වූ චේතෝ දුක්ඛය ඇසුරු කළ වික්ඛෙප ප්‍රත්‍යය වූ ව්‍යාපාද විතර්කය මනාව නිග්‍රහ කරන ලදැයි **යෙන** බ්‍යාපාද විතක්කං වාරෙති ඉදං සමාධින්ද්‍රියංයි කියන ලදී. කුසල ධර්මයන්හි අරඹන ලද උත්සාහය පරාපරාධය සුවසේ ඉවසන්නේ යැයි වීර්යයෙන් විහිංසා විතර්කය මනාව නිග්‍රහ කළැයි **යෙන විහිංසා විතකකං වාරෙති ඉදං විරියින්ද්‍රියං** යි කියන ලදී. සමාධි ආදියේ ද යම්සේ ස්වකීය ප්‍රතිපක්ෂය අතහැර දැමීම ප්‍රඥාවන්තයාටම සමෘද්ධ වේයැයි මේ අර්ථය දක්වමින් **යෙන උපනුපපනෙන** යනාදිය කියන ලදී.

යම්සේ නිර්ධාරණය කරන ලද මේ ඉන්ද්‍රිය පසෙහි ස්ව විෂය

පිළිබඳ ජ්‍යෙෂ්ඨ භාවය පෙන්වන්නට **සද්ධින්ද්‍රියං තත්‍ථ දට්ඨබ්බං** යනාදිය කියන ලදී. එය මනාව දතයුතුමය. ශෛක්ෂයන්ගේ මේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන්ගේ නිපැත්මෙන් සියලු ශෛක්ෂ ධර්ම මස්තකප්‍රාප්ත වේයැයි දක්වමින් **එවං සෙකෙඛා** යනාදියෙන් ශෛක්ෂ පටිපදාව නිගමනය කරයි.

මෙසේ ශෛක්ෂ ප්‍රතිපදාව බෙදා දක්වා දැන් අශෛක්ෂ ප්‍රතිපදාව බෙදා දක්වන්නට **කුසලෝ සබ්බධම්මානං** යනාදිය කීය. එහි **සබ්බධම්මානං** යන මේ පදයෙන් පළමුව ප්‍රකාශිත ධර්මයන් බෙදා දක්වා එහිදී අශෛක්ෂයාගේ කුසලතාව දක්වන්නට **ලොකෝ නාම** යනාදිය කියන ලදී. එය කියන ලද අර්ථ ඇත්තේමය. **කිලෙස ලොකෙන භවලොකෝ සමුදාගච්ඡති** යනු කාමාවචර ධර්මය නිසා රූපාවචර ධර්ම හටගනී යන අර්ථයයි. **සෝ** යනු එය මහද්ගත ධර්මවල හෝ පරිත්ත (ස්වල්ප වූ) මහද්ගත ධර්මවල හෝ පිහිටියේ යනුයි. ඉන්ද්‍රියානි නිබ්බතෙති යනු සීල සමාධි ආදිය තියුණු අවබෝධය ඇති ඒවා බවට පත්කොට විමුක්තිය මුනුකුරා යන සද්ධා ආදී ඉඳුරන් උපදවයි යනුයි. **ඉන්ද්‍රියෙසු භාවිය මානෙසු** යනු කියන ලද ඉන්ද්‍රියන් වැඩෙන කල්හි රූපාරූපයන් අල්ලා ගැනීම් වශයෙන් ඥෙය ධර්මයේ විශේෂ දැනීම ඇතිවේ. **දසසන පරිඤ්ඤා** යනු ඤාත පරිඤ්ඤාවයි. (ප්‍රසිද්ධ වූ විශේෂ දැනීමයි.) **භාවනා පරිඤ්ඤා** යනු **තීරණ පරිඤ්ඤාව** හා **ප්‍රහාණ පරිඤ්ඤාවයි. සා ද්විධෙන** යනාදියෙන් සංක්ෂේප වශයෙන් කියන ලද අර්ථය **යදා හි සෙකෙඛා** යනාදියෙන් විවරණය කරයි. එහි **නිබ්බිදා සහගතෙහි සඤ්ඤාමනසිකාරෙහි** යන මෙයින් දෘඪ වූ විදර්ශනාව දක්වයි. **යදා හි සෙකෙඛානි** යන මෙහි හික්මීම් ස්වභාවයෙන් කල්‍යාණ පෘථග්ජනයා ද ශෛක්ෂ පාදයෙන් සංග්‍රහ කරන ලදැයි (**තීරණය**) කොට **දෙව ධම්මා කොසල්ලං ගච්ඡන්ති දසසන කොසල්ලඤ්ච** යනාදිය කියන ලදී. මෙය මෙහි අදහසයි. කල්‍යාණ පෘථග්ජනයා යම්විටෙක පූර්වභාග ශික්ෂාවෙහි හික්මෙන්නේ කලකිරීම් සහිත සංඥා මනසිකාරයන්ගෙන් දතයුතු දෙය මනාව දැනගනී. යම්විටෙක ඔහුගේ ඒ විදර්ශනා ධර්මයෝ දර්ශන කුසලය වූ පළමු මාර්ග ඥානයට යෙන් ද ඊට පැමිණෙන් ද ඒ සමග ගැටෙන් ද එවිට සෝවාන් ආදී ශෛක්ෂ පුද්ගලයා කියන ලද ක්‍රමයෙන් දතයුතු දේ දැනගනී. එකල්හි ඔහුගේ ඒ විදර්ශනා ධර්මයෝ වැඩීමට කුසලත්වයට යත්. **තං ඤාණං** යනු ඥෙයයට පෙර යම් පරිඥාවක් කියන ලද ද ඒ ඥෙය පරිජානන ඤාණයයි. **පංචවිධෙන වෙදිතබ්බං** යනු විෂය භේදයෙන් එහි ප්‍රභේද දක්වයි යනුයි.

ධම්මානං **සලකබණෙ ඤාණං** යනු රූප අරූප ධර්මයන්ගේ කර්කශ, ස්පර්ශාදි සලක්ෂණයෙහි ඤාණයයි. යම්හෙයකින් ඒ සියලු ඥෙයය හේතු-හේතුඵල භේදයෙන් දෙවැදෑරුම් වෙයි. එහෙයින් **ධම්මපටිසම්භිදා අත්ථ පටිසම්භිදා** යි දක්වන ලදී. **පරිඤ්ඤා** යි තීරණ ප්‍රඥාව අදහස් කරන ලදී. යම්හෙයකින් රූපාරූප ධර්මයන් සලක්ෂණ හෙයිනුත් ප්‍රත්‍ය හෙයිනුත් මනාව දැන කුශලාදී විභාගයන්ගෙන් ඒවා අල්ලාගෙන අනිත්‍යාදි වශයෙන් දන්නේ වෙයි ද එහෙයින් **එවං අභිඤාතිච්චා යා පරිඤානා ඉදං කුසලං** යි කියන ලදී. එහි **එවං ගහිතා** යනු මෙසේ අනිත්‍යාදි වශයෙන් කලාපයන් ස්පර්ශ කිරීම් වශයෙන් ගන්නා ලද ස්පර්ශ කරන ලද යනුයි. **ඉදං ඵලං නිබ්බත්තෙතබ්බං** යනු මේ උදයව්‍යය ඤාණාදිය පිළිවෙලින් උපදවත් යනුයි. නිමිත්ත පිළිබඳ කර්තෘ භාවයෙන් හැසිරෙන බැවින් ආර්ය භාවය ඇතිකරන සත්‍ය අරිය සච්ච නම් වේ. **තෙසං** යනු උදයව්‍යය ඤාණ ආදියේය. **එවං ගහිතානං** යනු මෙසේ පැවති දේවලය. **අයං අත්ථෝ** යනු සත්‍ය පිළිබඳ මේ අවබෝධය යන අර්ථයයි. යම්සේ පරිඤ්ඤා පඤ්ඤාව සිහිකළ යුතු ධර්ම, සිහිකරනු ලබන ධර්ම පිළිබඳව සිහි කෙරුම් ආකාරය දන්නේ ද මෙසේ සිහිකිරීම් ඵලය ද දන්නේ යැයි (තීරණය කොට) මේ නය දක්වන ලදී.

යෙ **අකුසලා** යි සමුදය සත්‍යය කියන ලදී. සියලු අකුසලයෝ සමුදය පක්ෂයේ වෙත්. යෙ **කුසලා** යනු සම්මා දිට්ඨි ආදී මාර්ග ධර්මයෝය. ඉදින් ඵල සාක්ෂාත් කළයුතු ධර්මයෝ ද චතුසත්‍ය අවබෝධය අදහස් කරන ලද බැවින් **කතමෙ ධම්මා සච්ඡිකාතබ්බා, යා අසංඛතා ධාතු** යි කියන ලදී. **අනත කුසලෙ** යනු ප්‍රත්‍යවලින් ඇති වූ අර්ථයන්හි දක්ෂ වූ යනුයි. ධම්ම**කුසලෙ** යනු ප්‍රත්‍ය ධර්මයන්හි දක්ෂ වූ යනුයි. පාළි අර්ථය හෝ පාළි ධර්මය හෝ අත්ථධම්ම නම් වේ. **කල්‍යාණෙ කුසලෙ** යනු යෝග්‍යත්වයේ දක්ෂ වූ යනුයි. නය සතරෙහි දක්ෂ වූ යන අර්ථයයි. දේශනා යුක්තියෙහි දක්ෂ වූ හෝ යනුයි. **ඵලෙ කුසලෙ** යනු ක්ෂීණාශ්‍රව ඵලයෙහි දක්ෂ වූ යනුයි. **ආය කුසලෙ** යනාදියෙහි ආයෝ යනු වර්ධනයයි. එය ද අනර්ථ හානි වශයෙන් ද අර්ථෝත්පත්ති වශයෙන් ද දෙවැදෑරුම්ය. **අපායෙ** යනු නොවැඩීමයි. එය ද අර්ථ හානි වශයෙන් ද අනර්ථ උත්පත්ති වශයෙන් ද දෙවැදෑරුම්ය. **උපායෙ** යනු සත්ත්වයන්ගේ ඉක්මන් කටයුතු හෝ බිය හෝ උපන් කල්හි එයට පිළියම් කිරීමෙහි සමර්ථ වූ ඤාණය ඇතිකිරීමේ හේතුවයි. එහි කුසලෙ යනු අර්ථයයි. ක්ෂීණාශ්‍රවයාම සර්වප්‍රකාරයෙන් අවිද්‍යාව ප්‍රහීණ කළ බැවින් ප්‍රඥාවේ විපුලත්වයට

පැමිණියේ මේ ඉපදීම් ආදියෙහි දක්ෂයා වෙයි. මෙසේ අශෛක්ෂ පුද්ගලයාගේ කුසලතාව එක් කොටසකින් ප්‍රකට කොට නැවත ඉතිරි නැතිව දක්වමින් **මහතා කොසලෙන සමනනාගතො** යි කියන ලදී.

නිම වූ ශික්ෂා ඇති අශෛක්ෂ පුද්ගලයාට සතියෙන් කළයුතු වෙනත් ප්‍රයෝජනයක් නැතැයි දිටඨධම්ම **සුඛ විහාරත්‍ථං** යි කියන ලදී. දැන් දක්වන ලද පරිදි ශෛක්ෂ අශෛක්ෂ ප්‍රතිපදාව නිගමනය කරනුයේ **ඉමා දෙව චරියා** යනාදිය කියන ලදී. එහි **බොජ්ඣං** යනු අවබෝධ කළයුතු යනුයි.

තං චතුබ්බිධං යනු ඒ අවබෝධ කළ යුතු දේ සිව්වැදෑරුම් වේ යනුයි. චතුසත්‍ය බැවිනි. **එවං ජානාති** යනු මෙසේ විශේෂ වූ අවබෝධය ආදි වශයෙන් යමෙක් දනී ද එයයි. **අයං වුච්චති** යනු මේ අශෛක්ෂ පුද්ගලයා සතියෙන් විපුලත්වයට පැමිණියේ වෙනස් නොකළ හැකි සේ සිහියෙන් ඉදිරියට යන්නේය ආදියෙන් කියනු ලැබේ යනුයි. සෙස්ස ප්‍රකටමය. මෙහි ද විමසීම් විසඳීම් පරීක්ෂණය පෙර කියන ලද ක්‍රමය අනුසාරයෙන් දතයුතුය.

මහතෙරුන් වහන්සේ මෙපමණකින් විචය හාරය බෙදා දක්වමින් අජිත සූත්‍රය වශයෙන් විමසීම් පරීක්ෂණය ද විසඳීම් පරීක්ෂණය ද දක්වා දැන් සූත්‍රාන්තරයන්හි ද විමසීම්-විසඳීම් පරීක්ෂණයන්හි න්‍යාය දක්වනුයේ **එවං පුචඡිතබබං එවං විසසජ්ජිතබබං** යි කියන ලදහ. එහි **එවං** යනු මේ ක්‍රමයෙන් යනුයි. **පුචඡිතබබං** යනු විමසීම කළයුතු යනුයි. ඇසිය යුතු හෝ විවේචනය කළ යුතු යන අර්ථයයි. **එවං විසසජ්ජිතබබං** යන මෙහි ද ඒ ක්‍රමයමයි. **සුතනසස ච** යනාදිය අනුගීති විචය දැක්වීමකි. **අනුගීති අත්ථතො බ්‍යඤ්ජනතො ච සමානෙතබබා** යනු සූත්‍රාන්තර දේශනා සංඛ්‍යාත අනුගීතිය අර්ථ වශයෙන් ද බ්‍යඤ්ජන වශයෙන් ද විර්ණනා කරනු ලබන සූත්‍රය හා සමානව ගැලපෙන පරිදි කළයුතුය. ඒ සූත්‍රය මනාව ගෙන ආ යුතුය යනුයි. **අත්ථාපගතං** යනු අර්ථයෙන් පහ වූ යනුයි. එහෙයින්ම **සමථප්පලාපං භවති** යි කියන ලදී. මෙයින් අර්ථයේ පැමිණවිය යුතු හේතුව කියන ලදී. **දුනනිකඛිතසස** යනු වැරදි ලෙස තබන ලද යනුයි. **දුනනයො** යනු දුකසේ පැමිණවිය යුතු යනුයි. පමුණුවන්නට නොහැකි හෝ යනුයි. **බ්‍යඤ්ජනූපෙතං** යනු ස්වභාව නිරුක්තියෙන් යුක්ත වූ යනුයි.

මෙසේ අනුගීති විචය දක්වා නිද්දේස වාරයෙහි **සුත්තස්ස යෝ පවිචයෝ** යනුවෙන් කෙටියෙන් කියන ලද අර්ථය බෙදා දක්වන්නට **සුත්තං පවිචිනිතබ්බං** යි කියා එහි පරීක්ෂණ විධිය දක්වන්නේ **කිං ඉදං සුත්තං** ආහච්ච වචනං යනාදිය කියන ලදී. එහි **ආහච්ච වචනං** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් ස්ථාන කරණ ආදිය ඝට්ටනය කොට, නසා පවත්වන ලද වචනයයි. සම්‍යක් සම්බුදුරදුන් විසින් එකවිට දේශනා කරන ලද සූත්‍රයකි යන අර්ථයයි. **අනුසන්ධි වචනං** යනු ශ්‍රාවක භාෂිතයයි. එය වනාහි භාග්‍යවතුන් වහන්සේගේ වචනය හා ගළපා පවතින හෙයින් අනුසන්ධි වචනය යැයි කියන ලදී. **නීතත්ථං** යනු කියන ලද පරිදි දතයුතු අර්ථයයි. **නෙය්‍යත්ථං** යනු නිර්ධාරණය කොට ගතයුතු අර්ථයයි. **සංකිලෙස භාගියං** යනාදි පදයන්ගේ අර්ථය පටිඨාන වාර වර්ණනාවේදී ප්‍රකට වන්නේය. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සොළොස් වැදෑරුම් සාසන පටිඨානයෙහි එක් කොටසක් භජනය නොකරන්නේ නොවේ. එහෙයින් එම න්‍යාය ද විවේචනය කළයුතු බැවින් මෙහි ඇතුළත් කරන ලදී. **කුහිං ඉමස්ස සුත්තස්ස** යනු මේ සූත්‍රයේ මුල මැද කෙළවර යන කවර තැනක හෝ යනුයි. **සබ්බානි සච්චානි පසසිතබ්බානි** යනු දුක්ඛ සත්‍යය සූත්‍රයේ කොතැන කවර පෙදෙසක හෝ කවර පදයක හෝ දැකිය යුතුදැයි නිර්ධාරණය කොට විවේචනය කරන්නට සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය කොතැනක දැකිය යුතු ද දතයුතුදැයි නිර්ධාරණය කොට විවේචනය කරන්නට මෙසේ සියලු සත්‍යයන් උපුටා විවේචනය කළ යුතුය යන අදහසයි. **ආදිම්හිඤ්ච පරියොසානෙනි එවං සුත්තං පවිචෙතබ්බං** යනු මුලින් ද මැදින් ද අගින් ද වශයෙන් මෙසේ මේ ඇසීම් විවේචනය කිරීම් ආදී ක්‍රමයෙන් සූත්‍රය පරීක්ෂා කළ යුතුය යන අර්ථයයි. මෙහි ද පුච්ඡා විස්සජ්ජන පූර්ව අපර අනුගීති විචයයන් පාළියෙහි ඇති පරිදිම දක්වන ලදී. ආශ්වාද ආදි විචය සත්‍ය නිර්ධාරණ මුඛයෙන් නය වශයෙන් දක්වන ලදී. එය නිද්දේස වාරයේ කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. ඒ පරීක්ෂණයෙන්ම පද විචය සිද්ධ විය.

විචයහාර විභංග වර්ණනාව නිමි.

6.

තත්‍ථ කතමෝ යුත්තිහාරෝ යනාදිය යුත්තිහාර විභංගයයි. එහි **කිං යොජෙති** යි යුත්තිහාරයේ විෂය විමසයි. මෙහි විෂය කවරේ ද? අසත්‍යාකාරයෙන් ගනු ලබන සූත්‍රාර්ථ විෂයයි. එහෙයින් ඒවා ඝාතිශයට සුදුසු පරිදි යුත්ති නිර්ධාරණය සමග යෙදිය යුතුය. ඉතිරි ඒවායේ ද මේ හාරය කැමතිවන ලද්දේමය. **එය සත්‍යය** ප්‍රකාශ කරන තාක් වේ. යම්හෙයකින් මේ යුක්ති **ගවේෂණය මහාපදෙස** නොමැතිව නොවන බැවින් යුත්ති හාරය බෙදා **දක්වමින් එහි ලක්ෂණ** පළමුව උදෙසන්නට **වත්තාරෝ මහාපදෙසා** යනාදිය කියන ලදී.

එහි **මහාපදෙසා** යනු මහා අපදෙසයෝය. බුද්ධාදී පුද්ගලයෝ උසස් දේ බලා කියන ලද දේය. මහා කාරණා යන අර්ථයයි. එසේ නැතහොත් මහාපදෙසා යනු මහත් වූ අවකාශයෝය. ධර්මය පිළිබඳ මහා පිහිට යැයි කියන ලද්දේ වෙයි. මේ එහි වචනාර්ථයයි. බලනු ලැබේනුයි අපදෙසා නම් වේ. බුද්ධ අපදෙසය මෙහි වේ යන අර්ථයෙන් බුද්ධාපදෙස නම් වේ. සෙසු ඒවායේ ද මේ ක්‍රමය වේ. මා විසින් මෙය භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන් අසන ලදී යනාදියෙන් කිසිවකු විසින් අර්ථ දක්වනු ලැබේ. පමුණුවන ලද ග්‍රන්ථයේ ධර්මය හෝ අධර්මය හෝ කියා විනිශ්චය කිරීමයි. ඒ කුමක් ද? එසේ ඒ පමුණුවන ලද ග්‍රන්ථයේ සූත්‍රය තරණාදියමය. ඉදින් මෙසේ නම් සතරක් වන්නේ කෙසේ ද? බැලිය යුතු භේදයෙනි. භාග්‍යවතුන් වහන්සේ හා ශ්‍රාවකයෝ යැයි ධර්මය පිළිබඳ සම්ප්‍රදාය දෙකකි. එයින් ශ්‍රාවකයෝ සංඝ ගණ පුග්ගල වශයෙන් ත්‍රිවිධය. මෙසේ මා විසින් මෙයින් මේ ධර්මය පිළිගන්නා ලද්දේ යැයි බැලිය යුතු භේදයෙන් සතරකි. එහෙයින් **බුද්ධාපදෙසෝ -පෙ- එකත්ථෙරාපදෙසෝ** යි කියන ලදී. **තානි පදබ්‍යඤ්ජනානි** යනු පමුණුවන ලද කිසි සූත්‍රයක පද ද ව්‍යඤ්ජනයෝ ය. අර්ථපද හා බ්‍යඤ්ජන පද යන අර්ථයයි. වර්ණනා කරන්නා විසින් හෝ සංවර්ණනා වශයෙන් හෝ ගනු ලබන පද බ්‍යඤ්ජනයෝ ය. **සුත්තෙ ඔතාරෙතබ්බානි** යනු සූත්‍රයෙහි ප්‍රවේශ කළ යුතු යනුයි. **සන්දෙසයිතබ්බානි** යනු සැසඳිය යුතු යනුයි. **උපනික්ඛිපිතබ්බානි** යනු බහාලිය යුතු යනුයි. සූත්‍රාදිය දක්වන්නට **තතමසමිං** යනාදිය කියන ලදී. එහි යම්හෙයකින් සත්‍යයෙන් තොර වූ භාග්‍යවතුන් වහන්සේගේ එක් වචන මාත්‍රයක් හෝ නැත. එහෙයින් සුත්තෙ යන පදයේ අර්ථය දක්වන්නට **චතූසු අරියසච්චෙසු** යි කියන ලදී. එය මේ

නෙත්ති වචනය සමග ඒකාන්තයෙන් සැසඳෙයි. එසේම සම වෙයි යැයි දතයුතුය. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව උපාදාන රහිතව පිරිනිවීම පිණිසය. එය ඒකාන්තයෙන් රාගාදි කෙලෙස් සන්සිඳුවීම කියාතුයි. **විනයෙ** යන පදයේ අර්ථය දක්වමින් **රාග විනයෙ** යනාදිය කියන ලදී. විනයො යනු හේතුවයි. රාගාදිය සන්සිඳුවන නිමිත්ත මෙහිදී අදහස් කරන ලදී. උදාහරණ මෙසේ කියන ලදී.

"ගෝතමිය, නුඹ මේ ධර්මය රාග සහිත බව පිණිස පවතියි. රාගයෙන් දුරුවීම පිණිස නොපවතියි. සසර හා බැඳීම පිණිස පවතියි. සසරින් වෙන්වීම පිණිස නොපවතියි. කෙලෙස් රැස්වීම පිණිස පවතියි. කෙලෙස් දුරුකිරීම පිණිස නොපවතියි. මහත් ආශා ඇති බව පිණිස පවතියි. මහත් ආශා නැති බව පිණිස නොපවතියි. ලද පමණින් සතුටු නොවීම පිණිස පවතියි. ලද පමණින් සතුටුවීම පිණිස නොපවතියි. ගණයා කෙරෙහි ඇලී විසීම පිණිස පවතියි. ගණයා කෙරෙන් වෙන්ව විසීම පිණිස නොපවතියි. කුසීත බව පිණිස පවතියි. වීර්යාරම්භය පිණිස නොපවතියි. දුකසේ පෝෂණය කළ යුතු බව පිණිස පවතියි. සුවසේ පෝෂණය කළයුතු බව පිණිස නොපවතියි යැයි දැනගත්තෙහි ද එසේ වූ මේ දෙය ධර්මය නොවේ. එය විනය නොවේ. එය ශාස්තෘ ශාසනය නොවේ යැයි සැලකිය යුතුය."

"ගෝතමිය, මේ ධර්මය විරාගය පිණිස පවතියි. සරාගය පිණිස නොපවතියි. මේ ධර්මය විසංයෝගය පිණිස පවතියි. සසර බැඳීම පිණිස හෙවත් සංයෝගය පිණිස නොපවතියි. කෙලෙස් රැස්කිරීම පිණිස නොපවතියි. කෙලෙස් දුරලීම පිණිස පවතියි. අල්පේච්ඡ බව පිණිස පවතියි. මහිච්ඡ බව පිණිස නො පවතියි. ලද දෙයින් සතුටුවීම පිණිස පවතියි. ලද දෙයින් සතුටු නොවීම පිණිස නොපවතියි. ගණයා කෙරෙහි ඇලී ගැලී විසීම පිණිස නොපවතියි. ගණයා කෙරෙන් වෙන්ව දුරස්ව විසීම පිණිස හේතුවෙයි. කුසීත බව පිණිස නො පවතියි. වීර්යාරම්භය පිණිස පවතියි. දුකසේ පෝෂණය කළ යුතු බවට නොපවතියි. සුවසේ පෝෂණය කළයුතු බවට පවතියි යැයි යම් ධර්මයක් දැනගත්තෙහි ද ගෝතමිය එය ධර්මය වේ. එය විනය වේ. එය ශාස්තෘ ශාසනය වේ. මෙසේ නුඹ සැලකිය යුතුයි."

ධම්මනායං යන පදයේ අර්ථය දක්වන්නට පටිච්චසමුප්පාදෙ යනුවෙන් කියන ලදී. පටිච්චසමුප්පාදය **ඨිතාව සා ධාතු ධම්මටඨිතතා**

ධම්ම නියාමතා යි කියන ලදී. ධම්මතායං උපනිකඛිපිතබබානි යන මෙය පාළියේ නැත. අර්ථ දැක්වීම් වශයෙන් මෙහි කියන ලදැයි දතයුතුය. මෙහි ද ප්‍රවෘත්තිය නිවෘත්තිය හා එහි උපාය ද බාධා ඇති බැවිහි නියත ලෙස පෙන්නුම් කරනුයේ සූත්‍රයේ බහාලීම නම් වේ. ඒකාන්තයෙන් රාගාදි කෙලෙස් දුරුකිරීම ප්‍රකාශ කරමින් විනයෙහි සසඳයි. එසේ ශාස්වතය ද උච්ඡේදය ද දුරුකොට ඒකත්ත නය ආදිය දැක්වීමෙන් ස්වභාව ධර්මයන්ගේ ප්‍රත්‍ය හා ප්‍රත්‍යය උත්පන්න භාවය දක්වමින් ධර්මතාව විකෘති නොකරයි. පටිච්ච සමුප්පාදය අනුලෝම වශයෙන් පැවැත්ම ද පටිලෝම වශයෙන් නැවැත්ම ද නොවේ ද? ඔහු චතුරාර්ය සත්‍ය අනුව පිවිසුවන ලද්දේ කවර හෙයකින් මෙහිදී වෙන්ව ගන්නා ලද්දේ ද එය සත්‍යයකි. මෙහිදී වෙන්ව ගැනීම ධර්මයන්ගේ හේතුවට අයත් පැවැත්ම දැක්වීමෙන් අනිත්‍ය ප්‍රත්‍ය ලක්ෂණය අසමර්ථ ප්‍රත්‍ය ලක්ෂණය, නිරිහ ප්‍රත්‍ය ලක්ෂණය ද වර්ධනය කොට ඒවායේ හටගන්නා බව ද එයින්ම වැයවන බවද ඒ දෙකින් අනිත්‍යතාව ද උදය වය පෙළීමෙන් දුක්ඛත්වය ද අනාත්ම බව ද යන ත්‍රිලක්ෂණ එකතුව බබළවන සියලු දෘෂ්ටිගත වැරදි මත දුරුකරන්නේ ද වේ. අනන්‍ය සාධාරණ වූ සාසන සම්පත්තිය ප්‍රකාශ කරන ලද්දේ යැයි දක්වනු පිණිසය.

මෙහි ද **සුත්ත, සුත්තානුලෝම, ආචරියවාද, අත්තනොමති** යන මේ සතර දතයුතුය. එහි **සුතතං** යනු ත්‍රිවිධ සංගීතියට නැංවුණු ත්‍රිපිටකයයි. සුත්තානුලොමය නම් මහාපදේසයෝය. ආචරියවාදය නම් අටුවාවන්ය. අත්තනොමතිය නම් නය ග්‍රහණය කිරීමෙන් බුද්ධියෙන් වූ ස්වකීය වැටහීමයි. එහි සූත්‍රය බැහැර කළ නොහැකිය. එය බැහැර කිරීමෙන් ශාස්තෘහුම බැහැර කළේ වෙයි. එකඟත්වය වනාහි සූත්‍රය හා එක්වම ගතයුතුය. අනෙකක් නොවේ. ආචාර්ය වාදය ද සූත්‍රය හා එක්කොටම ගතයුතුය. අනෙකක් නොවේ. අත්තනොමතිය ද එසේය. එය සියල්ලට වඩා දුර්ලභය.

යම් ප්‍රයෝජනයක් පිණිස මෙහි සතර මහාපදෙස දක්වන ලද ද දැන් එය දක්වන්නට **චතූහි මහාපදෙසෙහි** යන ආදිය කියන ලදී. එහි **යං යං** යනු යම් යම් අර්ථයක් ධර්මයක් වේ ද එයයි. **යෙන යෙන** යනු යම් යම් කාරණයකිනි. එසේම **යථා** යනු යම් යම් ආකාරයකින් යනුයි. **තං තං ගහෙතබබං** යනු වර්ණනා කරන සූත්‍රයේ පමුණුවන ලද කාරණයෙන් ද අහඹු ආකාරයෙන් ද සූත්‍රයෙන් උපුටා සංවර්ණනා වශයෙන් ගතයුතුය

යන අර්ථයයි. එහෙයින් සතර මහාපදෙසවලට විරුද්ධ නොවූ යුක්තියකින් සූත්‍රයකින් අර්ථ වෙන්කොට යුත්තිහාරයෝජනය කළයුතුයැයි දක්වයි.

දැන් යුක්ති නිර්ධාරණය දක්වන්නට **පඤ්ඤං පුචඡිතෙන** යනාදිය අරඹන ලදී. එහි **කති පදානි** යනු පද කෙතෙක් ද යනුයි. **පරියොගාහිතබබං** යන පදයේ අර්ථය දක්වන්නට **විචෙතබබං** යි කියන ලදී. යම් පමණ පද අදහස් කළ පරිදි අර්ථය ප්‍රකාශ කෙරෙත් ද එපමණ පද එහි එක් අර්ථයක අවබෝධයට කැමති වූ බැවිනි. **එකො පඤ්ඤා** යි කියනු ලැබේ. ඒවා එක් ගාථාවක සියලු පද හෝ නැතහොත් එක් පදයක් හෝ එක් අර්ථයක් ප්‍රකාශ කෙරේ ද (එය) එකම ප්‍රශ්නයකි යන මේ අර්ථය යදි සබබානි යනාදියෙන් දක්වයි. **තං** යනු ඒ ප්‍රශ්නයයි. **අඤ්ඤානබබං** යනු දතයුතුය යනුයි. **කිං ඉමෙ ධමමා** යනාදිය දන්නා ආකාරය දැක්වීමයි. එහි **ධමමා** යනු පර්යාප්ති ධර්මයයි. **නානතථා** යනු නොයෙක් නොයෙක් අර්ථයන්ය.

විමර්ශන ගාථාවේ පදාර්ථය මෙයයි. **කෙනසසුබභාහතො ලොකො** යනු මේ සත්ත්වලෝකය, සොරුන් නසන්නකු විසින් සොරකු නසන්නාක් මෙන් කවරකු විසින් නසන ලද්දේ ද යනුයි. වධ කරනු ලැබේ ද යන අර්ථයයි. **කෙනසසු පරිවාරිතො** යනු ආශ්‍රිත වෘක්ෂය මාලුවා වැලකින් වෙලෙන්නාක් මෙන් කවරකු විසින් ලෝකය වසන ලද්දේ ද යනුයි. **කෙන සලලෙන ඔතිණණා** යනු විෂ පොවන ලද දැළි පිහියකින් මෙන් ශරීරය තුළට බැසගත් කවර උලකින් අනුප්‍රවිෂ්ට වූයේ ද යනුයි. **කිසස ධූපායිතො** යනු ලෝකය තවන ලද්දේ ද යනුයි. **සදා** යන පදය සියලු තැන යෙදිය යුතුය. **තෙ** යනු පද සතරයි. පඤ්ඤ ශබ්දය අපේක්ෂාවෙන් පුල්ලිංග නිර්දේශය කරන ලදී. **විසසජෙජති** යන මෙයින් විසඳීම් හේතුවෙන් ත්‍රිවිධ ප්‍රශ්න හැඟේ යයි දක්වයි.

තත්‍ථ යනු විසඳුම් ගාථාවෙහිය. පළමු පාදයෙහි කියන ලද **ජරාව** ද දෙවන පාදයේ කියන ලද **මරණය** ද යන මේ දෙකයි. **සංඛතසස** යනු පංචස්කන්ධයෝය. මේවායින් සලකුණු කරනු ලැබේනුයි **සංඛත ලක්ඛණ** නම් වේ. එය භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, සංඛත ධර්මයේ මේ සංඛත ලක්ෂණ තුනක් වේ. හටගැනීම ප්‍රකට වේ. විනාශය ප්‍රකට වේ. පවතින දෙයෙහි වෙනස්වීම ප්‍රකට වේ' යැයි කියන ලදී. එහෙයින් **ජරායං ඨිතසස අඤ්ඤථතථං මරණ වයො** යි කියන ලදී. මෙහි ද **ඨිතසස අඤ්ඤථතථං** යන මෙයින් ස්කන්ධ සමූහයේ පූර්වාපර විශේෂය වූ ජරාව

ක්‍ෂණයක් නො පවතීයැයි දක්වයි. මරණං වයෝ යන මෙයින් ද තිස්ස මැරුණේය. ථුස්ස මැරුණේය වශයෙන් ලෝකයෙහි කියන ලද සම්මුති මරණය දක්වයි. ක්‍ෂණික මරණය හෝ සමුච්ඡේද මරණය නොවේ. දැන් **තෙ තයෝ පඤ්ඤා** යි කියන ලද අර්ථය යුක්ති වශයෙන් දක්වන්නට **ජරාය ච** යනාදිය කියන ලදී.

එහි බොහෝ සෙයින් දිරාගිය දෙයෙහි මරණය දැක්වීමෙන් ජරා මරණයන්ගේ නානත්වය පිළිනොගන්නා කෙරෙහි ඒවායේ නානත්වය දැක්වීම පිණිස **ගබභගතාපි හි මීයන්ති** යි කියන ලදී. අදහස් කරන ලද ජරාවෙන් තොර වූ මරණයක් දැක්වීමෙන් ජරාව අනෙකකි මරණය අනෙකකි යන මෙය කියන ලද්දේ වෙයි. එහෙයින්ම **න ච තෙ ජිණණා භවනති** යි කියන ලදී. කවර භයක් ද? හුදු මරණය දක්නා ලද බැවින් ජරාව අනෙකකි. මරණය අනෙකකි. එය දෙවියන්ටත් එසේය යන මේ අර්ථය **අත්ථි ච දෙවානං** යනාදියෙන් දක්වයි. උතුරු මිනිස් දිව නොවන දෙයින් ද ප්‍රතිකාරයෙන් ද ජරාවට ප්‍රතිකාර කිරීමට හැකිය. මරණයට එසේ ප්‍රතිකාර කළ නොහැකිය. මෙසේ ද ජරාමරණයන්ගේ අර්ථ වශයෙන් වූ නානත්වය පිළිගත යුතුයැයි දක්වන්නට **සකකතෙව** යනාදිය කියන ලදී. එහි **සකකතෙ** යනු හැකි වේ යනුයි. පිළිවනි යන අර්ථයයි. **පටිකම්මං** යනු ප්‍රතිකර්මයයි. ඉද්ධිපාද භාවනාව වසඟ කරගත් විට මරණයට ද ප්‍රතිකාර කරන්නට නොහැකි ද යන චෝදනාව මෙනෙහි කොට **අඤ්ඤානුව ඉදධිමනතානං ඉදධි විසයා** යැයි කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්ද, යම් කිසිවකු විසින් සතර ඍද්ධිපාද භාවිත කරන ලද්දේ ද බහුල කරන ලද්දේ ද යානාවක් මෙන් කරන ලද්දේ ද වස්තුවක් මෙන් කරන ලද්දේ ද අනුව පවත්වන ලද්දේ ද පුරුදු කරන ලද්දේ ද මනාව අරඹන ලද්දේ ද හෙතෙම කැමති වන්නේ නම් කල්පයක් හෝ කල්පාවශේෂයක් හෝ සිටින්නේය යන මෙය කියන ලදී. මෙහි කල්පය යනු කුමක් ද? කල්පාවශේෂය යනු කුමක්ද? කප්පො යනු ආයු කල්පයයි. යම් ඒ කාලයක මිනිසුන්ගේ යම් ආයු ප්‍රමාණයක් වේ ද, එය සම්පූර්ණ කිරීම කල්පයක් සිටීම නම් වේ. අල්පව හෝ වැඩිපුර වර්ෂ සියයකට අතිරේකව සිටීම කල්පාවශේෂයක් සිටීම නම් වේ.ඉදින් මෙසේ නම් ඍද්ධිමත් වූ චේතො වසිත්වයට පැමිණි ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ ලොවට හිත පිණිස කවර හෙයකින් එසේ නො සිටිත් ද? ඒ උතුම් පුරුෂයෝ ස්කන්ධ සංඛ්‍යාත වූ දුක් සමූහය මනාව දත් බැවින් ද උත්සුක

බවක් නැති බැවින් ද සන්සිඳුවන ලද සියලු උත්සුක ඇත්තාහ. එහෙයිනි. එය දම්සෙනෙවි සැරියුත් තෙරුන් විසින් මෙසේ කියන ලදී.

නාභිනන්දාමි මරණං නාභිකඞ්ඛාමි ජීවිතං
කාලඤ්ච පටිකඞ්ඛාමි වෙතනං භතකෝ යථා

'මම මරණයට බිය නොවෙමි. ජීවිතය කැමති නොවෙමි. සේවකයෙක් වැටුප බලාපොරොත්තු වන්නා සේ මරණයට කාලය බලාපොරොත්තු වෙමි.'

අර්ථ වශයෙන් ජරාමරණවල අන්‍යෝන්‍ය නානත්වය යම්සේ ද එසේ ඒවායින් තණ්හාවේ ද නානත්වය දක්වන ලද කල්හි **තයො පඤ්හා** යන මෙය සිද්ධ වේය යන එය දක්වන්නට **යං පන** යනාදිය කියන ලදී. එහිදී යම්හෙයකින් රහතුන්ගේ සිත්හි තණ්හාව නැතිවිටත් ජරාමරණ ලැබේ ද එහෙයින් ජරාමරණ අනෙකකි. තණ්හාව අනෙකකි යන මේ අර්ථය දක්වන්නට **දිස්සන්ති විතරාගා ජීරන්තාපි මීයන්තාපි** යි කියන ලදී. තණ්හාව ද දිරීම් බිඳීම් ස්වභාව ඇත්තේ නොවේ ද? සත්‍යයකි. මෙහි මේ ජරාමරණ අදහස් නොකරන ලද්දේය යන මේ අර්ථය කියන ලදී. **යදි ච** යන ආදියෙන් ජරාමරණ කෙරෙන් තණ්හාවේ අනන්‍යත්ව දෝෂය දක්වයි. යොවුන් වයසේ සිටි නමුත් පහ වූ තණ්හා ඇත්තෝ වූහ. මෙය නුසුදුසුය යන අර්ථයයි. තණ්හාව නොවෙනස්ව ඇති කල්හි ජරාමරණ ද දුක්ඛ සමුදය ද වන්නේය යන අදහසයි. තණ්හාව ජරාමරණවලින් නොවෙනස්ව ඇතිකල්හි දුක්ඛ සමුදය නොවන්නේය යන අදහසයි. එහෙයින් අර්ථ වශයෙන් මේවායේ නානත්වය දතයුතුය යන අදහසයි. යම්සේ තණ්හාව මාර්ගයෙන් තොර ද තණ්හාව නොවෙනස්ව ඇතිවිට එසේම ජරාමරණ ද මාර්ගයෙන් තොරව පවතී. යම්සේ ජරාමරණ මාර්ගයෙන් තොර නොවේ ද තණ්හාව ද එසේ වන්නේය යන මේ නය ද කියන ලද්දේ මැයි දතයුතුය.

ඉමාය යුත්තියා යනු කියන ලද පරිදි ඇතිවීමෙනි. **අඤ්ඤමඤ්ඤෙහි** යන අන්‍ය වූ අන්‍ය වූ හේතු ඇතිවීමෙනි යනුයි. ඉදින් අර්ථ වශයෙන් අන්‍ය වේනම් ඒ අන්‍ය වූ දෙය ද ව්‍යඤ්ජන වශයෙන් සෙවිය යුතුය යන අර්ථයයි.

ඉමෙසං ධම්මානං අසථතෝ එකතතං යන මේ අර්ථයම **නහි යුජ්ජති** යනාදියෙන් විවරණය කෙරෙයි. **තණහාය අධිපපායෙ අපරිපූරමානෙ** යැයි කැමති වූ දෙයෙහි නොලැබීම ප්‍රකාශ කරයි. එයින් ඉච්ඡා තණ්හාවන්ගේ අර්ථ වශයෙන් වූ ඒකත්වය කියන ලද්දේ වෙයි. මෙයින් ඉච්ඡාවේ ද තණ්හාවේ ද අර්ථ වශයෙන් වූ වෙනස් බව නොයෙදේ. යම්සේ මේ වචනය සමර්ථ (සුදුසු) වේ ද එසේය. මෙසේ කැමැත්ත වෙනස්ව ඇති වෙර බැඳීමට හේතුවන කරුණු කෙරෙහි ක්‍රෝධය ද උපනාහය ද උපදී යන මෙය ද සුදුසු වේ. එසේ ජරා මරණ වෙනස්ව ඇතිවිට ජරාමරණ තණ්හාවන්ගේ අර්ථ වශයෙන් වූ වෙනස් බව සුදුසු නැත යන මේ අර්ථය **ඉමාය යුත්තියා** යනාදියෙන් දක්වයි.

ඉදින් ඉච්ඡා තණ්හාවන්ගේ අර්ථ වශයෙන් වූ වෙනස් බවක් වේනම් කවර හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දෙපරිදිව කියන ලද ද එහි පරිහාරය **යං පනිදං** යනාදියෙන් කියන ලදී. එහි **යං** යනු ක්‍රියාව ස්පර්ශ කරන්නකි. **අභිලපිතං** යනුවෙන් යමක් කියන ලද ද මේ ප්‍රකාශනය බාහිර රූපාදි වස්තූන්ගේ අරමුණු වශයෙන් හෝ අරමුණුවලට හේතු වශයෙන් හෝ යෙදිය යුතුය. **දවීහි ධමෙමහි** යනු ප්‍රකෘති දෙකකින් යනුයි. ඒ ප්‍රකෘතීහු කවරහු ද? නොපැමිණි විෂය සෙවීම් වශයෙන් වූ ඉච්ඡාව (පළමුවැන්නයි) පැමිණි හෝ නොපැමිණි හෝ විෂය පැමිණීමේ කැමැත්ත වශයෙන් වූ තණ්හාව (දෙවැන්නයි) මෙය මේවායේ විශේෂත්වයයි. ඉදින් මෙසේ වුවත් සියලු තණ්හාව රූපාදි විෂය ගිලගෙන නිමවා ග්‍රහණය කරගැනීමෙන් එකම ස්වභාව ඇත්මැයි දක්වමින් **සබබාපි තණහා අඡඣාසන ලකඛණෙන එක ලකඛණා** යි කියන ලදී. දැන් ඒ අර්ථය උපමාවකින් ප්‍රකාශ කරනුයේ **සබෙබා අගගී** යනාදිය කියන ලදී. එය මනාව දත හැකිය. (අර්ථ ප්‍රකටය.) හුදෙක් මේ තණ්හාව අරමුණෙහි පැවති විශේෂයෙන් නාම දෙකකින්ම කියන ලදී. ඉක්බිති නොයෙක් පර්යායන්ගෙන් යැයි දක්වන්නට **ඉචඡානිපි** යනාදිය කියන ලදී.

එහි එයින් අරමුණු කැමති වේනුයි **ඉචඡා** නම් වේ. ආශා කිරීම් අර්ථයෙන් **තණහා** නම් වේ. පීඩා ඇති කරවීමෙන් ද ඉදිරිය නොහැකි බැවින් ද විෂ පෙවූ හුලක් මෙන්ය යන අර්ථයෙන් **සලල** නම් වේ. තැවීම් අර්ථයෙන් **ධූපායනා** නම් වේ. ඇද ගැනීම් අර්ථයෙන් වේගයෙන් ගලායන ගඟක් මෙනැයි **සරිතා** නම් වේ. තෙමීම් අර්ථයෙන් හෝ සරිතා නම් වේ. සත්ත්වයාට තෙත් වූ ස්නේහයෙන් යුතු සොමිනස් ඇතැයි කියන ලදී.

මෙහි තෙත් වූ ද සිනිඳු වූ ද යන මේ අර්ථයයි. **විසතතිකා** යන තැන සිහි නොකරන ලද්දේනුයි විසත්තිකා නම් වේ. බැසගත්තේනුයි විසත්තිකා නම්. විෂම වූයේනුයි විසත්තිකා නම්. විශාල වූයේනුයි විසත්තිකා නම් වේ. පැටලේනුයි විසත්තිකා නම්. විසංවාද වූයේනුයි විසත්තිකා නම් වේ. ගෙනයානුයි විසත්තිකා නම් වේ. විෂ සහිත මුල් ඇත්තේනුයි විසත්තිකා නම් වේ. විෂ සහිත වූ ඵල ඇත්තේනුයි විසත්තිකා නම් වේ. විෂ පරිභෝග ඇත්තේනුයි විසත්තිකා නම් වේ. අසිහි ඇති ඒ තණ්හාව රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්ම කුලය ගණය ආදියේ සිහි නොමැත්තේ පැතිර ගියේනුයි විසත්තිකා නම් වේ. ස්නේහ කිරීම් වශයෙන් **සිනෙහ** නම් වේ. නොයෙක් ගතීන්හි ක්ලාන්තය ඉපිදවීමෙන් ක්ලාන්ත වූ යන අර්ථයෙන් **කිලමථො** නම් වේ. වෙලාගැනීම් අර්ථයෙන් වැලක් මෙන් යැයි **ලතා** නම් වේ. වැල සිඳ දමා සිටියි යැයි කියන ලදී. මගේ යැයි සිතීම් වශයෙන් වූ **මඤ්ඤනාවන්ය**. දුර ගිය දේද ඇද බැඳීම් අර්ථයෙන් බන්ධ නම් වේ. ආශිංසන අර්ථයෙන් **ආසා** නම් වේ. අරමුණු රසය බොනු කැමති බව ලෙසින් **පිපාසා** වූ යන අර්ථයයි. සතුටුවීම් අර්ථයෙන් අභිනන්දනා නම් වේ. **ඉති** යනුවෙන් මෙසේ අරමුණෙහි පැවතීම් විශේෂයෙන් නොයෙක් නාමයන්ගෙන් ගනු ලබන්නා වූ ද **සියලු තණ්හාව බැසගැනීම් ලක්ෂණයෙන් එක ලක්ෂණ** ඇතැයි කියන ලද පරිදි අර්ථය නිගමනය කරයි.

නැවත තණ්හාව නොයෙක් නාමවලින් ගත් බවම **යථා ච** යනාදියෙන් උපචය වශයෙන් දක්වයි. එහි **වෙවචනෙ** යනු වේවචන හාර විභංගයෙහිය. **ආසාව ජීහා** යන ගාථාවේ අර්ථය එහිම වර්ණනා කරන්නෙමු. අවිතරාගස්ස යනාදියෙහි රැඳවීම් අර්ථයෙන් **රාග** නම් වේ. කැමතිවීම් අර්ථයෙන් **ඡන්ද** නම් වේ. ප්‍රියකිරීම් අර්ථයෙන් **පේම** නම් වේ. දැවීම් අර්ථයෙන් **පරිදාහො** යි තණ්හාවම කියන ලදී. එහෙයින්ම තණ්හාය එතං වෙවචනං යැයි කියන ලදී. **එවං යුජ්ජති** යනු මෙසේ ඉච්ඡා තණ්හාවල අර්ථ වශයෙන් නොවෙනස් බැවින් ත්‍රිවිධ ප්‍රශ්න යැයි යමක් කියන ලද ද එය යෝග්‍යය යනුයි. යුක්තියෙන් එක්වේ යන අර්ථයයි.

මෙසේ **කෙනසඤ්ඤාහනෙ ලොකො** යන ගාථාවෙන් ප්‍රශ්න තුනකැයි ත්‍රිවිධ ප්‍රශ්න බවෙහි යුත්තිය දක්වා දැන් අන්‍ය වූ ප්‍රකාරයන්ගෙන් යුත්ති ගවේෂණය දක්වන්නේ **සබ්බෙ දුකඛූපචාරෙ** යනාදිය කියන ලදී. එහි **දුකඛූපචාරෙ** යනු දුකෙහි පැවැත්මයි. **කාමතණහා සංඛාර මූලකො**

යනු කාම තණ්හාව ප්‍රත්‍ය සංස්කාරයට හේතු වේයැයි යෙදේ යනුයි. **නිබ්බිදූපචාරෝ** යනු කලකිරීම පැවැත්මයි. කාමයන්ගේ විපරිණාම අනාථා භාවයෙන් උපදින අනභිරතිය ඤාණ නිබ්බිදාවය. **කාමතණ්හා පරිකබාර මූලකෝ** යනු කාම තණ්හාවේ පරිෂ්කාර වූ වස්තුකාම හේතුවයි. එහි නොඇලීම් සංඛ්‍යාත කලකිරීම කාම තණ්හාවේ පරිෂ්කාර මූලයයි. ඤාණ නිබ්බිදාව නොවේ. සියලු නිබ්බිදූපචාරය කාම තණ්හාවේ පරිෂ්කාර මූලය යැයි නොයෙදේ යැයි කියන ලදී. **ඉමාය යුතතියා** යැයි නය දක්වයි. මෙය කියන ලද්දේ වෙයි. යම්සේ ප්‍රශ්නත්‍රය පිළිබඳ යුත්තිය කියන ලද ද යම්සේ දුක්ඛූපචාර, නිබ්බිදූපචාරයන්හි **මේ යුත්තියෙන්** මේ යෝගයෙන් න්‍යායෙන් එකිනෙක **පිළිබඳ කරුණුවලින් ඒ ඒ පාළි** කොටස්වල අනුරූප වූ අන් ලෙසකින් වූ වෙනත් හේතූන්ගෙන් යුත්තිය සෙවිය යුතුය.

සංක්ෂිප්ත වූ ඒ න්‍යාය දැක්වීම දැන් විස්තර වශයෙන් බෙදා දක්වන්නට **යථාහි භගවා** යනාදිය ආරම්භ කළේය. මේ එහි සංක්ෂේපාර්ථයයි. රාග දෝස මෝහ චරිතයන්ට පිළිවෙලින් අසුභ මෙත්තා ප්‍රත්‍යයාකාර කථාවන් රාගාදිය දුරුකරන හෙයින් සප්පාය වේ යන මෙය සාසන යුත්තියයි. මෙසේ නොසිටි කල්හි ඉදින් රාග චරිතයාට මෙත්තා චේතෝ විමුත්තිය දේශනා කරන්නේ ද ඒ දේශනාව අසප්පාය බැවින් නොගැළපෙයි. සුබ පටිපදාදිය ද එසේය. සුබ පටිපදාදිය දේශනා ප්‍රතිපත්තියෙන් ඇති නොවන්නේ ද? එය සත්‍යයකි. මෙහිදී රාග චරිතයා යැයි තියුණු කෙළෙස් ඇති රාග චරිතයා යැයි අදහස් කරන ලදී. දුක්ඛ ප්‍රතිපදාවෙන් එහි වර්ධනය සමෘද්ධ වේ. දුක්ඛ ප්‍රතිපදාවෙන් යමකුගේ භාවනාව සමෘද්ධ වේ ද, ඔහුට ඉතා වැඩිපුර අසුභ දේශනාව සප්පාය වේ. යමෙකුට ඉතා වැඩිව අසුභ දේශනාව සප්පාය වේ ද මද කෙලෙස් ඇත්තකුට මෙන් ඔහුට ඉතා ලුහුව මේ අර්ථය දේශනා කරමින් **සුබං වා පටිපදං දෙසෙය්‍ය න යුජ්ජති දෙසනා** යි ප්‍රකාශ කරන ලදී. මේ ක්‍රමයෙන් සෙසු පදවලද අර්ථය ලැබෙන පරිදි කිවයුතුය. මෙහිදී ද අයුක්ත පරිහාරයෙන් යුත්ති අවබෝධය වේ යයි යුත්ති විමසීම පිණිස අයුත්තිය ද සෙවිය යුතුයයි **යදි හි -පෙ- න යුජ්ජති දෙසනා** යි කියන ලදී. සෙසු පදවල ද මේ ක්‍රමයමය. **එවං යං කිඤ්චි** යනාදිය යුත්තිහාර යෝජනයේ න්‍යාය දැක්වීමය.

එහි **එවං** යනු මේ ක්‍රමයෙනි. **යං කිඤ්චි** යනු අන්‍ය වූ යම් කිසිවක් යනුයි. **අනුරූපපහාණං** යනු ප්‍රහාණයට අනුරූප වූ යනුයි. ප්‍රහාණයට

සමත් වූ යන අර්ථයයි. සූත්‍රයෙහි අනවශේෂ වූ පදාර්ථයන්ගේ පදයක් පාසා වූ විමර්ශනය විචය හාරයයි. විචයහාර සංවර්ණනාවේ නිර්ධාරණය කරන ලද අර්ථවල යුත්ති සෙවීම පහසුය යන්න **සබබං තං විචයෙන හාරෙන විචිනිත්වා යුතතිහාරෙන යොජෙතබබං** යි කියන ලදී. යාවතිකා ඤාණසස භූමි යනු සංවර්ණනා කරන ආචාර්යවරයාගේ යම් ඤාණයක් යම් වැටහීමක් වේ ද ඔහුගේ විෂය යම් තාක් වේ ද ඒ තාක් යුත්තිවිචාර හාරය වේ යන අර්ථයයි. ඊට හේතුව කුමක් ද? සද්ධර්මය අනන්ත නය ඇති, හාත්පසින් යහපත් වූ නොමැඩිය හැකි විසිතුරු දේශනාවක් වීමයි.

මෙසේ නය දැක්වීම් වශයෙන්ම යුත්තිහාර යෝජනාව දක්වන ලදැයි එය බ්‍රහ්මවිහාර ඵල සමාපත්ති නවානුපූර්ව සමාපත්ති වශී භාවයන්ගෙන් බෙදා දක්වන්නට **මෙතතා විහාරිසස සතතා** යනාදිය ආරම්භ කරන ලදී. එහි **මෙතතා විහාරිසස** යනු මෛත්‍රී විහරණය ලැබූ පුද්ගලයාටය. **සතතා** යනු සමාන පුද්ගලයාටය. එසේ වූ පුද්ගලයාට යන අර්ථයයි. බ්‍යාපාදෝ යනු දැඩි දෝෂයයි. **චිතතං පරියාදාය ඨසසති** යනු සිත යටපත් කරයි යනුයි. යම්හෙයකින් කුසල ධර්මයන්ගේ අපූර්ව වූ ද්විතීය වූ පැවැත්මක් නම් නැත. එහෙයින් සමාපත්තියෙන් නැඟී සිටි පුද්ගලයාගේ පසුභාගයේ යැයි දැක්වීම පිණිස සිටි යැයි කියන ලදී. **න යුජජති දෙසනා** යනු බ්‍යාපාදයට ප්‍රතිපක්ෂ වූ බැවින් මෛත්‍රිය පිළිබඳ එබඳු කථාවක් නුසුදුසුය යන අර්ථයයි. **බ්‍යාපාදෝ පහාණං අබහතථං ගචඡති යුජජති දෙසනා** යනු කියන ලද කරුණින් ම මේ කථාව යුක්තය යනුයි. අනෙක් වාරයන්හි ද මේ ක්‍රමයෙන් අර්ථය දතයුතුය. අප්‍රකට පදම වර්ණනා කරමු. **අනිමිතතවිහාරිසස** යනු අනිත්‍යය අනුව දැකීම් ස්වරූපයෙන් ලබන ලද ඵල සමාපත්ති විහාරය ඇති තැනැත්තාටය. **නිමිතතානුසාරී** යනු සංස්කාර නිමිත්ත අනුව ක්‍රියා කරන්නාය. **තෙන තෙනෙව** යනු නිත්‍යාදියෙහි යමක් යමක් ප්‍රහීණ වූයේ ද ඒ ඒ නිමිත්තෙන් යනුයි. **අසමීහි විගතං** යනු පංච උපාදාන ස්කන්ධයන්හි දක්නට ලැබෙන මම වෙමි යන යම් කල්පනාවක් වේ ද එය පහ වූ යනුයි. එම අර්ථයම **අයමහසමීහි න සමනුපසසාමි** යනුවෙන් විවරණය කරයි. **විචිකිචඡා කථං කථා සලලං** යි විනයෙහි සැක ඇත්තාට ද කථා කරත්. පවත්නා ස්වභාවය විචිකිච්ඡා යන පදයෙන් වෙසෙසන ලදී. **න යුජජති දෙසනා** යනු විචිකිච්ඡාව ප්‍රහීණ වීමෙන් එකඟ වූ සිත් ඇති බැවින් මෙම කථාව සුදුසු නොවේ. **පඨමං ඣානං සමාපනනසස** යනු ප්‍රථමධ්‍යානයෙන් යුක්ත වූ යනුයි. **කාමරාග බ්‍යාපාදා විසෙසාය සංවතතනතීති න යුජජති** යනු

යම්හෙයකින් නීවරණ ප්‍රහීණ නොවූ කල්හි ප්‍රථම ධ්‍යානයේ උපචාරයට ද නොපැමිණේ ද ධ්‍යානය මුලින්මය. එහෙයින් කාමරාග ව්‍යාපාදයෝ විශේෂයෙන් දුතිය ධ්‍යානය පිණිස පවතිත් යැයි මේ කථාව සුදුසු නොවේ. ලබන ලද පරිදි පළමු ධ්‍යානයේ කාමරාග ව්‍යාපාද ඉස්මතු වීමට පත්විය. (එහෙයින්) **හානාය සංවත්තනති** යි කියන ලදී. **යුජ්ජති දෙසනා** යනු සුදුසු කථාව යනුයි. මෙසේ සියලු තැන යෙදිය යුතුය. අවිතර්ක සහගත සංඥා මනසිකාරයෝ නම් උපචාරය සමග වූ ද්විතීය ධ්‍යානයට අදාළ කරුණුය. මෙහි සහගත ශබ්දය අරමුණ පිළිබඳ හේතුව යන අර්ථය ඇත්තකි. **හානාය** යනු පළමු ධ්‍යානයෙන් පිරිහීම පිණිසයි. **විසෙසාය** යනු දෙවැනි ධ්‍යානය පිණිසයි. මේ ක්‍රමයෙන් ඒ ඒ තැන හාන - විසේස යනුවෙන් කියන ලද කරුණු දතයුතුය. **විතක්ක විචාර සහගතා** යනු ප්‍රථමධ්‍යාන ධර්ම හෝ කාමාවචර ධර්මයෝය. තත්‍රමජ්ඣත්තතා - උපෙක්ඛාවන් මෙහි උපෙක්ඛායි අදහස් කරන ලදී. **පීතිසුඛ සහගතා** යනු උපචාරය සමග වූ තෘතීයධ්‍යාන ධර්මයෝය. **උපෙක්ඛා සති පාරිසුද්ධි සහගතා** යනු චතුර්ථ ධ්‍යාන ධර්මයෝය. **සඤ්ඤප්පචාරා** යනු මූලික හඳුනාගැනීම් කටයුතු කරන්නා වූ ම යම්කිසි සිතිවිලිය. ආකිඤ්චඤ්ඤා- යතනයට අයත් කරුණු යැයි ද කියත්. **සඤ්ඤාවෙදයිතනිරොධ සහගතා** යනු සංඥා වෙදයිත නිරෝධයට පැමිණ වාසය කරන්නෙමියි එයට පරිකර්ම වශයෙන් පැවති කරුණුය. යම්හෙයකින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි සිටින්නා විසින්ම සංඥාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරන්නට හැකි ද එයින් පිරිහුනහු විසින් නොහැකි ද එහෙයින් **නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියා හානාය සංවත්තනති** යන කථාව අයෝග්‍යය. **විසෙසාය සංවත්තනති** යනු සුදුසු කථාව යැයි (සිතා) **හානාය** -පෙ- **දෙසනා** යැයි කියන ලදී. **කලලනා පරිචිතං** යනු සමත් බැවින් පුරුදු කරන ලද යනුයි. කියන ලද සමාපත්තීන්හි වශීභාවයෙන් පුරුදු කරන ලද යන අර්ථයයි. එහෙයින්ම **අභිනීහාරං ඛමති** යනුවෙන් කියන ලදී. සෙසු සියල්ල ප්‍රකටමය.

එසේ වුවත් මෙහි දී අප්‍රතිකූල හැඳිනීම් වශයෙන් කාමච්ඡන්දය වංචා කෙරේයයි යෝග්‍ය වේ. පිළිකූල් සංඥාවට යෝග්‍ය බැවින් ව්‍යාපාදය වංචා කෙරේ යනු යෝග්‍යය. සමාධි මුඛයෙන් ථීනමිද්ධය වංචා කෙරේ යනු යෝග්‍යය. වීර්යාරම්භ මුඛයෙන් උද්ධච්චය වංචා කෙරේ යනු යෝග්‍යය. ශික්ෂා කැමතිවීම් වශයෙන් කුක්කුච්චය වංචා කෙරේ යනු යෝග්‍යය. උභය පක්ෂය තීරණය කිරීම් වශයෙන් විචිකිච්ඡාව වංචා කෙරේ

යනු යෝග්‍යය. ඉටු අනිටු දෑ බැලීම් වශයෙන් මෝහය වංචා කෙරේ යනු යෝග්‍යය. අත්තඤ්ඤතා (සිත දැනීම් ස්වභාවය) මුඛයෙන් තමා කෙරෙහි පරිභව නොකිරීම් වශයෙන් මානය වංචා කෙරේ යනු යෝග්‍යය. විමසීම් මුඛයෙන් හේතුවට ගැළපෙන දේ ගැනීමෙන් මිථ්‍යා දෘෂ්ටිය වංචා කෙරේයයි සුදුසුය. විරක්ත ප්‍රතිරූපකයෙන් සත්ත්වයන් කෙරෙහි දයා නැති බව වංචා කෙරේ යයි යෙදේ. අනුමත කරන ලද ඇසුරු කිරීම් හා ගැළපෙන බැවින් එයින් කාමසුඛල්ලිකානු යෝගය වංචා කෙරේනුයි යෝග්‍යය. ආජීව පාරිශුද්ධත්වයෙන් අසංවිභාගශීලිත්වය වංචා කෙරේ යයි යෙදේ. සංවිභාගශීලිත්වයෙන් මිථ්‍යාජීවය වංචා කෙරේ යයි යෙදේ. අසංසර්ග විහරණයට සුදුසු සංග්‍රහශීලිත්වය වංචා කෙරේ යයි යෙදේ. සංග්‍රහ ශීලිත්වයට සුදුසු දෙයින් අනුලෝම සංසර්ගය වංචා කෙරේයයි යෙදේ. සත්‍යවාදීත්වයට සුදුසු දෙයින් කේලම් වචන වංචා කෙරේයයි යෙදේ. කේලම් නොවූ ප්‍රකාශනවලට සුදුසු දෙයින් අනර්ථකාමීත්වය වංචා කෙරේයයි යෙදේ. ප්‍රියවාදීත්වයට ප්‍රතිරූප වූ දෙයින් චාටුකම්‍යතාව වංචා කෙරේයයි යෙදේ. ප්‍රමාණවත් කථාවට ප්‍රතිරූප දෙයින් නොසතුටු බව වංචා කෙරේයයි යෙදේ. සම්මොදනශීලිත්වයට ප්‍රතිරූප දෙයින් මායාව ද කපටිකම ද වංචා කෙරේයයි යෙදේ. නිග්ගය්හවාදීත්වයට ප්‍රතිරූප දෙයින් එරුෂ වචන ඇති බව වංචා කෙරේ යයි යෙදේ. පාප ගර්හත්වයට ප්‍රතිරූප දෙයින් අන්‍ය වැරදි දක්නා බව වංචා කෙරේ යයි යෙදේ. කුලය කෙරෙහි අනුකම්පා ඇති බවට ප්‍රතිරූප දෙයින් කුලමසුරුකම වංචා කෙරේය යි යෙදේ. ආවාසය බොහෝකල් තිබේවා යන කැමැත්ත ඇති බවට ප්‍රතිරූප දෙයින් ආවාසමච්ඡරිය වංචා කෙරේයයි යෙදේ. ධර්ම බන්ධනය පරිහරණය කිරීම් වශයෙන් ධර්ම මසුරුකම වංචා කෙරේයයි යෙදේ. ධර්මදේශනාවට කැමතිවීම් වශයෙන් කථාවෙහි ඇලුණු බව වංචා කෙරේයයි යෙදේ. ප්‍රියවචන ඇති නිසා ගණයට අනුග්‍රහ කිරීම් වශයෙන් සංගණිකාරමත්වය වංචා කෙරේයයි යෙදේ. පුණ්‍යකාමීත්වයට සුදුසු දෙයින් කටයුතුවල ඇලීම් ස්වභාවය වංචා කෙරේ යයි යෙදේ. සංවේගයට ප්‍රතිරූප දෙයින් සිත්තැවුල වංචා කෙරේ යයි යෙදේ. ශ්‍රද්ධා බහුල බවට ප්‍රතිරූප දෙයින් අපරීක්ෂකත්වය වංචා කෙරේයයි යෙදේ. විමර්ශනයට ප්‍රතිරූප දෙයින් අශ්‍රද්ධාව වංචා කෙරේයයි යෙදේ. සිය අධිපති බවට ප්‍රතිරූප දෙයින් ගුරුවරුන්ගේ අනුශාසනාවේ අල්ප වූ පිළිගැනීම් ස්වභාවය වංචා කෙරේයයි යෙදේ. ධර්මාධිපතෙය්‍ය ප්‍රතිරූපයෙන් සබ්‍රම්සරුන් කෙරෙහි ගරු නොකරන බව වංචා කෙරේ යයි යෙදේ. ලෝකාධිපත්‍ය ප්‍රතිරූපයෙන් තමා කෙරෙහි ද ධර්මය කෙරෙහි ද වූ පරිභවය වංචා

කෙරේයයි යෙදේ. මෛත්‍රී කිරීම් ස්වරූපයෙන් රාගය වංචා කෙරේ යයි යෙදේ. කරුණාව දැක්වීම් වශයෙන් ශෝකය වංචා කෙරේ යයි යෙදේ. මුදිතා විහරණයට ප්‍රතිරූප දෙයින් උපහාසය වංචා කෙරේ යයි යෙදේ. උපේක්ෂා විහරණයට ප්‍රතිරූප දෙයින් කුශල ධර්මයන්හි බැසගත් කැමැත්ත වංචා කෙරේ යයි යෙදේ. මෙසේ ආගම ප්‍රතිරූපක, අධිගම ප්‍රතිරූපකාදියේ ඒ ඒ පරිද්දෙන් වන වංචන ස්වභාවය යුක්ති වශයෙන් දතයුතුය. මෙසේ ආගමානුසාරයෙන් යුක්ති ගවේෂණය කළ යුතුය.

යුත්ති හාර වර්ණනාව නිමාවිය.

7.

තත්‍ථ කතමො පදට්ඨානහාරෝ යනාදිය පදට්ඨාන හාර විභංගයයි. එහිදී යම් හෙයකින් මෙය මෙහි පදට්ඨානයයි. (ආසන්න කාරණයයි) මෙය මෙහි ආසන්න කාරණයයි. ඒ ඒ ධර්මයන්ට ආසන්න කාරණය වූ දෙය දක්වන ලක්‍ෂණය පදට්ඨාන හාරය වේ ද එහෙයින් පැවැත්මට මුල් වූ අවිද්‍යාව ආදි කොට ස්වභාව ධර්මයන්ගේ පදට්ඨානය නම් වූ ආසන්න කාරණය නිර්ධාරණය කරමින් **සබ්බධම්ම යාථාව අසම්පටිවෙධ ලකබණා අවිජ්ජා** යි අවිද්‍යාවේ ස්වභාවය දක්වයි. එහි අර්ථය මෙයයි. සියලු ධර්මයන්ගේ නොවෙනස් ස්වභාවය මෙයින් අවබෝධ කෙරේනුයි **සබ්බධම්මයාථාව අසම්පටිවෙධො** නම් වේ. ඒ ලක්‍ෂණය මෙහි ඇතැයි එය එසේ කියන ලදී. මෙයින් ධර්ම ස්වභාවය වසා දමන ලක්‍ෂණය අවිද්‍යාවයැයි කියන ලද්දේ වෙයි. එසේ නැතහොත් මනා අවබෝධය සම්පටිවෙධ නමි. ඊට ප්‍රතිපක්‍ෂ වූයේ අසම්පටිවෙධයයි. කවර තැනක ඒ සම්පටිවේධයේ ප්‍රතිපක්‍ෂය වේ ද, **සබ්බ -පෙ- ලකබණා** යි කියන ලදී. යම්හෙයකින් අශුභ දෙයෙහි ශුභය යනාදී විපර්යාස ඇතිවිට එහි මුළාව මතු මත්තෙහි හටගන්නේම වේ ද නොපිරිහේ ද එහෙයින් **තසසා විපල්ලාසා පදට්ඨානං** යි කියන ලදී. **පියරූපං සාතරූපං** යනු ප්‍රිය කළයුතු ජාතියේද කැමතිවිය යුතු ජාතියේ ද ආසන්න කාරණයයි. 'ලෝකයේ යම් ප්‍රිය රූපයක් වේ ද සැප ස්වභාවයක් වේ ද මෙහි ඒ තෘෂ්ණාව උපදමින් උපදී'යැයි කියන ලද්දේ ම ය. **අදිනනාදානා** යනු නුදුන් දෙය ගැනීමේ සිතිවිල්ලයි. එය එක් වරක් උපන්නේ නමුත් ආදීනව දැකීම

නිසා ලෝභයේ උත්පත්ති කාරණය වේයයි එහි ආසන්න කාරණය කියන ලදී. **දොසසස පාණාතිපාතො පදටඨානං මොහසස මිචඡාපටිපදා පදටඨානං** යන මෙහි ද මේ ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. **වණණ සණඨාන බයඤජනගගහණ ලකඛණා** යනු නිමිති අනුව්‍යඤ්ජන ගැනීම් ලක්‍ෂණයයි. සුබ සංඥාව වූ ස්පර්ශයේ උපගමන ලක්‍ෂණත්වය ස්පර්ශ ප්‍රත්‍යයමයි කියන ලදී. ස්පර්ශ කරන ලද්‍දව හඳුනාගනීයැයි කියන ලදී. **අසසාදො** යනු තණ්හාවයි. ඇතිවීම වැයවීම වෙනස්වීම සංබත ලක්‍ෂණයෝය. බොහෝසෙයින් විඤඤාණාදි නිත්‍ය ග්‍රහණය නිත්‍ය සංඥාවෙන් විඤඤාණයේ ආසන්න කාරණය බැව් කියන ලදී. එසේමය. ඒ භික්‍ෂුව එම විඤඤාණම දිවෙයි. සැරිසරයි යනුවෙන් විඤඤාණ විෂයම තමන්ගේ නිත්‍ය ග්‍රාහකත්වය ප්‍රකාශ කරයි. පංචස්කන්ධයේ අනිත්‍යත්වය ද දුක්ඛතාව ද මනාව දක්නා ලද්දේ ආත්ම සංඥාව සුබ සංඥාව අනාවකාශ යැයි **අනිචචසඤඤා දුකඛසඤඤා අසමනුපසසන ලකඛණා අනතසඤඤා** යි කියන ලදී. යමක් අනිත්‍ය ද එය දුකය. යමක් දුක්ඛ ද එය අනාත්මයැයි කියන ලදී.

බොහෝසෙයින් අරූප ධර්මයන්හි ආත්මාභිනිවේෂය වේයැයි **නසසා නාමකායො පදටඨානං** යයි කියන ලදී. **සබබං ඤෙයයං** යනු චතුරාර්ය සත්‍යයි. චතු සත්‍යයෙන් මිදුණු ඥෙය ධර්මයක් නොවන බැවිනි. **විතත විකෙඛපපටිසංහරණං** යනු උද්ධච්චය යටපත් කිරීමයි. **අසුභා** යනු අසුභානුපස්සනාවයි. පටිභාග නිමිත්ත වූ අසුභයම හෝ ය. තෘෂ්ණාවට ප්‍රතිපක්‍ෂ බැවින් සමථයට අසුභය ආසන්න කාරණය යැයි කියන ලදී. අභිධ්‍යාව තුනීකරන බැවින් නුදුන් දෙය ගැනීමෙන් වැළකීම අලෝභයේ ආසන්න කරුණ යැයි කියන ලදී. එසේම ව්‍යාපාදය තුනීකරන බැවින් ප්‍රාණඝාතයෙන් වැළකී සිටීම අදෝෂයේ ආසන්න කරුණ යැයි කියන ලදී. වස්තු පිළිබඳ නිවැරදි පිළිපැදීම් විෂය ස්වභාවය වැළැක්වීමයි. සම්‍යක් ප්‍රතිපත්තිය වූ සීල සමාධි සම්පදාවන්ගේ නිබ්බිදා ඤාණයෙන් අනභිරති ඤාණයම හෝ එසේ පැවති අනෙකකි. සියලු වේදනා දුක්ඛ දුක්ඛතා ආදී වශයෙන් දුක යැයි තීරණය කොට **දුකඛ සඤඤාය වෙදනා පදටඨානං** යැයි කියන ලදී. **ධමම සඤඤා** යනු ධර්ම මාත්‍රය කියන සංඥාවයි.

සත්ත්වයන්ගේ ශරීරයේ අවිතරාගීත්වය පංච අජඣත්තික ආයතනයන්ගේ වශයෙන් වේ යැයි **පංචින්ද්‍රියානි රූපානි රූපීනි රූපරාගසස**

පදටඨානං යි කියන ලදී. මෙහි කය ම රූපය යැයි අදහස් කරන ලදී. විශේෂයෙන් ධ්‍යානවලට නිශ්‍රය වූ මනායතනයෝ ද තෘෂ්ණාව වේ යැයි **ඡටඨායතනං භවරාගසස පදටඨානං** යි කියන ලදී. මෙවැනි රූපයක් ඇති නොවේවා. මෙවැනි වේදනාවක් ඇති නොවේවා යනුවෙන් පැවති රූපාදි අභිනන්දනය නිබ්බත්ති භවය දක්නා සුලුය. **ඤාණදසසනසස** යනු කම්මස්සකතා ඤාණ දර්ශනය පිණිසය. යෝනිසෝ මනසිකාරය ඇති පුද්ගලයාගේ පුබ්බේනිවාසානුස්සතියම කම්මස්සකතා ඤාණයට හේතුවෙයි. අයෝනිසෝ මනසිකාරය ඇති ගිලෙන්නාගේ නොවේ. මේ අර්ථය පැහැදිලි කිරීමට මහා නාරද කාශ්‍යප ජාතකය ද බ්‍රහ්මජාල සූත්‍රයේ එකසිය එකක් වූ වාද ද ගෙනහැර දැක්විය යුතුය. **ඔකපපන ලකබණා** යනාදියෙන් ශ්‍රද්ධාප්‍රසාද විශේෂය දක්වයි. ශ්‍රද්ධාවෙන් ම වූ ඒ අවස්ථා විශේෂය දතයුතුය. එහි **ඔකපපනං** යනු ඇදහීම් වශයෙන් අරමුණට බැසගැනීම් නිශ්චයයි. අනාවිලතා (යනු) අශ්‍රද්ධාව පහවීමෙන් සිතේ නිකැලැල් බවයි. **අභිපතතියනා** යනු ඇදහීමය. **අවෙචචපපසාදෝ** යනු ප්‍රඥා සහිත ආයතන ගත මනා ප්‍රසාදයයි.

අපිලාපනං යනු නොමුළාවයි. කිමිදී අරමුණෙහි බැසගැනීමයි. මෙහිදී ශ්‍රද්ධාදීන්ගේ ප්‍රසාද සද්ධා සම්‍යක් ප්‍රධන් සතිපට්ඨාන ඍධ්‍යාන අංගයන්ය. පිළිවෙලින් ආසන්න කරුණු යැයි කියන්නහු විසින් අවස්ථා විශේෂ වශයෙන් පදට්ඨාන භාවය කියන ලදැයි දතයුතුය. සති සමාධීන්ට කායාදිය සතිපට්ඨාන වේ. විතර්කාදීහු ද ආසන්න කාරණා වශයෙන් ධ්‍යාන වේයයි කියන ලදී. **අසසාද මනසිකාරෝ** යනු සංයෝජන ධර්මවල ආශ්වාදය දැකීමයි. **පුනබභව විරොහණං** යනු පුනර්භවයට පත්වීමයි. දෙවන භවයේ ඉපදීමට සුදුසු වූ විපාක ධර්ම ස්වභාවය යන අර්ථයයි. **ඔපපචචයික නිබබතති ලකබණං** යනු උත්පත්ති භවය වශයෙන් උපදනා ස්වභාවයයි. **නාමකාය රූප කාය සංඝාත ලකබණං** යනු රූප අරූප කායී සත්ත්වයන්ගේ ඒකාරාශිත්වයයි.

ඉන්ද්‍රිය වවසථානං යනු චක්ෂු ආදී ඉන්ද්‍රිය සයෙහි නියම කළ ස්වභාවයයි. **ඔපපචචයිකං** යනු නිපන්නා වූ ස්කන්ධයන් පහළ කරන යනුයි. **උපධි** යනු ආත්මභාවයයි. මොහුගේ මරණය තමාගේ මෙන් සිතන බාලයාට බොහෝ සෙයින් ශෝකය ඇතිවේ යැයි මරණ ශෝකයේ ආසන්න කරුණ යැයි කියන ලදී. **උසසුකකං** යනු සිත්තැවුලයි. **ඔදහනං** යනු අලුකිරීමයි. තමාගේ ආශ්‍රයේ තැවීමමය. **භවසසා** යැයි කියන ලද

භවය දක්වන්නට **ඉමානි** යන ආදිය කියන ලදී. එහි භවයේ අංග වූයේ ද භව සංඛ්‍යාත අංග වූයේ ද භවංගයෝය. ඒවායින් ක්ලේශයෝ භවයේ අංගයෝ වෙත්. කර්ම විපාක ප්‍රවෘත්තිය භව සංඛ්‍යාත අංගයෝය. **සමගගානි** යනු සියල්ලයි. බන්ධ ආයතන ආදියේ අන්‍ය අන්‍ය උත්පත්තීන්හි සැරිසැරීම සංසාරයයි. පළමු පළමු ජාතියේ ඉපැන්ම වූ කෙලෙස් පැවැත්ම එහි හේතුව යැයි **භවො සංසාරසස පදථයානං** යි කියන ලදී. පමුණුවන හේතුභාවය සඳහා **මගෙගා නිරොධසස පදථයානං** යැයි කියන ලදී. කර්මස්ථානයට බැසගන්නාට එතෙර වීමට හැකි බැවින් බහුශ්‍රැත බව තීර්ථය නම් වේ. එය මනාව ඇසුරු කිරීම **තිත්ථඤඤුතාවයි.** ධර්මය හා සබැඳි ප්‍රමෝදය පීති නම්. සැක ඇත්තා වූ ධර්මශ්‍රවණයෙන් එය උපදවා කර්මස්ථානයේ වර්ධනය කිරීම පීතඤඤුතාවයි. භාවනාවේ ස්වල්ප වූ ද ලයාපත්තිය ද (අසුරු සැනක් ගසන කාලය තුළ වන වැරැද්ද) උද්ධංපත්තිය ද (ප්‍රධාන වැරැද්ද ද) දැනීම පතතඤඤුතාවයි. තමාගේ පංච ප්‍රධානියංග දැනීම අතතඤඤුතාවයි. ඒවායින් පළමු පළමු කරුණු අවසන් අවසන් කරුණුවලට ආසන්න කරුණු බැව් මනාව දත යුතුමය. කරන ලද පින් ඇත්තාටම සුදුසු ප්‍රදේශයක විසීම හමුවේ අනෙකාට නොවේ යයි (දක්වන්නට) **පුබෙබකතපුඤඤතා පතිරූප දෙසවාසසස පදථයානං** යි කියන ලදී. **යථාභූත ඤාණදසසනං** යනු අධිෂ්ඨානය සමග වූ තරුණ විදර්ශනාවයි. **නිබබිදා** යනු බලවත් විදර්ශනාවයි. **විරාගො** යනු මාර්ගයයි. **විමුතති** යනු ඵලයයි. **එවං** යනු ඒ කුමක් ද යනුයි. **තසසා විපලලාසා පදථයානං** යනාදියෙන් අවිද්‍යා ආදියේ ආසන්න කාරණය මේ ක්‍රමයෙන් දක්වන ලදී. එසේ වුවත් **යො කොචි උපනිසසයො බලවපචචයො** යනු යම්කිසි ඉතිරි හේතුවකි. ඒ සියල්ල ආසන්න කාරණයයි දතයුතුය. **එවං යා කාචි උපනිසා යොගතො ච පචචයතො ච** යනුවෙන් ද කියවත්. එහි **උපනිසා** යනු හේතුවයි. **යොගෙන** යනු යුක්ති වශයෙනි. **පචචයතො** යනු හේතුභාව මාත්‍රයකි යන අර්ථය යැයි දතයුතුය. මෙහි යමක් අර්ථ වශයෙන් නොබෙදන ලද ද එය මනාව දත යුතුමය.

පදථයාන හාර විහංග වර්ණනාව නිමි.

8.

තත්‍ථ කතමො ලකඛණො හාරො යනාදිය ලකඛණ හාර විභංගයයි. එහිදී **කිං ලකඛීයති** යි ලක්ඛණ හාරයේ විෂය විමසයි. **යෙ ධම්මා** යනාදියෙන් ලක්ඛණ හාරය සංක්ෂේප වශයෙන් දක්වා එය උදාහරණවලින් බෙදා දක්වන්නට **චකඛුං** යනාදිය ආරම්භ කරන ලදී. එහි **වධකථොඨන එක ලකඛණානි** යන මෙයින් එක් අරමුණක නොපිහිටන ස්වභාවාදියෙන් ද ඒක ලක්ෂණත්වය කියන ලදමැයි දතයුතුය. මෙසේ ආයතන වශයෙන් ඒක ලක්ෂණත්වය දක්වා දැන් ස්කන්ධාදී වශයෙන් දක්වන්නට **අතීතෙ රාධ රූපෙ අනපෙකෙඛා හොහි** යනාදි සූත්‍රය ගෙනහැර දක්වන ලදී. **යමකොවාද සුත්තෙ වධකථොඨන එක ලකඛණා වුත්තා** යනු එම සූත්‍රයේ 'වධක රූපයකි. වධක රූපයකි'යි තතු ලෙස නොදනී යනාදි වශයෙන් ආ බැවින් කියන ලදී යනුයි. **ඉති** යනු මෙසේය. මේ ගාථාවෙහි, කායගතා සතියෙන් කියන ලද සතිය ද වෙදනාගතා සතිය ද චිත්තාගතා සතිය ද ධම්මගතා සතිය ද කියන ලද්දේ වෙයි. සතිපට්ඨාන බැවින් ඒක ලක්ෂණත්වයෙන් යුතු යන අදහසයි. දිටඨං යනාදීන්හි අර්ථය පසුව වර්ණනා කරන්නෙමු.

කායෙ කායානුපසසී විහරාහි යන මෙහි කායෙ යනු රූප කයෙහිය. රූප කය ම අංග ප්‍රත්‍යංගයන්ගේ සමූහාර්ථයෙන් කාය යැයි අදහස් කෙරේ. සමූහාර්ථයෙන් යම්සේ ද මෙසේම නින්දිත දේ පැමිණීම් අර්ථයෙන් ද කාය නම් වේ. ආය යනු උත්පත්ති දේශයකි. මේ එහි වචනාර්ථයයි. අය නම් නින්දිත වූ කෙස් ආදියයි. මේ නින්දිත වූ දේවලට වාසස්ථාන වේ යැයි කාය නම් වේ. **කායානුපසසී** යනු කය අනුව බලන සුලු යනුයි. කය අනුව බලන්නේ හෝයි කයෙහි යැයි කියා නැවත කායානුපස්සි යැයි දෙවනුව කාය ග්‍රහණය අමිශ්‍රව නිරණය කර සත්ත විනිබ්භෝගාදිය දැක්වීම පිණිසයි. එහෙයින් කයෙහි වෙදනානුපස්සී හෝ චිත්ත - ධම්මානුපස්සී පුද්ගලයෙක් නැත.

එකල්හි කායානුපස්සීව යනුවෙන් කාය සංඛ්‍යාත වස්තුවේ කායානුපස්සනා ආකාරයට දැක්වීමෙන් අමිශ්‍රව නියම කිරීම දක්වන ලද්දේ වෙයි. එසේම කය පිළිබඳ අංග ප්‍රත්‍යංගවලින් තොර වූ එක්වන් ධම්මානුපස්සනාවක් නැත. කෙස් ලොම් ආදියෙන් තොර වූ ස්ත්‍රී පුරුෂයන්

දකින්නෙක් ද නැත. මෙහි යම් කෙස් ලොම් ආදී වූ භූතයන්ගේ සමූහය නම් කයක් වේ ද එහිද භූත උපාදායවලින් මිදුණු එක්වත් ධම්මානුපස්සනාවක් නැත. ඉක්බිති රිය සමූහයක් බලන්නෙක් මෙන් අංග ප්‍රත්‍යංග සමූහය බලන්නෙකි. නගර අවයව බලන්නෙක් මෙන් කෙස් ලොම් සමූහය බලන්නෙකි. කෙසෙල් කඳෙහි පතුරු ගලවන්නෙක් මෙන් හිස් මිටක් වෙලා ගන්නෙක් මෙන් ද භූත උපාදාය රූප සමූහය දකින්නෙක් ම යැයි නානාප්‍රකාරයෙන් සමූහ වශයෙන්ම කාය සංඛ්‍යාත වස්තුවේ දර්ශනයෙන් සත්‍ය විනිබ්භෝගය දක්වන ලද්දේ වෙයි. මෙහි පෙර කියන ලද සමූහයෙන් මිදුණු කයක් හෝ අත් කිසි ධර්මයක් හෝ නොදක්නා ලැබේ. පෙර කියන ලද ධර්ම සමූහ මාත්‍රයම ඒ ඒ ලෙස සත්ත්වයෝ වැරදි ලෙස ග්‍රහණය කරත්. එහෙයින් පෝරාණිකයෝ

යං පස්සති න තං දිට්ඨං යං දිට්ඨං තං න පස්සති
අපස්සං බජ්ඣතෙ මූළ්හෝ බජ්ඣමානෝ න මුච්චති

"යමක් දක්නා ලැබේ ද එය නො දකින ලදී. යමක් දක්නා ලද ද එය නොදකියි. නොදක්නේ මුළාවේ බැඳේ. බැඳෙනුයේ නොමිදේ යැයි' කියන ලදී.

සත්‍ය විනිබ්භෝගාදිය දක්වනු පිණිස ආදි ශබ්දයෙන් මේ අර්ථය දතයුතුය. මොහු මේ කයෙහි කය අනුව බලන්නෙක් ම ය. අනෙක් ධර්මයක් බලන්නෙක් නොවේ. යම්සේ දිය නැහි මිරිඟුවේ දිය දකින්නෝ වෙත් ද මෙසේ අනිත්‍ය දුක්ඛ අනාත්ම අශුභ වූම මේ ශරීරයේ නිත්‍ය සුඛ ආත්ම සුභ වශයෙන් දකින්නෙක් නැත යන මෙය කියන ලද්දේ වෙයි. එසේ නැතහොත් මහා සතිපට්ඨානයේදී ආශ්වාස ප්‍රශ්වාස ආදී වූර්ණිකවලින් ඇති වූ අස්ථිවලින් කෙළවර වූ යම් මේ ශරීරයක් ගැන කියන ලද ද?

මෙලොව අයෙක් පඨවි කාය, ආපෝ කාය, තේජෝ කාය, වායෝ කාය -පෙ- අට්ඨිමිඤ්ජකාය අනිත්‍ය වශයෙන් දකියි යැයි පටිසම්භිදාවෙහි යම් කයක් ගැන කියන ලද ද ඒ සියල්ල මේ කයෙහිම දකින්නාගේ කයෙහි කය අනුව බලමින් යි මෙසේ මෙහි අර්ථය දතයුතුය. එසේ නැතහොත් කයෙහි මම කියා හෝ මගේ කියා හෝ ගතයුතු කිසිවක් නොදක්නේ කයෙහි කෙස් ආදී ධර්ම සමූහ සංඛ්‍යාත වූ කායානුපස්සනාව

කරමින් යැයි අරුත් දතයුතුය. තව ද මේ ශරීරයෙහි අනිත්‍ය වශයෙන් බලයි. නිත්‍ය වශයෙන් නොවේ යනාදියෙන් අනුක්‍රමයෙන් පටිසම්භිදාවේ ආ ක්‍රමය වූ සියල්ලේ අනිත්‍ය ලක්‍ෂණාදි ආකාර සමූහය නම් වූ කය අනුව බලමින් කයෙහි කය අනුව දකින්නා යන අර්ථයයි. **විහරාහි** යනු පවතුව යනුයි. **ආතාපී** යනු තුන් භවයන්හි කෙලෙස් තවානුයි ආතප වේ යනුයි. එය ඔහුට ඇත්තේනුයි ආතාපී නමි. **සම්පජානො** යනු සම්ප්‍රජන්‍ය (මනා දැනීම) සංඛ්‍යාත වූ ඥාණයෙන් සමන්විත වූ යනුයි. **සතිමා** යනු කය අල්ලාගන්නා සිහියෙන් සමන්විත වූ යනුයි. මෙය යම්හෙයකින් සිහියෙන් අරමුණ අල්ලාගෙන ප්‍රඥාවෙන් දකියි ද සතියෙන් තොර අනුපස්සනාවක් නැත. එහෙයින්ම 'මහණෙනි, මම සතිය සියලු දේ ඇති දෙයැයි කියමි යැයි කියන ලදී. කෙලෙස් තවන වීර්යය නැත්තහුගේ ඇතුළත වූ සංකාව අනතුරුදායක වෙයි. කර්මස්ථානයට නොපැමිණේ. එහෙයින් යම් ධර්මවල අනුභාවයෙන් ඊට පැමිණේ. එහෙයින් යම් ධර්මයන්ගේ ආනුභාවයෙන් ඊට පැමිණේ. එය දක්වන්නට **ආතාපී** යනාදිය කියන ලදී. එහි **විනෙය්‍ය** යනු තදංග වශයෙන් හෝ වික්ඛම්භන වශයෙන් දුරුකොට යනුයි. **ලොකෙ** යනු ඒ සිරුරෙහි ම ය. මෙහි කය ම කැඩීම් බිඳීම් අර්ථයෙන් ලෝකය යැයි අදහස් කරන ලදී. මෙහිදී අභිධ්‍යාග්‍රහණයෙන් කාමච්ඡන්දය ද දෝමනස්ස ග්‍රහණයෙන් ව්‍යාපාදයද ගන්නා ලද්දේය. නීවරණයන්හි දැඩි ධර්ම දෙක පිළිබඳ ප්‍රහාණය දැක්වීමෙන් නීවරණ ප්‍රහාණය කියන ලදැයි කායානුපස්සනා සතිපට්ඨානයේ ප්‍රහාණංගය දක්වන ලදී. ආතාපී යනාදියෙන් සම්පයෝග අංගය දක්වන ලදැයි යන මේ අර්ථය දක්වන්නට ආතාපී යනාදිය කියන ලදී. එහිදී අභිධ්‍යා දෝමනස්ස දෙකේ සමථය සෘජුවම ප්‍රතිපක්‍ෂ වේයැයි අභිධ්‍යා දෝමනස්ස ප්‍රහාණය කියනු ලබන්නේ සමාධි ඉන්ද්‍රිය දක්වා යයි. **විනෙය්‍ය ලොකෙ අභිඣඣා දොමනසසනති සමාධින්ද්‍රියං** යනුවෙන් කියන ලදී. එකලක්ඛණත්තා චතුන්නං ඉන්ද්‍රියානං යනු වීර්ය ප්‍රඥා සමාධි ඉන්ද්‍රියන්ගෙන් කායානුපස්සනා සතිපට්ඨානය සමෘද්ධ වේ. මෙසේ වේදනා චිත්ත ධම්ම අනුපස්සනා සතිපට්ඨානයන් ද ඒවායින් සමෘද්ධ වෙතැයි සූවිසි පට්ඨාන සාධනයෙහි මේ ඉන්ද්‍රියන්ගේ ස්වභාව භේදයක් නැතිකමින් සමාන ලක්‍ෂණ ඇති බැවින් ඉතිරි සතිපට්ඨාන ද කියන ලද්දේ ම වේ යන අර්ථයයි.

දැන් සතිපට්ඨාන ගත්කල්හි සියලු **බෝධිපාක්‍ෂික** ධර්මයන් ගත්

බව දක්වන්නට **චතුසු සතිපටඨානෙසු** යනාදිය කියන ලදී. එහි **බොධංගමා** යනු අවබෝධය වූ ආර්ය මාර්ග ඤාණයට යෙත් නුයි බෝධංගමා නම්. කියන ලද අවබෝධයේ පක්‍ෂයක වන්නේ නුයි බෝධපක්ඛිය නම්. **නියාණික ලකඛණෙන** යන මෙහි නිමිති වශයෙන් ද පැවතීම් වශයෙන් ද නැගී සිටීම නියාන නම් වේ. නියානයෙහි නියුතු වූයේ නුයි නියාණික නම්. දොවාරිකො යන්න මෙනි. නියාන සංඛාත ඵලයට සුදුසු වෙත් යන අර්ථයෙන් හෝ නෙයාණික නම් වේ. නිවන මොවුන් ගේ ප්‍රයෝජනයයි යන අර්ථයෙන් හෝ නියාන නම් වේ. **නියානියා** යයිද පාඨයක් වේ. ඊට පමුණුවානුයි නියානියා නම් අර්ථය දතයුතුය.

නියාණික ලකඛණෙන යනු නියාණික ස්වභාවයෙන් යනුයි. එවං **අකුසලාපි ධම්මා** යනු යම්සේ කුසල ධර්ම එක් ලක්‍ෂණයකින් නිර්ධාරණය කරන ලද ද මෙසේ අකුසල ධර්ම ද ඒක ලක්‍ෂණ අර්ථයෙන් නිර්ධාරණය කළ යුතුය යනුයි. කෙසේ ද? ප්‍රහාණයේ දී ඒකාර්ථ වශයෙනැයි දක්වනුයේ **පහාණං අබභවතං ගචඡනති** යි කියන ලදී. ඒ ඒ ප්‍රහාණය දක්වන්නට **චතුසු සතිපටඨානෙසු** යනාදිය කියන ලදී. එහිදී කායානුපස්සනා ආදී සතර සතිපට්ඨාන වර්ධනය කරන කල්හි අසුභයෙහි සුභ ලෙස දැකීම ආදී විපර්යාස සතර ද ප්‍රහීණ වෙයි. ඔහුගේ කබලිංකාර ආහාර ආදී ආහාර සතර ද අවබෝධ වේ. ඒවා දන්නහුගේ බැඳුම් වන කාම රාගාදිය අවසන් කළේ වෙයි යන අර්ථයයි. කවර හෙයින් ද? ඒවා ප්‍රහාණය කළ යුතු බැවින් ඒක ලක්‍ෂණ ඇති හෙයිනි. සියලු තැන මෙසේ අර්ථය යෙදිය යුතුය. එහෙයින්ම **එවං අකුසලාපි ධම්මා එකලකඛණතා පහාණං අබභවතං ගචඡනති** යි කියන ලදී.

දැන් වෙනත් ක්‍රමයකින් ලක්ඛණ හාරයට උදාහරණ දක්වන්නට **යඤ්ච වා පන** යනාදිය කියන ලදී. එහි **යඤ්ච** යනු යම් දේශනාවක යනුයි. **වා** ශබ්දය විකල්පාර්ථයයි. **පන** යනු පද පූරණ නිපාතයකි. **රූපින්ද්‍රියං** යනු නැසීම් ස්වභාව ඇති අෂ්ටවිධ ඉන්ද්‍රියයන් ය. **තඤ්ච** යනු ඒ දේශනාවෙහි ය. **රූපධාතු** යනු නැසීම් ස්වභාව ඇති දශවිධ ධාතූහු ය. **රූපායතනං** යනු නැසීම් ස්වභාව ඇති දශවිධ ආයතනයන් ය. රූපී වූ දශායතන යන අර්ථයයි. නැසීම් ලක්‍ෂණයෙන් එක සමාන ලක්‍ෂණ ඇති බැවින් මේවා දේශනා කරන ලදී යන අර්ථයයි. දෙසිතං තඤ්ච **සුඛින්ද්‍රියං සොමනසසින්ද්‍රියං** යනු සුඛ වේදනා බැවින් එක සමාන ලක්‍ෂණත්වය යන අදහසයි. **දුකඛ සමුදයො ච අරියසචචං** යන මෙය අකුසලයට සොම්නස් වශයෙන්

කියන ලදී. ආශ්‍රව සහිත කුශලය වශයෙන් ද සුදුසු ම ය. **සඞ්ඛා ච පටිච්ච සමුප්පාදෝ දෙසිතෝ** යනු සම්බන්ධයයි. අවිද්‍යාව අනුසයක් බැවින් අදුක්ඛමසුඛ වේදනාවෙන් ය. අදුක්ඛමසුඛ වේදනාවෙන් අවිද්‍යා අනුසය අනුව පවතී යන්න කියන ලද්දේ ම ය. එසේම **අදුකඛමසුඛා හි වෙදනාය අවිජ්ජා අනුසෙති** යි කියන ලදී. මේ වේදනා ග්‍රහණයෙන් අදුක්ඛමසුඛ අවිද්‍යාව ගන්නා ලද්දේ යැයි දක්වයි. අවිද්‍යා ග්‍රහණය ඇතිකල්හි සියලු පටිච්ච සමුප්පාදය දේශනා කරන ලදැයි දක්වන්නට **අවිජ්ජා පච්චයා සංඛාරා** යනාදිය කියන ලදී. **සෝ ච** යන මෙහි ච ශබ්දය ව්‍යතිරේකාර්ථය සඳහා යෙදුනකි. එහෙයින් ඒ පටිච්චසමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් යැයි මේ කියනු ලබන විශේෂය බබුළුවයි. ඒ අතරින් අනුලෝම වශයෙන් පටිච්චසමුප්පාදය දක්වන ලද පරිදි **සරාග සදොස සමොහ සංකිලෙස පංචෙන හාතබෙබා** යි කියන ලදී. පටිලෝම වශයෙන් වනාහි 'අවිද්‍යාවේ ම සම්පූර්ණ නිරෝධයෙන් ආදී වශයෙන් පාළියෙහි යමක් කියන ලද ද ඒ සඳහා **වීතරාග වීතදොස වීතමොහ අරියධමෙමහි හාතබෙබා** යි කියන ලදී.

දැන් ඒක ලක්‍ෂණත්වය දැක්වීමෙන් ලක්ඛණ හාර යෙදීමේ න්‍යාය දක්වන්නට **එවං යෙ ධම්මා** යනාදිය කියන ලදී. එහි **කිච්චතෝ** යනු පඨවි ආදියේ ද ඵස්ස ආදියේ ද රූපාරූප ධර්මයන්ගේ ද දැරීම් ගැටීම් ආදී කෘත්‍යයයෙන් ද ඒ ඒ ප්‍රත්‍ය ධර්මයන්ගෙන් ඒ ඒ ප්‍රත්‍යවලින් හටගත් ධර්මයේ ප්‍රත්‍යභාව සංඛ්‍යාත කෘත්‍යයෙන් ද යනුයි. **ලකඛණතෝ** යනු කර්කශ ස්පර්ශ ආදී ස්වභාවයෙනි. **සාමඤඤතෝ** යනු නැසීම් නැමීම් ආදියෙන් ද අනිත්‍යත්වය ආදියෙන් ද ස්කන්ධ ආයතන ආදියෙන් ද යනුයි. **චුතූපපාතතෝ** යනු සංඛත ධර්මයන්ගේ බිඳීමෙන් ද ඉපදීමෙන්ද යනුයි. සමාන නිරෝධයෙන් ද සමාන උත්පත්තියෙන් ද යන අර්ථයයි. මෙහිදී සමග හැසිරීම, සමාන හේතුත්වය, සමාන ඵලත්වය, සමභූමිත්වය, සම විෂයත්වය, සම අරමුණු ඇති බව යන මේ ආදියද ච ශබ්දයෙන් සංගෘහිත යයි දත යුතුය. සෙස්ස ප්‍රකටමය.

ලක්ඛණ හාර විභංග වර්ණනාව
නිමි.

9.

තත්‍ථ කතමො චතුබ්‍යූහො හාරෝ යනු චතුබ්‍යූහහාර විභංගයයි. එහි **බ්‍යඤ්ජනෙන සුතනසස නෙරුතනඤ්ච අධිපපායොච නිදානඤ්ච පුබබාහාර සඤ්ච ච ගවෙසිතබබා** යනු සංක්ෂේපයෙන් පළමුව චතුබ්‍යූහ හාරය දක්වයි යනුයි. **බ්‍යඤ්ජනෙන** යන මෙයින් සූත්‍රය ව්‍යඤ්ජනවලින් විමසිය යුතු බැවින් ව්‍යඤ්ජන මුඛයෙන් ම මේ චතුබ්‍යූහහාර පදාර්ථ වෙන්කර දැක්විය යුතුයයි දක්වයි. **නෙරුතතං** යනු නිරුක්තියයි. නිර්වචනය යන අර්ථයයි. නිරුක්තියම නෙරුත්ත නම් වේ. එහෙයින්ම **යා නිරුතති පද සංහිතා** යි කියන ලදී. එහි අර්ථය යමක් නිරුක්ති වේ ද එය නෙරුත්ත නම් වේ යනුයි. ඒ නිරුක්තිය කවරී ද? පද සංහිතා යනු පදයන් හා ගැළපුණු, ඒ සමග වූ යන අර්ථයයි. ලිංග වචන කාලසාධන පුරුෂ ආදී විශේෂ යෝගවලින් යම් යම් අර්ථයක් යම් යම් ආකාරයකින් කිවයුතු ද ඒ ඒ ආකාරයෙන් පැවති ස්වභාව නිරුක්තිය යන අර්ථයයි. එසේම **යං ධමමානං නාමසො ඤාණං** යි කියන ලදී. එහි යං යනු හේතු අර්ථයේ නිපාතයකි. යම් කරුණකට හේතු වූ යන අර්ථයයි. **ධම්මානං** යනු ඥෙය්‍ය ධර්මයන්ගේ ය. **නාමසො** යනු පොළව ස්පර්ශය, ස්කන්ධ, ධාතු, නිස්ස, ඵුස්ස යන මේ ආදි නාම විශේෂයෙන් ඤාණය පවතී ද මෙය ස්වභාව නිරුත්ති නම් වේ යනුයි. පොළොව යන මේ ආදී ශබ්දයක් ගෙන ඉන්පසු සංකේත ද්වාරයෙන් එහි අර්ථ ප්‍රතිපත්තිය වේ ද ඒ ඒ දෙය අනියත වූ නාම ප්‍රඥප්තීන් ගැනීම් වශයෙන් ම වේ.

එසේ නැතහොත් **පද සංහිතා** යනු පදය හා ගැළපුණු යනුයි. පදයෙන් ම පදාර්ථ අවබෝධය වේ. ඒ අර්ථය වනාහි ප්‍රවෘත්ති නිමිත්ත වූ ප්‍රඥප්තිය ගැනීමෙන්ම වේ යයි ඒ ප්‍රඥප්තිය නිරුක්ති සංඛ්‍යාත වූ පදය සමග ගැළපී පදාර්ථය අවබෝධ කෙරේ යන අර්ථයෙන් පද සංහිතායි කියන ලදී. **යදාහි භික්ඛු** යනාදියෙන් ධර්මයන්ගේ නාම වශයෙන් ඤාණය වේ යයි පදයේ අර්ථය විවරණය කරයි. එහි **අසඨසස** යනු ශබ්දයෙන් කිය යුතු අර්ථයේය. **නාමං ජානාති** යනු නාම ප්‍රඥප්ති වශයෙන් මේ නමැයි නම දනී යනුයි. **ධම්මසස** යනු ස්වභාව ධර්මයේය. **අභිනීරොපෙති** යනු යම් යම් අර්ථයක් හා ධර්මයක් යම් යම් සේ ව්‍යවහාර කළ යුතු ද එසේ එසේ ඒ නාම ව්‍යවහාරය නැගෙයි. දෙසයි යන අර්ථයයි. මෙපමණකින් ද මේ භික්ෂුව අසඨකුසල පුද්ගලයෙක් නොයෙක් නාමාන්තරයන්හි දක්ෂයෙක් ගැන කියනු ලැබේ යයි සම්බන්ධ කළයුතුය.

එහි **අපඨකුසලෝ** යනු පාළි අර්ථයෙහි දක්ෂ වූ යනුයි. **ධම්ම කුසලෝ** යනු පාළියෙහි දක්ෂ වූ යනුයි. **බ්‍යඤ්ජන කුසලෝ** යනු අකුරුවල ද වැකිවලද දක්ෂ වූ යනුයි. **නිරුත්ති කුසලෝ** යනු නිර්වචනයෙහි දක්ෂ වූ යනුයි. **පුබ්බාපරකුසලෝ** යනු දේශනාවේ පෙර පසු තැන්හි දක්ෂ වූ යනුයි. **අතීතාධිවචන කුසලෝ** යනු අතීත ප්‍රඥප්තියෙහි දක්ෂ වූ යනුයි. මේ නය ඉතිරි තැන්හි ද වේ. **එවං සබ්බානි කාතබ්බානි ජනපද නිරුත්තානි** යනු සත්ත්ව ව්‍යවහාරයේ ඇති යම් ඒ සියලු දේ සම්හ වූ පරිදි සූත්‍රයෙහි නිර්වචන වශයෙන් කළයුතුය. පැවතිය යුතුය යන අර්ථයයි. **සබ්බා ච ජනපද නිරුත්තියෝ** යනු සියලු ලෝක සංඥාවන් සුදුසු පරිදි කළ යුතුය යනුයි. ප්‍රඥප්ති නාමය නො ඉක්මිය යුත්තේ යයි කියන ලදී. එසේම සම්මුති සත්‍ය වශයෙන් පරමාර්ථ සත්‍යාවබෝධය වන්නේ ය. අධිප්පාය කාණ්ඩයේ ප්‍රකට නොකරන ලද අර්ථයක් නැත. නිදාන කාණ්ඩයෙහි **ඉමිනා වත්තුනා** යනු මේ පුත්‍ර ගව කීර්ති සංඛ්‍යාත කාරණයෙනි. මෙහිදී කාරණයම නිදානය යැයි කියන ලදී. මේ ක්‍රමයෙන් සියලු තැන්හිදී නිදානය වෙන්කර ගැනීම දතයුතුය.

කාමන්ධා යනු ක්ලේශ කාමයෙන් අන්ධ වූ යනුයි. **ජාලසඤ්ඡන්නා** යනු තණ්හා දැලින් වෙළුණු යනුයි. **තණ්හාජ්ජඩන ඡාදිතා** යනු තණ්හා සංඛ්‍යාත වූ අන්ධකාරයෙන් වසන ලද යනුයි. **බන්ධනා බද්ධා** යනු කාමගුණ සංඛ්‍යාත වූ බන්ධනයෙන් බැඳුණු යනුයි. **පමත්ත බන්ධනා** යිද පාඨයකි. ප්‍රමාදයෙන් යන අර්ථයයි. **පුබ්බාපරෙන** යනු මුලින් හෝ අගින් හෝ වූ වෙනත් දේශනයකින් යන අදහසයි. **යුජ්ජති** යනු යෝග්‍යත්වයට පත්වේ. ගැළපේ යන අර්ථයයි. **ඉමෙහි පදෙහි පරියුට්ඨානෙහි** යනු තණ්හාව මතුකරවාලන කියන ලද මේ ගාථා පදයන්ගෙන් යනුයි. **යා යෙව තණ්හා** යනු පළමු ගාථාවෙහි යමක් කියන ලද ද එම තණ්හාවමය යනුයි. **යඤ්චාහ** යනාදියෙන් ගාථා දෙකේම අර්ථ ගැළපීමෙන් පූර්වාපර පද පැහැදිලි කරයි. **පයොගෙන** යනු භාවිතයෙනි. **තස්මා** යනු යම්තැනක තමාම ඇතිවී ද එය සත්ත්වයන්ගෙන් ඉවත් කරන්නට නොදෙමින් නොයෙක් අරමුණුවලින් පොළඹවනු ලබන්නේ කෙලෙස්වලින් සිත මැඩගෙන සිටී ද එහෙයින් කෙලෙස් ලෙසින් ද පරියුට්ඨාන වශයෙන් ද තණ්හා බන්ධනය කියන ලදී.

ප්‍රපඤ්චනය කෙරෙත්. **සසරෙහි** බොහෝ කලක් තබත් යන අර්ථයෙන් **පපඤ්ච** නම් වේ. මේවා කරණ කොටගෙන පවතිනුයි **ඨිති**

නම් වේ. බන්ධනාර්ථයෙන් එකතු වූවාක් මෙන් යන අර්ථයෙන් **සන්ධානං** නම් වේ. නිර්වාණ නගරයට ප්‍රවේශවීම වළක්වන බැවින් බාධාවක් මෙනැයි **පලිඝ** නම් වේ. ඉතිරි නොකොට තණ්හාව ප්‍රහාණය කිරීමෙන් **නිතතණ්හ** බවට පත්වේ. තමාට ද අනුන්ට ද හිතවත් වූ මෙලොවට ද පරලොවට ද හිතවත් වූ දේ පිළිබඳව දන්නා බැවින් **මුනි** නම් වේ. මෙසේ ගාථාවේ පදාර්ථය දතයුතුය. ප්‍රපඤ්ච ආදි අර්ථ පාළියෙහි බෙදා දක්වන ලද්දේමය. එහිදී යම් කෙනෙකුගේ මේ පපඤ්චාදිය අස්තයට ගියානු ද ඔහුගේ තණ්හාවේ ස්වල්ප මාත්‍රයක් හෝ නොවේ. එහෙයින් **යො එතං සබ්බං සමතික්කනෙතා අයං වුච්චති භික්ඛවෙ නිතතණ්හා යි** කියන ලදී. **පරියුට්ඨානං** යනු තණ්හාවේ නැගී සිටීමයි. තෘෂ්ණා විමර්ශනය කියන ලදී. **සංඛාරා** යනු එය සකස් කළ සංස්කාරයෝ ය. **සංස්කාරයෝ තෘෂ්ණා දෘෂ්ටි මානයන්ට හේතු වේයැයි කියන ලදී.** යම් හෙයකින් ජවන් සිත් සතෙන් පළමු චේතනාව ප්‍රත්‍ය එකතුව ඇතිකල්හි මේ ආත්ම භාවයෙහි ඵල දෙයි ද අවසන් චේතනාව අනතුරු ආත්ම භාවයෙහිද ඒ දෙක අතරමැද චේතනාව යම්කිසි තැනකදී ඵල දෙයි. එහෙයින් විපාක දීම් වශයෙන් බෙදා දක්වන්නට **දිට්ඨධම්ම වෙදනීයා ච** යනාදිය කියන ලදී. යම් හෙයකින් ඒ ඒ චේතනා සමග යුක්ත වූ තණ්හාව ද චේතනාව මෙන් දිට්ඨධම්ම වේදනීය ආදී වශයෙන් තෙවැදෑරුම් වේ ද එහෙයින් **එවං තණ්හා තිවිධං ඵලං දෙතීං'යි** කියන ලදී. **පුබ්බාපරෙන යුජ්ජති** යනු සංස්කාර පිළිබඳව පූර්ව වූ පළමු වූ දිට්ඨධම්ම වේදනීයත්වය ආදී යම් වචනයක් කියන ලද ද එය මේ අපර වූ දිට්ඨධම්ම වේදනීයත්වය ආදී වචනයෙන් කර්මයට සුදුසු වේ යනුයි. යමුනා නදී දිය සමග ගංගා නදී දිය (ගැළපෙන්නාක් මෙන්) සැසඳේ. සමවේ යන අර්ථයයි.

සංඛාරා දසබලෙන යනු දිටඨිගත සම්පයුත්ත සිත් සතරෙහි ද විචිකිච්ඡා සම්පයුත්ත සිත් පසෙහි ද පංච චිත්තුප්පාදයන්හි ද වූ සංස්කාරයෝ පළමු මාර්ග ප්‍රඥා බලයෙන් යුක්ත වූ යනුයි. **ඡතනිංස තණ්හාවි චරිතානි භාවනා බලෙන** යනු පළමු මාර්ගයෙන් ප්‍රහීණව ඉතිරි වූ දේ ලෙසින් කියන ලදී. සියල්ල ලෙසින් නොවේ. **අනුබන්ධො** යනු තෘෂ්ණාදීන් බැඳගැනීම් වශයෙන් පැවැත්මයි. **යො චාපි පපඤ්චදා** යනාදියෙන් විස්තර කරයි ආදියෙන් කියන ලද රාධ සූත්‍රය ද සසඳයි. එහෙයින්ම **ඉදං එකඤං** යි කියන ලදී. ඉදින් අර්ථ වශයෙන් එකකි. දේශනාවෙන් විශේෂයක් දක්නට ලැබෙයයි දක්වන්නට **අපි ච** යනාදිය කියන ලදී.

එවං යනු මේ කියන ලද අයුරින් යනුයි. **සුතෙනන** යනු සංවර්ණනා කරනු ලබන සූත්‍රයෙනි. **සුතතං** යනු සූත්‍රාන්තරයකි. **සංසන්දෙත්වා** යනු මිශ්‍ර නොකර අර්ථ වශයෙන් නොබිඳ යනුයි. **පුබ්බාපරෙන සන්ධිං යොජෙත්වා** යනු පූර්ව හෝ අපර සූත්‍රයක් **සඞ්ග** අර්ථ වශයෙන් සම්බන්ධය යොදා යනුයි. මේ කියන ලද අර්ථයම ප්‍රකට කරයි **සුතතං නිද්දිට්ඨං හවති** යනු සූත්‍රයේ අර්ථය දක්වන ලද්දේ වෙයි. වෙනත් සූත්‍රයක් දැක්වීමෙන් විස්තර කරන ලදී යනුයි.

හුදෙක් සූත්‍රාන්තර සන්සන්දනය ම පූර්වාපර සන්ධිය නොවේ. එහෙයින් අනෙකක් ද ඇති බව දක්වන්නට **සොචායං** යනාදිය කියන ලදී. එහි **අත්ථ සන්ධි** යනු ක්‍රියා, කාරක ආදී වශයෙන් අර්ථයේ සම්බන්ධයයි. යම්හෙයකින් එය ෂඩ්විධ අර්ථ පදයන්ගෙන් ම වෙයි. සියලු පදාර්ථයේ අවරෝධයෙන් සම්බන්ධය නම් කිසි අර්ථයක් නොවේ ද එහෙයින් **බ්‍යඤ්ජන සන්ධි ච පදානි** යි කියන ලදී. **දෙසනාසන්ධි** යනු කියන ලද පරිදි වෙනත් දේශනයකින් දේශනය ගැළපීමයි. **න ච පඨවිං නිස්සාය** යනු පෘථිවි විෂය සංඛ්‍යාත වූ විෂය ඇසුරු කොට යනුයි. පොළවේ එල්බ යනුයි. **ඣායී** යනු ඵලසමාපත්ති ධ්‍යානයෙන් ධ්‍යාන කරන්නාය. පෘථිවිය ඇසුරුකොට ධ්‍යාන නොකෙරේ යනුවෙන් කියන ලදී. සෙසු පදයන්හි ද මේ ක්‍රමයමැයි. මෙහිදී සතරමහා භූතයන්ගෙන් රූපයන් බැඳී ඇති හෙයින් සියලු කාමභවය ද රූපභවය ද ගන්නා ලදී. අරූපභවය ස්වරූපයෙන් ම ගන්නා ලද්දේ යැයි සියලු ලෝකය මැඩගෙන නැවත වෙනත් ක්‍රමයකින් එය දක්වන්නට **නව ඉමං ලොකං** යනාදිය කියන ලදී. සියලු ලෝකය මෙලොව පරලොව යැයි කොටස් දෙකකින් යුක්ත වේ. යම්හෙයකින් මෙලොව යැයි විශේෂයෙන් මේ භවයට අයත් සත්ත්ව සන්තානය ගැන කියනු ලැබේ. පරලොව යැයි භවාන්තර ගත වූ සත්ත්ව සන්තානය (කියනු ලැබේ) ඒ දෙකින් මිදුණු ඉන්ද්‍රිය හා බැඳී නැති රූප සන්තානයක් වේ ද එහෙයින් ඒ සඳහා **යම්දං උභයමන්තරෙන** යනාදිය කියන ලදී. යමෙක් දෙක අතරින් යන වචනය ගෙන අන්තරා භවය කැමති වෙත් ද ඔවුන්ගේ ඒ අදහස මිථ්‍යාවකි. අන්තරා භවය අභිධර්මයේදී ප්‍රතික්ෂේප කරන ලදී. **දිට්ඨං** යනු රූපායතනයයි. **සුතං** යනු ශබ්දායතනයයි. **මුතං** යනු පැමිණ ගතයුතු ගන්ධායතන රසායතන ස්පර්ශායතනයන් ය. **විඤ්ඤාතං** යනු ධර්මාරම්මණය කෙළවර කර ඇති අවශේෂ දේ ය. **පත්තං** යනු පිරික්සා හා නොපිරික්සා පැමිණි දේ ය. **පරියෙසිතං** යනු ප්‍රාප්ත හෝ අප්‍රාප්ත හෝ පරියෙසිත දේ ය. **චිතකකිතං විචාරිතං** යනු

විතර්ක වශයෙන් ද පිරිමැදීම් වශයෙන් ද එල්බගත් යනුයි. **මනසානුවිචිනිතිනං** යනු සිතින් අනුව සිතන ලද යනුයි. **අයං සදෙවකෝ** -පෙ- **අනිසසිතෙන චිතෙතන න ඣායති ඣායතෙනා** යනු මේ ක්ෂීණාශ්‍රව තෙමේ ඵල සමාපත්ති ධ්‍යානයෙන් ධ්‍යාන කරමින් පළමුව තණ්හා දිට්ඨියෙන් මනාව ප්‍රහීණ කරන ලද බැවින් දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙව් මිනිසුන්ගෙන් යම්කිසිවෙකුට නොඇලුණු සිතින් ධ්‍යාන කරයි යනුයි. එහෙයින්ම ලෝකයේ කිසිවකු විසින් මොහු මෙන් ඇසුරු කොට ධ්‍යාන කරයි යැයි අවබෝධ කර නොගනී. එය කියන ලදී.

නමෝ තෙ පුරිසාජඤ්ඤ නමෝ තෙ පුරිසුත්තම
යසස තෙ නාභිජානාම කිං ත්වං නිසසාය ඣායසී

"පුරුෂ ශ්‍රේෂ්ඨය, ඔබට නමස්කාර වේවා. උතුම් පුරුෂය ඔබට නමස්කාර වේවා. ඔබ කවරක් ඇසුරුකොට ධ්‍යාන කරහිදැයි නොදනිමු."

දැන් ක්ෂීණාශ්‍රවයන්ගේ සිත කිසිතැනක නොඇලුණු බව ගෝධික සූත්‍රයෙන් ද වක්කලී සූත්‍රයෙන් ද දක්වන්නට **යථා මාරෝ** යනාදිය කියන ලදී. **විඤ්ඤාණං සමතෙවසතෙනා** යනු පිරිනිවීමෙන් මත්තෙහි විඤ්ඤාණයක් සොයමින් යනුයි. **පපඤ්චමානිතෙනා** යනාදියෙන් නොදක්වනු ලබන දෙයෙහි හේතුව කියන ලදී. **අනිසසිතචිතතා නඣායනති** ඣායමානා යනු නුදෙක් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් යුත් ක්ෂීණාශ්‍රවයාගේ සිතේ ස්වභාවය මාරාදීහු නොදනිත්. එහෙත් සඋපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් ද ඔහුගේ ඒ සිත නොදනිත් යන අර්ථයයි. **අයං දෙසනා සන්ධි** යනු ගෝධික සූත්‍රය වක්කලී සූත්‍රය ආදී සූත්‍රයන්ගේ අන්‍යොන්‍ය අර්ථ සැසඳීම දේශනා සන්ධි නම් වේ යනුයි. **නිදෙදස සන්ධි** යන තැන නිර්දේශයේ සන්ධිය නිද්දෙස සන්ධියයි. නිර්දේශයෙන් හෝ වූ සන්ධිය නිද්දේස සන්ධියයි. සූත්‍රයේ පළමු නිර්දේශයෙන් ද එහිම අවසන් නිර්දේශයෙන් ද යනුයි. අවසන් එකෙන් පළමු එකෙහි සම්බන්ධය යන අර්ථයයි. එය දක්වන්නට යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ බොහෝසෙයින් පළමුව සසර දක්වා පසුව නිවන දක්වයි. එහෙයින් **නිසසිතචිතතා** යනාදිය කියන ලදී. එහිදී නිස්සිත සිතක් මොවුන්ට ඇත යන අර්ථයෙන් **නිසසිත චිතතා** නම් වේ. පුද්ගලයෝයි. **නිදදිසිතබබා** යනු පුද්ගල අධිෂ්ඨානයෙන් වූ දේශනාවෙන් යන අදහසයි. ධර්මාධිෂ්ඨානයෙන් වනාහි නිස්සිත සිතක් මෙහි ඇත්තේනුයි **නිසසිතචිතතා** නම් වේ. **නිස්සිත**

සිත් ඇත්තෝ තණ්හා දිට්ඨි ඇසුරු කිරීම වශයෙන් පැවති සූත්‍රාපදේස ද වේ. මෙහි ඉතිරි සියල්ල ප්‍රකටමය.

චතුබ්‍යූහභාර විභංග වර්ණනාව නිමි.

10.

තසථ කතමො ආවටෙටා භාරෝ යනු ආවට්ටභාර විභංගයයි. එහි **ආරභථ** යනු ආරම්භ ධාතු සංඛ්‍යාත වීර්යය කර වූ යන අර්ථයි. **නික්කමථ** යනු දක්ෂතා පක්ෂයෙන් නික්මුණු බැවින් නික්කම ධාතු සංඛ්‍යාත ඊට වැඩිමනක් වූ වීර්යය කරවූ යනුයි. **යුඤ්ජථ බුද්ධසාසනෙ** යනු යම්හෙයකින් සීල සංවරය, ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇති බව, භෝජනයේ මාත්‍රඥතාව, සතිසම්පජඤ්ඤය යන මේ ධර්මයන්හි පිහිටියවුන්ට නිදිවැරීම් වශයෙන් ආරම්භ නික්කම ධාතුහු පැමිණෙත්. එහෙයින් එවැනි වූ සමථ විදර්ශනා සංඛ්‍යාත භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි යෙදුණාහු වෙවූ යනුයි. **ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරෝ** යනු මෙසේ පිළිපන්නාහු ද තෙධාතුක සසරට ප්‍රධාන වූ මාර රජුගේ වසඟයට සත්ත්වයන් පමුණුවානුයි ඔහුගේ සේනාසංඛ්‍යාත වූ අබල දුබල බව යම්සේ බලවත් ඇතෙක් බටළීවලින් සාදන ලද ගෙයක් ක්ෂණයකින් කඩාදමන්නාක් මෙන් කෙලෙස් සමූහය කම්පා කරවූ. විනාශ කරවූ. නසවූ යන අර්ථයයි. එය යොදා දක්වන්නට **ආරභථ නික්කමථ** යන්න වීර්යයේ ආසන්න කාරණයයි කියන ලදී. එහි **ආරභථ නික්කමථ** යන මේ වචනය වීර්යයේ ආසන්න කාරණයයි. වීර්යය යෙදීමේ හේතුව වීර්යාරම්භයෙහි නියෝජනය වන හෙයින්ය. 'යොගාවෙ ජායතෙ භූරී' යන වචනයෙන් යොග යනු භාවනාවයි. එහි විදර්ශනා භාවනාව කිය යුතු බැවින් මෙහි දී සමාධි භාවනාව අදහස් කරන ලදැයි කියන ලදී. **යුඤ්ජථ බුද්ධසාසනෙ** යනු සමාධියේ ආසන්න කාරණයයි. මාරයාගේ සේනාව යැයි කියන ලද කෙලෙස් සේනාව මනාව කම්පා කිරීම ඤාණයෙන් ම වේ යැයි ධුනාථ -පෙ- පදථානං යි කියන ලදී. නැවතත් කියන ලද පරිදිම වීර්ය සමාධි ප්‍රඥාවන්ගෙන් යුක්ත වූ අධිපති කෘත්‍යත්වයෙන් ප්‍රපඤ්චයන් ප්‍රහාණය කිරීමට සමත් වූ සංසාර මූලය සිඳ දමා නිවනට පමුණුවන්නේ යයි දැක්වීමට **ආරභථ නික්කමථාති**

විරියින්‍ද්‍රියස්ස පදට්ඨානං යනාදිය කියන ලදී. ඉමානි පදට්ඨානානි දෙසනා යනුවෙන් යම් මේ කරුණු වීර්යයේ ආසන්න කරුණු යනාදී වශයෙන් වීර්යාදියේ පදට්ඨානයන් කියන ලද ද එය ආරභථ නික්කමථ ආදී දේශනාවයි. වීර්යාරම්භ වස්තු ආදිය යන අර්ථය නොවේ. එසේ ද වර්ණනා කරන ලදී.

මෙසේ බැහැර කරන ලද දේශනාවේ ආසන්න කරුණු වශයෙන් අර්ථය වෙන්කොට දක්වා දැන් එය සභාග විසභාග ධර්ම වශයෙන් පරිවර්තනය කරනු කැමැත්තේ එහි භූමිය දක්වන්නට **අයුඤ්ජනතානං වා සතතානං යොගෙ යුඤ්ජනතානං වා ආරමෙභා** යනාදිය කියන ලදී. එහි අර්ථය නම් මෙයයි. යෝගයෙහි හෙවත් භාවනාවෙහි එය නොයොදන සත්ත්වයන්ගේ හෝ මුහුකුරා නොගිය ඤාණය ඇති අයගේ හෝ වාසනා භාගීත්වයෙන් මත්තෙහි දැන්වීම පිණිස මේ දේශනාරම්භයයි. නැතහොත් (භාවනාවේ) යෙදෙන සත්ත්වයන්ගේ හෝ මුහුකුරා ගිය ඤාණය ඇති අයගේ ය.

සො පමාදො දුවිධො යනු යම් ප්‍රමාදයකින් නො යෙදීමක් වේ ද ඒ ප්‍රමාදය තමාගේ කාරණ භේදයෙන් දෙවැදෑරුම් ය. **අඤ්ඤාණෙන** යනු පංචස්කන්ධයේ ස්වලක්ෂණ සාමාන්‍ය ලක්ෂණය වසාදමන මෝහයෙනි. **නිවුතො** යනු වසන ලද යනුයි. **ඤෙය්‍යට්ඨානං** යනු ඥෙය්‍ය ද මේ රූපයයි. මේ රූපයේ හටගැන්මයි ආදි වශයෙන් ඤාණයේ පවතිනා ස්ථානය ද ඤෙය්‍යට්ඨාන නම් වේ. පාප ධර්මයන්හි නොයෙක් භේද ඇති බැවින් ඒවායේ ස්වරූප වශයෙන් නොයෙක් භේද ඇති ප්‍රමාදය මූල හේතු වූ අවිද්‍යාව ලෙසින් එකක්ම වේ යයි **එකවිධො අවිජ්ජායි** කියන ලදී. ලාභ විනිශ්චය පරිග්ගහ අවිජරියාදිය සෙවීම් රැකීම් පරිභෝග කිරීම්හි ඇතුළත් ය. ඡන්දරාගයෙහි බැසගත් තණ්හාවම තණ්හාමූලික ධර්මයෙහිම ඇතුළත්කොට **තිවිධො තණ්හාය** යන්න කියන ලදී. **රූපීසු භවෙසු** යනු රූප ධර්මයන්හි ය. **අජ්ඣොසානං** යනු තණ්හාවට බැසගැනීමයි. මෙයින් **තණ්හාය රූපකායො පදට්ඨානං** යන පදයේ අර්ථය විවරණය කරයි. කෙළවරක් නොමැති සසරේ ස්ත්‍රී පුරුෂයෝ ඔවුනොවුන්ගේ රූපය කෙරෙහි ඇලුණාහ. මේ අර්ථය ද චිත්ත පරියාදාන සූත්‍රයෙන් ප්‍රකාශ කළ යුතුය. **අරූපී සමෙමාහො** යනු ස්පර්ශාදිය ඉතා සියුම් බැවින් ද සන්තති සමූහ කිච්ච ආරම්මණ, ඝන විනිබ්භොග රූප දුෂ්කර බැවින් ද අරූප ධර්මයන්හි මුළාව වේ. සත්ත්වයන්ගේ පිහිටීමෙන්

යනු වචන ශේෂයයි. මෙසේ වෙන්කර දක්වන ලද රූපකාය නාමකාය සංඛ්‍යාත උපාදානස්කන්ධ පංචකයෙහි ආරම්මණ හේතු වශයෙන් පැවති තණ්හාව ද අවිද්‍යාව ද අවිශේෂයෙන් කියන ලදී. සතර පද වශයෙන් බෙදා දක්වා ඒ සක්න්ධයන්ගේ උපාදානයන්ගේ ද දුක් හටගැනීම් වශයෙන් දතයුතු ප්‍රභාණය කළයුතු ආකාරය **තත්‍ථ රූප කායො** යනාදියෙන් දක්වයි.

මෙසේ පමා මුඛයෙන් පළමු සත්‍ය දෙක වෙන්කොට දක්වා පමා මුඛයෙන්ම අනෙක් සත්‍ය දෙක ද වෙන්කොට දක්වන්නට **තත්‍ථ යො** යනාදිය කියන ලදී. එහි **තසස** යනු ඒ ප්‍රමාදයෙනි. **සමපටිවෙධෙන** යනු මනා දැනීමෙනි. ආශ්වාද ආදියේ දැනීමෙනි. **රකඛණා පටිසංහරණා** යනු තමාගේ සිත රැකීම් සංඛ්‍යාත ප්‍රමාදයේ වැළැක්මෙනි. ඊට ප්‍රතිපක්ෂ වූ හකුළුවාලීමෙනි. **අපපමාදානුයොගෙන යා බෙපනා, අයං සමථො** යනුවෙන් කෘත්‍ය වශයෙන් සමාධිය දක්වයි. මේ චොදාන පක්ෂ විභාග ධර්ම වශයෙන් වූ පරිවර්තනයයි. **යදා ඥානාති කාමානං** -පෙ- ආනිසංසං යන මෙයින් සමථය අවබෝධ කිරීමේ උපාය දක්වයි. එහි කාමානං යනු වස්තු කාමයන්ගේ ද ක්ලේශ කාමයන්ගේ ද යනුයි. **අසසාදඤච අසසාදතො** යනු කාමයන් නිසා උපදින සැප සොම්නස සංඛ්‍යාත ආශ්වාදය ආශ්වාදනාව ආශ්වාද මාත්‍රයෙන් ය. **ආදීනවං** යනු කාමයෝ අල්ප ආශ්වාද ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ ආදියෙන් කියන ලද ආදීනව දෝෂයයි. **නිසසරණං** යනු පළමු ධ්‍යානයයි. මෙය කියන ලදී. මෙය කාමයන්ගේ නිස්සරණයයි. එනම් නෙෂ්ක්‍රම්‍යයයි. (නික්මීමයි.) **ඔකාරං** යනු ලාමක භාවයයි. **සංකිලෙසං** යනු කෙලෙසීමයි. සත්ත්වයෝ කාම හේතුවෙන් කෙලෙසෙත්. **චොදානං** යනු පිරිසිදු වීමයි. **නෙකඛම්මෙ ආනිසංසං** යනු නීවරණ ප්‍රභාණය ආදි ගුණ විශේෂ යෝගයකි. **තත්‍ථ** යනු කියන ලද පරිදි ඒ සමථයෙහි වූ සිහියයි. **යා වීමංසා** යනු යම් ප්‍රඥාවකි. සමාහිත වූයේ ඇති සැටියෙන් දනී යයි කියන ලදී. යම්සේ තණ්හා සහිතවම අවිද්‍යාව සංස්කාරවලට හේතු වේ ද එසේ අවිද්‍යාව සහිතවම තණ්හාව උපාදානයනට ප්‍රත්‍ය වේ. ඒවා නිරුද්ධ වූ කල්හි උපාදාන ආදීන්ගේ අභාවයම වේ යැයි තණ්හා අවිද්‍යා ප්‍රභාණය කිරීමෙන් සියලු සංසාර දුක්ඛයේ නිරෝධය දක්වමින් **ඉමෙසු දවීසු ධමෙමසු පහිණෙසු** යනාදිය කියන ලදී. මේ චතුරාර්ය සත්‍ය විසභාග සභාග ධර්මවලට පරිවර්තනය වීම් වශයෙන් වෙන්කරන ලදී යන අදහසයි.

මෙසේ පාරිශුද්ධ පක්ෂය බැහැරකොට එහි විෂභාග ධර්ම වශයෙන් ද සභාග ධර්ම වශයෙන් ද පරිවර්තනය දක්වා දැන් සංකිලෙස පක්ෂය

බැහැර කොට එහි විසභාග වශයෙන් වූ ද සභාග වශයෙන් වූ ද පරිවර්තනය දක්වන්නට **යථාපි මූලෙ** යන ගාථාව කීහ. එහි අර්ථය මෙසේය. යම්සේ ප්‍රතිෂ්ඨා හේතු නොමැති නිසා මූල යනුවෙන් ලබන ලද ව්‍යවහාර ඇති භූමිගත වූ ගසක අවයවයෙක පොරවෙන් කැපීමාදී අනතුරු නොමැති බැවින් උපද්‍රව නොමැති එයින්ම දැඩි වූ ස්ථිර වූ සිදින ලද කඳක් ඇතිවිට ඇසතු ආදි ගස් පැනවේ ද මෙසේ තණ්හා අනුසය සංඛ්‍යාත ආත්මභාව නමැති ගසෙහි මූලය මාර්ග ඤාණ නමැති පොරවෙන් සිදිකල්හි ඒ මේ දුක නැවත නැවත පෙර පසු බැවින් ඇතිවේ. නිරුද්ධ නොවේ.

කාම තණ්හාදිය නවතනු පිණිස **භව තණ්හාය** යි කියන ලදී. **එතසස ධම්මසස පච්චයො** යනු භව තණ්හා සංඛ්‍යාත වූ ඒ ධර්මය හවයන්හි ආදීනව වැසීම් වශයෙන් ආශ්වාද ග්‍රහණයේ ප්‍රත්‍යය වේ. එය මෙසේ කියන ලදී. 'මහණෙනි, සංයෝජන ධර්මයන්ගෙන් ආශ්වාදය අනුව බලන්නාගේ තණ්හාව වර්ධනය වේ' යනුවෙනි. එහෙයින්ම අවිජ්ජා පච්චයා හි භවතණ්හා' යැයි කියන ලදී. මෙහිදී සමථය ද විදර්ශනාව ද මාර්ග සමාධිය ද මාර්ග ප්‍රඥාවද අදහස් කරන ලදැයි **යෙන තණ්හානුසයං සමූහනති** යනාදිය කියන ලදී. ඉමානි චත්තාරි සච්චානි යනු විසභාග සභාග ධර්මයන් පැවතීම් වශයෙන් වෙන් කරන ලදී. සෙස්ස කියන ලද ක්‍රමයෙන් ම ය.

දැන් හුදෙක් වෙන්කරන ලද විසභාග සභාග ධර්මවලින් පරිවර්තනය නොවේ. එවිට ඒ පෙළෙහි ආ දෙයින් ද වන පරිවර්තනය ආවට්ටහාරය යැයි දැක්වීමට **සබබපාපසස අකරණං** යන ගාථාව කියන ලදී. එහි **සබබපාපසස** යනු සියලු අකුසල්ය. **අකරණං** යනු නූපදවීමයි. **කුසලසස** යනු චාතුර්භූමක කුසලයයි. **උපසම්පදා** යනු ප්‍රතිලාභයයි. **සචිතත පරියොදපනං** යනු තමාගේ චිත්ත පාරිශුද්ධියයි. එය අර්හත්වයෙන් වෙයි. මෙසේ සීල සංවරයෙන් සියලු පාප ඉවත්කොට සමථ විදර්ශනාවන්ගෙන් කුසලය සම්පාදනය කොට අර්හත් ඵලයෙන් සිත පිරිසිදු කළ යුතුය. **එතං බුද්ධාන සාසනං** යනු අවවාදයයි. අනුශාසනයයි. මේ සංක්ෂේපාර්ථයයි. විස්තර වශයෙන් පෙළින්ම හැඟෙයි.

එහිදී **සබබපාපං නාම** යනාදියෙහි **දොස සමුටඨානං** යන්නෙහි දෝෂ හටගැනීම ම මෙහි ඇත්තේනුයි දොසසමුටඨාන නම් වේ. දෝෂයන් ම හටගන්නේ නොවේ. කේලාම් වචනයෙන් ලෝභ හටගැනීම ද

සම්භ වේ. කාය දුච්චරිතං යන පදය දෙස බලා දොස සමුට්ඨානං යනුවෙන් නපුංසක ලිංගයෙන් දක්වා තිබේ. ලෝභ සමුට්ඨාන මෝහ සමුට්ඨානාදියෙහි ද මේ ක්‍රමයමයි. සම්පප්‍රලාපය නොසන්සුන් සිතින් පවත්වයි යන අදහසින් එහි මෝහ සමුට්ඨානත්වය කියන ලදී.

මෙසේ මෝහ දුශ්චරිත අකුසල කර්ම පථ කර්ම විභාගයෙන් සබ්බපාපං යනුවෙන් මෙහි කියන ලද පාපය බෙදා දක්වා දැන් අකුසල මූල වශයෙන් අගතිගමන විභාගය දක්වන්නට **අකුසල මූලං** යනාදිය කියන ලදී. එහි **අකුසල මූලං පයොගං ගච්ඡන්ති** යනු ලෝභාදී අකුසල කාය වාග් ප්‍රයෝගවලට යන්නාහු කාය වාග් ප්‍රයෝග නගා සිටුවත් යන අර්ථයයි. **ඡන්දා** යනු ඡන්ද හේතුවයි. **යං ඡන්දා අගතිං ගච්ඡති ඉදං ලොභ සමුට්ඨානං** යනු ඡන්දයෙන් අගතියට යයි යන යම් මේ අගතියට යෑමක් වේ ද මෙය ලෝභ සමුට්ඨානයයි. මෙසේ සෙසු පදවල ද අර්ථය දතයුතුය. සබ්බ පාපස්ස අකරණං යන මෙපමණකින් මෙහි පාපය දක්වා දැන් එහි නූපදවීම දක්වනුයේ **ලොභො -පෙ- පඤ්ඤාය** යනුවෙන් ත්‍රිවිධ කුසල මූලයන්ගෙන් ත්‍රිවිධ අකුසල මූලයන්ගේ ප්‍රහාණ වශයෙන් සියලු පාපයන්ගේ නොකිරීම, නූපදවීම ප්‍රකාශ කරන ලදී. එසේම **ලොභො උපෙකඛාය** යනාදියෙන් බ්‍රහ්මවිහරණයන්ගෙන් (කියන ලදී) එහිදී නොඇලීම සමනය කෙරේ. මුදිතාව එහි මූලකාරණය වූ මෝහය දුරු කෙරේයයි තීරණය කොට **මොහො මුදිතාය පහාණං අබභඤං ගච්ඡති** යයි කියන ලදී.

දැන් වෙනත් අයුරකින් ද පාපය හා එහි නූපදවීම දක්වා සෙසු පදවල ද අර්ථ විභාග මුඛයෙන් වූ සභාග විසභාග ධර්මයන්ගේ ආවර්තනය දක්වන්නට **සබබපාපං නාම අට්ඨමිච්ඡත්තානි** යනාදිය කියන ලදී. **අක්‍රියා අකරණං අනජ්ඣාචාරෝ** යන පද තුනෙන් මිථ්‍යා ස්වභාවයන්ගේ නූපදවීම ම ප්‍රකාශ කරයි. එසේ ක්‍රියා කරන අජ්ඣාචාර යන පද තුනෙන් උත්පාදනය ම ප්‍රකාශ කෙරේ. **අජ්ඣාචාරෝ** යනු අධිෂ්ඨාන කොට හැසිරීමයි. **අතීතස්ස** යනු බොහෝකල් පැවතීම් වශයෙන් පැරණි වූ යනුයි. **මගගස්ස** යනු ආර්ය මාර්ගයේ ය. 'පුරාණ මාර්ගය පුරාණ අඤ්ජස යන මෙය ආර්ය අෂ්ටාංගික මාර්ගයට වෙනත් නමකි' යන මෙය කියන ලද්දේ ම ය. පෙර වැඩසිටි විපස්සි බුදුරදුන් විසින් අවබෝධ කළ පරිදි දේශනා කරන ලද බව සඳහා අතීතස්ස මග්ගස්ස යනුවෙන් කියන ලදී. මෙය භාග්‍යවත් වූ සම්මා සම්බුද්ධ වූ විපස්සි බුදුන්ගේ පාමොක් උදෙසන ගාථාවයි. **යං පට්වෙධෙන** යනු යමක

අවබෝධයෙනි. **යං පරියොදපිතං අයං නිරොධො** ඉදින් අසංඛත නිර්වාණ ධාතුව කිසිදු ක්ලේශයකින් කිලිටි නොවන්නේ ද අවබෝධය ලබන පුද්ගලයාගේ වශයෙන් මෙසේ කියන ලදී. යම්තාක් කෙලෙස් දුරු නොවේ ද ඒතාක් අසංඛත ධාතුව පිරිසිදු නොකරන ලදැයි කියනු ලැබේ. යම්සේ නිර්වාණාවබෝධයෙන් යම් ස්කන්ධ සන්සිඳුවිය යුතු ද ඒවායේ ඉතිරි බැවින් ද ඉතිරි නැති බැවින් ද සඋපාදිසේස කියා ද අනුපාදිසේස කියා ද කියනු ලැබේ. මෙසේ මේ සම්පත්තිය දතයුතුය.

පාළියෙහි ආ ධර්ම පිළිබඳව සභාග විසභාග ධර්මයන් පරිවර්තන වශයෙන් වෙන්කොට දක්වන ලද මේ චතුරාර්ය සත්‍ය නැවතත් පාළියෙහි ආ ධර්මයන්ගේ සභාග විසභාග ධර්මයන් පරිවර්තන වශයෙන් ආවට්ටන හාරය දක්වන්නට ධම්මෝ හවෙ රකඛති යන ගාථාව ප්‍රකාශ කරන ලදී. එහි පදාර්ථ මුලින්ම කියන ලද්දේය. මෙහි ධම්මෝ යන්නෙන් පුණ්‍ය ධර්මය අදහස් කරන ලදී. එය බෙදා දක්වමින් **ධම්මෝ නාම ඉන්‍ද්‍රියො ඉන්‍ද්‍රිය සංවරෝ මගෙඟා ච** යයි කියන ලදී. ඉන්‍ද්‍රිය සංවර ශීර්ෂයෙන් මෙහිදී සියලු ශීලය ගන්නා ලදැයි දතයුතුය. **සඛඛා උපපත්තියො දුගතිං** යනු දුක්ඛ දුක්ඛතා ආදී යෙදීමෙන් දුක් ඇති ගති ස්වභාව ඇතිකොට යනුයි. කියන ලද දෙවැදෑරුම් ධර්මයෙහි පළමු ධර්මය යම්සේ මනාව පුරුදු කරන ලද්දේ වෙයි ද යම්හෙයකින් එය රකී ද, යම්තැනක පිහිටුවා ද ඒ සියල්ල දක්වන්නට **තත්‍ථ යා සංවරසීලෙ අඛණ්ඩකාරිතා** යනාදිය කියන ලදී. දැන් ඒ ධර්මයේ අපායෙන් වන රක්ෂණයේ ඒකාන්තභාවය දක්වන්නට ගාමණී සංයුත්තයේ අසිබන්ධක පුත්ත සූත්‍රය ගෙනෙන ලදී. එහි එවං යනු ප්‍රකාරාර්ථයෙනි. **ච** ශබ්දය සම්පිණ්ඩනාර්ථයෙහිය. මේ ප්‍රකාරයෙන් මේ අර්ථය දතයුතු යයි යන අදහසයි.

අසිබන්ධකපුත්තෙනා යනු අසිබන්ධක නම් පුත්‍රයාය. ගමෙහි ප්‍රධානියා බැවින් **ගාමණී** නම් වේ. **පච්ඡාභූමකා** යනු පසු පෙදෙස් වාසිහුය. **කාමණ්ඩලුකා** යනු කෙණ්ඩි සහිත පුද්ගලයෝය. **සෙවාලමාලිකා** යනු උදෑසනින්ම දියෙන් දියසෙවල ද උපුල් ආදිය ද ගෙන උදක පාරිශුද්ධිය ඇති කිරීම පිණිස මාලා සාදා පළඳින්නෝය. **උදකාරොහකා** යනු උදේ හවස දියට බස්නවුන් ය. **උය්‍යාපෙනති** යනු මත්තෙහි යැපෙත් යනුයි. **සඤ්ඤාපෙනති** යනු මනාව යැපෙත් යනුයි. **සනනං නාම උගගමෙනත** යනු පිරිවරා සිටගෙන පින්වත බඹලොවට යව. බඹලොවට යවයි කියමින් ස්වර්ගයට පිවිසුවත් යනුයි. **අනුපරිසක්කෙය්‍ය** යනු අනුව යන්නේය යනුයි.

උම්මුජ්ජ යනු නැගිසිටුව යනුයි. **උපලව** යනු ජලය මත්තෙහි පාවෙව යනුයි. **ථලමුපලව** යනු ගොඩට නගුව යනුයි. **නත්‍ථ යස්‍ස** යනු එහි යමක් වන්නේ ද එයයි. **සකඛරකඨලං** යනු කැට හෝ කැබලිතිය **සා අධොගාමී අස්‍ස** යනු එය යටට යයි යනුයි. යටට යන්නේ වන්නේය. **අවං නවෙජ්ඣස්‍ස** යනු යටට යන්නේ ය යනුයි. **මග්ගස්‍ස** යනු ආර්ය මාර්ගයේ ය. **තිකඛිනා** යනු තියුණු බවයි. එය ආයුධයක් මෙන් උල් වූයේ නොවේ. එනම් ඉන්ද්‍රියයන්ගේ පටු බව දක්වන්නට **අධිමත්ත තා** යි කියන ලදී.

තමා විසින් ප්‍රහාණය **කළයුතු කෙලෙස් ඉතිරි** නැතිව සිඳ දමන්නේ නම් ආර්යමාර්ගය ඉතා **සියුම් වූයේ නොවේ** ද? මෙය සත්‍යයකි. එසේ වුවත් දිට්ඨියට පත් පුද්ගලයාට එසේ නොවේ යන වදනින් සද්ධා විමුත්ත දිට්ඨිප්පත්ත පුද්ගලයන්ගේ කෙලෙස් ප්‍රහාණය පිළිබඳ කිසියම් විශේෂ මතයක් ඇතැයි කිවහැකිය. මේ විශේෂයයි. මෙහිදී සියලු උත්පත්තීන්ගේ සමතික්‍රමණය පිළිබඳ අධිප්‍රේතත්වය අදහස් නොකරන ලදී. යම්හෙයකින් ආර්ය මාර්ගයෙන් සීමා වශයෙන් කෙලෙස් ප්‍රහීණ වෙත්. එසේ ඒවායේ ඒ ප්‍රහාණය මාර්ග ධර්මයන්හි ඉන්ද්‍රියයන්ගේ අපාටව (අදක්ෂ බව) පාටව (දක්ෂ බව) පාටවතර (ඉතා දක්ෂ බව) පාටවතම (ඉතාම දක්ෂ බව) වශයෙන් වන්නේය. දියමන්ති බඳු ධර්මයන්ගෙන් යමක් මස්තකප්‍රාප්ත වූ අග්‍ර ධර්මයන්ගේ දක්ෂතම වේ ද මෙය මෙහිදී මාර්ගයේ තියුණු බවයැයි අදහස් කරන ලදී. එහෙයින්ම **අයං ධම්මෝ සුවිණෙණා සබබාහි උපපත්තීහි රකඛති** යි කියන ලදී. තඝමා රකඛිත චිත්තඝස්‍ස යනාදි වෙනත් සූත්‍රයකින් සුගති සංඥා ඇත්තවුන්ගේ ද උප්පත්තීන්හි දුගති බව සාධනය කරයි.

දැන් කියන ලද ධර්මයේ විසභාග ධර්ම වූ තණ්හා අවිද්‍යා ආදී සභාග ධර්මයන්ගේ ද සමථ විදර්ශනා ආදියේ ද වෙන්කොට දැක්වීම් වශයෙන් ආවර්තන භාරය යොදා දක්වන්නට **තත්‍ථ දුගගති හෙතු තණ්හා ච අවිජ්ජා ච** යනාදිය කියන ලදී. එය පෙර කියන ලද ක්‍රම ඇති බැවින් මනාව දතහැකිය. **ඉදං වුච්චති බ්‍රහ්මචරියං** යනු මේ ආර්ය වූ සමථ විදර්ශනා සංඛ්‍යාත මාර්ග බ්‍රහ්ම චර්යාව යැයි කියනු ලැබේ. **යං රකඛති** යනු සියලු දුගතීන්ගෙන් රකින්නා වූ ආර්ය මාර්ගයේ අරමුණ වූ නිරෝධය රකින්නාක් මෙන් කියන ලද නිමිත්තේ කර්තෘභාවයෙන්ම සේවනය කරන ලද බැවිනි. මේ චතුරාර්ය සත්‍ය විසභාග සභාග ධර්මයන් පරිවර්තනය කිරීම් වශයෙන් වෙන්කරන ලදැයි යන අදහසයි.

ආවට්ට හාර විභංග වර්ණනාව නිමි.

11.

තසථ කතමො විහතති හාරො යනු විහතතිහාර විභංගයයි. එහිදී ධමම විහතති භූමි විහත්ති පදවිථාන විහත්ති යැයි විහත්ති ත්‍රිවිධ වේ. යම්හෙයකින් ඒවා අතරින් ධර්මයන් විභාග වශයෙන් දැක්වූ කල්හි එහිදී ලැබෙන භූමි විභාගය ද පදවිථාන විභාගය ද දක්වනු ලබන්නේ මනාව දතහැකි වෙයි. එහෙයින් පළමුව ධම්ම විහත්තිය දක්වනුයේ සොළොස් වැදෑරුම් පවිථාන යම් සූත්‍රයක් ලෙසින් විශේෂ වශයෙන් බෙදිය යුතු ද ඒ සූත්‍ර දක්වන්නට **දෙව සුතතානි වාසනාභාගියඤඤව නිබබධ භාගියඤඤව** යන්න ප්‍රකාශ කරන ලදී.

එහි වාසනාව නම් පුණ්‍ය වර්ධනයයි. එයින් භාගයක් කොටසක් වාසනා භාගයයි. එයට හිත වූයේ **වාසනාභාගිය** නම් වේ. සූත්‍රයයි. ලෝභ ස්කන්ධ ආදියේ විනිවිදයාම, පළා දැමීම නිබ්බෙධයයි. එයින් කොටසක් වූයේ නිබ්බෙධ භාගියයි. සෙස්ස පූර්වය හා සමාන ම ය. යම් සූත්‍රයක ත්‍රිවිධ පුණ්‍යක්‍රියා දෙසන ලද ද ඒ සූත්‍රය **වාසනා භාගිය** සූත්‍රයකි. මේ අර්ථය ද පාළියේම එන්නේය. **පුඤඤභාගියා** යනු පුණ්‍ය කොටසෙහි වන යනුයි. එසේම ඵලභාගිය දේ ද දතයුතුය. ඵලය යනු මහණකමේ ප්‍රතිඵලයයි. **සංවරසීලං** යනු ප්‍රාතිමෝක්ෂ සංවරය, ඤාණ සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යන සංවර පස සංවර ශීලය යනුයි. **පහාණ සීලං** යනු තදංග ප්‍රහාණය, වික්ඛම්භන ප්‍රහාණය සමුච්ඡේද ප්‍රහාණය පටිප්පස්සද්ධි ප්‍රහාණය, නිස්සරණ ප්‍රහාණය යන පස්වැදෑරුම් ප්‍රහාණයන්ය. ඒවායින් නිස්සරණ ප්‍රහාණය හැරුණු ප්‍රහාණයන්ගේ ස්වභාවයෙන් ප්‍රහාණ ශීලය දතයුතුය. **සො** යනු යමෙක් වාසනාභාගිය සූත්‍රය පිළිගන්නෙක් වේ ද ඔහුය. **තෙන බ්‍රහමචරියෙන** යනු ඒ සංවරශීල සංඛ්‍යාත වූ ශ්‍රේෂ්ඨ චර්යාවෙන් යුක්ත වූ බ්‍රහ්මචාරියෙක් වෙයි යනුයි. මෙහිදී ද අෂ්ට සමාපත්ති බ්‍රහ්මචර්යාවේ ප්‍රතික්ෂේපයක් නොමැත. ඇතැමෙක් **තෙනෙව බ්‍රහමචරියෙන** යනුවෙන් ද කියවත්. ඔවුන්ගේ මතය අනුව එහි ප්‍රතික්ෂේපයක් වන්නේය. **පහාණසීලෙ යීතො** යනු සමුච්ඡේද පටිප්පස්සද්ධි ප්‍රහාණ වශයෙන් ප්‍රහාණශීලයේ සිටියේ යනුයි. **තෙන බ්‍රහමචරියෙන** යනු ඒ ප්‍රහාණ ශීලයෙන් විශේෂිත වූ මාර්ග බ්‍රහ්මචර්යාවෙනි. යමෙක් වනාහි **තෙනෙව බ්‍රහමචරියෙන** යනුවෙන් කියවත් ද ඔවුන් **සතුව වාසනා භාගියං නාම සුතතං දාන කථා සීල කථා සග්ග කථා පුඤඤවිපාක**

කථා යන මේ පාඨයක් වේ. යමෙක් වනාහි **තෙන බ්‍රහ්මචරියෙන** යනුවෙන් කියවත් ද ඔවුන් සතුව ද **වාසනා භාගියං නාම සුත්තං දානකථා සීලකථා සග්ග කථා කාමානං ආදීනවෝ නෙක්ඛම්මෙ ආනිසංසෝ'** යන මේ පාඨයක් වේ.

එහි කවර පාඨය වඩාත් යුක්ති සහගත වේ ද? අවසන් පාඨය යැයි නිගමනය කළ යුතුය. යම්හෙයකින් **නිබ්බෙධභාගිය** සූත්‍රය චතුසත්‍ය ප්‍රකාශ කරන්නේ යැයි කියනු ලැබේ ද එහෙයිනි. මහතෙරුන් වහන්සේ ඉතිරිකොට ධර්ම දේශනා කරන්නේ නොවේ. **නත්ථි පජානාති** යනාදියෙන් සූත්‍ර දෙකේම අමිශ්‍ර හේතුව දක්වයි. එහි පජානාති යනු ආර්ය මාර්ගයේ ආසන්න කරුණ වූ නැගීසිටින සුළු විදර්ශනා ප්‍රඥාවයි. **ඉමානි චතතාරි සුත්තානි** යනු මේ සූත්‍ර හතරේ වාසනාභාගිය නිබ්බෙධභාගිය වශයෙන් ද සංකිලෙසභාගිය අසෙක්ඛභාගිය වශයෙන් ද කියනු ලබන සූත්‍ර සතරයි. **දෙසනාය** යනු දේශනා න්‍යායෙනි. **සබ්බතො විචයෙන හාරෙන විචිනිත්වා** යනු සියලු කොටසින් එකොළොස් තැනක් අතහැර විචය හාරයෙන් පිරික්සා යනුයි. **යුත්තිහාරෙන යොජෙතබ්බානි** යන මෙයින් විචය හාරය යුත්ති හාරය යන දෙක විභත්තිහාරයේ පරිකර්ම ස්ථානය දක්වයි. යාවතිකා ඤාණස්ස භූමි යන මෙයින් විභත්ති හාරයේ මහා විෂයත්වය දක්වයි.

මෙසේ වාසනාභාගිය, නිබ්බෙධ භාගිය ස්වරූපයන්ගෙන් ධර්මයන් එක් අයුරකින් බෙදා දක්වා දැන් ඒවා සංකිලෙස භාගිය අසෙක්ඛභාගිය ස්වභාවයන්ගෙන් සාධාරණ අසාධාරණ ස්වභාවයන්ගෙන් බෙදා දක්වන්නට තත්‍ර කතමෙ ධම්මා සාධාරණා යනාදිය අරඹන ලදී. එහි **කතමෙ ධම්මා** යනු කවර ස්වභාව ඇති ධර්මයෝ ද යනුයි. **සාධාරණා** යනු පොදු වූ යනුයි. සමාන යන අර්ථයයි. **දුවෙ ධම්මා** යනු ප්‍රකෘති දෙකයි. මේ ධර්ම ශබ්දය ප්‍රකෘති යන අර්ථය ඇත්තකි. **ජානි ධම්මානං සන්තානං** යනාදියේ මෙනි. **නාම සාධාරණා** යනු නාමයෙන් සාධාරණ වූ යනුයි. **කුසල අකුසල** යනු සමාන නම් ඇති යන අර්ථයයි. **වත්ථු සාධාරණා** යනු ආශ්‍රිත වස්තුවෙන් සමාන වූ යනුයි. එක පරපුරකට වැටුණු සමාන වස්තු යන අර්ථයයි. විශේෂයෙන් සංකිලෙස පක්ෂයෙහි ප්‍රහාණ වූ අර්ථ නම් සාධාරණය. එක්ව ඇති වූ වස්තු සාධාරණය. **අඤ්ඤම්පි එවං ජාතියං** යනු කටයුතු හේතු ප්‍රතිපක්ෂ ආදියෙන් සමාන වූ දේ ගනිතු ලැබේ.

මිච්ඡත්තනියතානං අනියතානං යන මෙය පෘථග්ජනයන්ගේ සලකා බැලීමකි. එහෙයින් ශාස්වතවාදය උච්ඡේදවාදය යනාදි සියල්ල පෘථග්ජන භේදය ගෙනවුත් ප්‍රකාශ කළ යුතුය. දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු කෙලෙස් සාධාරණ වන්නේ අසත්‍ය වූ ද අනියත වූ ද දේ ලැබෙන බැවින්ද සත්‍ය වූ නියත වූ දේ නොලැබෙන බැවින් දැයි මේ ක්‍රමයෙන් සෙසු පදවලද අර්ථය දතයුතුය. **අරියසාවකෝ** යන්න ශෛක්ෂයා සඳහා කියනු ලබයි. **සබ්බා සා විතරාගෙහි සාධාරණා** යනු ලෞකික සමාපත්ති රූපාවචර අරූපාවචර දිව්‍යවිහාර බ්‍රහ්මවිහාර ප්‍රථමධ්‍යාන සමාපත්ති යන මේ ආදී ක්‍රමවලින් සාධාරණ වූ යනුයි. මේ ක්‍රමයෙන් කුසල සමාපත්තිය අසාධාරණ වෙයි. මේ දෝෂය දකින සමහරු **යං කිඤ්චි** - පෙ- **සබ්බා සා අවීතරාගෙහි සාධාරණා** යි කියවත්. ඔවුහු කෙසේනම් සීමා වශයෙන් ගන්නා ලද්දාහු ද, නැවත සීමා වශයෙන් ගතයුතුද ? කෙසේ සාධාරණ වේ ද? යෙදීම සිහිකොට එය පිරිසිදු කරනුයේ **සාධාරණාහි** ධම්මා එවං **අඤ්ඤමඤ්ඤං** යනාදිය කියන ලදී. එහි අර්ථය මෙසේය. යම්සේ අසත්‍ය වූ ලෙස නියත වූ ද අනියත වූ ද දේ සාධාරණ යැයි කියන ලදද මෙසේ සාධාරණ ධර්මයෝ සියලු සත්ත්වයන්ට සාධාරණ බැවින් සාධාරණ වේ. කවර හෙයින්ද? යම් හෙයකින් එකිනෙකට අන්‍ය වූ අන්‍ය වූ ස්වකීය වූ ස්වකීය වූ විෂය නොඉක්මවත්. ඒවායේ ප්‍රවෘත්ති ස්ථානය නියතය. වෙනත් අයුරකින් එලෙස ව්‍යවහාරයක් නොවන්නේ ම ය යන අදහසයි. යම්හෙයකින් මේ ධර්මයෝ මෙසේ නියත වූ විෂය ඇත්තාහු ද එහෙයින් **යොපි ඉමෙහි ධම්මෙහි සමන්නාගතෝ න සෝ තං ධම්මං උපාතිවත්තති** යනුවෙන් ප්‍රකාශ කරන ලදී. අසත්‍ය ලෙස නියත වූ ද අනියත වූ ද දර්ශනයෙන් ප්‍රහීණ කළ යුතු කෙලෙස් නොවෙත්. අනෙකක හෝ නැතැයි මෙසේ සෙසු ඒවායේ ද කිවයුතුයි.

අසාධාරණ ධර්මය නම් ඒ ඒ පුද්ගලයාට වෙන් වෙන්ව ඇත්තේ ආර්යයන් කෙරෙහි සෙබ අසෙබ ධර්ම වශයෙන් ද අනාර්යයන් කෙරෙහි සුදුසු නුසුදුසු දේ ඉවත් කිරීම් වශයෙන් ද සෙවිය යුතුය. අනෙක් ඒවායේ නිර්දේශ කළයුතු බවක් ඇති බැවිනි. එය වනාහි සාධාරණ බවෙහි දක්ෂ බැවින් ඒ ඒ දෙය හේතුකරගෙන එසේ ප්‍රකාශ කරන ලද දේශනානුසාරයෙන් යන මේ අර්ථය **කතමෙ ධම්මා අසාධාරණා යාවදෙසනං උපාදාය ගවෙසිතබ්බා සෙක්ඛා සෙක්ඛා භබ්බාභබ්බා** යන මෙයින් දක්වාලයි. **අට්ඨමකස්ස** යනු සෝවාන්ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් පුද්ගලයාගේ යනුයි.

ධම්මතා යනු ධර්ම ස්වභාවයයි. පළමුවැන්නේ මාර්ගත්වයයි. දෙවැන්නේ ඵලත්වයයි. පළමුවැන්නේ ප්‍රහීණවන ක්ලේශත්වය හෝ දෙවැන්නේ ප්‍රහීණවන ක්ලේශත්වයයි. නැවතත් **අට්ඨමකස්ස** යනු අනාගාමී මාර්ගස්ථයාට ය. **නාමං** යනු සෙබ යන නමයි. **ධම්මතා** යනු ඒ ඒ මාර්ගස්ථ බව හා අවසන් ඵලස්ථභවයයි. **පටිපන්නකානං** යනු මාර්ගයෙන් යුක්ත පුද්ගලයන්ගේ ය. **නාමං** යනු පිළිපන් තැනැත්තා යන නමයි. මෙසේ අට්ඨමකස්ස ආදියෙන් ආර්ය පුද්ගලයාගේ අසාධාරණ ධර්මය දක්වා අනෙක් පුද්ගලයන්ගේ න්‍යාය දැක්වීමට **එවං විසෙසානුපසසිනා** යනාදිය කියන ලදී. හීනාදිභාවය ලෞකික ධර්මයන්හි ම ය. එහි **විසෙසානුපසසිනා** යනු අසාධාරණ ධර්ම දක්නා විසින් ය. අසත්‍ය ලෙස නියත වූ අනියත ධර්මයෝ සාධාරණ වෙති. අසත්‍ය ලෙස නියත දේ අතුරෙන් ද නියත මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ අනියත ධර්මයෝ සාධාරණයහ. නියත මිථ්‍යාදෘෂ්ටිය අසාධාරණය. මේ ක්‍රමයෙන් විශේසානුපස්සනාව දතයුතුය.

මෙසේ නොයෙක් නොයෙක් ක්‍රමවලින් ධම්ම විභත්තිය දක්වා දැන් භූමි විභත්තිය ද පදට්ඨාන විභත්තිය ද බෙදා දක්වන්නට **දසසන භූමි** යනු පළමු මාර්ගයයි. යම්හෙයකින් ආර්ය ශ්‍රාවකයා පළමු මාර්ග ක්ෂණයෙහි නිරවද්‍ය ස්වභාවයට බැසගන්නේ වෙයි. ඉන්පසු බැසගත්තේ වෙයි. එහෙයින් **දසසන භූමි නියාමා වකකනතියා පදටඨානං** යි කියන ලදී. කෙසේ වුවත් යටින් යටින් වූ මාර්ගය උඩින් උඩින් වූ මාර්ගය අවබෝධ කරගැනීමට හේතුවෙයි. සක්කායදිට්ඨි ආදිය දුරු නොකොට කාමරාග ව්‍යාපාද ආදිය දුරුකිරීමට නොහැකි හෙයිනි. එසේ වුවත් ආර්ය මාර්ගය තමාගේ ඵලයේ විශේෂ කාරණය ද ආසන්න කාරණය ද යනු දක්වන්නට **භාවනා භූමි උතතරිකානං ඵලානං පතතියා පදටඨානං** යි කියන ලදී. සුබ පටිපදාව වහා පැමිණෙන ලෙස අභිඤ්ඤා ඇත්තකි. එවැනි ප්‍රත්‍ය යෙදීමේදී ඤාණයට අධික දේ වන්නේ යයි එය විදර්ශනාවේ ආසන්න කාරණය යැයි කියන ලදී. ඉතිරි ප්‍රතිපදා තුන සමථය කැඳවන්නේමය. ඒවායින් සියල්ලට වඩා සියලු වූ දෙය දැක්වූ කල්හි සෙසු ඒවාද දක්වන ලද්දාහු වේමැයි. **දුකබා පටිපදා දනධාභිඤ්ඤා සමථසස පදටඨානං** යි කියන ලදී. **දානමයං පුඤ්ඤ කිරියවතථු** යන තැන දානයම දානමය නම් වේ. පුණ්‍යඵල උපදවන අර්ථයෙන් පුඤ්ඤ නම් වේ. එයම කිරීමෙන් ක්‍රියාවක් වේ. ප්‍රයෝග සම්පත්ති ආදියේ අධිෂ්ඨාන භාවයෙන් වස්තුවක් ද වූයේ දානමය පුඤ්ඤකිරිය වත්‍ථු නම් වේ. **පරතො ඝොසසස**

යනු ධර්ම ශ්‍රවණයේය. **සාධාරණං** යනු අංකුරයට බීජය මෙන් හෝ දර්ශන භූමි ආදිය මෙන් හෝ නියම ලෙස බැසගැනුම් ආදියට ආවේණික වූවක් නැත. එනම් සාධාරණ වූ වෙනත් කරුණුවලින් ද පරතොඝෝෂය පවත්නා හෙයින් යන අදහසයි. එහිදී කිසිවෙක් දායකයාට දානානුමෝදනයක් පුරුදු කරත්. දානය පරතෝ ඝෝෂයේ හේතුවයැයි කියත්. දායකයා වනාහි දක්ඛිණා විසුද්ධිය බලාපොරොත්තු වෙමින් දාන සීල ආදි ගුණ විශේෂයන්ගේ ශ්‍රවණයෙහි ඇලීම් යෙදීම් ඇතැයි දානය ධර්මශ්‍රවණයේ හේතුවයි කියන ලදී. සීල සම්පන්නයා විපිළිසර නොවීම් වශයෙන් සමාහිත වූයේ ධර්ම චින්තාවෙහි සමර්ථ වූයේ වන්නේ යැයි සීලය චින්තාමය ඤාණයේ හේතුවක් යැයි **සීලමයං** යනාදිය කියන ලදී. **භාවනාමයං** යනු සමථ සංඛ්‍යාත වූ භාවනාමය නුවණයි. **භාවනාමය** යනු මත්තෙහි ධ්‍යාන සංඛ්‍යාත වූ ද විදර්ශනා සංඛ්‍යාත වූ ද භාවනාමය ප්‍රඥාවයි. පළමු පළමු දේ පසු පසු දෙයට ආසන්න කාරණ වෙයි. දැන් යම්හෙයකින් දාන සීලය හා ලෞකික භාවනාව ද හුදෙක් කියන ලද පරතො ඝෝෂාදින්ගෙන් ම නොවේ ද එවිට පිළිවෙලින් පර්‍යාප්තිය, බහුශ්‍රැත බව කර්මස්ථානවල යෙදීම, මාර්ග, සම්මා දිට්ඨි ආදියේ හේතුව ද වෙයි. එහෙයින් න්‍යාය දක්වන්නට නැවතත් **දානමයං** යනාදියෙන් දේශනාව වර්ධනය කරයි. එසේ සුදුසු පෙදෙස්හි විසීම් ආදිය කාය විවේක චිත්ත විවේක ආදියේ හේතුව වේයයි මේ න්‍යාය දක්වන්නට **පතිරූප දෙසවාසො** යනාදිය කියන ලදී. එහි **කුසලවීමංසාය** යනු නැවත මෙනෙහි කරනු පිණිසය. **අකුසල පරිවජ්ජාගො** යන මෙයින් ප්‍රහාණ ප්‍රඥාව කියන ලදී. **සමාධින්‍ද්‍රියසස** යනු මාර්ග සමාධි ඉන්‍ද්‍රියයේය. සෙස්ස පහසුවෙන් අවබෝධ කරගත හැකිමය.

විහතති හාර විභංග වර්ණනාව නිමි.

12.

තත්‍ථ කතමො පරිවත්තනො හාරො යනු පරිවර්තන හාර විභංගයයි. එහි යම්හෙයකින් වර්ණනා කරනු ලබන සූත්‍රයෙක දක්වන ලද පරිදි කුසල අකුසල ධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ අකුසල කුසල ධර්මයන් ප්‍රහීණ කළ යුතු බැවි ආදී වශයෙන් වෙන්කිරීම ප්‍රතිපක්ෂ වශයෙන් පරිවර්තනයයි.

එහෙයින් **සම්මා දිට්ඨිසස පුරිස පුගගලසස මිචඡාදිට්ඨි නිජඡිණණා හොති** යනාදිය අරඹන ලදී. එහි මනාව පසසන ලද සුන්දර වූ දෘෂ්ටිය මෙහි ඇත්තේනුයි සම්මා දිට්ඨි නම් වේ. එහිය. ඒ සම්‍යග් දෘෂ්ටිත්වය පූර්වභාග සම්මා දිට්ඨියෙන් හෝ ලෝකෝත්තර සම්මා දිට්ඨියෙන් හෝ දතයුතුය. **මිචඡාදිට්ඨි නිජඡිණණා හොති** යනු පළමු ක්‍රමයේදී විදර්ශනා සම්මා දිට්ඨිය ප්‍රහීණ වෙයි. යටපත් කරන ලදී යන අර්ථයයි. අවසන් ක්‍රමයේදී පළමු මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් ප්‍රහීණ වූයේ මුලින් සිඳදමන ලද්දේය යන අර්ථයයි. **යෙ චසස මිචඡාදිට්ඨිපචචයා** යනු මිථ්‍යාවට බැසගැනීමට හේතු ව ආර්යයන් නොදකිනු කැමති බව ආදී ද ලෝභාදිය ද ප්‍රාණඝාතාදිය ද යන මේවායි. **අනෙකෙ** යනු ලාමකාර්ථයෙනි. **පාපකා** යනු අදක්ෂභාවය ඇතිකර වූ අර්ථයෙනි. අකුසල්දහම් උපදින්නාහ. අරඹන ලද විදර්ශනා ඇති මේ ආර්ය පුද්ගලයාගේ ද, **ධම්මා** යනු සමථ විදර්ශනාදි ධර්ම හෝ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝය. නූපන් ධර්ම උපදී. උපන් ධර්ම වර්ධනයට පරිපූර්ණත්වයට පත්වෙත්. **සම්මා සංකපපසස** යනාදියේ ද මේ ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. මේ වනාහි විශේෂයයි. සම්මා විමුක්ති ආදියේ මිච්ඡා විමුත්තිය නොමිදුනේම අපි මිදුනෙමුයි යන මෙවන් හැඟීම් ඇත්තෝ හෝ අවිමුක්තියෙහි විමුක්ත සංඥා ඇත්තෝය. මේ එහි වචනාර්ථයයි. අසත්‍ය වූ පාපී වූ විමුක්තිය හෙවත් විමොක්ෂය මෙහි ඇත්තේනුයි **මිචඡා විමුතති** නම් වේ. අංග අටකින් යුත් මිච්ඡා විමුක්තිය කියන ලද ආකාරයෙන් මිථ්‍යාභිනිවේශ වශයෙන් පැවති අන්ත දෙක පිළිබඳ ලක්ෂණයන්ය. **සම්මා විමුතතිය** වනාහි ඵලධර්මයන් ය. මිථ්‍යා දෘෂ්ටිකයින් ඇසුරුකරන බැවින් හෝ මිච්ඡා විමෝක්ෂය මිච්ඡා විමුත්ති නම් වේ.

මිචඡා විමුතති ඤාණ දසසනං වනාහි මිථ්‍යා විමොක්ෂයෙහි ද මිථ්‍යා දෘෂ්ටියෙහි ද සාරය යැයි ගැනීම් වශයෙන් පැවති අකුසල් සිත් ඉපදවීම යටපත් පිරිසෙයින් පාපයක් කොට මා විසින් මනාව කරන ලදැයි සිහිකරන්නාට උපන්නා වූ මෝහය ද වේ. **සම්මා විමුතති ඤාණදසසනසස** යන මෙහි ශෛක්ෂයන්ගේ ප්‍රත්‍යවේක්ෂණ ඤාණය සම්මා විමුත්ති ඤාණ දර්ශනය යැයි අදහස් කරන ලදී. එය වනාහි මත්තෙහි භාවනා පරිපූර්ණත්වය පිණිස පවතී. මෙසේ සම්මා දිට්ඨි ආදි ප්‍රවේශයෙන් මිථ්‍යාදෘෂ්ටි ආදිය දක්වා නැවත පාණාතිපාතා අදින්නාදානා කාමෙසු මිච්ඡාචාර ආදියෙන් වැලකීම්වලින් පාණාතිපාතාදීන්ගේ පරිවර්තනය දක්වන්නට **යසස** යනාදිය අරඹන ලදී. එහි **කාලවාදිසස** යනු ලක්ෂණ

වචනයකි. කාලයෙන් කරුණු සහිත කෙළවර ඇති අර්ථවත් වූ දෙය. එය සම්පප්‍රලාපය ප්‍රහාණය පිණිස පිළිපත්තේ යැයි කියන ලදී. නැවත **යෙ ච බො කෙචි** යනාදියෙන් සම්මා දිට්ඨි ආදි ප්‍රවේශයන්ගෙන්ම මිථ්‍යාදෘෂ්ටි ආදියෙන්ම වූ පරිවර්තනය වෙනත් ආකාරයකින් දක්වයි. එහි **සන්දිට්ඨිකා** යනු ප්‍රත්‍යක්ෂ වූ යනුයි. **සඋධම්මිකා** යනු කරුණු සහිත යනුයි. **ගාරයහා** යනු ගැරහිය යුතු යනුයි. **වාදානුවාදා** යනු වාදය ද අනුවාදය ද යන දෙකයි. **වාදානුපාතා** යැයි ද පාඨයක් වේ. වාදය අනුව පැවැතීම් යන අර්ථයයි. **පුජ්ජා** යනු පූජනීය යනුයි. **පාසංසා** යනු පැසසිය යුතු යනුයි. නැවත **යෙ ච බො කෙචි** යනාදියෙන් මධ්‍යම ප්‍රතිපදාවේ අන්ත දෙක පිළිබඳ පරිවර්තනය දක්වයි. එහි **භූඤ්ජිතබබා** යනාදී පද සතර වස්තුකාම වශයෙන් යෙදිය යුතුය. **භාවයිතබබා බහුලීකාතබබා** යන පද දෙක ක්ලේශකාම වශයෙනි. **තෙසං අධමෙමා** යනු වැඩිය යුතු ධර්ම වන්නේය යනුයි. ඒවායින් කාමයන් වැඩිය යුතුයි කැමති විය. කාමයන්ගෙන් වෙන්වීම කාමයන්ට ප්‍රතිපක්ෂ වූයේය. මෙසේ ඒවායින් මේ අධර්මයට පැමිණේ යන අදහසයි. **නියාණිකො ධමෙමා** යනු විදර්ශනාව සමග වූ ආර්ය මාර්ගයයි. **දුකෙඛා** යනුවෙන් පාපය ගෙවා දමමුයි පැවති ශරීර තාපනය කියවේ. **සුඛො** යනු නිවැරදි වූ ප්‍රත්‍ය පරිභෝග කරන සැපයයි. මේ වාරයන්හිද කියන ලද ක්‍රමයෙන්ම අධර්ම භාවයට පැමිණීම කිවයුතුයි. දැන් අසුභ සංඥා ආදි ප්‍රවේශයෙන් සුභ සංඥා ආදියේ පරිවර්තනය දක්වන්නට **යථා පන** යනාදිය කියන ලදී. අරඹන ලද විදර්ශනා ඇත්තහුගේ කෙලෙස් නමැති අශුචි වැගිරීම් වශයෙන් තෙහුමක සංස්කාරයන් අශුභ වශයෙන් එළඹ සිටී යයි තීරණය කර **සබබ සංඛාරෙසු අසුභානු පසසිනො විහරතො** යි කියන ලදී. **යං යං වා පන** යන ආදියෙන් ප්‍රතිපක්ෂ වූ දෙයෙහි ලක්ෂණ දක්වයි. එහි **අජඣාපනෙනා** යනු අධි ආපනෙනා යන පද දෙකයි. සමීපයට පැමිණියේ හාත්පසින් දත්තේ යන අර්ථයයි.

පරිවර්තන හාර විභංග වර්ණනාව නිමි.

13.

තත්‍ථ කතමො වෙවචන හාරො යනු වෙවචන හාර විභංගයයි. එහි යම්සේ වෙවචන නිර්දේශය වෙයි ද එය දක්වන්නට **එකං භගවා**

ධම්මං අඤ්ඤමඤ්ඤෙහි වෙවචනෙහි නිද්දිසති යි කියන ලදී. වෙවචනෙහි යනු පර්යාය ශබ්දයන්ගෙන් යන අර්ථයයි. පදාර්ථය මුලදී කියන ලද ම ය. භාග්‍යවතුන් වහන්සේ කවර හෙයකින් එක් ධර්මයක් නොයෙක් පර්යායන්ගෙන් දක්වන සේක් ද? කියනු ලැබේ. දේශනා කාලයෙහි ද මත්තෙහි ද කිසිවෙක්, කෙසේනම් යන අර්ථ අවබෝධය පරියාය වචනයෙන් වෙයි. එකෙණෙහි වික්ෂිප්ත වූ සිත් ඇති වෙන දෙසකට යොමු වූ සිත් ඇති අයට අන්‍ය ක්‍රමයකින් ඒ අර්ථාවබෝධය කරනු පිණිස පර්යාය වචනය යොදාගැනේ. එහිදී ඒ පදයෙන්ම ඉන් අන්‍ය වූ පදවල පුනරුක්ත අවබෝධ වන්නේය. මන්දබුද්ධිකයන්ට නැවත නැවත ඒ අර්ථ සලකුණෙහි නොමුළාවීම පිණිස පර්යාය වචන යොදා ගැනේ. නොයෙක් අර්ථ සමාන ව්‍යඤ්ජන සහිත වෙත් යන යම් අර්ථාන්තර පරිකල්පනයක් වේ ද එය දුරුකරනු පිණිස ද පර්යාය වචනය යොදා ගැනේ. නොදන්නා වචනයකදී විවිධ වූ ඒ ඒ සංඥාවන්ගෙන් ඒ ඒ අර්ථ හැඟවීම පිණිස ද පර්යාය වචන යොදාගැනේ. නිඝණ්ඩු ශාස්ත්‍රයෙහි මෙනි. පෙළ අර්ථය අවබෝධ කරගන්නා ධර්ම කථිකයන්ගේ සුඛසිද්ධිය පිණිස ද පර්යාය වචන යොදාගැනේ. හික්මවිය යුතු පුද්ගලයන්ට තමන්ගේ ධර්ම නිරුක්ති පටිසම්භිදා සම්පත් විභාවනය කරනු පිණිසත් එහි බීජ වපුරනු පිණිසත් භාග්‍යවතුන් වහන්සේ පර්යාය වචන නිර්දේශ කරන සේක. බොහෝ කොට කීමෙන් කවර ප්‍රයෝජනයක් ද? යම් ධර්ම ධාතුවක් මනාව අවබෝධ කළ හෙයින් සම්‍යක් සම්බුදුන් වහන්සේ යම්සේ සියලු අර්ථයන්හි නොවළක්වන ලද ඥාණාචාරයක් ඇත්තේ ද එසේ සියලු ශබ්ද ව්‍යවහාරයෙහි එක් අර්ථයක් ද නොයෙක් ක්‍රමයන්ගෙන් අවබෝධ කරවයි එහිදී අර්ථයේ අඥාන බවක් අඩාල බවක් ඇති නොවේ. ධර්මදේශනා හානියක් ද නොවේ. මෙය බුද්ධධර්මයේ ආවේණික දෙයකි. පර්යාය දේශනාව දක්වමින් **ආසා** යනාදිය කියන ලදී. එහි අර්ථය දක්වනුයේ **ආසානාම වුච්චති යා භවිස්සසස අත්ථස්ස** යනාදිය කියන ලදී. එහි **භවිස්සසස අත්ථස්ස** යනු අනාගතයේ කැමතිවිය යුතු අර්ථයේය. **අවසසං ආගමිස්සති** යනුවෙන් එහි පැවැත්මේ ස්වරූපය දක්වයි. අනාගත අර්ථවිෂය පිළිබඳ තණ්හාව ආශාවයි. අනාගත වර්තමාන අර්ථවිෂය පිළිබඳ තණ්හාව පිහා නම්. මේ මේවායේ විශේෂයයි. **අත්ථනිපඵත්ති පටිපාලනා** යනු යමකින් කැමති අර්ථයේ නිෂ්පත්තිය රකී ද ඉවසා ද යමකින් නිපන්නා වූ අර්ථය පාලනය කෙරේද රකී ද මෙය **අභිනඳනා** නම්. ලබන ලද පරිදි අර්ථයේ මමත්ව ග්‍රහණය නම් වේ යන අර්ථයයි. ඒ අර්ථ නිෂ්පත්තිය සත්ත්ව සංස්කාර වශයෙන් බෙදා දක්වන්නේ **පියං වා**

ඤාතිං යනාදිය කීහ. එහි ධම්මං යනු රූපාදි වූ අරමුණුය. ඉෂ්ටාරම්මණයෙහි සතුටු වෙයි. අනිෂ්ටාරම්මණයෙහි ද එය දක්වන්නට **අපපටිකූලතො වා අභිනන්දති** යි කියන ලදී. පිළිකුල් සහගත දෙයි ද විපර්යාස වශයෙන් සත්ත්වයා හෝ සංස්කාර හෝ අප්‍රතිකූල වශයෙන් සතුටු වෙයි.

තණ්හාව යම් නොයෙක් ධාතූන්හි පැවැත්මෙන් **අනෙක ධාතුසු සරා** යයි කියන ලද ද ඒ ධාතූහු විභාග වශයෙන් දක්වන්නට **චකඛුධාතු** ආදිය කියන ලදී. කෙසේ වුව ද ධාතු විභංග ආදී සූත්‍රවල කාමධාතු ආදි අනෙක් ධාතු සඳහන්ය. මෙහිදීම ඒවායේ ද එකතුව දක්වනු පිණිස අටලොස්ව දක්වන ලදී. **කෙවිරූපාධිමුත්තතා** යනාදිය ඒ ධාතූන්හි තණ්හාවේ පැවැත්ම දැක්වීමකි. එහිදී යම්හෙයකින් ආධ්‍යාත්මික ධාතු පස ද විඤ්ඤාණ ධාතු සත ද ධම්මධාතුව ද ධර්මාරම්මණයෙහිම සංග්‍රහ කරන ලද ද එහෙයින් අටලොස් ධාතු දක්වා ෂඩ්විධ තණ්හාවේ ප්‍රවෘත්ති ස්ථාන බෙදන ලදැයි දතයුතුය.

ආශාව හේතුකරගෙන දොම්නස වේ යන ප්‍රකාශයෙන් තෘෂ්ණාවට පක්ෂ වූ නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කරගත් දොම්නස් හැසිරීම් ඒවා අතර වූ විමෝක්ෂයන්හි ආශාව එළඹවමින් උපදියි. ගෙහසිත වූ දොම්නස් හැසිරීම්වලදී කවර කතා ද යනු දැක්වීමට **ඉමානි චතුවීසති පදානි** තණහා පෙකඛා යි කියන ලදී. ගෙහසිත උපේක්ෂාව නොදන්නා වූ උපේක්ෂාවට කැමති පරිදි ප්‍රවිෂ්ට වී ප්‍රත්‍ය වේ යයි **ඡ උපෙකඛා ගෙහසිතා** අයං දිටඨිපකෙඛා යනුවෙන් කියන ලදී.

දැන් ඒ සමීප හැසිරීම්වල තණ්හා පර්යාය දක්වනුයේ **සායෙව පහොනා කාරෙන ධම්මනන්දි** යනුවෙන් ප්‍රකාශ කරන ලදී. නැවත චිත්ත, පඤ්ඤා, භගවා, ධම්ම, සංඝො, සීලං, චාගො යනුවෙන් මේවායේ පර්යාය වචන වෙන් කිරීමෙන් වේවචනහාරය බෙදා දක්වන්නට **චිතතං මනො විඤඤාණනති** යනාදිය ආරම්භ කරන ලදී. එහි අන්‍ය වූ මෙවන් ජාතියකි යන මෙයින් පඤඤා, පජානන, විචය, පවිචය, ධම්මවිචය, සල්ලකඛණ, උපලකඛණ, පවවුපලකඛණ, පණ්ඩිච්ච, කොසල්ල, නෙපුඤඤ, වෙභව්‍යචිනතා, උපපරිකඛා, භූරිමෙධා, පරිනායිකා, විපසසනා, සම්පජඤඤ, පතොද පඤඤා, පඤඤින්ද්‍රිය, පඤඤාබල, පඤඤාසත්ථ, පඤඤා පාසාද, පඤඤා ආලෝක, පඤඤාඔභාස, පඤඤාපජ්ජොත, පඤඤාරතන, අමොහ යන මේ ආදී වශයෙන් පඤඤාවේ පර්යාය ශබ්ද සංග්‍රහය දතයුතුයි.

පඤ්චින්ද්‍රියානි ලොකුත්තරානි යනු බයෙ ඤාණය යනාදි ලෝකෝත්තර පංච ඉන්ද්‍රියන් ය. ලෝකෝත්තර ප්‍රඥාවේ වේවචන යන අර්ථයයි. **සබබා පඤඤා** යනු ඉතිරි වේවචනවලින් කියන ලද සියලු ප්‍රඥාව ලෞකික ලෝකෝත්තර මිශ්‍රය යන අර්ථයයි. **අපිච** යනාදියෙන් මේ ක්‍රමයෙන් වේවචන කිව යුතුයයි දක්වයි. **අධිපතෙය්‍යටෙඨන** යනු අධිමොකඛ ලක්ඛණයෙහි අධිපති අර්ථයෙනි. **යථා ච බුද්ධානුස්සතියං වුත්තං** යනු බුද්ධානුස්සති නිර්දේශයෙහි යම්සේ 'ඉතිපිසො භගවා' ආදි පාළියෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ 'මේ කරුණින් ද අරහං නම් වේ -පෙ- මේ කරුණින් ද භගවා නම් වන සේක' යනුවෙන් නොයෙක් වචනවලින් භාග්‍යවතුන් වහන්සේ සිහිකළ යුතු යැයි කියන ලදී. මේ ක්‍රමයෙන්ම බල නිෂ්පත්තියට පැමිණියේ, වෛශාරද්‍ය භාවයට පත්වූයේ යම්තාක් ධර්මාලෝකය දල්වන්නෙක් වේ ද මේ ක්‍රමයන්ගෙන් භාග්‍යවත් බුදුරදුන්ට පර්යාය වචන බුද්ධානුස්සතියේ දී කිවයුතුය යන පද ගෙනවුත් සම්බන්ධය දතයුතුයි. මේවා ද භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ වේවචන කිහිපයක්ම පමණි. භාග්‍යවතුන් වහන්සේගේ බුදුගුණ ද ගුණ නිමිති ද පිළිබඳ නාම අසංඛ්‍යය. මෙය ධම්ම සේනාපති සැරියුත් හිමියන් විසින් කියන ලදී.

> අසංඛෙය්‍යානි නාමානි සගුණෙන මහෙසිනො
> ගුණෙන නාම මුද්දෙයය්‍යං අපි නාම සහස්සතො

ගුණ සහිත වූ මහර්ෂී වූ බුදුරදුන්ගේ නාමයන් සංඛ්‍යා රහිතය. ගුණයෙන් පසසත් නම් නම් දහස් ගණනකිනි.

ධම්මානුස්සතියෙහි **අසංඛතං** යනාදියෙහි කිසි හේතුවකින් සංඛත නොවූයේ **අසංඛතයි.** මෙහි අන්තයක් විනාසයක් නැත්තේනුයි **අනන්ත** නම්. ආශ්‍රවයන් අරමුණු නොකරන හෙයින් **අනාසව** නම් වේ. නොවෙනස් වන ස්වභාව ඇති බැවින් **සච්ච** නම් වේ. සසරේ පරතෙර බැවින් **පාර** නම් වේ. නිපුණ වූ ඤාණ විෂය ඇති බැවින් ද සියුම් ස්වභාව ඇති බැවින්ද **නිපුණ** නම් වේ. නො මුහුකුරවන ලද ඤාණ සම්භාරයන්ගෙන් දැකීමට නොහැකි යන අර්ථයෙන් සුදුද්දස නම් වේ. උත්පත්ති ජරා ආදියෙන් නොමඩනා ලද හෙයින් **අජජර** නම් වේ. ස්ථිර භාවයෙන් ධ්‍රුව නම් වේ. ජරාමරණවලින් නොබිඳෙන හෙයින් **අපලොකිතං** නම් වේ. මසැසින් ද දිවැසින් ද නොදැකිය යුතු බැවින් **අනිදස්සන** නම් වේ. රාග ආදී පපඤ්චයන් නොමැතිකමින් **නිප්පපඤ්ච** නම් වේ. ක්ලේශ

අභිසංස්කරණයන් සන්සිඳුවන හෙයින් **සනත** නම් වේ. අමෘත බැවින් බිඳීමක් නොමැත්තේ **අමත** යයි. උත්තම අර්ථයෙන් ද නොතැවීම් අර්ථයෙන් ද **පණීත** නම් වේ. අයහපත් වූ කර්ම, ක්ලේශ, විපාක දුක් නොමැති නිසා **සිවං** නම් වේ. සතර යෝගවලින් උවටැරු නොමැති බැවින් **බෙමං** නම් වේ. මෙහි තණ්හාව ගෙවේනුයි **තණ්හක්ඛය** නම්. කළ පින් ඇත්තවුන් විසින් කිසිදිනෙක දැකිය යුතු බැවින් **අවජරිය** නම් වේ. පෙර නොවූ විරූ හෙයින් **අබභූත** නම් වේ. අනතුරු නැති බැවින් **අනීතික** නම් වේ. අනතුරු නැති බවට හේතුවන බැවින් **අනීතිකධම්ම** නම් වේ. නූපදිම් ස්වභාව ඇති බැවින් **අජාත** නම් වේ. එහෙයින්ම **අභූත** නම් වේ. දෙපසින්ම ඉපදීම් රහිත යැයි කියන ලද්දේ වෙයි. **කිසිවකු** විසින් උපදවා කළ නොහැකි බැවින් **අනුපඳව** නම් වේ. කිසිදු හේතුවකින් නොකරන ලද්දේනුයි **අකත** නම්. මෙහි ශෝකයක් නැත්තේ නුයි **අසෝක** නම්. ශෝක හේතු නැතිවීමෙන් **විසෝක** වේ. කිසිවකු විසින් උපදවා කළ නොහැකි බැවින් **අනුපසඟ** නම් වේ. අනුපසන්න භාවයට හේතුවන බැවින් **අනුපසඟ ධම්ම** නම් වේ. ගැඹුරු අරමුණු වන බැවින් **ගම්භීර** නනම් වේ. මනා ප්‍රතිපත්තියකින් තොරව දක්නට, පැමිණෙන්නට නොහැකි බැවින් **දුපපස්ස** නම් වේ. සියලු ලෝකය තරණය කොට සිටියේනුයි **උත්තර** නම්. මෙයට වඩා උසස් වූවක් නැත්තේනුයි **අනුත්තර** නම් වේ. සමාන වූ සදෘශ වූ දෙයක් නොමැති බැවින් **අසම** නම් වේ. සමාන වූවක් නොමැති හෙයින් **අපපටිසම** නම් වේ. උත්තම අර්ථයෙන් **ජෙටඨ** නම් වේ. පැසසීම් පමණින් හෝ **ජෙටඨ** නම්. සසර දුකෙහි ඇලුණුවන් විසින් සැඟවිය යුතු හෙයින් **ලෙණ** නම් වේ. එයින් රකින හෙයින් **තාණ** නම් වේ. පාප නැති බැවින් **අරණ** නම් වේ. කෙලෙස් නොමැති කමින් **අනංගණ** නම් වේ. දොස් නැති බැවින් **අකාම** නම් වේ. රාගාදි කෙලෙස් ඉවත් වූ හෙයින් **විමල** නම් වේ. සතර ඕඝයන්හි බැස නොගත යුතු බැවින් **දීප** නම් වේ. සසර සන්සිඳ වූ සැපයෙන් **සුඛ** නම් වේ. ප්‍රමාණකාරක කරුණු ඇති බැවින් පමාණ වේ. මෙයට ප්‍රමාණයක් ගත නොහැක යන අර්ථයෙන් **අපපමාණ** නම් වේ. සංසාර සමුද්දයේ නොගිලෙන බැවින් **පතිටඨා** නම් වේ. රාගාදි කිඤ්චන නැතිකමින් ද ග්‍රහණය කිරීමක් නැතිකමින් ද **අකිඤ්චන** නම් වේ යනුවෙන් මෙසේ අර්ථය දතයුතුය.

සංඝානුස්සතියෙහි **සන්තානං සාරෝ** යනු සීලයෙන් සරුවීම ආදී සාර ගුණයෝගයෙන් සත්ත්වයන්ගෙන් සාර බවට පත් වූ යනුයි. **සන්තානං මණ්ඩා** යනු ගව රසයෙන් ගිතෙල් මෙන් සත්ත්වයන්ගෙන් සතුටු වූ

යනුයි. සාර ගුණ වශයෙන් ම සත්ත්වයන්ගේ උඩට ගතයුතු බැවින් **සන්තානං උද්ධාරෝ** යි යෙදේ. නිශ්චල ගුණ ඇති බැවින් **සන්තානං එසිකායි** යෙදේ. ගුණ ශෝභා සුවඳින් යුත් බැවින් සත්තානං පසූනං යි යෙදේ. සුවඳමල් යන අර්ථයයි. ගුණයන් අතර උත්තමාංගය ප්‍රඥාවයි. ඒ ශෝභාවට හේතුවූ බැවින් සීලය **උත්තමං ගෝප සොභන** යැයි කියන ලදී. සීලය පරිපූර්ණ කරන්නාගේ නොපෙනෙන ගුණයක් නැතැයි **නිධානං සීලං සබ්බදොහගග සමනිකකමනටෙඨන** යි කියන ලදී. මේ අර්ථය ද ආකංඛෙය්‍ය සූත්‍රයෙන් දැක්විය යුතුය. 'මහණෙනි, සිල්වත් පුද්ගලයාගේ චේතොප්‍රණිධිය පිරිසිදු බැවින් සමෘද්ධිමත් වේ' යනුවෙන් වෙනත් දෙයක් ද කියන ලදී. **සිපපං** යනු ධනු ශිල්පයයි. **ධඤ්ඤං** යනු ධනය ලැබිය යුතු යනුයි. **ධම්ම වොලොකන තාය** යනු සමථ විදර්ශනා ආදී ධර්මයන් බැලීම් වශයෙනි. **වොලොකනටෙඨන** යනු සත්මහල් පහයක සිට මෙන් සීලයෙහි පිහිටා අභිඥා ඇසින් ලොව බලන්නට හැකියැයි කියන ලදී. චාතුර් භූමක කුසලය ද ඊට අනුව පවත්නා හෙයින් සීලය සියලු භූමියෙහි පරිවර්තනය වන සුලුය. සෙස්ස ප්‍රකටමය.

වෙවචන හාර විභංග වර්ණනාව නිමි.

14.

තත්‍ථ කතමෝ පඤ්ඤත්ති හාරෝ යනු පඤ්ඤත්ති හාර විභංගයයි. එහිදී මේ පඤ්ඤත්ති නම් කවරී ද? කියන ලදී. **යා පකති කථාය දෙසනා** යන මෙය කියන ලද්දේ වෙයි. දේශනා හාරාදිය මෙන් ආශ්වාද ආදී පදාර්ථ විශේෂ වෙන් නොකොට භාග්‍යවතුන් වහන්සේගේ ස්වාභාවික ධර්ම කථාවෙන් යුත් යම් දේශනාවක් වේ ද, එය එහි පැනවීමෙන් මේ පඤ්ඤත්තිහාරය බවට පත්වේ. යම්හෙයකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ඒ ආකාරයෙන් හික්මවනු ලබන පුද්ගලයන්ගේ සිතෙහි අභිප්‍රේතාර්ථය තබන්නේනුයි නික්ඛෙප නම් වේ. මේ හාරය දුක් සංඛ්‍යාත කොටස් ඒ ඒ ප්‍රකාරයන්ගෙන් හඟවයි. අමිශ්‍රව තබයි ද එහෙයින් ඊට **නිකෙඛපපඤ්ඤත්ති** ය යැයි කියන ලදී. මෙසේ ප්‍රකෘති කථාවේ දේශනාව යැයි සංක්ෂේපයෙන් කියන ලද අර්ථය විස්තර වශයෙන් බෙදා දක්වන්නට **කා ච පකතිකථාය දෙසනා** යි විමසා **චතතාරි සච්චානි** යනාදිය කියන ලදී.

තසෝ ඉදං දුකඛනති අයං පඤ්ඤත්ති යනු කර්කශ ස්පර්ශාදි ස්වභාව ඇති අතීත ආදී වශයෙන් බෙදුණු රූප අරූප ධර්මයන් නොබිඳ පීළන, සංඛත, සන්තාප, විපරිණාම ආදී අර්ථ සාමාන්‍යයෙන් නින්දිත බව ආදි ප්‍රවේශයන්ගෙන් එක්ව ගැනීමට හේතු වූ යම් ප්‍රඥප්තියක් වේ ද එයයි. එය කවරේ ද? නාමපඤ්ඤත්ති නිබන්ධනය හා තජ්ජා පඤ්ඤත්තියයි. අනෙක් ඒවා වෙනස් හැඳිනීම් සහිත ශබ්දමය. මේ ක්‍රමයෙන් ඒ ඒ තැන ප්‍රඥප්ති අර්ථය දතයුතුය. **පඤ්චන්නං බන්ධානං** යනාදියෙන් ඒ ප්‍රඥප්තියේ උපාදානය දක්වයි. **දසන්නං ඉන්ද්‍රියානං** යනු රූප ඉන්ද්‍රිය අට, මනින්ද්‍රිය, වෙදනා ඉන්ද්‍රිය යන මේ දහයේ ය. විත්දනය කිරීමේ සාමාන්‍යයෙන් වේදනාව එක් ඉන්ද්‍රියක් බවට පත්කරන ලදී. ශ්‍රද්ධාදිය ද ආර්ය මාර්ගයට පක්ෂ වූ දේ ද එසේමය. පිඬු කෙරේනුයි කබලීකාර නම් වේ. මේ නිර්දේශය වස්තු වශයෙනි.

යම් ඕජාවකින් සත්ත්වයෝ යැපෙත් ද මේ ඊට වෙනත් වචනයකි. එය ඕජාව අටවැනි වූ රූපය ආහරණය කරන බැවින් ආහාර නම් වේ. **අත්ථි** යනු මාර්ගයෙන් නොසිදි බැවින් විද්‍යමාන වේ යනුයි. **රාගො** යනු රඤ්ජනාර්ථයෙන් රාග නම් වේ. නන්දනාර්ථයෙන් **නන්දි** නම් වේ. ආශා කිරීම් අර්ථයෙන් තණ්හා නම් වේ. මේ සියල්ල ලෝභයට ම යෙදෙන නාමයන් ය. **පතිට්ඨිතං තත්‍ථ විඤ්ඤාණං විරූළ්හං** යනු කර්මය දුවවා ප්‍රතිසන්ධිය ඇදගැනීමට සමත් බැවින් පිහිටියා වූ ද වර්ධනය වූ ද විඤ්ඤාණයයි. **යත්‍ථ** යනු තෙහුමක සසරෙහි භූමියයි. සියලු තැන හෝ පළමු පළමු පදයෙහි හෝ මේ භූමිය වේ. **අත්ථි තත්‍ථ සංඛාරානං වුඩ්ඪි** යන්න මේ විපාක සසරෙහි පිහිටි මත්තෙහි වැඩීමට කරුණු වන යම් සංස්කාර වේ ද ඒවා සඳහා කියන ලදී. **යත්‍ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්තනි** යනු යම්තැනක මත්තෙහි පුනර්භවයේ පහළවීමක් වේ ද එයයි. **අත්ථි තත්‍ථ ආයතිං ජරාමරණං** යනු යම්තැනක පිළිසිඳ ගැනීම වේද එතැන ස්කන්ධයන්ගේ පහළවීම් සංඛ්‍යාත උපත ද මේරීම් ලක්ෂණ ඇති ජරාව ද බිඳීම් ලක්ෂණ ඇති මරණය ද වේ යනුයි. **අයං පභව පඤ්ඤත්තනි දුකඛස්ස ච සමුදයස්ස ච** යනු කියන ලද පරිදි මේ දේශනාව දුක්ඛ සත්‍යයේ ද සමුදය සත්‍යයේ ද සමුට්ඨාන පඤ්ඤත්තිය වේ යනුයි. තණ්හා හේතුව දක්වන ලද බැවින් විපාකවට්ටයෙහි වූ සංස්කාරයන්ගේ ද සමුට්ඨාන පුඤ්ඤත්තිය වේ යන අදහසයි. **නත්‍ථි රාගො** යනු ශ්‍රේෂ්ඨ වූ මාර්ග භාවනාවෙන් මුලින්ම සිඳ දමන ලද බැවින් රාගය නැත යනුයි. **අපපතිට්ඨිතං තත්‍ථ විඤ්ඤාණං අවිරූළ්හං** යනු කර්මය දුව වා ප්‍රතිසන්ධිය

ඇදගැනීමට සමත්කමක් නැති බැවින් අප්පතිට්ඨිත වූයේ ද අවිරුළ්හ වූයේ ද කියන ලද ප්‍රතිපක්ෂ න්‍යායෙන් අර්ථය දතයුතුය යනුයි. **අයං පරිඤ්ඤා පඤ්ඤත්ති** යනාදියෙන් එක්වන් අවබෝධය වශයෙන්ම මාර්ග සම්මා දිට්ඨිය චතුරාර්ය සත්‍යයෙහි පවතී යැයි දක්වයි. **අයං භාවනා පඤ්ඤත්ති** යනු සදොර පවත්නා ධර්මයන්ගේ ද්වාර පිළිබඳ අරමුණුවලින් ආර්ය මාර්ගය ගැන අනිත්‍ය ලෙස දැකීම භාවනා පඤ්ඤත්තිය වේ යනුයි. **නිරොධ පඤ්ඤත්ති නිරොධසස** යනු රෝධ සංඛ්‍යාත තණ්හාව ආර්ය මාර්ගයෙන් ඉතිරි නොකර නිරුද්ධ කරන නිරෝධ පඤ්ඤත්තියයි. **උපපාද පඤ්ඤත්ති** යනු ඇති වූ දෙය දක්වාලීමයි. **ඔකාස පඤ්ඤත්ති** යනු ස්ථානය දක්වාලීමයි. **ආහමනාපඤ්ඤත්ති** යනු ඉවත් කිරීමේ ප්‍රඥප්තියයි. **ආසාටිකානං** යන තැන ගවයන්ගේ වණවල නිලමැස්සන් විසින් වසන ලද තැන ආසාටිකා නම් වේ. මෙහිදී යමකු තුළ මෙය ඇතිවී ද ඒ සත්ත්වයාගේ විනාශයට හේතුවන බැවින් අසාටිකයක් මෙන් වේ යන අර්ථයෙන් අසාටික නම් වේ. එනම් කෙලෙස් ය. ඒ කෙලෙස්වල ය. **අභිනිසාත පඤ්ඤත්ති** යනු මුලිනුපුටා දැමීමේ ප්‍රඥප්තියයි.

මෙසේ සසර හා නිවන යන ප්‍රවේශයන්ගෙන් උපාදානස්කන්ධ ස්පර්ශ කිරීම් මුඛයෙන් සත්‍යයන්හි ප්‍රඥප්ති විභාගය දක්වා දැන් ත්‍රිපරිවෘත්ත වශයෙන් දක්වන්නට **ඉදං දුකඛනති** මෙ **හිකඛවෙ** යනාදිය අරඹන ලදී. එහි දර්ශනාර්ථයෙන් **චකඛු** නම් වේ. පවත්නා ස්වභාවය දැනීම් අර්ථයෙන් **ඤාණ** නම් වේ. විනිවිද යෑම් අර්ථයෙන් පඤ්ඤා නම් වේ. අවබෝධ කිරීම් අර්ථයෙන් **විජජා** නම් වේ. බැබළීම් අර්ථයෙන් **ආලෝක** නම් වේ. සියල්ල ප්‍රඥාවේ පර්යාය පද ම ය. මේ වෙවචන පඤ්ඤත්තියයි. **සචඡිකිරිය පඤ්ඤත්ති** ප්‍රත්‍යක්ෂ කරන ප්‍රඥප්තියයි.

තුලමතුලඤ්ච යන ගාථාවේ බොහෝ ජනයාට ප්‍රත්‍යක්ෂ බැවින් සමානය **පිරිසිදිණි** යන අර්ථයෙන් **තුල** නම් වේ. කාමාවචර සිතයි. සම නොවේ නුයි අතුල නම්. මීට සමාන වූ සදෘශ වූ වෙනත් ලෞකික ක්‍රියාවක් නැත්තේ නුයි අතුල නම්. මහග්ගත කර්මයයි. නැතහොත් කාමාවචර, රූපාවචර කර්මය තුල නම් වේ. අරූපාවචර කර්මය අතුල නම් වේ. ස්වල්ප වූ විපාක ඇති කර්මය තුල නම් වේ. බොහෝ විපාක ඇති කර්මය අතුල නම් වේ. මෙයින් ලැබෙනුයි සම්භව නම් වේ. ඇතිවීමට හේතුවූ යනුයි. **භව සංඛාර** යනු පුනර්භවය සකස් කරන දේය. **අවසසජී** යනු අත්හළේය යනුයි. **මුනි** යනු බුද්ධ මුනීන්ද්‍රයන් ය.

අජ්ඣත්තරතෝ යනු නියතව ඇතුළත ඇලුණු යනුයි. **සමාහිතෝ** යනු උපචාර අර්පණා සමාධි වශයෙන් එකඟ වූ යනුයි. **අභිදා කවචමිව** යනු සන්නාහයක් මෙන් බින්දේය යනුයි. **අතතසමභවං** යනු තමා තුළ ඇතිවූ කෙලෙස් ය. මෙය කියන ලද්දේ වෙයි. විපාක සහිත යන අර්ථයෙන් හටගත් භවය සකස් කරන අර්ථයෙන් භව සංඛාරයයි ලබන ලද නම් ඇති තුල අතුල සංඛ්‍යාත වූ ලෞකික කර්මය ද අත්හළේය. යුධ පෙරමුණෙහි මහා යෝධයෙක් සන්නාහයක් පලන්නාක් මෙන් තමා තුළ හටගත් කෙළෙස් ද අධ්‍යාත්මයෙහි ඇලුණේ සමාහිත වී පලාදැම්මේය යනුවෙනි.

එසේ නැතහොත් **තුලං** යනු සම කරනුයේ, තීරණය කරනුයේ යනුයි. අතුල වූ දෙය ද නිවන ද සම්භවය ද හමුවෙත්. භව සංඛාරං යනු භවගාමී කර්මයයි. අවස්සජි මුනි යනු පංචස්කන්ධ අනිත්‍යය. ඒවායේ නිරෝධය වූ නිවන නිත්‍යයය ආදී ක්‍රමයෙන් තුලනය කරමින් බුද්ධ මුනින්දයන් වහන්සේ භවයේ ආදීනව ද නිවනේ ආනිසංස ද දැක ස්කන්ධයන්ගේ මුල වූ ඒ භව සංස්කාරය කර්මක්ෂය කිරීමෙන් ආර්ය මාර්ගයෙන් දුරුකළේය. කෙසේ ද? අධ්‍යාත්මයේ ඇලීමෙනි. හෙතෙම වනාහි විදර්ශනා වශයෙන් අධ්‍යාත්මයේ ඇලුනේ සමථ වශයෙන් සමාහිත වූයේ සන්නාහයක් මෙන් ආත්මභාවය හාත්පස වසාගෙන සිටි තමා තුළ හටගත් බැවින් අත්තසම්භව යනුවෙන් ලබන ලද නම් ඇති සියලු කෙලෙස් සමූහය බිඳ දැමුවේය. කෙලෙස් නැතිකමින් කර්මය සම්බන්ධතා නැති වූවක් බැවින් අවස්සට්ඨ නම් වේ. කෙලෙස් නැති නිසා කර්මය අත්හළේය යන අර්ථයයි. සංඛත අසංඛත ධාතුවලින් තොර වූ දතයුතු දෙයක් නැති බැවින් **තුල** -පෙ- **ධම්මානං** යයි කියන ලදී. එහෙයින් ධම්මපටිසම්භිදාව කියන ලද්දේ වනැයි **නිකෙබප පඤඤනති** ධම්මපටිසම්භිදාය යි කියන ලදී. භව සංස්කාරයන් පිළිබඳ සමුදය පක්‍ෂය සඳහා **පරිවවාග පඤඤනති** යයි කියන ලදී. දුක්ඛ සත්‍ය පක්‍ෂයේ වශයෙන් **පරිඤඤා පඤඤනති** යයි කියන ලදී. සමව පිහිටුවීමෙන් විශිෂ්ට වූ අධ්‍යාත්මයේ ඇලීම් වශයෙන් **භාවනාපඤඤනති කායගතාසතියා** යි කියන ලදී. අධ්‍යාත්මයේ ඇලීම් වශයෙන් විශිෂ්ට වූ සමාධානය ලෙසින් **ඨිති පඤඤනති චිතතෙකගගතාය** යැයි කියන ලදැයි දතයුතුය. **අභිනිබබිදා පඤඤනති චිතතසස** යනු ආයු සංස්කාරය අත්හැරීම් වශයෙන් සිතෙන් බැහැර කිරීමේ ප්‍රඥප්ති යයි. **උපාදාන පඤඤනති** යනු ග්‍රහණය කිරීමේ ප්‍රඥප්ති යයි. **සබබඤඤතාය** යනු සම්මා සම්බුදු බවට ය. මෙයින් සම්මා

සම්බුදු නොවන අයට ආයු සංස්කාර හරණයක් නැතැයි දක්වයි. ක්ලේශයන් නැති නිසා භාග්‍යවතුන් වහන්සේ කර්මය දුරු කෙරේ යයි දක්වමින් **පදාලනා පඤ්ඤත්ති අවිජ්ජණ්ඩකොසානං** යි කියන ලදී.

යො දුකබමදදකබ් යතො නිදානං යනු යමෙක් අරඹන ලද විදර්ශනාව ඇත්තේ ද ඔහු සියලු තෙත්හුමක දුක දුටුවේය. දැක්කේය යනුයි. එය ද යතො නිදානං = යම් හේතුවකින්ය. ඒ හේතුව නොමැතිකමින් තණ්හාව දුටුවේය යනුයි. **කාමෙසු සො ජනතු තථා නමෙය්‍ය** ය මෙසේ පිළිපන් ඒ පුරුෂයා වස්තුකාම සහිත ක්ලේශ කාමයන් කෙරෙහි යම් ආකාරයකින් නැමෙන්නේ ද වෙසෙසින් නැමෙන්නේ ද ඒ ආකාරයක් නැත. කවර හෙයින් ද? ලෝකයේ කාමයෝ ඇලීම් යැයි දැන සිටින හෙයිනි. යම්හෙයකින් මේ ලෝකයේ කාමය හා ස්ථාන බන්ධනයක් නැත. භාග්‍යවතුන් වහන්සේ විසින් 'න තං දළහං බන්ධනමාහු ධීරා'යි එය වදාරන ලදී. එහෙයින් ගැටීම් අර්ථයෙන් සංස්කාරයන් සංගයන් යැයි දැනගෙන (යනුයි.)

තෙසං සතිමා විනෙය්‍ය සිකෙබ යනු කායගතා සතියේ යෙදීමෙන් සිහි ඇත්තේ ඒ කාමයන් සන්සිඳුවීම පිණිස ත්‍රිවිධ ශික්ෂාවන්හි අප්‍රමාදීව හික්මෙන්නේ ය යන අර්ථයයි. **වෙවචන පඤ්ඤත්ති** යනු ස්කන්ධ ආදියේ පර්යාය වචන ප්‍රඥප්තියයි. අද්දක්බ් යන පදයෙන් **දුකබසස පරිඤ්ඤා පඤ්ඤත්ති ච** යන සම්බන්ධතාවය කියන ලදී. **පචචත්තිකතො දසසන පඤ්ඤත්ති** යන අර්ථ ඇතිකරන හෙයින් ප්‍රයෝජනයට ප්‍රතිවිරුද්ධත්වයෙන් දස්සන පඤ්ඤත්තිය යනුයි. **පාවක කපපා** යනු දැල්වෙන ගිනිකඳන් හා සමාන වූ යනුයි. **පපාත උරගුපමා** යනු ප්‍රපාත උපමාව හා උරග උපමාවයි.

මොහසමබන්ධනො ලොකො යනු මේ ලෝකය අවිද්‍යාවට හේතු වූ සංයෝජනවලින් බැඳුණේය යනුයි. **භබබරූපොව දිසසති** යනු සදොස් අදහස් ඇති නමුත් මායාවෙන් ද කපටිකමින් ද වැසුණු ස්වභාව ඇත්තේ සුදුස්සෙකු මෙන් තමා දක්වයි යනුයි. **උපධි සමබන්ධනො බාලො තමසා පරිවාරිතො** යනු ඒ බාලයා එසේ දැකීමෙහි මෝහාන්ධකාරයෙන් පිරිවරන ලද බැවින් කාමගුණයන්හි ආදීනව නොවන දේ දැක්වීම පිණිස ක්ලේශාභි සංස්කාරයන්ගෙන් බඳනා ලද බැවින් යනුයි. එසේ වූ මේ බාලයා පණ්ඩිතයන්ට කාලකණ්ණියක මෙන් වැටහෙයි. අභාග්‍ය සම්පන්නයෙක් වී උපස්ථාන කරයි. ඒ මේ සියල්ල බාලයෙක්ව රාගාදි කිඤ්චන සහිත

බැවිනි. පණ්ඩිතයා පිළිබඳව වනාහි ප්‍රඥා ඇසින් දක්නාට කිඤ්චන නැත යන මේ සංක්ෂේපාර්ථයයි. මෝහ ශීර්ෂයෙන් විපර්යාසයන් ගන්නා ලද්දේය යන අර්ථයෙන් **දෙසනා පඤ්ඤත්ති විපල්ලාසානං** යයි කියන ලදී. **විපරීත පඤ්ඤත්ති** යනු විපරීත ආකාරයෙන් උවටැන් කරන්නහු පිළිබඳ පැනවීමයි.

නිර්වාණය ඇත යන ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ වදන වස්තු මාත්‍රයක් ම ය. පරමාර්ථ වශයෙන් නොලැබෙන ස්වභාව ඇති බැවින් නිවන නැත යන වැරදි ලෙස ගත්තවුන්ගේ මිථ්‍යාවාදය බිඳ දමන්නට භාග්‍යවතුන් වහන්සේ විසින් **'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං** යනුවෙන් වදාරන ලදී. එහි හේතුව දක්වන්නට **නො වෙ තං භික්ඛවෙ** යනාදිය ප්‍රකාශ කරන ලදී. එහි අර්ථය මෙයයි. 'මහණෙනි, ඉදින් අසංඛත ධාතුව නොවන්නේ නම් මේ ලෝකයේ සියලු සංඛතයන්ගේ නිෂ්ක්‍රමණය වන්නේය. නිවන අරමුණු කොට පවත්නා සම්මා දිට්ඨි ආදි මාර්ග ධර්ම කෙලෙස් ඉතිරි නැතිව මුලිනුපුටා දමත්. එයින් ත්‍රිවිධ සසර නොපවතී. මේ එහි අදහසයි. යම්සේ අවබෝධ කටයුතු බැවින් උසස් වූ කාමයන්ට ද රූපයන්ට ද ප්‍රතිපක්ෂ වූ ඊට විරුද්ධ ස්වභාව ඇති නිස්සරණය ප්‍රකට වේ. මෙසේ එවන් ස්වභාව ඇති නිස්සරණයෙන් එය විය යුතුය. ඒ නිස්සරණය යමක්ද එය අසංඛත ධාතුවයි. වැඩිදෙය කුමක් ද? සංඛත ධර්මයන්ගේ අරමුණ වූ විපස්සනා ඤාණයයි. තව ද අනුලෝම ඤාණය කෙලෙස් මුලිනුපුටා දැමීම් වශයෙන් අත්හරින්නට නොහැකිය. සම්මුති සත්‍යයේ අරමුණ ද ප්‍රථමධ්‍යාන ආදියේ ඤාණ වූ වික්ඛම්භන මාත්‍රය ම ඇති කෙරේ. කෙලෙස්වල මුලිනුපුටා දැමීමක් නොවේ ද සමුච්ඡේද ප්‍රහාණය ඇතිකරන ආර්යමාර්ග ඤාණය ඒ සංඛත ධර්ම සම්මුති සත්‍යයට වෙනස් වූ අරමුණෙන් ඇතිවිය යුතුයි. එය අසංඛත ධාතුවයි. එසේම නිබ්බාණ ශබ්දය කිසියම් විෂයකදී නොවෙනස් අර්ථ ඇතිව වටහාගත යුතුයි. සිහ ශබ්දය උපචාර වුත්ති සද්භාවයෙනි. එසේ නැතහොත් 'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං' යන වචනය නොවෙනස් අර්ථ ඇත්තකි. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද බැවිනි. භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් වදාරන ලද ද එය නොවෙනස් අර්ථ ඇත්තේය. උදාහරණ මෙසේය. 'සබ්බෙ සංඛාරා අනිච්චා. සබ්බෙ සංඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා' යනුයි. මෙසේ ද යුක්ති වශයෙන් අසංඛත ධාතුවේ පරමාර්ථ වශයෙන් ස්වභාවය දතයුතුය. මේ යුක්ති චින්තාවෙන් කවර ප්‍රයෝජනයක් ද? භාග්‍යවතුන් වහන්සේ විසින් 'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං' කියා ද 'අපපච්චයා ධම්මා, අසංඛතා ධම්මා'

කියා ද 'අසංඛතඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිසසාමි අසංඛත ගාමී පටිදං' කියා ද මේ ආදියෙන් ද නොයෙක් සූත්‍ර පදයන්ගෙන් ද පරමාර්ථ වශයෙන් නිර්වාණ ධාතුවේ ස්වභාවය දේශනා කරන ලදී. එහි **උපනයන පඤ්ඤත්ති** යනු ප්‍රතිපක්ෂයට හේතු එළවන්නහුගේ ගෙනහැරපෑමයි. **ඡොතනා පඤ්ඤත්ති** යනු පොරොන්දු වූ අර්ථ සිද්ධිය ප්‍රකාශ කරන ප්‍රඥප්තියයි. සෙසු සියල්ල මනාව දතයුතුය.

පඤ්ඤත්ති හාර විභංග වර්ණනාව නිමි.

15.

තත්‍ථ කතමො ඔතරණො හාරො යනු ඔතරණ හාර විභංගයයි. එහි **අසෙකඛා විමුත්ති** යන මෙය ත්‍රෛධාතුක සසරෙහි වීතරාගීත්වය වූ අශෛක්ෂ ඵල විමුක්තියයි. **තානි යෙව** යනු අශෛක්ෂ විමුක්තියෙහි ඒ ශ්‍රද්ධාදියයි. **අයං ඉන්ද්‍රියෙහි ඔතරණා** යනු අශෛක්ෂ විමුක්තියෙන් වෙන් කරන ලද ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් කරණ කොටගෙන සංවර්ණනයට බැසගැනීමයි. **පඤ්චින්ද්‍රියානි විඡා** යනු සම්මා සංකප්පය සම්මා දිට්ඨියට උපකාරක පවත්නාක් මෙන්, පඤ්චස්කන්ධය පිළිබඳ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය විද්‍යාවට උපකාරක බැවින් සංග්‍රහ කිරීම වශයෙන් කියන ලදී යනුයි. **සංඛාරා පරියාපනනානි** යනු පඤ්ච ස්කන්ධයන් සංස්කාර ස්කන්ධයෙහි ඇතුළත්ය යනුයි. **යෙ සංඛාරා අනාසවා** යන්නෙන් අග්‍රඵලය අදහස් කරන ලද බැවින් ඒ සංස්කාර ස්කන්ධය වෙසෙසයි. එහෙයින් ම භවංගයෝ නොවෙත්.

ධම්ම ධාතු සංගහීතා යනු අටළොස් ධාතූන්ගෙන් ධම්ම ධාතුව සංග්‍රහ කරන ලදී යනුයි. පෙර වීතරාගී යම් අශෛක්ෂ විමුක්තියක් දක්වන ලද ද එහි ප්‍රතිපත්ති දක්වනු පිණිස මේ මම වෙමි, නොඋකින්නා වෙමි යන දර්ශන මාර්ගය මෙහි කියන ලදී යන මේ අර්ථය දක්වන්නට **අය මහමසමි අනානුපසසි** යනාදිය කියන ලදී. සියල්ල කියන ලද ක්‍රමයෙන් ම ය.

නිසසිතසස චලිතං යනු තණ්හා දෘෂ්ටි වශයෙන් එක් අරමුණක නොපිහිටි කර්මයයි. **චුතුපපාතො** යනු පහළ වීම යන අර්ථ ඇති අන්‍ය

වචනයකි. නිශ්‍රිත පදයෙහි ලැබෙන නිශ්‍රය පදය උපුටමින් **නිසසයො නාම යි** කියන ලදී. **තණහා නිසසයො** යනු තණ්හාවට බැසගැනීමයි. එය තණ්හා චරිතයාට ප්‍රතිඡ්‍යා බැවින් එසේ කියන ලදී. මෙසේ **දිටඨිනිසසය** ද දතයුතුය. **රතනසස චෙතනා** යනු චේතනා ප්‍රධාන බැවින් සංස්කාරස්කන්ධ ධර්මයන් චේතනා ශීර්ෂයෙන් තණ්හාවම කියයි යනුයි. එහෙයින්ම **අයං තණහා නිසසයො** යයි කියන ලදී. යම්හෙයකින් වෙනස් වූ ප්‍රවේශය මෝහය බලවත් කල්හිම වෙයි ද එහෙයින් **සා සම්මූළහසස චෙතනා අයං දිටඨි නිසසයො** යි කියන ලදී.

මෙසේ චේතනා ශීර්ෂයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් ප්‍රකාශ කොට දැන් එහිදී නිෂ්පරියාය දේශනයෙන් චේතනාවම ගනිමින් **චෙතනා පන සංඛාරා** යි කියන ලදී. **යා රතනසස වෙදනා අයං සුඛා වෙදනා** යනු සුඛ වේදනාවෙන් රාගය යටපත් වේ යයි තීරණය කොට කියන ලදී යනුයි. එසේම අදුකඛමසුඛ වේදනාවෙන් අවිද්‍යාව යටපත් වේයයි (සිතා) **යා සම්මූළහසස වෙදනා අයං අදුකඛමසුඛා වෙදනා** යයි කියන ලදී. මෙහිදී වේදනා ශීර්ෂයෙන් චේතනාව ප්‍රකාශ කරන ලදී. **තණහාය** යනු තණ්හං යනුයි. **දිටඨියා** යනු දිටඨිං යනුයි. යම්සේ සෙසු කරුණුවලදී තණ්හාව නිස්සය ලෙසින් ඇතිවිට පුද්ගලයා තණ්හාවේ නිස්සිත යැයි කියනු ලැබේ. මෙසේ තණ්හාව සෙසු කරුණුවලට හේතු වශයෙන් ඇතිවිට පුද්ගලයා තණ්හාවේ නිස්සිතයා යැයි කියනු ලැබෙනුයි **තණහාය අනිසසිතො** යි කියන ලදී. **පසසදධි** යනු කරදර සන්සිඳුවීමයි. **කායිකා** යනු කරජකය ඇසුරු කළ දේ ය. **චෙතසිකා** යනු සිත ඇසුරු කළ දේය. යම්හෙයකින් ඒ කරදර සන්සිඳුවීම කායචිත්තයන්ගේ සැපය ඇතිවිට ප්‍රකට වේ ද එහෙයින් යම් කායික සැපයක් ආදි ලෙසින් වූ එලූපචාරයෙන් කියන ලද පස්සද්ධියේ නැමීමක් නොමැතිකමින් හේතුව දක්වන්නට **පසසදධකායො** යනාදිය කියන ලදී. **සො** යනු මෙසේ මිදුණු සිත් ඇති ක්ෂීණාශ්‍රවයා ය. **රූපසංඛයෙ විමුතතො** යනු රූපයන්ගේ ගෙවීම් සංඛ්‍යාත නිවනෙහි මිදුණු යනුයි. **අත්ථිතිපි න උපෙති** යනු ලෝකය ද ආත්මය ද ශාස්වතය යනුවෙන් තණ්හා දිටඨි උපායයන්ගෙන් යුක්ත නොවේ. නොගනී යනුයි. **නත්ථි** යනු අශාස්වතය යනුයි. **අත්ථි නත්ථි** යනු එක්විටෙක ශාස්වතය එක්විටෙක අශාස්තවතය යනුයි. **නෙවත්ථි නො නත්ථි** යනු අමරා වික්ෂෙප වාද වශයෙනි. **ගමහීරො** යනු නැගී සිටීමට හේතුවන කෙලෙස් නැතිකමින් ගැඹුරු වූ යනුයි. **නිබබුතො** යනු ඇත යනාදි උපගමන ක්ලේශයන් සන්සිඳුවීමෙන් පිරිනිවියේ සිසිල්වූයේ යනුයි. **ඉධාගති**

යනු පරලොවින් මෙහි පැමිණි යනුයි. **ගති** යනු මෙලොවින් පරලොව යෑමයි. එය වනාහි පුනර්භවය යැයි සලකා **පෙච්චභවෝ** යි කියන ලදී. **ඉධ හුරං** යනුවෙන් දොරටු පිළිබඳ අරමුණු දක්වන ලදී. උභයමනතරෙන යන පදයෙන් දොරටුවල පැවති ධර්මයන් දක්වමින් **එසස සමුදිතෙසු ධම්මෙසු** යි කියන ලදී. එහි අර්ථය නම් හේතු වූ ස්පර්ශය සමග විඤ්ඤාණ වේදනා සංඥා චේතනා විතර්ක විචාර ආදී ධර්මයන් ඇතිවූ කල්හි හටගත් කල්හි යනුයි.

අතනානං න පසසති යනු ඒ ධර්මයන් පිළිබඳ අනාත්ම භාවය ඇතිකල්හි එහි ආත්මය නොදකී ම ය. නොඇලෙයි. 'විරාගා විමුච්චති' යන පදයන්ගෙන් ලෝකෝත්තර ධර්මයන්ගේ ප්‍රතීත්‍ය සමුත්පන්න භාවය දක්වමින් ඒ සඳහා සීලාදි ක්‍රමයෙන් ද එහි ස්වභාවය **ලොකුතතරෝ** යනාදියෙන් ප්‍රකාශ කරන ලදී. **නාම සම්පයුත්තෙතා** යනු නාමයෙන් මිශ්‍ර වූ යනුයි. **සඋපාදිසෙසා නිබ්බාණ ධාතු** යනුවෙන් අර්හත්ඵලය අදහස් කරන ලදී. එයද ප්‍රඥා ප්‍රධානයැයි (දක්වමින්) **සඋපදිසෙසා නිබ්බාණ ධාතුවිඥා** යි කියන ලදී. සෙසු සියල්ල ප්‍රකටමය.

ඔතරණ හාර විභංග වර්ණනාව නිමියේය.

16.

තත්‍ථ කතමෝ සොධනෝ හාරෝ යනු සොධන හාර විභංගයයි. එහි **භගවා පදං සොධෙති** යනු අවිද්‍යාවෙන් ලෝකය වසන ලද්දේය යනාදිය ප්‍රකාශ කරමින් භාග්‍යවතුන් වහන්සේ 'කවරකින් ලෝකය වසන ලද්දේ වේ ද? යනුවෙන් ආයුෂ්මත් අජිත විසින් ප්‍රශ්න වශයෙන් කියන ලද පදය ශෝධනය කෙරේ යනුයි. ඒ අර්ථය විසඳීම වශයෙනි. **නෝ ච ආරම්භං** යනු පළමුව ආරම්භය ශෝධනය නො කෙරේ යනුයි. දැනගත්නට කැමති වූ අර්ථය ඇසුරු නොකළ බැවිනි. **සුදෙධා ආරමෙභා** යනු දැනගන්නට කැමති වූ අර්ථය ප්‍රබෝධ කරන ලද බැවින් ශෝධනය කරන ලද ආරම්භය යන අර්ථයයි. අඥාන පක්‍ෂයෙහි වූවන්ගේ හෝ සැක ඇත්තවුන්ගේ හෝ විමසන වේලාවෙහි විමසුවන්ගේ විමසීම් විෂය

ගැට ඇති මහා වනගහණක් මෙන් මහා දුර්ගයක් මෙන් ද අන්ධකාරය නොනැසුනේ වෙයි. යම්විටෙක, පණ්ඩිතයන්ගෙන් හෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් හෝ නො පදයෙහි පදයැයි දක්වමින් එල්ල කළ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ විසින් ගැට නැති සැඟවෙන තැන් නැති තත්ත්වයට පත්කොට විසඳූ කල්හි මහා ගඳැතෙකු විසින් මැඩගෙන, බිඳ පලා දැමූ මහා වනගහණ පෙදෙසක් මෙන් නසන ලද අඳුර ඇත්තේ ප්‍රකට වූයේ උපස්ථාන කරනුයේ විශෝධනය කරන ලද්දේ නම් වේ.

සෝධන හාර විභංග වර්ණනාව නිමි.

17.

තත්‍ථ කතමෝ අධිට්ඨානෝ හාරෝ යනු අධිට්ඨාන හාර විභංගයයි. එහි **තථා ධාරයිතබබා** යනු එක් බව විවිධ බව සංඛ්‍යාත වූ සාමාන්‍ය විශේෂ මාතෘයෙන් දැරිය යුතුයි යනුයි. එහි කිසිවක් විකල්පනය නොකළ යුතුය යන අදහසයි. විකල්පනය නොකළ යුතු කරුණු නිද්දේසවාර වර්ණනාවෙහි කියන ලද ම ය. ඒ ඒ ඵලය සොයයි. ගවේෂණය කරයි නුයි මග්ග නම් වේ. එය කැමතියවුන් විසින් සොයනු ලැබේ. ගවේෂණය කරනු ලැබේ නුයි මග්ග නම් වේ. නොඇලීම් අර්ථයෙන් ද ආශ්වාද රහිත අර්ථයෙන් ද නිරය නම් වේ. උඩට ගොස් හරහට ඇදේනුයි තිරච්ඡාන නම් වේ. ඉවත් වූ බැවින් පෙත්ති නම් වේ. මෙයින් පරලොව ගිය බව යන අර්ථයයි. පෙත්තියම පෙත්තිවිසය නම් වේ. සුර නොවෙත්. නොබබළත්, නොහොබිත් යන අර්ථයෙන් අසුර නම් වේ. අසුරයෝ ම අසුරයොනි නම් වෙත්. දිව්‍යමය රූපයන්ගෙන් මනා වූ අග් ඇත්තේනුයි සග්ග නම් වේ. මනස උසස් බැවින් මනුස්සා නම්. වාණ යනුවෙන් තණ්හාව කියනු ලැබේ. එය එහි නැතැයි නිබ්බාණ නම් වේ. නිරයට යේනුයි **නිරයගාමී** නම්. සෙසු පදයෙහි ද මේ ක්‍රමයමැයි. **අසුරයොනියො** යනු අසුර යෝනියට හිත වූයේ යනුයි. අසුර ජාතියෙහි උපදින්නෙක් යන අර්ථයයි. ස්වර්ගයට පමුණුවානුයි **සග්ගගාමියො** නම් වේ. **මනුස්සගාමී**

යනු මනුෂ්‍ය ලෝකයට යන්නාය. **පටිසංඛා නිරොධො** යනු නුවණින් බලා **සුකරෙන** ප්‍රතිපක්ෂ භාවනාවේ නිරෝධයයි. ප්‍රතිපක්ෂ දෙයෙහි හෝ එසේ නොපැවති දෙයෙහි හෝ ඉපදීමට සුදුසු දෙයෙහි ප්‍රතිපක්ෂ පැවැත්මේ නූපදවීමයි. **අපපටිසංඛා නිරොධො** යනු සංඛත ධර්මයන්ගේ ස්වකීය නිරෝධයයි. **ඛණික නිරෝධය** යන අර්ථයයි. **රූපං** යනු ඒකත්වයයි. **භූතානං උපාදාය** යනු විවිධත්වයයි. **උපාදාය රූපං** යනු ඒකත්වයයි. **චකඛායතනං -පෙ- කබලීකාරෝ ආහාරෝ** යනු විවිධත්වයයි. පඨවි ධාතු යනු ඒකත්වයයි. විසි ආකාරය විවිධත්වයයි. ආපෝධාතු යනු ඒකත්වයයි. දොළොස් ආකාරය විවිධත්වයයි. තේජෝ ධාතු යනු ඒකත්වයයි. සතර ආකාරය විවිධත්වයයි. වායෝ ධාතු යනු ඒකත්වයයි. සය ආකාරය විවිධත්වයයි යනුවෙන් මේ අර්ථය දක්වමින් **දවීහි ආකාරෙහි ධාතුයො පරිගණහාති** යනාදිය කීවේය.

එහි **කෙසා** යන තැන කෙස් නම් අල්ලා ගන්නා ලද ශරීරයෙහි ඇති කර්කශ ලක්ෂණයි. මේ ශරීරයෙහි වෙන් වෙන් වූ පඨවි ධාතු කොටසයි. **ලොමා** නම් -පෙ- **මත්ථලුංගං** නම් ශරීරස්ථ කර්කශ ලක්ෂණයයි. මේ ශරීරයෙහි වෙන් වෙන් වූ කොටසක් යන මෙය විවිධත්වයයි. **ආපො ධාතු** ආදි කොටස්වල ද පිත්තාදියෙහි ද මේ ක්‍රමයමය. මේ විශේෂයයි. **යෙන ච** යනු කුපිත වූ යම් තේජෝ ධාතුවකින් යනුයි. **සනනපපති** යනු මේ කය තැවෙයි. එක දවසකට අයත් වූ ජරා ආදී ස්වභාවයෙන් උණුසුම් වූයේ වේ. **යෙන ච ජීරති** යනු මේ ශරීරය යමකින් දිරනු ලැබේ ද යනුයි. ඉන්ද්‍රිය විකලත්වයට බලරහිත බවට හම රැලි වැටීමට කෙස් ඉදීමට ද පැමිණෙයි. **යෙන ච පරිඩයහති** යනු කිපුණු යමකින් මේ කය දැවේ ද යනුයි. ඒ පුද්ගලයා ද දැවෙමි දැවෙමි යි අඬමින් සියවරක් සෝදන ලද ගිතෙල් රන්වන් සඳුන්, සඳුන් ආදී නැවරීම් ද විජිනිපත් පවන ද පතයි. **යෙන ච අසිතපීතඛායිත සායිනං සම්මා පරිණාමං ගච්ඡති** යනු බත් ආදී කන ලද දේ හෝ පාන ආදි බොන ලද දේ හෝ පිටිකැවිලි ආදි කඩා කන ලද දේ හෝ ඉදුණු අඹ, මීපැණි ආදි දිවින් රසවිඳින ලද දේ හෝ මනාව දිරවයි. රස ආදී ස්වභාවයෙන් විවේකයට පැමිණේ යන අර්ථයයි. මෙහිදී ද පළමු තුන තේජෝ ධාතුවයි. පසුව වූ සතර සමුට්ඨාන කර්ම සමුට්ඨාන ම ය.

උද්ධංගමා වාතා යනු උගුරට ඒම, ඉක්කා වැටීම ආදියේ පැවති උඩට නැගෙන වායුවයි. **අධොගමා වාතා** යනු මළමූත්‍ර කිරීම් ආදියේදී

බැහැර යන පහතට බසින වායුවයි. **කුච්ඡිසයා වාතා** යනු අන්ත්‍රවලින් බැහැර අති වායුවයි. **කොට්ඨාසයා වාතා** යනු අන්ත්‍ර ඇතුළත ඇති වායුවයි. **අංගමංගානුසාරිනෝ වාතා** යනු ධමනි ජාලාවන් අනුසාරයෙන් සියලු ශරීරයේ අඟපසඟෙහි විසුරුවන ලද හැකිලීම් දිගහැරීම් ආදියෙන් ඇතිවන වායුවයි. **අසසාසෝ** යනු ඇතුළට පිවිසෙන නාසික වාතයයි. **පසසාසෝ** යනු පිටතට නික්මෙන නාසික වාතයයි. මෙහිදී ද පළමුව දැක්වූ චතු සමුට්ඨාන වේ. ආශ්වාස ප්‍රශ්වාස, චිත්ත සමුට්ඨානමය. මෙසේ විවිධත්වය දැක්වීම් වශයෙන් විභාග ලෙසින් ගෙනහැර දක්වන ලදී. ධාතු සතර පටික්කූල මනසිකාර වශයෙන් ගෙනහැර **පානුයේ ඉමෙහි දවාචතතාළීසාය ආකාරෙහි** යි කියන ලදී. එහි **න ගයහූපගං** යනු ගැනීමට නුසුදුසු යනුයි. **සභාවභාවතෝ** යනු ස්වභාව ලක්ෂණයෙනි. මෙසේ පටික්කූල මනසිකාරය දක්වා නැවත විමසීම් වාරය පාළි වශයෙන්ම දක්වන්නට තෙනාහ භගවා යා වෙව ඛෝ පන යනාදිය කියන ලදී. ඒ සියල්ල මනාව දතයුතුය.

මෙසේ සත්‍ය මාර්ගයේ ස්වරූපය ලෙසින් අධිට්ඨාන හාරය දක්වා දැන් අවිද්‍යා, විද්‍යා ආදී වශයෙන් එය දක්වන්නට **අවිජජාති එකතතතා** යනාදිය කියන ලදී. එහි **දුකෙඛ ඤාණං** යනාදියෙහි යම්හෙයකින් අවිද්‍යාව දුක්ඛ සත්‍යයේ අවකාශ ඇති පරිදි සලක්ෂණය දැනගන්නට, අවබෝධ කරගන්නට නොදෙයි ද වසා, ආවරණය කොට සිටියි ද එහෙයින් **දුකෙඛ ඤාණං** යයි කියනු ලැබේ. එසේම, යම්හෙයකින් දුක්ඛ සමුදය සත්‍යයේ, දුක්ඛ නිරෝධ සත්‍යයේ, දුක්ඛනිරෝධගාමිනි පටිපදා සත්‍යයේ යථාවසර සලක්ෂණය දැනගන්නට අවබෝධ කරගන්නට නොදෙයි ද වසාගෙන, ආවරණය කොටගෙන සිටී ද එහෙයින් **දුකඛ නිරොධගාමිනියා පටිපදාය ඤාණං** යි කියනු ලැබේ. අතීත කාලයෙහි වූ ස්කන්ධ ආයතන ධාතු ආදීහු අතීත පටන්ගැන්මෙන් යුක්ත වෙති. අනාගත කාලයෙහි වූ දේ අනාගත කෙළවරින් යුතු වෙත්. ඒ දෙකෙහිම වූ දේ පූර්වාන්ත හා අපරාන්ත වෙති. සංස්කාරාදීන්ට හේතු වූ අවිද්‍යාදිය ප්‍රත්‍ය පිළිබඳ ස්වරූපයෙන් යුතුය. අවිද්‍යාදියෙන් ඇති වූ බැවින් සංස්කාර ආදී ධර්ම පටිච්චසමුප්පන්න වෙති. එහිදී මේ අවිද්‍යාව යම් හෙයකින් අතීතයේ වූ ස්කන්ධ ආදීන්ට පටිච්ච සමුප්පන්න ධර්මයන්ගේ යථාවසර ලක්ෂණය දැනගන්නට, අවබෝධ කරගන්නට නොදේ ද වසාදමා, ආවරණය කොටගෙන සිටී ද, එහෙයින් **පුබබනෙත ඤාණං යාව පටිවව සමුපපනෙනසු ධමෙමසු ඤාණං** යි කියනු ලැබේ.

මේ අවිද්‍යාව කෘත්‍ය වශයෙන් ද ජාති වශයෙන් ද කියන ලදමය. මෙය වනාහි මේ අට තැන දැනගන්නට අවබෝධ කරගන්නට නොදේයැයි කෘත්‍ය වශයෙන් කියන ලදී. ඉපදෙන්නාහු මේ අටතැන්හි උපදී යයි ජාති වශයෙන් කියන ලදී. මෙසේ කෘත්‍ය වශයෙන් ද ජාති වශයෙන් ද කියන ලද්දේ නමුත් ලක්ෂණ වශයෙන් කියන ලද කල්හිම මනාව කියන ලද්දේ වනැයි ලක්ෂණ වශයෙන් දක්වන්නට **ඤාණං** යනාදිය කියන ලදී. එහි ඤාණය අර්ථ අනර්ථ කාරණ අකාරණ චතුසත්‍ය ධර්මය දන්නා ලද්දේ ප්‍රකට කෙරෙයි. මේ අවිද්‍යාව ඉපිද එය දත්තේ ප්‍රකට කිරීමට නොදේනුයි ඤාණයට විරුද්ධ වූයේ **අඤ්ඤාණ** නම් වේ. දකින්නේ නුයි පඤ්ඤා නම් වේ. ඒ ප්‍රඥාව ඒ ආකාරය දකියි. අවිද්‍යාව ඉපිද දක්නට නොදේනුයි **අදස්සන** නම් වේ. අවබෝධය ද පඤ්ඤා නම් වේ. එය ඒ ආකාරය අවබෝධ කෙරෙයි. අවිද්‍යාව ඇති වී එය අවබෝධ කරන්නට නොදේනුයි **අනභිසමයෝ** නම්. අනුබෝධය, සම්බෝධය, පටිවෙධය ද පඤ්ඤා නම් වේ. එය ඒ ආකාරය අවබෝධ කෙරේ. මනාව අවබෝධ කරයි. සම්පූර්ණයෙන් දැනගනී. අවිද්‍යා ඇති වී අවබෝධ කරන්නට මනාව අවබෝධ කරන්නට, සපුරා දැනගැනීමට නොදේ නුයි **අනනුබොධො අසමෙබාධො අපපටිවෙධො** නම් වේ. එසේම සල්ලක්ඛණය, උපලක්ඛණය, පච්චුපලක්ඛණය, සමපෙකඛණය ද පඤ්ඤා නම් වේ. එය ඒ ආකාරය සලකා බලයි. වෙනස සලකා බලයි. සපුරා සලකා බලයි. මනාව සලකා බලයි. සම හෝ මනාව බලනු ලබයි. අවිද්‍යාව ඉපිද ඊට එසේ කරන්නට නොදේ නුයි **අසලලකඛණං අනුපලකඛණං, අපචචුපලකඛණං, අසමපෙකඛණං** යි ද කියනු ලැබේ. මෙයට ප්‍රත්‍යක්ෂ වූ කිසිදු කර්මයක් නැත. තමා ද නොසිතා කළ කර්මයකැයි **අපචචකඛකමම** නම් වේ. අඥානයන්ගේ ස්වභාවය **දුමෙමජඣ** නම්. මෝඩයන්ගේ ස්වභාවය **බාලෑං** නම් වේ. සම්ප්‍රජන්‍යය ද පඤ්ඤා නම් වේ. ඒ ප්‍රඥාව අර්ථ අනර්ථ, කාරණ අකාරණ, චතුසත්‍ය ධර්මය විමසා දනී. අවිද්‍යාව ඉපිද ඒ කාරණය දැනගන්නට නොදේනුයි **අසමපජඤ්ඤ** නම් වේ. මුළා කිරීම වශයෙන් **මොහ** නම් වේ. වඩාත් මුළාකිරීම වශයෙන් **පමොහ** නම් වේ. සමෙමාහ වශයෙන් **සමෙමොහො** නම් වේ. නොවිදිය යුතු දේ විඳියි. විඳියි යුතු දේ නොවිඳිනුයි අවිජ්ජා නම් වේ. සසර ඇතිකරයි. ඊට බස්වයි යන අර්ථයෙන් **අවිජ්ජාසෑ** නම්. සසරෙහි යොදවානුයි **අවිජ්ජායොග** නම්. අප්‍රහීණ අර්ථයෙන් ද නැවත නැවත යෙදීමෙන් ද **අවිජ්ජානුසය** නම් වේ. මග නැගී සිටි සොරු මගියන් පැහැර හරින්නා සේ කුසල් සිත නැගිටුවයි. පැහැර ගනීනුයි **අවිජ්ජා පරියුට්ඨාන** නම්. යම්සේ නුවර දොර පලිස

සංඛ්‍යාත දොරට දමන හරස් පොල්ල වැටුණු විට මිනිසුන්ගේ නගර ප්‍රවේශය සිදී යයි ද මෙසේ යම් තැනැත්තකුගේ සිය සිරුර නමැති නගරයෙහි වැටුණු මේ අවිද්‍යාව ඔහුගේ නිර්වාණ සම්ප්‍රාපක (පමුණුවන) ඤාණලාභය සිඳ දමානුයි **අවිජ්ජාලංසී** නම් වෙයි. අකුසල් වූයේ ද එයමය. මූලය වූයේ ද ඒමය. නැතහොත් අකුසලයන්ගේ මූලය අකුසල මූල නම් වේ. මෙහි මෝහය යනුවෙන් වෙනත් කිසිවක් අදහස් නොකරන ලදී. මොහො **අකුසල** මූලං යන මේ පදය අවිද්‍යාවේ, අර්ථ උපුටා ගැනීමකි. අයං වෙමතතතා යනු මෙය අවිද්‍යාවේ විවිධත්වය යනුයි.

විජජා යන තැන විදිය යුතු දේ විදිනුයි විජ්ජා නම් වේ. පැවතීම් අර්ථයෙන් විජ්ජා නම් වේ. **දුකෙඛ ඤාණං** යන ආදියෙහි දුක්ඛ සත්‍යයේ යථාවසර ලක්ෂණය දනියි. දකියි. අවබෝධ කරයි යන අර්ථයෙන් දුක්ඛ ආර්ය සත්‍යයෙහි විෂය වූ ඤාණය **දුකෙඛ ඤාණං** යැයි කියන ලදී. සෙසු ඤාණවලදී ද මේ ක්‍රමයමය. **පඤඤා** යනු ඒ ඒ අර්ථය ප්‍රකට කිරීම් සංඛ්‍යාත පැනවීම් අර්ථයෙන් පඤඤා නම් වේ යනුයි. නැතහොත් ඒ ඒ අනිත්‍යාදි ප්‍රකාරයෙන් ධර්මයන් දන්නේනුයි පඤඤා නම් වේ. දන්නා ස්වභාවය **පජානනා** නම් වේ. අනිත්‍යාදිය විමසානුයි **විචය** නම් වේ. ප්‍රකාරයන්ගෙන් විමසානුයි **පවිචයෝ** නම් වේ. චතු සත්‍ය ධර්මයන් විමසානුයි ධම්මවිචය නම් වේ. අනිත්‍යාදිය සලකා බැලීම් වශයෙන් වූයේ **සල්ලකඛණ** යයි. ඒවාම කෙරෙහි උපලක්ෂණ වශයෙන් සලකා බැලීම **පවවුපලකඛණ** යයි. පණ්ඩිත ස්වභාවය **පණ්ඩිචච** නම්. දක්ෂ ස්වභාවය කොසල්ල නම්. නිපුණ ස්වභාවය **නෙපුඤඤ** නම්. අනිත්‍යාදිය පැහැදිලි කිරීම් වශයෙන් **වෙභව්‍ය** නම් වේ. ඒවා පිළිබඳ සිතිම් වශයෙන් කටයුතු කිරීම **චිනතා** නම් වේ. අනිත්‍යාදිය පරීක්ෂා කෙරේනුයි උපපරිකඛා නම් වේ. භූරි යනු පොළවට නමකි. මෙයද ක්‍රියාර්ථයෙන් හා විස්තෘතාර්ථයෙන් පොළව මෙන් යන අර්ථයෙන් **භූරි** නම් වේ. එහෙයින් කියන ලදී. 'භූරි යනුවෙන් පොළව කියනු ලැබේ. ඒ පොළව හා සමාන විස්තෘත වූ ප්‍රඥාවෙන් යුක්ත වූයේ නුයි භූරිපඤඤ නම් වේ යනුවෙනි. තවද භූරි යන මෙය ප්‍රඥාවටම වෙනත් නමකි. සත්‍ය වූ අර්ථවල ඇලේ නුයි භූරි නම් වේ. ක්ලේශයින් පෙළයි හිංසා කරයි යන අර්ථයෙන් මෙධා නම් වේ. වහා ග්‍රහණය කිරීම් ධාරණය කිරීම් අර්ථයෙන් හෝ මෙධා නම් වේ. යමෙකු තුළ උපදී ද ඒ සත්ත්වයා හිත ප්‍රතිපත්තියෙහි යොදනුයේ හෝ සුදුසු ලක්ෂණයන් අවබෝධ කරගැනීමෙහි පමුණුවා නුයි **පරිනායිකා** නම් වේ. අනිත්‍යාදි වශයෙන් ධර්මයන් දකිනුයි **විපසසනා**

නම් වේ. මනා ආකාරයන්ගෙන් අනිත්‍යාදිය දනිනුයි **සමපජඤ්ඤ** නම් වේ. නොමගට පිළිපන් අශ්වයන් වීථියට නැංවීම පිණිස කෙවිටක් මෙනැයි **පතොද** නම් වේ. දැකීම් ලක්ෂණයෙහි අධිපතිත්වය ඇති කෙරේනුයි ඉන්ද්‍රිය නම් වේ. ප්‍රඥා සංඛ්‍යාත ඉන්ද්‍රිය **පඤ්ඤින්ද්‍රියයි**. අවිද්‍යාවෙන් කම්පා නොවේනුයි **පඤ්ඤාබල** නම්. කෙලෙස් සිඳින අර්ථයෙන් ප්‍රඥාවට ආයුධයක් වූයේ **පඤ්ඤාසත්ථ** නම්. ඉතා උස් වූ අර්ථයෙන් ප්‍රඥාවම ප්‍රාසාදයක් වූයේ **පඤ්ඤාපාසාද** නම්. ආලෝකාර්ථයෙන් ප්‍රඥාවම ආලෝකයක් වූයේ **පඤ්ඤාලෝක** නම්. බැබළීම් අර්ථයෙන් ප්‍රඥාවම බැබලීමක් වූයේ **පඤ්ඤාඔභාස** නම්. දිලිසීම් අර්ථයෙන් ප්‍රඥාවම දිලිසීමක් වූයේ **පඤ්ඤා පජ්ජොත** නම් වේ. ඇලුම් ඇති කිරීම් අර්ථයෙන් ද රති දායකාර්ථයෙන් ද රති ජනන අර්ථයෙන්ද බුහුමන් කිරීම් අර්ථයෙන් ද දුර්ලභ දෙයක් පහළවීම් අර්ථයෙන් ද දුර්ලභ දෙයක් පහළවීම් අර්ථයෙන් ද අතුල්‍ය අර්ථයෙන්ද උතුම් සත්ත්වයන් විසින් පරිභෝග කරන ලද අර්ථයෙන් ද ප්‍රඥාවම රත්නයක් වූයේ **පඤ්ඤාරතන** නම් වේ. එයින් සත්ත්වයෝ මුළා නොවෙත්. තමා හෝ අරමුණෙහි මුළා නොවේනුයි **අමොහ** නම් වේ. ධම්මවිචය පදය කියන ලද ම ය. කවර හෙයකින් නැවත කියන ලද ද? අමෝහයේ මෝහ ප්‍රතිපක්ෂභාවය දීපනය කිරීම සඳහාය. එයින් එය දීපනය කෙරෙයි. යම් මේ අමෝහයක් වේ ද එය හුදෙක් මෝහයෙන් අනෙකක් නොවේ. මෝහයට ප්‍රතිපක්ෂ වූ ධම්මවිචය සංඛ්‍යාත අමෝහයම මෙහිදී අදහස් කරන ලදී. **සම්මා දිට්ඨි** යනු නිවනට පමුණුවන කුසල දෘෂ්ටියයි. ධම්මවිචය සංඛ්‍යාත වූ ප්‍රශස්ත වූ සුන්දර වූ බොජ්ඣංගය **ධම්මවිචය සම්බොජ්ඣංගයයි**. මගඟංගං යනු ආර්ය මාර්ගයේ අංගය කාරණය යනුයි. ආර්ය මාර්ගයට ඇතුළත් බැවින් මගඟ **පරියාපන්න** නම් වේ.

අසඤ්ඤ සමාපත්ති යනු සංඥා විරාග භාවනා වශයෙන් පැවති අසංඥභවයේ උපත පහළ කරන සමාපත්තියයි. බුදුරදුන් නූපන් කල්හි එක් තීර්ථායතනයක පැවිදිව වායෝ කසිණයෙහි පිරිකම් කොට චතුර්ථ ධ්‍යානය උපදවා ධ්‍යානයෙන් නැගීසිට සංඥාවේ දොස් දකිත්. සංඥාව ඇතිකල්හි අත්සිඳීම් ආදී දුක් ද සියලු බිය ද ඇතිවෙත්. මේ සංඥාවෙන් වැඩක් නැත. සංඥා අභාවය ඇතැයි සංඥාවේ දොස් දැක සංඥාවේ නොඇලීම් වශයෙන් සතරවැනි ධ්‍යානය උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් යුතුව කලුරිය කොට **අසංඥයන්හි** උපදිත්. ඔවුන්ගේ සිත චුති සිත නිරුද්ධ වීමෙන්ම මෙහි **නවති**. රූපස්කන්ධ මාත්‍රයම එහි පහළ වේ. ඒවා

යම්සේ දුනුදියෙහි වේගයෙන් ඔසවන ලද ඊය, දුනුදිය වේගය යම්තාක් ද ඒතාක්ම අහසේ ගමන් කරයි. මෙසේම ධ්‍යාන වේගයෙන් ඔසවන ලද්දාහු ඉපිද ධ්‍යානවේගය යම්තාක් ද ඒතාක් කල්ම සිටිත්. ධ්‍යාන වේගය ක්‍ෂය වූ කල්හි එහිදී රූපස්කන්ධය අතුරුදන් වේ. මෙහි ප්‍රතිසන්ධි සංඥාව උපදී. ඒ සඳහා **අසඤ්ඤභවූපපත්ති නිබන්ධන සමාපත්තියි** කියන ලදී. **විඤ්ඤා සඤ්ඤා සමාපත්ති** යනු විඤ්ඤාණඤ්චායතන සමාපත්තියයි. එය වනාහි අරූප තලයෙහි වූ පළමු විඤ්ඤාණය ද පළමු අරූතල සංඥාව ද පැහැදිලි කරන හෙයින් විඤ්ඤා සංඥා යැයි කියනු ලැබේ. **කිසිවෙක් විඤ්ඤා රූප සඤ්ඤා** යි කියවත්. ඔවුන්ගේ මතයෙන් විඤ්ඤරූප සමාපත්ති යනු සෙසු අරූප සමාපත්තින්ය. සෙසු සමාපත්තින් මනාව දත හැකිමය.

නෙවසෙඤ්ඤා නාසෙඤ්ඤා ඣායී යනු ධ්‍යානලාභී පෘථග්ජනයාය. ආජානියෝ ඣායී යනු රහතන් වහන්සේය. නැතහොත් සියලු ආර්ය පුද්ගලයෝය. **අසඝබලුංකොඣායී** යනු අශ්ව පෝතකයෙකු හා සමාන ධ්‍යාන කරන්නා ය. යම් සේ අශ්ව පෝතකයා දමනයට නොපැමිණේ ද කැමති පරිදි එහෙ මෙහෙ දුවයි ද මෙසේම යම් පෘථග්ජනයෙක් අභිඥා ලැබුවේද ඔහු අභිඥාවන් විඳගෙන මෙපමණක් ප්‍රමාණවත් ය. එපමණක් කවරේ ද යනුවෙන් මත්තෙහි දමනය පිණිස උත්සාහ නොකරනුයේ අභිඥා සිත් ලෙසින් එහෙ මෙහෙ දුවයි. පවතී. ඒ අශ්ව පෝතකයා ඣායී යැයි කියනු ලැබේ. **දිවයුනතරෝ ඣායී** යනු ධ්‍යානලාභී දෘෂ්ටිගතිකයෙකි. **පඤ්ඤුනතරෝ ඣායී** යනු ලක්‍ෂණයන් සමීපයෙන් බලන නිසා ඣායී නම් වේ යනුයි. සියල්ලම හෝ පඤ්ඤාධික ඣායී නම්.

සරණෝ සමාධි යනු අකුසල චිත්ත ඒකාග්‍රතාවයි. නැතහොත් සියලු සාශ්‍රව සමාධියයි. **අරණෝ සමාධි** යනු සියලු කුසල අව්‍යාකත සමාධියයි. නැතහොත් ලොකුත්තර සමාධිය ම ය. **සංඛරෝ සමාධි** යනු පටිඝ සිත්වල ඒකාග්‍රතාවයි. **අවෙරෝ සමාධි** යනු මෛත්‍රී චේතෝ විමුක්තියයි. අනතුරු කොටස් දෙකෙහි ද මේ ක්‍රමය ම ය. **සාචිසෝ සමාධි** යනු ලෞකික සමාධියයි. එය වනාහි නොඉක්මවන ලද සංසාර ආමිෂය, ලෝකාමිෂය බැවින් සාමිස නම් වේ.

නිරාමිසෝ සමාධි යනු ලෝකෝත්තර සමාධියයි. **සසංඛාර සමාධි** යනු පමා වූ අභිඥා ඇති දුක්ඛ ප්‍රතිපදාවද පමා වූ අභිඥා ඇති සුඛ ප්‍රතිපදාවද යන දෙකයි. එය වනාහි මෙහෙයවීම් සහිත ප්‍රයෝග සහිත

සිතින් විරුද්ධ ධර්ම දුකසේ අමාරුවෙන් නිග්‍රහකොට අවබෝධ කරගත යුතුය. අනෙක **අසංඛාර සමාධියයි. එකංස භාවිතො සමාධි** යනු ශුෂ්ක විදර්ශකයාගේ සමාධියයි. **උභයංස භාවිතො සමාධි** යනු සමථයානිකයාග් සමාධියයි. **උභතො භාවිත භාවනො සමාධි** යනු කායසක්‍ඛි පුද්ගලයාගේ හෝ උභතොභාග විමුත්තයාගේ සමාධියයි. එය වනාහි දෙකොටසින්ම භාවිත කරන ලද භාවනාවයි.

ආගාළ්හ පටිපදා යනු කාමයන්ට බැසගන්නා ප්‍රතිපත්තියයි. කාමසුඛානු යෝගය යන අර්ථයයි. **නිජ්ඣාම පටිපදා** යනු කාමයට බැසගැනීම් වශයෙන් හෝ සිඳීම් වශයෙන් පැවති ප්‍රතිපත්තියයි. අත්තකිලමථානුයෝගය යන අර්ථයයි. **දුක්ඛමා පටිපදා** යනාදියෙහි ප්‍රධන් වඩන වේලාවෙහි සීතල ආදිය නොඉවසන්නාගේ ප්‍රතිපදාව ය. ඒවා නොඉවසානුයි **ඛමා** නම් වේ. උපන් කාම විතර්කය නොඉවසයි ආදී වශයෙන් මිථ්‍යා විතර්ක සමනය කෙරේ නුයි **සමා** නම් වේ. මනස සවැනි කොට ඇති ඉන්ද්‍රියන් දමනය කෙරේ නුයි **දමා පටිපදා** නම් වේ. **එවං** යැයි මේ කියන ලද ක්‍රමයෙන් යනුයි. **යොධමේමා** යනු යම්කිසි ජාති ආදි කරුණකි. **යසස ධම්මසස** යනු එයින් අන්‍ය වූ ජරා ආදි කරුණකි. **සමාන භාවො** යනු දුක්ඛ ආදී ස්වභාවයෙන් සමාන බවයි. **ඒකතතතාය** යනු සමාන බැවින් දුක්ඛ ආදී ස්වභාවයන්ගේ එක්වන බැවිනි. **එකී භවති** යනු අනේකදුක ආදී වශයෙන් ඒක ශබ්දයෙන් කිය යුතු බැවින් එක්වන් වෙයි. මෙයින් එක්වන් බැවිහි ලකුණු කියන ලදී. **යෙන යෙන වා පන විලකඛණො** යනු යම් ධර්මයක් යම් ධර්මයකට යම් යම් ස්වභාවයකින් අසමාන වේ ද එයයි. **තෙන තෙන වෙමත්තං ගචඡති** යනු ඒ ඒ ස්වභාවයෙන් ඒ ධර්මය ඒ ධර්මයේ විවිධත්වයට අසමාන බවට යෙයි. දුක්ඛ ස්වභාවයෙන් සමාන කල්හි ද ජාති ආදියෙන් ඉපදීම් ආදියෙන් ජරා ආදියේ විශිෂ්ටත්වයට යෙයි යන අර්ථයයි. මෙයින් වෙනසෙහි ලක්‍ෂණ කියන ලදී. දැන් වනාහි ඒකත්ත වෙමත්ත විෂයෙහි යොදවා දක්වන්නට **සුතෙන** වා වෙය්‍යාකරණෙ වා යනාදිය කියන ලදී. එහි **පුචඡිතං** යනු විමසීම් වශයෙන් දේශනා කරන ලද සූත්‍රයක් ලෙසින් කියන ලදී. අධිට්ඨානහාරයේ පෘච්ඡා විෂයත්වයෙන් නොවෙයි. සෙස්ස ප්‍රකටමය.

අධිට්ඨාන හාර විභංග වර්ණනාව නිමි.

18.

තත්ථ කතමෝ පරිකඛාර හාරෝ යනු පරික්ඛාර හාර විභංගයයි. එහි **යෝ ධම්මෝ යං ධම්මං ජනයති තස්ස සෝ පරිකඛාරෝ** යනු කෙටියෙන් පරික්ඛාර ලක්ෂණය ප්‍රකාශ කොට එය විභාග වශයෙන් දක්වන්නට **කිං ලකඛණෝ** යනාදිය කියන ලදී. එහි හීනෝ යනු තමාගේ ඵලය වෙත ප්‍රත්‍ය භාවයෙන් යේ නුයි **හෙතු** නම් වේ. එය හේතුකොට ප්‍රතිඵලය ඒ නුයි **පච්චය** නම්. හේතු පච්චය ශබ්දවලින් කාරණය ම කියනු ලැබුවත් එහි විශේෂය විභාග වශයෙන් දක්වන්නට **අසාධාරණ ලකඛණෝ** යනාදිය කියන ලදී. **සභාවෝ හෙතු** යනු සමාන භාව ඇති බීජය හේතුව වේ යනුයි. බීජය අංකුරාදිය හා සමාන නොවේ ද? නොවන්නේ නොවේ. අනෙකකින් එබන්දක් නූපදින බැවිනි. **යථ චා පන** යනාදියෙන් වෙනත් උදාහරණයක් දැක්වීමෙන් හේතුප්‍රත්‍යයන්ගේ විශේෂයම දක්වයි. එහි **දුද්ධං** යනු කිරිය. **දධි භවති** යනු ඒකස්ස න්‍යායෙන් හෝ අභේදොපචාරයෙන් හෝ කියන ලදී. අන් පරිද්දකින් නොවේ. කිරි දිකිරි බවට පත් නොවේ. එහෙයින්ම **නචත්ථි එකකාල සම්භවධානං දුද්ධස්ස ච දධිභස්ස ච යි** කියන ලදී. නැතහොත් කළයෙහි දමන ලද කිරි දිකිරි බවට පත් වෙයි. එහිදී කල් ඉකුත්වීමේදී වෙනත් හේතු හා එකතු වීමෙන් දිකිරි ඇතිවේ. එහෙයින් කිරි රසය විපාක ආදියෙන් බිඳුණු ස්වභාව ඇති බැවින් කිරිවල ද දිකිරිවල ද එකම වේලෙහි එකතුවීමක් නැත්තේ ය. **එවමෙවං** යනු යම්සේ හේතුව වූ කිරෙහි ඵලය වූ දිකිරි සමග එකම වේලාවේ එකතුවීමක් නැත්තේ ද මෙසේ අන් හේතුවක ද ඵලය සමග එකම වේලාවේ එකතුවීමක් නැත්තේය. එසේම ප්‍රත්‍යයේ ද නොවේ. ප්‍රත්‍යය ඒකාන්ත ඵලය සමග බිඳුණු වේලාවක් නොවේ යයි මෙසේ ද හේතු ප්‍රත්‍යයන්ගේ විශේෂය දතයුතුය යන අදහසයි.

මෙසේ බාහිර හේතුප්‍රත්‍ය විභාගය දක්වා දැන් ආධ්‍යාත්මික හේතුප්‍රත්‍ය විභාගය දක්වන්නට **අයං හි සංසාරෝ** යනාදිය කියන ලදී. එහිදී අවිද්‍යාව අවිද්‍යාවට හේතුවේ යයි කී කල්හි කිම එක් සිතිවිල්ලක නොයෙක් අවිද්‍යාවන් විද්‍යමාන වෙත් ද? (යනුවෙන් ප්‍රශ්න නැගේ) **පුරිමිකා අවිජ්ජා පච්ඡිමිකාය අවිජ්ජාය හෙතු** යනුවෙන් ඊට පිළිතුරු කියන ලදී. එයින් එකම වේලාවේ හේතුප්‍රත්‍යයන්ගේ එකතුවීමක් නැත යන මේ අර්ථයම සමර්ථනය කෙරේ. එහි **පුරිමිකා අවිජ්ජා** යනාදියෙන්

හේතුඵලයන් වූ අවිද්‍යාවන්ගේ විභාගය දක්වාලයි. **බීජංකුරෝ විය** යනාදියේ මේ අර්ථය දක්වයි. යම්සේ බීජය අංකුරයට හේතුවනුයේ දෙවැනි හේතු බැවින් හේතුව වෙයි ද බීජයෙන් යම් ඵලයක් ඇති වේ ද එයට බීජය පරම්පරා හේතු භාවයෙන් හේතුව වෙයි. මෙසේ අවිද්‍යාවද හේතු භාවයෙන් දතයුතුය. නැවත යථා වා පන යනාදියෙන් ද හේතුප්‍රත්‍ය විභාගය ම දක්වයි.

එහි **ථාලකං** යනු පහන් කබලයි. **අනගගිකං** යනු ගිනි නැතිව යනුයි. **දීපෙතුං** යනු දල්වන්නට ය. **ඉති සභාවෝ හෙතු** යනු මෙසේ පහන් දැල්වීම් ආදියෙහි ගින්දර ආදි පහන හා සමාන හේතුව සභාව හේතුව යනුයි. **පරභාවෝ පචචයෝ** යනු එහිම පහන් කබල වැටිය තෙල් ආදිය හා සමාන ගින්නෙන් අන්‍ය වූ ස්වභාව හේතුවයි. **අජඣත්තිකෝ** යනු ස්වකීය අධ්‍යාත්මයෙහි වූ සිය අධ්‍යාත්ම ස්වභාවයයි. **බාහිරෝ** යනු පිටතින් වූ යනුයි. **ජනකෝ** යනු ඇතිකරන්නායි. **පරිගගාහකෝ** යනු උපකාර වන්නායි. **අසාධාරණෝ** යනු ආවේණික වූ යනුයි. **සාධාරණෝ** යනු හේතුප්‍රත්‍යවලින් ඇති වූ අනෙක් ඒවාට ද සමාන වූ යනුයි. දැන් යම්හෙයකින් හේතුව පරික්බාර යනුවෙන් ප්‍රකාශ කරන ලද ද හේතුව ද ඵලය අපේක්ෂාවෙන් පවතී ද එහෙයින් හේතුවේ යම් හේතුරහිත බවක් වේ. එය යම්සේ වේ ද යම් ඵලයක් වේ ද එහි යම් විශේෂයක් වේ ද හේතුඵලයන්ගේ යම් **සම්බන්ධයක්** වේ ද ඒ සියල්ල දක්වන්නට **අවුපචෙජදතෝ** යි කියන ලදී.

එහි හේතුඵල භාවයෙන් වූ **සම්බන්ධතාවය** පරපුරයි. එහි සම්බන්ධය කවරේ ද? හේතුඵල භාවය කවරක් ද? අවුපච්ඡේදාර්ථය එය ම ය. ඵලය වූ යමක් අනෙක් දෙයෙහි හේතුනොවන දෙය වී නිරුද්ධ වේද, එය සිදින ලද හේතුව වෙයි. එය රහතුන් වහන්සේගේ චුති සිතයි. යමක් තමාට අනුරූප වූ ඵලයේ හේතුව බවට පත්වී නිරුද්ධ වේ ද, එය නොසිඳන ලද හේතුව නම් වෙයි. හේතුඵල සම්බන්ධයේ විද්‍යමානත්වය නිසා ය. (එනිසා) **අවුපචෙජදතෝ සනතති අතෝ** යි කියන ලදී. යම්හෙයකින් හේතුවෙන් උපන් ඵලය නම් ඇති නොවූයේ නොවේ ද එහෙයින් **නිබබතති අතෝ ඵලතෝ** යි කියන ලදී. යම්හෙයකින් පෙර භවයෙන් අනතුරු භවයේ පිළිසිඳ ගැනීම් වශයෙන් පැවති උත්පත්ති ස්කන්ධ පුනර්භවය වේ ද එහෙයින් **පටිසන්ධි අතෝ පුනබභවතෝ** යි කියන ලදී. එසේම යම් පුද්ගලයෙකුගේ කෙලෙස් උපදී ද එය පළිබෝධ

නම්. මනාව පිළිපදින්නට නොදෙයි. යම්තාක් ආර්ය මාර්ගයෙන් විනාශ නොකළේ ද ඒ තාක් අනුව පවතින්නේ නම් වේ. එහෙයින් **පළිබොධත්ථො පරියුට්ඨානත්ථො අසමුග්ඝාතනත්ථො අනුසයත්ථො** යි කියන ලදී. වෙසෙසින් අවබෝධ කිරීම වශයෙන් දත්කල්හි කිසිවිටෙක එය නාම නමැති අංකුරයට හේතු නොවන්නේ යැයි **පරිඤ්ඤාතත්ථො විඤ්ඤාණස්ස බීජත්ථො** යි කියන ලදී. **යත්ථ අවුපවෙජ්දො තත්ථ සන්තති** යනු යම්තැනක රූප පිළිබඳ පැවැත්ම තුළ මුලින් කියන ලද අවුපච්ඡේදය වේ ද එහි සන්තති ව්‍යවහාරය වෙයි. **යත්ථ සන්තති තත්ථ නිබ්බත්තී** යනාදිය ප්‍රත්‍ය පරම්පරාව දැක්වීමේ හේතුඵල සම්බන්ධය දැක්වීමක් ම ය. **යථා වා පන චක්ඛුඤ්ච පටිච්ච** යනාදියෙන් ස්වභාව හේතුව යැයි කියන ලද අර්ථය ම විභාග වශයෙන් දක්වයි. එහි **සන්නිසස්සයත්තාය** යනු උපනිශ්‍රය වූ ප්‍රත්‍යයෙනි. **මනසිකාරෝ** යනු ක්‍රියා මනෝධාතුවයි. එය ද චක්ඛු විඤ්ඤාණයේ දැනීම බැවින් සමාන ජාතිත්වයෙන් ස්වභාව හේතුවයි. **සංඛාරා විඤ්ඤාණස්ස පච්චයා** සහාවො හෙතු යනු පුණ්‍ය ආදී අභිසංස්කරණ පටිසන්ධි විඤ්ඤාණයේ හේතුව යනුයි. එහි යම් ස්වභාවයක් වේ ද එය හේතුවයි. මෙහිදී සංඛාර යනුවෙන් සියලු ලෞකික කුසල අකුසල සිතිවිලි අදහස් කරන ලදී. මේ ක්‍රමයෙන් සෙසු පදවල ද අර්ථය දතයුතුය. **එවං යො කොචි උපනිස්සයො සබෙබා සො පරිකඛාරෝ** යනු කියන ලද ප්‍රභේද ඇති යම්කිසි ප්‍රත්‍යයක් වේ ද ඒ සියල්ල තමාගේ ඵලය පිරිවරන හෙයින් සකස් කරන හෙයින් පරික්ඛාර නම් වේ යනුයි. එය වෙන්කොට ප්‍රකාශ කිරීම පරික්ඛාර හාරයයි.

පරිකඛාර හාර විභංග වර්ණනාව නිමි.

19.

තත්ථ කතමො සමාරොපනො හාරෝ යනු සමාරෝපන හාර විභංගයයි. එහි **එකසමිං පදථ්යානෙ** යනු එක් හේතුවක් වූ යම් කිසි ධර්මයක් සූත්‍රයෙන් ගත් කල්හිය. **යතනකානි පදථ්යානානි ඔතරන්ති** යනු අන්‍ය දේවලට හේතුවූ යම්තාක් දේ වෙත් නම් ඒ ධර්මයෙහි රැස්වෙයි යනුයි. **සබ්බානි තානි සමාරොපයිතබ්බානි** යනු ඒ සියලු පදථ්යාන හා

පදට්ඨාන ධර්ම මනාව වෙන්කිරීම් වශයෙන් ගෙනවුත් දේශනාවට නැංවිය යුතුය යනුයි. දේශනාවට නැංවී කල්හි මෙන් සිතා කියයුතුය යන අර්ථයයි. ආවට්ට හාරයෙහි 'එකමහි පදට්ඨානෙ පරියෙසති සෙසකං පදට්ඨානං' යන වචනයෙන් නොයෙක් පදයන්ගේ සෙවීම කියන ලදී. එසේ මෙහිදී ද බොහෝ පදයන්ගේ සමාරෝපනය (නැංවීම) කළ යුතුයැයි දක්වමින් **යථා ආවටෙට හාරෙ** යයි කියන ලදී. සමාරෝපනය හුදෙක් පදට්ඨාන වශයෙන් ම නොවේ. එහෙයින් වේවචන (පර්යාය පද) භාවනා ප්‍රභාණ වශයෙන් ද සමාරෝපනය කළ යුතුයැයි දක්වමින් **තඤ්ච සමාරොපනා චතුබ්බිධො** යන ආදිය කියන ලදී. **මෙහිදී කවර** හෙයින් පදට්ඨාන වේවචනයන් ගන්නා ලද්දේ ද? **පදට්ඨාන වේවචන** හාරයේදී ම මේ අර්ථය පැහැදිලි කරන ලද්දේ නොවේද? එය සත්‍යයකි. මෙහිදී පදට්ඨාන වේවචන ග්‍රහණය භාවනා ප්‍රභාණයන්ගේ අධිට්ඨාන විෂය දැක්වීම සඳහා හා ඒවායේ අධිවචන විභාගය දැක්වීම සඳහා ය. මෙසේ භාවනා ප්‍රභාණයෙන් මනාව දතහැකි වෙත්. දක්වන්නට පහසු ද වෙත්. **ඉදං පදට්ඨානං** යනු මේ ත්‍රිවිධ සුචරිතය බුදුවරුන්ගේ අනුශාසනයේ, අවවාදයේ විෂය බැවින් පදට්ඨාන වෙයි යනුයි. එහි **කායිකං** යනාදියෙන් ත්‍රිවිධ සුචරිතයන්ගෙන් සීලාදිය ද ත්‍රිවිධ ස්කන්ධයන් ද සමථ විදර්ශනා දෙක ද තෙවැනි සිව්වැනි ඵල ද වෙන්කොට දක්වයි. එය මනාව දතහැකි ම ය. සේවනය කෙරේනුයි **වන** නම් වේ. පීඩාකරයි පීඩා කරනු ලැබේ නුයි **වන** නම් වේ. එහිදී යම්හෙයකින්, පංචකාම ගුණයන් කාම තණ්හාවට නිමිති ගැනීම් වෙයි. කුඩා ලකුණු ගන්නාට ආධ්‍යාත්මික බාහිර ආයතන ඊට බැඳුණු ඡන්දරාගාදීන්ගේ අනුසය ධර්ම ද නැගීසිටින කරුණු ද වෙත්. එහෙයින් එම අර්ථය දක්වන්නට **පංචකාම ගුණානි** යනාදිය කියන ලදී.

අයං වෙවචනෙන සමාරොපනා යනු රාගවිරාග, චෙතො විමුත්ති, සෙකඛඵල, අනාගාමි ඵල, කාමධාතු සමතික්කමන යන මේ පදයන්ගෙන් තෙවැනි ඵලය පිළිබඳ යම් නිර්දේශයක් කරන ලද ද එසේම අවිජ්ජා, විරාග, පඤ්ඤා විමුත්ති, අසෙකඛ ඵල, අගඵල, අරහත්ත, තෙධාතුක **සමතික්කමන** යන මේ පර්යාය පදයන්ගෙන් සිව්වැනි ඵලය පිළිබඳ යම් නිර්දේශයක් කරන ලද ද පඤ්ඤින්ද්‍රිය ආදී පර්යාය වචනයන්ගෙන් ප්‍රඥාව පිළිබඳ යම් නිර්දේශයක් කරන ලද ද එය වේවචනයන්ගෙන් කරන ලද **සමාරෝපනයකි**. 'තසමාතිහ ත්වං භික්ඛු කායෙ කායානුපසසි විහරාහි' යනාදිය **ලකඛණහාර** විභංග වර්ණනාවේ කියන ලද ක්‍රමයෙන් දතයුතුයි. හුදෙක් එහිදී ඒක ලක්ඛණත්වයෙන් යුත් බැවින් නොකියන ලද දේවලත්

කියන ලද බව දැක්වීම් වශයෙන්ම ආයේය. මෙහිදී භාවනා සමාරෝපන වශයෙනැයි (දතයුතු) මෙයම විශේෂයයි.

කායානුපසසනා වෙසෙසින් අසුභානුපස්සනාව ම ය. කාමරාගය හා ඊට අයත් කෙලෙස්වලට ඒකාන්තයෙන් ප්‍රතිපක්ෂ යැයි අසුභ සංඥාව, කබලීකාර ආහාරවල පමණ දැන්මෙන්, හාත්පසින් බැඳෙන කෙලෙස්, කමූපදානය, කාමයෝගය, අභිධ්‍යාව, කායගන්ථ, කාමාසව, කාමොඝ, රාගසල්ලය ද රූපධර්මවල පමණ දැන්මෙන් ප්‍රතිපක්ෂ කෙලෙස් ද රූපධර්මයන්හි රාගය, ඡන්දයෙන් අගතියට යාම යන මේ පාප ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස පවතී යැයි යන අර්ථය **කායෙ කායානුපසසි විහාරතෙතා** යනාදියෙන් දක්වයි. එසේම විශේෂ වශයෙන් වේදනානුපස්සනාව දුක අනුව බැලීමකි. එය,

යො සුඛං දුකඛතො අද්ද දුකඛමද්දකඛි සලලතො
අදුකඛමසුඛං සනතං අද්දකඛි නං අනිචචතොති

'යමෙක් සුඛය දුක් වශයෙන් දැක දුක හුලක් ලෙසින් දුටුවේ ද ඇත්තා වූ අදුක්ඛමසුඛය අනිත්‍ය ලෙසින් දුටුවේය.'

යනාදි වචනයෙන් සියලු වේදනාව දුකයැයි දකිමින් සුඛ සංඥාවෙන් වේදනාවේ හේතුව දැනගෙන, හාත්පසින් බැඳෙන කෙලෙස් පිළිබඳ ගව සිල ආදියෙන් භවයේ පිරිසිදු බව ටන්නේ යයි වේදනාශ්වාදයෙන් පැවති භව උපාදාන සංඛ්‍යාත සීලබ්බත උපාදානය වේදනා වශයෙන් මා විසින් හැසිරෙන ලදැයි ආදීනව වශයෙන් පැවති ව්‍යාපාද කාය ගන්ථය හා දෝස හුලද වේදනාශ්වාද වශයෙන් පැවති භවයෝග, භවාසව, භවෝඝ සංඛ්‍යාත භව රාගය ද භව පරිඤ්ඤාවෙන් බැහැරුණු කෙළෙස්හි වේදනා විෂය වූ රාගය ද ද්වේෂයෙන් අගතියට යෑම ද ප්‍රහාණය පිණිස පවතී යන මේ අර්ථය **වෙදනාසු වෙදනානුපසසි** යනාදියෙන් දක්වයි.

එසේම චිත්තානුපස්සනාව විශේෂ වශයෙන් අනිත්‍යය අනුව බැලීමකි. එය සිත අනිත්‍යව දකින්නේය. එහිදී බොහෝසෙයින් සත්ත්වයෝ නිත්‍ය සංඥා ඇත්තාහ. නිත්‍ය සංඥාවෙන් විඤ්ඤාණාහාර පරිඥාව නිසා හාත්පසින් බැඳෙන කෙලෙස් පිළිබඳ නිත්‍ය යන හැඟීමට ප්‍රතිපක්ෂවම දිට්ඨි උපාදාන, දිට්ඨියෝග, සීලබ්බත පරාමාස, කායගන්ථ දිට්ඨාසව,

දිට්ඨොග සංඛ්‍යාත දිට්ඨියේ නිත්‍යය යන හැඟීමට නිමිති වූ 'මම ශ්‍රේෂ්ඨ වෙමි' ආදී ලෙසින් පැවති මාන හුල ද සංඥා දැනීමෙන් ප්‍රතිපක්ෂ වූ කෙලෙස් පිළිබඳ සංඥා රාගය ද දෘෂ්ටියට වැටීම ප්‍රහීණ වී නොමැති කමින් උපදින භයින් අගතියට යෑමද ප්‍රහාණය පිණිස පවතී යන මේ අර්ථය **චිනෙත චිනතානුපසසි** යනාදියෙන් දක්වයි.

එසේම ධම්මානුපස්සනාව විශේෂ වශයෙන් අනාත්ම සංඥාව වේ. එය සංස්කාරයන්හි ආත්ම සංඥාවෙන් මනෝ සංචේතනා ආහාරය දැනගෙන ප්‍රතිපක්ෂ වූ කෙලෙස් පිළිබඳව සක්කාය දිට්ඨියෙන් යුතුව මෙයම සත්‍යයයි පැවති මිථ්‍යාදෘෂ්ටියට බැසගැනීම ද මිථ්‍යාදෘෂ්ටියට බැසගැනීමට හේතු වූ අවිජ්ජායොග, අවිජ්ජාසව, අවිජ්ජෝඝ, මෝහසල්ල සංඛ්‍යාත අවිද්‍යාවෙන් සංස්කාරයන් දැනගෙන, හාත්පසින් බැඳෙන කෙලෙස් පිළිබඳ සංස්කාරයන්හි රාගය ද මෝහයෙන් අගතියට යෑම ද ප්‍රහාණය පිණිස පවතීයැයි යන මේ අර්ථය ධමෙමසු ධම්මානුපසසි **විහරනෙතා** යනාදියෙන් දක්වයි. සෙස්ස ප්‍රකටමය.

සමාරෝපන හාර විහංග වර්ණනාව නිමි.

හාර විහංග වර්ණනාව ද නිමියේය.

20.

මෙසේ මනාව පිරියම් කරන ලද බිමෙක නන් වන් පිපුණු මල් විසුරුවන්නාක් මෙන් ද සුශික්ෂිත වූ ශිල්පාචාරීන් විසින් විමසන ලද සුරත්පැහැ ස්වර්ණාලංකාරයන්හි නොයෙක් රශ්මි ජාලාවන්ගෙන් බබළන විවිධ වූ මාණික්‍ය රත්නයන් බඳින්නාක් මෙන් ද මහ පොළව පෙරළා බිම්මල් යුෂය කන්නාක් මෙන් ද යොදුනක් දිග මීවදයක් මිරිකා ඉතා මිහිරි වූ මධුරසය පොවන්නාක් මෙන් ද ආයුෂ්මත් මහා කච්චායන තෙරුන් වහන්සේ නොයෙක් නොයෙක් සූත්‍ර කොටස් ගෙනහැර පාමින්

සොළොස් හාරයන් බෙදා දක්වා දැන් ඒවා එකම සූත්‍රයක යොදා දක්වමින් හර සම්පාතවාරය ආරම්භ කළ සේක. පටන් ගනිමින් ද නිද්දේස වාරයේදී

සොළස හාරා පයමං
දිසා ලොචනතො දිසා විලොකෙත්වා
සංඛිපිය අංකුසෙන හි
තයෙහි තිහි නිද්දිසෙ සුතතනති

'පළමුකොට ව්‍යඤ්ජන පර්යේෂණ හෙයින් සෝළස හාරයෝ යෙදිය යුතුයි. දිසාලෝචන නයින් ප්‍රථම දිශා ආදිය බලා අංකුස නයින් දිශාභූත ධර්මයන් සූත්‍රයෙන් නිර්ධාරණය කොට නන්දියාවත්තාදී අර්ථනයත්‍රයෙන් සූත්‍රය වර්ණනා කරන්නේය.'

යම් ඒ ගාථාවක් කියන ලද ද යම්හෙයකින් හාරවිභංග වාරය එය යොදා නොගනී. විසිරුණු විෂය ඇති බැවින් ද නය විචාරයේ මධ්‍යගත බැවින් ද නොයෙක් සූත්‍ර කොටස්වලින් හාරයන්ගේ විභාග දැක්වීමම හාර විභංග වාරයයි. හාර සම්පාත වාරය වනාහි එය යොදයි. එකම සූත්‍ර කොටසෙහි සොළොස් හාරයන් යොදා ඉන් අනතුරුව නය සමුට්ඨානය කියන ලද බැවිනි. එහෙයින් **සොළස හාරා කුහිං දට්ඨබ්බා ? හාරසම්පාතෙ** යන්න කියන ලදී. එහි අර්ථය නම් ඒ ගාථාවේ නිර්දේශය කොහි දතයුතු ද යනුයි. මෙයින් සූත්‍රයන්හි හාරයන්ගේ යෙදීම් න්‍යාය දැක්වීම හාරසම්පාත වාරය යැයි දක්වයි. හාරසම්පාත යන පදයේ අර්ථය කියන ලදමය.

අරකඛිතෙන චිතෙතන යනු චක්ඛු ද්වාරාදිය ඇතිකල්හි ආරක්ෂාව නොමැතිකමින් නොරක්නා ලද සිතින් යනුයි. **මිච්ඡා දිට්ඨිගතෙන** යනු ශාස්වත ආදී මිථ්‍යා දෘෂ්ටිවලට පැමිණීමෙන් දූෂිත වූ යනුයි. **ථීනමිද්ධාභිභූතෙන** යනු සිතෙහි ද කයෙහි ද කල්‍යාණ නොවන ලක්ෂණයන්ගෙන් යුත් ථීනමිද්ධ දෙකින් යටපත් කරන ලද යනුයි. **වසං මාරසස ගචඡති** යනු ක්ලේශ මාරාදීන් විසින් කැමති පරිදි කළහැකි කටයුතු ඇත්තේ වෙයි යන මෙය ගාථාවේ පදාර්ථයයි. **පමාදං** යනු නොරක්නා ලද සිතින් යන මෙම පදය දොරටු සයකදී සිහිය අත්හැරීමේ ලක්ෂණය වූ ප්‍රමාදය කියයි යනුයි. **තං මච්චුනො පදං** යනු ඒ ප්‍රමාදය ගුණ මරාදමන හෙයින් මච්චුසංඛ්‍යාත මාරයාගේ වසඟයේ පවත්නා තැනයි. එහෙයින් නොරක්නා ලද සිතින් මාරයාගේ වසඟයට යයි යන

පළමු පාදය සතරවැනි පාදය සමග සම්බන්ධකොට දක්වයි. **සෝ විපල්ලාසෝ** යනු අනිත්‍ය වූ පංචස්කන්ධය නිත්‍යය යන යම් දැකීමක් වේද ඒ විපර්යාසය වැරදි ගැනීමකි. එහෙයින්ම **විපරීතගහාහ ලකඛණෝ විපල්ලාසෝ** යි කියන ලදී. සියල්ල විපර්යාස යන සාමාන්‍ය ක්‍රමයෙන් ගෙන එහි අධිට්ඨානය **කිං විපල්ලාසයකි** යනුවෙන් විමසයි.

සාමාන්‍යයේ ද විශේෂය අධිෂ්ඨාන භාවයෙන් ව්‍යවහාර කෙරෙනුයි **සඤ්ඤං චිත්තං දිට්ඨිං** යයි කියන ලදී. එය විපල්ලාසයති යන පදයෙන් සම්බන්ධ කළයුතුය. ඒවායින් සඤ්ඤා විපල්ලාසය සියල්ලට වඩා මෘදුය. තණකොළවලින් සෑදූ පුරුෂ රූවල පුරුෂයෙක් යනුවෙන් මුව පොව්වන් තුළ ඇති වූ හැඟීම මෙන් අනිත්‍ය ආදි විෂයයේ මිථ්‍යා වශයෙන් එළඹ සිටි ආකාරය ගැනීම් පමණකි. චිත්ත විපල්ලාසය ඊට වඩා බලවත් ය. මැණික් නො වන ආදි දේ විෂයයෙහි මැණික් ආදි ආකාරයෙන් එළඹ සිටි විට නිත්‍යාදි වශයෙන් සිටීම් මාත්‍රය එසේ සනිටුහන් වනු මෙනි. දිට්ඨි විපල්ලාසය වනාහි සියල්ලට වඩා බලවත්ය. යම් යම් අරමුණක් යම් යම් ආකාරයකින් එළඹ සිටී ද එය ඒ ඒ ආකාරයෙන් ශාස්වතාදී වශයෙන් මෙයම සත්‍යය අනෙක් ඒවා බොරුය යනුවෙන් ඇතුළත්ව පවතී. එහි සඤ්ඤා විපල්ලාසය චිත්ත විපල්ලාසයේ හේතුවයි. චිත්ත විපල්ලාසය දිට්ඨි විපල්ලාසයේ හේතුව වෙයි.

දැන් විපර්යාසයන්ගේ ප්‍රවෘත්ති ස්ථාන විෂය දැක්වීමට **සෝ කුහිං විපල්ලාසයති අත්තභාව වත්ථුසු** යයි කියන ලදී. එහි අත්තභාවවත්ථුසු යනු පංචඋපාදාන ස්කන්ධයන්හිය. ඒවායින් සකසන ලද්දේ අහං යන මානය මෙහි ඇත්තේනුයි අත්තා නම් වේ. ආත්මය මෙහි වෙයි යන බුද්ධි ව්‍යවහාරය ආත්ම භාවයයි. එයම සුභ ආදීන්ගේ විපර්යාසයට ද අධිෂ්ඨාන වන බැවින් වස්තු වූයේ **අත්තභාවත්ථු** යයි කියනු ලැබේ. **රූපං අත්තතෝ සමනුපස්සති** යනාදියෙන් ඒ සියලු විපර්යාසයන්ගේ මූලය වූ සක්කාය දිට්ඨියේ ප්‍රවෘත්ති ස්ථාන භාවයෙන් ආත්මභාව වස්තුත්වය දක්වා නැවතත් විපර්යාසයන්ගේ පැවතීම් ආකාරය සමග විෂයය බෙදා දක්වන්නට **රූපං පඨමං විපල්ලාසවත්ථු අසුභෙ සුභං** යයි කියන ලදී. ඒ සියල්ල මනාව දතයුතුය. නැවත මූලහේතු වශයෙන් විපර්යාසයන් බෙදා දක්වන්නට දෙව **ධම්මා චිත්තස්ස සංකිලෙසා** යනාදිය කියන ලදී. එහි අවිද්‍යාව නැති වුවත් තණ්හාව ද නැත්තේය. අවිද්‍යාව ද සුබ සුබ සංඥාවන්ගේ ප්‍රත්‍යයමය. එසේ වුවත් තණ්හාව ද ඒවායේ සාතිශය

ප්‍රත්‍යයයැයි දක්වන්නට **තණ්හා නිවුතං -පෙ- දුක්ඛෙ සුඛං** යැයි කියන ලදී. **දිට්ඨිනිවුතං** යනු දෘෂ්ටි යන මාතෘකාවෙන් අවිද්‍යාව කියන ලදී යනුයි. අවිද්‍යාවෙන් වටකරන ලද යන අර්ථයයි. මෙහිදී ඒකාන්තයෙන්ම තණ්හාවෙන් තොරවූ දෘෂ්ටියක් නැත. තණ්හාව ද දෘෂ්ටියේ හේතුවක් ම ය. තණ්හාව ද නිත්‍යය. ආත්මය යැයි නුනුවණින් ගැලෙන්නවුන්ගේ එසේ පැවති මිථ්‍යාභිනිවේශයේ මෝහය විශේෂ ප්‍රත්‍යයකැයි දක්වන්නට **දිට්ඨිවුතං -පෙ- අනත්තා** යි කියන ලදී. **යො දිට්ඨිවිපල්ලාසො** යනු අනිත්‍යයෙහි නිත්‍යය, අනාත්මයෙහි ආත්මය යැයි පැවති විපර්යාස දෙක සඳහා කියන ලදී. **සො අතීතං රූපං -පෙ- අතීතං විඤ්ඤාණං අතතතො සමනුපසසති** යන මෙයින් අටළොස් වැදෑරුම් වූ ද පූර්වාන්ත කල්පිකවාදය පශ්චිම වූ විපර්යාස දෙකින් වේයැයි දක්වයි. **තණ්හා විපල්ලාසො** යනු තණ්හා මූලික වූ විපර්යාසයයි. අසුභයෙහි සුභය දුක්ඛයෙහි සුඛය යන විපර්යාස දෙක සඳහා කියයි. **අනාගත රූපං අභිනන්දති** යනු අනාගත රූපය පිළිබඳව දැක සතුටුවීම් වශයෙන් සතුටුවෙයි යනුයි. **අනාගත වෙදනං සඤ්ඤං සංඛාරෙ විඤ්ඤාණං අභිනන්දති** යන මෙහි ද මේ ක්‍රමයමය. මෙයින් සතළිස් සතර වැදෑරුම් අපරාන්ත කල්පික වාදය බොහෝසෙයින් පළමු විපර්යාස දෙක ලෙසින් වේ යැයි දක්වයි.

දෙව ධම්මා චිත්තසස උපකකිලෙසා යනු මෙසේ මහා සාවද්‍ය වූ විපර්යාසයේ මූලකාරණයයි. විශේෂයෙන් චිත්ත උපක්ලේශ වූ කරුණු දෙකයි. **තණ්හා ච අවිජ්ජා ච** යනුවෙන් ඒවා ස්වරූප වශයෙන් දක්වයි. **තාහි විසුජ්ඣනතං චිත්තං විසුජ්ඣති** යනු ප්‍රතිපක්ෂ වශයෙන් ද ඒවායේ උපක්ලේශ භාවය ම පැහැදිලි කරයි. තණ්හා අවිද්‍යාවන් ප්‍රහීණ නොවූ කල්හි කිසි සංක්ලේශ ධර්මයක් ප්‍රහීණ නොවේ යනුයි. තණ්හා අවිද්‍යාවන්ගේ මූල කාරණය වූ විපර්යාසයන් යම්සේ ද සියලුම සසරෙහි මූල කාරණය ද එසේය. අනුසන්ධියට අනුව ගාථාව නිමවන්නට **නෙසං** යනාදිය කියන ලදී. එහි **නෙසං** යනු යම්කෙනෙකුන්ගේ නොරක්නා ලද සිත මිථ්‍යාදෘෂ්ටියෙන් මඩනා ලද ද ඔවුන්ගේ ය. **අවිජ්ජානිවරණානං** යනාදියෙන් මාරයාගේ වසඟයට යාමෙන් අනාදිමත් වූ සසරෙහි සැරිසැරීම දක්වයි.

ථීනමිද්ධාභිභූතෙන හි එසඃ ථීනං නාමා යනාදියෙන් ථීනමිද්ධයන්ගේ ස්වරූපය දක්වයි. ඒවායින් සිත මඩනා ලද බැවින් මනාව දතහැකි ම යැයි එය පරාමර්ශනය නොකොට ක්ලේශ මාරයාගේ ගැනීමෙන් ම ඊට

නිමිති වූ අභිසංස්කාර මාර, බන්ධමාර, මච්චුමාර ආදීන් ගන්නා ලදමැයි. **කිලෙස මාරසස ච සන්තතමාරසස ච** යන තැන ච ශබ්දයෙන් හෝ ඒවායේ ගැනීම කරන ලදැයි දතයුතුය. **සො හි නිවුතො සංසාරාභිමුඛො** යනු හෙතෙම කෙලෙස්වලින් මාර වසඟයට ගියේ එයින් ම වටකරන ලද්දේ යම්තාක් මාර බන්ධනය නොසිඳී ද ඒ තාක් සසරට අභිමුඛ වෙයි. සසරට අනභිමුඛ වූයේ නොවෙයි යන අදහසයි. මේ සත්‍ය දෙක භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. කෙසේ දෙසන ලද ද? එහිදී අභිධර්මය ආශ්‍රිත වූ ද සූත්‍රාන්ත නිශ්‍රිත වූ ද කථා දෙකකි. ඒවායින් අභිධර්ම නිශ්‍රිත කථාව නම්, (මෙයයි) **අරකඛිතෙන චිත්තෙන** යන තැන (රාගයෙන්) රත් වූ සිත ද අරක්ෂිතය. (නොරක්නා ලද්දකි) (ද්වේෂයෙන්) දූෂිත වූ සිත ද අරක්ෂිතය. (මෝහයෙන්) මුළා වූ සිත ද අරක්ෂිතය. එහි රත් වූ සිත අෂ්ටවිධ ලෝභ සහගත සිත් ලෙසින් දතයුතුය. දූෂිත වූ සිත දෙවැදෑරුම් පටිඝ සිත් ලෙසින් දතයුතුය. මුළා වූ සිත දෙවැදෑරුම් මෝහ සිත් ලෙසින් දතයුතුය. මේ සිත්වල ස්වරූපයෙන් යම්තාක් ඉන්ද්‍රියයන්ගේ ගුප්තිය, ගෝපනය පාලනය රක්ෂණය නොවේ ද සිහිවිකල් වූයේ පමා වූයේ සිත අසංවර වූයේ වේ ද මෙසේ අරක්ෂිත සිතක් ඇතිවේ. මිථ්‍යා දෘෂ්ටියෙන් මඩනා ලද සිත චතුර්විධ දිට්ඨි සම්පයුත්ත සිත් ලෙසින් දතයුතුය. මෙසේ නොගත යුතු දෙය ගැනීමෙන් සියලු අකුසල් සිත් වේ. ඒවා 'අකුසල ධර්ම කවරේ ද? යම්කලෙක අකුසල් සිත උපන්නේ වෙයි' ආදී වශයෙන් චිත්තුප්පාද කාණ්ඩයෙහි අකුසල් සිත් දේශනා කිරීම් වශයෙන් විස්තර වශයෙන් කිවයුතුයි.

මාරයාගේ යන මෙහි පංච මාරයෝ ය. ඔවුන්ගෙන් ක්ලේශ මාරයාගේ විභාගය සතර ආශ්‍රව, සතර ඕඝ, සතර යෝග, සතර ගන්ථ, සතර උපාදාන, අෂ්ට නීවරණ, දස ක්ලේශ වස්තු වශයෙන් කෙලෙස් පොකුරු ලෙසින් කියන ලද ක්‍රමයෙන් ද එසේම ජාතිවාදය, ගෝත්‍රමදය, ලිංගමදය, ආරෝග්‍ය මදය ආදියෙන් බුද්දක වස්තු විභංගයෙහි ආ සප්ත ක්ලේශයන්ගේ වශයෙන් ද දතයුතුයි. මේ වනාහි මෙහි අභිධර්ම නිශ්‍රිත කථාවයි.

සූත්‍රාන්ත නිශ්‍රිතව වනාහි **අරකඛිතෙන චිත්තෙන** යනු මෙයයි. ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ වෙයි. අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් හේතුවකින් චක්ඛුරින්ද්‍රියේ අසංවරය වාසය කරනුයේ අභිධ්‍යා, දොම්නස් ආදී පාපී අකුසල් දහම් සොයන්නාහ. එහි සංවරයට නො පැමිණෙත්.

චක්ඛුරින්ද්‍රිය නොරකී. චක්ඛුරින්ද්‍රියේ සංවරයට නොපැමිණේ. කණෙන් -පෙ- නාසයෙන් -පෙ- දිවෙන් -පෙ- කයින් -පෙ- සිතින් -පෙ- මනින්ද්‍රියෙහි සංවරයට නොපැමිණේ. මෙසේ ආරක්ෂිත සිත ඇත්තේ වෙයි. **මිච්ඡාදිට්ඨි හතෙන ච** යන තැන මිථ්‍යා දෘෂ්ටියෙන් මඩනා ලද සිත නම් පූර්වාන්ත කල්ප වශයෙන් හෝ අපරාන්ත කල්ප වශයෙන් හෝ පූර්වාන්ත අපරාන්ත කල්ප වශයෙන් හෝ මිථ්‍යාවෙහි ගැලෙන්නහුගේ, නුණුවනින් ගිලෙන්නහුගේ ලෝකය ශාස්වතය කියා හෝ -පෙ- තථාගත තෙම මරණින් මතු නොවේ. නොවන්නේ නොවේ යනුවෙන් යම් දෘෂ්ටියක් වේ ද එයින් මඩනා ලද සිතයි. යම් මේ ශාස්වතවාද සතරක් ද -පෙ- පරම දිට්ඨි ධම්ම නිබ්බාණ පසක් ද වශයෙන් බ්‍රහ්මජාල සූත්‍රයෙහි ත්‍රිවිධ ප්‍රපඤ්චයෙහි ආ දෙසැටක් දෘෂ්ටිනු ද වශයෙන් සිතෙහි මිථ්‍යාදෘෂ්ටියෙන් මඩනා ලද බව කිවයුතුය.

ථීනමිද්ධාභිභූතෙන යන තැන ථීන නම් සිතෙහි අකර්මණ්‍යතාවයි. මිද්ධය නම් වේදනා ආදී ස්කන්ධ තුනෙහි අකර්මණ්‍යතාවයි. එසේම ථීන යනු අනුත්සාහයන් නැසීමයි. මිද්ධ යනු ශක්ති නොවන දේ නැසීමයි. මෙසේ ථීනයෙන් ද මිද්ධයෙන් ද සිත මඩනා ලද්දේ බැසගත්තේ, පීඩාවට පත්වූයේ, හැකිලුමට පත්වූයේ ලයාපන්න වූයේ වෙයි. **වසං මාරස්ස ගච්ඡති** යන තැන වසඟය නම් ඉච්ඡා, ලෝභ, අධිප්පාය, රුචි ආකංඛා, ආණ, ආණත්ති යනුයි. මාරයා යනු ඛන්ධමාර අභිසංඛාර මාර, මච්චුමාර, දේවපුත්තමාර, කිලෙසමාර යන පස්මරුන්ය. ගච්ඡති යනු ඔවුන්ගේ වසඟයට, ඉච්ඡාවට, -පෙ- ආඥාවට යයි පැමිණෙයි. පවති. අනුව පවතී නොඉක්මවයි යනුයි. එහෙයින් මාරයාගේ වසඟයට යේ යැයි කියනු ලැබේ.

එහි කියන ලද අකුසල ධර්ම වූ තණ්හා අවිද්‍යාව හෝ සමුදය සත්‍යයයි. යම් ඒ පුද්ගලයෙක් මාරයාගේ වසඟයට යේ යැයි කියන ලද්දේ ද එයම පංච උපාදානස්කන්ධ නිසා පනවන ලද්දේය. ඒ පංචස්කන්ධ දුක්ඛ සත්‍යයයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්‍ය දෙකක් දෙන ලදහ. එහෙයින් ම **දුකඛං සමුදයො ච යි** කියන ලදී. **තෙසං භගවා පරිඤ්ඤාය ච පහාණා ච ධම්මං දෙසෙති** යනුවෙන් කියන ලද අර්ථය ඉතා ප්‍රකට කරන්නට **දුකඛසස පරිඤ්ඤාය සමුදයසස පහාණාය** යැයි කියන ලදී. කෙසේ දේශනා කෙරේ ද?

තසමා රකඛිත චිත්තස්ස සම්මා සංකප්ප ගොචරෝ
සම්මා දිට්ඨිං පුරෙකඛිත්වා ඤත්වාන උදයබ්බයං
ථීන මිද්ධාභිභූ භික්ඛු සබ්බා දුගතියෝ ජහෙති

එහෙයින් සම්මා සංකප්පයට ගෝචර වූ ථීනමිද්ධයෙන් මඩනා ලද භික්ෂුව සම්මා දිට්ඨිය පෙරටුකොට රක්නා ලද සිතෙහි හටගැන්ම හා විනාශය දැනගෙන සියලු දුගති අත්හරනේය යන ගාථාවෙනි.

එහි අර්ථය මෙයයි. **යම්හෙයකින් නොරක්නා** ලද සිතින් මාරයාගේ වසඟයට යේ ද එහෙයින් **සති සංවරයෙන් මනස** සවැනි කොටගත් ඉන්ද්‍රියයන්ගේ රක්ෂණයේ රකින ලද සිත් ඇත්තෙක් වන්නේය යනුයි. **සම්මා සංකප්ප ගොචරෝ** යනු යම්හෙයකින් කාම සංකල්ප ආදි මිථ්‍යා සංකල්පයට ගෝචර වූ දෙය ඒ ඒ ආකාරයෙන් නුණුවනින් විකල්පනය කොට නන්වැදෑරුම් මිථ්‍යා දර්ශනයන් ගනියි. එයින් ද මිථ්‍යා දෘෂ්ටියෙන් මඩනා ලද සිතින් මාරයාගේ වසඟයට යයි. එහෙයින් යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරනුයේ නෙක්ඛම්ම සංකප්ප ආදි සම්‍යක් සංකල්පයට ගෝචර වන්නේය.

සම්මා දිට්ඨිං පුරෙකඛිත්වා යනු සම්මා සංකප්පයට ගෝචර වන බැවින් දුරුකරන ලද මිථ්‍යා දර්ශනය ඇත්තේ කම්මස්සකතා ඤාණය ද යථාභූත ඤාණ ලක්ෂණය ද සම්මා දිට්ඨිය පෙරටුකොට සීල සමාධි ආදියෙහි යෙදුනේ යනුයි. එයින් ම ද **ඤත්වාන උදයබ්බයං** උදය - ව්‍යය දැනගෙන පංච උපාදානස්කන්ධයන්හි සමපණස් ආකාරයන් ගෙන් උපන් නිරෝධය ද දැනගෙන විදර්ශනාව පිළිබඳව උනන්දු කරවා අනුක්‍රමයෙන් ආර්ය මාර්ගය ගනු ලබන්නේ අග්‍ර වූ මාර්ගය කරණ කොටගෙන ථීන මිද්ධයෙන් මඩනා ලද ථීන මිද්ධාභිභූ භික්ඛු සබ්බා දුගතියෝ ජහෙති භික්ෂුව සියලු දුගති දුරු කරන්නේය. මෙසේ සර්වප්‍රකාරයෙන් බිඳුණු කෙලෙස් ඇති බැවින් ක්ෂීණාශ්‍රව භික්ෂුව ලැබෙන පරිදි ත්‍රිවිධ දුක්ඛතාවේ යෙදීමෙන් දුගති සංඛ්‍යාත සියලු ගති අත්හරින්නේය. ඒවාට එහායින් වූ නිවනෙහි සිටින්නේය යන අර්ථයයි.

යං තණ්හාය ච අවිජ්ජාය ච පහාණං අයං නිරොධෝ යනු ප්‍රහාණය වූ නිරෝධයේ හේතුව බැවින් අසංඛත ධාතුව ප්‍රහාණ නිරෝධය යැයි ද කියන ලදී. **ඉමානි චතතාරි සච්චානි** යන මුල් ගාථාවේ මුල් දෙක ද

දෙවැනි ගාථාවේ පසු දෙක ද යන ගාථා දෙකින් කියන ලද මේ ආර්ය සත්‍ය සතරයි. ඒවායින් සමුදය සත්‍යයෙන් ආශ්වාදය ද දුක්ඛ සත්‍යයෙන් ආදීනවය ද මාර්ග නිරෝධ සත්‍යවලින් නිස්සරණය ද ගැනේ. සියලු ගති හැරීම ඵලයයි. රක්නා ලද සිත් ඇති බව ආදි උපාය ද නොරක්නා ලද සිත් ඇති බව ආදි නිෂේධ මුඛයෙන් රක්ෂිත චිත්ත ආදියේ නියෝජනය භාග්‍යවතුන් වහන්සේගේ ආඥාවක් ම ය. මෙසේ දේශනා හාරයේ පදාර්ථ වූ ආශ්වාදාදිය වෙන්කළ යුතුය. එහෙයින්ම **නියුත්තෙනා දෙසනා හාරොයි** කියන ලදී.

දේශනාහාර සම්පාත වර්ණනාව නිමි.

මෙසේ දේශනාහාර සම්පාතය දක්වා දැන් විචයහාර සම්පාතය දක්වනුයේ යම්හෙයකින් දේශනා හාරයේ පදාර්ථ විමසීම විචරය හාරය වේ ද එහෙයින් දේශනාහාරයෙහි විපර්යාස හේතුව ලෙසින් වෙන්කොට ගත් තණ්හාවේ කුශල ආදී විභාගය විමසීම් මුඛයෙන් විචයහාර සම්පාතය දක්වන්නට **තත්‍ථ තණ්හා දුවිධා** යනාදිය අරඹන ලදී. එහි **කුසලා** යනු කුසලධර්ම පිළිබඳ අරමුණු ය. මෙහිදී කුසල ශබ්දය බාහිතික සූත්‍රයේදී මෙන් අවිද්‍යාර්යේ දතයුතුය. මෙහිදී කවර හෙයින් තණ්හාව කුශල පර්යායයෙන් උපුටන ලද ද? ඉහත දේශනාහාරයෙහි විපර්යාස හේතුව ලෙසින් තණ්හාව උපුටා ඊට අනුකූලව සංකිලේස පක්ෂය දක්වන ලදී. විසිතුරු වැටහීම් ඇති බැවින් මෙහිදී ද තණ්හා ශීර්ෂයෙන් වොදාන පක්ෂය දක්වන්නට කුසල පර්යායයෙන් තණ්හාව උපුටන ලදී. එහි සසරට යේ නුයි **සංසාර ගාමිනී** නම් වේ. සසරේ නායිකාව යන අර්ථයයි. අපචය නම් නිවනට යේනුයි **අපචයගාමිනී** නම් වේ. කෙසේ නම් තණ්හාව අපචයගාමිනී වේ ද? (ඊට පිළිතුරු) ප්‍රකාශ කරන ලදී. **පහාණ තණ්හා** යනු තදංග ප්‍රහාණයට හේතු වූ තණ්හාවයි.

කෙසේ නම් ඒකාන්තයෙන් සාවද්‍ය වූ තණ්හාවේ කුශල භාවයක් ඇතිවේ ද? ඇසුරුකළ යුතු බැවිනි. තණ්හාව යම් සේ ද මෙසේ මානය ද කුසල යනුවෙන් ද අකුසල යනුවෙන් ද දෙවැදෑරුම්ය. තණ්හාව ම පමණක් නොව තණ්හාව දැක්වීම් වශයෙන් මානය කියන ලදී. එහිදී

මානය පිළිබඳව කැමති පරිදි කුසල ආදී ස්වරූපය දක්වන්නට **යං මානං නිසස්සාය** යනාදිය කියන ලදී. 'දේවානමිඳය, මම මානය ද දෙවැදෑරුම්ව දක්වමි. ඇසුරු කළ යුතු හා නොකළ යුතු වශයෙනි' යනුවෙන් මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ද ප්‍රකාශ කරන ලදී. **යං නෙක්ඛම්මසිතං දොමනසසං** යනාදිය කුසල යැයි කියන ලද තණ්හාවේ ස්වරූපය දැක්වීම සඳහා කියන ලදී. එහි නෙක්ඛම්මය ඇසුරු කළ දොම්නස නම් (මෙයයි) එහි නෙක්ඛම්මය ඇසුරු කළ සවැදෑරුම් දොම්නස කවරේ ද? රූපයන්ගේ අනිත්‍යතාව දැනගෙන විපරිනාම විරාග නිරෝධය රූපයට පෙරසේ ම දැනුදු ඒ සියලු රූප අනිත්‍යය දුකය වෙනස්වන ස්වභාව ඇතැයි තතු පරිදි මනා ප්‍රඥාවෙන් දැක අනුත්තර වූ විමෝක්ෂයන්හි කැමැත්ත එළවාලයි. ආර්යයෝ දැන් යම් ආයතනයකට පැමිණ වෙසෙත් ද, මම කවදා නම් ඒ ආයතනයට පැමිණ වෙසෙම්ද යනුවෙන් අනුත්තර වූ විමෝක්ෂයන්හි කැමැත්ත (ආශාව) එළවනුයේ ආශාව උපදී. ආශා හේතුවෙන් (ආශාව) එළවනුයේ ආශාව උපදී. ආශා හේතුවෙන් දොම්නස ඇතිවේ. මෙවන් වූ යම් දොම්නසක් වේ ද එය නෙක්ඛම්ම සිත දෝමනස්ස යැයි කියනු ලැබේ. මෙසේ සදොරෙහි ඉෂ්ට වූ අරමුණු ඉන්ද්‍රිය හමුවට පැමිණි කල්හි අනුත්තර විමෝක්ෂ සංඛ්‍යාත ආර්ය ඵල ධර්මයන්හි ආශාව ඇතිකොට ගෙන එය ලැබීම සඳහා අනිත්‍යාදි වශයෙන් විදර්ශනාව එළවා උත්සුක කිරීමට ද නොහැකි පුද්ගලයාට මේ පක්ෂය ද මේ මාසය ද මේ වසර ද විදර්ශනාව පිළිබඳව උත්සුක කරවා ආර්ය භූමියට පැමිණෙන්නට නොහැකියැයි ශෝක කරන්නා තුළ ඇති වූ දොම්නස නෙක්ඛම්ම වශයෙන්, විදර්ශනා වශයෙන් අනුස්සති වශයෙන්, ප්‍රථමධ්‍යානාදි වශයෙන් ප්‍රතිපත්ති හේතුවක් නොමැති බැවින් උපදිනුයේ නෙක්ඛම්ම සිත දොම්නස නම් වේ.

අයං තණහා කුසලා යනු මේ පිහා යැයි කියන ලද තණ්හාව කුසල වේ යනුයි. කෙසේ ද? **රාග විරාගා චෙතො විමුතති තදාරම්මණා කුසලා** යන මෙය කියන ලද්දේ වෙයි. රාග විරාගයෙන් චේතෝ විමුත්තිය වේ. ස්වභාවයෙන් කුසල් නොවේ. නිවැරදි අර්ථයෙන් කුසල් වේ. ඒ උදෙසා පැවති එහි අරමුණ වන තණ්හාව **කුසල්** අරමුණක් බැවින් කුසල වේ. අවිද්‍යා විරාගයෙන් පඤ්ඤා විමුත්තිය වේ. නිරවද්‍ය අර්ථයෙන් **කුසල වේ. තසසා** යනු පඤ්ඤා විමුත්තියෙහිය. යම් ප්‍රයෝජනයක් ලෙසින් **තසමා රකඛිත චිතතසස** යන ගාථාවෙහි සියලු දුගති දුරු කෙරේ යයි කියන ලද ද

මෙසේ අධිකව විදර්ශනා පිරිවෙස වැස දුක්ඛ පටිපදාව දන්ධාභිඥාවෙන් අවබෝධ කළ කල්හි පඤ්ඤා විමුත්තිය ලෙසින් විවයහාර සම්පාතය දක්වන්නට **තසසාකෝ පවිවයෝ** යනාදිය අරඹන ලදී.

එහිදී යම්හෙයකින් පඤ්ඤා විමුත්තිය ආර්ය මාර්ග මූලික වේ ද එහෙයින් චතුර්ථ ධ්‍යානයට පාදක වූ ආර්ය මාර්ග ධර්ම උදෙසා ඒවායේ ආ පිළිවෙල දක්වන්නට **කත්‍ථ දට්ඨබ්බා චතුත්ථජ්ඣානෙ** යයි කියන ලදී. එහි **පාරමිතාය** යනු උසස් බවට පැමිණි චතුර්ථ ධ්‍යාන භාවනාවේ ය. යම් අංග අටකින් යුක්ත වූ චතුර්ථධ්‍යාන සිත ප්‍රකාශ කරන ලද ද ඒ අංග දක්වන්නට **පරිසුද්ධං** යනාදිය කියන ලදී. එහිදී උපේක්ෂා සති පාරිශුද්ධත්වයෙන් පිරිසිදු වූයේය. පිරිසිදු බැවින්ම පරියොදාත නම් වේ. ප්‍රභාස්වර වූයේය යනුවෙන් ද කියන ලද්දේ වෙයි. සුඛාදීන්ගේ ප්‍රත්‍ය නසන බැවින් විතරාග ආදි අංගණ ඇති බැවින් **අනංගණ** නම් වේ. අනංගණ බැවින් ම පහ වූ උපක්ලේශ ඇති වේ. කෙලෙස්වලින් ම සිත කෙලෙසයි. මනාව වර්ධනය කළ බැවින් මෘදු වූයේය. වසඟ බවට පැමිණි යන අර්ථයයි. වසඟයෙහි පවතින සිත මුදුයැයි කියනු ලැබේ. මෘදු බැවින් ම **කම්මනිය** වේ. ක්‍රියාවට සුදුසු යෝග්‍ය යන අර්ථයයි. මෘදු සිත මනාව පිරිසිදු කළ රත්තන් මෙන් ක්‍රියාවට සුදුසු වේ. ඒ දෙක ම මනාව වඩන ලද හෙයිනි. එය මෙසේ කියන ලදී. 'මහණෙනි, යමක් මෙසේ වර්ධනය කරන ලද්දේ මෘදු ද වෙයි. කර්මණ්‍ය ද වෙයි. මහණෙනි, එනම් සිතයි. මම එවන් වෙනත් කිසිවක් නොදකිමි' යනුවෙනි. මේ පිරිසිදු බව ආදියෙහි සිටි බැවින් **ඨිත** නම් වේ. සිටි බැවින්ම **ආනෙඤ්ජපපත්ත** නම්. නොසැලෙන කම්පා රහිත යන අර්ථයයි. මෘදු බැවින් හෝ කර්මණ්‍ය බැවින් හෝ තමාගේ වසඟයේ සිටි බැවින් ඨිත නම්. ශ්‍රද්ධාදිය විසින් පරිගෘහිත බැවින් ආනෙඤ්ජපපත්ත නම්. ශ්‍රද්ධාවෙන් අල්ලාගත් සිත අශ්‍රද්ධාවෙන් කම්පිත නොවේ. වීර්යයෙන් අල්ලාගත් සිත කුසීත බැවින් කම්පිත නොවේ. සිහියෙන් අල්ලාගත් සිත ප්‍රමාදයෙන් කම්පිත නොවේ. සමාධියෙන් අල්ලාගත් සිත් උඩඟු බවින් කම්පිත නොවේ. ප්‍රඥාවෙන් අල්ලාගත් සිත අවිද්‍යාවෙන් කම්පිත නොවේ. ආලෝකයට ගිය සිත කෙලෙස් අඳුරෙන් කම්පිත නොවේ. මේ කරුණු හයෙන් අල්ලාගත් සිත ආනෙඤ්ජපපත්ත වෙයි. මෙසේ අංග අටකින් සමන්විත වූ සිත ප්‍රාර්ථනාවට සුදුසු වෙයි. විශිෂ්ට ඤාණයන්ගෙන් සාක්ෂාත් කරගත යුතු ධර්මයන් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරනු පිණිස ප්‍රාර්ථනා කළේ වෙයි.

අනෙක් ක්‍රමයක් ද වේ. චතුර්ථධ්‍යාන සමාධියෙන් සමාහිත වූ සිත නීවරණ දුරුකළ බැවින් පිරිසිදුය. විතර්කාදිය සන්සිඳුවන බැවින් පරියෝදාතය (හාත්පසින් පිරිසිදුය) ධ්‍යාන ප්‍රතිලාභයට විරුද්ධ වූ පාපී වූ අභිමත හැසිරීම්වල අභාවයෙන් අනංගණය. **ඉච්ඡාවචරානං** යනු කැමැත්තෙන් හැසිරෙන්නවුන්ගේ කැමැත්තට අනුව බැසගත් ඒ අනුව පැවති නන්වැදෑරුම් වූ කෝප හේතූන්ගේ යන අර්ථයයි. අභිධ්‍යා ආදී චිත්තෝපක්ලේශයන්ගේ පහවීමෙන් විගතූපක්ලේශ වේ. මේ දෙකම අනංගණ සූත්‍රය, වත්ථ සූත්‍රය ලෙසින් දතයුතුය. වසඟ බවට පත් බැවින් මෘදු වූයේය. ඉද්ධිපාදවලට පැමිණීමෙන් කර්මණ්‍ය වේ. භාවනා පරිපූර්ණත්වයෙන් ප්‍රණීත බවට පැමිණීමෙන් ආනෙඤ්ජපපත්ත වේ. යම්සේ ආනෙඤ්ජ බවට පත්වූයේ ද එය ආනෙඤ්ජපපත්ත නම් වේ. මෙසේ සිටි යන අර්ථයයි. මෙසේ ද අංග අටකින් යුක්ත වූ සිත ප්‍රාර්ථනාවට සුදුසු වෙයි. විශිෂ්ට ඥානයෙන් සාක්ෂාත් කළයුතු ධර්මයන් විශිෂ්ට ඥානයෙන් සාක්ෂාත් කරනු පිණිස පාදක වූයේ ආසන්න කරුණ ද වෙයි. එහෙයින්ම **සො තත්ථ අට්ඨවිධං අධිගච්ඡති ඡ අභිඤ්ඤා දෙව ච විසෙසෙ යි** කියන ලදී. එහි **සො** යනු ලබන ලද සතරවැනි ධ්‍යානය ඇති යෝගාවචරයායි. **තත්ථ** යනු ඒ ස්ථිර වූ චතුර්ථ ධ්‍යානයෙහි යනුයි. අට්ඨවිධං අධිගච්ඡති යනු අෂ්ටවිධ ගුණය අවබෝධ කරයි යනුයි. ඒ අෂ්ටවිධ ගුණය කවරේ ද? (එය මෙසේ) කියන ලදී. **ඡ අභිඤ්ඤා දෙව ච විසෙසෙ යි** කී පරිදි ෂට් අභිඥා මනෝමය ඍද්ධිය හා විදර්ශනා ඥානයයි. **තං චිත්තං** යනු චතුර්ථධ්‍යාන සිතයි. **යතො පරිසුද්ධං තතො පරියොදාතං** යනාදියෙන් පළමු පළමු දේ පසුව පසුව ඇති දෙයට හේතුවදන් යැයි දක්වයි. **තදුභයං** යනු යම් රාගාදි ක්ලේශයන්ගේ ද අභිධ්‍යා ආදී උපක්ලේශයන්ගේ ද අභාවයෙන් අනංගණ වේ. පහ වූ කෙලෙස් යැයි කියන ලද ඒ අංගණයන් ද උපක්ලේශ ද යන ඒ දෙකයි. ඒ දෙකම තෘෂ්ණා ස්වභාව ඇති බැවින් ද තණ්හාවට විරුද්ධ නොවන බැවින් ද **තණ්හාපෙක්ඛ** නම් වේ. **යාව ඉඤ්ජනා** යනු සිතේ නොසන්සුන්කමෙන් යම් ස්එන්දනයක් වේ නම් එයයි. **අට්ඨිති** යනු නොසිටීමයි. **අයං දිට්ඨිපෙක්ඛා** යනු යම් කම්පාවක් ද නොසිටීමක් ද වේ නම් එය මිථ්‍යාවට ප්‍රවේශවීමට හේතුවක් බැවින් දිට්ඨිපට්පක්ඛ නම් වේ යනුයි. **චතස්සාරි ඉන්ද්‍රියානි** ආදියෙන් වේදනාවෙන් ද චතුර්ථ ධ්‍යානය පැහැදිලි කෙරේ. මෙසේ අංග අටකින් යුක්ත වූ චතුර්ථධ්‍යාන සිත මත්තෙහි අභිඥා ලබාගැනීම පිණිස ඉදිරියට ගෙන ඒමට සුදුසු වෙයි. ඒ අභිනීහාර ක්ෂමතාව දාහතර ආකාරයකින් පුරුදු කරන ලද වසඟ බව ඇත්තාට ම වෙයි. ඒ වශීභාවය ද අෂ්ට සමාපත්ති ලාභියාටයි.

රූපාවචර ධ්‍යාන මාත්‍රය පමණක් ලබාගත් තැනැත්තාට නොවේ යයි අරූප සමාපත්තියේ මනසිකාර විධිය දක්වනුයේ **සො උපරිමං සමාපතනිං සනතතො මනසි කරොති** යනාදිය කියන ලදී. **තසා උපරිමං සමාපතනිං** යනු ආකාසානඤ්චායතන සමාපත්තියයි. **සනතතො මනසි කරොති** යනු අංග ඇතිවිට ද අරමුණු ඇතිවිට ද ඇතැයි මෙනෙහි කරයි. යම් යම් හෙයකින් අරූප සමාපත්තිය විද්‍යමාන ලෙසින් මෙනෙහි කරයි ද ඒ ඒ ආකාරයෙන් රූපාවචර ධ්‍යානය නොසන්සුන්ව එළඹ සිටී. එහෙයින් ම **තසස උපරිමං** -පෙ- **සණටහති** යි කියන ලදී. පටිඝ සංඥා සංඛ්‍යාත වූ පංච විඤ්ඤාණ සංඥාවන්හි නොඇල්ම පිහිටයි. **සො සබබසො** යනාදියෙන් එක් ආකාරයකින් අරූප සමාපත්තිය දක්වයි. **අභිඤ්ඤාභිනිහාරො රූපසඤ්ඤා** යනු රූපාවචර සංඥාව නම් වූ මෙය යම්තාක් අභිඥා පිණිස වූ ප්‍රාර්ථනා මාත්‍රයකි යනුයි. අරූපාවචර සමාපත්ති මෙන් විද්‍යමාන නොවේ යන අදහසයි.

වොකාරො නානතත සඤ්ඤා යනු නානත්ත සංඥා නම් වූ මෙය නොයෙක් අරමුණුවල ස්කන්ධයයි. එහිදී සිතේ ආකුල පැවැත්මක් ඇත යන අර්ථයයි. **සමතිකකමති** යනු මෙසේ එහි ආදීනව දක්නෙක්ව ඒවා ඉක්මවයි යනුයි. **පටිඝසඤ්ඤා වසස අබභඤං ගචඡති** යනු ආකාසානඤ්චායතන සමාපත්තිය අවබෝධ කරන්නා වූ මේ යෝගියාගේ දස පටිඝ සංඥාවන් ඉවත් වේ යනුයි. මෙයින් පළමු අරූප සමාපත්තිය කියන ලදී. **එවං සමාහිතසස** යනු මෙසේ මේ කියන ලද ක්‍රමයෙන් රූපාවචර ධ්‍යානයෙහි චිත්ත ඒකාග්‍රතාව ඉක්මවීමෙන් එකඟ වූවහුගේ ය. **සමාහිතසස** යනු අරූප සමාධියෙන් සන්සුන් වූ පැවතුම් ඇති සමාහිතයාගේ ය. **ඔහාසො** යනු පෙර යම් රූපාවචර ධ්‍යාන ආලෝකයක් වේ ද එයයි. **අනතරධායති** යනු ඒ රූපාවචර ධ්‍යානාලෝකය අරූපාවචර ඣානයට සමවදින කල්හි පහව යයි යනුයි.

දසසනඤ්ච අනතරධායති යනු රූපාවචර ධ්‍යාන ඇසින් දර්ශනය ද අතුරුදන් වේ යනුයි. **සො සමාධි** යනු පෙර කියන ලද ඒ රූප අරූප සමාධියයි. **ඡළඞගසමනනාගතො** යනු උපකාරක, පරිකබාර ස්වභාවය වූ අංග හයෙන් යුක්ත වූ යනුයි. **පචචවෙකඛිතබබො** යනු ආපසු බැලිය යුතු යනුයි. නැවත නැවත සිතිය යුතුය යන අර්ථයයි. ප්‍රත්‍යවේක්ෂා කරන ආකාරය විෂය සමග දක්වන්නට **අනභිඡඣාසහගතං** යනාදිය කියන ලදී. එහි **සබබලොකෙ** යනු සියලු ප්‍රිය රූපයෙහි ද සැප රූපයෙහි ද

සත්ත්ව ලෝකයේ ද සංස්කාර ලෝකයේ ද යනුයි. එයින් කාමච්ඡන්දයේ ප්‍රහාණය කියන ලදී. එසේම **අබ්‍යාපනනං** යනාදියෙන් ව්‍යාපාදය, කුසීත බව, එකට එක කිරීම, කපටිකම, ආකුලත්වය, මූර්ඡාව ආදියේ ප්‍රහාණය දක්වන ලදී. නැවත ඒ අංග හය සමථ විදර්ශනා වශයෙන් බෙදා දක්වන්නට **යඤ්ච අනභිජ්ඣා සහගතං** යනාදිය කියන ලදී. ඒ සියල්ල මනාව දත හැකිය.

මෙපමණකින් පඤ්ඤා විමුක්තියයි කියන ලද අරහත් ඵලයේ සමාධිය ලෙසින් පූර්වභාග ප්‍රතිපදාව දක්වා දැන් අර්හත් ඵල සමාධිය දක්වන්නට **සෝ සමාධි** යනාදිය කියන ලදී. එහි **සෝ සමාධි** යනු යම් ඒ සම්මා සමාධියක් වේ ද එයයි. පෙර කියන ලද ආර්ය මාර්ග සමාධියේ ඵලය වූ සමාධියයි. **පඤ්ච විධෙන** වෙදිතබ්බා යනු දැන් කියනු ලබන පස්වැදෑරුම් ප්‍රත්‍යවේක්ෂණ ඥානයන්ගෙන් තමා විසින් ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ආකාර සංඛ්‍යාත පස්වැදෑරුම් බවින් දතයුතුය යනුයි.

අයං සමාධි පච්චුපපනන සුඛෝ චෙව යනාදියෙහි අර්හත් ඵල සමාධියට සමවැදුණු සමවැදුණු මොහොතෙහි සුඛයක් බැවින් පවත්නා වූ සැපයයි. පළමු පළමු දෙය පසු පසු සමාධි සැපයට ප්‍රත්‍යවන බැවින් **මත්තෙහි සැප විපාක ඇත්තේ** වෙයි. කෙලෙස්වලින් දුර බැවින් **අරිය** නම් වේ. කාම ආමිස, වට්ට ආමිස, ලෝක ආමිසයන්ගෙන් තොර බැවින් **නිරාමිස** නම් වේ. බුද්ධාදි මහා පුරුෂයන් විසින් ඇසුරුකරන ලද බැවින් **අකාපුරිස සෙවිත** නම් වේ. අංග සන්තතියෙන් ද සියලු කෙලෙස් දාහ සන්තතියෙන් ද යුක්ත වූයේ නම් වෙයි. අතෘප්තිකර අර්ථයෙන් **ප්‍රණීත** නම් වේ. කෙලෙස් සන්සිඳුවීමෙන් ලබන ලද බැවින් ද කෙලෙස් සන්සිඳුවන හෙයින් හෝ ලබන ලද බැවින් **පටිපපසසද්ධි** ලද්ධෝ නම් වේ. පස්සද්ධ, පස්සද්ධි යන මෙය අර්ථ වශයෙන් එකකි. සන්සිඳුණු ක්ලේශයෙන් හෝ රහත් බව ලබන ලද බැවින් ද **පටිපපසසද්ධ** ලද්ධ නම් වේ. එකඟ බැවින් අවබෝධ කළ බැවින් හෝ එකඟ බව අවබෝධ කළ බැවින් **එකොදිභාවාධිගතෝ** නම් වේ. අල්ප ගුණ ඇති ආශ්‍රව සහිත සමාධිය මෙන් සංඛාර සහිත ප්‍රයෝග සහිත විරුද්ධ ධර්මයන් නිග්‍රහ කොට, කෙලෙස් වළක්වා අවබෝධ නොකරන ලද බැවින් **න සසංඛාර නිගහයහ වාරිතවතෝ** නම් වේ.

යම් යම් කොටසකින් ඒ සමාධියට සමවදිනුයේ එයින් හෝ නැගී

සිටිනුයේ සිහියෙන් විපුලත්වයට පත් වූයේ සිහි ඇතිව ම සමවදියි. සිහි ඇතිව ම නැගී සිටියි. සීමාකළ කාල වශයෙන් හෝ සිහි ඇතිව සමවදියි. සිහි ඇතිව නැගී සිටියි. එහෙයින් මෙහිදී යම්විටෙක මේ සමාධිය දැන් සැප ඇත්තා සේ ම මත්තෙහි ද සැප විපාක ඇති කෙරේ යයි ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට වෙන් වෙන්ව ම අනුන්ගේ කීමෙන් නො අදහන ඤාණය උපදී. මේ එක් ආකාරයකි. සෙස්සෙහි ද මේ ක්‍රමයමැයි. මෙසේ මේ ප්‍රත්‍යවේක්ෂා කළයුතු ආකාර පසට අනුව සමාධිය පස්වැදෑරුම්ව දතයුතුය.

නැවත **යො ච සමාධි** ආදියෙන් අරහත් ඵලයෙහි සමථ විදර්ශනා විභාගය දක්වයි. එහි සමාධි සුඛය සුඛය යැයි අදහස් කරන ලද බැවින් **යො ච සමාධි පචචුපපනෙන සුඛො ආයතිං සුඛවිපාකො අයං සමථො** යයි කියන ලදී. ආර්ය නිරාමිස බව ආදිය ප්‍රඥානුභාවයෙන් උපදීයැයි **යො ච සමාධි අරියො** -පෙ- **අයං විපසසනා** යි කියන ලදී.

මෙසේ අර්හත් ඵල සමාධිය විභාග වශයෙන් දක්වා දැන් එහි පූර්වභාග ප්‍රතිපදාව සමාධි විභාගයෙන් දක්වන්නට **සො සමාධි** යයි කියන ලදී. එහි **සො සමාධි** යනු යම් ඒ රූපාවචර චතුර්ථ ධ්‍යාන සමාධියක් අර්හත් ඵල සමාධියේ පූර්වභාග ප්‍රතිපදාවේදී කියන ලද ද එයයි. **සො සමාධි පඤචවිධෙන** යනු කියනු ලබන පස් ආකාරයෙන් දතයුතුය යනුයි. **පීති ඵරණතා** යනාදියෙහි ප්‍රීතිය පැතිරෙමින් උපදියි යන අර්ථයෙන් ධ්‍යාන දෙකෙහි ප්‍රඥාව **පීතිඵරණතා** නම් වේ. සැපය පැතිරෙමින් උපදියි යන අර්ථයෙන් ත්‍රිවිධ ධ්‍යානයන්හි ප්‍රඥාව **සුඛ ඵරණතා** නම් වේ. අනුන්ගේ සිත පැතිරෙමින් උපදියි යන අර්ථයෙන් චේතොපරිය ප්‍රඥාව චෙතොඵරණතා නම් වේ. ආලෝකයේ පැතිරීම උපදියි යන අර්ථයෙන් දිබ්බචක්ඛු ප්‍රඥාව **ආලෝක ඵරණතා** නම් වේ. ප්‍රත්‍යවේක්ෂණ ඤාණය **පචචවෙකඛණා නිමිතතං** නම් වේ. එය කියන ලදී. 'ධ්‍යාන දෙකෙහි ප්‍රඥාව පීති ඵරණතාවයි. ත්‍රිවිධ ධ්‍යානයෙහි ප්‍රඥාව සුඛ ඵරණතාවයි. පරචිත්ත ප්‍රඥාව චේතෝ ඵරණතාවයි. දිවැස ආලෝක ඵරණතාවයි. ඒ ඒ සමාධියෙන් නැගී සිටියහුගේ ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාව ප්‍රත්‍යවේක්ෂණ නිමිත්තයි යනුවෙනි.

මෙහි දී සමථ විපස්සනා විභාගය දක්වන්නට **යා ච පීති ඵරණතා** යනාදිය කියන ලදී. මෙහිදී ද ප්‍රඥා ශීර්ෂයෙන් දේශනාව කරන ලදැයි ප්‍රඥා වශයෙන් සංවර්ණනාව කරන ලදී. පඤඤා, පීති, ඵරණතා ආදියෙහි

සමාධි සහගත වේ මැයි එහිදී සමාධි වශයෙන් සමථය උපුටන ලදී. එහෙයින් **පීති** සුඛ චේතෝ එරණතාව විශේෂයෙන් සමාධියේ පැහිරීම් වශයෙන් සමෘද්ධ වේ යැයි (සිතා) ඒවා **සමථ** යැයි කියන ලදී. ඉතිරි ඒවා ඤාණය පැහිරීම් වශයෙන් වේ යැයි (සිතා) ඒවා **විපසසනා** යැයි කියන ලදී.

දැන් ඒ සමාධිය අරමුණු වශයෙන් බෙදා දක්වන්නට **දස කසිණායතනානි** යනාදිය කියන ලදී. එහි කසිණ ධ්‍යාන සංඛ්‍යාත කසිණයන් ද යෝගියාගේ සුඛ විශේෂයන්ට අධිෂ්ඨාන බැවින් ද මනායතන ධම්මායතන බැවින් ආයතනයන් ද වේ යැයි **කසිණායතන** නම් වේ. **පඨවි කසිණං** යනු කරන ලද පිරිකම් ඇති පඨවි මණ්ඩලය ද එහි පැවති උග්ගහ - පටිභාග නිමිත්ත ද ඒ නිමිත්තෙහි උපන් ධ්‍යානය ද පඨවි කසිණයැයි කියනු ලැබේ යනුයි. ඒවායින් මෙහිදී ධ්‍යානය අදහස් කරන ලදී. **ආකාස කසිණං** යනු කසිණයෙන් විවෘත වූ ආකාශයේ පැවති පළමු අරූප ධ්‍යානයයි. **විඤඤාණ කසිණං** යනු පළමු අරූප විඤඤාණයේ අරමුණ වූ දෙවැනි අරූප ධ්‍යානයයි. පිරිසිදු සමථ භාවනාව ලෙසින් පැවති පඨවි කසිණ ආදිය සඳහා ඉමානි **අටඨ කසිණානි සමථො** යයි කියන ලදී. සෙසු කසිණ දෙක විදර්ශනා අධිෂ්ඨාන වශයෙන් පැවතියේ **විපසසනා** යි කියන ලදී. එවං යනු මේ ක්‍රමයෙන් යනුයි. **සබෙබා අරියමගෙගා** යනු සම්මා දිට්ඨි ආදී ස්වරූපයෙන් නොබිඳුණු ආර්යමාර්ගය ද සතිපට්ඨාන ආදී පූර්වභාග ප්‍රතිපදා භේදයෙන් නොයෙක් කොටස්වලට බෙදුණු නිරවශේෂ වූ ආර්යමාර්ගය ද යන දෙකයි.

යෙන යෙනාකාරෙන යනු අනභිධ්‍යා ආදියෙහි ද දැන් පවත්නා සැප බව ආදියේ ද ආකාරයන් අතරින් යම් යම් ආකාරයෙන් කියන ලදී යනුයි. **තෙන තෙන** යනු ඒ ඒ ආකාරවලින් යමක් යමක් සමථ වශයෙන් ද යමක් යමක් විදර්ශනා වශයෙන් ද යෙදීමට හැකිවෙත්. ඒ ඒ ආකාරයෙන් සමථ විදර්ශනා දෙකින් ආර්ය මාර්ගය විමසා යෙදිය යුතුය. **තෙ** යනු සමථ අධිෂ්ඨාන විදර්ශනා ධර්මයන් ය. **තීහි ධම්මෙහි සංගහිතාතා** යනු ත්‍රිවිධ අනුපපස්සනා ධර්මයන්ගෙන් සංග්‍රහ වූ යනුයි. ගණන් ගත් යන අර්ථයයි. කවර තුනකින් ද? අනිත්‍යතාවෙන් දුක්ඛතාවෙන් අනාත්මතාවෙන් යයි කියන ලදී. අනිත්‍යතාව හා එක්ව හැසිරෙන බැවින් විදර්ශනා අනිත්‍යතාව යැයි කියන ලදී. සෙස්සෙහි ද මේ ක්‍රමයමැයි. **සො සමථ විපසසනං භාවයමානො තීණිවිමොකඛමුඛානි භාවයති** යනු ආර්ය

මාර්ගාවබෝධය පිණිස යෙදුණු, මෙහෙයවුණු ඒ යෝගියා සුදුසු කල සමථයට සමවැදීම් වශයෙන් ද සුදුසු කල විදර්ශනාව විමසා බැලීම් වශයෙන් ද වඩනුයේ අනිමිත්ත විමෝක්ෂ සංඛ්‍යාත ත්‍රිවිධ අනුපස්සනාවන් වර්ධනය කරයි යනුයි. **තයො ඛන්ධෙ භාවෙති** යනු ත්‍රිවිධ අනුපස්සනාවන් මතුමත්තෙහි විශේෂයට පමුණුවමින් සීලස්කන්ධය, සමාධි ස්කන්ධය, ප්‍රඥා ස්කන්ධය යන මේ ත්‍රිවිධ ස්කන්ධ වඩයි යනුයි. යම්හෙයකින් ත්‍රිවිධ ස්කන්ධයන්හි ආර්ය අෂ්ටාංගික මාර්ගය සංග්‍රහ කරන ලද ද එහෙයින් **තයො ඛන්ධෙ භවෙනෙතා අරියං අට්ඨංගිකං මගගං භාවයති** යැයි කියන ලදී.

දැන් යම්තැනක හික්මෙන යම් පුද්ගලයන්ට විශේෂ වශයෙන් නික්ම යන (සසරින්) දොරටු වේ ද යම් ඒ කෙලෙස්වලට ප්‍රතිපක්ෂ වූ ත්‍රිවිධ විමෝක්ෂ වේ ද ඒවා සමග ඒ දොරටු දක්වන්නට **රාගචරිතො** යනාදිය කියන ලදී. එහි **අනිමිනත විමොකඛමුඛෙන** යනු අනිචචානුපස්සනාවෙනි. එය වනාහි නිත්‍ය නිමිති ආදිය නැසීමෙන් අනිමිත්ත වූයේ රාගාදීන්ගේ මූලිනුපුටා දැමීම්වලින් මිදුණු බැවින් විමොක්ඛ යනුවෙන් ලබන ලද නම් ඇති ආර්ය මාර්ගයේ මුඛය බැවින් දොරටුව බැවින් අනිමිත්ත විමොක්ඛ මුඛය යැයි කියනු ලැබේ. **අධිචිනත සිකඛාය** යනු සමාධියෙහි ය. **සුඛ වෙදනීයං එසසං අනුපගචඡනෙතා** යනු සැප වේදනාවට හිත වූ සැප වේදනාවට හේතු වූ ස්පර්ශය තණ්හාවට අනුව යන්නේ යනුයි. **සුඛං වේදනං පරිජානනෙතා** යනු මේ සුඛ වේදනාව වෙනස්වීම් ආදියෙන් දුකක් යැයි දනිමින් රාගය ඉක්මවූයේ යනුයි. **රාගමලනං පවාහෙනෙතා** යනාදියෙන් ඒ ක්‍රමයන්ගෙන් රාගයේ ප්‍රහාණයම කියන ලදී. **දොස චරිතො පුගගලො** යනාදියෙහි ද කියන ලද ක්‍රමය අනුසාරයෙන් අර්ථය දතයුතුය. ප්‍රඥාධික පුද්ගලයාට **සන්තති, සමූහ, කිච්ච, ආරම්මණ** ආදී ඝන විනිබ්භොගයෙන් සංස්කාරයන්හි ආත්ම ශූන්‍යතාව ප්‍රකට වේ යැයි විශේෂයෙන් අනත්තානුපස්සනාව ප්‍රඥාප්‍රධාන වේ යැයි (සලකා) **සුඤඤත විමොකඛ මුඛං පඤඤාකඛන්ධො** යයි කියන ලදී.

එසේම සංස්කාරයන්ගේ ස්වභාවය බිඳීම බැවින් ස්වල්ප වූ මොහොතක් පවත්නා බැවින් උපන්නවුන්ගේ ඒ ඒ තැන බිඳියාම මනාව එකඟ කළ සිත් ඇති තැනැත්තා තුළ ම ප්‍රකට වේයැයි (සලකා) විශේෂයෙන් අනිත්‍යානුපස්සනාව සමාධි ප්‍රධාන යැයි **අනිමිනත විමොකඛ මුඛං සමාධිකඛන්ධොයි** කියන ලදී. එසේම සීලය සපුරාලන, ඉවසීම් බහුල වූ,

ඇති වූ දුක හා නොඇල්ම මැඩගෙන වාසය කරන පුද්ගලයාගේ සංස්කාරයන් පිළිබඳ දුකබතාව දුරුවූයේ යැයි (සලකා) දුක්ඛානුපස්සනාව සීලය ප්‍රධාන කොට ඇතැයි යන්න **අපපණිහිත විමොකඛ මුඛං සීලකඛන්ධො** යනුවෙන් කියන ලදී. මෙසේ ත්‍රිවිධ විමෝක්ෂ මුඛයන් ත්‍රිවිධ සංස්කාරවල සංග්‍රහ කරන ලද බැවින් **සො තීණි විමොකඛමුඛානි භාවයනෙතා තයො ඛන්ධෙ භාවෙති** යි කියන ලදී. යම්හෙයකින් ත්‍රිවිධ ස්කන්ධයන්හි ආර්ය අෂ්ටාංගික මාර්ගය සංග්‍රහ කරන ලද බැවින් **තයො ඛන්ධෙ භාවයනෙතා අරියං අට්ඨංගිකං මගගං භාවෙති** යි කියන ලදී.

එහෙයින් ඒවාහි (ස්කන්ධයන්හි) එහි (ආර්ය මාර්ගයේ) සංග්‍රහය දක්වමින් **යා ච සම්මාවාචා** යනාදිය කියන ලදී. නැවත ත්‍රිවිධ ස්කන්ධයන්ගේ සමථ විදර්ශනා භාවය දක්වන්නට **සීලඛන්ධො ච** යනාදිය කියන ලදී. එහි සීලස්කන්ධය ඉවසීම ප්‍රධාන කොට ඇති බැවින් ද සමාධියට බොහෝ උපකාරවත් බැවින් ද සමථ පක්ෂය ඇසුරුකරන බව දතයුතුය. **භවංගානි** යනු උත්පත්ති භවයේ අංගයන් ය. **දෙව පදානි** යනු පාද දෙකයි. බොහෝසෙයින් පසළොස්වරණ ධර්ම සීල සමාධීන්හි සංග්‍රහ කරන ලදී. **භාවිතකායො** යනු ආභිසමාචාරික ශීලයේ පරිපූරණත්වයෙන් වඩන ලද සීලය ඇත්තේය. එසේ නැතහොත් භාවිතකායො යනු ඉන්ද්‍රිය සංවරයෙන් වඩන ලද පංචද්වාර කයයි. භාවිත සීලො යනු ඉතිරි වූ ශීලය ලෙසින් වඩන ලද ශීලයයි. මනා වූ කාය භාවනාව ඇතිකල්හි අත්‍යන්ත වූ කාය දුශ්චරිත ප්‍රහාණය ද නිවැරදි වූ නැගී සිටීම ද සපිරේ. එසේ අනුත්තර වූ සීලය සපිරෙන කල්හි මිථ්‍යා වචනයේ හා මිථ්‍යා ජීවයේ ප්‍රහාණය ඉතිරි නැතිව සම්පූර්ණ වේ. සිත හා ප්‍රඥාව වැඩූ කල්හි සම්මා සතිය, සම්මා සමාධිය, සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය වැඩීමට පරිපූර්ණත්වයට පත්වූයේ වෙයි. එය ස්වභාවයෙන් හා ඒ කරුණු දෙකින් වන බැවින් ඒ අර්ථය **කායෙ භාවියමානෙ** යනාදියෙන් දක්වයි. **පංචවිධං අධිගමං අධිගච්ඡති** යනු ආර්යමාර්ග අවබෝධයට අවස්ථා විශේෂ වශයෙන් පසළොසකින් බෙදා දක්වයි යනුයි. ආර්ය මාර්ගය වනාහි වහාම එකවිට ම එක චිත්ත ක්ෂණයෙකින් ම චතුසත්‍යයන්හි දී තමා විසින් අවබෝධ කරගත යුතුය. අවබෝධ කෙරෙයි යනුයි. එහි ලෞකික සමාපත්තියෙහි මෙන් වසඟ කරන කටයුත්තක් නැත. **වහා අවබෝධ කරගැනීම** යි. දුරු කළයුතු දේවලින් අනිශයින් ඉවත්වීම් වශයෙන් ඉවත්කරන හෙයින් **මුතතාධිගම** ද වෙයි. ලෝකයා විසින් මහත් වූ සීලස්කන්ධාදීන් අවබෝධ

කිරීම් වශයෙන් **මහාධිගම** ද වෙයි. ඒවායේ ම මහත් වූ ඵලයන් අවබෝධ කරන හෙයින් **විපුලාධිගම** ද වෙයි.

තමා විසින් කළයුතු කිසිවක් ඉතිරි නැති බැවින් **අනවසෙසාධිගම** ද වෙයි. ඒ අධිගමයෙන් කවරහු ද? කිසිවෙක් සමථයේ ආනුභාවයෙන් ද කිසිවෙක් විදර්ශනාවේ ආනුභාවයෙන් ද යන මේ විභාගය දක්වන්නට **තත්‍ථ සමථෙන** යනාදිය කියන ලදී.

මෙසේ මහතෙරුන් වහන්සේ තස්මා රක්ඛිතචිත්තස්ස යන ගාථාව ලෙසින් අර්හත්ඵල විමුක්තිය වූ විවයහාර සම්පාතය දක්වමින් දේශනා කුශලත්වය කරණ කොටගෙන නොයෙක් සූත්‍ර කොටස්වලින් එහි පූර්වභාග ප්‍රතිපදාවේ වූ භාවනා විශේෂයන්ගේ ද භාවනා ආනිසංසයන්ගේ ද බෙදා දැක්වීම් වශයෙන් තන් අයුරින් විවය හාරය දක්වා දැන් දශවිධ තථාගත බල ලෙසින් එය දක්වන්නට **තත්‍ථ යො දෙසයති** යනාදිය කියන ලදී.

ඔවාදෙන සාවකෙ න විසංවාදෙති යනු තමාගේ අවවාදයෙන් දහම් අසන බැවින් ශ්‍රාවක යැයි ලබන ලද නම් ඇති විනේයයන් නොරවටයි. වංචා නොකරයි යනුයි. මිථ්‍යා වාදයට හේතු වූ පාප ධර්මයන් ආර්ය මාර්ගයෙන් බෝමුලදීම මනාව ප්‍රහීණ කරන ලද හෙයිනි. **තිවිධං** යනු තුන්ආකාර වූ යනුයි. ආකාර තුනකින් යන අර්ථයයි. **ඉදං කරොථ** යනු මේ සරණාගමනයට ද ශීලාදියට ද පැමණ වාසය කරවු යනුයි. **ඉමිනා උපායෙන කරොථ** යනු මේ ක්‍රමයෙන් ද සරණයන් ශෝධනය කරමින් සිලාදිය පුරමින් සම්පාදනය කරවු යනුයි. **ඉදං වො කුරුමානානං** යනු මේ සරණාගමනය ද සීලාදිය ද අනුකූලව සිටින ඔබලාට මෙලොව, පරලොව, නිවන් ලෙසින් හිත පිණිස ද සුව පිණිස ද වන්නේය යනුයි. ඒවා සම්පාදනය කරවු යන අර්ථයයි. මෙසේ අවවාද දෙන ආකාරය දක්වා **ඔවාදෙන සාවකෙ න විසංවාදෙති** යනුවෙන් යමක් කියන ලද ද එය තථාගත බලවලින් බෙදා දක්වන්නට **සො තථා ඔවදිතො** යනාදිය කියන ලදී. එහි **තථා** යනු ඒ ආකාරයෙන් යනුයි. මෙය කරවු. මේ උපායෙන් කරවු යනාදි වශයෙන් කියන ලද ක්‍රමයෙනි. **ඔවදිතො** යනු ධර්ම දේශනාව කරණ කොටගෙන අනුශාසනා කරන ලද යනුයි. **අනුසිට්ඨො** යනු ඊටම පර්යාය වචනයකි. **තථා කරොනෙතන** යනු අවවාදය යම්සේ ද එසේ කරන්නා යනුයි.

නං භූමිං යනු භූමියක අධිගම පිණිස අවවාද කරන ලද ද ඒ දර්ශන භූමිය හා භාවනා භූමියයි. **නෙතං ඨානං විජ්ජති** යනු මේ කාරණය විද්‍යමාන නොවේ යනුයි. කාරණය ම මෙහි ඵලය තිබේ. ඊට අයත් පැවතුම් ඇති බැවින් යන අර්ථයෙන් ඨාන යැයි කියනු ලැබේ. දෙවැනි වාරයෙහි **භූමිං** යනු සීලස්කන්ධයෙන් පහකළ යුතු සම්පත්ති භව සංඛ්‍යාත භූමියයි.

දැන් යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ චතුවෛශාරද්‍ය ඥානයන් ද නොවෙනස් ස්වභාව ඇති බැවින් පළමු ඵල ඤාණයේ විෂය විශේෂයක් වෙයි. එහෙයින් ඒවා ද එහි විෂය ස්වභාවයෙන් දක්වන්නට **සම්මා සම්බුද්ධස්ස තෙ සතො** යනාදිය කියන ලදී. එහි **සම්මා සම්බුද්ධස්ස තෙ සතො** යනු මම සම්මා සම්බුද්ධ වෙයි. මා විසින් සියලු ධර්මය අවබෝධ කරන ලදී යනුවෙන් දැනගැනීමෙන් සම්මා සම්බුදුරදුන්ට ඒවා සිහිවේ යනුයි. **ඉමෙ ධම්මා අනභිසම්බුද්ධොති නෙතං ඨානං විජ්ජති** යනු කිසිවක් මෙනම් ධර්ම ඔබ විසින් අවබෝධ නොකරන ලදැයි කරුණු සහිතව හේතු සහිතව කාරණා සහිත වචනයෙන් සුනකඛත්ත මෙන් කියන්නාහු යන්න අප්‍රමාණ වේද එහෙයින් කරුණු සහිතව ප්‍රතිචෝදනා කෙරෙත් යන මේ කරුණ විද්‍යමාන නොවේ. සෙසු පදවලදී ද මේ ක්‍රමයමැයි. **යස්ස තෙ අත්ථාය ධම්මො දෙසිතො** යනු රාගාදීන්ගෙන් යමක් යමක් ප්‍රහීණ කිරීම පිණිස අසුභ භාවනා ආදි ධර්මයන් කියන ලදී යනුයි. **තක්කරස්ස** යනු එසේ පිළිපන්නාටය. **විසෙසාධිගමං** යනු අභිඥා ප්‍රතිසම්භිදා ආදී විශේෂ අධිගමය යනුයි. **අනන්තරායිකා** යන තැන අනතුරු ඇතිකිරීම අන්තරායයි. සීලය මොවුන්ගේ අනතුරයි. (එබැවින්) එය අන්තරායික වේ. අනතුරේ නියුතු යන අර්ථයෙන් හෝ අනතුරේ ප්‍රයෝජන හෝ යන අර්ථයෙන් අන්තරායිකා නම් වේ. ඒවා වනාහි කම්ම කිලෙස ආදී භේදයෙන් පස්වැදෑරුම්ය.

අනියාානිකා යනු ආර්ය මාර්ගයෙන් බැහැර වූ සියලු ධර්මයෝ ය. **දිට්ඨි සම්පනෙනා** යනු මාර්ග දෘෂ්ටියෙන් යුක්ත වූ සෝවාන් ආර්ය ශ්‍රාවකයායි. **සුභතං** යනු මනාව නැසූ යනුයි. මෙය ද ඒකදේශ කථනයක් ම ය. හෙතෙම මතක දාන, ප්‍රේත දාන ආදිය ද කරයි ම ය. **පුථුජ්ජනො** යනු බොහෝ ක්ලේශ සංස්කාරාදිය ඇතිකරන ආදී කරුණුවලින් පෘථග්ජන වූ යනුයි. එය මෙසේ කියන ලදී.

පුථූනං ජනනාදීනි කාරණෙහි පුථුජ්ජනෝ
පුථුජ්ජනනෙනාගධතතා පුථුවායං ජනෝ ඉතී

'බොහෝ කෙලෙස් ජනනය කිරීම් ආදී කරුණුවලින් පුථුජ්ජන නම් වේ. පෘථග්ජනයාට ඇතුළත් බැවින් ද මේ මිනිසා පුථු නම් වේ' යනුවෙනි.

මාතරං යනාදියෙහි උපදවන්නිය මවයි. උපදවන්නා පියා ද වේ. මනුෂ්‍යයෙකු වූ ක්ෂීණාශ්‍රව රහතුන් වහන්සේ යන අදහසයි. කිම ආර්ය ශ්‍රාවකයා අන්‍යයන් දිට්ඨියෙන් තොර කරවත් ද? මෙය ද නොවිය හැක්කකි. ඉදිනුදු භවාන්තර වූ ආර්ය ශ්‍රාවකයා තමාගේ ආර්ය ශ්‍රාවකත්වය නොදන්නාහු නමුත් කිසිවෙක් 'මේ කුන්තකිපිල්ලකයා දිවියෙන් තොර කරවා මුල් සක්වල ගැබ සක්විති රජකමට පත්වෙවයි' කියන්නේ ද හෙතෙම එම කුන්තකිපිල්ලකයාව දිවියෙන් තොර නොකරන්නේ ම ය. එසේ නැතහොත් මෙසේ කියන්නාහ. 'ඉදින් මොහු නොමරන්නේ නම් ඔබගේ හිස සිදින්නෙමු' යනුවෙනි. (ඔවුහු) ඔහුගේ හිසම සිදින්නාහ. හෙතෙම උභව නොමරන්නේ ම ය. පෘථග්ජන භාවයේ මහාසාවද්‍යතාව දැක්වීම සඳහාත් ආර්ය භාවයේ බලය දැක්වීම සඳහාත් මෙසේ කියන ලදී. මෙය වනාහි මෙහි අදහසයි. යම්තැනක මව මැරීම ආදී ආනන්තරිය පාප කර්ම කරන්නේ ද ඒ පෘථග්ජනභාවය ඒකාන්තයෙන් සාවද්‍යය. යමෙක් ඒ පාපයන් නොකරන්නේ ද ඒ ආර්යභාවය මහා බලසම්පන්නය යනුයි. **සංඝං භිඤ්ඤෙය්‍ය** යනු **සමාන සංවාසක** උපාලි සමාන සීමාවෙහි සිටි සංඝයා පස් කරුණකින් බිඳෙන්නේය යනුයි. එය (මෙසේ) විදාරන ලද්දේය. කර්මයෙන්, උද්දේසයෙන්, ව්‍යවහාරයෙන්, අනුශ්‍රාවණයෙන්, කුසපත් ගැනීමෙන් යන පස් කරුණෙන් සංඝයා බිඳෙන්නේය යනුවෙනි.

එහි **කම්මෙන** යනු අපලෝකන ආදී කර්ම සතරින් එක්තරා කර්මයකිනි. **උද්දෙසෙන** යනු පස්වැදෑරුම් පාමොක් උදෙසීම්වලින් එක්තරා උදෙසීමකිනි. **වොහරනෙතා** යනු ප්‍රකාශ කරමින්, ඒ ඒ උත්පත්තිවලින් අධර්මය ධර්මය වේ ආදී අටළොස් භේදකර වස්තූන් දක්වමින් යනුයි. **අනුසාවණෙන** යනු 'උසස් කුලයෙන් පැවිදි වූ මාගේ බහුශ්‍රැතභාවය නුඹලා නොදන්නහු ද? මා වැන්නෙක් අධර්මය, අවිනය ලෙස ශාස්තෘ ශාසනය ග්‍රහණය කරන්නේ යැයි සිතක්වත් උපදවන්නට ඔබලාට සුදුසු ද? කිම මම අපායෙන් නොබිය වෙම් ද?' ආදී ක්‍රමයෙන් කණ මුල වාග්භේදය

කොට ඇස්වීමෙනි. **සලාකගගාහනෙන** යනු මෙසේ අස්වා ඔවුන්ගේ සිත රැකුල් දී නොනවතින ධර්මයක් කොට මේ කුසපත ග්‍රහණය කරවූ කියා කුසපත් ගැන්වීමෙනි. මෙහිදී ද කර්මයම හෝ උද්දේසය හෝ ප්‍රමාණ වෙයි. ව්‍යවහාරය, අනුශ්‍රාවණය, කුසපත් ගැන්වීම වනාහි පූර්වභාගයයි. අටලොස් භේදකර වස්තූන් දැක්වීම් වශයෙන් ව්‍යවහාර කරන්නහු විසින් එහි කැමැත්ත ඇතිකිරීම් පිණිස අනුශ්‍රාවණය කොට කුසපත් ගැන්වූ කල්හි ද සංඝයා නොබිඳුනේ ම වෙයි. යම්විටෙක මෙසේ සතරම හෝ අතිරේක එකක් හෝ කුසපත් ගන්වා ආවේණික කර්මයක් හෝ උදෙසීමක් හෝ කරත් ද එවිට සංඝයා බිඳුනේ වෙයි. මෙසේ දිට්ඨි සම්පන්න පුද්ගලයා, සංඝයා බිඳුවන්නේය. සඟ රජෙක් හෝ ඇතිකරන්නේය යන මේ කරුණු නොවන්නක් ම ය. **දුට්ඨචිත්තෙනා** යනු වධක සිතින් දූෂණය වූ සිතයි. **ලොහිතං උපපාදෙය්‍ය** යනු ජීවමාන ශරීරයෙහි කුඩා මැස්සෙකු විසින් බොනු ලබන ස්වල්පයක් හෝ ලේ උපදවන්නේය යනුයි. යම් පාපකර්ම පෘථග්ජනයා විසින් කෙරෙයි ද ආර්ය ශ්‍රාවකයා විසින් නො කෙරෙයි ද ඒ මව මැරීම ආදී පංච ආනන්තර්ය පාප කර්ම මෙපමණකින් දක්වන ලද්දේ වෙයි. **දුට්ඨ චිත්තෙනා** යනු යහපත් සිතක් නැතිව දූෂිත වූ සිතයි. **ථූපං** යනු චෛත්‍යයයි. **හිංසෙය්‍ය** යනු නසන්නේය යනුයි. **අඤ්ඤං සත්ථාරං** යනු මොහු මගේ ශාස්තෘවරයාය. ශාස්තෘ කෘත්‍යය කිරීමට සමත් වේ යැයි කියා භවාන්තරයෙහි ද අන්‍ය වූ තීර්ථාංකරයෙකු ගැනීමයි.

අපදිසෙය්‍ය යනු මොහු මාගේ ශාස්තෘ යැයි ගන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ යනුයි. **ඉතො බහිද්ධා අඤ්ඤං දකඛිණෙය්‍ය පරියෙසෙය්‍ය** යනු සසුනෙන් බැහැරව අන්‍ය වූ බාහිර සමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පිළිබඳව මොහු දක්ෂිණාර්හයෙකි. මොහු කෙරෙහි කරන ලද සත්කාරය මහත්ඵල වන්නේය යන අදහසින් ඔහු පිළිදැගුම් කරන්නේය යන අර්ථයයි. **කුතූහලමංගලෙන සුද්ධිං පවෙචෙය්‍ය** යන මෙයින් මෙය වන්නේය යනුවෙන් පැවති බැවින් කුතූහල සංඛ්‍යාත දිට්ඨ සුත මුත මංගලයන්ගෙන් තමාගේ ශුද්ධිය පිරිසිදු බව විශ්වාස කරන්නේය යනුයි. **ඉත්ථී රාජා චකකවතති සියාති නෙතං යානං විජජති** යම්හෙයකින් කෝෂය තුළට බැසගත් ලිංගය ආදිය නැතිකමින් ස්ත්‍රියගේ (මහා) ලක්ෂණ නොසපිරෙත් ද ස්ත්‍රීරත්නය නොමැතිකමින් සප්තරත්නයන්ගෙන් යුක්ත බවට නොපැමිණේ ද සියලු මිනිසුන්ගේ ද අධික වූ ආත්මභාවයක් නොවේ ද එහෙයින් **ඉත්ථී -පෙ- විජජති** යි කියන ලදී.

යම්හෙයකින් ගරුකළ යුතු බව ආදී කරුණු තුන උතුම් වේ ද ස්ත්‍රී ලිංගය හීන වේ ද එහෙයින් ඇගේ ගරු කළයුතු බව ආදිය ද වැළකී යන්නේය. ස්ත්‍රී ලිංගය යම් සේ ද පුරුෂලිංගයත් එසේ නොවේ ද? එහෙයින් බඹලොව මහා බ්‍රහමයා පුරුෂයෙක් වන්නේදැයි නොකිවයුතු නොවන්නේ ද? නොකිව යුත්තේ නොවේ. කවර හෙයින් ද? මෙහි පුරුෂයා එහි උපදනා හෙයිනි. ස්ත්‍රීන් වනාහි මෙහි ධ්‍යාන වඩා කළුරිය කොට බ්‍රහ්ම පාරිසජ්ජ දෙවියන්ගේ සහව්‍යතාවට ඉපදෙත්. මහා බ්‍රහ්මයන්ගේ සහව්‍යතාවට නොවේ. පුරුෂයා වනාහි කිසිතැනක නූපදින්නේ යැයි නොකිව යුතුය. උභයලිංග භාවය ඇතිවිටත් ඔවුහු පුරුෂ ලකුණු ඇත්තෝ ම ය. එහි බඹහු ස්ත්‍රී ලකුණු ඇත්තෝ නොවෙත්. එහෙයින් මෙය මතා කියමනකි.

ඉත්ථී තථාගතො යන මෙහි සර්වඥ ගුණයන් උපදවා ලෝකයා (සසරින්) එතෙර කිරීමට සමර්ථ වූ බුද්ධභාවය සිටීවා. ඒ සඳහා ප්‍රාර්ථනා මාත්‍රයකට හෝ ස්ත්‍රිය නොපැමිණෙයි.

මනුසසත්තං ලිංග සම්පත්ති හෙතු සත්ථාර දසසනං
පබබජ්ජා ගුණ සම්පත්ති අධිකාරෝ ච ඡන්දතා
අථඨධම්ම සමොධානා අභිනීහාරෝ සම්ජඤ්ඤතී

මනුෂ්‍යත්වය ලිංග සම්පත්තිය, හේතුව, ශාස්තෘ දර්ශනය, පැවිද්ද, ගුණ සම්පත්තිය, අධිකාරය, ඡන්දය යන කරුණු අට එක්වීමෙන් ප්‍රාර්ථනාව සමෘද්ධ වේ.

මේවා වනාහි ප්‍රණිධාන සම්පත්ති කරුණුය. මෙසේ ප්‍රාර්ථනා මාත්‍රයක් හෝ සම්පාදනය කරන්නට අසමර්ථ වූ ස්ත්‍රියට බුදුබවක් කොයින්දැයි දක්වන්නට **ඉත්ථී තථාගතො අරහං සම්මා සම්බුද්ධො සියා නෙතං ඨානං විජ්ජති** යි කියන ලදී. හැම අයුරකින්ම පිරිපුන් පුණ්‍යයන්ගේ නැගී සිටීම සියලු ආකාරයෙන් පරිපූර්ණ වූ ආත්මභාවය උපදවන්නේය යන අර්ථයෙන් පුරුෂයාම අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙයි. **එකිසසා ලොක ධාතුයා** යනු දස සහස්සි ලෝකධාතුවෙහි යමක් ජාතිකෙඛත්ත යයි කියනු ලැබේ ද එයයි. එය වනාහි තථාගතයන් වහන්සේගේ ගැබට බැසගන්නා වේලාව ආදියේදී කම්පා වෙයි. ආණාඛෙත්ත වනාහි කෝටි සියදහසක් වූ සක්වළයි. යම් සක්වළක් එක්වම සංවෘත වේ ද, විවෘත වේ ද යම් තැනක ආටානාටිය පිරිත ආදියේ අණසක පවතී ද (එය

ආණා බෙත්ත නම්) විසය බෙත්තයේ ප්‍රමාණයක් නැත. 'ඥානය යම්තාක් ද ඒ තාක් ප්‍රඥාව වේ. යම්තාක් ප්‍රඥාව වේද ඒ තාක් ඥානය වේ. ප්‍රඥාව ඥානය කෙළවර කොට ඇත්තේය. ඥානය ප්‍රඥාව කෙළවර කොට ඇත්තේය' යන වචනයෙන් බුදුවරුන්ට විෂය නොවූ දෙයක් නම් නැත. මේ ත්‍රිවිධ ක්ෂේත්‍රයන්ට අනුව ත්‍රිපිටක බුද්ධවචනය ත්‍රිවිධ සංගීතියට නැගූ කල්හි මේ සක්වළ හැර වෙනත් සක්වලක බුදුවරු උපදිත් යනුවෙන් ප්‍රකාශිත සූත්‍රයක් නැත. උපදිත් යන යමක් නැත.

අපුබ්බං අචරිමං යනු පෙර පසු නොවී එක්ව නූපදී යනුයි. පෙර හෝ පසු හෝ උපදිත් යැයි කියන ලද්දේ වෙයි. එහි ගැබට බැසගැනීමෙන් පූර්වයෙන් වූයේ පුරෙ යයි දතයුතුය. එතැන්පටන් දහදහසක් සක්වළ කම්පා කිරීමෙන් කෙෂ්ත්‍ර පරිග්‍රහය කරන ලද්දේ වෙයි. අනෙක් බුදුවරයෙකුගේ උපතක් නැත. ධාතු පරිනිර්වාණයෙන් මත්තෙහි, පසුව එයින් යට ද වෙනත් බුදුවරයෙකුගේ උපතක් නැත. උඩින් නොවළක්වන ලදී. කවර හෙයකින් නොපූර්වව නොපළමුව නූපදිත් ද? ආශ්චර්යයක් නොවන බැවිනි. භාග්‍යවත් බුදුවරු ආශ්චර්ය මනුෂ්‍යයෝය. එය මෙසේ කියන ලදී. 'මහණෙනි, ආශ්චර්ය මනුෂ්‍ය වූ එක් පුද්ගලයෙක් ලෝකයේ උපදිනුයේ උපදියි' යනාදි වශයෙනි. ඉදින් නොයෙක් බුදුවරු එක්ව උපදින්නාහු නම් දේශනාවේ විශේෂයක් නොමැතිකමින් ආශ්චර්යයක් නොවන්නාහ. සතිපට්ඨාන ආදී භේද ඇති යම් ධර්මයක් එක්ව දේශනා කෙරේ ද වෙනත් ක්‍රමයකින් ද එයම දෙසිය යුතු වන්නේය. විවාදයක් නොවන හෙයින් ද වේ. බොහෝ බුදුවරු එක්ව උපන්කල්හි බොහෝ ගුරුවරුන්ගේ අතවැස්සන් මෙන් 'අපගේ බුදුහු ප්‍රසාදය ඇතිකරත් යනාදියෙන් ඔවුන්ගේ ශ්‍රාවකයෝ විවාද කරන්නාහ. මේ කරුණු සෙවීමෙන් කවර ප්‍රයෝජනයක් ද? එක් ලෝකධාතුවක බුදුවරු දෙදෙනෙක් එකවිට නූපදිත් යන මෙය ධර්මතාවකි. යම්සේ කොහොඹ බීජ, කෝසාතකී (වැටකොළු) බීජ ආදිය මිහිරි ඵල නූපදවත් ද මිහිරි නොවූ අමිහිරි ඵල ම උපදවත් ද එසේ කාය දුශ්චරිතාදිය මිහිරි විපාක ඇති නොකරයි. අමිහිරි විපාක ම ඇතිකරයි. යම්සේ උක්බීජ හැල්වී බීජ ආදිය මිහිරි වූ මධුර රසැති ඵල ම උපදවයි ද අමිහිරි කටුක ඵල නූපදවයි ද එසේ කාය සුචරිත ආදිය මිහිරි විපාක ම උපදවයි. නොමිහිරි ඒවා නූපදවයි. මෙය ද (මෙසේ) කියන ලදී.

යාදිසං වපතෙ බීජං තදිසං හරතෙ ඵලං
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං

යම්බඳු බීජ වපුරයි ද එබඳු ඵල ගනු ලැබේ. යහපත කරන්නා යහපත් විපාක ලබයි. පව් කරන්නා පාපී විපාක ලබයි.

එහෙයින් **තිණණං දුචරිතානං** යනාදිය කියන ලදී. **අඤ්ඤතරො සමණො වා බ්‍රාහමණො වා** යනු පැවිදි මාත්‍රයෙන් ශ්‍රමණ වූ යම්කිසිවෙක් හෝ ජාතිමාත්‍රයෙන් බ්‍රාහ්මණ වූ යම්කිසිවෙක් හෝ ය. පවිටු අදහස් ඇත්තා සම්භාවනා කිරීමේ අදහසින් පුදුමයට පත්කිරීම් වශයෙන් **කුහකො** කුහකයෙක් වේ. ප්‍රත්‍ය සනිශ්‍රිත බවෙහි යෙදූ වචන ලෙසින් **ලපකො** ලපකයෙක් වේ. ප්‍රත්‍ය උපදවන නිමිතිවල හැසිරෙන හෙයින් **නෙමිත්තකො** වේ. **කුහනලපන නෙමිත්තකත්තං පුබබංගමං කත්වා** යනු කුහක බව ආදියම පෙරටුකොට සන්සුන් ඉඳුරන් ඇති, සන්සුන් මනසක් ඇති අයෙකු මෙන් හැසිරෙමින් යනුයි. පංචනීවරණෙ යනු කාමච්ඡන්ද ආදී පංච නීවරණයන් ය. නීවරණ වනාහි සිත බැහැරින් දූෂණය කරයි. කිලිටි කරත්. පෙළත්. තවත්. එහෙයින් සිතෙහි උපක්ලේශ යැයි කියනු ලැබේ. **පඤ්ඤාය දුබබලීකරණෙ** යනු නීවරණයන් ය. නීවරණයෝ වනාහි නූපන් ප්‍රඥාව උපදින්නට නොදෙත්. එහෙයින් ප්‍රඥාව දුබල කරන්න දේවල්යැයි කියනු ලැබේ. **අනුපටඨිතසතී** යනු සතර සතිපට්ඨානයන්හි නොළඟී සිහියයි. **අභාවයිත්වා** යනු වර්ධනය නොකොට යනුයි. **අනුත්තරං සම්මා සමබොධිං** යනු අර්හත් පදයට කරුණු වූ සර්වඥතා ඥානයයි. පශ්චිම වාරයෙහි, **අඤ්ඤතරො සමණො වා බ්‍රාහමණො වා** යනු සර්වඥ - බෝසතුන් සඳහා කියන ලදී. එහි **සබබදොසා පගතො** යනු පාරමිතාවන්ට ප්‍රතිපක්ෂ වූ සියලු දෝෂයන්ගෙන් ඉවත්වූයේ යනුයි. මෙයින් පුරන ලද පාරමිතා ඇති බව දක්වයි. සතිපට්ඨාන යනු විදර්ශනාවයි. බොජ්ඣංග යනු මාර්ගයයි. අනුත්තර වූ සම්මා සම්බෝධිය අර්හත්වයයි. සතිපට්ඨාන හෝ විදර්ශනාව හෝ බොජ්ඣංග හෝ මිශ්‍ර වූ සම්මා සම්බෝධිය අර්හත්වය ම ය. සෙස්ස අනතුරු වාරයෙහි කියන ලද ප්‍රතිපක්ෂ ක්‍රමයෙන් දතයුතුය.

යං එතං ඤාණං යනු කියන ලද පරිදි මෙතැන ද යම්තැනක් නොතැන යයි කියන ලදනම් එතැන ද (යන දෙතැන) අට්ඨාන යනුවෙන් පැවති ඥානයයි. **හෙතුසො** යනු ඒ ඨානයේ ද අට්ඨානයේ ද හේතුවෙනි.

යානසෝ යනු එකෙණෙහිම සිහිකිරීමට අනතුරුව යනුයි. **අනධිසෝ** යනු සීමාවක් නොමැතිකමින් කිසිවක් ඉතිරි නොකොට යන අර්ථයයි. **ඉති යානා යානගතා** යනාදියෙහි මෙසේ යානායාන භාවයට ගියානුය. **සබෙබ** යනු ක්ෂයවීම් වැයවීම්, නොඇලීම්, නිරුද්ධවීම් ස්වභාවයන්ගෙන් යුත් සංඛත ධර්මයෝ ය. ඒවාම සත්ත්ව ප්‍රඥප්තියෙන් උපාදාන වූයේ වෙත්. ධර්මචාරී වූ යම් **කෙචි සකඛගඵපනා** කිසිවෙක් ස්වර්ගාමී වෙත්. අධර්මචාරී වූ යම්කිසිවෙක් **කෙචි අපායූපගා** අගයගාමී වෙත්. කර්මක්ෂය කරන ආර්ය මාර්ගයට පිළිපන් **කෙචි නිබබාණූපගා** යම්කිසිවෙක් නිර්වාණගාමී වෙත්.

දැන් කියන ලද අර්ථය විවරණය කරමින් **සබෙබ සතතා මරිසසනති** යන ගාථා දෙක ප්‍රකාශ කරන ලදී. එහි අර්ථය **සබෙබ සතතාති අරියා ච අනරියා ච** යන ආදියෙන් තමාව දක්වාලයි. එහි **ජීවිත පරියනෙතා මරණනෙතා** යනු ජීවිතයේ කෙළවර නම් මරණ සංඛ්‍යාත අන්තය යනුයි. **යථාකමමං ගමිසසනති** යන මෙහි සත්ත්වයන්ගේ කර්මය අනුව වූ යම් ගමනක් වේ ද එය මේ කම්ස්සකතාව යැයි යන අර්ථයයි. කම්මානං ඵල දස්සාවිතා අවිප්පවාසෝ ච යන මේ වචනයෙන් ද පුඤ්ඤපාපඵලූපගා යන මේ වචනයෙන් ද කර්මයන්ගේ ඵලයේ ප්‍රත්‍යක්ෂකාරීත්වය ද රැස් කරන ලද කර්මයන් පිළිබඳ ස්වකීය ඵලයේ අප්‍රධාන භාවය ද දක්වන ලද්දේය යන අර්ථයයි. කර්මයම කම්මන්ත නම් වේ. පාප කර්මය මොවුන්ට වේ ය යන අර්ථයෙන් **පාප කමමනතා** නම් වේ. එහි අර්ථය දක්වන්නට **අපුඤ්ඤ සංඛාරා** යයි කියන ලදී. අපුඤ්ඤ සංඛාරය මොවුන්ට වේ ය යන අර්ථයෙන් අපුඤ්ඤ සංඛාර නම් වේ. **පාපකමමනතා** යන්න නිස්සක්ක (පංචමී) විභක්ති වචනයකි. පාපකර්ම හේතුව යන අර්ථයයි. පුඤ්ඤසංඛාරා යනාදියෙහි ද එසේමය. නැවත **නිරයං පාපකමමනතං** යනාදියෙන් අන්තද්වය සමග මධ්‍යම ප්‍රතිපදාව දක්වයි. එසේම **අයං සංකිලෙසෝ** යනාදියෙන් සසර නිවන ලෙසින් ද ආදීනව නිස්සරණ ලෙසින් ද හේතුඵල ලෙසින් ද ගාථාවෙහි ත්‍රිවිධ අර්ථ විකල්පයන් දක්වන ලදී. නැවත **නිරයං පාපකමමනතංති අයං සංකිලෙසෝ** යනාදියෙන් පිරිසිදු **කිරීම්** (වොදාන) වශයෙන් ගාථාවේ අර්ථය දක්වයි.

තෙන තෙන යනු ඒ ඒ අවසන් කළ කටයුතු ඇති රූපභව අරූප භව ආදියෙනි. **ඡතතිසෝ** යනු කාම තණ්හාව වනාහි රූපාදි විෂය හේතුයෙන් සයක් ද එසේම භව තණ්හාව හා විභව තණ්හාව අටළොසක් ද

ඒවා ම අජ්ඣත්තික රූපාදින්හි අටළොසක් ද බාහිර රූපාදියෙහි අටළොසක් ද වශයෙන් මෙසේ සතිසක් වේ යනුයි. **යෙනයෙන** යනු සුභ වේ සුබ වේ යනාදියෙනි.

කොටස් තුනක් ලෙසින් පිරිසිදු බව ත්‍රිවිධ වේ. එය දක්වන්නට **තණ්හා සංකිලෙසො** යනාදිය කියන ලදී. නැවත **සබ්බ සතතා මරිසසනති** යනාදිය ප්‍රතිපදා විභාගයෙන් ගාථාවන්ගේ අර්ථය දක්වන්නට කියන ලදී. **තත්‍ථ තත්‍ථ ගාමිණී** යනු ඒ ඒ තැනම නිවනට යන යනුයි. නිවනට යන සුළු යන අර්ථයයි. නැවත තත්‍ථ තත්‍ථ ගාමිණී සබ්බත්‍ථගාමිණී පුද්ගලයන්ගේ ප්‍රතිපදා විභාගය දක්වන්නට **තයො රාසි** යනාදිය කියන ලදී. **යං** යනු නිරය ආදී වූ යම්තැනකි. ඒ ඒ තැනට සුදුසු පරිදි පමුණුවානුයි සබ්බත්‍ථගාමිණී නම් වේ. ප්‍රතිපදා සංඛ්‍යාත වූ පව්කමෙහි ද පින්කමෙහි ද කර්මයන් ක්‍ෂය කරන කර්මයේ ද විභාග වශයෙන් භාග්‍යවතුන් වහන්සේ තුළ පවතින ඥානයයි. මේ තථාගත බලය සබ්බත්‍ථගාමිණී පටිපදා ඤාණය නම් වේ. මේ ඥානයෙන් භාග්‍යවතුන් වහන්සේ සියලු ප්‍රතිපදාව ඇති සැටියෙන් දැනගනී. කෙසේ ද? සියලු ගම්වැසියන් එක්ව එක් ඌරෙකු හෝ මුවෙකු හෝ මරන කල්හි සියල්ලන්ගේ චේතනාව අනෙකෙකුගේ ජීවිත ඉන්ද්‍රිය අරමුණුකොට ඇත්තේ වෙයි. ඒ කර්මය වනාහි ඔවුන්ගේ ආයුහන ක්‍ෂණයෙහි ම (රැස්කිරීම් මොහොතෙහි ම) විවිධ වෙයි. ඔවුන් අතුරෙන් එක් අයෙක් කැමැත්තෙන් ම කරයි. එක් අයෙක් නුඹත් කරවයි අන්‍යයන් විසින් පෙළන ලද්දේ කරයි. එක් අයෙක් සමාන වූ කැමැත්ත ඇත්තෙකු මෙන් වී නොවැළකෙමින් හැසිරෙයි. ඔවුන් අතුරෙන් එක් අයෙක් ඒ ක්‍රියාවෙන් ම නිරයේ උපදී. එක් අයෙක් තිරිසන් යෝනියේ උපදී. එක් අයෙක් ප්‍රේත විෂයේ උපදී.

එය එසේ වූ හෙයින් ආයූහන ක්‍ෂණයෙහි ම මේ ආකාරයෙන් රැස්කළ නිසා නිරයේ උපදින්නේය. එය සොළොස් උත්සදයන්හි යැයි දනී. තිරිසන් යෝනියේ උපදින්නාව ද 'මොහු පා නැත්තෙක් වන්නේය. මොහු දෙපා ඇත්තෙක් වන්නේය. මොහු සිවුපාවෙක් වන්නේය. මොහු බහුපාවෙක් වන්නේය' යනුවෙන් දැනගනී. ප්‍රේතවිෂයෙහි උපදින්නාට ද 'මොහු නිජ්ඣමතණ්හිකයෙක් වන්නේය. මොහු ඛුප්පිපාසිකයෙක් වන්නේය. මොහු පරදත්තූප ජීවියෙක් වන්නේය' යනුවෙන් දැනගන්නේය. ඒ කර්මයන්ගෙන් ද මේ කර්මය ප්‍රතිසන්ධිය ඇදගන්නේය. මෙය ඇද නොගන්නේය. දුබලව දුන් ප්‍රතිසන්ධියෙන් කෙලෙස් මේරීම් මාත්‍රයක්

පමණක් වන්නේ යයි දනියි. එසේම සියලු ගම්වැසියන් එක්ව දන්දෙන කල්හි සියල්ලන්ගේ ම චේතනාවන් දාන අරමුණුකොට ඇත්තේ වෙයි. ඒ කර්මය වනාහි ඔවුන්ගේ ආයුහන ක්‍ෂණයෙහි ම විවිධ වෙයි. ඔවුන්ගෙන් කිසිවෙක් දෙව්ලොව උපදී. කිසිවෙක් මිනිස්ලොව උපදී. එය එසේ වූ හෙයින් ආයුහන ක්‍ෂණයෙහි ම මේ ආකාරයෙන් රැස්කළ නිසා මොහු මිනිස්ලොව උපදින්නේය. මොහු දෙව්ලොව උපදින්නේයැයි දනී ද එහිදී ද මොහු පරනිම්මිත වසවත්ති දෙවියන් කෙරෙහි උපදින්නේය. මොහු භූම්ම දෙවියන් කෙරෙහි උපදින්නේය. මොහු දෙටු දෙව්රජ වී උපදින්නේය. මොහු ඔහුගේ දෙවැනි තෙවැනි තනතුර දරමින් පරිචාරකයෙක් වී උපදින්නේ යැයි දැනගනී. ඒ කර්මයන්ගෙන් ද මෙය ප්‍රතිසන්ධිය ඇදගන්නට සමත් වන්නේය. මෙය ප්‍රතිසන්ධිය ඇදගන්නට සමත් නොවන්නේය. දුබලව දුන් ප්‍රතිසන්ධියෙන් කෙලෙස් මේරීම් මාත්‍රයක් පමණක් වන්නේ යැයි දැනගනී. එසේ විදර්ශනාව පිහිටුවන කල්හි ද මොහු මේ ආකාරයෙන් විදර්ශනාව අරඹන ලද බැවින් රහත් වන්නේය. මොහු අනාගාමී වන්නේය. මොහු සකෘදාගාමී වන්නේය. මොහු සෝවාන් වන්නේය. එකබීජී, කෝලංකෝල, සත්තක්ඛත්තුපරම වන්නේය. මොහු මාර්ගයට පැමිණෙන්නට නොහැකි වන්නේය. ලක්‍ෂණයන් අරමුණු කොටගත් විදර්ශනාවේ ම සිටින්නේය. මොහු ප්‍රත්‍ය අල්ලා ගැනීමෙහි යෙදෙන්නේය. මොහු නාමරූප අල්ලා ගැනීමෙහි යෙදෙන්නේ ය. අරූප අල්ලා ගැනීමෙහි යෙදෙන්නේ ය. මොහු මහාභූත ප්‍රමාණයම තීරණය කරන්නේය. මොහු කිසිවක් සලකා බලන්නට නොහැකිවන්නේ යැයි දැන ගන්නේ. කසිණ පිරියම් කරන්නහු කෙරෙහි ද මොහු පරිකර්ම මාත්‍රයෙහි ම සිටින්නේය. මොහු නිමිති උපදවන්නට සමත් වන්නේය. අර්පණාවට නොවේ. මොහු අර්පණාව ද උපදවන්නේය. මොහු ධ්‍යානයට පැමිණෙන්නේය. මත්තෙහි වෙසෙසකට නොපැමිණෙන්නේය. මොහු මත්තෙහි විශේෂත්වයන් ද අවබෝධ කරන්නේයැයි දැනගනී.

අනෙකධාතු යනු චක්‍ෂු ආදී වූ ද පෘථ්වී ආදී වූ ද නොයෙක් ධාතු මෙහි ඇත්තේ නු අනේකධාතු නම් වේ යනුයි. බොහෝ ධාතු යන අර්ථයයි. **ලොකො** යනු ස්කන්ධ ආයතන ආදී ලෝකයයි. **චකඛුධාතු** යනාදිය යම් ධාතූන් කරණකොට ගෙන ලෝකය අනේකධාතුක යැයි කියන ලදද ඒවායේ ස්වරූපය දැක්වීමකි. එහි ස්වභාවාර්ථයෙන් ද නිස්සත්ත අර්ථයෙන් ද ධාතු නම් වේ. ඇසම ධාතු වූයේ **චකඛුධාතු** නම්. සෙසු පදයන්හි ද මේ ක්‍රමය ම ය. **කාමධාතු** යන මෙහි ක්ලේශ කාම

වස්තුකාම යැයි කාම දෙකකි. ක්ලේශකාම පක්ෂයෙහි කාමය හා යෙදුණු ධාතුව කාමධාතුවයි. මෙය චිතර්කයට නමකි. වස්තුකාම පක්ෂයෙහි චනාහි කාමාවචර ධර්මකාමයයි. (කාමාවචර යන්නෙහි) දෙවැනි පාදය ලොප් කිරීමන් පසු කාමය වූයේත් එයමය. ධාතු වූයේත් එයමය. වේ නුයි **කාමධාතු** නම්. ව්‍යාපාදය හා බැඳුණු ධාතුව **බ්‍යාපාද** ධාතුවයි. මෙය බ්‍යාපාද චිතර්කයට නමකි. බ්‍යාපාද වූයේත් ධාතු වූයේත් එයමැයි බ්‍යාපාද ධාතු නමි. මෙය දස ආඝාත වස්තූන්ට විෂය වූ පටිඝයට නමකි. විහිංසාව හා බැඳුණු ධාතුව විහිංසා ධාතුවයි. විහිංසා චිතර්කය හෝ විහිංසාව ම ධාතුවක් වූයේ විහිංසා ධාතු නමි. මෙය අන්‍ය සත්ත්ව හිංසාවට නමකි. **නෙකඛම්ම අව්‍යාපාද අවිහිංසා ධාතුයො** යනු නෙක්ඛම්ම චිතක්ක ආදිය සියලු කුසල් දහම්, මෙත්තා කරුණාවදැයි දතයුතුය යනුයි. **රූපධාතු** යනු රූප භවය හෝ සියලු රූප ධර්මයෝ ය. **අරූපධාතු** යනු අරූපභවය හෝ අරූප ධර්මයෝ ය. **නිරෝධ ධාතු** යනු නිරෝධ තණ්හාවයි. **සංඛාර** ධාතු යනු සියලු සංඛත ධර්මයෝ ය. සෙස්ස මනාව දතයුතුය. අන්‍යොන්‍ය වූ ලක්ෂණ ඇති බැවින් නන්වැදෑරුම් ධාතූහු මෙහි වෙතැයි **නානාධාතු** නම් වේ. ලෝකයයි. එහෙයින්ම ඇඤ්ඤා චකඛුධාතු යාව අඤ්ඤා නිබබාණධාතුයයි කියන ලදී. යම්සේ මේ ඥානය චක්ෂුධාතු ආදී භේදයෙන් ග්‍රහණය කරගත් සංස්කාර ලෝකය ලෙසින් නොයෙක් ධාතු ඇති නන්වැදෑරුම් ධාතුලෝකය දැනගනී. මෙසේ ග්‍රහණය කරනොගත් ලෝකය ලෙසින් එය දැනගනී. පසේ බුදුවරු ද දැඟසවුවරු ද ග්‍රහණය කරගන්නා වූ සංස්කාර ලෝකයේ ම නානත්වය දැනගනිති. එයද ඒකදේශ වශයෙනි. කොටස් වශයෙන් නොවේ. අනුපාදින්නක සංස්කාර ලෝකයේ නානත්වය නොදනිත්.

භාග්‍යවතුන් වහන්සේ චනාහි මෙනම් ධාතුවේ උත්සන්නතාවෙන් මේ ගසේ කඳ සුදුවෙයි. මෙහි කලු වෙයි. මෙහි සිලිටි වෙයි. මෙහි රළු වෙයි. මෙහි ගණ වෙයි. මෙහි තුනී පොත්තක් වේ. මෙනම් ධාතුව උත්සන්න වීමෙන් මේ ගසේ කොළ වර්ණය හැඩය ආදී ලෙසින් මෙවැනි වෙයි. මේ ධාතුව උත්සන්න බැවින් මේ ගසේ මල නිල්පාට වෙයි. කහපාට වෙයි. රතුපාට වෙයි. සුදුපාට වෙයි. සුවඳවත් වෙයි. සුගඳ වෙයි. මෙනම් ධාතුව උත්සන්න වීමෙන් ගෙඩිය කුඩා වෙයි. මහත් වෙයි. දික්වෙයි. රවුම් වෙයි. සුසණ්ඨාන වෙයි. දුසණ්ඨාන වෙයි. සිලිටි වෙයි රළු වෙයි. සුවඳැති වෙයි. දුගඳැති වෙයි. තිත්ත වෙයි. මිහිරි වෙයි. කටුක වෙයි. ඇඹුල් වෙයි. කහට වෙයි. මෙනම් ධාතුවේ උස්සන්න වීමෙන් මේ

ගසේ කටු තියුණු වෙයි. නොතියුණු වෙයි. ඍජු වෙයි. වක් වෙයි. කලුපාට වෙයි. නිල්පාට වෙයි. සුදුපාට වෙයි. මෙසේ අනුපාදින්න සංස්කාර ලෝකය ලෙසින් ද අනේකධාතු නානාධාතු ස්වභාවය දැන ගනියි. මේ බලය සර්වඥ වූ බුදුවරුන්ගේ ම මිස අන්‍යයන්ගේ නොවේ. **යං යදෙව ධාතුං** යනු හීනබව ආදී යම්කිසි ස්වභාවයකි. යම්හෙයකින් අධිමුත්තිය (ප්‍රාර්ථනා නිශ්චය කිරීම) නම් අජ්ඣාසය ධාතුව වේ ද එහෙයින් නිශ්චය කිරීම යනු හීනාදි ස්වභාවයෙන් අදහසේ පැවැත්මයි. එය වනාහි එහි ආධාරය ද ප්‍රවේශය ද වේ යන අර්ථයෙන් **අධිමුච්චනනි තං තදෙව අධිට්ඨහනනි අභිනිවිසනනි** යි කියන ලදී. අධිමුච්චනයේ විෂයය විභාග වශයෙන් දක්වන්නට **කෙචි රූපාධිමුත්තා** යනාදිය කියන ලදී. එය මනාව දතහැකි ම ය. **නානාධිමුත්තනිකතා ඤාණං** යනු හීනබව ආදී වශයෙන් වෙන් වෙන් වූ නිශ්චය කිරීම් පිළිබඳ ඥානයයි. තෙ යථාධිමුත්තා භවනති යනු ඒ හීනාධිමුක්තිය හා ප්‍රණිතාධිමුක්තිය ඇති සත්ත්වයෝ යම් යම් ආකාරයකින් ප්‍රාර්ථනා කරන ලද්දාහු වෙත්. **තං තං කම්ම සමාදානං සමාදියනති** යනු ප්‍රාර්ථනයට අනුරූපීව තමා විසින් සමාදන් විය යුතු, කළ යුතු ඒ ඒ කටයුතු කරත් යනුයි. ඒ කර්ම සමාදානයන් හටගැනීම් වශයෙන් බෙදා දක්වන්නේ **තෙ ඡබ්බිධං කම්මං** යනාදිය කියන ලදී. එහි ඇතැමෙක් ලෝභ වශයෙන් කර්ම සමාදාන කෙරෙතැයි සම්බන්ධ කළ යුතුය. සෙසු තැන්වල ද මේ ක්‍රමයමැයි. **තං විභජජමානං** යනු එය හටගැනීම් වශයෙන් සවැදෑරුම්ය. නැවත පැවතීම් නැවතීම් වශයෙන් බෙදනුයේ දෙවැදෑරුම්ය. **යං විභජජමානං** යනු එය හටගැනීම් වශයෙන් සවැදෑරුම්ය. නැවත පැවතීම් නැවතීම් වශයෙන් බෙදනුයේ දෙවැදෑරුම්ය. **යං ලොභවසෙන දොසවසෙන මොහවසෙන ච කම්මං කරොති** යන්න දස අකුසල කර්මපථ හා සබැඳි කර්මය සඳහා කියයි. එය වනාහි කෙලෙසෙන බැවින් කළු වූයේ නුයි **කණහ** නම් වේ. අපායවල උපදවන හෙයින් කළු විපාක ඇත්තේනුයි **කණහ විපාක** ඇත්තේ වේ. **යං සද්ධාවසෙන කම්මං කරොති** යනු දසකුසල කර්මපථ පිළිබඳ කර්මයයි. එය වනාහි නොකිලිටි බැවින් සුදු වූයේනුයි **සුකක** නම් වේ. ස්වර්ගයේ උපදවන හෙයින් සුදු විපාක ඇති බැවින් සුක්ක විපාක ඇත්තේ වේ. **යං ලොභවසෙන දොසවසෙන මොහවසෙන සද්ධාවසෙන ච කම්මං කරොති ඉදං කණහ සුකකං** යනු මිශ්‍ර වූ කර්මයයි. **කණහසුකක විපාකං** යනු සුබ දුක්ඛ විපාකයයි. මිශ්‍ර කර්මය කොට අකුසල වශයෙන් තිරිසන් යෝනියේ මගුල් ඇතු ලෙස උපන්නේ කුසලයෙන් පැවති සැපය අනුභව කරයි. කුසලින් රාජ කුලයෙහි උපන්නා ද අකුසලින් දුක්විඳියි. **යං විරියවසෙන**

පඤ්ඤාවසෙන ච කම්මං කරොති ඉදං කම්මං අකණ්හං අසුකකං අකණ්හ අසුකක විපාකං කම්මකබයකරං යනු චතුර් මාර්ගයෙහි වූ චේතනාවයි. එය වනාහි ඉදින් පාපී වේනම් පාපී විපාක ගෙන දෙන්නේය. ඉදින් පුණ්‍ය වේ නම් යහපත් උපත ඇතුළු විපාක ගෙන දෙන්නේය. උභය විපාකය ස්වල්ප වශයෙන් දෙන හෙයින් කලු-සුදු විපාක ගෙන දෙන්නේය යන මෙය මෙහි අර්ථයයි. කර්ම සමාදානයේ පළමුවැන්න කාමයන්හි හෙළිය යුතු අවේලක ප්‍රතිපදාවයි. දෙවැන්න කඳුළු මුවින් හඬන තියුණු කෙලෙස් ඇත්තාගේ පිරිසිදු බඹසර හැසිරීමයි. තෙවැන්න කාමයන්හි නොහෙළිය යුතු අවේලක ප්‍රතිපදාවයි. සිව්වැන්න ප්‍රත්‍ය නොලබන ධ්‍යාන විදර්ශනා සැපවලින් යුක්ත පුද්ගලයාගේ ශාසන බ්‍රහ්මචර්යාවේ හැසිරීමයි.

යං එවං ජාතියං කම්මසමාදානං යනු යම් අන්‍ය වූ මෙවැනි කර්මයකි. **ඉමිනා පුගගලෙන** යනාදිය ඒ කර්ම විපාකයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ඤාණයේ පැවතුම් ආකාරය දක්වන්නකි. **එහි උපචිතං** යනු යම්සේ කරන ලද කර්මය විපාකදීමට සමත්වේ ද එසේ කරන ලද රැස් කරන ලද කර්මය යනුයි. **අවිපකකං** යනු නොමේරූ විපාකයයි. **විපාකාය පවවුපටඨිතං** යනු විපාකදීම සඳහා කරන ලද අවකාශ ඇති යනුයි. **නව හබෙබා අභිනිබබිධාගනතුං** යනු ක්ලේශ අභිසංස්කාරයන්ගේ කලකිරීමෙන් අභිනිබ්බිදා සංඛ්‍යාත ආර්ය මාර්ගයට පැමිණෙන්නට නුසුදුසු යනුයි. තං භගවා න ඔවදති යනු භාග්‍යවතුන් වහන්සේ විපාක ආවරණයෙන් වට වූ ඒ පුද්ගලයාට සත්‍යාවබෝධය පෙරටුකොට අවවාද නොදෙයි යනුයි. අජ්ඣාසත් ආදීන්ට මෙන් වාසනාව පිණිස එබන්දන්ට ද දහම් දෙසත් ම ය. **උපචිතං** යනු කිරීමට අරඹන ලදී යනුයි. එහෙයින්ම **නව තාව පාරිපූරිං ගතං** යි කියන ලදී. එයින් අසත්‍ය නියමයේ අසමත් බව දක්වයි. **පූරා පාරිපූරිං ගචඡති** යනු පරිපූර්ණ ඵල නිෂ්පාදනයට සමත් බවට පැමිණේ යනුයි. මුලින්ම අවබෝධ කරගන්නේය යනුයි. අසත්‍ය නියමය බැවින් වහාම ඵල ධර්මයේ අභාජනත්වය පළමුව උපදවයි. එහෙයින් ම පුරා **වෙනෙය්‍යතතං සමතිකකමති** යි කියන ලදී. **පුරා අනියතං සමතිකකමති** යනු ද පාඨයකි. එයම අර්ථයයි. **අසමතෙත** යනු කර්මය අසම්පූර්ණ වූ කල්හිය. නැතහොත් ඒවා අසම්පූර්ණයහ. මෙසේ ක්ලේශ අන්තරාය හා මිශ්‍ර වූ කර්ම අන්තරාය දක්වා දැන් අමිශ්‍ර වූ කර්ම අන්තරාය දක්වන්නට **ඉමසස ච පුගගලසස** යනාදිය කියන ලදී. එය කියන ලද ක්‍රමයමැයි. **සබෙබසං** යනු මේ බල නිර්දේශයෙහි කියන ලද සියලු කර්මයන්ගේය. **මුදු මජ්ඣාධිමත්තතා** යනු මෘදු මධ්‍ය තීව්‍ර ස්වභාවයයි. කර්මයන්ගේ මෘදු

බව ආදී ස්වභාවයෙන් කර්ම විපාකයන්ගේ මෘදු මධ්‍ය තීව්‍රභාවය හැඟේ යන අදහසයි.

දිට්ඨධම්ම වෙදනීයං යනාදියෙහි ඉහාත්ම සංඛ්‍යාත මේ ආත්ම භාවයෙහි දතයුතු ඵලය **දිට්ඨධම්ම වෙදනීය** වේ. අනතුරු භවයෙහි ඉපිද දතයුතු ඵලය **උපපජ්ජවෙදනීය** වේ. අනෙක් ආත්මභාවයක, මෙයින් අන්‍ය වූ යම්කිසි ආත්මභාවයක දතයුතු ඵලය **අපරාපරිය වෙදනීය** වේ. එක් ජවන වාරයක චේතනා **සිතින් පළමු චේතනාව දිට්ඨධම්ම** වේදනීය නම් වේ. අවසන් චේතනාව **උපපජ්ජවේදනීය** නම් වේ. මධ්‍යයෙහි වූ චේතනා පස අපරාපරිය **වේදනීය නම් වේ. විපාක වෙමත්තතා ඤාණං** යනු විපාක වේමත්තතාව පිළිබඳ විපාක විශේෂයෙහි වූ ඤාණයයි. මේ කර්ම විපාකයේ ගති සම්පත්තිය, ගති විපත්තිය, උපධි සම්පත්තිය, උපධි විපත්තිය, කාල සම්පත්තිය, කාල විපත්තිය, ප්‍රයෝග සම්පත්තිය, ප්‍රයෝග විපත්තිය ආදිය හේතුවයි. ඒවා පිළිබඳ ඒ හේතු ස්වභාවය 'අත්ථකවචානි කම්ම සමාදානානි ගති සම්පතති පටිබාළහානි න විපච්චනති' යනාදි පෙළට අනුව දතයුතුය.

බල නිර්දේශයට අනතුරුව කියන ලද කර්ම සමාදාන පදයෙන් ම ධ්‍යානාදිය සංග්‍රහකොට දක්වන්නට **තථා සමාදිනනානං කම්මානං** යනාදිය කියන ලදී. ශෛක්ෂ, පෘථග්ජන සන්තානයන්හි පැවති ධ්‍යානාදිය කර්මය වෙයි. එහි **තථා සමාදිනනානං** යන් ශුක්ලය, ශුක්ල විපාකය, පවත්නා සැපයයි. මතු සැප විපාකයයි යනාදී ආකාරවලින් ග්‍රහණය කරන ලද කර්මයන්හි යනුයි. **සංකිලෙසො** යනු ප්‍රතිපක්ෂ ධර්ම ලෙසින් කිලිටි වූ ස්වභාවයයි. **වොදානං** යනු ප්‍රතිපක්ෂ ධර්මවලින් පිරිසිදු වීමයි. වුට්ඨානං යනු ප්‍රගුණ කළ පිරිසිදු බව හා භවංගයන්ගේ නැගීසිටීමයි. **එවං සංකිලිසසති** යන ආදියෙහි මේ අර්ථය දක්වා තිබේ. 'මේ ආකාරයෙන් ධ්‍යාන ආදිය කෙළෙසෙයි. පිරිසිදු වෙයි. නැගී සිටියි' යනුවෙන් දැනගන්නා ඥානය භාග්‍යවතුන් වහන්සේගේ අනාවරණ ඥානයයි. එහි ආවරණයක් නැත' යනුවෙනි.

කති ඣානානි යනාදිය ධ්‍යාන ආදිය විභාග වශයෙන් දක්වන්නට අරඹන ලදී. **චතතාරි ඣානානි** යන්න සිව්වැදෑරුම් න්‍යාය ලෙසින් රූපාවචර ධ්‍යාන සඳහා කියන ලදී. **එකාදස** යනාදිය රූ ඇත්තා රූප දකී යනාදියෙන් අටවැදෑරුම්ව ද සුඤඤත විමෝක්ෂ ආදී වශයෙන්

නෙවැදෑරුම් වශයෙන් ද කියන ලදී. **අට්ඨ** යනු ඒවා හැර ලෝකෝත්තර විමෝක්ෂයේ සිටුව යනුයි. **සත්ත** යනු ඒවායින් ම නිරෝධ සමාපත්තිය හැර සතකි. **තයො** යනු සූත්‍රාන්ත පර්යායෙන් සුඤ්ඤත විමෝක්ෂ ආදී තුනයි. **දෙව** යනු අභිධර්ම පරියායෙන් අනිමිත්ත විමෝක්ෂයක් හමුනොවන බැවින් ඉතිරි දෙකයි. මෙහිදී මේ සත පිළිවෙලින් සමවැදුණු සමවැදුණු මොහොතෙහි යටත් කිරීම් වශයෙන් විරුද්ධ ධර්මයන්ගෙන් මුදවන හෙයින් ද අරමුණෙහි ප්‍රාර්ථනා කිරීම් වශයෙන් ද මිදුනේ වෙයි., නිරෝධ සමාපත්තිය වනාහි සර්වප්‍රකාරයෙන් සංඥා වේදනාවන්ගෙන් මිදුණු බැවින් පහවූ විමෝක්ෂ නම් වේ. ලෝකෝත්තර දේ ද ඒ ඒ මාර්ගයෙන් තොර වූ කෙලෙස්වලින් සමුච්ඡේද වශයෙන් මිදුණු බැවින් විමොක්ඛ නම් වේ. මේ විශේෂය දතයුතුය. සමාධීන්හි චතුක්ක නය පංචක නය ආදියෙන් පළමු ධ්‍යාන සමාධිය විතර්ක සහිත විචාර සහිත සමාධිය නම් වේ. පංචක නයෙහි ද්විතීය ධ්‍යාන සමාධිය විතර්ක රහිත විචාර මාත්‍රයක් වූ සමාධිය නම් වේ. සෙසු ධ්‍යානයන්ගෙන් චතුක්ක නයෙහි ද පංචක නයෙහි ද වූ සමාධිය අවිතක්ක අවිචාර සමාධිය නම් වේ. සමාපත්තීන්හි පිළිවෙලින් අෂ්ට සමාපත්තීනට සමාධි යැයි ද සමාපත්ති යැයි ද නමක් වේ. කවර හෙයින් ද? චිත්ත ඒකාග්‍රතාව ලැබෙන බැවිනි. නිරෝධ සමාපත්තියෙහි එය නොමැති නිසා සමාධි යන නාමය නැත. සංඥා සමාපත්ති ආදිය යට කියන ලද ම ය. **භාන භාගියො සමාධි** යනු අල්පගුණ ඇති ප්‍රථමධ්‍යාන ආදියෙන් නැගිටින ලද පුද්ගලයාගේ සංඥා මනසිකාරයන්ගේ කාමාදියට පැනගැනීම ප්‍රථමධ්‍යාන ආදී සමාධියේ පිරිහීම් පක්ෂයේ වූ බැවින් යනුයි.

පඨමස්ස ඣානස්ස කාමරාග බ්‍යාපාදා සංකිලෙසො යි කියන ලද බැවින් ද්විතීය ධ්‍යාන ආදී වශයෙන් යෙදිය යුතුය. නොදන්නා දෙය පිළිකුල් කිරීම් වශයෙන් ඒ පරමතාව කුක්කුට යැයි කියනු ලැබේ. **කුකකුටඡ්ඣායී** යනුවෙන් පුද්ගල අධිෂ්ඨානයෙන් ධ්‍යානයන් කියන ලදහ. **දෙව** යනුවෙන් පළමු දෙවැනි ධ්‍යාන කියන ලදී. යමෙක් පළමු හෝ දෙවැනි ධ්‍යානය උපදවා මෙපමණක් ප්‍රමාණවත් යැයි සංකෝචයට පත්වේ ද මත්තෙහි වෑයම් නොකෙරේ ද? ඔහුගේ ඒ ධ්‍යාන සතර ද කුක්කුට ධ්‍යානයැයි කියනු ලැබේ. එයින් යුක්ත වූවහු කුක්කුටධ්‍යායී නම් වේ. ඒවායින් පළමු දෙක ආසන්න වූ බලවත් විරුද්ධත්වය ඇති බැවින් ද විශේෂ භාගීත්වයක් නැති බැවින් ද සංකිලෙස භාවයෙන් කියන ලදී.

අනෙක් ඒවා වනාහි විශේෂ භාගීත්වයක් ඇතත් මද විරුද්ධත්වයක් ඇති බැවින් වොදාන භාවයෙන් කියන ලදැයි දතයුතුය.

විසෙස භාගියො සමාධි යනු ප්‍රගුණ කරන ලද ප්‍රථම ධ්‍යාන ආදියෙන් නැගීසිටි පුද්ගලයාගේ සංඥා මනසිකාරයන්ගේ ද්විතීය ධ්‍යානාදියට පැනීමයි. ප්‍රගුණ කරන ලද පිරිසිදු බව ද භවංගවලින් නැගීසිටීම ද වුට්යාන යැයි කියන ලදී. මුලින් මුලින් ප්‍රගුණ කරන ලද ධ්‍යානය පසුව පසුව ප්‍රගුණ කළ ධ්‍යානයේ ආසන්න කාරණය වෙයි. එහෙයින් වොදානය ද වුට්යාන යැයි කියන ලදී. භවංග වශයෙන් සියලු ධ්‍යානයන්ගෙන් නැගී සිටීම වේ යැයි භවංග වොදානය ද වුට්යානයකි. යම්හෙයකින් වුට්යානයට වසඟ බැවින් පිරිසිඳ දක්වන ලද කාලයක් තුළ සමාපත්තියෙන් නැගී සිටීමක් වේ ද එහෙයින් සමාපත්තියෙන් නැගී සිටීමේ කුශලතාව මෙහි වුට්යාන යැයි කියන ලදී.

තසෙසව සමාධිසස යනු ඊට අනතුරු වූ බල නිර්දේශයේදී ධ්‍යාන ආදී ක්‍රමවලින් කියන ලද සමාධියේ යනුයි. **පරිවාරො** යනු පිරිකරයි. **ඉන්‍රියානි** යනු සද්ධා සතිපඤඤා ඉන්‍රියයන් ය. **බලානි** යනු හිරි ඔත්තප්ප සමග ඒවා ම ය. වීර්යය වෙනම ගැනීම බලයන්ගේ බහුපකාරත්වය දැක්වීම පිණිසයි. වීර්යයට උපස්ථම්භක වීමෙන් සද්ධා ආදිය විරුද්ධ අකම්පනීය වේ. එහෙයින් ම **විරියවසෙන බලානි භවනත** යි කියන ලදී. **තෙසං** යනු ඉන්‍රියයන්ගේ ය. **මුදුමජඣාධිමතතතා** යන තැන විශද නොවූයේ මෘදු නම්. අතිශයින් විශද නොවූයේ මධ්‍ය නම්. අතිශයින් විශද වූයේ අධිමාත්‍ර නම්. බලවත් බව තීක්ෂණ යයි කියනු ලැබේ. හික්මවිය යුතු අයගේ ඉන්‍රියයන්ට අනුරූපීව භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පවතී යයි දක්වන්නට **තතථ භගවා** යනාදිය කියන ලදී.

එහි **සංඛිතතවිත්ථාරෙන** යනු සංක්ෂිප්තයේ විස්තර වශයෙනි. එසේ නැතහොත් **සංඛිතෙතන** යනු උදෙසීම් මාත්‍රයකිනි. **සංඛිතතවිත්ථාරෙන** යනු උද්දේසයෙන් හා නිද්දේසයෙනි. විත්ථාරෙන යනු උද්දේස නිද්දේස පටිනිද්දේසයන්ගෙනි. **මුදුකං** යනු සැහැල්ලු යනුයි. අපාය භය සංසාර භය ආදියෙන් තැති ගැනීම් වශයෙන් බර නොකොට යනුයි.

මුදුතිකඛං යනු ඉතා තියුණු නොවූ යනුයි. සංවේග වස්තූන්ගෙන් **සංවේග ඇතිකිරීම්** ආදී වශයෙන් බර කොට යනුයි. **සමථං උපදිසති** යනු

සමථය අධික කොට දක්වයි යනුයි. විදර්ශනාව එසේ නොවේ යන අදහසයි. හුදු සමථයෙන් සත්‍යාවබෝධය නොලැබේ. **සමථ විපස්සනං** යනු මධුර බව සහිත සමථ විදර්ශනා දෙකයි. **විපස්සනං** යනුවෙන් අධික වූ විදර්ශනාව දක්වයි. යම්හෙයකින් මෙහි තිකඛිත්‍රිය ආදීහු ද උග්ඝටිතඤ්ඤූ ආදීහු ද වෙත් ද එහෙයින් **තිකඛිත්‍රියස්ස නිස්සරණං දෙසෙති** යනාදිය කියන ලදී.

එහි **අධිපඤ්ඤාසිකඛාය** යනු අධිප්‍රඥා ශික්ෂාවයි. **යං එත්ථ ඤාණං** යනු, මෙහි ඉන්ද්‍රියන්ගේ මෘදු මධ්‍ය තියුණු බැවින් යම් ඤාණයක් වේ ද එයයි. **ඉදං වුච්චති පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රිය පරොපරියත්ත වෙමත්තතාඤාණං** යන්න සම්බන්ධ කළ යුතුය. ඒ ඥානයේ පැවතුම් විධිය දැක්වීමට **අයං ඉමං භූමිං** යනාදිය කියන ලදී. එහි **අයං ඉමං භූමිං භාවනඤ්චව ගතො** යනු මේ පුද්ගලයාට මේ සංකිලෙසවාස වොදාන භවංගයන්ට ගියේය, යයි, යන්නේය යන කාල තීරණයක් නැති හෙයිනි. කිරිමෙනි. **ඉමාය වේලාය** යනු මේ කාලයේ ය. මේ මෘදු මධ්‍ය තියුණු භේදයෙන් අනුසාසනා කළ යුතුය. **එවං ධාතුකො** යනු හින බව ආදී වශයෙන් මෙවන් අදහස් ඇත්තේය. මෙවන් ප්‍රාර්ථනා ඇත්තේය යනුයි. **අයඤ්චසස ආසයො** යනු මේ පුද්ගලයාට මේ ශාස්වත උච්ඡේද ප්‍රකාරය හෝ යථාභූත ඤාණයට අනුලෝම වන ඉවසීම් ප්‍රකාරය හෝ අභිප්‍රාය වේ යනුයි. මෙය වනාහි චතුර්විධය. සත්ත්වයෝ මෙහි සම්පව සයනය කෙරෙත්. වාසය කරන් යන අර්ථයෙන් ආසය නම් වේ. භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන්ගේ මේ අභිප්‍රාය දන්නේ විදර්ශනා ඥාන කම්මස්සකතා ඥාන ඇති ඒ දෘෂ්ටි ගතීන් නොපවත්නා විට ද මෙසේ දැනගන්නා සේක. මෙය ද කියන ලදී.

කාමය ඇසුරු කරන්නා වූ ම මේ පුද්ගලයා කාමගරුකයෙකි. කාම ආසය (අභිප්‍රාය) ඇත්තෙකි. කාමයන්ගෙන් මිදුණු අයෙකියි දැනගනී. කාමය ඇසුරු කරන්නා වූ ම මේ පුද්ගලයා නෙක්ඛම්මගරුක වෙයි. නෙක්ඛම්ම ආසය ඇත්තෙක් වෙයි. නෙක්ඛම්මයෙන් මිදුනෙක් වෙයි යැයි දැනගනී. නෙක්ඛම්මය ඇසුරු කරන්නා වූ ම පුද්ගලයාව දැනගනී. ව්‍යාපාදය, අව්‍යාපාදය, ථීනමිද්ධය, ආලෝක සංඥාව ඇසුරු කරන්නා වූම මේ පුද්ගලයා ථීනමිද්ධගරුක වෙයි. ථීනමිද්ධ ආසය ඇත්තෙක් වෙයි. ථීනමිද්ධයෙන් මිදුනෙක් වෙයි යැයි දැනගනී. **අයං අනුසයො** යනු මේ පුද්ගලයාගේ මේ කාමරාගාදිය ප්‍රහීණ නොවූයේ ම අනුව සයනය

කළ ක්ලේශය ප්‍රහීණ නොවූයේ ම ය. ස්ථාවර වූ ක්ලේශය අනුසයයි. **පරසන්තානං** යනු ප්‍රධාන සත්ත්වයන්ගේ ය. **පරපුග්ගලානං** යනු එයින් අන්‍ය සත්ත්වයන් වූ හීන සත්ත්වයන්ගේ යන අර්ථයයි. එකම අර්ථ ඇති මේ පද දෙක භික්ෂුවිය යුතු පුද්ගලයන්ගේ වශයෙන් දෙපරිදිව කියන ලදී. **ඉන්ද්‍රියපරෝ පරියත්ත වෙමත්තතා ඤාණං** යන තැන පරභාවය ද අපරභාවය ද පරෝපරියත්ත නමි. ආකාරයට ඔකාරයක් කිරීමෙන් පසුවයි. එහි වෙනස් බව පරොපරියත්ත වේමත්තතාවයි. සද්ධා ආදී ඉන්ද්‍රියන්ගේ පරොපරියත්ත වේමත්තතාවෙන් වූ ඤාණය ඉන්ද්‍රිය පරොපරියත්ත වේමත්තතා ඤාණය වේයයි පද විභාගය දතයුතුය.

එහි **යං** යනු නන්වැදෑරුම් වූ පූර්වේනිවාසය සිහිකිරීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේට යම් ඥානයක් ලැබේ ද එයයි. එහි අටවැනි තථාගත බලය වේ යන සම්බන්ධය වෙයි. **අනෙකවිහිතං** යනු නන්වැදෑරුම් යනුයි. නැතහොත් නොයෙක් ප්‍රකාරයන්ගෙන් පැවති යනුයි. **පුබ්බනිවාසං** යනු සිහි කරන්නට කැමති වූ තමාගේ ද අනුන්ගේ ද පසුගිය අතීත භවය ආදිකොට ඒ ඒ තැන වාසය කරන ලද පරපුරයි. **අනුස්සරති** යනු එක් උපතක්, උපත් දෙකක් ආදී වශයෙන් ජාති පිළිවෙලින් අනුව ගොස් සිහිකරයි. එකවිට හෝ සිහිකරයි. සිත (අරමුණට) නැමූ කල්හිම සිහිකෙරෙයි යන අර්ථයයි. භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිකර්ම ක්‍රියාවක් නැත. ආවර්ජන මාත්‍රයෙන් ම සිහිකෙරෙයි.

සෙය්‍යථීදං යනු ආරද්ධ, ප්‍රකාර, දර්ශන අර්ථයෙහි නිපාතයකි. **එකම්පි ජාතිං** යනු එක් ප්‍රතිසන්ධි මූලයක් ඇති චුති කෙළවර ඇති එක් භවයකට අයත් ස්කන්ධ පරම්පරාවයි. **දෙවම්පි ජාතියෝ** යනාදියේ ද මේ ක්‍රමයයි. **අනෙකෙපි සංවට්ට කපෙප** යනාදියෙහි පිරිහෙන කල්පය සංවට්ට කප්ප නම් වේ. වැඩෙන කල්පය විවට්ට කල්පය නම් වේ යැයි දතයුතුය. එහි වැසීම මුල්කොට ඇති බැවින් සංවට්ටයායි වේ. වැඩීම මුල්කොට ඇති බැවින් විවට්ටයායි නම් වෙයි ගන්නා ලදී. මෙසේ ඇතිකල්හි 'මහණෙනි, කල්පයක අසංඛ්‍ය වූ දේ සතරකි. කවර සතරක් ද? සංවට්ට සංවට්ටයායි, විවට්ට විවට්ටයායි' යනුවෙන් යමක් කියන ලද ද ඒ සියල්ල ගන්නා ලද්දේ වෙයි. **අමුත්‍රාසිං** යනාදිය සැරිසරන ආකාරය දැක්වීමකි. එහි **අමුත්‍රාසිං** යනු අසවල් සංවට්ට කල්පයෙහි අසවල් භවයෙහි හෝ යෝනියෙහි හෝ ගතියෙහි හෝ විඤ්ඤාණ පැවැත්මෙහි හෝ සත්ත්ව වාසයෙහි හෝ සත්ත්ව කොටසෙහි හෝ ය. **එවං නාමෝ** යනු තිස්ස

කියා හෝ ථුස්ස කියා හෝ ය. **එවං ගොත්තෙනා** යනු භග්ගව හෝ ගෝතම යන ගෝත්‍රයයි. **එවං වණ්ණෙණා** යනු සුදුපැහැ හෝ රන්වන් පැහැ හෝ ය. **එවමාහාරෝ** යනු හැල්, මස්, බත් ආහාරය හෝ පවත්තඵල භෝජනය හෝ ය. **එවං සුඛදුක්ඛ පටිසංවෙදී** යනු අත්තේකප්‍රකාර වූ කායික-චෛතසික හෝ සාමිස-නිරාමිස ප්‍රභේද ඇති සුවදුක් විඳින යනුයි. **එවමායුපරියනෙනා** යනු මෙසේ සියයක් වසක් පරමායුෂ කෙළවරකොට ඇති හෝ අසූහාර දහස් වසක් පරමායුෂ කෙළවර කොට ඇති හෝ යනුයි. **සෝ තතෝ චුතෝ අමුත්‍ර උදපාදිං** යනු හෙතෙම ඒ භවයෙන් හෝ සත්ත්ව කොට්ඨාසයෙන් හෝ චුත වූයේ නැවත අසවල් සත්ත්ව කොට්ඨාසයෙහි උපන්නේ යනුයි. එසේ නැතහොත් ඒ භවයෙහි හෝ සත්ත්ව කොට්ඨාසයෙහි හෝ නැවත වීමි. එවං නාමෝ යනාදිය කියන ලද අර්ථ ඇත්තේ ම ය.

දිබ්බන යනාදියෙහි දෙවියන් හා සමාන සත්ත්වයෝ දිබ්බ නම් වේ. දෙවියන්ට වනාහි යහපත් කර්මවලින් නිපන් පිත් සෙම් රුධිර ආදියෙන් නොකිලිටි වූ උපක්ලේශවලින් මිදුණු බැවින් දුර වූ අරමුණු ගැනීමට සමත් වූ දිව්‍යමය ප්‍රසාදචක්ෂුව ඇත්තේ වෙයි. මෙය ද වීර්ය භාවනා බලයෙන් නිපන් නැණස හා සමය. දිව්‍යත්වය හා සමාන බැවින් දිබ්බ නම් වේ. දිව්‍යවිහාර වශයෙන් ලබන ලද බැවින් තමා විසින් ද දිව්‍ය විහාරය ඇසුරු කරන ලද බැවින් ද දිබ්බ නම් වේ. ආලෝකය ගැනීමෙන් මහා බැබළීමක් ඇති බැවින් ද දිබ්බ නම් වේ. තිරෝකුඩ්ඩ ආදී ගතින් දැක්වීමෙන් මහත් ගති ඇති බැවින් දිබ්බ නම් වේ. ඒ සියල්ල ශබ්දාර්ථ අනුසාරයෙන් දතයුතුය. දැකීම් අර්ථයෙන් චක්ඛු නම් වේ. චක්ඛු කෘත්‍යය කිරීමෙන් චක්ඛුව මෙන් වේනුයි චක්ඛු නම් වේ. චුතූපපාත ඥාන දර්ශනයෙන් දෘෂ්ටිය පිරිසිදුවන බැවින් (පිරිසිදු වූ) විසුද්ධ නම් වේ. යමෙක් චුති මාත්‍රය ම දකී ද පුනරුත්පත්තිය නොදකී ද හෙතෙම උච්ඡේද දෘෂ්ටිය ගනියි. යමෙක් පුනරුත්පත්ති මාත්‍රය ම දකී ද චුතිය නො දකී ද හෙතෙම නව සත්ත්වයෙකුගේ පහළවීම පිළිබඳ දෘෂ්ටිය ගනියි. යමෙක් වනාහි ඒ දෙක ම දකී ද හෙතෙම යම්හෙයකින් ඒ දෘෂ්ටිගති දෙකම ඉක්මවා ද එහෙයින් ඔහුගේ ඒ දර්ශනය දිට්ඨි විසුද්ධියට හේතුවේ. භාග්‍යවතුන් වහන්සේ ඒ දෙක ම දක්නා සේක. එහෙයින් චුතූපපාත ඥාන දර්ශනයෙන් දිට්ඨි විසුද්ධියට හේතුවන බැවින් විසුද්ධ වූ යැයි කියන ලදී. ඒකාදශ උපක්ලේශයෙන් තොරවූයේ හෝ විසුද්ධ නම්.

මෙසේ කියන ලදී. 'අනුරුද්ධය, ඒ මම විචිකිච්ඡාව සිත්හි උපක්ලේශයකැයි දැන සිත්හි උපක්ලේශයක් වූ විචිකිච්ඡාව අත් හළෙමි. අමනසිකාරය සිත්හි උපක්ලේශයකැයි දැන - ථීනමිද්ධය - තැතිගැන්ම - අධික ප්‍රීතිය, නොමනා වචනය, දැඩි උත්සාහය, සැඟවුණු උත්සාහය, ඉල්ලීම, නානා ආකාර සංඥාව, අධික පසුතැවීම් ස්වභාවය සිත්හි උපක්ලේශයකැයි දැන අධික පසුතැවීම් ස්වභාවය වූ චිත්තෝප ක්ලේශය අත්හළෙමි' යන මේ ආදියයි. මෙසේ එකොළොස් උපක්ලේශයෙන් තොරවූ හෙයින් හෝ විසුද්ධ නම් වේ. මිනිස් සීමාව ඉක්මවා රූප දක්නා හෙයින් අනික්කන්ත මානුසක නම් වේ. මසැස ඉක්මවූ බැවින් හෝ අතික්කන්ත මානුසක නම් වේ. එහෙයින් **මිනිස් බව ඉක්ම වූ පිරිසිදු වූ දිව්‍යමය ඇසින්** (යයි කියන ලදී.) **සතෙත පසසති** යනු මිනිසෙක් මසැසින් මිනිසකු දකින්නා සේ සත්ත්වයන් දකියි. බලයි යනුයි. **චවමානෙ උපජජමානෙ** යන මෙහි චුති ක්‍ෂණයෙහි හෝ උත්පත්ති ක්‍ෂණයෙහි හෝ දිවැසින් ද දක්නට නොහැකිය. චුතවීමට ආසන්න වූ යමෙක් දැන් චුතවෙත් ද ගන්නා ලද ප්‍රතිසන්ධි ඇති යමෙක් දැන් උපන්නාහු ද චුතවන උපදින ඔවුනු යන්න අදහස් කරන ලදී. මෙලෙස චුතවන උපදින ඔවුනුය.

හීනෙ යනු මෝහය කාන්දුවන ස්වභාවයෙන් යුත් බැවින් හෝ හීන ජාතික කුලය, භෝගය ආදී වශයෙන් හෝ පිළිකුල් කළ, නින්දා කරන ලද යනුයි. **පණීතෙ** යනු ප්‍රඥාව වැගිරෙන ස්වභාවයෙන් යුත් බැවින් ඊට විරුද්ධ වූ යනුයි. **සුවණ්ණෙ** යනු අද්වේශය වැගිරෙන ස්වභාවයෙන් යුත් බැවින් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ වර්ණයෙන් යුක්ත යනුයි. **දුබබණ්ණෙ** යනු ද්වේෂය වැගිරෙන ස්වභාවයෙන් යුත් බැවින් අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ අවර්ණයෙන් යුක්ත යනුයි. මනා රූ ඇති හා විරූපී පුද්ගලයන් යන අර්ථයයි. **සුගතෙ** යනු සුගතියට ගියා වූ සත්ත්වයන් ය. අලෝභ විපාකයෙන් යුත් බැවින් ආඪ්‍ය වූ මහත් ධන ඇති සත්ත්වයන් ය. **දුගතෙ** යනු දුගතියට ගියා වූ සත්ත්වයන් ය. ලෝභ විපාකයෙන් යුත් බැවින් දිළිඳු වූ අල්ප වූ ආහාරපාන භෝජන ඇති සත්ත්වයන්ය. **යථා කම්මූපගෙ** යනු යම් යම් කර්මයක් රැස්කරන ලද ද ඒ ඒ කර්මයෙන් යුක්ත වූ සත්ත්වයන් ය. එහිදී පළමුව කී චවමානෙ යනාදියෙන් දිඛ්බචක්ඛුවේ කටයුතු කියන ලදී. මේ පදයෙන් වනාහි යථාකම්මූපග ඥානයේ කටයුතු කියන ලදී. යථා කම්මූපග ඥානය හා අනාගතංස ඥානය දිවැස පාදක කොට පවතී. දිවැස සමගම සමෘද්ධ වෙත් යනුයි.

කාය දුච්චරිතෙන යනාදියෙහි නොමනා චරිතය හෝ දුෂ්ට වූ චරිතය කෙලෙස්වලින් නරක් කරන ලද බැවින් දුච්චරිත නම් වේ. කය කරණ කොටගෙන නොමනා ලෙස හැසිරීම හෝ කය කෙරෙන් පැවති නොමනා හැසිරීම කාය දුශ්චරිතයයි වාග්-මනෝ දුශ්චරිතයන් ද මෙසේ දතයුතුය. **සමනනාගතා** යනු යුක්ත වූ යනුයි. **අරියානං උපවාදකා** යනු බුද්ධාදී ආර්යයන්ට ද යටත් පිරිසෙයින් ගිහි සෝවාන් පුද්ගලයන්ට ද අන්තිම වස්තුවෙන් හෝ ගුණ විනාශයෙන් හෝ දොස් කියන්නෝ ය. අපහාස කරන්නෝ ය. ගර්හා කරන්නෝ ය. **මිචඡාදිටඨිකා** යනු විපරීත වූ දර්ශන ඇත්තෝය. **මිචඡාදිටඨිකමම සමාදානා** යනු යමෙක් මිථ්‍යාදෘෂ්ටි හේතුවෙන් ගන්නා ලද විවිධ වූ කටයුතු ඇත්තෝ ය. එහි වාග්-මනෝ දුශ්චරිත ග්‍රහණයෙන් ආර්යයන්ට දොස්කිම ආදී මිථ්‍යාදෘෂ්ටි ගත් කල්හි ඒවා නැවත කිම මහාසාවද්‍ය භාවය දැක්වීම පිණිස ය. මහා සාවද්‍ය වූ ආර්ය උපවාදය ආනන්තර්ය පාප කර්මය හා සමාන ය. මෙසේ කියන ලදී. 'ශාරිපුත්‍රය, සීල සම්පන්න වූ සමාධි සම්පන්න වූ භික්ෂුව යම්සේ මේ ආත්මයේදී ම රහත්බවට පැමිණේ ද ශාරිපුත්‍රය, මේ කාරණය ද මෙසේයයි කියමි. ඒ කිම නොහැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට සිටියේ ගෙනහැර සිටුවූවකු මෙන් නිරයේ උපදනේ වෙයි' යනුවෙනි. මිථ්‍යා දෘෂ්ටියට වඩා මහාසාවද්‍ය වූ අන්‍ය වූ පාපායක් නැත. (එය) මෙසේ කියන ලදී. 'මහණෙනි, මම මෙසේ මහාසාවද්‍යතර වූ අනෙක් එකදු ධර්මයකුදු නොදකිමි. මහණෙනි, එනම් මිථ්‍යා දෘෂ්ටියයි. මහණෙනි, වැරදි මිථ්‍යා දෘෂ්ටිය පරම කොට පවතී යනුවෙනි. **කායස්ස භෙදා** යනු උපාදාන කළ ස්කන්ධයන් අත්හැරීමෙනි. **පරං මරණා** යනු ඉන් අනතුරුව පහළ වූ ස්කන්ධ අල්ලා ගැනීමෙහි ය. එසේ නැතහොත් කායස්ස භෙදා යනු ජීවිතේන්ද්‍රියයෙහි සිදීමෙනි. පරම්මරණා යනු චුතියෙන් මතු ය. **අපායං** යනාදි සියල්ල නිරය පර්‍යාය වචනයන් ය. නිරය වනාහි ස්වර්ගමෝක්ෂ දෙකට හේතු වූ පුණ්‍ය සම්මත වූ වර්ධනයෙන් පහවූ බැවින් ද සුබ සංඛ්‍යාත ආදායම නැති බැවින් ද **අපාය** නම් වේ. දුක්ඛ ගතියට පිළිසරණ වූයේ දුගතියයි. නැතහොත් දෝෂ බහුල බැවින් දුෂ්ට වූ ක්‍රියාවෙන් උපන් ගතිය **දුගති** නම්. නපුරු දේ කළහු එහි ඉබේ වැටෙත් නුයි විනිපාත නම් වේ. මෙහි ආශ්වාද හැඟීම් ඇත්තාගේ වර්ධනයක් නැත්තේ නුයි **නිරය** නම් වේ. එසේ නැතහොත් අපාය ගැනීමෙන් තිරිසන් යෝනිය ප්‍රකාශ කෙරෙයි. තිරිසන් යෝනි සංඛ්‍යාත අපාය සුගතියෙන් වෙන් වූ බැවින් දුගතියක් නොවේ. මහේශාක්‍ය නාගරාජාදීන් උපදනා බැවිනි. දුගතියේ ම දුගති ද වේ. සුගතියෙන් පහවූ බැවින් දුකෙහි ස්වභාවය වූ

බැවිනි. විනිපාතය අසුරයන් හා සමාන වූවක් නොවේ. නොවැටෙන ස්වභාව ඇති බැවිනි. මහා ආනුභාව ඇති ප්‍රේතයන්ගේ විමාන ද පහළ වේ. විනිපාත ග්‍රහණයෙන් අසුර කාය ප්‍රකාශ කෙරේ. එය ද කියන ලද අර්ථයෙන් අපාය ද දුග්ගති ද වෙයි. සුබ රාශියෙන් වැටෙන ස්වභාව ඇති බැවින් විනිපාත යැයි කියනු ලැබේ. නිරය ග්‍රහණයෙන් අවීචි ආදී අනේක ප්‍රකාර නිරයම ප්‍රකාශ කෙරේ. **උපපන්නා** යනු පැමිණි යනුයි. එහි පහළ වූ යන අදහසයි. කියන ලද චෙතස්කමින් ශුක්ලපක්‍ෂය පිළිබඳව දතයුතුය. මෙය වනාහි විශේෂත්වයයි. **මෙහි සුගති ග්‍රහණයෙන් මනුෂ්‍ය ස්වභාවය ද ගණන් ගනු ලැබේ. ස්වර්ග ග්‍රහණයෙන් දිව්‍ය ස්වභාවය** ගණන් ගැනේ. එහි **සුන්දර වූ ස්වභාවයක් ඇත්තේ සුගති** යයි. රූපාදි විෂයයන් කරණ කොටගෙන මනා වූ අගක් ඇත්තේය යන අර්ථයෙන් **සඟ** නම් වේ. ඒ සියල්ල ද කැඩීම් බිඳීම් අර්ථයෙන් **ලෝක** නම් වේ යන මෙය වචනාර්ථයයි. අසවල් කල්ප කෙළවරදී රැස්කරන ලදී. **අමූකාය කපපකොටියං උපචිතං** එහෙයින් මොහු දැන් හෝ අනාගතයේ හෝ ස්වර්ගයට යයි. අපායට යයි යනුවෙන් අටවැනි නවවැනි බලඥාන කෘත්‍යය එකක් කොට දක්වන ලදී. **කපපසත සහසෙස** වා යනාදියෙහි ද එසේමය.

එහෙයින්ම **ඉමානි භගවතො දෙව ඤාණානි** යි කියන ලදී. **නිහතො මාරො බොධිමූලෙ** යනු බෝරුක මුලදී ක්ලේශමාරයා නසන ලදී. මුලින් සිදින ලදී යනුයි. **ඉදං භගවතො දසමං බලං** යනු මේ ක්ලේශ මාරයාගේ නැසීම මුලින්ම සිඳ දැමීම භාග්‍යවතුන් වහන්සේගේ දසවැනි බලය වේ යනුයි. එහෙයින් ම **සබබාසව පරිකබය ඤාණං** යි කියන ලදී. යම්හෙයකින් වනාහි යම්දිනෙක අර්හත් මාර්ගයෙන් වාසනා සහිත සියලු කෙලෙස් ක්‍ෂය කරන ලද ද එදින භාග්‍යවතුන් වහන්සේ විසින් සර්වඥතා ඥානය අවබෝධ කරන ලද්දේ වේ ද එහෙයින් **යං සබබඤඤුතා පතතා** යනාදිය කියන ලදී. මෙය වනාහි මේ පිළිබඳ ආචාර්යවරුන්ගේ සමානාර්ථ කථාවයි.

පරවාදියා මෙසේ කියන ලදී. හුදකලා වූ දසබල ඤාණයක් නම් නැත. යම්හෙයකින් **සබබඤඤුතා පතතා විදිතා සබබධම්මා** යි කියන ලද්ද එහෙයින් මෙය සර්වඥතා ඥානයේම ප්‍රභේදයකි. එය එසේ නොදත යුතුයි. දසබල ඥානය අනෙකක් ම ය. සර්වඥතා ඥානය අනෙකකි. දසබල ඥානය ස්වකීය ස්වකීය කටයුතු ම දනියි. සර්වඥතා ඥානය

එයද එයින් අවශේෂ වූ දෙයද දනියි. දසබල ඥානයන්ගෙන් පළමුවැන්න කාරණ අකාරණයන් ම දනියි. දෙවැන්න කර්මය පිරිසිඳ දැනීම ම (දැනගනී) තෙවැන්න ධාතු නානත්ව හේතුව ම (දැනගනී) සිව්වැන්න අජ්ඣාසය අධිමුත්තිය ම (දැනගනී) පස්වැන්න කර්ම විපාක වෙනස ම (දැනගනී) සවැන්න ධ්‍යානාදිය සමග ඒවායේ කෙලෙසීම ම (දැනගනී) සත්වැන්න ඉන්‍ද්‍රියයන්ගේ තියුණු හා මෘදු භාවය ම (දැනගනී) නවවැන්න චුතූපපාත ඥානයම (දැනගනී) දසවැන්න සත්‍ය පිරිසිඳ දැනීම ම (දැනගනී) සර්වඥතා ඥානය වනාහි මේවායින් දතයුතු දේ ද එයින් එහා දේ ද දැනගනියි. මේවායේ කෘත්‍යය සියල්ල සිදු නොකරයි. එය වනාහි ධ්‍යානය බවට පත්ව සමවදින්නට නොහැකි වෙයි. ඍද්ධිය බවට පත්ව ඍද්ධි දක්වන්නට නොහැකි වෙයි. මාර්ගය බවට පත්ව ඍද්ධි දක්වන්නට නොහැකි වෙයි. මාර්ගය බවට පත්ව කෙලෙස් ක්ෂය කරන්නට නොහැකි වෙයි. එසේ වුවත් පරවාදියා මෙසේ විචාළ යුතුය. මේ දසබල ඥානය නම් විතර්ක විචාර සහිත වූවක් ද? අවිතර්ක විචාර මාත්‍රයක් ද ? අවිතර්ක අවිචාරය ද? කාමාවචරයක් ද? රූපාවචරයක් ද? අරූපාවචරයක් ද? ලෞකික ද? ලෝකෝත්තර ද? මෙසේ දන්නේ පිළිවෙලින් සප්තවිධ සවිතර්ක සවිචාර ආදිය කියා ද එයින් අන්‍ය වූ දෙවැදෑරුම් අවිතර්ක අවිචාර ආදිය කියා ද කියනු ලැබේ. ආසවක්ඛය ඥානය සවිතර්ක සවිචාර වන්නේය. අවිතර්ක විචාර මාත්‍රයක් වන්නේය. අවිතර්ක අවිචාර වන්නේය. එසේම පිළිවෙලින් සප්තවිධ කාමාවචරයන් ද ඉන්පසු රූපාවචර සිත් දෙක ද කෙළවර එක් ලෝකෝත්තර සිතක් යැයි කියනු ලැබේ. සබ්බඤ්ඤුත ඥානය වනාහි සවිතර්ක සවිචාර ම ය. කාමාවචර ම ය. ලෞකික ම ය යැයි මෙහිදී නිෂ්ඨාවට යා යුතුය.

විචයහාර සම්පාත වර්ණනාව නිමි.

මෙසේ නොයෙක් නොයෙක් ක්‍රමවලින් විචය හාර සම්පාතය විස්තර කොට දැන් යුක්තිහාර සම්පාතාදිය දක්වන්නට **නත්ථ කතමො යුත්තිහාර සම්පාතො** යනාදිය ආරම්භ කරන ලදී. එහි **තසමා රක්ඛිත චිත්තසස** යන ගාථාවේ පදාර්ථය විස්තර කරන ලද්දේ ම ය. **රක්ඛිත චිත්තසස සම්මා සංකප්ප ගොචරෝ භවිසසතීති යුජ්ජති** යනු මනස සවැනි කොට ඇති දොරටු සිහිය නමැති ජනේලය වසා වාසය කරන්නාට

කාමවිතර්ක ආදී මිථ්‍යා සංකල්පයන්ගෙන් අවකාශයක් නැත්තේය. නෙක්ඛම්ම විතර්කාදි සම්මා සංකප්පයම් එහි අරමුණ පවතින ස්ථානය වන්නේය යන මේ අර්ථය සුදුසු වේ. යුක්තිය සමග ගැටෙයි. සැසඳෙයි. සමවෙයි යන අර්ථයයි. **සම්මා සංකප්ප ගොචරෝ සම්මා දිට්ඨි භවිසසති** යනු කියන ලද ක්‍රමය අනුව සම්මා සංකප්පයට ගෝචර වූ පුද්ගලයා නොවෙනස්ව විතර්ක කරන හෙයින් සම්මා දිට්ඨි ඇත්තේ වෙයි. සම්මා දිට්ඨි සංඛ්‍යාත විදර්ශනා ඥානය පෙරටුකොට වාසය කරන්නා මාර්ග ඥානයෙන් පංචස්කන්ධයේ හටගැනීම හා විනාශවීම නොමුළාව අවබෝධ කරන්නේය. එසේ අවබෝධ කරන්නා දුක් ස්වභාව ඇති බැවින් සියලු භව ගතීන් දුරු කරන්නේය. එයින්ම සියලු නිරය භයද සසර භය ද ඉවත්ව යන්නේය යන මේ සියලු අර්ථය සුදුසු ම ය.

ස්වකීය සම්පත්තිය පිළිබඳව මෙන් මනාව යොදවන ලද සංකල්පය ඉන්ද්‍රියයන් කෙරෙහි රක්නා ලද දොරටු ඇති බැවින් සුචරිත සපිරීම පිණිස ආසන්න හේතුව වේ යයි සලකා **රකඛිතචිත්තසසාති නිණණං සුචරිතානං පදටඨානං** යි කියන ලදී. එහි අර්ථය මෙයයි. **රකඛිත චිත්තසස** යන මෙය ත්‍රිවිධ සුචරිතවලට ආසන්න පදයකි යනුයි. නෙක්ඛම්ම සංකප්ප ආදිය බහුලව ඇති පුද්ගලයාට කාමච්ඡන්ද ආදී නීවරණ ප්‍රහාණය කිරීම පහසුයැයි නෙක්ඛම්ම සංකප්ප ආදිය සමථයේ ආසන්න හේතුයැයි සලකා **සම්මා සංකප්ප ගොචරොති සමථසස පදටඨානං** යි කියන ලදී. කම්මස්සකතා සම්මා දිට්ඨියේ ද ප්‍රත්‍ය සහිත නාමරූපයන් දක්වාලන සම්මා දිට්ඨියේ ද සිටියේ ආත්ම ආදීන්ගේ සසර දුක දකිමින් එය ඉක්මවීමට උපාය වූ විදර්ශනාව අරඹන්නේය යන අර්ථයෙන් සම්මා දිට්ඨිය විදර්ශනාව පිණිස විශේෂ කාරණයකැයි සලකා **සම්මා දිට්ඨි පුරෙකඛාරොති විපසසනාය පදටඨානං** යි කියන ලදී. ඇතිවීම - නැතිවීම දැකීම වර්ධනය කරන්නා මත් වූ ස්වභාවය පහ කෙරේ. එය පළමු මාර්ගය අවබෝධ කරනු පිණිස හේතුවේ යැයි සලකා **ඤඤවාන උදයබබයනති දසසනභූමියා පදටඨානං** යි කියන ලදී. ආලෝක සංඥාව මෙනෙහි කිරීම ආදියෙන් ථීනමිද්ධයේ මැඩලීම වීර්යයේ ආසන්න කාරණය යැයි සලකා **ථීනමිද්ධාභිභූ භිකඛුනි විරියසස පදටඨානං** යි කියන ලදී. ඉදින් ආර්යමාර්ගය අවබෝධවන මොහොතෙහි පහාණ භාවනාව එකම අවබෝධය කැමතිවන ලද බැවින් සමාන වේ ද එසේ වුවත් ප්‍රහාණය කළයුතු දෙයෙහි ප්‍රහාණයක් නොමැති හෙයින් භාවනා සපිරීමක් නැතැයි ප්‍රහාණ නිමිත්ත බඳු කොට **සබබා දුගගතියෝ ජහෙති භාවනාය පදටඨානං** යි

කියන ලදී. එසේ නැතහොත් සියලු දුගතීන් අත්හරියි යන භාග්‍යවතුන් වහන්සේගේ මේ වචනය යෝගීන්ගේ උත්සාහ ජනනය පිණිස ආනිසංස ප්‍රකාශ කිරීමක් වේ. භාවනාවේ විශේෂ කරුණකැයි සලකා **සබ්බා -පෙ- පදථානං** යි කියන ලදී.

ඉඳුරන්හි වසන ලද දොරටු ඇති බව, සති සංවරය, සති බලය, නෙක්ඛම්ම විතර්ක බහුලකොට ඇත යන අර්ථයෙන් **නසමා රකඛිත චිනතසස සමමා සංකපප ගොචරොති ඉදං සතින්ද්‍රියං** යි කියන ලදී. එහි අර්ථය මෙසේය. එහෙයින් රක්නා ලද සිත් ඇත්තාට සම්මා සංකප්පය ගෝචර වේ යන මෙහි රක්නා ලද සිත් ඇති බවට ද සම්මා සංකප්පයේ ගෝචරත්වයට ද හේතුවන හෙයින් මෙය සතින්ද්‍රිය වේ. පංච ඉන්ද්‍රියයෙන් ගන්නා ලද්දානු වෙත්. ඉන්ද්‍රිය ලක්ෂණයෙන් හෝ විමුක්තිය මුනුකුරා යැවීම් ස්වභාවයෙන් හෝ එක සමාන ලක්ෂණ ඇති බැවින් යන අදහසයි. **ගහිතො භවති** යන මෙහි මාර්ග ලක්ෂණයෙන් ගැනීම ඉතා පහසු යැයි සලකා එය හැරදමා කරුණු වශයෙන් ගැනීම දක්වන්නට **සමමා දිටඨිතො හි සමමා සංකපපො පහවති** යනාදිය කියන ලදී. එහෙයින්ම **ගහිතො භවති අරියො අටඨංගිකො මගෙහා** යි කියා විමුක්තිය, විමුක්තිඥාන දර්ශනය ආදිය ද කියන ලදී.

රකිනු ලැබෙනුයි **රකඛිතං** නම් වේ. එය පද වශයෙන් වූ නිර්වචනයකි. යම්හෙයකින් අර්ථ වශයෙන් නිර්වචනය කී කල්හි පද වශයෙන් ද නිර්වචනය කියන ලද්දේ ම වෙයි ද එහෙයින් **රකඛිතං පරිපාලියතීති එසා නිරුතති** යි කියන ලදී. එහි **ඉති** ශබ්දය ආදී අර්ථයේ ය. ප්‍රකාරාර්ථයෙහි හෝ වේ. එයින් මේ නිරුක්තිය මෙබඳුය. මෙබඳු ආකාර ඇත්තේ යයි කියන ලද්දේ වෙයි. එහෙයින් සිතානුයි **චිනත** නම් වේ. චිත්‍රවිචිත්‍ර අර්ථයෙන් **චිනත** නම් වේ. විසිතුරු කිරීම් අර්ථයෙන් **චිනත** නම් වේ. මනාව කල්පනා කෙරේ යන අර්ථයෙන් **සමමා සංකපප** නම් වේ. ආදියෙන් නිරුක්තිය දතයුතුය. **අයං එසෝ භගවතො අධිපපායො** යනු රක්නා ලද සිත් ඇත්තෙක් වන්නේය යනාදියෙන් ඉන්ද්‍රිය සංවරාදිය ද දුර්ගත ප්‍රහාණය ද ප්‍රකාශ කරන භාග්‍යවතුන් වහන්සේගේ මේ ගාථාවේ අදහස වේ යනුයි. **කොකාලිකො හි** යනාදිය නිදානය දැක්වීමයි. එහි හි ශබ්දය හේතු අර්ථයේ ය. යම්හෙයකින් කෝකාලිකයා නොරක්නා ලද සිත් ඇති බැවින් අගසව්වන් කෙරෙහි සිත දූෂණය කොටගෙන පදුම නිරයෙහි උපන්නේ ද එහෙයින් දුගතීන් හරිනු කැමති පුද්ගලයා රක්නා ලද සිත්

ඇත්තෙක් වන්නේය යන මෙය කියන ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ ද සිහියෙන් ආරක්ෂා වූ සිතින් යුක්ත වූයේ සියලු දුගති දුරු කෙරේ යන අර්ථයයි. **සුතනමහි වුතතං සතියා චිතතං රකඛිතබබං** යනු දේශනා අනුසන්ධි (ගැළපීම) දැක්වීමයි.

නෙක්ඛම්ම සංකල්ප බහුල පුද්ගලයා කසිණ වශයෙන් හෝ මෛත්‍රී ආදී වශයෙන් හෝ ලබන ලද චිත්ත ඒකාග්‍රතා සංඛ්‍යාත වූ සිත් නමැති මංජුසාවෙහි සිත තබා සමාධිය ම හෝ ලබන ලද පරිදි සංකිලේස වශයෙන් රක්නා ලද සිත් ඇත්තේ වනැයි **තසමා රකඛිතචිතතසස සමමා සංකපප ගොචරොති අයං සමථෝ** යි කියන ලදී. විදර්ශනාව ප්‍රඥා ප්‍රධාන වේ යන්න **සමමාදිටඨි පුරෙකඛාරොති අයං විපසසනා** යනුවෙන් කියන ලදී. ආර්ය මාර්ගයෙන් දුක්ඛ සත්‍යය අවබෝධ කළ කල්හි උදය-ව්‍යය දර්ශනය මස්තකප්‍රාප්ත වේ යන්න **ඤතවාන උදයබබයනති දුකඛපරිඤඤා** යි කියන ලදී. හටගත් ස්වභාව ඇති යම්කිසිවක් වේ ද ඒ සියල්ල නිරුද්ධ වන ස්වභාව ඇත්තේය යනු මාර්ග ඥානයේ පැවැත්ම දැක්වීමකි. **ඉමානි චතතාරි සචචානි** යනු චතුසත්‍ය ධර්ම වශයෙන් ආවර්තනය වීම නිමවයි යනුයි. එහිදී පළමු සත්‍ය දෙක තැබීමෙන් විභාග ධර්ම වශයෙන් ද අවසන් දෙකින් සභාග වශයෙන් ද ආවර්තනය දතයුතුය.

කුසල පක්ෂය කුසල පක්ෂය සමග දැක්විය යුතුය. රක්නා ලද සිත් ඇත්තහුට යනු සති සංවරයයි. එය ද්වාර වශයෙන් ෂඩ්විධය. චක්ෂු ද්වාරයේ පටන් මනෝද්වාරය දක්වා ය. නෙක්ඛම්ම සංකප්පය අව්‍යාපාද සංකප්පය අවිහිංසා සංකප්පය යැයි සම්මා සංකප්පය ත්‍රිවිධ ය. දුකෙඛ ඤාණය - පෙ- ඉදපපචචයතා පටිචච සමුපපනෙනසු ධමෙමසු ඤාණය යනුවෙන් සම්මා දිට්ඨිය අටවැදෑරුම් ය. උදය - ව්‍යය ඥානය පණස් වැදෑරුම් ය. අවිද්‍යාව හටගැනීමෙන් රූප සමුදය වේ. -පෙ- වෙනස්වන ලක්ෂණය දකින්නා ද විඤඤාණ ස්කන්ධයේ වැයවීම දකී (වශයෙනි) සතර මාර්ගවලට අනුව ඊනමිද්ධයෙන් මැඩීම චතුර්විධ ය. එහි සති සංවරය ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් ය. ඒවා අතුරෙන් ලෞකික සති සංවරය කාමාවචරය ම ය. ලෝකෝත්තරය දර්ශන භාවනා භේදයෙන් දෙවැදෑරුම් ය. එකක් වූ මෙය සතර සතිපට්ඨාන භේදයෙන් සිව්වැදෑරුම් ය. **සම්මා සංකප්ප** ආදියේදී ද මේ ක්‍රමයමැයි. මෙය වනාහි විශේෂයයි. **සම්මා සංකප්පය** ප්‍රථමධ්‍යාන වශයෙන් රූපාවචර වේ යයි

බැහැර කළ යුතුය. පදට්ඨාන විභාගය පදට්ඨාන හාර **සම්පාතයෙහි** කියන ලද ක්‍රමයෙන් කිය යුතුය. අකුසල පක්‍ෂයෙහි අසංවරය ලක්ඛ අසංවරය -පෙ- කාය අසංවරය, වාචා අසංවරය, මනෝ අසංවරය කියාද අටවැදෑරුම් ය. මිථ්‍යා සංකල්පය කාමවිතර්කාදී වශයෙන් ත්‍රිවිධය. අඥානත්වය දුක පිළිබඳ අඥානත්වය ආදී ලෙසින් අෂ්ටවිධව බෙදන ලදී. සම්‍යක් දෘෂ්ටි පක්‍ෂයෙන් මිථ්‍යාදෘෂ්ටිය සැට දෙවැදෑරුම්ව දතයුතුය. උත්පත්ති භූමි ලෙසින් ථීනමිද්ධය පස්වැදෑරුම් ය. මෙසේ අකුසල පක්‍ෂයෙහි බෙදීම දතයුතුය.

පරිවර්තන හාරයෙහි, ආවර්තන හාරයෙහි කියන ලද ක්‍රමයෙන් සමථ විදර්ශනා දෙක වෙන් නොකොට **සමථ විපසසනාය භාවිතාය** යි කියන ලදී. මෙහිදී සමථ විදර්ශනා දෙක ලෞකික යි දතයුතුය. **පටිපකෙඛන** යනු අරකඛතෙන චිතෙතන යන ගාථාවට ප්‍රතිපක්‍ෂ වූ යන අදහසයි. එසේ නැතහොත් විහක්ති හාරයෙහි දක්වන ලද අකුසල පක්‍ෂයට ප්‍රතිපක්‍ෂ වූ යන අර්ථයයි.

මානස, හදය, පණ්ඩර, විඤඤාණ, විඤඤාණස්කන්ධ, මනෝ විඤඤාණ ධාතු යනු සිතට පර්යාය වචනයන්ය. තක්ක, විතක්ක, සංකප්ප, අප්පනා, බ්‍යප්පනා, චේතසෝ අභිනිරොපනා යනු සම්මා සංකප්පයට පර්යාය වචනයන් ය. පඤඤා පජානන විචය පවිචය යනාදිය සම්මා දිට්ඨියට පර්යාය වචනයන් ය. ථීන, ථීයන, ථීයිකත්ත, චිත්ත අකල්ලතා, අකම්මඤඤතා, ඔනාහ පරිනාහ අන්තොසංකොච යනු ථීනයට පර්යාය වචනයන් ය. අකලලතා, අකම්මඤඤතා, කායාලසිය, සුපප, සුපපනා, සුපිත යනු මිද්ධයට පර්යාය වචනයන් ය. භික්ඛකො, භික්ඛු යනාදිය භික්ඛු යන පදයට පර්යාය වදන් ය. දුග්ගති, අපාය, විනිපාත, වට්ටදුක්ඛ, සංසාර යනාදිය දුගතියට පර්යාය වදන් යැයි දතයුතුය.

රකිනු ලබන සිහියෙන් අධිෂ්ඨානය කොට රකිනු ලබන සිත ඊට අධිෂ්ඨානයක් මෙන් වේයැයි සලකා **රකඛිතචිතතසසානි පදටඨාන පඤඤතති සතියා** යි කියන ලදී. සෙස්ස මේ පඤ්ඤත්ති හාර සම්පාතයේ දී ඉන් මත්තෙහි ඔතරණ, සොධන හාර සම්පාතයන්හි දී ද නොවූ විරූ නොවේ. යට කියන ලද ක්‍රමය ම වේ.

අධිට්ඨාන හාර සම්පාතයේ දී **සමමා දිටඨි නාම යං දුකෙඛ ඤාණං**

යනාදියෙන් චතුසත්‍ය හේතුව, හේතු සමුත්පන්න, ප්‍රත්‍ය, ප්‍රත්‍යුත්පන්න සංඛ්‍යාවා විෂය වශයෙන් වෙනස දක්වා නැවත **යං තත්‍ථ තත්‍ථ යථාභූතං ඤාණං දස්සනං** යනුවෙන් පාලියේ ද පාලි අර්ථයන්ගේ ද ඉතිරි විෂය වශයෙන් ම වෙනස් බව දක්වයි. එහි **යං සච්චාගමනං** යනු සත්‍යයෙන් වෙනස් නොවූ යම් විෂයාගමනයක් වේ ද එයයි. අවබෝධය යන අර්ථයයි. **යං පච්චාගමනං** යනුවෙන් ද පාඨයක් වේ. ඒ විෂයයේ පිළිවෙලින් යම් ආගමනයක් වේ ද එයයි. ඒ ඒ විෂයාධිගමය යන අර්ථයයි. මෙහිදී පරික්ඛාර, සමාරොපන හාර සම්පාතයන්හිදී ඉතිරි වූ යමක් කිවයුතු ද එය පෙර කියන ලද බැවින් ප්‍රකට ම ය.

එසේ වුවත් මෙහිදී හාර සම්පාත නිර්දේශය මේ ක්‍රමයෙන් ද දතයුතුය.

> මනො පුබ්බංගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා
> මනසා චේ පසන්නෙන භාසති වා කරොති වා
> තතො නං සුඛමන්වෙති ඡායාව අනපායිනි යනුවෙනි.

එහි **දේශනාහාර සම්පාතය කවරේ ද?** මනස පූර්වංගම ධර්මයයි. මනෝ යනුවෙන් (ස්කන්ධ නියම කිරීමේදී) බන්ධවවත්‍ථානයේ දී විඤ්ඤාණ ස්කන්ධය දේශනා කෙරෙයි. ආයතන වවත්‍ථානයේ දී මනායතනයයි. ධාතු වවත්‍ථානයේ දී විඤ්ඤාණ ධාතුවයි. ඉන්ද්‍රිය වවත්‍ථානයේ දී මනින්ද්‍රියයි. කවර ධර්ම පූර්වංගම වේ ද? ධර්ම හයක් පූර්වංගම වේ. කුසලයන්ගේ කුසල මූල (තුන) හා අකුසලයන්ගේ අකුසල මූලයන් ය. (තුනයි.) ප්‍රධානීන් සහිත වූවන්ට අධිපති වේ. සියලු සිතිවිලිවලට ඉන්ද්‍රිය අධිපති වේ. එසේ වුවත් මේ සූත්‍රයේ දී මනස අදහස් කරන ලදී. යම්සේ බලසේනා ගණින තැනට රජතුමා පෙරටු වේ ද එසේම සියලු (චෛතසික) ධර්මවලට මනස ම පෙරටු වේ. එහිදී නෙක්ඛම්ම ඡන්දය, අව්‍යාපාද ඡන්දය, අවිහිංසා ඡන්දය යන තුන් ක්‍රමයෙන් මනස පූර්වංගම වේ. එහිදී නෙක්ඛම්ම ඡන්දයෙන් අලෝභයට මනස පූර්වංගම වේ. අව්‍යාපාද ඡන්දයෙන් අද්වේෂයට මනස පූර්වංගම වේ. අවිහිංසා ඡන්දයෙන් අමෝහයට මනස පූර්වංගම වේ. **මනොසෙට්ඨා** යනු ඒ ධර්මයන් අතුරෙන් මනස ශ්‍රේෂ්ඨය. විශිෂ්ටය. උතුම්ය. ප්‍රවරය මූලයයි. ප්‍රමුඛයායි. වඩාත් ප්‍රමුඛයායි. එහෙයින් මනෝ සෙට්ඨා යයි කියනු ලැබේ. **මනොමයා** යනු මනසින් කරන ලද මනසින් නිම්වන ලද මනසින් නිපන් බැවින් මනස් ඒවායේ හේතුව වේ. එහෙයින්

මනෝමයා යි කියනු ලැබේ. ඒ ධර්මයෝ නම් ඡන්දයෙන් හටගත් නොකැළඹුණු සංකල්පවලින් ඇතිවූ ස්පර්ශ එකතුවෙන් යුත් වේදනා ස්කන්ධය, සංඥා ස්කන්ධය, සංස්කාර ස්කන්ධය යන මේවාය.

මනසා වෙ පසනෙනන යනු යම් ශ්‍රද්ධාවක් සද්දහන, ඔකප්පන, අභිප්‍රසාද යන මේ ප්‍රසාදයෙන් යුක්ත වූයේ මනාව යුක්ත වූයේ, ඊට එළඹියේ, මනාව එළඹියේ, එයින් යුක්ත වූයේ සමන්නාගත වූයේ වෙයි ද එහෙයින් පසන්නෙන යැයි කියනු ලැබේ. එය මනෝ කර්මයයි. **භාසති** යනු වචීකර්මයයි. **කරොති වා** යනු කාය කර්මයයි. මෙසේ දස කුසල කර්මපථය දක්වන ලදී. **තතො** යනු දශවිධ කුසල කර්ම කළ බැවිනි. රැස්කළ බැවිනි. **නං** යනු කරන ලද පින් ඇති කරන ලද කුසල් ඇති බියෙන් එතෙර වූ යම් ඒ පුද්ගලයෙක් වේ ද ඒ පුද්ගලයා ය. **සුඛං** යනු කායික, චෛතසික යන සැප දෙකයි. **අනෙති** යනු අනුව යයි යනුයි. මේ ලෝකයේ ප්‍රහීණ නොවූ කෙලෙස් ඇති පුද්ගලයා සංයෝජනීය ධර්මවල ආශ්වාදය අනුව බලයි. හෙතෙම සංයෝජනීය ධර්මවල ආශ්වාදය අනුව බලමින් දක්නා ලද පරිදි අසන ලද පරිදි මතුභවය ප්‍රාර්ථනා කරයි. මෙසේ ඔහුගේ අවිද්‍යාව ද භව තණ්හාව ද එකට බැඳී තිබේ. හෙතෙම දක්නා ලද පරිදි අසන ලද පරිදි මතුභවය ප්‍රාර්ථනා කරනුයේ පැහැදිය යුතු වස්තුවෙහි සිත පහදවයි. අදහයි. විශ්වාස කරයි. ප්‍රසන්න සිත් ඇති හෙතෙම කයින් වචනයෙන් මනසින් දානමය ශීලමය භාවනාමය ත්‍රිවිධ පුණ්‍ය වස්තුව අනුව සිටියි. හෙතෙම එහි විපාකය මෙලොවදී හෝ දෙවන භවයේදී හෝ ඉන් අන්‍ය වූ භවයක දී හෝ විඳියි. මෙසේ ඔහුට අවිද්‍යා හේතුවෙන් සංස්කාර වේ. සංස්කාර හේතුවෙන් විඤ්ඤාණය වේ. විඤ්ඤාණ හේතුවෙන් නාමරූප වේ. නාමරූප හේතුවෙන් සළායතන වේ. සළායතන හේතුවෙන් සැපවේදනා ස්පර්ශය වේ. ස්පර්ශ හේතුවෙන් වේදනාව වේ. මෙසේ ඇත්තා වූ ඒ සැපය අනුව යයි. මෙසේ අන්‍ය අන්‍ය බවකට පෙරලෙන වේදනාව නිසා ඔහුට තණ්හාව ඇති වේ. තණ්හා හේතුවෙන් උපාදානය වේ. -පෙ- හටගැනීම වෙයි. එහි යමක් මනස වේ ද යමක් මනෝපූර්වංගම වේ ද යමක් සුබ වේ ද ඒවා පංචස්කන්ධය යැයි කියනු ලැබේ. දුක්ඛ සත්‍යය ඒවාට පළමු හේතුව විය. අවිද්‍යාව හා භව තණ්හාව සමුදය සත්‍යයයි. ඒවා අවබෝධ කරනු පිණිස, ප්‍රහාණය කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරති. දුක අවබෝධ කරනු පිණිසය. දුක හටගැනීමේ හේතුව (=සමුදය) ප්‍රහාණය කරනු පිණිසය. දුක හටගැනීමේ හේතුව (=සමුදය) ප්‍රහාණය

කරනු පිණිසය. යමක් කරණ කොටගෙන වෙසෙසින් දැනගනී ද යමක් කරණ කොටගෙන ඉවත් කෙරේද මේ මාර්ගයයි. යම්තැනක මාර්ගය පවතී ද ඒ නිරෝධයයි. මේ සතර සත්‍යය මෙසේ ආයතන ධාතු, ඉන්ද්‍රිය දොරටුවලින් ද වෙන්කළ යුතුය. එහි සමුදය සත්‍යයෙන් ආශ්වාදයයි. දුක්ඛ සත්‍යයෙන් ආදීනවයයි. මාර්ග නිරෝධ සත්‍යවලින් නිස්සරණයයි. සැපයේ අනුපිළිවෙල ඵලයයි. ප්‍රසන්න මනසින් වන කායික වාචසික උත්සාහය උපායයි.

මනස පෙරටුකොට ඇති බැවින් තමාට සැප කැමති ප්‍රසන්න වූ සිතින් චෛතසික ධර්ම පිළිබඳ වචී කර්මය ද කාය කර්මය ද පැවැත්විය යුතුය යන මෙය භාග්‍යවතුන් වහන්සේගේ ආඥාවයි. මේ දේශනා හාර සම්පාතයයි.

එහි විචය හාර සම්පාතය කවරේ ද?

සිතන හෙයින් අරමුණ දැනගන්නා හෙයින් මන නම් වේ. මනන ලක්ෂණයෙහි යෙදුණු දේ කෙරෙහි ආධිපත්‍යය ඇති කරන බැවින් පූර්වංගම නම් වේ. උත්සාහයක් නොමැති හෙයින් ආත්මයක් නැති ජීවයක් නැති අර්ථයෙන් ධම්ම නම් වේ. ගම්වල ප්‍රධානියා ගාමණී මෙන් ප්‍රධාන අර්ථයෙන් මේවා අකුරෙන් මනස ශ්‍රේෂ්ඨ වේ යන අර්ථයෙන් මනොසෙට්ඨ නම් වේ. සහජාත ආදී ප්‍රත්‍යයක් වූ මනසින් නිපන්නේනුයි මනොමය නම් වේ. කිලිටි නැති බැවින් ද අරමුණ විශ්වාස කරන බැවින් ද ප්‍රසන්න වූ (බැවින් පසනෙනන නම් වේ.) වාග් විඥප්තිය පැතිරෙන බැවින් ද එසේම (එය) හාරගන්නා බැවින් ද භාසති නම් වේ. සෙලවෙන කාය විඥප්තිය පැතිරෙන බැවින් ද එසේම (එය) හාරගන්නා බැවින් ද කරොති නම් වේ. එසේ යෙදුණ බැවින් ද නොවෙනස් බැවින් ද තතො යයි කියන ලදී. සුව බැවින් ද සැප බැවින් ද ඉටු බැවින් ද සුඛ යැයි කියන ලදී. රැස් කරන ලද බැවින් ද නොපැසුණු විපාක ඇති බැවින් ද අචෙති යයි කියන ලදී. කාරණයට අයත් පැවතුම් ඇති බැවින් ද හැර නොයන බැවින්ද ඡායාව අනපායිනි යි කියන ලදී. මේ පදයක් පාසා පිරික්සීම් වශයෙන් වූ විචය හාර සම්පාතයයි.

එහි යුක්ති හාර සම්පාතය කවරේ ද?

චෛතසික ධර්මයන්ගේ ආධිපත්‍ය යෝගයෙන් මනසේ පෙරටු බව යෙදෙයි. එහෙයින් ම ඒ ධර්මයන් මනසට අනුව පවත්නා හෙයින් මනෝ ශ්‍රේෂ්ඨත්වය යෙදෙයි. සහජාත ආදී ප්‍රත්‍ය ලෙසින් මනසින් උපන් බැවින් ධර්මයන්ගේ මනෝමයත්වය යෙදෙයි. ප්‍රසන්න මනසින් හටගත් කායවාක් කර්මයන්ගේ කුශලභාවය යෙදෙයි. යමකින් කුසල කර්මය රැස් කරන ලද ද එය සෙවණැල්ල මෙන් සැපය අනුව යේ යැයි යෙදෙයි. මේ යුක්තිහාර සම්පාතයයි.

එහි පදට්ඨාන හාර සම්පාතය කවරේ ද?

මනස මනෝපවිචාරයන්ට ආසන්න කාරණයයි. මනස පෙරටුකොට ඇති ධර්ම සියලු කුසල පක්‍ෂයට ආසන්න කාරණ වෙයි. භාසති යනු සම්මා වාචාවයි. කරොති යනු සම්මා කම්මන්තයයි. ඒවා සම්මා ආජීවයේ ආසන්න කාරණයයි. සම්මා ආජීවය සම්මා වායාමයේ ආසන්න කාරණයයි. සම්මා වායාමය සම්මා සතියේ ආසන්න කාරණයයි. සම්මා සතිය සම්මා සමාධියේ ආසන්න කාරණයයි. මනසා පසන්නෙන යන මෙහි ප්‍රසාද යනු සද්ධා ඉන්ද්‍රියයි. එය සීලයේ ආසන්න කාරණයයි. සීලය සමාධියේ ආසන්න කාරණයයි. සමාධිය ප්‍රඥාවේ ආසන්න කාරණය වේයයි විමුක්ති ඥාන දර්ශනය දක්වා යෙදිය යුතුය. මෙය පදට්ඨානහාර සම්පාතයයි.

එහි ලක්‍ෂණ හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබබංගමා ධම්මා යන මනස පෙරුටකොට ඇති බව යන ප්‍රකාශයෙන් ධර්මයන්ගේ ඡන්දය පෙරටුකොට ඇති බව ද වීර්යය පෙරටුකොට ඇති බව ද වීමංසාව පෙරටු කොට ඇති බව ද කියන ලද්දේ වෙයි. අධිපති ලක්‍ෂණයෙන් ඡන්ද ආදියේ ද මනසේ ද සමාන ලක්‍ෂණ ඇති බැවිනි. එසේම ඒවායේ ශ්‍රද්ධා පූර්වංගමත්වය ද කියන ලද්දේ වෙයි. ඉන්ද්‍රිය ලක්‍ෂණයෙන් ශ්‍රද්ධා ආදියේ ද මනසේ ද සමාන ලක්‍ෂණ ඇති බැවිනි. මනසා චෙ පසන්නෙන යනු යම්සේ මනසේ ප්‍රසාද සහිත බවක් වේද කාය වාක් කර්මයන්ගෙන් හටගත් ඒ අනවද්‍යභාව ලක්‍ෂණය යම්සේද එසේ සිතේ සති ආදියෙන් යුක්ත බව ද ඒවායේ අනවද්‍ය ලක්‍ෂණය ද වේ. යෝනිසො මනසිකාරයෙන් හටගත් බැවින් සමාන ලක්‍ෂණ ඇති බැවිනි. සුඛමනිඤ්ඤති යනු සැපය අනුව යයි යන

ප්‍රකාශනයෙන් සුඛයට හේතු වූ මනාප වූ රූපාදියේ අනුව යෑම කියන ලද්දේ වෙයි. කර්ම ප්‍රත්‍ය බැවින් ඒවායේද සමාන ලක්ෂණ ඇති බැවිනි. මේ ලක්ෂණහාර සම්පාතයයි.

එහි චතුබ්‍යූහ හාර සම්පාතය කවරේ ද?

මනො පුබ්බංගමා යනාදියෙහි මනො යනාදී පදයන්ගේ නිර්වචනය නිරුක්තියයි. එය පදාර්ථ දැක්වීම් වශයෙන් දතයුතුය. පදාර්ථය ද කියන ලද ක්‍රමයෙන් මනාව දතහැකිය. යමෙක් සැපයෙන් වැඩ කැමැත්තානු ද ඔවුන් විසින් ප්‍රසන්න වූ සිතින් කාය වාක් මනෝ කර්මයන් පැවැත්විය යුතුය යනු මෙය මෙහිදී භාග්‍යවතුන් වහන්සේගේ අදහසයි. පුණ්‍ය ක්‍රියා කරණ කොටගෙන අනෙක් ඒවාත් පෙරටු වී ඇත. එහිදී ඒ දේශනාවේ නිදානය මනාව දක්වන්නෝ 'සදොරට අධිපති රජුය. ධර්මයෝ සිතට අනුව පෙරළෙන්නෝ ය. ඒකධර්මය වූ සිතෙහි වසඟයට සියල්ලේ පැමිණියහ. 'මේ ආදිය දැක්වීමෙන් මේ දේශනාවේ සැසඳීම දේශනානු සන්ධියයි. පදානුසන්ධිය මනාව දතහැකිය. මේ චතුබ්‍යූහ හාර සම්පාතයයි.

එහි ආවට්ටහාර සම්පාතය කවරේ ද?

මනො පුබ්බංගමා ධම්මා යන එහි යම් ත්‍රිවිධ කුසල මූලයක් වේ ද ඒවා අෂ්ටවිධ සම්මතයන්ගේ හේතුවයි. යමක් සම්මත කරන ලද ද ඒ අෂ්ටාංගික මාර්ගයයි. මනස හා හටගත් යම් නාමරූපයක් වේ ද එය දුක්ඛ සත්‍යයයි. නොසිඳින ලද පළමුව නිපන් අවිද්‍යා භව තණ්හාවක් වේද එය නිරෝධයයි. මෙසේ මේ සතර සත්‍යය වේ. මේ ආවට්ට හාර සම්පාතයයි.

එහි විභත්ති හාර සම්පාතය කවරේ ද?

මනො පුබ්බංගමා ධම්මා මනසා චෙ පසන්නෙන තතො නං සුඛමන්වෙති යන මෙය ප්‍රකාශ කළ පරිදිම නොගත යුතුය. යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ සතුන් මරණ, මිථ්‍යාදෘෂ්ටික වූ මිථ්‍යා කටයුතුවලට පිළිපන් පුද්ගලයෙකු කෙරෙහි ස්වකීය සිත පහදවා ද ප්‍රසන්න වූ සිතින් ද නොමැති ගුණයන් දැක්වීම් වශයෙන් කියන්නේ හෝ ඔහුට නිහතමානී භාවය දක්වයි ද එයින් ඔහු සැප අනුව නොයයි. එයින් ඔහු බර උසුලන

ගොනාගේ පිය අනුව යන රිය සක මෙන් දුක අනුව යයි. මෙසේ මෙය විභජ්ජ ව්‍යාකරණීය වේ. ඉදින් ප්‍රසන්න වූ මනසින් යමක් කියයි ද නැතහොත් කරයි ද එය මේ සුඛවේදනීය වූ වාක් කර්මය හා කාය කර්මයයි. ඊට හේතු කවරේ ද? සම්මත බවට ගියවුන් විසින් සුවසේ විඳිය යුතුය. මිථ්‍යා ස්වරූපයට පත්වූවන් විසින් දුකසේ විඳිය යුතුය. මේ ප්‍රසාදය කෙසේ දතයුතු ද? මෙය ප්‍රසාදයක් නොවේ. ප්‍රසාද ස්වරූපී මිථ්‍යා විමෝක්ෂය යැයි කියමි. මේ විභක්තිහාර සම්පාතයයි.

එහි පරිවත්ත හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබ්බංගමා යනු ආරම්භයයි. දූෂිත වූ සිතින් යමක් කියයි නම් හෝ කරයි නම් හෝ එය දුකට අනුව යන්නේය. මේ සූත්‍රය වනාහි ඊට ඍජුව ප්‍රතිපක්ෂ වෙයි. මේ පරිවත්ත හාර සම්පාතයයි.

එහි චේවචන හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබ්බංගමා යන්නට මනෝ, චිත්ත, මනායතන, මනින්ද්‍රිය, මනෝ විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ ධාතු යනු පර්යාය වචනයන් ය. පුබ්බංගමා යන්නට පුරෙචාරී, පුරෙගාමී යනු පර්යාය වචනයන් ය. ධම්මා අත්තා සභාවා යනු ද පර්යාය වචනයන් ය. සෙට්ඨං, පධානං, පවරං යනු පර්යාය වචනයන්ය. මනෝමය, මනෝ නිබ්බත්තං, මනෝ සම්භූත යනු පර්යාය වචනයන් ය. පසන්නෙන සද්දහන්තෙන ඔකප්පෙන්තෙන යනු පර්යාය වචනයන් ය. සුඛ, සාත, වෙදයිත යනු පර්යාය වචනයන් ය. අන්වෙති, අනුගච්ඡති, අනුබන්ධති යනු පර්යාය වචනයන් ය. මේ චේවචන හාර සම්පාතයයි.

එහි පඤ්ඤත්ති හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබ්බංගමා යන මෙය මනසේ කෘත්‍යය පැනවීමයි. ධම්මා යනු ස්වභාව ප්‍රඥප්තියයි. කුසල කර්ම පථ ප්‍රඥප්තියයි. මනොසෙට්ඨා යනු ප්‍රධාන ප්‍රඥප්තියයි. මනෝමයා යනු සහජාත ප්‍රඥප්තියයි. පසන්නෙන යනු සද්ධා ඉන්ද්‍රියෙන් යුක්ත ප්‍රඥප්තියයි. ශ්‍රද්ධා නැත්තාට ප්‍රතික්ෂේප ප්‍රඥප්තියයි. භාසති වා කරොති වා ය නු සම්මා වාචා, සම්මා කම්මන්ත යනාදියේ නික්ෂේප ප්‍රඥප්තියයි. තතො නං සුඛ මන්වෙති යනු කර්මයේ

ඵලය හා බැඳුණු ප්‍රඥප්තියයි. කර්මයේ අවිනාස ප්‍රඥප්තියයි. මේ ප්‍රඥප්ති හාර සම්පාතයයි.

එහි ඔතරණ හාර සම්පාතය කවරේ ද?

මනෝ යනු විඥාන ස්කන්ධයයි. ධම්මා යනු වේදනා සංඥා සංස්කාර ස්කන්ධයන්ය. භාසති වා කරොති වා යනු කාය වාක් විඥප්තීන් ය. ඒවා ඇසුරින් සතර මහාභූත වේ. රූපස්කන්ධය වේ. මේ ස්කන්ධයන්හි බැසගැන්මයි. මනෝ යනු අභිසංඛාර විඤ්ඤාණයයි. මනෝ යන ගැනීමෙන් අවිද්‍යා හේතුවෙන් වන සංස්කාර ගන්නා ලදී. සංස්කාර හේතුවෙන් විඤ්ඤාණය වේ. -පෙ- හටගැනීම වෙයි යන මෙය පටිච්ච සමුප්පාදයෙන් බැසගැනීමයි. මේ ඔතරණ හාර සම්පාතයයි.

එහි සොධන හාර සම්පාතය කවරේ ද?

මනෝ යනු ආරම්භයයි. පද සුද්ධිය නොවේ. ආරම්භ සුද්ධිය ද නොවේ. මනෝ පුබ්බංගමා යනු පද සුද්ධියයි. ආරම්භ සුද්ධිය නොවේ. එසේම ධම්මා සිට සුඛං තෙක් පද සුද්ධියයි. ආරම්භ සුද්ධිය නොවේ. සුඛමන්වෙති යන්න වනාහි පද සුද්ධිය සේම ආරම්භ සුද්ධිය ද වේ. මේ සොධන හාර සම්පාතයයි.

එහි අධිට්ඨාන හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබ්බංගමා ධම්මා මනෝසෙට්ඨා මනෝමයා යනු ඒකත්වයයි. මනසා චෙ පසන්නෙන යනු විවිධත්වයයි. එසේම මනසා චෙ පසන්නෙන යනු ඒකත්වයයි. භාසති වා කරොති වා යනු විවිධත්වයයි. එසේම මනසා චෙ පසන්නෙන යනු ඒකත්වයයි. ඒ ප්‍රසාදය දෙවැදෑරුම් ය. ආධ්‍යාත්මික ව්‍යාපාදය දුරු කිරීමෙන් ද බාහිර දෙය විශ්වාස කිරීමෙන් ද වශයෙනි. එසේම සම්පත්ති භාවයට හේතු වූ ද වැඩීමට හේතු වූ ද ප්‍රසාදය වශයෙනි. මේ විවිධත්වයයි. ඒ මේ සූත්‍රය ආකාර දෙකකින් අධිෂ්ඨාන කළ යුතුය. යමෙක් ප්‍රසන්න මනසින් යුතු වේද ඒ හේතුවෙන් ද යමක් සුබ වේදනීය වේ ද ඒ විපාකයෙන් ද යනුවෙනි. මේ අධිට්ඨාන හාර සම්පාතයයි.

එහි පරික්ඛාර හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබ්බංගමා යන මෙහි මනෝ යනු කුසල විඥානයයි. ඤාණයෙන් යුක්ත වූ ඊට අලෝභ, අදෝස, අමෝහ යන තුන සම්ප්‍රයුක්ත හේතු වෙයි. ඤාණයෙන් තොර වූ දෙයට අලෝභ අදෝස යන දෙක සම්ප්‍රයුක්ත හේතුවෙයි. සියල්ලට අවිශේෂයෙන් යෝනිසො මනසිකාරය හේතුවෙයි. සතර සම්පත්ති චක්‍රයන් ප්‍රත්‍ය වෙයි. සඳහම් ඇසීම ද එසේය. දානාදී වශයෙන් පවත්නා දෙය්‍ය ධර්ම ආදිය ඊට හේතුවෙයි. මෙහි ධම්මා යනු වේදනා ආදියේ ඉටු අරමුණු ආදියයි. එසේම ත්‍රිවිධ වේදනාදිය ප්‍රසාද විඥානයේ සද්ධෙය්‍ය වස්තුවයි. කුසල අභිසංස්කාර විපාක සැපයේ හේතුවයි. මේ පරික්ඛාර හාර සම්පාතයයි.

එහි සමාරෝපන හාර සම්පාතය කවරේ ද?

මනෝ පුබ්බංගමා ධම්මා යන තැන මනෝ යනු පුණ්‍ය චිත්තයයි. එය දානමය, සීලමය, භාවනාමය යනුවෙන් ත්‍රිවිධය. එහි දානමය පින් සිතට අලෝභය ආසන්න කාරණ වෙයි. සීලමය පින් සිතට අදෝසය ආසන්න කාරණ වෙයි. භාවනාමය පින් සිතට අමෝහය ආසන්න කාරණ වෙයි. සියල්ලට අභිප්‍රසාදය ආසන්න කාරණ වෙයි. 'ශ්‍රද්ධාව ඇති වූයේ එළඹෙයි. එළඹෙමින් ඇසුරු කරයි' යන සූත්‍රය විස්තර කළ යුතුය. කුසල සිත සුබ සහගත ඉෂ්ට විපාකයේ ආසන්න කාරණයයි. යෝනිසො මනසිකාරය කුසල සිතේ ආසන්න කාරණයයි. නුවණින් සිහි කරනුයේ කුසල් සිත අධිෂ්ඨාන කරයි. කුසල් සිත වඩයි. හෙතෙම නූපන් පාපී අකුසල් දහම් නූපදවීම පිණිස කැමැත්ත උපදවයි. උපන් කුසල් දහම් -පෙ- උත්සාහ කරයි. මෙසේ සතර සම්‍යක් ප්‍රධන් වඩන කල්හි ඔහුගේ සතර සතිපට්ඨාන පටන් ආර්ය අෂ්ටාංගික මාර්ගය දක්වා වැඩීමට පිරිපුන් බවට පත්වේ යන මෙය භාවනාවට නැංවීමයි. සතියද ප්‍රහාණය ද භාවනාවෙන් සිද්ධ වේ ම ය. මේ සමාරෝපන හාර සම්පාතයයි.

එසේම

දදතො පුඤ්ඤං පවඩ්ඪති - සංයමතො වෙරං න චීයති
කුසලො ච ජහාති පාපකං - රාග දොස මොහකඛයා සනිබ්බුතො

(යන්නෙන් ද හාර සම්පාත නිර්දේශය දතයුතුය.)

එහි දදතො පුඤ්ඤං පවඩ්ඪති යනුවෙන් දානමය පුණ්‍යක්‍රියා වස්තුව කියන ලදී. සංයමතො වෙරං න චීයති යනුවෙන් සීලමය පුණ්‍ය ක්‍රියා වස්තුව කියන ලදී. කුසලො ච ජහාති පාපකං යනු ලෝභයේ ද ද්වේෂයේ ද මෝහයේ ද ප්‍රහාණය කියන ලදී. එයින් භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුව ප්‍රකාශ කරන ලදී. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතො යනුවෙන් අනුපාදාපරිනිර්වාණය ප්‍රකාශ කරන ලදී.

දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු අලෝභ කුසල මූලයයි. සංයමතො වෙරං න චීයති යනු අදෝස කුසල මූලයයි. කුසලෝ ච ජහාති පාපකං යනු අමෝහ කුසල මූලයයි. රාග දෝස මෝහක්ඛයා ස නිබ්බුතො යනුවෙන් ඒවායේ නිස්සරණය කියන ලදී.

දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු සීල ස්කන්ධයේ ආසන්න කාරණයයි. සංයමතො වෙරං න චීයති යනු සමාධි ස්කන්ධයේ ආසන්න කාරණයයි. කුසලො ච ජහාති පාපකං යනු ප්‍රඥා ස්කන්ධයේ ද විමුක්ති ස්කන්ධයේ ද ආසන්න කාරණයයි.

දානයෙන් ඕලාරික කෙලෙස්වල ප්‍රහාණය ද සීලයෙන් මධ්‍යම කෙලෙස්වල ප්‍රහාණය ද ප්‍රඥාවෙන් සියුම් කෙලෙස්වල ප්‍රහාණය ද (දක්වයි) රාගදෝස මොහක්ඛයා සනිබ්බුතො යනුවෙන් කර නිමවූ භූමිය දක්වාලයි.

දදතො පුඤ්ඤං පවඩ්ඪති -පෙ- ජහාති පාපකං යි සේඛභූමිය දක්වන ලදී. රාගදෝස මෝහක්ඛයා සනිබ්බුතොයි අග්‍රඵලය කියන ලදී. එසේම දදතො පුඤ්ඤං -පෙ- වෙරං න චීයති යනුවෙන් ලෞකික කුසල මූලය ප්‍රකාශ කරන ලදී. කුසලො ච ජහාති පාපකං යනුවෙන් ලෝකෝත්තර කුසල මූලය කියන ලදී. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතො යනුවෙන් ලෝකෝත්තර කුසල මූලයේ ඵලය ප්‍රකාශ කරන ලදී.

දදතො පුඤ්ඤං -පෙ- වෙරං න චීයති යි පෘථග්ජන භූමිය දක්වන ලදී. කුසලො ච ජහාති පාපකං යි සේඛ භූමිය දක්වයි. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතො යි අසේඛ භූමිය දක්වන ලදී. දදතො -පෙ- න චීයති යි ස්වර්ගගාමී ප්‍රතිපදාව කියන ලදී. කුසලො ච ජහාති පාපකං යි

සේඛ විමුක්තිය (කියන ලදී) රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතො යි අසේඛ විමුක්තිය කියන ලදී.

දදතො -පෙ- වෙරං න චියති යි දානකථාව සීල කථාව ස්වර්ග කථාව හා ලෞකික ධර්මයන්ගේ දේශනාව කියන ලදී. කුසලො ච ජහාති පාපකං යනුවෙන් ලෝකයේ ආදීනව දැක්ම සමග සාමුක්කංසික ධර්ම දේශනාව දක්වන ලදී. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතො යි ඒ දේශනාවේ ඵලය දක්වන ලදී.

දදතො පුඤ්ඤං පවඩ්ඪති යනුවෙන් ධර්ම දානය ද ආමිෂ දානයද ප්‍රකාශ වෙයි. සංයමතො වෙරං න චියති යනුවෙන් ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් සත්ත්වයන්ගේ අභයදානය කියවේ. මෙසේ සියලුම ශික්ෂාපද විස්තර කළ යුතුය. ඒ සීල සංයමයෙන් සීලයෙහි පිහිටියේ සිත සංවර කරයි. ඔහුගේ සමථය පරිපූර්ණත්වයට යෙයි. මෙසේ හෙතෙම සමථයෙහි සිටියේ විදර්ශනා දක්ෂතාවෙන් දක්ෂයා ද අත්හරියි. පාපී රාගය අත්හරියි. ද්වේෂය අත්හරියි. මෝහය අත්හරියි. ආර්ය මාර්ගයෙන් සියලුම පාපී අකුසල ධර්මයන් අත්හරියි. මෙසේ පිළිපන්නා ද රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතොයි රාගාදීන්ගේ ක්ෂයවීමෙන් විමුක්ති දෙකම ලබයි. මේ සූත්‍ර නිර්දේශයයි.

එහි දේශනා හාර සම්පාතය කවරේ ද?

මේ සූත්‍රයෙහි කුමක් දේශනා කරන ලද ද? දෙව් මිනිස් සුගති දෙක, දිව්‍යමය පංචකාම ගුණ, මානුෂික පංචකාම ගුණ දිව්‍යමය පංච උපාදානස්කන්ධ, මානුෂික පංච උපාදානස්කන්ධ යන ආදියයි. මෙය දුක්ඛ ආර්ය සත්‍යය යැයි කියනු ලැබේ. ඊට හේතු ලෙසින් පළමුව පළමුව උපන් තණ්හාව සමුදය ආර්ය සත්‍යයයි. එය ආශ්වාදය හා ආදීනවය යැයි කියනු ලැබේ. දදතො -පෙ- වෙරං න චියති යන පළමු පද දෙකින් සියල්ලෙහි නිර්දේශය දැක්විණ. කුසලො ච ජහාති පාපකං යි මාර්ගය කියන ලදී. රාග දෝස මොහකඛයා ස නිබ්බුතො යනු සඋපාදිසෙස හා අනුපාදිසෙස යන නිර්වාණ ධාතු දෙකයි. එය නිස්සරණයයි. ඵල ආදිය සුදුසු පරිදි දතයුතුය. මේ දේශනාහාර සම්පාතයයි.

විචය හාර සම්පාතය කවරේ ද? දදතො පුඤ්ඤං පවඩ්ඪති යන

මේ පළමු පදයෙන් දානමය සීලමය භාවනාමය ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාව කියන ලදී. දසවිධ වූ දෙය්‍ය ධර්මයේ පරිත්‍යාගය කියන ලදී. ෂඩ්විධ වූ රූප ආදී අරමුණු ද එසේය. සංයමතො වෙරං න චීයති යන දෙවැනි පදයෙන් අවෛරී වූ අවිරුද්ධ වූ අව්‍යාපාද වූ ප්‍රතිපදාව කියන ලදී. කුසලො ච ජහාති පාපකං යන තෙවැනි පදයෙන් ක්‍ෂාණය පහළවීම ද අක්‍ෂක්‍ෂාණය නිරුද්ධවීම ද සියලු ආර්ය අෂ්ටාංගික මාර්ගය ද සියලු බෝධිපාක්‍ෂික ධර්මද කියන ලදී. රාග දෝස මෝහක්ඛයා ස නිබ්බුතො යනුවෙන් රාගය ක්‍ෂය වීමෙන් රාග විරාගය වූ චේතෝ විමුක්තිය ද මෝහය ක්‍ෂය වීමෙන් අවිද්‍යා විරාගය වූ පක්‍ෂඤා විමුක්තිය ද කියන ලදී. මේ විචය හාර සම්පාතයයි.

යුත්තිහාර සම්පාතය කවරේ ද? දීමෙහි යෙදුණහු මසුරු බව නැති කිරීමත් කුසල විපාකය ගලා ඒමත් පූරණය කෙරෙයි යන මේ යුක්තියක් ඇත. සීල සංයමයෙහි යෙදුණහු උපචාර සමාධියත් අර්පණා සමාධියත් පූරණය කෙරයි යන මේ යුක්තියක් ඇත. පාප ධර්මයන් දුරු කරන්නා දුක දැනගනියි. නිරෝධය සාක්‍ෂාත් කෙරෙයි. මාර්ගය වඩයි යන මේ යුක්තියක් ඇත. රාග දෝස මෝහයන් සර්වප්‍රකාරයෙන් ක්‍ෂය වූ කල්හි අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙයි යන මේ යුක්තියක් ඇත. මේ යුක්තිහාර සම්පාතයයි.

පදට්ඨාන හාර සම්පාතය කවරේ ද? දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු චාග අධිට්ඨානයේ ආසන්න කාරණයයි. සංයමතො වෙරං න චීයති යනු සත්‍ය අධිෂ්ඨානයේ ආසන්න කාරණයයි. කුසලො ච ජහාති පාපකං යනු ප්‍රඥා අධිෂ්ඨානයේ ආසන්න කාරණයයි. රාග දෝස මොහක්ඛයා සනිබ්බුතො යනු උපසම අධිෂ්ඨානයේ ආසන්න කාරණයයි. මේ පදට්ඨාන හාර සම්පාතයයි.

ලක්ඛණහාර සම්පාතය කවරේ ද? දදතො යන මෙයින් ප්‍රිය වචනය, අර්ථචර්යාව හා සමානාත්මතාව දක්වන ලදී යැයි දතයුතුය. සංග්‍රහ වස්තු ලෙසින් සමාන ලක්‍ෂණ ඇති බැවිනි. සංයමතො යන මෙයින් ඉවසීම, මෛත්‍රිය, අවිහිංසාව, කරුණාව ආදිය දක්වන ලදැයි දතයුතුය. වෛරය නූපදවීම් ලක්‍ෂණයෙන් සමාන ලක්‍ෂණ ඇති බැවිනි. වෙරං න චීයති යන මෙයින් හිරි ඔතප්, අල්පේච්ඡත්වය සතුට ආදිය දක්වන ලදී. වෛරය නොවැඩෙන හෙයින් සමාන ලක්‍ෂණ ඇති බැවිනි. අහිරික

අනොත්තප්ප ආදිය ද එසේය. නොසිතිය යුතු බැවින් සමාන ලක්ෂණ ඇති හෙයිනි. කුසලො යන මේ කුශලතාව දැක්වීමෙන් සම්මා සංකප්ප ආදිය දක්වන ලදී. මාර්ග අංග ආදී ලෙසින් සමාන ලක්ෂණ ඇති බැවිනි. ඡහාති පාපකං යන මෙයින් පරිඤ්ඤා අභිසමය ආදිය ද දක්වන ලදී. දැනගැනීම් ලක්ෂණයෙන් සමාන බැවිනි. රාග දෝස මොහක්ඛයා යන මෙයින් ඉතිරි කෙලෙස් ආදියේ ද ක්ෂයවීම දක්වන ලදී. ඉවත් කළ යුතු බැවින් සමාන ලක්ෂණ ඇති හෙයිනි. මේ ලක්ෂණහාර සම්පාතයයි.

චතුබ්භූහ හාර සම්පාතය කවරේ ද? දදතො යන ගාථාවෙහි භාග්‍යවතුන් වහන්සේගේ අධිප්‍රාය කවරේ ද? යමෙක් මහා භෝගත්වය ප්‍රාර්ථනා කෙරෙත් ද ඔවුහු දිළිඳු බව නැති කරනු පිණිස දන් දෙති. යමෙක් අවෙරිත්වය කැමති වෙත් ද ඔවුහු පංච වෛරයන් දුරුකරත්. යමෙක් කුසල ධර්මයන් කැමැත්තාහු ද ඔවුහු අෂ්ටාංගික මාර්ගය වඩත්. යමෙක් නිවෙනු කැමැත්තාහු ද ඔවුහු රාග ද්වේෂ මෝහ දුරුකෙරෙත් යන මෙය මෙහිදී භාග්‍යවතුන් වහන්සේගේ අදහසයි. මෙසේ නිර්වචන, නිදාන ගැලපීම් කිවයුතුය. මේ චතුබ්‍යූහ හාර සම්පාතයයි.

ආවට්ට හාර සම්පාතය කවරේ ද? නොදීමන් යම් මසුරු බවක් වේ ද අසංයමයෙන් යම් වෛරයක් වේ ද, අකුසලයේ පාපයේ යම් දුරු නොකිරීමක් වේ ද එය ප්‍රතිපක්ෂ දේ දැක්වීමෙන් සමුදය සත්‍ය වේ. අලෝභයෙන් ද අදෝසයෙන් ද අමෝහයෙන් ද දානාදියෙන් ද එහි ප්‍රහාණය වේ. මේ ත්‍රිවිධ කුසල මූලයන්ය. ඒවායේ හේතුව අෂ්ටවිධ වූ මේ මාර්ගයයි. රාගදෝස මෝහයන්ගේ යම් ක්ෂයවීමක් වේ ද එය නිරෝධයයි. මේ ආවට්ට හාර සම්පාතයයි.

විහතති හාර සම්පාතය කවරේ ද? දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු එක් අතකින් යමෙක් භය හේතුවෙන් දෙයි. රාග හේතුවෙන් දෙයි. කිසියම් ආමිෂ හේතුවකින් දෙයි. ඔහුගේ පින නොවැඩෙයි. අනුන් පෙළනු පිණිස යම් දඬු දීමක් අවිදීමක් වේ ද ඔහුගේ පව වැඩෙයි. යමෙක් කුසල් සිතින් අනුකම්පා කරමින් හෝ පුදමින් හෝ ආහාර දෙයි ද පාන වස්තු යාන මල්ගඳ විලවුන් යහන් ආවාස පහන් දෙයි ද නැතහොත් සියලු සතුන්ට අභය දානය දෙයි ද මෙත් සිත් ඇත්තේ හිතවත් අදහස් ඇත්තේ නිස්සරණ සංඥාවෙන් දහම් දෙසයි. සංයමතො වෙරං න චියති යනු එක් අතකින් අහයෙහි ඇලුණහු විසින් රැස් කෙරෙයි. කුමන කරුණක් ද?

යමක් අසමර්ථ ද එයයි. බියෙහි ඇලුණහු මෙලොවට බිය වේ. රජවරු මා අල්ලාගෙන අත් නොසිඳිවා -පෙ- ජීවත්වන්නහු හුලෙහි නොහිඳුවාවායි ඒ සංයමයෙන් අවෙරය රැස් කෙරෙයි. යමෙක් මෙසේ වූයේ වෛරය රැස් නොකෙරේ ද යමෙක් වනාහි මෙසේ සමාදන් වෙයි. ප්‍රාණඝාතයේ පාපී විපාකය මෙලොව ද පරලොව ද වේ. එසේම සියලු අකුසල්වල ද වේ යනුවෙනි. හෙතෙම එයින් සතුටු වේ. මේ සංයමයෙන් වෛරය රැස් නොකරයි. සංයමය නම් සීලයයි. එය චතුර්විධය. චේතනා සීලය, චේතසික සීලය, සංවර සීලය, අවිතික්කම සීලය යනුවෙනි. කුසලො ච ජහාති පාපකං යනුවෙන් පාපයන් දුරුකරන සත්තිස් බෝධිපාක්ෂික ධර්ම කිවයුතුය. මේ විභක්ති හාර සම්පාතයයි.

පරිවත්තන හාරසම්පාතය කවරේ ද? දෙන්නහුගේ පින වැඩෙයි. නොදෙන්නහුගේ ද පින වැඩෙයි. දානයමය වූ පින නොවේ. සංවර වූවහුගේ වෛරය රැස් නොවේ. අසංවර වූවහුගේ ද වෛරය රැස් නොවේ. දානයෙන්, ප්‍රත්‍යවේක්ෂා බලයෙන්, භාවනා බලයෙන් කුසලය ද අත්හරියි. පාපී වූ අකුසලය අත් නොහරියි. රාග දෝස මෝහ ක්‍ෂය වීමෙන් හෙතෙම නිවුනේ වෙයි. ඒවායේ ක්‍ෂය නොවීමෙන් නිවීමක් නැත යනුයි. මේ පරිවත්තන හාර සම්පාතයයි.

වේවචන හාර සම්පාතය කවරේ ද? දීමෙන් පින වැඩේ. පරිත්‍යාගයෙන් කුසල් රැස් කෙරෙයි. අනුමෝදන් වීමෙන් ද පින වැඩේ. චිත්ත ප්‍රසාදයෙන් ද වතාවත් කිරීමෙන් ද පින වැඩේ. සංයමතො යනු සීල සංවරයෙනි. පිරිසිදු බැවිනි. වෙරං න චියති යනු පාපය නොවැඩේ. අකුසලය නොවැඩේ යනුයි. කුසලො යනු පණ්ඩිත, නිපුණ, නුවණැති, පරීක්‍ෂාකාරී පුද්ගලයාය. ජහාති යනු මුලින් සිඳ දමයි. සහමුලින් උදුරයි යනුයි. මේ වේවචන හාර සම්පාතයි.

පඤ්ඤත්ති හාර සම්පාතය කවරේ ද? දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු ලෝභය (දුරුකිරීමේ) පිළිබඳ පටිනිස්සග්ග ප්‍රඥප්තියයි. අලෝභය පිළිබඳ නික්ඛේප ප්‍රඥප්තියයි. සංයමතො වෙරං න චියති යනු ද්වේෂය පිළිබඳ විෂකම්භන ප්‍රඥප්තියයි. අද්වේෂය පිළිබඳ නික්ඛේප ප්‍රඥප්තියයි. කුසලො න ච ජහාති පාපකං යනු මෝහය පිළිබඳ සමුග්ඝාත ප්‍රඥප්තියයි. අමෝහය පිළිබඳ භාවනා ප්‍රඥප්තියයි. රාග දෝස මෝහයේ ප්‍රහාණ ප්‍රඥප්තියයි. අලෝභ අදෝස අමෝහයේ භාවනා ප්‍රඥප්තියයි. රාග දෝස

මෝහක්ඛයා සනිබ්බුතෝ යනු කෙලෙස්වල පටිපස්සද්ධි ප්‍රඥප්තියයි. නිර්වාණයේ සච්ඡිකිරිය ප්‍රඥප්තියයි. මේ ප්‍රඥප්ති හාර සම්පාතයයි.

ඔතරණ හාර සම්පාතය කවරේ ද? දදතෝ පූඤ්ඤං පවඩ්ඪති යන්නෙහි දානය නම් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියන්ගෙන් වේ යයි මෙය ඉන්ද්‍රියයන්ගෙන් වූ බැසගැන්මයි. සංයමතෝ වෙරං න චියති යන්නෙහි සංයමය නම් සීලස්කන්ධයයි. මේ ස්කන්ධයන්ගෙන් වූ ඔතරණයයි. කුසලෝ ච ජහාති පාපකං යන්නෙහි පාප ප්‍රහාණය නම් ත්‍රිවිධ විමෝක්ෂයන්ගෙන් වේ. ඒවායේ උපාය වූ ත්‍රිවිධ විමෝක්ෂ මුඛ ද වේ. මේ විමෝක්ෂ මුඛයන්ගෙන් වූ ඔතරණයයි. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතෝ යනු විමුක්ති ස්කන්ධයයි. එය ද ධම්මධාතුව හා ධම්මායතනය වේ. මේ ධාතුවලින් ද ආයතනවලින් ද වූ ඔතරණයයි. මේ ඔතරණ හාර සම්පාතයයි.

සොධන හාර සම්පාතය කවරේ ද? දදතෝ යන ආදිය පද සුද්ධියයි. ආරම්භ සුද්ධිය නොවේ. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතෝ යන මෙය පද සුද්ධිය ද ආරම්භ සුද්ධිය ද වේ. මේ සොධන හාර සම්පාතයයි.

අධිට්ඨානහාර සම්පාතය කවරේ ද? දදතෝ යන මෙය එකක් බැවින් චාගය, පරිත්‍යාගය, ධර්මදානය, ආමිෂ දානය, අභය දානය යන දාන අට විස්තර කළ යුතුය. මේ වෙනසයි. සංයමෝ යන මෙය ඒකත්වයයි. ප්‍රාතිමෝක්ෂ සංවරය සති සංවරය යන මෙය වෙනසයි. කුසලෝ ච ජහාති පාපකං යන මෙය ඒකත්වයයි. සක්කාය දිට්ඨිය අත්හරියි. විචිකිච්ඡාව අත්හරියි යනාදි මෙය විවිධත්වයයි. රාග දෝස මෝහක්ඛයා සනිබ්බුතෝ යන මෙය ඒකත්වයයි. සඋපාදිසෙස නිර්වාණ ධාතුව අනුපාදිසේස නිර්වාණ ධාතුව යන මෙය විවිධත්වයයි. මේ අධිෂ්ඨාන හාර සම්පාතයයි.

පරිකබාර හාර සම්පාතය කවරේ ද? දානයට ප්‍රමුදිත බව ප්‍රත්‍ය වේ. අලෝභ හේතුවයි. සංයමයට හිරිඔතප් ආදිය ප්‍රත්‍ය වේ. යෝනිසෝ මනසිකාරය හා අද්වේෂය හේතුවේ. පාප ප්‍රහාණයට සමාධිය ද යථාභූත ඤාණ දර්ශනය ද ප්‍රත්‍ය වේ. ත්‍රිවිධ අනුපස්සනාවන් හේතුව වේ. නිවනට මාර්ග සම්‍යග් දෘෂ්ටි දෙක හේතුවේ. සම්මා සංකප්ප ආදිය ප්‍රත්‍ය වේ. මේ පරික්බාර හාර සම්පාතයයි.

සමාරෝපන හාර සමපාතය කවරේ ද? දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු දානමය පුණ්‍ය ක්‍රියාවයි. එය සීලයේ ආසන්න කාරණයයි. සංයමතො වෙරං න චියති යනු සීලමය පින් කිරිය වතයි. එය සමාධියේ ආසන්න කාරණයයි. සීලයෙන් ද ධ්‍යානයෙන් ද රාගාදි කෙලෙස් දුරු නොවේ. ඒ හේතු කරගෙන යම් ආශ්‍රව, පීඩාකාරී දැවිම් ඇතිවේ ද ඒවා ද ඔහුට නොවේ. කුසලො ච ජහාති පාපකං යනු ප්‍රහාණාවබෝධයයි. එය භාවනාමය පින් කිරියවතයි. රාග දෝස මෝහක්ඛයා ස නිබ්බුතො යනු රාගයේ ක්‍ෂයවීමෙන් ද ද්වේෂයේ ක්‍ෂයවීමෙන් ද මෝහයේ ක්‍ෂය වීමෙන් ද යනුයි. එහි රාගය යනු යම් රාගයක්, සරාගයක්, සිතින් ඇලීමක්, ලෝභයක්, ලෝභී බවක්, අභිධ්‍යාවක්, ලෝභයක්, අකුසල මූලයක් වේ නම් එයයි. දොසො යනු යම් ද්වේෂයක්, දුස්සනයක්, දූෂිත බවක්, ව්‍යාපාදයක්, සිතින් නැසීමක්, දෝසයක්, අකුසල මූලයක් වේ නම් එයයි. මෝහෝ යනු යම් අඥානයක්, නොදැන්මක්, අනවබෝධයක්, අසම්බෝධයක්, අප්‍රතිවේධයක්, මෝඩකමක්, බාල බවක්, නොදැන්මක් අකුසල මූලය වූ මෝහයක් වේ ද එයයි. මෙසේ මේ රාගාදීන්ගේ ක්‍ෂයවීම, නිරෝධය, ඉවත්වීම, නිවීම, නිවී යෑම, පරිනිර්වාණය, සඋපාදිසේස නිර්වාණ ධාතුව, අනුපාදිසේස නිර්වාණ ධාතුව යන මේවායේ ය. මේ සමාරෝපන හාර සම්පාතයයි.

හාර සම්පාත වාර වර්ණනාව නිමි.

21.

මෙසේ නානාසූත්‍ර වශයෙන් ද ඒක සූත්‍ර වශයෙන් ද හාර විචාරය දක්වා දැන් නය විචාරය දක්වන්නට **තත්‍ථ කතමං නය සමුට්ඨානං** යනාදිය අරඹන ලදී. මෙහිදී කවර හෙයින් (එසේ අරඹන ලද ද?) එහි දේශනාහාරය කවරේ ද? අස්සාදිනවතා යන ගාථාවයි. මේ දේශනාහාරය කුමක් දේශනා කෙරේ ද? යනාදියෙන් හාර නිද්දේසය අරඹන ලදී. මෙසේ එහිදී නන්දියාවට්ටය කවරේ ද? තණ්හඤ්ඣව අවිජ්ජමපි ච යන ගාථාවයි. මේ නන්දියාවට්ටය කුමක් ගෙනයා ද? යනාදියෙන් ආරම්භ

නොකොට සමුට්ඨාන මුඛයෙන් අරඹන ලද ද? (එය) හාර නයවල විෂය භේදයෙන් කියනු ලැබේ. යම්සේ හාරයෝ ව්‍යඤ්ජන මුඛයෙන් සූත්‍රයේ අර්ථ සංවර්ණනය වේ ද න්‍යාය එසේ නොවේ. න්‍යාය වනාහි නොයෙක් සූත්‍ර ලෙසින් වෙන්කරන ලද තෘෂ්ණා අවිද්‍යා ආදී මූල පදවලින් චතුසත්‍ය යෝජනයෙන් න්‍යාය කෙරෙන් අවබෝධ කරනු ලබන දුක්ඛාදී අර්ථයයි. එය වනාහි මාර්ග ඥානය ගෙන යයි. පමුණුවයි යන අර්ථයෙන් න්‍යාය නම් වේ. අවබෝධ කරගන්නවුන් උග්ඝටිතඤ්ඤූ ආදී ත්‍රිවිධ විනේය පුද්ගලයන්ගේ ස්වරූපයෙන් මූලපද විභාගය තෙපරිදිව බෙදන ලදී. මෙහි එක එකක් යම් තැනකින් පමුණුවයි ද? යමක් ගෙන යයි ද? ඒවා සංකිලෙස - වෝදාන විභාගයෙන් දෙපරිදිව සංග්‍රහ කරන ලද්දේ සතර, සය, අට ලෙසින් බිඳී ගියේ හාර නයවල විෂය වෙයි. එහෙයින් **හාරා ව්‍යඤ්ජන විචයෝ සුත්තසස නයා තයෝ ච සුත්තත්ථෝ** යි කියන ලදී. මෙසේ විශිෂ්ට වූ විෂය ඇති බැවින් හාර නයවලින් හාරයන්ගෙන් අන් ලෙසකින් නය දක්වමින් **තත්ථ කතමං නය සමුට්ඨානං** යනාදිය කියන ලදී.

මේ එහි වචනාර්ථයයි. මෙය කරණකොට ගෙන නැගී සිටින් නුයි සමුට්ඨාන නම් වේ. කවරක් නැගීසිටී ද? න්‍යායෝ ය. න්‍යායන්ගේ සමුට්ඨානය නය සමුට්ඨාන නම් වේ. එය කුමක් ද? එයනම් මූල පදයන් සමග චතුරාර්ය සත්‍ය යෙදීමයි. එය වනාහි නන්දියාවට්ට ආදී න්‍යායයන්ගේ ඉපැත්මට සමාන බැවින් සමුට්ඨාන භූමි යයි ද කියනු ලැබේ. එසේ ම **අයං වුච්චති නන්දියාවට්ටසස නයසස භූමි** යි කියනු ලැබේ.

පුබබා කොටි න පඤ්ඤායති අවිජ්ජාය ච භව තණ්හාය ච යනාදිය නන්දියාවට්ට නයෙහි භූමි දර්ශනයයි. එහි **පුබබා කොටි නපඤ්ඤායති** යනු අසවල් නම් ඇති භාග්‍යවත් බුදුරදුන්ගේ, අසවල් නම් ඇති සක්විති රජුගේ කාලයෙහි අවිද්‍යාව ද භව තණ්හාව ද උපන්නේය. ඉන් පූර්වයෙහි නොවීය යනුවෙන් අවිද්‍යා භව තණ්හාවන්ගේ පූර්ව වූ කිසි සීමාවක් නොදක්නා ලැබේ. කවර හෙයින් ද? සංසාරයේ අනවරාග්‍රත්වයෙනි. එය මෙසේ කියන ලදී. 'මහණෙනි, මේ සසර අනවරාග්‍රය. මුල් කෙළවර නොපෙනේ' යනු විස්තරයයි.

නත්ථි යනු අවිද්‍යා භව තණ්හා ආදියේ ය. ඉදින් අවිද්‍යාවේ සංයෝජන භාවය ද තණ්හාවේ නීවරණ භාවය ද පෙළෙහි කියන ලදී. එසේ වුවත් අවිද්‍යාවෙන් වසන ලද ආදීනව ඇති භවයන් හා තෘෂ්ණාව යොදවයි යන මේ අර්ථය දක්වනු පිණිස **අවිජ්ජා නීවරණානං තණ්හාසංයෝජනානං** යනුවෙන් කියන ලදී. **අවිජ්ජා සංයුතතා** යනු අවිද්‍යාව හා මිශ්‍ර වූ නැතහොත් අවිද්‍යාවෙහි බැසගත් වස්තූන්හි බැඳුණු යනුයි. **අවිජ්ජා පකෙඛන විචරනති** යනු අවිද්‍යා පාර්ශ්වයෙන්, අවිද්‍යාවේ සහායෙන් දොළොස් වැදෑරුම් විපර්යාස කරණකොටගෙන අභිනිවේශ වස්තු වූ අරමුණු පවතිත් යනුයි. **තෙ චුචවනනි දිටඨිචරිතා** යනු අවිද්‍යාවෙන් මඩනා ලද ඒ රූපාදිය නිත්‍යාදි ලෙසින් බැසගන්නාහු දිට්ඨි චරිතයෝ යයි කියනු ලැබෙත්. දිට්ඨි චරිතයෝ නම් වෙති යන අර්ථයයි. **තණ්හාපකෙඛන** යනු එක්සිය අටවැදෑරුම් තණ්හා විචාරයෙනි. දිට්ඨි චරිතයන් හා තණ්හා චරිතයන් ප්‍රතිපත්තියෙන් බෙදා දක්වන්නට දිට්ඨි චරිතා යනාදිය කියන ලදී.

එහි **අතතකිලමථානුයොගං** යනු තමහාගේ කය කෙලෙසන ප්‍රයෝග වූ ආත්ම පරිතාපන ප්‍රතිපත්තියයි. **කාමසුඛල්ලිකානු යොගං** යනු කාම සැපයේ ඇලීම් ප්‍රයෝගය වූ කාමයන්හි වැටීමයි. ඉදින් බාහිර දුක තණ්හාව යැයි දනිත් ද 'මෙය දුකය. මෙපමණක් දුක යැයි ද, මේ තණ්හාවයි. මේ එහි විරාගයයි ද යනුවෙන් අවබෝධ කටයුතු ඉවත්කළ යුතු බැවින් නොදනිත්. ඉබේ පැවැත්ම ද පැවතුම් හේතුව ද නොදනිත්. නැවැත්ම නැවතුම් හේතුව ගැන කවරනම් කථාවක් ද? **ඉතො බහිදධා නත්ථි සචචවවත්ථානං** යනාදිය කියන ලදී.

එහි **සචචපපකාසනා** යනු සත්‍ය දේශනාවයි. **සමථ විපසසනා කොසලලං** නු සමථ විදර්ශනාවන්හි භාවනා කුශලත්වයයි. ඒවායෙහි ග්‍රහණ, විමර්ශන, ශ්‍රවණ, මනසිකාර කෞශලයහෝ ය. මෙහිදී විදර්ශනා අධිෂ්ඨානය සමථය යැයි අදහස් කරන ලදී. **උපසම සුඛපපපනති** යනු කෙලෙස්වල සන්සිඳීම් සැපය ලැබීමයි. **විපරිතචෙතා** යනු මිථ්‍යාවෙහි බැසගත් සිතයි. **නත්ථි සුඛෙන සුඛං** යනු නිවැරදි වූ ප්‍රත්‍ය පරිභෝග සුඛයෙන් කය ද සිත ද සන්සිඳුණු බාධා ඇත්තක් කොට ආර්යයන් විසින් පැමිණිය යුතු යම් උපසම සුඛයක් වේ ද එය ප්‍රතික්ෂේප කරයි යනුයි. **දුකෙඛන** යනු කය රිදවන දුකිනි. **සො ලොකං වඩෙඪති** යනු හෙතෙම කාමයන් සේවනය කරනු ලබන්නේ ආත්මභාව සංඛ්‍යාත ලෝකය වර්ධනය

කරයි. පිනවයි යනුයි. දරුමුණුබුරු පරපුරින් හෝ සසරේ සිඳ නොදැමීමෙන් සත්ත්ව ලෝකය වර්ධනය කරයි. **බහුං පුඤ්ඤං පසවති** යනු පංච කාමගුණයන් සන්තර්පනය කිරීමෙන් ද තමාගේ පුතුන්ගේ මුනුණ දැකීමෙන් ද බොහෝ පින් උපදවයි යනුයි. අභිනිවේශය ඉතා දැඩි නොවන බැවින් **එවං සඤ්ඤී** යි යෙදේ. දැඩි බවින් **එවං දිට්ඨී** නම් වේ. දුකින් සැප පතමින් අත්තකිලමථානුයෝගයේ යෙදුනානු ද කාමයන්හි පුණ්‍ය හැඟීමෙන් කාම සුඛල්ලිකානු යෝගයෙහි යෙදුනානු ද වාසය කෙරෙත් යයි යෙදිය යුතුය. **තදභිඤ්ඤා සනතා** යනු එවන් හැඟීම් ඇතිව යනුයි. **රොගමෙව වඩ්ඪයනති** යනු ආත්මභාව නමැති රෝගය ම හෝ ක්ලේශ නමැති රෝගය ම හෝ එකිනෙක වර්ධනය කරත් යනුයි. ගඩු, නුල් ආදියේ ද මේ ක්‍රමය මැයි. **රොගාභිතුනනා** යනු කියන ලද පරිදි රෝගවලින් ලෙඩ වූ යනුයි. **ගණ්ඩපටිපීළිතා** යනු කියන ලද පරිදි ගඩුවලින් ලෙඩ වූ යනුයි. **සල්ලානුවිද්ධා** යනු කියන ලද පරිදි නුල්වලින් අනින ලද යනුයි. **උම්මුජ්ජ නිම්මුජ්ජානි** යනු උපදින, චුතවන ස්වභාවයන් ය. උග්ඝාතනිග්ඝාතං යනු උස්පහත් බවයි. **රොග ගණ්ඩසල්ල හෙසජ්ජං** යනු පෙර කියන ලද රෝග පිළියම් සමථ විදර්ශනා දෙක සඳහා කියයි යනුයි. එහෙයින් ම **සමථ විපසසනා රොගනිග්ඝාතක හෙසජ්ජං** යි කියන ලදී. එහි **රොග නිග්ඝාතකං** යනු රෝග සන්සිඳීමයි. **සංකිලෙසො දුක්ඛං** යනාදියෙන් සත්‍යයන් ඒවායේ අවබෝධ කළයුතු බව ආදී ස්වරූපයෙන් කියනු ලැබේ. එහි **සංකිලෙසො දුක්ඛං** යනු අත්තකිලමථානුයෝග කාම සුඛල්ලිකානුයෝග දෙකෙන් කෙලෙසෙන නැතහොත් ඒවායින් කිලිටිවන රූප අරූප කාය සංඛ්‍යාත දුක්ඛ ආර්ය සත්‍යයි. **තදහි සංගො තණ්හා** යනු එහි අභිසංග ආසංග යනුවෙන් ලබන ලද නම් ඇති තණ්හාවයි. දැන් දිට්ඨී චරිත තණ්හා චරිතයන්ගේ සක්කාය දර්ශනයෙන් පැවැතීම් භේදය දක්වන්නට **දිට්ඨී චරිතො** යන ආදිය කියන ලදී.

එහි **දිට්ඨී චරිතා රූපං අත්තතො උපගච්ඡනති** යනු දෘෂ්ටි චරිතයෝ දෘෂ්ටිවලට බැස ගැනීමට අධිකව කටයුතු කරන හෙයින් රූපය ආත්මය යැයි ගනිත්. ඔවුන්ගේ ආත්ම අභිනිවේශය බලවත් වේ. තමන් පිළිබඳ අභිනිවේශය එසේ නොවේ. **වෙදනං** යන ආදියෙහි ද මේ ක්‍රමය ම වේ. **තණ්හා චරිතා රූපවන්තං පුත්තානං** යනු තෘෂ්ණා චරිතයෝ තෘෂ්ණාභිනිවේශය බලවත් බැවින් රූපය තමාගේ රාගාදි පළිබෝධ භාවයෙහි තබා ඉතිරි වේදනාදිය ආත්මය යැයි ගනිත්. **අත්තනිවා රූපං** යනු ආත්මය දරණ රූපය හෝයි. **රූපසම්ං අත්තානං** යනු රූපය දරණ සිතයි.

වෙදනාවනතං යනාදියෙහි ද මේ ක්‍රමයමැයි. මේවායෙහි අත්තනිය අභිනිවේශය බලවත් වේ. ආත්ම අභිනිවේශය එසේ නොවේ. එහෙයින් ලබන ලද පරිදි අත්තනියං යනුවෙන් කල්පනාකොට ඉන් අන්‍ය වූ දේ අත්තායැයි ගනිත්. **අයං වුච්චති වීසති වත්ථුකා සකකාය දිට්ඨි** යනු මේ පංච උපාදානස්කන්ධයන්ගෙන් එක එකක සතර සතර බැගින් ගැනීම් වශයෙන් වස්තු විස්සක් විද්‍යමාන වන කල්හි පංචස්කන්ධ සංඛ්‍යාත ශරීරයෙහි සිහිය හෝ විද්‍යමාන වේ. එහි දිට්ඨි යනු සක්කාය දිට්ඨියයි. **ලොකුත්තර සම්මා දිට්ඨි** යනු පළමු මාර්ග සම්මා දිට්ඨියයි. **අනායිකා** යනු සම්මා දිට්ඨියේ අනුගාමීන් ය. **යම්විටක සම්මා දිට්ඨිය** සක්කාය දිට්ඨිය දුරුකිරීම් වශයෙන් **පැවැත්තේ** ද **එවිට එහි** දෙවෙනි ස්වරූපය ලෙසින් පවතින දේ යන අර්ථයයි. ඒවා කවරහු ද? **සම්මා සංකපෙපා** යන ආදිය කියන ලදී. **තෙ තයො බන්ධා** යනාදියෙන් ආර්ය මාර්ගයෙන් බන්ධ සංඛ්‍යාත සමථ විපස්සනාවන් වෙන් කෙරේ. **තත්‍ථ සකකායො** යන ආදිය චතුසත්‍යය වෙන්කිරීමයි. ඒ සියල්ල මනාව දත යුතුමය.

නැවත **තත්‍ථයෙ රූපං අතනතො උපගචඡනති** යනාදියෙන් සක්කාය දිට්ඨිය දැක්වීම් ස්වරූපයෙන් උච්ඡේද ආදි අන්ත දෙක ද මධ්‍යම ප්‍රතිපදාව ද වෙන් කෙරේ. එහි **ඉමෙ වුච්චනති උචෙඡදවාදිනො** යනු මේ රූපාදි පංචස්කන්ධය ආත්ම වශයෙන් ගන්නාහු රූපාදියේ අනිත්‍ය භාවයෙන් නැසේ. ආත්මය විනාශ වේ. මරණින් මතු නොවේ. මෙසේ ප්‍රවේශවන බැවින් උච්ඡේදවාදීහු යැයි කියනු ලැබේ යනුයි. **ඉමෙ වුච්චනති සසසතවාදිනො** යනු මේ රූපවත් වූ ආත්මයයි යනාදියෙන් රූපාදියෙන් තොර වූ අන්කිසි ආත්මයක් වේ යැයි සිතන්නාහු එම ආත්මය නිත්‍යය ස්ථිරය ශාස්වතයැයි සිතන හෙයින් ශාස්වතවාදීන් යැයි කියනු ලැබේ යනුයි. **උචෙඡද සසසතවාදා උභො අනතා අයං සංසාරපපවනති** යන ආදිය සත්‍යය වෙන් කිරීමයි. එය මනාව දත හැකිය. **උචෙඡද සසසතං සමාසතො වීසති වත්ථුකා සකකාය දිට්ඨි** යනු ආත්මය නැසේ. ආත්මය නිත්‍යය ආදිය පවත්නා බැවින් උච්ඡේද ශාස්වත දර්ශනය සංක්ෂේපයෙන් වීසතිවත්ථුක සක්කාය දිට්ඨිය ම වෙයි. සියලුම ආත්මවාදය සක්කාය දිට්ඨියෙහි ඇතුළත් වීම ම ය. **විත්‍ථාරතො දවාසටඨි දිට්ඨිගතානි** යනු උච්ඡේද ශාස්වත දර්ශනය විස්තර කිරීමෙන් බ්‍රහ්මජාල සූත්‍රයේ ආ දෙසැටක් දෘෂ්ටිගතීන් ය. **තෙසං** යනු මෙසේ සංක්ෂේප විස්තර ඇති උච්ඡේද ශාස්වත දර්ශනයන්ගේ ය. **පටිපකඛො** යනු ප්‍රහාණ කරන දේවලට ප්‍රතිපක්ෂ වූ යනුයි. **තෙචතතාළීසං බොධිපකඛියා ධමමා** යනු අනිචච සඤඤාව

දුකඛ සඤඤාව අනත්ත සඤඤාව පහාණ සඤඤාව විරාග සඤඤාව නිරෝධ සඤඤාව සතර සතිපට්ඨාන -පෙ- ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේ බෝධිපාක්ෂික ධර්ම හතළස් තුනයි.

මෙසේ විපස්සනා වශයෙන් ප්‍රතිපක්ෂ දේ ඉදිරිපත් කොට නැවත සමථ වශයෙන් දක්වන්නට **අථ විමොකඛ දසව කසිණයතනානි** යැයි කියන ලදි. **දවාසටඨි දිටඨිගතානි** මොහජාලං යනු සැටදෙකක් වූ දෘෂ්ටි ගතින් මෝහ දැලකට හේතුවන බැවින් මෝහ ජාලයකි යනුයි. **අනාදි අනිධනපපවතතං** යන තැන මුල් කෙළවර නොමැති බැවින් අනාදි නම් වේ. ප්‍රතිපක්ෂ වූ අධිගමයන් නොමැති කල්හි සන්තාන වශයෙන් නොසිඳී පවත්නා හෙයින් අතිඔනපපවතත වේ. යම්හෙයකින් මෝහ ජාලයට හේතු වූ දෘෂ්ටි ගතින් මෝහ ජාලය පලා දැමූ කල්හි පලන ලද්දේ වේ. ඒ හෙයින් **තෙ චතතාළීසං බොධිපකඛිං ධමමා ඤාණවජිරං මොහ ජාල** පදාලනං යැයි කියන ලදි. එහි **ඤාණ වජිරං** යනු දියමන්ති ස්වරූපී ඤාණයයි. අෂ්ට සමාපත්තීන්ට සමවැද නියුණු කොට තීක්ෂණ ස්වභාවයෙන් පාලනය කළ විදර්ශනා ඤාණය ද මාර්ග ඤාණය ද ඤාණ වජිර නම් වේ. භාග්‍යවතුන් වහන්සේ තුළ පැවැති මේ ඤාණය ම මහා වජිරඤාණය යැයි කියනු ලැබේ. එය වනාහි සමූහයක් කොට දක්වන්නේ **තෙ චතතාළීසං බොධිපකඛියා ධමමා** යැයි කියන ලදී. **මොහජාල පදාලනං** යනු පූර්ව භාගයේදී වික්ඛම්භන වශයෙන් ද මාර්ග ක්ෂණයේදී සමුච්ඡේද වශයෙන් ද අවිද්‍යා භව තණ්හාවන්ගේ සිඳ දැමීමයි. අතීතාදි භේදයන්ගෙන් බිඳුණු රූපාදි ස්වකීය ආත්මභාවයන්හි ද එකට එකතු කරන ලද ස්වරූපයෙන් පවත්නා හෙයින් ජාල නම් වූ භව තණ්හාවයි. එහි වනාහි තණ්හා ජාලිනි සිබබිති, ජාලං යනු සමාන වචනයන් ය.

මෙසේ අත්තකිලමථානුයෝග කාමසුඛල්ලිකානුයෝග දෘෂ්ටි තෘෂ්ණාවන්ට බැසගැනීම ශාස්වත උච්ඡේදයන්ගෙන් වෙන් කිරීම් වශයෙන් මෝහ සමූහ විශේෂයෙන් අවිද්‍යා තෘෂ්ණා දෙක බෙදා දක්වා ගැලපෙන පරිදි සංකිලේස පක්ෂය නිගමනය කරමින් **තෙන වුචචති පුබබාකොටි න පඤඤායති අවිජජාය ච භව තණහාය ච** යන්න කියන ලදී.

තතථ දිටඨිවරිතොති යනාදියෙන් වෝදාන පක්ෂය දක්වයි. එහි **සලලෙඛානු සනතතවුතති** යනු අනුපදිත වූ සැහැල්ලු පැවැත්මයි. කවර

හෙයින් ද? යම්හෙයකින් සැහැල්ලු පැවැත්මෙහි අධික ගෞරව ඇත්තේ ද එහෙයිනි. දෘෂ්ටි චරිතයා තපස පිළිකුල් කිරීම් ආදියෙන් නොමගින් ද බොහෝසෙයින් ක්ලේශයන්ගේ නැසීම අදහස් කරගෙන හැසිරෙයි. එහෙයින් හෙතෙම සසුනේ පැවිදි වූයේ ධුත ධර්මයක් ලෙසින සලෙලඹ පටිපදාව පූරණය කෙරේ. **සිකඛානු සනතත චුතනි** යනු සිදුරු නැති චතු පාරිශුද්ධශීල පැවැත්මයි. දෘෂ්ටියෙන් ස්වකීය විෂයෙහි ප්‍රඥාව හා සමානව පවතින්නේය යන අර්ථයෙන් හෙතෙම පිරිසිදු වනු ලබන්නේ අධික ප්‍රඥා ඇත්තෙක් වේ යැයි දිට්ඨි චරිතො සම්මත්ත නියාමං ඔකකමනෙතා ධම්මානුසාරි භවති යනුවෙන් කියන ලදී. තෘෂ්ණා වශයෙන් මිථ්‍යා විමෝක්ෂය වේ යන අර්ථයෙන් තෘෂ්ණා චරිතයා පිරිසිදු වනු ලබන්නේ ශ්‍රද්ධාදිකයෙක් වේ.

එහෙයින් **තණහා චරිතො සම්මත්ත නියාමං ඔකකමනෙතා සද්ධානුසාරි භවති** යි කියන ලදී. **දිට්ඨි චරිතො සුබාය පටිපදාය** යනාදි පටිපදා නිර්දේශය යට දේශනාහාර විභංගයෙහි ආයේ ම ය. එහිදී අර්ථයද සර්වප්‍රකාරයෙන් කියන ලද්දේ ම ය. අනුපූර්ව පදයන්හි **විවෙචියමානො** යනු මුදවනු ලබන යනුයි. **පටිනිසසරති** යනු බැහැර වේ. මේදෙයි යන අර්ථයයි. **දන්ධඤ්ඤව ධම්මං ආජානානි** යනු මන්දප්‍රාඥ වූ තණ්හා චරිතයාගේ ස්වරූපයෙන් කියන ලදී. තීක්ෂණ ප්‍රාඥයා වනාහි වහාම ධර්මය දැනගනී. **සතතාපි දුවිධා** යනාදියෙන් ඉන්ද්‍රිය විභාගයෙන් නැවතත් ප්‍රතිපදා විභාගය දක්වයි. එය මනාව දත හැකිය. **යෙ හි කෙචි** යනාදියෙන් ඒ ප්‍රතිපදාවන්ගේ නික්මීමෙහි තුන්කල්හි ම ඒකාන්තභාවය දක්වයි. එහි **ඉමාහි චතුහි පටිපදාහි** යනු මේ ප්‍රතිපදා සතරින් ම හා ඉන් වෙන් වූ අනෙක් ප්‍රතිපදාවක් නොමැතිකමිනි.

චතුකකමගගං යනු ප්‍රතිපදා චතුෂ්කයයි. පටිපදා යනු මාර්ගයයි. එසේ නැතහොත් චතුක්කමග්ගං යනු නන්දියාවට්ටයෙහි සතරදිශා සංඛ්‍යාත මාර්ගයයි. ඒ සතර දිශාවන් දිසාලෝචන නයෙහි එන්නේය. කවර ප්‍රයෝජනයක් පිණිස චතුෂ්ක මාර්ගය පනවත් ද? **අබුධජන සෙවිතාය** යනු මෝඩ මිනිසුන් විසින් සේවනය කරන ලද යනුයි. **බාලජනතාය** යනු බාල ජනයා විසින් කැමති වන බැවිනි. **රතතවාසිනියා** යනු රක්ත වූ රාගයෙන් මඩනා ලද්දා වූ අය අතර වාසය කෙරේ නුයි රත්තවාසිනී නම් වේ. එහි ය. **නන්දියා** යනු ඒ ඒ තැන සතුටුවීම් අර්ථයෙන් නන්දි සංඛ්‍යාත වූ තෘෂ්ණාවෙනි. **ආවට්ටනත්ථං** යනු මුලින්ම සිඳදැමීම සඳහා ය.

අයං වුච්චති නන්දියාවට්ටස්ස නයස්ස භූමි යනු තණ්හා අවිද්‍යා ලෙසින් සංකිලේස පක්ෂයෙහි දිශා දෙකක් හා සමථ විදර්ශනා වශයෙන් වෝදාන පක්ෂයෙහි දිශා දෙකක් සේ මේ චතුසත්‍ය යෙදීම නන්දියාවට්ට න්‍යායෙහි සමුට්ඨානත්වයෙන් භූමි වෙයි යනුයි.

මෙසේ නන්දියාවට්ට න්‍යායෙහි භූමිය නිර්දේශ කොට එහි දිශාව වූ කරුණු දක්වන්නහු විසින් යම්හෙයකින් එහි දිශාව වූ කරුණු කී කල්හි දිශා ලෝචන න්‍යාය කියන ලද්දේ ද එහෙයින් **වෙය්‍යාකරණසුහි යෙ කුසලා කුසලා** යනුවෙන් දිශා ලෝචන ලක්ෂණය ඒකදේශයකින් පරාමර්ශනය කොට තෙ දව්ධෙන උපපරිකබිතබබා යනාදිය අරඹන ලදි.

එහි තෙ යනු දිශාභූත ධර්මයන් ය. **දව්ධෙන** යනු මේ සංකිලේශ ධර්මයන් ය. මේ වෝදාන ධර්මයන් ය යන ආකාර දෙකෙනි. **උපපරිකබිතබබා** යනු උප්පත්තීන් හාත්පස නිරීක්ෂණය කළ යුතුයි යනුයි. ධර්ම යුක්තියෙන් ඒ ඒ දිශාව අනුව බැලිය යුතු සැලකිය යුතු යන අර්ථයයි. යම් ප්‍රකාරයක් සඳහා දෙපරිදිව සැලකිය යුතුයි යනුවෙන් කියන ලද ද එය **ලොක වට්ටානුසාරි ච ලොක විවට්ටානුසාරි ච** යන්නෙන් දක්වයි. එහි අර්ථය මෙසේයි. ලෝකයම සසර වූයේයි **ලොකවට්ට** නම් වේ. ලොකවට්ට ලෙසින් සිහිකරයි. පවතියි යන අර්ථයෙන් **ලොකවට්ටානසාරි** නම් වේ. සංකිලේශ ධර්මය යන අර්ථයයි. ලෝකයේ හෝ ලෝකයෙන් ඉවත්වීම ලොකවිවට්ට නම් වේ. නිවනයි. එය සිහිකරයි. අනුලෝම වශයෙන් ගමන් කරයි යන අර්ථයෙන් ලොකවිවට්ටානුසාරි නම් වේ. වෝදාන ධර්මය යන අර්ථයයි. එහෙයින් ම **වට්ටං නාම සංසාරෝ විවට්ටං නිබ්බාණං** යන්න කියන ලදි. **තං කථං දට්ඨබබං** යනු එය කවර ආකාරයකින් දතයුතු ද යනුයි. **උපචයෙන** යම්සේ කරන ලද කර්මය ප්‍රතිඵල ගෙනදීමට සමත් වේ ද එසේ කරන ලද උපචිත යැයි කියනු ලැබේ. මෙසේ රැස්කළ කල්හි කර්මය නම් වේ. විපාක දුකට හේතුවෙයි යන අර්ථයයි. සියලුම කෙලෙස් සතර විපර්යාසයන්ගෙන් දැක්විය යුතුය. දසවැදෑරුම් කෙලෙස්වල විපර්යාස හේතු ඇති බැවිනි. **තෙ කත්‍ථ දට්ඨබබා** ඒ විපර්යාසයෝ කවර තැනක දැකිය යුතු ද? **දස වත්‍ථුරක කිලෙස පුඤ්ඤ** යැයි කියන ලදි. දසවිධ වූ කෙලෙස් සමූහයේ යන අර්ථයයි. එහි ක්ලේශයෝ ද ක්ලේශ හේතු වෙයි. කෙලෙස්වල ප්‍රත්‍ය ධර්මයන් ද කෙලෙස් හේතු වේ. ඒවායින් කරුණු ඇති බැවින් පළමුව සිදු වූ කෙලෙස් පසුව අනෙක් ඒවාට ප්‍රත්‍ය වන බැවින් ක්ලේශයන් ද ක්ලේශ

හේතු වේ. අයෝනිසො මනසිකාරය ද අයෝනිසෝ මනසිකාර පරිඤ්ඤ ධර්මයන් ද කෙලෙස් ඉපදීමට හේතු බැවින් ක්ලේශ ප්‍රත්‍යයෝ ද ක්ලේශ හේතූන් යැයි දතයුතුය.

චතතාරෝ ආහාරා යන මෙහි ආහාර මාතෘකාවෙන් ඊට විෂය වූ කෙලෙස් ද අදහස් කරන ලදි. **චතතාරෝ විඤ්ඤාණට්ඨිතියො** යන මෙහි ද මේ ක්‍රමයමැයි. **පඨමෙ ආහාරෙ** යනාදියෙන් දසවස්තුක ක්ලේශ සමූහයෙන් පළමු පළමු දෙය පසුව පසුව ඇති දෙයෙහි හේතුවයැයි දක්වයි.

එහි **පඨමෙ ආහාරෙ** යනු විෂය වූ පළමු ආහාරයෙහි පළමු විපර්යාසය පවතියි යන අර්ථයයි. සෙසු ආහාරවල ද මේ ක්‍රමය මැයි. **පඨමෙ විපල්ලාසෙ** යනු පළමු විපර්යාසය ප්‍රහීණ නොවූ කල්හි පළමු උපාදානය පවතියි යන අර්ථයයි. සෙසු පදවල ද මේ ක්‍රමය මැයි. මෙහි යමක් කියයුතු ද එය නිද්දේසයෙහි ම කියන්නෙමු.

දැන් දසවස්තුක කෙලෙස් පිඬ තෘෂ්ණා අවිද්‍යා වශයෙන් කොටස් දෙකකට බෙදනුයේ **යො ච කබලිංකාරො ආහාරො** යනාදිය කියන ලදී. එහි කබලිංකාර ආහාරය හා ස්පර්ශ ආහාරය නොදන්නා වූ තෘෂ්ණා චරිතයාට පිළිවෙලින් කායවේදනාවන්හි තීව්‍ර ඡන්දරාගයක් වෙයි ද මෙසේ උපක්ලේශයක් වූ ඡන්දරාගයේ හේතුවක් නොමැතිකමින් **යො කබලිංකාරො ආහාරො යො ච එසෙසා ආහාරො ඉමෙ තණ්හා චරිතසස පුගගලසස උපකකිලෙසො** යි කියන ලදී. එසේම මනෝ සංචේතනා ආහාරය ද විඤ්ඤාණ ආහාරය ද නොදන්නා වූ දෘෂ්ටි චරිතයා ඒවා කෙරෙහි ආත්ම සංඥාව ද නිත්‍ය සංඥාව ද වේ යැයි කියන ලද ක්‍රමයෙන් ම දෘෂ්ටි චරිතයාගේ උපක්ලේශ කියන ලදී. එසේම පූර්ව වූ විපර්යාස දෙක ද පූර්ව වූ දෙක බැගින් වූ උපාදාන, යෝග, ගන්ථ, ආසව, ඕඝ, සල්ල, විඤ්ඤාණ ඨිතිය, අගතිගමනය ආදිය තණ්හා ප්‍රධාන බැවින් තණ්හාව ස්වභාව කොට ඇති බැවින් තණ්හාව විෂයකොට ඇති බැවින් තණ්හා චරිතයාගේ උපක්ලේශ යැයි කියන ලදී. ඒ අවසන්හි වූ දේ දෘෂ්ටිය ප්‍රධාන බැවින් දෘෂ්ටිය ස්වභාවකොට ඇති බැවින් දෘෂ්ටිය විෂයකොට ඇති බැවින් දෘෂ්ටි චරිතයාගේ උපක්ලේශ යැයි කියන ලදැයි දතයුතුය.

කබලිංකාරෙ ආහාරෙ අසුභෙ සුභනති විපල්ලාසො යනු ආහාර

සතර අතුරින් කබලිංකාර ආහාර ද විපර්යාස සතර අතුරින් අසුභයෙහි සුභය වේ යන විපර්යාසය ද දතයුතුය. කබලිංකාර ආහාරයේ අසුභ ස්වභාවය ඇති බැවින් ද අසුභයේ නැගීම් ස්වභාවය ඇති බැවින් ද ය. එසේම ස්පර්ශ ආහාරයේ දුක්ඛ ස්වභාවත්වය ද දුක්ඛ ප්‍රත්‍යයත්වය ද වේ. විශේෂ වශයෙන් එහි **දුකෙහි සැප යන විපර්යාසය වේ.**

එසේම, බොහෝ සෙයින් සත්ත්වයෝ විඤ්ඤාණයෙහි නිත්‍ය සංඥා ඇත්තෝ වෙති. සංස්කාරයන්හි ආත්ම සංඥා ඇත්තෝ වෙති. සංස්කාරයෝ චේතනා ප්‍රධාන වෙති'යි (සලකා) විඤ්ඤාණාහාරෙ -පෙ- අත්තා නි විපල්ලාසො යි කියන ලදී. **පයමෙ විපල්ලාසෙ යීතො කාමෙ උපාදියති** යනු අසුභයෙහි සුභයැයි වෙනස්ව ගන්නා තැනැත්තා ක්ලේශ කාමයෙන් වස්තුකාමයන් දැඩිව ගනී. ඉදං වුච්චති කාමූපදානං යනු එලෙස කාමයන්ගේ යම් ග්‍රහණයක් වේ ද එය කාමූපදානය යැයි කියනු ලැබේ. දුකෙහි සැපයැයි වෙනස්ව ගන්නා තැනැත්තා සීල ව්‍රතයන් කරණ කොටගෙන අනාගතයෙහි භව විසුද්ධිය වේ. එය නිවීමේ සැපයයි දැඩිව ගනියි. අනිත්‍යයෙහි නිත්‍යයැයි වෙනස්ව ගන්නා තැනැත්තා සියලු භවයන් නිත්‍යය, ස්ථිරය. සසදාකාලිකය. නොවෙනස් ස්වභාව ඇත්තේය යන සසර පිළිබඳ සතුටුවන භව දෘෂ්ටිය දැඩිව ගනියි. අනාත්මයෙහි ආත්මය තිබේ යැයි වෙනස්ව ගන්නා තැනැත්තා ආත්මය නැතිකල්හි මේ කර්මඵලය කවරෙකුට ද? එහෙයින් ඔහු කරයි. ඔහු විදියි යන ආත්ම දෘෂ්ටිය දැඩිව ගනී යන මේ අර්ථය **දුතියෙ විපල්ලාසෙ යීතො** යනාදියෙන් දක්වයි.

අයං වුච්චති කාමයොගො යනු යම් කාමරාග සංඛ්‍යාත වූ කාම උපාදානයකින් වස්තුකාමයන් සමග සත්ත්වයා බඳවයි ද මේ කාමරාගය කාමයෝගය යැයි කියනු ලැබේ යනුයි. **අයං වුච්චති භවයොගො** යනු යම් හෙයකින් සීල ව්‍රත උපාදාන සංඛ්‍යාත වූ භවූපදානයෙන් භවය සමග සත්ත්වයා බඳවයි ද මේ භවරාගය භව යෝගය යැයි කියනු ලැබේ යනුයි. **අයං වුච්චති දිට්ඨියොගො** යනු අහේතුක දෘෂ්ටි සංඛ්‍යාත වූ යම් පාපී දෘෂ්ටියකින් ද සක්කාය දිට්ඨි ආදී ඉතිරි දෘෂ්ටියකින් ද සත්ත්වයා දුක සමග බඳවයි ද මේ පාපී දෘෂ්ටිය දිට්ඨියෝග යැයි කියනු ලැබේ යනුයි. **අයං වුච්චති අවිජ්ජායොගො** යනු යමකින් ආත්මවාදය දැඩිව ගැනීමෙන් සියලු සසර දුක සමග සත්ත්වයා බඳවා ද මේ අවිද්‍යාව අවිද්‍යා යෝගය යැයි කියනු ලැබේ යනුයි. යම්හෙයකින් කාමයෝගාදිය

අභිදහා කාය ග්‍රන්ථාදියට හේතු වේ ද එහෙයින් **පඨමෙ යොගෙ ඨිතො අභිජඣාය කායං ගඡති** යනාදිය කියන ලදී.

එහි **අභිජඣාය කායං ගඡති** යනු අනුන්ගේ වස්තුව කෙරෙහි ලෝභ කිරීමේ ලක්ෂණය වන අභිධ්‍යාවෙන් නාමකය වෙළයි. ගටයි යන අර්ථයයි. එසේම භවය පැතීම ප්‍රහීණ වී නොමැති හෙයින් භව දෘෂ්ටිය භවරාග වශයෙන් වෛර බැඳීමට හේතුවන කරුණුවල සත්ත්වයන්ගේ සිත් කෙළෙසයි යන්න **දුතියෙ යොගෙ ඨිතො බ්‍යාපාදෙන කායං ගඡති** යි කියන ලදී. එසේම දෘෂ්ටි වශයෙන් ද අවිද්‍යා වශයෙන් ද සීල ව්‍රතයන්ගෙන් පිරිසිදු වෙයි. මෙයම සත්‍ය වේ. අනෙක්වා බොරු වේ යැයි ද තීරණයකට බැසගනී යන්න **තතියෙ** -පෙ- **ඉදං සචාහිනිවෙසෙන කායං ගඡති** යි කියන ලද **තසස** යනු අභිධ්‍යාදියෙන් යුක්ත වූ ඒ පුද්ගලයාගේ ය. **එවං ගඡිතා** යනු මෙසේ අභිධ්‍යාදී වශයෙන් නාමකය වෙළාගෙන සිටී යනුයි. **අසසවනනි** යනු ආශ්‍රව ලෙසින් පවතිත් යනුයි. **කුතො ච වුචචති අසසවනනි** යනු කවර හේතුවකින් ඒ කෙලෙස් වැගිරේ ද යනුවෙන් ආශ්‍රව හේතුව විමසයි. යම්හෙයකින් ක්ලේශයෝ කුසල පැවැත්ම වළකා සිත මැඩගෙන සිටින්නාහු මාර්ග ප්‍රඥාවෙන් නොසිඳින ලද්දාහු ආශ්‍රවයන්ගේ ඉපදීමට හේතු වෙත් ද එහෙයින් **අනුසයතො වා පරියුට්ඨානතො වා** යි කියන ලදී. **අභිජඣා කායගනථෙන කාමාසවො** යනු අභිධ්‍යා කාය ග්‍රන්ථයෙන් සිද්ධ වූ බැවින් කාමරාග ස්වභාවය නිසා කාමාසවය සිද්ධ වූයේ වෙයි. අන්කිසි විෂයකදී දොම්නසින් ඊට ප්‍රතිපක්ෂ වූ විෂයයෙහි ඒ විෂය බහුල වූ භවයන් පතන්නේය යන්න **බ්‍යාපාද කායගනථෙන භවාසවො** යි කියන ලදී.

පරාමාස කායගනථෙන දිට්ඨාසවො යනු සීලබ්බත පරාමාස කාය ග්‍රන්ථයෙන් සිද්ධ වූ හෙයින් එය ස්වභාවකොට ඇති අන්‍ය අන්‍ය දෘෂ්ටීහු අල්ලා ගන්නා පුද්ගලයාගේ දිට්ඨාසවය සිද්ධ වූයේ වෙයි. **ඉදං සචාහිනිවෙසන කාය ගනථෙන අවිජාසවො** යනු මෙය ම සත්‍යය අනෙක්වා බොරුය යනුවෙන් තීරණයක බැසගන්නහුගේ අයෝනිසො මනසිකාර හේතුවෙන් නොයෙක් අකුසල ධර්ම සමග අවිද්‍යා ආශ්‍රවය උපදී යනුයි. සියලු අකුසල ධර්මයන් අවිද්‍යාව පෙරටුකොට ඇති බැවින් මේ සත්‍යාභිනිවේශ කායග්‍රන්ථය සිද්ධ වූ විට ඊට හේතු වූ අවිද්‍යා ආසවය සිද්ධ වූයේ වෙයි. යම්හෙයකින් ආශ්‍රවයන්ට හාත්පසින් පිබිදියාහු සසරෙහි බහාලත් ගිල්වත් යන අර්ථයෙන් ඕඝා යැයි කියනු ලැබේ ද

එහෙයින් **නසස ඉමෙ චතතාරො ආසවා** යනාදිය කියන ලදී. **අනුසය** සහගතා යනු අනුසය ස්වරූපය ප්‍රතික්ෂේප නොකොට ගිය, පැවති, අනුසය වූ යන අර්ථයයි. **අජඣාසයං** යනු සිතයි.

අනුපසවිටඨා යනු බැසගත් යනුයි. **හදයං ආහචච තිටඨනති** යනු සිතේ අභ්‍යන්තරය වන හදවත ගටා සිටිත් යනුයි. එහෙයින් ම අට්ඨසාලිනියේ දී 'අබභනතරටඨෙන හදයං'යි කියන ලදී. **තෙන වුචචනති සලලා** යනු යම්හෙයකින් අදහසට ඇතුල්වූවාහු හදවත ගටා සිටිත් ද එහෙයින් සල්ලායි කියනු ලැබේ. පීඩා ඇති කිරීම, ගැළවිය නොහැකි බවද සල්ල යන අර්ථයයි. මෙය මගේ ආත්මය යැයි ගැනීම් මුඛයෙන් මෙය මම වෙමියි ගැනීමක් වේ ද (මේ) දෘෂ්ටිය නිසා ද මානය ජප කරයි යන අර්ථයෙන් **දිටඨොසෙන මානසලලො** යි කියන ලදී. **පරියාදිනනං** යනු අනෙකාට ඉඩක් නොදී හාත්පසින් අල්ලාගත් යනුයි. **චතූසු ධමමෙසු සණඨහති** යනු අරමුණ ප්‍රත්‍යය බැවින් අරමුණු වූ කරුණු සතරෙහි පිහිටයි යනුයි. **රූපෙ වෙදනාය සඤඤාය සංඛාරෙසු** යනුවෙන් ඒවා ස්වරූප වශයෙන් දක්වයි.

නඤඤුපසෙවනෙන යනු ලෝභ සහගත සිත සමග යෙදුණු එක්ව හටගත් කෙළවර ඇති නන්දි නම් තෘෂ්ණාව අනන්‍ය වූ උපනිශ්‍රය කෙළවරෙහි ඉසිත් නුයි නන්දුපසෙවන නම් වේ. ඒ නන්දුපසෙවනයෙනි. කවරකු විසින් ඒ නන්දුපසේවනය කෙරේ ද? **රාග සලලෙන නඤඤුපසෙවනෙන විඤඤාණෙ සෙවනෙන** යනුවෙන් කියන ලදී. එහි **රාගසලලෙන** යනු හේතු වූ රාග නමැති හුලෙනි. **නඤඤුපසෙවනෙන විඤඤාණෙන** යනු ඉතිහේතු ලක්ෂණයෙහි කරණ විභක්ති වචනයකි. **රූපූපගා විඤඤාණටඨිති** යනු රූපයට අරමුණු හේතු ලෙසින් එළඹිය යුතු හෙයින් ද විඥානයේ ප්‍රතිෂ්ඨාව බැවින් ද රූපූපගා විඤඤාණටඨිති නම් වේ යනුයි. මෙහි සිටිනුයි ඨිති නම් වේ. පංචවොකාර භවයෙහි අභිසංස්කාර විඥානය රූපස්කන්ධය ඇසුරුකොට පවතියි. **දොසසලලෙන** යනු එකට හටගත් දෝෂ හුලෙනි. යම්විටෙක වේදනාව අනුව ගිය විඥාන පැවැත්ම යැයි කියනු ලැබේ ද එවිට උපනිශ්‍රය කෙළවරම නන්දියගෙන් සේවනය වූ විඥානය දතයුතුය. වේදනාව ද දොම්නස් වේදනාව ම ය. යම්විටෙක උපනිශ්‍රය හේතුව වූ දෝෂ හුල කරණ කොටගෙන වේදනූපග විඤඤාණටඨිතිය යැයි කියනු ලැබේ ද එවිට සහජාත කෝටියෙන් හෝ උපනිශ්‍රය කෝටියෙන් යුත් නන්දියගෙන් සේවනය කරන ලද විඥානය

දතයුතුය. ත්‍රිවිධ වූ වේදනාවන්ගේ අරමුණු ඇසුරු කරන බැවින් වේදනා ද තුනක් වේ. එහි පළමු න්‍යාය දොම්නස් අරමුණෙහි අභිසංස්කාර විඥානය ලෙසින් කියන ලදී. දෙවැන්න සියලු වේදනා අරමුණු වශයෙන් යැයි දතයුතුය. **මානසලෙලන** යනු මාන හුල සමග සහජාත වූ හෝ උපනිශ්‍රය වූ හෝ දෙයිනි. **මොහ සලෙලන** යන මෙහි ද මේ ක්‍රමය මැයි.

මෙහි ද අනාදිමත් වූ සසරෙහි ස්ත්‍රීපුරුෂයෝ රූපයෙහි ඇලෙනැයි රාග හුල ලෙසින් පළමු විඥාන **ස්ථිතිය** යොදන ලදී. සියලු වේදනාව දුක්ඛ හේතු ස්වභාවයෙන් **දුක පිළිබඳ** දෝෂය අනුව පවතී යන අර්ථයෙන් දෝෂ හුල ලෙසින් දෙවැන්න **යොදන ලදී. සංඥා** වශයෙන් මම ශ්‍රේෂ්ඨ වෙමි යි හැඟීමක් වේ යැයි සලකා මාන හුල ලෙසින් තෙවැන්න යොදන ලදී. සංස්කාරයන්හි සමූහය එකිනෙක ගැළවිය නොහැකි යයි මෝහ හුල ලෙසින් සිව්වැනි විඥාන ස්ථිතිය යොදන ලදැයි දතයුතුය. **උපසඳධං** යනු එල්බගත් අරමුණු වූ විඥාන ස්ථිතීන්ගෙන් රුකුල් දුන් යනුයි. **තඤඤව කමමං** යනු චේතනා චේතසික යනුවෙන් පෙර යමක් කියන ලද ද එයයි. **ඉමෙ ච කිලෙසා** යනු මේ දසවස්තුක ක්ලේශයෝ ය. සෙස්ස මනාව දතයුතු ම ය.

දැන් හාර ආදිය න්‍යායවල සංකිලේස පක්ෂයේ දිශා ලෙසින් තීරණය කොට දක්වන්නට **ඉමා චතසෙසා දිසා** යනාදිය අරඹන ලදී. එය ප්‍රකට කරන ලද්දේ ම ය. නැවත **කබලිංකාරෝ ආහාරෝ** යනාදිය ආහාරාදීන්හි යම් පුද්ගලයෙකුගේ උපක්ලේශ වේ නම් එය බෙදා දක්වන්නට අරඹන ලදී.

එහි **දසනනං සුතනානං** යන්න ඒකදේශයක සමූහ ව්‍යවහාරයෙන් කියන ලදී. සමූහයෙහි පැවති නාමය අවයවවල ද දක්නා ලැබේ. පටෝ දඬෙඩා, සමුද්දෝ දිටෙඨා යනු උදාහරණයි. **එකෝ අසෙටා** යනු එක් අර්ථයක් උපදවන හෙයින් කියන ලදී. **බයඤජනමෙව නනං** යන මෙහි බ්‍යඤ්ජන ග්‍රහණයෙන් බ්‍යඤ්ජනාර්ථය ද ගන්නා ලදැයි දතයුතුය. දශවිධ සූත්‍ර පදයන්ගෙන් ම වස්තු සහිත තණ්හාව කියන ලදී. තණ්හාව ද රාග චරිත ඇති පුද්ගලයාව වහාම දූෂණය කෙරේ යන්න **ඉමෙ රාග චරිතසස පුගගලසස උපකකිලෙසො** යි කියන ලදී. යම්සේ පළමු දිශා භාවයෙන් කියන ලද ධර්ම රාග චරිතයාට උපක්ලේශ වේ ද එසේම දුතිය දිශා භාවයෙන් කියන ලද ධර්මදෝෂ චරිතයාට තෘතීය චතුර්ථ දිශා භාවයෙන්

කියන ලද ධර්ම පිළිවෙලින් දිට්ඨි චරිතයාට ද මන්ද ප්‍රාඥයාට ද තික්ඛණ ප්‍රාඥයාට ද උපක්ලේශ වේ යයි කියන ලදී. ඒවායේ උපක්ලේශභාවය කියන ලද ක්‍රමය අනුව දතයුතුය.

ආහාර විපලාස ආදිය ඉදින් සියලු ම විමෝක්ෂ මුඛ තුන කරණ කොටගෙන පූර්වභාගයේදී සුදුසු පරිදි දතයුතු දෑ ඉවත්කළ යුතු ද වේ. යමෙකුගේ දුක්ඛානුපස්සනාව පළමු ආහාර දෙකෙහි දුකක් ලෙසින් බහුලව පවතී ද ඒ අනුව **යොව කබලිංකාරෝ ආහාරෝ යොව එසෙසා ආහාරෝ ඉමෙ අපපණිහිතෙ විමොකඛමුඛෙන පරිඤඤං ගචඡති** යි කියන ලදී. ඉතිරි ඒවායෙහි ද මේ ක්‍රමය මැයි. එය මෙසේ වේ. අන් පරිද්දකින් නොවේ. ආර්ය මාර්ගයන්හි මෙන් විමෝක්ෂ මුඛයන්ගේ ප්‍රහාණ කළයුතු, දතයුතු ප්‍රහාණය කළයුතු දේවල කිසි නියමයක් හමු නොවේ. **ඉති සඛෙබ ලොකවටටානුසාරිනො ධමමා නියාඛනති තෙ ලොකා නීහි විමොකඛමුඛෙහි** යනු නිගමනයයි. එහි අර්ථය මෙසේය. මෙලෙස කියන ලද ආකාර ඇති සියලු ආහාරාදී ලෝක සංඛ්‍යාත දුක අනුව යන ධර්මයෝ වෙත් ද ලෝකය වූ ඒවා අනිච්චානුපස්සනා ආදී ත්‍රිවිධ විමෝක්ෂ මුඛයන් මගින් සසරින් (පුද්ගලයාව) ගෙන යත්.

මෙසේ සංකිලේස පක්ෂයෙහි දිශාව වූ කරුණු දක්වා දැන් වොදාන පක්ෂයෙහි දිශාව වූ කරුණු දක්වන්නට චතස්සො පටිපදා ආදිය කියන ලදී. එහි දිව්‍ය, බ්‍රහ්ම, ආර්ය, ආනෙඤ්ජවිහාර යන සතර විහරණ ද, මානය ප්‍රහාණ කරන, තෘෂ්ණාව උපුටා හරින, අවිද්‍යාව දුරුකරන, භවය සන්සිඳුවන ආශ්චර්ය අද්භූත ධර්ම සතර ද සච්ච අධිට්ඨාන ආදී අධිෂ්ඨාන සතරද ඡන්දසමාධි භාවනා ආදී සමාධි භාවනා සතර ද ඉන්‍ද්‍රිය සංවරය, තප සංඛ්‍යාත පුණ්‍ය ධර්මය, බොජ්ඣංග භාවනාව සියලු උපධීන් බැහැර කිරීම් සංඛ්‍යාත නිවන ද යන සතර සැපයට බඳුන්වන කරුණු ද දතයුතුය.

පඨමා පටිපදා යනාදිය පටිපදා සතිපට්ඨාන ආදීන්ගේ භේදයක් නොමැති බව දැක්වීමයි. ඉදින් මෙසේ නම් කවර හෙයින් වෙන වෙනම ගැනීම් කරන ලද ද? දසවස්තුක වූ කෙලෙස් පිඬෙහි ප්‍රතිපක්ෂභාවය දක්වනු පිණිස පටිපදා ආදී දසක දැක්වීම් කරන ලදී. එසේම **චතතාරෝ ආහාරා තෙසං පටිපකෙඛා චතසෙසා පටිපදා** යන ආදිය කියනු ලැබේ. කෙසෙ වුවත් සතර සතිපට්ඨානවලදී මේ සතිපට්ඨානය මේ ප්‍රතිපදාවෙන් ම සමෘද්ධ වේ යැයි නියමයක් නැත. එසේ වුවත් පළමු ප්‍රතිපදාවෙන් පළමු

සතිපට්ඨානය හටගනීයැයි සම්භවය අනුව **පඨමා පට්පදා පඨමං සතිපට්ඨානං** යි කියන ලදී. යම්හෙයකින් ආහාර විපල්ලාස ආදියේ මෙන් පට්පදා සතිපට්ඨාන ආදීන්ගේ අර්ථ වශයෙන් වූ නානත්වයක් නැත්තේ ද ඒ ඒ ආකාරයෙන් පිළිපන් සතිපට්ඨානයන් ම දුක්ඛාපට්පදා දන්ධාභිඤ්ඤා ආදී නම් ලබත් ද එහෙයින් සංකිලෙස පක්ෂයෙහි මෙන් **පඨමෝ ආහාරෙ පඨමෝ විපල්ලාසෝ** යනාදී අධිකරණ භේදයෙන් කියන ලද අධිකරණ භේදය ඇති නොකොට පඨමා පට්පදා පඨමං සතිපට්ඨානං යනාදිය කියන ලදී. සෙසු ඒවායෙහි ද මේ ක්‍රමය මැයි.

අන්ධයාගේ කඳු නැගීම මෙන් කිසිදිනෙක ඇතිවන දෙය ආශ්චර්ය වේ. පොරාණයෝ අප්සරාවන්ට යෝග්‍ය වූයේ අච්ඡරිය යැයි කියත්. නොවූ විරූ දේ වූයේ නුයි අබ්භූත නම්. මේ දෙකම විස්මයත්වයට අධිවචනයි. මාන ප්‍රහාණාදියෙන් අන්‍ය වූ නොලැබිය හැකි වූ ද විස්මය ඇති කරන්නා වූ ද දෙයක් නොලැබේ. මෙය කරණ කොටගෙන පවතී. නැතහොත් මෙහි ඉටාගැනීම් මාත්‍රයක් ම වේ. එය අධිට්ඨාන නම් වේ. සත්‍ය වූයේත් ඒ ම ය. අධිෂ්ඨාන වූයේත් ඒ ම ය. (යන ක්‍රමයෙන් හෝ) සත්‍යයේ අධිෂ්ඨානය (යන ක්‍රමයෙන් හෝ) සත්‍යය හා අධිෂ්ඨානය මොහුට ඇත (යන ක්‍රමයෙන් හෝ) සච්චාධිට්ඨාන නම් වේ. ඉතිරි ඒවායේ ද මේ ක්‍රමය මැයි. සමාධිය ම වැඩිය යුතු බැවින් සමාධි භාවනා නම් වේ. සුඛය ඇසුරු කෙරේනුයි සුඛභාගිය නම් වේ. එක් සත්ත්වයෙකුට අසුභ භාවනාදිය මෙන් එක දෙසෙක නොපැවතී ඉතිරි නැතිව ගන්නා හෙයින් මෙහි ප්‍රමාණයක් නැත යන අර්ථයෙන් අප්පමඤ්ඤා නම් වේ. **පඨමා පට්පදා භාවිතා බහුලීකතා පඨමං සතිපට්ඨානං පරිපූරෙති** යනු පළමු ප්‍රතිපදාවෙන් භාවනාව බහුල කරන්නෙක් වේ. පළමු සතිපට්ඨානයෙන් භාවනාව සපුරන්නෙක් වේ යන අර්ථයයි. ඉතිරි පදවල ද මේ ක්‍රමයමැයි. යම්සේ වනාහි ආර්ය මාර්ගය වර්ධනය කළ කල්හි සතිපට්ඨාන ආදී බෝධිපාක්ෂික ධර්ම සියල්ලම භාවිත කරන ලද්දේ ම වේද එසේ මේ සම්පත්තිය දතයුතුය. කායානුපස්සනාව කාමරාගයට සෘජුව විරුද්ධවන බැවින් **පඨමං සතිපට්ඨානං භාවිතං බහුලීකතං කාමපට්පක්ඛං පඨමජ්ඣානං පරිපූරෙති** යි කියන ලදී. එසේම ප්‍රීති චින්දන වශයෙන් පවත්නා දෙවැනි සතිපට්ඨානය ප්‍රීතිය සහිත වූ ද්විතීය ධ්‍යානයේ ද සිතෙහි අභිප්‍රමෝද වශයෙන් පවත්නා තෙවැනි සතිපට්ඨානය උසස් බවට පත් සැප ඇති තෘතීය ධ්‍යානයේ ද අනිත්‍ය විරාග ආදී වශයෙන් පැවති සංස්කාරයන්හි උපේක්ෂාව වූ සතරවැනි සතිපට්ඨානය උපෙක්ඛා

සති පාරිසුද්ධි භාවයෙන් චතුර්ථ ධ්‍යානයේ සපිරීම පිණිස පවතී. යම්හෙයකින් රූපාවචර ප්‍රථමධ්‍යානය රූපාවචර සමාපත්තීන්ගේ ද්විතීය ධ්‍යානය ව්‍යාපාද විතර්කාදිය දුරුකිරීම් ස්වභාවයෙන් යුත් බ්‍රහ්මවිහාර සම්බන්ධ තෘතීය ධ්‍යානය, ප්‍රීති විරාගයෙන් හා සුඛයෙන් විදර්ශනාවේ අධිෂ්ඨානය වූ ආර්ය විහාරී චතුර්ථ ධ්‍යානය උපේක්ෂා සති පාරිසුද්ධියෙන් යුත් ස්ථිර බවට පැමිණි ආනෙඤ්ජවිහරණයන්ගේ වෙසෙසින් ප්‍රත්‍යය වේද එහෙයින් **පඨමං ඣානං භාවිතං බහුලීකතං පඨමං විහාරං පරිපූරෙති** යනාදිය කියන ලදී. මෙසේ යමෙක් යම් ධ්‍යානයක විශේෂ ප්‍රත්‍ය සහිත වේ ද හෙතෙම එය සපුරන්නේ යැයි කියන ලදැයි දතයුතුය.

දැන් ප්‍රතිපදා ආදිය වෝදාන පක්ෂයෙහි දිශාව ලෙසින් නියම කරන්නට **තත්‍ර ඉමා චතසෙසා** යනාදිය කියන ලදී. එය මනාව දතහැක්කේ ම ය. නැවත **පඨමා පටිපදා** යනාදිය ප්‍රතිපදා චතුෂ්ක ආදියෙහි යම් ලෙසකින් යම් පුද්ගලයෙකුගේ පිරිසිදු බවක් වේ ද එය බෙදා දක්වන්නට අරඹන ලදී. එය යට කියන ලද න්‍යාය ම ය. ඉදිනුදු ත්‍රිවිධ විමෝක්ෂ මුඛයන් අතුරෙන් මෙය විමෝක්ෂ මුඛය නම් වේ. මෙම ප්‍රතිපදාවෙන් ම සමෘද්ධ වේ යන නියමයක් නැත. යම් පුද්ගලයන්ගේ මුල් ප්‍රතිපදා දෙකින් ප්‍රගිණ නොවූ අප්‍රගිහිත විමෝක්ෂ මුඛයෙන් ආර්ය මාර්ගාධිගමය වේ ද ඒ පුද්ගලයන්ගේ ස්වරූපයෙන් මේ ප්‍රතිපදා විමෝක්ෂමුඛ සන්සන්දනය වේ. සතිපට්ඨාන ආදියෙන් විමෝක්ෂ මුඛ සන්සන්දනය ද මේ ක්‍රමය මැයි. **තෙසං විකකීළිතං** යනු අසන්ත ආසන ජවන පරාක්‍රම ආදී විශේෂ යෙදීමෙන් බුද්ධ සිංහයන්ගේ ද (බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ ද) පසේ බුදුවරුන්ගේ ද බුද්ධ ශ්‍රාවකයන්ගේ ද **ක්‍රීඩාවයි.** විහරණයයි. එනම් ආහාර ආදී ක්ලේශ වස්තු ඉක්මවීම් මුඛයෙන් අනුන්ගේ සිතෙහි ප්‍රතිපදාදිය සම්පාදනය කිරීමයි. දැන් ආහාර ආදියේ ප්‍රතිපදාවන්ගෙන් යමක ඉක්මවීමක් වේ ද එය ඒවාට ප්‍රතිපක්ෂ බව දක්වමින් **චතත්තාරෝ ආහාර තෙසං පටිපකෙඛා චතසෙසා පටිපදා** යනාදිය කියන ලදී.

එහිදී ඒවායේ ප්‍රතිපක්ෂ භාවය පහාතබ්බ භාවය හා පහායක භාවය (දතයුතු වේ) මෙහිදී ආහාරය විඤ්ඤාණ ඨිතිය (විඤ්ඤාණයේ පැවැත්ම) ආදියේ ඉවත් කළයුතු ස්වභාවය හා ඒ හා බැඳුණු ඡන්දරාගය අනුව දතයුතුය. එහි වික්කීළිතය භාවනාව හා සාක්ෂාත් කරණය යනාදියයි. මේ එහි සංක්ෂේපාර්ථයයි. තෙසං වික්කීළිතං යන මෙහි ඒ වික්කීළිතය

යනු වැඩිය යුතු බෝධිපාක්ෂික ධර්මයන්ගේ වැඩීමයි. සාක්ෂාත් කළ යුතු ඵල-නිර්වාණ ආදියේ සාක්ෂාත් කිරීමයි. එසේම ප්‍රහාණය කළයුතු දසවස්තුක කෙලෙස් සමූහය තදංග ආදී වශයෙන් ප්‍රහාණය කිරීමයි. ඉතිරි නොකොට විනාශ කිරීමයි.

දැන් එය කෙටියෙන් දක්වමින් **ඉන්ද්‍රියාධිට්ඨානං විකකීළිතං විපරියාසානධිට්ඨානං** යි කියන ලදී. **ඉන්ද්‍රියාධිට්ඨානං** යනු ඉන්ද්‍රියන්ගේ පැවැත්ම, වර්ධනය හා සාක්ෂාත් කරණයයි. **විපරියාසානධිට්ඨානං** යනු විපර්යාසයන්ගේ නොපැවැත්ම, ප්‍රහාණය හා නූපදවීමයි. **ඉන්ද්‍රියානි සද්ධම්ම ගොචරෝ** යනු සද්ධර්මයට අරමුණු වූ ඉන්ද්‍රියයන් ය. පවත්ති හේතු යනු අදහස් කරන ලද සද්ධින්ද්‍රිය ආදිය යන අර්ථයයි. **විපරියාසා කිලෙස ගොචරෝ** යනු විපර්යාසයෝ සංකිලේස පක්ෂයට ප්‍රවෘත්ති ස්ථානයකි. පැවතුම් හේතුවකි යනුයි. **අයං වුච්චති සීහ විකකීළිතස්ස නයස්ස භූමි** යන යම් මේ භූමියක් **චතතාරෝ ආහාරා** යනාදියෙන් සංකිලේස පක්ෂයෙහි චතුෂ්ක දහයේ ද **චතතාරෝ පටිපදා** යනාදියෙන් වෝදාන පක්ෂයෙහි චතුෂ්ක දහයේ ද තෘෂ්ණා චරිත ආදීන්ගේ උපක්ලේශ වෝදානයන් දැක්වීම් ස්වරූපයෙන් වෙන් කෙරේ ද මෙය සීහවික්කීළිත නයෙහි භූමිය නම් වේ.

දැන් උග්ඝටිතඤ්ඤ ආදී පුද්ගලයන් තිදෙනා වශයෙන් තිපුක්කලනයෙහි භූමිය දක්වන කැමැත්තේ යම් හෙයකින් න්‍යායයන්ගේ අන්‍යොන්‍ය වශයෙන් වන ප්‍රවේශය කැමති බැවින් සීහවික්කීළිත නයෙන් තිපුක්කල නය නික්ම යේ ද එහෙයින් පද විභාග වශයෙන් පුද්ගලයින් සතර දෙනෙක් සීහවික්කීළිත නයෙහි භූමිය සේ දක්වා එයින් ම උග්ඝටිතඤ්ඤ ආදී පුද්ගලයන් තිදෙනා වෙන්කර දක්වන්නට **තත්‍ථ යෙ දුක්ඛාය පටිපදාය** යනාදිය අරඹන ලදී.

එහි **ඉමෙ දුවෙ පුගලා** යනු පළමු ප්‍රතිපදා දෙක ලෙසින් මේ පුද්ගලයන් දෙදෙනා ය. අනෙක් තැන්වලදී ද මේ ක්‍රමය මැයි. නැවත **තත්‍ථ යෙ දුක්ඛාය පටිපදාය** යනාදිය මුලින් කියන ලද පුද්ගල චතුෂ්කයෙන් උග්ඝටිතඤ්ඤ ආදී පුද්ගලත්‍රය වෙන් කරන්නට කියන ලදී.

එහි **යො සාධාරණාය** යනු වහා පැමිණෙන ලද අභිඥා ඇති දුක්ඛ ප්‍රතිපදාවෙන් ද පමා වූ අභිඥා ඇති සුඛ ප්‍රතිපදාවෙන් ද පමුණුවයි යන

සම්බන්ධයයි. කෙසේනම් ප්‍රතිපදා දෙකක් එකක හමුවේ ද? එය මෙසේ නොදත යුතුය. එක් පුද්ගලයෙකුට එකෙක්හි පටිපදා දෙකක් හමු නොවේ යනුවෙනි. පෙර කියන ලද ප්‍රතිපදා දෙකෙහි යමෙක් යම්කිසිවක් ගෙනයයි ද ඒ විපඤ්චිතඥ පුද්ගලයා යන මෙය මෙහි අදහසයි. යම්හෙයකින් අට්ඨසාලිනියේ දී ප්‍රතිපදාව සෙලවෙයි. නොසෙල්වෙයි යන විචාරයෙහි චලති යයි කියන ලද ද එහෙයින් එක් පුද්ගලයෙකුගේ ධ්‍යාන අතර මාර්ග අතර ප්‍රතිපදා භේදය කැමතිවන ලද්දේය යනුයි. **තත්‍ථ භගවා** යනාදියෙන් දේශනා විභාගයන්ගෙන් ද ඒ පුද්ගල විභාගය ම දක්වයි. එය මුලින් කියන ලද ක්‍රමය ම ය.

එහි **අධිචිත්තං** යනු අධිචිත්ත ශික්ෂාවන් යනුයි. **ච** ශබ්ද ලොප්කරන ලද්ද දැක්වීමයි. එයින් අධිචිත්ත ශික්ෂාව ද අධිප්‍රඥා ශික්ෂාව ද විපඤ්චිතඥ පුද්ගලයාට පනවයි යන අර්ථයයි. **අධිසීලං** යන මෙහි ද මේ ක්‍රමය ම ය. අධිසීල ශික්ෂාව අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාවද යෙදිය යුතුය. **චතනාරි හුත්වා තීණි භවනත්‍ත** යනු ලිංග විපර්යාස වශයෙන් කියන ලදී. චත්තාරෝ පුග්ගලා හුත්වා තයෝ පුග්ගලා හොන්ති යන අර්ථයයි. **අයං සංකිලෙසෝ** යනු අකුසල මූල ආදී මේ දොළසක් වූ තික සංග්‍රහය මෙය කරණ කොටගෙන කෙළෙසෙන්නේය යන අර්ථයෙන් සංකිලෙසොයි තීරණයකොට යනුයි. **ඉදං වොදානං** යන මෙහි ද මේ ක්‍රමය මැයි. **තීණි හුත්වා දෙව භවනති** යනු නන්දියාවට්ට නයෙහි දිශාව වූ ධර්මයන් දක්වනු පිණිස කියන ලදී. එහෙයින් ම **තණ්හාව අවිජ්ජාව** යනාදිය කියන ලදී. ඒ සියල්ල මනාව දතහැකිය.

මෙහිදී කවර හෙයකින් න්‍යායන්ගේ උද්දේස අනුපිළිවෙලින් නිද්දේසය නොකරන ලද්දේ ද? න්‍යාය න්‍යායන්ගෙන් ඇතිවූ බව දක්වනු පිණිසය. පළමු නයෙන් පුද්ගල අධිෂ්ඨාන වශයෙන් තෙවන නය ද තෙවැනි නයෙන් දෙවැනි නය ද ඇතිවේ යන මේ විශේෂය දක්වනු පිණිස පළමු නයට අනතුරුව තෙවැනි නය ද තෙවැනි නයට අනතුරුව දෙවැනි නය ද දක්වන ලදී. ධර්මාධිෂ්ඨාන වශයෙන් තෙවැනි නයෙන් දෙවැනි නයද දෙවැනි නයෙන් පළමු නය ද ඇති වේ යන මේ විශේෂය දක්වනු පිණිස කෙළවරදී **තණ්හා ච අවිජ්ජා ච** යනාදියෙන් පළමු නයෙහි භූමිය දක්වන ලදී. එහෙයින් **චතතාරි හුත්වා තීණි හොනති තීණි හුත්වා දෙව හොනති** යයි කියන ලදී. ඉදින් (මෙය) මෙසේනම් දෙකක් වී සතරක් වේ. දෙකක් වී තුනක් වේ. තුනක් වී සතරක් වේ යන මේ නය ද කිවයුතු

වන්නේද? එය සත්‍යයකි. මේ නය වනාහි අර්ථ වශයෙන් දක්වන ලද්දේ ම යැයි සලකා නොකියන ලද්දේය. යම්හෙයකින් ත්‍රිවිධ අර්ථ න්‍යායන්ගේ අන්‍යොන්‍ය ප්‍රවේශය කැමතිවන ලද්දේ ද (එම) අනුප්‍රවේශය ඇතිකල්හි එයින් ඉවත්වීම ද ලැබෙමය. මේ අර්ථය ද පේටකෝපදේශයෙන් දැක්විය යුතුය.

මේ එහි මූලපටන් වූ විභාවනයයි. පුද්ගලයන් සතර දෙනෙකි. තෘෂ්ණා චරිතයා මුදින්ද්‍රිය හා තීක්ඛින්ද්‍රිය ලෙස ද්විවිධය. දෘෂ්ටි චරිතයා ද එසේම ය. එහි මෘදු ඉන්ද්‍රිය ඇති තෘෂ්ණා චරිතයා දුක්ඛ ප්‍රතිපදාවෙන් පමා වී අභිඤ්ඤා ලබනු පිණිස මෙහෙයවයි. තීක්ඛින්ද්‍රිය පුද්ගලයා දුක්ඛ ප්‍රතිපදාවෙන් වහා අභිඤ්ඤා ලබනු පිණිස මෙහෙයවයි. දෘෂ්ටි චරිතයා වනාහි මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ සුඛ ප්‍රතිපදාවෙන් පමා වී අභිඤ්ඤා ලබනු පිණිස මෙහෙයවයි. තීකඛින්ද්‍රිය පුද්ගලයා සුඛ ප්‍රතිපදාවෙන් වහා අභිඤ්ඤා ලබනු පිණිස මෙහෙයවයි. මෙලෙස මේ ප්‍රතිපදාවන්හි සුදුසු පරිදි පැවති තෘෂ්ණා, දෘෂ්ටි චරිතයන් විසින් සතර ආහාර ඊට බැඳුණු ඡන්දරාගය ප්‍රහාණය කිරීමෙන් ඉවත්කළ යුතුයි. සතර සතිපට්ඨාන වඩා සතර විපර්යාස දතයුතුය යන සියල්ල කියන ලද ක්‍රමය අනුව අනුගමනය කළයුතුය. මේ එහි පෙළයි.

එහි යම් දෘෂ්ටිචරිත ඇති සත්ත්වයෝ වෙත් ද ඔවුහු කාමයන්හි දෝෂ දෘෂ්ටීන් ඇත්තෝ ය. ඔවුහු කාමසුඛයන් පිළිබඳ අනුසය මනාව නසන ලද්දෝ නොවෙත්. ඔවුහු අත්තකිලමථානුයෝගයෙහි යෙදුණාහු වාසය කරත්. කාමයන්ගෙන් ප්‍රයෝජනයක් නැතැයි ශාස්තෘවරයා හෝ අන්‍ය වූ ගරුකටයුතු සබ්‍රහ්මචාරියෙකු හෝ ධර්මය දේශනා කරයි. ඔවුහු පළමුව ම කාමයන්ගෙන් ප්‍රයෝජනයක් නැතැයි (සිතා) නිදුකින් කාමයන් දුරුකරත්. ඔවුහු චෛතසික දුකින් (කාමයන්) සමාප්ත කළාහු නොවෙත්. එහෙයින් සුඛ ප්‍රතිපදාව යැයි කියනු ලැබේ. කාමයන්හි රාගය අවසන් කළ යම් තෘෂ්ණා චරිත ඇති සත්ත්වයෝ වෙත් නම් ඔවුන්ට ශාස්තෘන් වහන්සේ හෝ අන්‍ය වූ භික්ෂුවක් හෝ කාමයන්ගෙන් ප්‍රයෝජනයක් නැතැයි දහම් දෙසයි. ඔවුහු දුකසේ ප්‍රිය රූපය අත්හරිත්. එහෙයින් දුක්ඛ ප්‍රතිපදාව යැයි කියනු ලැබේ. මේ සියලු සත්ත්වයෝ ප්‍රතිපදා දෙකෙහි දුක්ඛ වූ ද සුඛ වූ ද ඒකරාශීවීම්වලට ගමන් කරත්. එහි යම් දෘෂ්ටි චරිත ඇති සත්ත්වයෝ වෙත් ද ඔවුහු තීක්ඛින්ද්‍රිය හා මුදින්ද්‍රිය සේ දෙපරිදියහ. එහි තියුණු ඉන්ද්‍රිය ඇති යම් දෘෂ්ටි චරිත ඇති සත්ත්වයෝ වෙත්නම්

ඔවුහු සැපසේ අත්හරිත්. වහා සන්සිඳුවත්. එහෙයින් සුඛ ප්‍රතිපදාව වහා අවබෝධ කරන ලද අභිඥා ඇතැයි කියනු ලැබේ. එහි මෘදු ඉන්ද්‍රිය ඇති යම් දෘෂ්ටි චරිත ඇති සත්ත්වයෝ වෙත් නම් ඔවුහු පළමුව තියුණු ඉන්ද්‍රිය අරමුණුකොට ඉතා ලැසිව සන්සිඳුවත්. ඔවුහු සැපසේ අත්හරිත්. ලැසිව සන්සිඳුවත්. එහෙයින් සුඛා පටිපදා දන්ධාභිඥා යැයි කියනු ලැබේ.

එහි තෘෂ්ණා චරිත ඇති සත්ත්වයෝ තියුණු ඉන්ද්‍රිය හා මෘදු ඉන්ද්‍රිය ලෙසින් දෙවැදෑරුම් ය. එහි තියුණු ඉන්ද්‍රිය ඇති තෘෂ්ණා චරිතවලින් සමන්විත සත්ත්වයෝ වෙත් නම් ඔවුහු දුකසේ අත්හරිත්. වහා සන්සිඳුවත්. එහෙයින් දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤායි කියනු ලැබේ. එහි මෘදු වූ ඉන්ද්‍රිය ඇති තෘෂ්ණා චරිතවලින් යුත් සත්ත්වයෝ වෙත් නම් ඔවුහු පළමුව තියුණු ඉන්ද්‍රිය අරමුණු කොට ඉතා ලැසිව සන්සිඳුවත්. ඔවුහු දුකසේ අත්හරිත්. ලැසිව සන්සිඳුවත්. එහෙයින් දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤායි කියනු ලැබේ. මේ ප්‍රතිපදා සතර පස්වැන්නක් නැත්තකි. සවැන්නක් නැත්තකි. යම්කිසිවෙක් නිවුනාහු ද නිවෙත් ද මතු නිවෙන්නාහු ද මේ ප්‍රතිපදා සතරින් මිස අනෙකකින් නොවේ. ප්‍රතිපදා සතර පිළිබඳ මාර්ගයෙන් කෙලෙස් ඉදිරිපත්කොට ආර්ය සත්‍ය පිළිබඳ මාර්ග සතරින් මේ නය දැක්විය යුතුය. සීහවික්කීළිත නය මේ යැයි කියනු ලැබේ.

එහි මේ ආහාර සතරකි. විපර්යාස සතරකි. උපාදාන, යෝග, ග්‍රන්ථ, ආශ්‍රව, ඕඝ, සල්ල, (විඤාන ස්ථිති) විඤාණයේ පැවතීම්, අගතියට යෑම් යන මෙය සූත්‍රය හා සැසඳීම් ය. ආහාර සතරකි. එහි යම් කබලිංකාර ආහාරයක් වේ ද යම් ස්පර්ශාහාරයක් වේ ද ඒවා තෘෂ්ණා චරිතයා විසින් ඉවත්කළ යුතුය. එහි යම් මනෝ සංචේතන ආහාරයක් වේ ද යම් විඤාන ආහාරයක් වේ ද ඒවා දෘෂ්ටි චරිතයා විසින් ඉවත්කළ යුතුය. එහි පළමු ආහාරය පළමු විපර්යාසයයි. දෙවැනි ආහාරය දෙවැනි විපර්යාසයයි. තෙවැනි ආහාරය තෙවැනි විපර්යාසයයි. සිව්වැනි ආහාරය සිව්වැනි ආහාරයයි. මේ සතර විපර්යාසයෝ පස්වැන්නක් නැත්තෝ ය. සවැන්නක් නැත්තෝ ය. මෙය ද සතර ආහාරවල ප්‍රමාණයයි. මෙසේ මේ පද සියල්ල දහයකි. එහිදී පළමු විපර්යාසයෙහි සිටි තැනැත්තා කාමයන් ග්‍රහණය කරගනී. මෙය කාම උපාදානයයි. දෙවැනි විපර්යාසයෙහි සිටි තැනැත්තා අනාගත භවය ග්‍රහණය කරයි. මෙය සීලබ්බත උපාදානයයි. තෙවැනි විපර්යාසයෙහි සිටි තැනැත්තා විපරීත දෘෂ්ටිය ග්‍රහණය කරයි. මෙය දිට්ඨි උපාදානයයි. සිව්වැනි විපර්යාසයෙහි සිටි

තැනැත්තා ස්කන්ධයන් ආත්ම වශයෙන් ග්‍රහණය කරයි. මෙය අත්තවාද උපාදානයයි. එහිදී කාම උපාදානයෙහි සිටි තැනැත්තා කාමයන් අභිධ්‍යාවෙන් ගොතයි. මෙය අභිධ්‍යා කාය ග්‍රන්ථයයි. සීලබ්බත උපාදානයෙහි සිටි තැනැත්තා ව්‍යාපාදය ගොතා ගනී. මෙය ව්‍යාපාද කාය ග්‍රන්ථයයි. එහිදී දිට්ඨි උපාදානයෙහි සිටි තැනැත්තා පරාමාසය ගොතා ගනී. මෙය පරාමාස කාය ග්‍රන්ථයයි. එහිදී අත්තවාද උපාදානයෙහි සිටි තැනැත්තා ප්‍රමාද කරමින් ගොතා ගනී. මෙය ඉදං සච්චාභිනිවෙස කාය ග්‍රන්ථයයි. කෙලෙස් ගැටවලින් ගෙතුණු ඔහුගේ කෙලෙස් වැගිරෙයි. කුමක් නිසා වැගිරෙතැයි කියයි ද? පසුතැවිලි ය. යමක් පසුතැවීම් වේ ද ඒ අනුසයෝ ය. එහිදී අභිධ්‍යාකාය ග්‍රන්ථයෙන් කාමාසවය ද ව්‍යාපාද කාය ග්‍රන්ථයෙන් භවාසවය ද පරාමාස කාය ග්‍රන්ථයෙන් දිට්ඨාසවය ද ඉදං සච්චාභිනිවෙස කාය ග්‍රන්ථයෙන් අවිද්‍යාසවය ද විපිළිසර වේ. මේ සතර ආශ්‍රවයෝ විශාල වූවාහු ඕඝ නම් වේ. එහෙයින් ඕඝ යැයි කියනු ලැබේ.

එහි කාමාසවය කාම ඕඝයයි. භවාසවය භව ඕඝයයි. අවිජ්ජාසවය අවිජ්ජා ඕඝයයි. දිට්ඨාසවය දිට්ඨි ඕඝයයි. ඒ සතර ඕඝයෝ සත්ත්ව සන්තානයට පිවිසියාහු අනුසය සහගත වෙති. එහෙයින් හදවත පැහැර සිටින හුල්යැයි කියනු ලැබේ. එහි කාම ඕඝය රාග නමැති හුලයි. භව ඕඝය දෝෂ නමැති හුලයි. අවිද්‍යා ඕඝය මෝහය නමැති හුලයි. දිට්ඨි ඕඝය දිට්ඨිය නමැති හුලයි. මේ සතර හුල්වලින් මඩනා ලද විඤ්ඤාණය රූපයෙහි, වේදනාවෙහි සංඥාවෙහි සංස්කාරයන්හි යන ධර්ම සතරෙහි සිටියි. (පවතී) මේ විඤාණයේ පැවතුම් සතරයි. එහිදී රාග නමැති හුල කරණකොට තෘෂ්ණාව ඇතිකරන, රූපය අනුව ගිය විඤාණය පවතී. දෝෂය නමැති හුල කරණ කොටගෙන වේදනාව අනුව ගිය, මෝහ නමැති හුල කරණ කොටගෙන සංඥාව අනුව ගිය, දිට්ඨිය නමැති හුල කරණ කොටගෙන තෘෂ්ණාව ඇතිකරන සංස්කාර අනුව ගිය විඤාණය පවතී. චතුර්විධ විඤාන පැවතුම් හේතුකරගෙන ඡන්ද දෝෂ භය මෝහ යන චතුර්විධ අගතියට යයි. රාගයෙන් ඡන්දාගතියට යයි. දෝෂයෙන් දෝසාගතියට යයි. මෝහයෙන් මෝහාගතියට යයි. දෘෂ්ටියෙන් භයාගතියට යයි. මෙසේ මේ කර්මයන් ද මේ කෙලෙස් ද මේ සසර හේතුව ද වේ.

එහි මේ දිශා සතරකි. කබලිංකාර ආහාරය. අසුභයෙහි සුභයැයි ගන්නා විපර්යාසය කාම උපාදානය කාම යෝගය, අභිධ්‍යා කාය ගන්ථය, කාමාසවය, කාම ඕඝය, රාග සල්ලය, රූපූපගය, විඤ්ඤාණයේ පැවැත්ම, ඡන්දයෙන් අගතියට යෑම, මේ පළමු දිශාවයි.

ස්පර්ශ ආහාරය, දුකෙහි සැපයයි ගන්නා විපර්යාසය **සීලබ්බත** උපාදානය, භවයෝගය, ව්‍යාපාද කාය ගන්ථය, භවාසවය, **භව ඕඝය**, දෝස සල්ලය, වෙදනූපගය, විඤ්ඤාණයේ පැවැත්ම, දෝෂයෙන් අගතියට යාම මේ දෙවැනි දිශාවයි.

මනෝ සංචේතන ආහාරය, අනාත්මයෙහි ආත්මය යැයි ගන්නා විපර්යාසය, දිට්ඨි උපාදානය, දිට්ඨි යෝගය, පරාමාස කාය ගන්ථය, දිට්ඨි ආසවය, දිට්ඨි ඕඝය, දිට්ඨි සල්ලය, සඤ්ඤූපගය, විඤ්ඤාණයේ පැවැත්ම, භයින් අගතියට යාම මේ තෙවැනි දිශාවයි.

විඤ්ඤාන ආහාරය, අනිත්‍යයෙහි නිත්‍යයැයි ගන්නා විපර්යාසය. අත්තවාද උපාදානය, අවිජ්ජා යෝගය, ඉදං සච්චාභිනිවේස කායගන්ථය, අවිද්‍යාසවය, අවිද්‍යා ඕඝය, මෝහසල්ලය, සංස්කාර අනුව ගිය විඤ්ඤාණයේ පැවැත්ම, මෝහයෙන් අගතියට යාම මේ සිව්වැනි දිශාවයි.

මෙසේ මේ සූත්‍ර දහයේ පළමු පදය කරණකොට ගෙන පළමු දිශාවෙන් බැලීම, දෙවන පදය කරණ කොටගෙන දෙවන දිශාවෙන් බැලීම, තෙවන පදය කරණ කොටගෙන තෙවන දිශාවෙන් බැලීම, සිව්වන පදය කරණ කොටගෙන සිව්වන දිශාවෙන් බැලීම (යන යමක් වේද) එය අපලෝකන දිශා යැයි කියනු ලැබේ. මේ ක්‍රමයෙන් සියලු කෙලෙස් පද සතරෙහි ඇතුළත් කළ යුතුය. මේ අකුසල පක්ෂයයි.

ප්‍රතිපදා සතරකි. ධ්‍යාන සතරකි. සතිපට්ඨාන සතරකි. දිව්‍යමය බ්‍රහ්මමය, ආර්ය, ආනෙඤ්ජ විහරණ සතරකි. සම්‍යක්ප්‍රධන් සතරකි. ආශ්චර්ය අද්භූත ධර්ම සතරකි. අධිෂ්ඨාන සතරකි. ඡන්ද සමාධි, විරිය සමාධි, චිත්ත සමාධි, වීමංසා සමාධි යන සමාධි සතරකි. සුඛභාගීය ධර්ම සතරකි. බොජ්ඣංගවලින් තොර නොවූ, තපසින් තොර නොවූ ඉන්ද්‍රිය සංවරයෙන් තොර නොවූ සියලු අත්හැරීමෙන් තොර නොවූ අප්‍රමාණ ධර්ම සතරකි.

එහිදී දැඩාභිඥ වූ දුක්ඛ ප්‍රතිපදාව වඩනු ලබන බහුල කරනු ලබන තැනැත්තා පළමු ධ්‍යානය සම්පූර්ණ කරයි. පළමු ධ්‍යානය සපිරුණේ පළමු සතිපට්ඨානය සම්පූර්ණ කරයි. පළමු සතිපට්ඨානය සපිරුණේ පළමු විහරණය සම්පූර්ණ කරයි. පළමු විහරණය සපිරුණේ පළමු සම්‍යක් ප්‍රධානය සම්පූර්ණ කරයි. පළමු සම්‍යක් ප්‍රධානය සපිරුණේ පළමු ආශ්චර්ය අද්භූත ධර්මය සම්පූර්ණ කරයි. පළමු ආශ්චර්ය අද්භූත ධර්මය සම්පූර්ණ වූයේ පළමු අධිෂ්ඨානය සම්පූර්ණ කරයි. පළමු අධිෂ්ඨානය සපිරුණේ ඡන්ද සමාධිය සම්පූර්ණ කරයි. ඡන්ද සමාධිය සපිරුණේ ඉන්ද්‍රිය සංවරය සම්පූර්ණ කරයි. ඉන්ද්‍රිය සංවරය සපිරුණේ පළමු අප්‍රමාණය සම්පූර්ණ කරයි. මෙසේ සියලු අතහැරීම දක්වා වූ සතරවැනි අප්‍රමාණය සම්පූර්ණ කරයි.

එහි පළමු ප්‍රතිපදාව ද පළමු ධ්‍යානය ද පළමු සතිපට්ඨානය ද දිව්‍ය විහරණය ද පළමු සම්‍යක් ප්‍රධානය ද පළමු ආශ්චර්ය අද්භූත ධර්මයද සත්‍ය අධිෂ්ඨානය ද ඡන්ද සමාධිය ද ඉන්ද්‍රිය සංවරය ද මෛත්‍රී අප්‍රමාණයද යන මෙය පළමු දිශාවයි.

දෙවැනි ප්‍රතිපදාව ද දෙවැනි ධ්‍යානය ද දෙවැනි සතිපට්ඨානය ද බ්‍රහ්ම විහරණය ද දෙවැනි සම්‍යක් ප්‍රධානය ද ආශ්චර්ය අද්භූත ධර්මය ද ත්‍යාග අධිෂ්ඨානය ද චිත්ත සමාධිය ද තපස ද කරුණා අප්‍රමාණය ද යන මෙය දෙවැනි දිශාවයි.

තෙවැනි ප්‍රතිපදාව ද තෙවැනි ධ්‍යානය ද තෙවැනි සතිපට්ඨානය ද අරිය විහරණය ද තෙවැනි සම්‍යක් ප්‍රධානය ද තෙවැනි ආශ්චර්ය අද්භූත ධර්මය ද සත්‍යාධිෂ්ඨානය ද විරිය සමාධිය ද බොජ්ඣංග ද මුදිතා අප්‍රමාණය ද යන මෙය තෙවැනි දිශාවයි.

සිව්වැනි ප්‍රතිපදාව ද සිව්වැනි ධ්‍යානය ද සිව්වැනි සතිපට්ඨානය ද ආනෙඤ්ජ විහරණය ද සිව්වැනි සම්‍යක් ප්‍රධානය ද සිව්වැනි ආශ්චර්ය අද්භූත ධර්මය ද උපසමාධිෂ්ඨානය ද වීමංසා සමාධිය ද සබ්බ නිස්සග්ගය ද උපේක්ෂා අප්‍රමාණය ද යන මෙය සිව්වැනි දිශාවයි. මේ දිශා සතර පිළිබඳ යම් බැලීමක් වේ ද එය දිසාලෝචන නම් නය යැයි කියනු ලැබේ.

මේ එහි යෝජනයයි. ආහාර සූතර ද ප්‍රතිපදා සූතර ද විපර්යාස සූතර ද සතිපට්ඨාන සූතර ද උපාදාන සූතර ද ධ්‍යාන සූතර ද යෝග සූතර ද විහරණ සූතර ද ග්‍රන්ථ සූතර ද සම්මප්පධාන සූතර ද ආස්‍රව සූතර ද ආශ්චර්ය අද්භූත ධර්ම සූතර ද ඕඝ සූතර ද අධිෂ්ඨාන සූතර ද සල්ල සූතර ද සමාධි සූතර ද විඥාන ස්ථිති සූතර ද සුබභාගිය ධර්ම සූතර ද අගතිගමන සූතර ද අප්‍රමාණ සූතර ද වශයෙන් කුශල අකුශලයන්ගේ ප්‍රතිපක්ෂ ලෙසින් යෙදෙයි. මේ සීහවික්කීළිත න්‍යායයෙහි දිශාලෝචන නයයි.

එහි කෙළවර සූතර සාමඤ්ඤ ඵලයන් ය. එහිදී පළමු දිශාවේ අවසානය සෝවාන් ඵලයයි. දෙවැන්නේ සකෘදාගාමී ඵලයයි. තෙවැන්නේ අනාගාමී ඵලයයි. සිව්වැන්නේ අවසානය අර්හත් ඵලයයි.

එහි තිපුකඛල නය කවරේ ද? ප්‍රතිපදා විභාගයෙන් පුද්ගලයන් සූතරදෙනා අතුරෙන් යමෙක් බිප්පාභිඤ්ඤ (වහා අවබෝධය ලබන්න වූ) සුබ ප්‍රතිපදාවෙන් යේ ද මොහු උග්ඝටිතඤ්ඤ නම් වේ. යමෙක් දන්ධාභිඤ්ඤ (ලැසිව අවබෝධය ලබන්නා වූ) සුබ ප්‍රතිපදාවෙන් හෝ බිප්පාභිඤ්ඤ වූ දුක්ඛ ප්‍රතිපදාවෙන් යේ ද මොහු විපඤ්චිතඤ්ඤ නම් වේ. යමෙක් දන්ධාභිඤ්ඤ වූ දුක්ඛ ප්‍රතිපදාවෙන් යේ ද මොහු නෙය්‍ය නම් වේ. මෙසේ පුද්ගලයන් සූතරක් වී තුනක් වේ.

එහි උග්ඝටිතඤ්ඤ පුද්ගලයාට සමථය පෙරටුකොටගත් විදර්ශනාව සප්පාය වෙයි. නෙය්‍ය පුද්ගලයාට විදර්ශනාව පෙරටු කොටගත් සමථය සප්පාය වෙයි. විපඤ්චිතඤ්ඤ පුද්ගලයාට සමථ විදර්ශනා දෙක එකවිට වේ. උග්ඝටිතඤ්ඤ පුද්ගලයාට මෘදු දේශනාවක් වේ. නෙය්‍ය පුද්ගලයාට තියුණු දේශනාවක් වේ. විපඤ්චිතඤ්ඤ පුද්ගලයාට මෘදු තියුණු දේශනාවක් වේ. උග්ඝටිතඤ්ඤ පුද්ගලයාට අධිප්‍රඥා ශික්ෂාව වේ. විපඤ්චිතඤ්ඤ පුද්ගලයාට අධිචිත්ත ශික්ෂාව ද අධිප්‍රඥා ශික්ෂාව ද වේ. නෙය්‍ය පුද්ගලයාට අධිශීල ශික්ෂාව ද අධිචිත්ත ශික්ෂාව ද අධිප්‍රඥා ශික්ෂාව ද වේ. මෙසේ ප්‍රතිපදා සූතර කරණ කොටගෙන මේ පුද්ගලයන්ගේ ඉවත්ව යෑම වෙයි.

මේ එහි සංකිලේස පක්ෂයයි. අකුශල මූල තුනකි. ස්පර්ශ තුනකි. වේදනා තුනකි. උපවිචාර තුනකි. කිලේස තුනකි. අනුසය තුනකි. විතර්ක තුනකි. පරිළාහ තුනකි. සංඛත ලක්ෂණ තුනකි. දුක්ඛ ස්වභාව තුනකි.

ත්‍රිවිධ අකුශල මූල යනු ලෝභ අකුසල මූලය ද්වේෂ අකුසල මූලය මෝහ අකුසල මූලය යනුයි. ත්‍රිවිධ ස්පර්ශ යනු සුඛවේදනීය ස්පර්ශය, දුක්ඛවේදනීය ස්පර්ශය අදුක්ඛමසුඛ වේදනීය ස්පර්ශය යනුයි. ත්‍රිවිධ වේදනා යනු සුඛ වේදනාව දුක්ඛ වේදනාව අදුක්ඛමසුඛ වේදනාව යනුයි. ත්‍රිවිධ උපවිචාර යනු සෝමනස්සුපවිචාරය දෝමනස්සුපවිචාරය, උපෙක්ඛුප විචාරය යනුයි. ත්‍රිවිධ කිලේස යනු ලෝභය ද්වේෂය මෝහය යනුයි. ත්‍රිවිධ විතර්ක යනු කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය යනුයි. ත්‍රිවිධ පරිළාහ යනු රාගයෙන් හටගත් ද්වේෂයෙන් හටගත් මෝහයෙන් හටගත් දැවීම් ය. ත්‍රිවිධ සංඛත ලක්ෂණ යනු උප්පාද ඨිති වය යන තුනයි. ත්‍රිවිධ දුක්ඛතාවන් යනු දුක්ඛ දුක්ඛතා විපරිනාම දුක්ඛතා සංඛාර දුක්ඛතා යනුයි.

එහි ලෝභී අකුශල මූලය මනාප වූ අරමුණින් නැගී සිටියි. ඒ මනාප වූ අරමුණ නිසා සුඛ වේදනීය වූ ස්පර්ශය උපදී. සුඛවේදනීය ස්පර්ශය නිසා සුඛවේදනාව ඇතිවේ. සුඛ වේදනාව නිසා සෝමනස්සු පවිචාරය උපදී. සෝමනස්සුපවිචාරය නිසා රාගය ඇතිවේ. රාගය නිසා කාම විතර්කය ඇතිවේ. කාම විතර්කය නිසා රාගයෙන් හටගත් දැවීම ඇතිවේ. රාගයෙන් හටගත් දැවීම නිසා උප්පාද සංඛත ලක්ෂණය ඇතිවේ. උප්පාද සංඛත ලක්ෂණය නිසා විපරිණාම දුක්ඛතාව ඇතිවේ.

ද්වේෂ අකුසල මූලය අමනාප වූ අරමුණින් නැගී සිටියි. ඒ අමනාප වූ අරමුණ නිසා දුක්ඛවේදනීය වූ ස්පර්ශය උපදී. දුක්ඛවේදනීය ස්පර්ශය නිසා දුක්ඛ වේදනාව ඇති වේ. දුක්ඛ වේදනාව නිසා දෝමනස්සුපවිචාරය උපදී. දෝමනස්සුපවිචාරය නිසා ද්වේෂය ඇතිවේ. ද්වේෂය නිසා ව්‍යාපාද විතර්කය ඇති වේ. ව්‍යාපාද විතර්කය නිසා ද්වේෂයෙන් හටගත් දැවීම ඇතිවේ. ද්වේෂයෙන් හටගත් දැවීම නිසා පැවති දෙයෙහි වෙනස්වීමේ සංඛත ලක්ෂණය ඇතිවේ. පැවති දෙයෙහි වෙනස්වීමේ සංඛත ලක්ෂණය නිසා දුක්ඛදුක්ඛතාව ඇති වේ.

මෝහ අකුසල මූලය උපේක්ෂා, අරමුණෙන් නැගී සිටියි. ඒ උපේක්ෂා අරමුණ නිසා අදුක්ඛමසුඛවේදනීය ස්පර්ශය උපදී. අදුක්ඛමසුඛ වේදනීය ස්පර්ශය නිසා අදුක්ඛමසුඛ වේදනාව උපදී. අදුක්ඛමසුඛ වේදනාව නිසා උපෙක්ඛා උපවිචාරය ඇතිවේ. උපෙක්ඛා උපවිචාරය නිසා මෝහය ඇතිවේ. මෝහය නිසා විංසා විතර්කය ඇතිවේ. විහිංසා විතර්කය නිසා

මෝහයෙන් හටගත් දැවීම ඇතිවේ. මෝහයෙන් හටගත් දැවීම නිසා වය සංඛත ලක්ෂණය ඇතිවේ. වය සංඛත ලක්ෂණය නිසා සංඛාර දුක්ඛතාව ඇතිවේ. මේ ආකාර තුනකින් ක්ලේශයන්ගේ ඉදිරිපත් කිරීමකි. යම්කිසි අකුසල පක්ෂයක් වේ ද ඒ සියල්ල ත්‍රිවිධ අකුසල මූලයන්හි ඇතුළත් වේ.

එහි කුසල පක්ෂය කවරේ ද? අලෝභ අදෝස අමෝහ යන කුසලමූල තුනයි. සුතමයි චින්තාමයි භාවනාමයි යන ත්‍රිවිධ ප්‍රඥාවන් ය. විතර්ක විචාර සහිත සමාධිය, අවිතර්ක විචාර මාත්‍රයක් ඇති සමාධිය, අවිතර්ක අවිචාර ඇති සමාධිය යන සමාධි තුනයි. අධිශීල ශික්ෂාව අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාව යන ත්‍රිවිධ ශික්ෂාවන් ය. සමථ නිමිත්ත, පග්ගහ නිමිත්ත, උපෙක්ඛා නිමිත්ත යන නිමිති තුනයි. නෙක්ඛම්ම විතර්කය අව්‍යාපාද විතර්කය අවිහිංසා විතර්කය යන විතර්ක තුනයි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය යන ඉන්ද්‍රිය තුනයි. සෝමනස්සුපවිචාරය, දොමනස්සුපවිචාරය උපෙකඛුපවිචාරය යන ත්‍රිවිධ උපචාරයන් ය. කාමයන් සෙවීම, භවය සෙවීම, බ්‍රහ්ම චර්යය සෙවීම යන සෙවීම් තුනයි. සීලස්කන්ධය, සමාධි ස්කන්ධය, ප්‍රඥා ස්කන්ධය යන ස්කන්ධ තුනයි.

එහි අලෝභ කුසල මූලය සුතමය ප්‍රඥාව සම්පූර්ණ කරයි. සුතමය ප්‍රඥාව සපිරුණේ සවිතක්ක සවිචාර සමාධිය සම්පූර්ණ කරයි. සවිතක්ක සවිචාර සමාධිය සපිරුණේ අධිශීල ශික්ෂාව සම්පූර්ණ කරයි. අධිශීල ශික්ෂාව සපිරුණේ සමථ නිමිත්ත සම්පූර්ණ කරයි. සමථ නිමිත්ත සපිරුණේ නෙක්ඛම්ම විතර්කය සම්පූර්ණ කරයි. නෙක්ඛම්ම විතර්කය සපිරුණේ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය සම්පූර්ණ කරයි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය සපිරුණේ නෙක්ඛම්ම සිතුපවිචාරය සම්පූර්ණ කරයි. නෙක්ඛම්ම සිතුපවිචාරය සපිරුණේ කාමයන් සෙවීම ඉවත් කරයි. කාමයන් සෙවීම දුරුකිරීම සීලස්කන්ධය සම්පූර්ණ කරයි.

අදෝෂ කුසල මූලය චින්තාමය ප්‍රඥාව සම්පූර්ණ කරයි. චින්තාමය ප්‍රඥාව සපිරුණේ අවිතක්ක විචාර මාත්‍රයක් ඇති සමාධිය සම්පූර්ණ කරයි. අවිතක්ක විචාර මාත්‍රයක් ඇති සමාධිය සපිරුණේ අධිචිත්ත ශික්ෂාව සම්පූර්ණ කරයි. අධිචිත්ත ශික්ෂාව සපිරුණේ උපෙක්ඛා නිමිත්ත සම්පූර්ණ කරයි. උපෙක්ඛා නිමිත්ත සපිරුණේ අව්‍යාපාද විතර්කය සම්පූර්ණ කරයි. අව්‍යාපාද විතර්කය සපිරුණේ අඤ්ඤින්ද්‍රිය සම්පූර්ණ

කරයි. අඤ්ඤින්ද්‍රිය සපිරුණේ අව්‍යාපාද උපවිචාරය සම්පූර්ණ කරයි. අව්‍යාපාද උපවිචාරය සසපිරුණේ භවය සෙවීම අත්හරියි. භවය සෙවීම දුරුකිරීම සමාධිස්කන්ධය සම්පූර්ණ කරයි.

අමෝහ කුසල මූලය භාවනාමය ප්‍රඥාව සම්පූර්ණ කරයි. භාවනාමය ප්‍රඥාව සපිරුණේ අවිතක්ක අවිචාර සමාධිය සම්පූර්ණ කරයි. අවිතක්ක අවිචාර සමාධිය සපිරුණේ අධිප්‍රඥා ශික්ෂාව සම්පූර්ණ කරයි. අධිප්‍රඥා ශික්ෂාව සපිරුණේ පග්ගහ නිමිත්ත සම්පූර්ණ කරයි. පග්ගහ නිමිත්ත සපිරුණේ අවිහිංසා විතර්කය සම්පූර්ණ කරයි. අවිහිංසා විතර්කය සපිරුණේ අඤ්ඤතාවින්ද්‍රිය සම්පූර්ණ කරයි. අඤ්ඤතාවින්ද්‍රිය සපිරුණේ අවිහිංසූපවිචාරය සම්පූර්ණ කරයි. අවිහිංසූපවිචාරය සපිරුණේ බඹසර සෙවීම සපුරයි. බඹසර සෙවීම සපිරුණේ ප්‍රඥාස්කන්ධය සම්පූර්ණ කරයි.

මෙසේ අකුශල පාක්ෂික වූ ද කුශල පාක්ෂික වූ ද මේ කරුණු තුන තික නිර්දේශයන් කරණ කොටගෙන දක්වන ලද්දේ තිපුක්බල නයෙහි දිශා නම් වේ. එහි අවසානය අප්පණිහිත සුඤ්ඤත අනිමිත්ත යන ත්‍රිවිධ විමෝක්ෂයන් ය. මේ තිපුක්බල නම් දෙවැනි නයයි.

එහි උග්ඝටිතඤ්ඤ විපඤ්චිතඤ්ඤ නෙය්‍ය යන යම් මේ පුද්ගලයන් තිදෙනෙක් වේ ද මේ පුද්ගලයන් තිදෙනාගෙන් පුද්ගලයන් දෙදෙනෙක් බිප්පාභිඤ්ඤ වූ සුබ ප්‍රතිපදාවෙන් ද දන්ධාභිඤ්ඤ වූ සුබ ප්‍රතිපදාවෙන් ද යෙත්. පුද්ගලයෝ දෙදෙනෙක් බිප්පාභිඤ්ඤ වූ දුක්ඛ ප්‍රතිපදාවෙන් ද දන්ධාභිඤ්ඤ වූ දුක්ඛ ප්‍රතිපදාවෙන් ද යෙත්. (මෙසේ) මේ පුද්ගලයන් සතර දෙනෙකි. ඔවුහු විශේෂ වශයෙන් දිට්ඨිචරිත හා තණ්හාචරිත ලෙස දෙවැදෑරුම් වෙත්. මොවුහු සතර දෙනෙක් වී තිදෙනෙක් වෙත්. තිදෙනෙක් වී දෙදෙනෙක් වෙත්. මේ පුද්ගලයන් දෙදෙනාට මේ සංකිලේශය ද අවිද්‍යාව ද තණ්හාව ද අහිරිකය ද (ලජ්ජා නැති බව) අනොත්තප්පය ද (භය නැති බව) අසතිය ද අසම්පජන්‍යය ද නීවරණයන් ද සංයෝජනයන් ද අජ්ඣාසානය ද (බැස ගැනීම) අභිනිවේශය ද (ඇතුළත් වීම) අහංකාරය ද මමංකාරය ද අශ්‍රද්ධාව ද දුර්වච බව ද කම්මැලිකම ද අයෝනිසො මනසිකාරය ද විචිකිච්ඡාව ද අවිද්‍යාව ද අසද්ධර්ම ශ්‍රවණය ද අසමාපත්තිය ද වෙයි.

එහි අවිද්‍යාව ද අහිරිකය ද අසතිය ද නීවරණයන් ද අජ්ඣාසානය ද

අහංකාරය ද අශ්‍රද්ධාව ද කම්මැලිකම ද විචිකිච්ඡාව ද අසද්ධර්මශ්‍රවණය ද යන මෙය එක් දිශාවකි. තණ්හාව ද අනොත්තප්පය ද අසම්ප්‍රජන්‍යය ද සංයෝජනයන් ද අභිනිවේශය ද මමංකාරය ද දුර්වච බව ද අයෝනිසෝ මනසිකාරය ද, අවිද්‍යාව ද අසමාපත්තිය ද යන මෙය දෙවැනි දිශාවයි. දුක දහයෙන් පළමු කළයුතු පද දහය සංක්ෂිප්තව අර්ථය හඟවයි. ප්‍රතිපක්ෂ වූ තණ්හා පක්ෂයේ දුක දහයෙන් දෙවැනි පද දහය වේ. මේ දෙවැනි දිශාවයි.

එහි කුශල පක්ෂය කවරේ ද? සමථයද විදර්ශනාව ද විද්‍යාව ද චරණය ද සතිය ද සම්ප්‍රජන්‍යය ද හිරිය ද ඔත්තප්පය ද අහංකාරය දුරුකිරීම ද මමංකාරය දුරුකිරීම ද සම්මා වායාමය ද යෝනිසෝ මනසිකාරය ද සම්මා සතිය ද සම්මා සමාධිය ද ප්‍රඥාව ද නිබ්බිදාව ද සමාපත්තිය ද සද්ධර්ම ශ්‍රවණය ද සොම්නස ද ධර්මානුධර්ම ප්‍රතිපත්තිය ද යනුයි. දුක දහයෙන් සමථ ආදී වූ සොම්නස කෙළවර කළ පළමු පද දහය පළමු දිශාවයි. විදර්ශනා ආදී ධර්මානුධර්ම ප්‍රතිපත්ති කෙළවර කළ දෙවැනි පද දහය දෙවැනි දිශාවයි.

මෙසේ කුසල පක්ෂයේ හා අකුසල පක්ෂයේ වූ නන්දියාවට්ට නයෙහි දිශා සතරකි. ඒවායින් කුසල පක්ෂයෙහි සමථාදියෙන් අකුසල පක්ෂයේ තණ්හාදිය ද ප්‍රහාණයට යෙයි. ඒවායේ ප්‍රහාණයෙන් රාගයෙන් තොරවීමෙන් චේතෝවිමුත්තිය වේ. කුසල පක්ෂයේ විදර්ශනා ආදියෙන් අකුසල පක්ෂයේ අවිද්‍යාදිය ප්‍රහාණ වේ. ඒවා ප්‍රහාණ වීමෙන් අවිද්‍යා විරාගයෙන් යුත් ප්‍රඥා විමුක්තිය වේ. මෙසේ මේ විමුක්ති දෙක නන්දියාවට්ට නයෙහි අවසානය වේ.

එහි තණ්හාව, අවිද්‍යාව, සමථය, විදර්ශනාව යනුවෙන් පද සතරකි. ඒවායින් අටළොස් මූල පද එක්රැස් වේ. (එක්ව හැසිරේ) කෙසේ ද? සමථය ද අලෝභය ද අදෝෂය ද අසුභ සංඥාව ද දුක්ඛ සංඥාව ද යන මේ පද පස සමථය ඇසුරු කෙරෙයි. විදර්ශනාව ද අමෝහයද අනිත්‍ය සංඥාව ද අනාත්ම සංඥාව ද යන මේ පද සතර විදර්ශනාව ඇසුරු කෙරෙයි. මෙසේ කුසලපද නවය පද දෙකෙහි ඒකරාශී වේ. තණ්හාව ද ලෝභය ද ද්වේෂය ද සුභ සංඥාවද සුඛ සංඥාවද යන මේ පද පස තණ්හාව ඇසුරු කෙරෙයි. අවිද්‍යාව ද මෝහය ද නිත්‍ය සංඥාව ද ආත්ම සංඥාව ද යන මේ පද සතර අවිද්‍යාව ඇසුරු කෙරෙයි. මෙසේ

අකුසල පද නවයක් පද දෙකෙහි මෙසේ තිපුක්බල නයත් සීහවික්කීළිත නයත් නන්දියාවට්ට නයට ඇතුළත් වෙයි.

ඉතිරි න්‍යාය දෙක තිපුක්බල නයෙහි කෙසේ ඇතුළත් වෙයිද? විදර්ශනාව ද අමෝහය ද අනිත්‍ය සංඥාව ද අනාත්ම සංඥාව ද යන **මේ පද සතර අ**මෝහයයි. සමථයද අලෝභය ද අසුභ සංඥාව ද දුක්ඛ **සංඥාව ද යන** මේ පද සතර අලෝභයයි. අදෝෂය අදෝෂය මැයි. **මෙසේ කු**සල පද නවයක් පද තුනෙක ඒකරාශී වේ. තණ්හාව ද ලෝභය ද සුභ සංඥාව ද සුඛ සංඥාව ද යන මේ පදසතර ලෝභයයි. අවිද්‍යාව ද මෝහය ද නිත්‍ය සංඥාව ද ආත්ම සංඥාව ද යන මේ පද සතර මෝහයයි. ද්වේෂය ද්වේෂයමැයි. මෙසේ අකුසල පද නවයක් පද තුනක ඒකරාශී වේ. මෙසේ ඉතිරි න්‍යාය දෙක තිපුක්බල නයෙහි ඇතුළත් වේ.

අටළොස් මූලපදයන් සතර පදයන්හි කෙසේ ඒකරාශී වේ. තණ්හාව ද සුභ සංඥාවද යන මෙය පළමු විපර්යාසයයි. ලෝභයද සුඛ සංඥාව ද යන මෙය දෙවන විපර්යාසයයි. අවිද්‍යාව ද නිත්‍ය සංඥාව ද යන මෙය තෙවැනි විපර්යාසයයි. මෝහය ද ආත්ම සංඥාව ද යන මෙය සිව්වැනි විපර්යාසයයි. මෙසේ අකුසල පද නවයක් පද සතරක ඒකරාශී වේ. සමථයද අසුභ සංඥාවද පළමු සතිපට්ඨානයයි. අලෝභයද දුක්ඛ සංඥාව ද දෙවැනි සතිපට්ඨානයයි. විදර්ශනාව ද අනිත්‍ය සංඥාව ද තෙවැනි සතිපට්ඨානයයි. අමෝහය ද අනාත්ම සංඥාව ද සිව්වැනි සතිපට්ඨානයයි. මෙසේ කුසල පද නවයක් පද සතරක ඒකරාශී වෙයි. මෙසේ ඉතිරි නය දෙක සීහවික්කීළිත නයෙහි ඇතුළත් වේ.

ත්‍රිවිධ න්‍යායයන්ගේ යම් ගෝචර භූමියක් වේ ද එය එක් එක් නයට ඇතුළත්ය. එහෙයින් එක් එක් නයෙහි අකුසල ධර්මයෙහි හෝ දැනගත්තා වූ කුසලයෙහි හෝ ප්‍රතිපක්ෂය සෙවිය යුතුය. විරුද්ධ දෙය සොයා ඒ නය දැක්විය යුතුය. එම න්‍යාය දැක්වූ කල්හි යම් සේ එක් න්‍යායයෙක්හි ඉතිරි න්‍යායන් පිළිබඳ මූලපදයන් ඇතුළත් වූයේ වෙයි. එයින් (ඒ එක එකින්) බැහැරකොට දැක්විය යුතුය. එක් එක් නයක අටළොස් මූල පද ඇතුළත් වූයේ වේ. එහි එක් එක් කරුණ දත්කල්හි සියලු කරුණු දත්තේ වේ.

මේ නය තුනෙන් සීහ වික්කීළිත නයෙහි අවසානය ඵල සතරයි.

පළමු දිශාවෙහි (අවසානය) පළමු ඵලයයි. දෙවැනි දිශාවෙහි (අවසානය) දෙවැනි ඵලයයි. තෙවැනි දිශාවෙහි (අවසානය) තෙවැනි ඵලයයි. සිව්වැනි දිශාවෙහි අවසානය සිව්වැනි ඵලයයි. තිපුක්බල නයෙහි අවසානය ත්‍රිවිධ විමෝක්ෂයන් ය. පළමු දිශාවෙහි (අවසානය) අප්පණිහිත විමෝක්ෂයයි. දෙවැනි දිශාවෙහි (අවසානය) සුඤ්ඤත විමෝක්ෂයයි. තෙවැනි දිශාවෙහි අවසානය අනිමිත්ත විමෝක්ෂයයි. නන්දියාවට්ට නයෙහි අවසාන විමුක්ති දෙකයි. පළමු දිශාවෙහි (අවසානය) තණ්හා විරාගයෙන් වූ චේතෝ විමුක්තියයි. දෙවැනි දිශාවෙහි (අවසානය) අවිද්‍යා රාගයෙන් වූ ප්‍රඥා විමුක්තියයි. මේ ත්‍රිවිධ න්‍යායන්ගෙන් අටළොස් පද පිළිබඳ යම් ආලෝචනයක් වේ ද එය දිශාලෝචන නයයි. කුසල පක්ෂයෙහි ද අකුසල පක්ෂයෙහි ද යම් න්‍යායක් සලකා බලා මේ ධර්මය, මේ ධර්මය ඇසුරු කෙරේ යයි දන්නා තැනැත්තා විසින් මනා යෙදීමක් කෙරෙයි ද මෙය අංකුස නය නම් වේ. (මෙසේ) මේ නය පසකි.

නය සමුට්ඨාන වර්ණනාව නිමි.

22.

මෙසේ සර්වප්‍රකාරයෙන් නය සමුට්ඨානය බෙදා දක්වා දැන් සාසන පට්ඨානය බෙදා දක්වන්නේ යම්හෙයකින් සංග්‍රහ වාර ආදියේ දී මූල පදයන්ගෙන් ම පට්ඨානය සංග්‍රහ කොට ස්වරූප වශයෙන් නොදක්වන ලද ද එහෙයින් යම්සේ මූලපදයන්ගෙන් පට්ඨානය වෙන්කළ යුතු ද මෙසේ පට්ඨානයෙන් ද මූලපදයන් වෙන්කළ යුතුයයි දැක්වීම පිණිස අට්ඨාරස මූලපදා කුසිං දිට්ඨබ්බා, සාසන පට්ඨානෙ යි කියන ලදී. මූලපද සාසන පට්ඨානයන්ගේ අන්‍යෝන්‍ය සංග්‍රහය පූර්වයෙහි දක්වන ලද්දේ ම ය.

ඉක්බිති සාසන පට්ඨානං යනු කවර වචනාර්ථයක් ද? සාසනයාගේ පිහිටීම සාසන පට්ඨාන නම්. සාසන යනු දේශනාවයි. ඒ හික්මවිය යුතු පුද්ගලයන්ගේ අදහස්වලට අනුරූප වූ ඔවුන්ට හිතසුව ඇතිකරවනු පිණිස ඒ ඒ ආකාරවලින් තැනක් තිබීම සාසන පට්ඨානයයි. මෙහිදී වනාහි එහි එබඳු ස්වරූපය ඉදිරිපත් කිරීම සාසන පට්ඨානය යැයි දතයුතුය. එසේ

නැතහොත් සාසන යනු අධිශීක්ෂා ආදියයි. ඒවායේ පැවැත්මට උපාය බැවින් 'මේවා කරණකොටගෙන පිහිටන්නේය' යන අර්ථයෙන් පට්ඨාන නම් වේ. එනම් සංකිලේස ධර්මයෝ ය. ඒවා ප්‍රකාශකරන බැවින් ඊට උපචාර ලෙසින් සූත්‍රයන් ද පට්ඨාන නම් වේ. ඒවා සමූහ ලෙසින් ගෙන මේ ප්‍රකරණ ප්‍රදේශය පට්ඨාන නම් වේ.

වෙනත් ක්‍රමයක් ද වේ. කවර අර්ථයකින් පට්ඨාන නම් වේ ද? පිහිටීම් අර්ථයෙනි. ගමනාර්ථයෙන් යන අර්ථයයි. 'යෙ තෙ ගොට්ඨා පට්ඨිතගාවෝ' යනුවෙන් පැමිණි තන්හි යම් පට්ඨානයකින් ඒ ගවගාලවල් පට්ඨිතගාවොයි කියන ලද ද එය අර්ථ වශයෙන් යාම නම් වේ. මෙසේ වැඩි විස්තර නැති ක්‍රම ඇති හාර නයවල ඇලීම් නැති දේශනා ඥානයේ සංකිලෙස භාගිය ආදී ලෞකික භේදයන්හි ද ඒ දෙකෙන් මිශ්‍ර වූ භේදයන්හි ද විස්තර කරන ලද ක්‍රම ලැබීමෙන් නොඇලීම් වශයෙන් පවතින ගමන් ඇති බැවින් ඒ සංකිලෙස භාගිය ආදියද ලෞකිකාදිය ද වෙන වෙනම මිශ්‍රව අධිකරණ වශයෙන් පට්ඨාන නම් වේ. ඒවා ප්‍රකාශ කරන බැවින් මේ ප්‍රකරණ ප්‍රදේශය පට්ඨානයැයි දතයුතුය.

සංකිලෙසභාගියං යනාදියෙහි මෙය කරණ කොටගෙන කෙලෙස්නුයි සංකිලෙස නම් වේ. සංකිලේස භාගයේ සංකිලෙස කොටස් පවතිනුයේ **සංකිලෙස භාගිය** නම් වේ. වාසනාව පිනේ වැඩීමයි. වාසනා භාගයෙහි පැවතියේ වාසනාභාගිය නම් වේ. වාසනාව ඇසුරු කරවා නුයි **වාසනා භාගිය** නම් වේ. ලෝභ සමූහය ආදියේ බිඳීම, පැලීම නිබ්බේධ නම්. නිබ්බේධ භාගයෙහි පැවතියේ හෝ නිබ්බේධය ඇසුරු කරවූයේ **නිබ්බේධභාගිය** නම් වේ. නිමා වූ ශික්ෂා ධර්මය අසෙකඛ නම්. අසේඛ භාගයෙහි පැවතියේ හෝ අසේඛය ඇසුරු කරවූයේ **අසේඛභාගිය** නම් වේ.

ඒවා අතුරෙන් යම්තැනක තණ්හා ආදි සංකිලේසයන් බෙදන ලද්දේ ද එය සංකිලෙස භාගිය වේ. යම්තැනක දාන ආදි පින් කිරියවත් බෙදා දක්වන ලද ද එය වාසනාභාගිය වේ. යම්තැනක අශෛක්ෂ වූ සීල ස්කන්ධ ආදිය බෙදා දක්වන ලදද එය අසෙකඛභාගිය නම් වේ. ඉතිරි ඒවා ඒවායේ මිශ්‍ර ක්‍රමය ලෙසින් කියන ලදී. ඒවා වනාහි දුක සය තික තුන චතුක්ක එක අන්‍ය වූ චතුෂ්ක එක යන දොළසක් වේ. ඒවායින් දුක සතර ද තික දෙක ද දක්වන ලදී. අනෙක්වා නොදක්වන ලදී. නොදැක්වීමෙහි හේතුවක් නැ. මේ ක්‍රමයෙන් ඒවා ද ගන්නට හැකියයි.

පෙළෙහි සංක්ෂෙප කරන ලදැයි දතයුතුය. එසේම **ඉමානි චතතාරි සුතතානි සාධාරණානි කතානි අටඨ භවනති** යනාදිය කියන ලදී. එහිදී යම්හෙයකින් කිසියම් සූත්‍රයකදී තණ්හා සංකිලේශයම දක්වනු ලැබේ ද කිසියම් එකකදී දෘෂ්ටි සංකිලේසය ම (දක්වනු ලැබේ) කිසියම් එකකදී දුශ්චරිත සංකිලෙසය ම දක්වනු ලැබේ ද, එහෙයින් සංකිලෙස භාගිය සූත්‍රය තෙපරිදිව බෙදා **තණහා සංකිලෙස භාගියං සුතතං** යනාදියෙන් දක්වන ලදී. එසේම සංකිලේසය ඇතිකල්හි වොදානය වේයැයි වොදාන භාගිය සූත්‍රය සංකිලෙස විභාගයෙන් තෙපරිදිව දක්වන ලදී. **තණහා වොදාන භාගියං සුතතං** යනාදියෙනි. එය වනාහි අර්ථ වශයෙන් වාසනා භාගිය ආදිය ම වේ. මේ ක්‍රමය කිසි පොතක නැත. **තසඨ සංකිලෙසො තිවිධො** යනාදිය සංකිලේසයට විරුද්ධ හෙයින් සමාදිය වෙන්කිරීම් වශයෙන් වාසනා භාගිය ආදී සූත්‍රයන්ගේ විෂය දැක්වීම පිණිස අරඹන ලදී.

එහි **යදි ආසතති උපපජජති භවෙසු** යනු භවයන්හි ඡන්දරාගය අත්හරින්නට නොහැකි පුද්ගලයාට ඉදින් භව ප්‍රාර්ථනාව උපදී ද එයයි. එවං සායං යනු මෙසේ ඒ පුද්ගලයාට මේ සමථ විදර්ශනාව භාවනාමය පින්කිරියවතක් වේ යනුයි. පුනර්භව ඵලය උපදවන බැවිනි. **තනෑපපතතියා සංවතතති** යනු ඒ ඒ භවයෙහි උපදිනු පිණිස පවතී යනුයි. **ඉමානි චතතාරි සුතතානි** යනු මේ සංකිලේසභාගිය ආදි සූත්‍ර සතරයි. **සාධාරණානි කතානි** යනු සංකිලෙස භාගිය, සංකිලෙසභාගිය හා නිබ්බෙධභාගිය, සංකිලෙසභාගිය හා අසෙකඛභාගිය, වාසනාභාගිය හා නිබ්බෙධභාගිය යන මේ පදාන්තර සංයෝග වශයෙන් මිශ්‍රකරන ලද යනුයි. **අටඨ භවනති** යනු පෙර සතර ද, මේ සතර ද වශයෙන් අටක් වේ යනුයි. **තානියෙව අටඨ සුතතානි සාධාරණානි කතානි සොළස භවනති** යනු ඒ මුලින් කියන ලද සූත්‍ර අටමය. වාසනා භාගිය අසෙකඛ භාගිය ද නිබ්බෙධ භාගිය ද, අසෙක්ඛ භාගිය ද සංකිලෙස භාගිය ද වාසනා භාගිය ද, නිබ්බෙධ භාගිය ද සංකිලෙස භාගිය ද නිබ්බෙධ භාගිය ද, අසෙක්ඛ භාගිය ද සංකිලෙස භාගිය ද වාසනා භාගිය ද, නිබ්බෙධ භාගිය ද අසෙක්ඛ භාගිය ද සංකිලෙස භාගියද නොවූ ද, වාසනාභාගිය නොවූ ද නිබ්බෙධ භාගිය නොවූ ද අසෙක්ඛභාගිය නොවූද වශයෙන් මෙලෙස සාධාරණය කරන ලද පළමු සූත්‍ර අට ද මේ අට ද යනුවෙන් සොළසක් වේ. ඒවායින් ඒකක සතරක් ද්‍රුක හයක් තික හතරක් එක් චතුෂ්කයක් අන්‍ය වූ තවත් එක් චතුෂ්කයක් යන මේ විභාගය දතයුතුය. එහි ද ද්‍රුක දෙකක් තික දෙකක් චතුක්ක දෙකක් පෙළෙහි නොපැමිණි බව දතයුතුය.

දැන් මේ පට්ඨානයට සියලු ශාසනය සංග්‍රහ කරන ලද බව දක්වන්නට **ඉමෙහි සොළසෙහි සුතෙතහි හිතෙනහි නවවිධං සුතතං හිතනං භවති** යි කියන ලදී. එහි අර්ථය, මේ සංකිලෙසභාගිය ආදී සූත්‍ර දහසය පට්ඨාන නය කරණ කොටගෙන බෙදුවිට සුත්ත ගෙය්‍ය ආදී නවවිධ පර්යාප්ති සාසන සංඛ්‍යාත සූත්‍රය බිඳුණේය. සොළොස් වැදෑරුම්ව බෙදන ලද්දේ වෙයි. මේ සොළොස් වැදෑරුම් පට්ඨානයෙන් සංගෘහිත නොවූ පර්යාප්ති ශාසන කොටසක් නැත යන අදහසයි. කෙසේ වනාහි සංකිලෙස භාගියාදි ස්වභාවය ගතයුතු ද? **ගාථාය වා ගාථා අනුමිනිතබබා** යනාදිය කියන ලදී. එහි **ගාථාය වා ගාථා අනුමිනිතබබා** යනු මේ ගාථාව මෙන් (අදාළ) ගාථාව සංකිලෙස භාගිය හෝ වේ ද වාසනාභාගිය හෝ වේ ද නිබ්බෙධභාගිය හෝ වේ ද අසෙක්ඛභාගිය හෝ වේ දැයි අනුමාන කළයුතුය. අනුව අනුව මැන බලා තර්කකොට දතයුතුය යන අර්ථයයි. සෙසු පදවල ද මේ ක්‍රමය මැයි. මෙහිදී ද වෙය්‍යාකරණයෙන් තොර වූ සියලු ගාථා පර්යාප්ති සූත්‍රයෙන් යන පදයෙන් සංග්‍රහ කරන ලදැයි දතයුතුය.

දැන් මුලින් දක්වන ලද සංකිලෙසභාගිය ආදී සූත්‍රයන් උදාහරණ වශයෙන් දක්වන්නට **තත්‍ථ කතමං සංකිලෙස භාගියං සුතතං** යනාදිය අරඹන ලදී. එහි **කාමන්ධා ජාලසඤ්ඡනනා** යන ගාථාවේ අර්ථය මුලින් කියන ලද ම ය. මේ ගාථාවට යම්සේ ද මින් මතු ඒවාට ද එසේම ය. මුලින් කියන ලද අර්ථ ඇති ප්‍රකට පදයන්ගේ අර්ථය වර්ණනා නොකරන්නෙමු.

අගති ගමණානි යනු කාය ආදියෙන් නොයා යුතු යනුයි. නොකළ යුතු කරුණු යන අර්ථයයි. **ඡන්දා** යනු ඡන්ද හේතුවෙන්, කැමති ප්‍රත්‍යයෙන් යනුයි. **අගතිං ගවජති** යනු නොයා යුතු ගතියට යෙයි. නොකළ යුතු දේ කරයි යන අර්ථයයි. **ධම්මං** යනු යහපත් වූ ආර්යයන්ගේ ධර්මයයි. **අතිවතතති** යනු මැඩලා ඉක්මවයි යනුයි. **නිහීයති** යනු පිරිහේ යනුයි. **යසො** යනු කීර්තිය හා හා පිරිවරයි.

මනොපුබබංගමා යන ගාථාවෙහි මනො යනු ඉදින් කාමාවචර කුසල ආදී භේදය ද සියලු චතුභූමික සිත ද මනස වේ යනුයි. මෙතැන වනාහි මුල් ජාතියෙහි වෙදෙකු වූ චක්ඛුපාල තෙරුන් තුළ ඉපදීම් වශයෙන් නියමිත වූ පටිඝ සම්ප්‍රයුක්ත සිත ම ලබයි. ඒ මනස මොවුන්ට පෙරටු

වේයැයි **මනො පුබබංගමා** නම් වේ. පළමුව යන මනසින් යුක්ත වූ යන අර්ථයයි. **ධම්මා** යන්නෙහි ආත්ම රහිත ජීව රහිත යන අර්ථයෙන් ධම්මා නම් වේ. ඒවානම් වේදනාදි ත්‍රිවිධ අරූපී ස්කන්ධයන් ය. මේවා මනෝ පූර්වංගම වෙති. කෙසේ නම් මේවා සමග එක් වස්තුවක එක් අරමුණක එක ක්‍ෂණයක උපදින මනස පූර්වංගම නම් වේ යනුයි. උත්පාද ප්‍රත්‍ය අර්ථයෙනි. යම්සේ බොහෝ දෙනා එක්ව ගම් නැසීම් ආදී කාර්යයන් කරනවිට කවරෙක් ඔවුන්ට පෙරටු වේ ද?යි කී කල්හි යමක් ඒවායේ ප්‍රත්‍ය වේ ද, යමක් යමක් ඇසුරුකොට ඔවුහු ඒ කටයුතු කරත් ද ඒ දත්ත හෝ චිත්ත හෝ ඒවාට පෙරටු වෙයි යයි කියනු ලැබේ. මෙසේ මේ සම්පත්තිය දතයුතුය. මෙසේ උත්පාද ප්‍රත්‍යාර්ථයෙන් මනස මේවාට පෙරටු වේනුයි මනෝ පුබ්බංගමා නම්. මනස නූපදනා කල්හි මනස උපදීමය. අධිපති වශයෙන් මනස මේවාට ප්‍රධාන වේ නුයි **මනොසෙට්ඨා** නම් වේ. යම්සේ සොරු ආදීන්ට සොර දෙවු ආදීහු ශ්‍රේෂ්ඨ අධිපතියෝ වෙත් ද එසේ ඒවාතුරෙන් මනස ශ්‍රේෂ්ඨ ය. යම්සේ දැව ආදියෙන් නිපන් භාණ්ඩ දාරුමය නම් වේද එසේ මේවා ද මනසින් නිපන් බැවින් **මනොමය** නම් වේ. **පදුට්ඨෙන** යනු අභිධ්‍යා ආදී දෝෂයන්ගෙන් නරක් වූ දූෂිත වූ යනුයි. **භාසති වා කරොති වා** යනු හෙතෙම කියනුයේ චතුර්විධ වාග් දුශ්චරිතය ම කියයි. කරනුයේ ත්‍රිවිධ කාය දුශ්චරිතය ම කරයි. නොකියනුයේ නොකරනුයේ ඒ අභිධ්‍යාදියෙන් දූෂිත වූ සිත් ඇති බැවින් ත්‍රිවිධ මනෝ දුශ්චරිතය පුරයි. මෙසේ ඔහුගේ දස අකුසල කර්මපථ පරිපූර්ණත්වයට යයි. **තතො නං දුක්ඛ මන්වෙති** යනු ඒ ත්‍රිවිධ දුශ්චරිතයෙන් පසු ඒ පුද්ගලයා දුක අනුව යයි. දුශ්චරිතානුභාවයෙන් සතර අපායයන්හි දුක අනුව යයි. කුමක් මෙන් ද? **චක්කංව වහතො පදං** යනු යම්සේ ගැළ උසුලන ගොනු පියවරක් තබමින් රියසක අනුව යයි. මෙසේ ඒ පුද්ගලයා දුක අනුව යයි.

මිද්ධී යදා හොති යන ගාථාවේ **මිද්ධී** යනු ථීනමිද්ධයෙන් මඩනා ලද යනුයි. **මහඝසසො** යනු මහා භෝජනයයි. ආහාරපථක, අලංසාටක, තනුවට්ටක, කාකමාසක, භුත්තවමිකත යන පුද්ගලයන් අතුරෙන් එක් අයෙකු මෙනි. **නිද්දායිතා** යනු ස්වප්නශීලී යනුයි. **සම්පරිවත්තසායී** යනු සයන සුඛ පහස් සුඛයන්හි යෙදීම් වශයෙන් පෙරලෙනසුලු, නිදනසුලු යනුයි. **නිවාප පුට්ඨෝ** යනු ධාන්‍ය කැබලි ආදී හූරු බතින් විමසන ලද යනුයි. ගෘහ සූකරයා වනාහි බාල කල පටන් පෝෂණය කරනු ලබන්න් මහා සිරුරක් ඇතිවිට ගෙයින් පිටතට නික්මෙන්නට නොලබන්නේ

ඇඳන් යට ආදියෙහි පෙරලි පෙරලි හුස්ම ගනිමින් පිට කරමින් නිදන්නේ ම ය. මෙය කියන ලද්දේ වෙයි. යම්විටෙක පුරුෂයා කම්මැලි වේ ද, මහා භෝජන ඇත්තේ වේ ද, භූරු බතින් අමතන ලද මහා ඌරෙකු මෙන් වෙනත් ඉරියව්වකින් යැපෙන්නට නො හැක්කේ නිදනසුලු වූයේ ද එවිට අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂනයන් **සිහි කරන්නට** නොහැකි වෙයි. ඒවා සිහි නොකිරීමෙන් මඤ්ඤාඥයා නැවත නැවත ගැබට පැමිණෙයි. ගර්භ වාසයෙන් නොමිදෙයි.

අයසාව මලං යන ගාථාවෙහි **අයසා** යනු යකඩින් ය. **සමුට්ඨිතං** යනු හටගත් යනුයි. **තතුට්ඨාය** යනු එයින් නැගිට යනුයි. **අතිධොන චාරිනං** යන්නෙහි ප්‍රත්‍ය සතර ධොන යැයි කියනු ලැබේ. මෙය ඇති බැවින් එයින් පලක් නැතැයි ප්‍රත්‍යවේක්ෂා කොට පරිභෝග කරන ප්‍රඥාවයි. එය ඉක්මවා හැසිරෙන්නේ අතිධොනචාරී නම් වේ. මෙය කියන ලද්දේ වෙයි. යම්සේ යකඩින් මළ හටගෙන යම් තැනකින් එය හටගත්තේ ද එයම කයි. විනාස කරයි. මෙසේ ප්‍රත්‍ය සතර ප්‍රත්‍යවේක්ෂා නොකර පරිභෝග කරන්නා අතිධොනචාරී නම්. **සානි කම්මානි** යනු තම සිතෙහි පහළ වූ බැවින් තමා සතු වූ ඒ කර්ම දුගතියට පමුණුවත් යනුයි.

චොරෝ යථා යන ගාථාවෙහි චොරෝ යථා සන්ධිමුඛෙ ගහීතෝ යනු යම්සේ සොරෙක් ගෘහසන්ධිය බිඳ ගෙට පිවිසෙනුයේ ගෘහ සන්ධි මුවෙහිදී ම රාජ පුරුෂයන් විසින් ගන්නා ලද්දේ ද එසේය යනුයි. **සකම්මුනා හඤ්ඤති බජ්ඣතෙ ච** යනු ඒ තමා කළ කර්මයෙන් කසයෙන් තැලීම් ආදියෙන් නසන්නා සේ ම දම්වැල්වලින් බැඳීම් ආදියෙන් බඳිනු ලැබේ. **එවමයං පෙචචපජා පරත්‍ථ** යනු මේ පාපකාරී ප්‍රජාව මෙසේ ද මෙයින් චුතව පරලොවෙහි යනුයි. **සකම්මුනා හඤ්ඤති බජ්ඣති ච** යනු තමා විසින්ම කරන ලද පාප කර්මයෙන් නිරය ආදියෙහි නානාප්‍රකාර කටයුතු කිරීම් ආදියෙන් හිංසාවේ එසේම බැඳේ යනුයි.

සුඛකාමානි යන ගාථාවෙහි **යො දණ්ඩෙන විහිංසති** යනු යම් පුද්ගලයෙක් දණ්ඩකින් හෝ කැට ආදියෙන් හෝ පෙළයි යනුයි. **පෙචච සො න ලභෙ සුඛං** යනු ඒ පුද්ගලයා පරලොව මනුෂ්‍ය සැපතක් හෝ දෙව් සැපතක් හෝ නොලබයි. නිවන් සැපයෙහි පැවැත්මක් නැත්මය.

ගුනනඤ්ඤව තරමානානං යනු සැඩපහර තරණය කරන ගව දෙනුන්ගෙන් ය. **ජිමහං ගච්ඡති පුංගවො** යනු ඉදින් ප්‍රධාන වෘෂභයා වක්ව යේ ද එයයි. **සබබා තෙ ජිමහං ගච්ඡනති** යනු ඒ සියලු ගව දෙන්නු වක්ව යෙත් යනුයි. කවර හෙයින් ද? **නෙතෙන ජිමහගතෙසති** යනු නායක ගවයා වක්ව ගිය හෙයින් යනුයි. නායකයා ඇඳට ගිය හෙයින් යන අර්ථයයි. ඔහු වනාහි ඒ ගව දෙනුන්ගේ විශ්වාසවන්තයා ද උවදුරු නසන්නා ද වේ. එවමෙවං යනු, ගාථාවෙහි යම්සේ මෙය වේ ද එසේ යමෙක් මිනිසුන් අතර ප්‍රධානියා සේ සම්මත ද එයයි. ඉදින් හෙතෙම අධර්මචාරී වේ ද, ඔහුගේ සියලු අනුජීවිහු ද අධාර්මිකයෝ වෙත්. ස්වාමි සම්පදාව ප්‍රකෘති සම්පදාව සම්පාදනය කෙරේ. යම්හෙයකින් එයම වේ ද එහෙයින් ඉදින් රජු අධාර්මික වේ නම් සියලු රට දුකසේ සයනය කෙරේ යැයි කියන ලදී.

සුකිච්ඡරූපා වත යනු ඒකාන්තයෙන් අධික දුකට පැමිණි ස්වරූප ඇති යනුයි. **උපධිසු** යනු කාමගුණ උපධීන්හි ය. **රතතා** යනු රාගයෙන් මැඩුණාහු යනුයි. **කටුකං** යනු කුකුස් ඇති කිරිමෙන් ම දුක් සහගත යනුයි. පතුයේ මුවවිට හටගැනීම සිදින ලද බැවින් ඇතිවන ගෙඩි හටගැනීම කෙසෙල් ගසේ විනාශය පිණිස වේ යැයි **එලං වෙ කදලං හනති** යි කියන ලදී. එසේම ඵලය කෙළවරකොට ඇති බැවින් ඕසධීන්ට (ගෙඩි හටගැනීමෙන් මැරෙන ගස්වලට) ඵලං වෙළුං ඵලං නළං යි කියන ලදී. කොටළුවෙකු නිසා වෙළඹකගේ කුසේ උපන්නිය අශ්වතරී නම් වේ. ඇය ගැබ්ගෙන සුදුසුකල් පැමිණි කල්හි වදන්නට නොහැකි වෙයි. පාවලින් බිම පහරමින් සිටින්නීය. ඉක්බිති ඇගේ පා සතර කණු සතරක බැඳ කුස පලා පැටවා බැහැරට ගන්නේය. ඇය එතැන ම මැරෙන්නීය. එහෙයින් **ගබ්භා අසසතරිං යථා** යි කියන ලදී. යම්සේ සිය ඵලය නිසා කෙසෙල්, උණ බට විනාශ වේ ද ගැබ නිසා අශ්වතරිය විනාශ වේ ද මෙසේ තමාගේ කර්මඵලය වූ සත්කාරය අසත්පුරුෂයා විනාශ කරයි යන මෙය කියන ලද්දේ වෙයි.

කොධමකඛගරු යනු කිපීම් ලක්ෂණ ඇති ක්‍රෝධය ද අනුන්ගේ ගුණ මකන ලක්ෂණ ඇති මකු බව ද ගරුකොට උසස් කොට බැහැරකොට හැසිරෙන්නේ යනුයි. **සුඛෙතෙන** යනු මනා වූ කෙතෙහි ද යනුයි. **පූති බීජං ව** යනු කුණු වූ ස්වරූපයට ගිය බීජයක් මෙන් යනුයි. ඡකණ

(අස්බෙටි) රස ආදිය වැඩිකිරීම අඩුකිරීම සුවසේ පිහිටුවීම ආදිය නොකිරීමෙන් දූෂිත වූ බීජ යන අර්ථයයි.

චෙතසා යනු සිය සිතිනි. **චෙතෝ** යනු ඒ පුද්ගලයාගේ සිතයි. **පරිචචා** යනු පිරිසිඳ යනුයි. **ඉරියති** යනු පවතී යනුයි. **යථාහතං** යනු කිසිවක් ගෙනහැර තබන ලද පරිදි යනුයි.

මාකත්‍ථ යනු නොකරව යනුයි. **න පමුත්‍යත්‍ථි** යනු ප්‍රමුඛයෙක් නැත යනුයි. **උපෙච්චායි** යනු දැන දැන ද බුද්ධි පූර්වකව ද යන අර්ථයයි.

අධමෙමන යැයි කියාත් **මුසාවාදෙන** යන වචනය මුසාවාදයේ මහාසාවද්‍යභාවය දක්වනු පිණිසය. එහෙයින්ම 'එකං ධම්මං අතීතසස' යනාදිය කියන ලදී. එසේම එවං පරිත්තං වො රාහුල, තෙසං සම්ඤ්ඤං යොසං නත්‍ථි සම්පජානා මුසාවාදෙ ලජ්ජා' යනාදිය ද කියන ලදී. **නං කථනනු භවිසසති** යනු ඒ ධනය කවර ආකාරයකින් ඔවුන්ට ලැබෙන්නේ ද? ඒවා අධර්මයෙන් රැස් කරන ලද බැවින් ඒවා කෙරෙහි දිගුකල් පවත්නා බවක් නොවේ යන අර්ථයයි. **අනතරායා සුභවිසසනති** යනු අධාර්මික ව්‍යවහාරාදියෙන් රාජ අනතුරු ආදිය වන්නේය යනුයි. **සු** යනු නිපාත මාත්‍රයකි. **සමහතසස විනසසති** යනු මෙහි රැස්කරන ලද, පිළියෙල කරන ලද දෙය විනාශ වේ යනුයි. **සගගං** යනු සුගතියයි. එය ශෝභන වූ රූපාදියේ අග්‍ර වූයේනුයි සග්ග නම් වේ යැයි අදහස් කරන ලදී. **එතනාවනා** යනු මෙලොවට පරලොවට සම්බන්ධ අර්ථයන් හානිවීමෙනි. **හනා** යනු යනුයි.

විවටටතෙ යනු පෙරලයි යනුයි. **ලොහා බණති අතනානං** යනු ලෝභ හේතුවෙන් පව් කරමින් වැරදි කායික හැසිරීම් ආදී යෝගයෙන් තමා සාරයි නම් වේ. **මිතෙතහි ජීරති** යනු මිත්‍ර භාවයෙන් පිරිහෙයි යනුයි.

චරනති යනු සතර ඉරියව්වලින් අකුසල කර්ම කරමින් හැසිරෙත් යනුයි. **බාලා** යන මේ ලෝකාර්ථය ද පරලෝකාර්ථය ද නොදන්නා පුද්ගලයන් මෙහි බාල නම් වේ යනුයි. **දුමෙමධා** යනු ප්‍රඥා රහිතයෝ ය. ප්‍රඥාවේ දුෂ්ට භාවයක් නම් නැත. **අමිතෙත නෙව** යනු මිත්‍ර නොවූවකු මෙන් වෛරයෙන් වෙන්ව යනුයි. **කටුකඵලං** යනු තියුණු ප්‍රතිඵලයයි.

දුක්ඛ ඵලය යන අර්ථයයි. **න තං කම්මං කතං සාධු යං කත්වා අනුතපපති** යනු යම් කර්මයක් නිරය ආදියේ උපදවීමට සමත් වේ ද දුක ඇතිකොට සිහි කළයුතු බව සිහිකළ මොහොතෙහි අනුව තැවේ. අනුව ශෝක කරයි. ඒ කරන ලද දෙය යහපත් නොවේ. සුන්දර නොවේ. හද නොවේ. **යස්ස අසුමුඛො** යනු කඳුලින් තෙත් වූ මුහුණු ඇතිව හඬන යමෙකුගේ යනු විපාකය ඇසුරු කරයි. විඳියි යනුයි.

දුකකරං යනු වත්පිළිවෙත් පිරීම් වශයෙන් ආභිසමාචාරික සීලය රකින්නට නොහැකි බැවින් දුෂ්කරය යනුයි. සමාදානයේ පටන් කඩ නොකොට විශේෂයෙන් ආදි බ්‍රහ්මචරියක ශීලයේ පළමු සිත පැමිණවිය යුතු බැවින් **ඉවසිය නොහැක.** සීල සංවරාදිය හෝ නොපිරික්සා **සම්පාදනය** කරන්නට නොහැකි බැවින් දුෂ්කරය. **අවියතෙතන** යන මෙදප්‍රාඥයා විසිනි. **සාමඤඤං** යනු ශ්‍රමණ භාවයයි. තපෝ යනු ඒ ශ්‍රමණ භාවයෙහිය. සමබාධා යනු මනාව නොහැඳි, නොපෙරළි බව, මාගමුන් ආදී බාධාවන් ය. යතෝ යනු සීල සංවර ආදියට බාධා වූ සම්බාධ සංඛ්‍යාත විෂම අරමුණුවල ය. එසේ නැතහොත් දුක්කරං යන පදයේ අර්ථය දක්වන්නට දුත්තිතික්ඛං යයි කියන ලදී. දුත්තිතික්ඛං යනු ක්ෂමා කළ නොහැකි ඉවසිය නොහැකි යනුයි. අවියත්තෙන යනු බාලයා විසිනි. සාමඤඤං යනු ශ්‍රමණ ධර්මයයි. පණ්ඩිත වූ කුලපුත්‍රයෝ දසවසක් ද විසිවසක් ද -පෙ- සැටවසක් ද දහින් දත මැඩ දිවෙන් තල්ල මැඩ සිතින් සිත නිග්‍රහකොට ඒකාසනය ඒකභත්තය ඇසුරු කරමින් දිවි ඇතිතෙක් බඹසර හැසිරෙන්නාහු ශ්‍රමණ ධර්මය කෙරෙත් ද එය බාල අව්‍යක්තයන් විසින් කරන්නට නොහැකි වෙත් යන මෙය කියන ලදී. **බහූහි තපෝ සමබාධා** යනු ඒ ශ්‍රමණ භාව සංඛ්‍යාත ආර්ය මාර්ගයෙහි බොහෝ සම්බාධ වේ යනුයි. මාර්ගාධිගමය පිණිස පිළිපන්නාහුගේ බොහෝ වෙහෙස පිණිස යන අර්ථයයි.

අපපමෙය්‍යං පමිණනෙතා යනු ප්‍රමාණ කළ නොහැකි ක්ෂීණාශ්‍රව පුද්ගලයා මෙපමණ සිල් ඇත්තෙකි. මෙපමණ සමාධි ඇත්තෙකි. මෙපමණ ප්‍රඥා ඇත්තෙකියි මනිනුයේ යනුයි. **කොධ විදවා විකපපයෙ** යනු මෙලොව කවරනම් පණ්ඩිත වූ විදග්ධයෙක් තර්ක කෙරේ ද යනුයි. ක්ෂීණාශ්‍රවයෙක් ම ක්ෂීණාශ්‍රවයකු මනිමින් තර්ක කෙරේ යැයි දීපනය කෙරේ. **නිවුතං මඤඤෙය්‍ය** යනු යම් පෘථග්ජනයෙක් ප්‍රමාණ කරන්නට පටන්ගනී ද ඒ පරික්ෂේප කරන ලද අවකුජ්ජපඤඤ පුද්ගලයා යැයි සිතමි. **අකිසසවං** යනු කිස්සව යනුවෙන් ප්‍රඥාව කියවේ. ප්‍රඥා රහිත යන අර්ථයයි.

කුයාරි යනු තමාව සිදින අර්ථයෙන් කෙටෙරිය හා සමාන එරුෂ වචනයයි. **ඡඳති** යනු කුසල මූල සංඛ්‍යාත මූලය ම සිදියි යනුයි. **විසං හලා හලාමීව** යනු හලාහල සංඛ්‍යාත විෂක් මෙන් යනුයි. **එවං විරුද්ධං පාතෙති** යනු වරද්දන ලද, අපරාධ කළ පැකිළෙන ලද පුද්ගලයා මෙසේ අපායයන්හි හෙලයි යනුයි. **වාචා දුබභාසිතා යථා** යනු ආර්යයන්ට උපවාද වශයෙන් නපුරුකොට කියන ලද වදන් අනුව යනුයි.

නිඳියං යනු නින්දා කටයුතු යනුයි. **නං වා නිඳති යො පසංසියො** යනු යමෙක් විශිෂ්ට ගුණ ඇති බැවින් ප්‍රශංසාර්හ පුද්ගලයෙක් වේ ද හෙතෙම පාපිච්ඡතා ආදිය ආරෝපණය කොට ගර්හා කෙරේ. **විචිනාති** යනු රැස්කරයි යනුයි. **කලිං** යනු අපරාධයයි. **සබබසාපි සභාපිඅතනනා** යනු තමාගේ සියලු ධනය ද තමා ද සමග යනුයි. **සුගතෙසු** යනු ශෝභන වූ ගමන් ඇති බැවින් ද සුන්දර වූ තැනකට ගිය බැවින් ද මනාව ගිය බැවින් ද මනාව කියන ලද බැවින් ද සුගත සංඛ්‍යාත බුද්ධාදීන් කෙරෙහි යනුයි. **මනං පදොසයෙ** යනු යමෙක් සිත දූෂණය කෙරේ ද යනුයි. ඔහුගේ මේ මනෝපදෝෂය ම මහත් වූ අපරාධයැයි කියන ලද්දේ වෙයි. කවර හෙයින් ද? යම්හෙයකින්, **සතං සහසසානං** -පෙ- **පාපකං** යි කියන ලද හෙයිනි. එහි **සතං සහසසානං** යනු නිරර්බුද ගණනින් සියක් දහසකි යනුයි. **ඡතතිංසති** යනු අන්‍ය වූ නිරර්බුද තිස්හයකි. **පඤච ච** යනු අර්බුද ගණනින් අර්බුද පහකි යනුයි. එහෙයින් වර්ෂ ගණන් කිරීමෙන් ඒ මෙපමණ කාලයක් ය. යම් කාලයක් මුළුල්ලේ ආර්යයන් ගැරහුම් වචන ද සිත ද පිහිටුවා පාපී වූ නිරයට පැමිණෙයි. එහි පැසේ යැයි කියන ලද්දේ වෙයි. යම් සංක්ෂේප වශයෙන් පාප නිරයෙහි ආයු ප්‍රමාණයයි. විස්තර වශයෙන් පසුව එන්නේය.

ලොහ ගුණෙ යනු බාලයන් විසින් දක්නා ලද බැවින් ද නොයෙක් වර පැවති බැවින් ද ලෝභය ම ලෝභගුණය වේ. ඒ ලෝභ ගුණයෙහි ය. තණ්හාවෙහි යන අර්ථයයි. **අනුසුතෙතා** යනු අනුව අනුව යෙදුණු යනුයි. **අවදඤඤු** යනු වචන නොදන්නා සුලු යනුයි. බුදුවරුන්ගේ ද අවවාදය නොගන්නා හෙයිනි. **මචඡරි** යනු පස්වැදෑරුම් මසුරුකමෙන් මසුරු වූ යනුයි. **පෙසුණියං අනුසුතෙතා** යනු කේළමෙහි යෙදුනේ අග්‍ර ශ්‍රාවකයන් බිඳ දැමීමෙන් යනුයි. මිය යන කෝකාලිකයාට අවවාද කරන ආයුෂ්මත් මහා මොග්ගල්ලායන තෙරුන් විසින් මේ ගාථාව කියන ලදී. **මුබඳගග** යනු මුඛ විසමය යනුයි. **විභූත** යනු විගත භූතය, අලිකවාදිය යනුයි.

අනරිය යනු අසත්පුරුෂය යනුයි. **භූනහූ** යනු භූති හනකය යනුයි. එනම් **තම** බුද්ධිය විනාශ කරන්න යනුයි. **පුරිසනත** යනු පුරිසාධමය යනුයි. **කලි** යනු අලකඩ පුරුෂය යනුයි. **අවජාතක පුතන** යනු භාග්‍යවත් බුදුරදුන්ගේ අවජාත පුත්‍රයා යනුයි. **මා බහුභාණිධ නෙරයිකොසි** යනු දැන් වැඩිය කියන්නෙක් නොවෙව. නිරයෙහි උපදින්නෙක් නොවෙව යනුයි. **රජ මා කිරසෙ** යනු තමා තුළ කෙළෙස් රජස් දම්ගතිහි යනුයි. **සනෙත** යනු ක්ෂීණාශ්‍රවයන් සන්සිඳුණු කල්හි යනුයි. **කිබබිසකාරි** යනු පාපකාරියායි. **පපතං** යනු නරකයයි.

ඉදං සංකිලෙසභාගියං යනු මෙය තණ්හා ආදීන්ගේ ස්වභාව භේදයෙන් ද අවස්ථා භේදයෙන් ද අනෙක වූ භේද ඇති බව දක්වන්නට නොයෙක් සූත්‍ර පදයන් කරණ කොටගෙන උදාහරණ වශයෙන් දක්වන ලද සංකිලෙසභාගිය සූත්‍රයකැයි දතයුතුය.

පසනෙනන යනු කර්ම කර්මඵල ආදිය විශ්වාස කරන්නා විසින් යනුයි. **ඉදධං** යනු හක්ෂූපග සීසූපග ආදී අලංකාරවලින් ද මැණික් රත්න ආදියෙන් ද සමෘද්ධිමත් වූ යනුයි. **වීතං** යනු තෙල් මීපැණි ආදියෙන් ද ධනධාන්‍ය ආදියෙන් ද මහත් වූ යනුයි. **ආකිණණ මනුසසං** යනු නිතර මිනිසුන් ඇති යනුයි. **සමබාධබහූහං** යනු තැන තිනිවිද නොගිය වීථිය. බ්‍යූහායි කියනු ලැබේ. යමෙක් පෘථිවි මඟෙන් මෙන් යේ ද ඒ සම්බාධක බ්‍යූහකයෝ මෙහි ඇත්තේ නුයි **සම්බාධබ්‍යූහ** නම් වේ. මෙයින් ද ඒ නගරයේ ගණ වාසය ම දීපනය කෙරේ. **භනෙතන** යනු දමනයට පැමිණියහු විසින් යනුයි. නැතහොත් එහෙ මෙහෙ කැරකෙන්නහු විසින් ය. **අපාපකං** යනු අලාමක වූ යනුයි. **අවෙචචපපසාදෙන** යනු අචල ප්‍රසාදයෙනි. සත්‍යාවබෝධයෙන් පැමිණි ප්‍රසාදයෙනි.

පෙචච සො ලහතෙ යනු යමෙක් දණ්ඩෙන් සත්ත්වයන්ට හිංසා නොකෙරේ ද ඒ පුද්ගලයා පරලොව මිනිසෙකු වූයේ මනුෂ්‍ය සැපත ද දෙවියෙකු වූයේ දෙව් සැපත ද දෙකම ද ඉක්මවමින් නිවන් සුවය ලබන්නේය යන අර්ථයයි.

චාරිකං පකක මිසසති යනු ජනපද චාරිකාවෙහි යන්නේය යනුයි. භාග්‍යවතුන් වහන්සේ කවර හෙයින් ජනපද චාරිකාවේ හැසිරෙන සේක් ද? දේශාන්තරගත වූ විනේය පුද්ගලයන්ගේ හික්මවීම පිණිස ය. එහි

සිටියවුන්ගේ උත්සාහ ජනනය පිණිස ය. එක් තැනක වූ ශ්‍රාවකයන්ගේ නිරන්තර වාසස්ථානය පරිහරණය කරනු පිණිස ය. තමාද එහි නොඇලුණු බව දක්වනු පිණිස ය. සම්මා සම්බුදුරදුන් වාසය කරන ලද තැනක් බැවින් එම දේශයේ චෛත්‍ය ස්වභාවයක් සම්පාදනය කරනු පිණිස ය. දැකීම පැමිණීම් ආදියෙන් බොහෝ සත්ත්වයන්ට පින් නමැති ඕසය මෙරවීම පිණිස ය. වැසි නොවැසීම ආදී උවදුරු සන්සිඳුවීම පිණිස ය යන මේ කරුණු හත නිසා භාග්‍යවත් බුදුවරු ජනපද චාරිකාවේ හැසිරෙනැයි දතයුතුය. **ඉසිදත්ත පුරාණා** යනු ඉසිදත්ත හා පුරාණ යන දෙදෙනායි. ඔවුන් අතරින් ඉසිදත්ත සකෘදාගාමීය. පුරාණ සෝවාන් ය. **සාකෙතෙ** යනු සාකේත යයි ලබන ලද නම් ඇති භෝග ග්‍රාමයේ ය. **මගෙ පුරිසං යපෙසුං** යනු ඔවුන්ගේ ගම්දොර භාග්‍යවතුන් වහන්සේගේ ගමන් මාර්ගයයි. එහෙයින්, ඉදින් භාග්‍යවතුන් වහන්සේ අප නිදිගත් විට හෝ පමා වූ විට යන්නේ නම් දකින්නට නොලැබමෝ යයි පාර මැද පුරුෂයෙකු තැබූහ යනුයි. **අනුබන්ධිංසු** දුරින් නොව පිටුපසින් පිටුපසින් ලුහුබැන්දහ යනුයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි කරත්ත පාර මැද අඩිපාරෙන් වැඩියහ. අනෙක් තෙරවරු දෙපසින් අනුව යන්නාහු මෙන් ගමන් කළහ. **මගා ඔකකමම** බුදුවරු වනාහි කිසිවකු සමග ගමන් කරමින් ම පිළිසඳර කථා කරති. කිසිවකු සමග නැවතී කථා කරත්. කිසිවකු සමග දවස් භාගයක් මුළුල්ලේ හිඳගෙන කථා කරත්. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූහ. 'මොවුහු මගේ ශාසනයේ ප්‍රියයෝ ය. පැමිණ ඵල ඇත්තෝ ය. මොවුන් සමග හිඳගෙන දවස් භාගයක් පිළිසඳර කථා කරන්නෙමි' යනුවෙනි. (ඉන්පසු) මගින් බැස එක්තරා ගසක් මූලට පැමිණියේය. **පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි** ඔවුහු ඡත්‍ර, වහන්, සැරමිටි, පාද සම්බාහන තෙල් මෙන්ම අෂ්ටවිධ පාන ද සරහ මුවන්ගේ පා ඇති පර්යංකයක් ද ගෙන ගියහ. ඉන්පසු ඒ පර්යංකය පනවා දුන්හ. ශාස්තෘන් වහන්සේ එහි වැඩ සිටියේය. **එකමන්තං නිසීදිංසු** යනු ඡත්‍ර, උපාහන ආදිය භික්ෂු සංඝයාට දෙවයි කියා භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ යනුයි. **සාවත්ථියා කොසලෙසු චාරිකං පකකමිසසති** යනාදි සියල්ල මධ්‍යම දේශ වශයෙන් ම කියන ලදී. කවර හෙයින් ද? නියත වශයෙන් පුරුදු කරන ලද බැවිනි. භාග්‍යවතුන් වහන්සේගේ චාරිකාවේ හැසිරීම මධ්‍ය දේශයෙහි ම ය. **ඉදින්** ප්‍රත්‍යන්ත දේශයෙහි ගමන් කරයිනම් මධ්‍ය දේශයෙහි ම **අරුණ** නගන්නේය යන්න නියත වූ **ආවේණික ධර්මයකි.** එහෙයින් මධ්‍ය **දේශ** වශයෙන් ම කියන ලදී. **කාසිසු** යනු කසී රටෙනි. එසේම මගධෙසු යනු මගධ රටෙනි. **ආසනෙන**

නො භගවා භවිසසති යන මෙහි හුදෙක් (බුදුරදුන්) ළඟ නිසා ම ඔවුන්ට සතුටු නොවේ. එසේ නම් (කුමක් හෙයින් ද) දැන් දන් දෙන්නට සුවඳමල් ආදියෙන් පූජා කරන්නට බණ අසන්නට ප්‍රශ්න විමසන්නට ලබන්නෙමුයි ඔවුන්ට සතුට ඇති වෙයි. **තසමාතිහ ඨපතයො සමබාධො ඝරාවාසො** යනු වඩුවෙනි, යම් හෙයකින් ඔබලා තුළ මා දුරුවූ කල්හි බොහෝ දොම්නස ද ළං වූ කල්හි බොහෝ සොම්නස ද වෙයි. එහෙයින් ද මේ ගෘහවාසය බාධා සහිත යැයි දතයුතුය. ගෘහවාසයේ දෝෂයෙන් ම ඔබලාට මෙසේ වෙයි. ඉදින් ගෘහවාසය අතහැර දමා පැවිදි වන්නහු ද එසේ ඔබලා මා සමගම යන්නාහු ද නොයන්නාහු ද එය නොවන්නේය යන මේ අර්ථය දක්වමින් මෙසේ කීහ. කිඤ්චන සහිත, පළිබෝධ සහිත අර්ථයෙන් එහි සම්බාධත්වය දතයුතුයි. මහා නිවසක වසන්නාට ද සකිඤ්චන සපළිබෝධාර්ථයෙන් ගෘහවාසය බාධා සහිත ම ය. **රජා පථො** යනු රාගාදි කෙලෙස් පැමිණීමට මගකි යනුයි. පැමිණෙන තැනක් යන අර්ථයයි. **අබෙභාකාසො පබබජජා** යනු පැවිද්ද වනාහි අකිඤ්චන අපළිබෝධ අර්ථයෙන් අභ්‍යවකාශයකි. සිවරුවන් ගැබක පර්යංකයෙන් පර්යංකය ගටා හුන්නා වූ භික්ෂූන් දෙදෙනෙකුගේ පැවිද්ද අකිඤ්චන පළිබෝධාර්ථයෙන් අභ්‍යවකාශයක් නම් වේ. **අලඤ්ච පන වො ඨපතයො අපපමාදාය** යනු මෙසේ සම්බාධක වූ ගෘහවාසයෙහි වසන්නා වූ තොප විසින් අප්‍රමාදයම ඇති කරගන්නට සුදුසුය යන අර්ථයයි. **නාගා** යනු ඇත්තු ය. **ඔපවය්‍හ** යනු රජුට නැගීමට සුදුසු යනුයි. **එකං පුරතො එකං පච්ඡතො නිසීදාපෙ** යනු ඒ දෙදෙනා සියලු අලංකාරවලින් සරසන ලද ඇතුන් දෙදෙනෙකු පිට ඒ ස්ත්‍රීන් හිඳුවා රජුගේ ඇතු මැදට කොට දෙපසින් යත් යනුයි. එහෙයින් මෙසේ කීහ. **නාගොපි රකඛිතබෙබ** යනු යම්සේ කිසිදු විශේෂයක් නො කෙරේ ද එසේ රැකිය යුත්තේ වෙයි යනුයි. **තාපි භගිනියො** යනු යම්සේ ප්‍රමාදයට නොපැමිණෙත් ද එසේ රැකිය යුත්තාහු වෙති යනුයි. **අතනාපි** යනු මද සිනහව, කථනය, විකෙළිපය ආදිය නොකරන්නවුන් විසින් තමා ද රැකගත යුතුය යනුයි. මෙසේ කරන්නා මොහු ස්වාමීදෝහියෙකැයි නිග්‍රහ කළ යුත්තේ වෙයි. **තසමාතිහ ඨපතයො** යනු යම්හෙයකින් ඔබලා වෙත රජතුමා නිරතුරුව රාජභාණ්ඩ භාර දේද එහෙයින් ද ගෘහවාසය සම්බාධකය. කෙලෙස් පථයකි. යම්හෙයකින් පාංශුකූලික භික්ෂුවක් මෙසේ පවරන්නේ ද එහෙයින් අභ්‍යවකාශය බඳු පැවිද්දක් නොවේ. සියලු තැනම මෙසේය. **අලඤ්ච බො ඨපතයො අපපමාදාය** යනුවෙන් අප්‍රමාදය ම කරවූ යැයි දක්වයි. **මුතතචාගො** යනු හරන ලද පරිත්‍යාගයයි. **පයතපාණී** යනු පැමිණි පැමිණි

අයට දෙනු පිණිස යොදන ලද අත් ඇති යනුයි. **දාන සංවිභාගරතො** යනු මෙයින් ඉතා අල්ප වූ කිසිවක් ලැබ එයින් ද බෙදීමෙහි ඇලුණු යනුයි. **අපපටි විභතතං** යනු මෙය අපට වන්නේය. මෙය ආර්යයන්ට වන්නේය යනුවෙන් නොබෙදන ලද යනුයි. සියල්ලම දිය යුතුමය යයි සිතා සිටී යන අර්ථයයි. ඉමෙහි බො ඵපතයො **චතූහි** ධමෙමහි සමනනාගතො අරියසාවකො සොතාපනෙනා හොති **යනු** යෝවාන් වූ පුද්ගලයා මේ ධර්මයන්ගෙන් යුක්ත වෙයි යන අර්ථයයි. මේ **සෝවාන්** පුද්ගලයා විසින් මේ ධර්ම සතර ඒකාන්ත වශයෙන් ම ලබන බව දක්වයි. මෙසේ ඒ වඩුවන්ට මේ කරුණු සතරින් යුක්ත බව යන ක්‍රමයෙන් කරුණු දක්වා දැන් නිෂ්පර්යාය වශයෙන් එය දක්වන්නට **තුමෙහ** බො **ඵපතයො** යනාදිය කියන ලදී.

සහසසං කපප කොටියො යනු දහසක් ආත්මභාව විය යන අර්ථයයි. **අසිති කපපකොටියො** යන පාඨයක් ද වේ. ආයුකල්ප අසූවක් විය යන අර්ථයයි. ඒවා කවර තැනක වී ද? **දෙවලොව මනුසෙස ච** යි කියන ලදී. දෙවියන් අතර ද මිනිසුන් අතර ද යන අර්ථයයි.

සංවිරුළහමහි යනු හාත්පසින් දලු ලද මෙන් වැඩුණු යනුයි. අලහිංහං යනු (අලහිං අහං යන පද දෙකයි) මම ලැබුවෙමි යනුයි. **අජජ තිංසං තතො කපප** යනු ඒ කල්පයෙන් අද දැන් මේ තිස්වැනි කල්පය යනුයි. **තසසා සඤඤාය වාසනා** යනු ඒ අවබෝධ වූ සංඥාවේ වාසනාවෙනි.

තණහා නිගඝාතකො යනු තණ්හාව මුලින් උපුටන්නෙකි. වටංසකො යනු මල්වලින් කරන ලද කැණිමඬලයි. **සබබපුපෙඵහි ලංකතො** යනු නොයෙක් මල්වලින් අලංකාර කරන ලද යනුයි. **ලපනනතරා** උඩු යටි තොල් අතර යනුයි. **ඔකකා** යනු ප්‍රභාවයි. **මුදධනනතරධායථා** යනු මුදුනින් අතුරුදන් විය යනුයි. **කංඛං විතරා** යනු සැකය දුරු කරව යනුයි. **යසස සබබධමෙමසු සදා ඤාණං පවතතති** යන තැන **තං** යනු නිපාත මාත්‍රයකි. සියලු ධර්මයන්හි කැමැත්ත බැඳී ඇති බැවින් යමකු තුළ සැමදා ඤාණය පවතී ද ඒ සර්වඥ වූ භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ට මෙය වදාළහ යන සම්බන්ධයයි. **රාජා රටෙඨ භවිසසති** යනු සියලු රට තුළ රජු වන්නේය යනුයි. **චරිමං** යනු මුල් භවයයි. **සචඡිකතවා** යනු ප්‍රත්‍යක්ෂ කොට යනුයි. **ධමමතං** යනු චතුසත්‍ය ධර්මය හෝ ප්‍රත්‍යෙක බෝධියයි.

සුවණ්ණචඡදනං නාවං යනු දෙපසින් රන් අලංකාරවලින් සැරසීම් වශයෙන් වසන හු රන් නැවක් යනුයි. **පඤ්හං පුටයා වියාකාසි සකකසස** ඉති මෙ සුතං යනු යම්සේ ඒ දේවතාවා ප්‍රශ්න විමසන ලද්දේ ශක්‍රයාට විසඳ දෙන ලද ද මා විසින් ද මෙසේ අසන ලදැයි ආයුෂ්මත් මහා මුගලන් තෙරුන් තමා විසින් අසන ලද පරිදි එය භාග්‍යවතුන් වහන්සේට ප්‍රකාශ කරයි යනුයි.

පංසු ථූපෙසු යනු ශරීර ධාතු ඇතුළත තබා පස්වලින් කරන ලද ස්තූපයන්හි ය. මෙසේ ඒවා භාග්‍යවතුන් වහන්සේ උදෙසා කරන ලද්දේ නම් වේ. එහෙයින් ම **උද්දිසස කතෙසු දසබලධරානං** යි කියන ලදී.

දෙවපුතත සරිරවණණා යනු දිව්‍ය පුත්‍රයෙකුගේ ශරීරය හා සමාන වර්ණ ඇති යනුයි. **සුභගසණ්ඨිති** යනු සෞභාග්‍යයෙන් යුතු සලකුණයි.

උළාරං වත තං ආසි යනු මා විසින් කරන ලද ඒ පින උදාර විය යනුයි. යාහං යනු යා අහං යන පද දෙකයි.

සත සහසසං කපෙප මුදිතො ථූපං අපූජෙසි යනු ස්තූපය පුදා සියක් දහසක් ආයු කල්පයෙහි මම සතුටුවිමි යන අර්ථයයි. **අනාගනතුන චිනිපාතං** යනු අපායෙහි ඉපැත්මට නොගොස් යනුයි. **යං චකඛුං** යනු යම් ප්‍රඥා ඇසක් යනුයි. **පණිහිතං** යනු තබන ලද යනුයි. විමුත්ත චිතතමහි යනු මිදුණු සිත් ඇත්තේ වෙමි යනුයි. **විධූතලතො** යනු කම්පා කරන ලද තණ්හා ලතාවෙනි. මුලින් සිඳින ලද තණ්හාව යන අර්ථයයි.

සාමාකපපපථා දනමතතං යනු හුරුහැල් තණ නැළියක් පමණ බත් යනුයි. **අබිලෙ** යනු පංච චේතොඛිලයන්ගේ අභාවයෙන් සියල්ලෙහි යනුයි. **තසමිඤඤව ඔකපපයි ධමමමුතතමං** යන්නෙහි තසමිං යනු පසේ බුදුන් තුළ ය. උත්තම ධම්මං යනු පසේබුදු බවයි. මොහු තුළ උතුම් දහමක් විය යුතුයැයි විශ්වාස කළෙමි. **තසමිඤඤව ධමෙම පණිධෙසිං මානසං** යනු මොහු විසින් ලබන ලද ධර්මය මම ද සාක්ෂාත් කරන්නෙමියි සිත පිහිටවූයෙමි යනුයි. **භවෙ කුදාසුපි ච මා අපෙකඛ වා** යනු කිසි භවයක අපේක්ෂා ඇත්තෙක් නොවේවා යි සිත පිහිටවූයෙමි යන සම්බන්ධයයි. **කුරුසු** යනු උතුරුකුරු දීපයන්හි ය. **දීසායුකෙසු** යනු ඔවුන්ගේ දහස් වර්ෂ ආයුෂ පිණිස කියන ලදී. **අමමෙසු** යනු අල්ලා

නොගන්නා ලද දෙයෙහි ය. **පාණීසු** යනු සත්ත්වයන් කෙරෙහි ය. **අභිනගාමිසු** යනු ලබන ලද සම්පත් ඇති පුද්ගලයන් විසින් දිවි ඇති තෙක් නොපිරිහෙන ස්වභාව ඇති යනුයි. **තිදසොපපජ්ජථ** යනු තව්තිසා දෙවියෙක්ව උපන්නෙමි යනුයි. දෙවිලොව හෝ තව්තිසාවේ හෝ උපන්නෙමි. **විසිට්ඨකායුපගතො** යනු විශිෂ්ට සිරුරට, නන් වන් කයට පැමිණියේ යනුයි. **යසසසිසු** යනු පිරිවර ඇත්තවුන් කෙරෙහි ය. **හිතාහිතාසිහි** යනු කුශලාකුශලයන් ඉක්මවන්නන් විසිනි. **පචවකඛං බවිමං** යනු මේ වචනය ප්‍රත්‍යක්ෂ වූවකි යන අදහසයි.

සකාසි යනු සො අකාසි යනුයි. **බලිමාහිහාරි** යනු පූජා බලිය ගෙනාවේය යනුයි. **පතිතසස එකං** යනු ඔහුගේ අතින් එක් මලක් වැටුණේය යනුයි.

උපරිටඨං යනු අහස මත සිටි යනුයි. **අරිටඨං** යනු අරිට්ඨ නම් පසේ බුදුවරයායි. **අජඣතතං ච බහිදධා ච** යනු ආධ්‍යාත්මික විෂය ද බාහිර විෂය ද යනුයි. යෙ මෙ විජජිංසු යනු යමක් මා තුළ පෙර විද්‍යමාන වීද යනුයි. **ජාතිමරණ සංසාරො නත්ථිදානි පුනබභවො** යනු යමෙක් නැවත නැවත උපදින මැරෙන සුලු වූයේ ද (එය) සසර යැයි ද පුනර්භවය යැයි ද කියනු ලැබේ. ඔහු ද දැන් නැත යන අර්ථයයි.

ඉදං වාසනා භාගියං සුතතං යනු මෙය වාසනා භාවය පුණ්‍ය සම්පත්තිය දක්වන නොයෙක් සූත්‍ර පදයන්ට උදාහරණ ලෙසින් දක්වන ලද වාසනාගිය සූත්‍රයකැයි දතයුතුය යනුයි.

උදධං අධො -පෙ- අපුනබභවාය යන මෙය නිබ්බේධභාගිය සූත්‍රයකැයි කියන ලදී. ඕඝතරණය ආර්ය මාර්ගයේ කෘත්‍යය බැවිනි. **න චෙතනා කරණීයා** යනු සිත නුපදවිය යුතුය යනුයි. **ධමමතා** යනු ධර්ම ස්වභාවයයි.

යදා හවෙ යනු ඒකාන්තයෙන් යම්කලෙක යනුයි. **පාතු භවනති** යනු උපදිත් යනුයි. **ධමමා** යනු අනුලෝම පච්චය ආකාරයෙන් අවබෝධය ඇතිකරන බෝධිපාක්ෂික ධර්මයෝ ය. නැතහොත් පාතු භවන්ති යනු ප්‍රකාශ වෙත්, අවබෝධ වීම් වශයෙන් ප්‍රකට වෙත් යනුයි. ධම්මා යනු චතුරාර්ය සත්‍ය ධර්මයෝයි. කෙලෙස් තැවීම් අර්ථයෙන් වීර්යය

ආතාපයැයි කියනු ලැබේ. **ආතාපිනො** යනු සම්‍යක් ප්‍රධන් වීර්යය ඇති පුද්ගලයාගේ ය. **ඣායතො** යනු ආරම්මණ උපනිජ්ඣාන ලක්ඛණයෙන් ද (අරමුණ නිරීක්ෂණය කිරීම ලක්ෂණයෙන්) ලක්ඛණ උපනිජ්ඣාන ලක්ෂණයෙන් ද (ස්වරූපය නිරීක්ෂණය කිරීම් ලක්ෂණයෙන්) යුත් ධ්‍යානයෙන් ධ්‍යාන කරන්නාට යනුයි. **බ්‍රාහ්මණස්ස** යනු කෙළෙස් බැහැර කරන ලද ක්ෂීණාශ්‍රවයාට ය.

අථස්ස කංඛා වපයනති සබබා යනු මෙසේ පහළ වූ ධර්ම ඇති ඔහුට 'ස්වාමීනි, කවරෙක් ස්පර්ශ කෙරේ ද? භාග්‍යවතුන් වහන්සේ අපට සුදුසු ප්‍රශ්නයකැයි කිවේය ආදී ක්‍රමයෙන් ද ස්වාමීනි ජරාමරණ යන කවරේ ද? කාශ්‍යප මේ ජරාමරණයයි. මේ ජරාමරණයයි ආදී ක්‍රමයෙන් ද යම් හේතුප්‍රත්‍යමය සැකයක් කියන ලද ද යම් හේතු ප්‍රත්‍යයක් අවබෝධ නොකළ හෙයින් මම අතීත කාලයෙහි වීමි ආදී සොළොස් සැකයන් ද බුදුන් ගැන සැක කරයි. ධර්මය ගැන සැක කරයි ආදී අෂ්ට සැකයන් ද වශයෙන් ආ ඒ සියලු සැක දුරු කරත්. පහවෙත්. නිරුද්ධ වෙත් යනුයි. කවර හෙයින් ද? **යතො පජානාති සහෙතු ධම්මං** යම් හෙයකින් අවිද්‍යා ආදී හේතුවෙන් සහේතුක වූ මේ සංස්කාර ආදි හුදු දුක්ඛ ස්කන්ධ ධර්මය දැනගනී. අවබෝධ කරගනී. වටහාගනී.

යථො ඛයං පචචයානං අවෙදි යනු යම්හෙයකින් ප්‍රත්‍යයන්ගේ ඛය සංඛ්‍යාත වූ නිර්වාණය දත්තේ අවබෝධ කළේ වටහාගත්තේ එහෙයින් යම්විටෙක මේ ආතාපී වූ ඣායී වූ බ්‍රාහ්මණයාට කියන ලද ආකාර ඇති ධර්මයෙන් පහළ වෙත් ද ඉක්බිති ඔහුට නිවන් නොදැනීම නිසා වූ යම් සැක උපදී ද ඒ සියලු සැක දුරුවේ යනුයි.

ආරඤඤං යනු ආරණ්‍යක යනුයි. **අඤඤාතුඤඤජන යාපෙනතං** යනු කුලයන් නොදන්නේ නිත්‍ය නවකයෙක් වී අහර ටික ටික සිඟා යන පිණ්ඩපාත චර්යාවෙන් යැපෙන්නා ය. එසේ නැතහොත් සලකුණු කරන ලද ඉසුරුමත් ජනයාගේ ගෙවල්වල කටුක භාණ්ඩ රාශිය, ඉතා සුවඳැති භෝජනය සොයන්නහුගේ පිණ්ඩාහාරය ඤාතුඤජන නම් වේ. ගෙපිළිවෙළින් දොරටුවෙහි හුන් තැනැත්තා විසින් ලබන ලද මිශ්‍ර භෝජනය අඤඤාතුඤජන නම් වේ. මෙහි එය අදහස් කරන ලදී. එයින් යැපෙන්නායි. **කාමෙසු අනපෙකඛිනං** යනු වස්තුකාම ක්ලේශ කාමයන්හි අපේක්ෂා රහිත යනුයි.

ඡෙත්වා යනු වධකොට යනුයි. **සුඛංසෙති** යනු ක්‍රෝධ නමැති දාහයෙන් නොදැවෙන බැවින් සුවසේ නිදයි යනුයි. **න සොචති** යනු ක්‍රෝධ විනාශයෙන් නසන ලද දොම්නස ඇති බැවින් ශෝක නොකරයි යනුයි. **විසමූලසස** යනු දුක් විපාකයට ය. **මධුරගහසස** යනු ආක්‍රෝශ කරන ලද්දහුට පෙරලා ආක්‍රෝශ කොට පහරදෙන ලද්දහුට පෙරලා පහරදී යම් සැපයක් ඇති වේද ඒ සඳහා සො මධුරගොගායි කියන ලදී. මෙතැන අවසානය / කෙළවර අග්ග යැයි කියන ලදී. **අරියා** යනු බුද්ධාදීහු ය.

හනෙ යනු නසන්නේය යනුයි. **උපනතිතං** යනු විවෘත නොකරන ලද, විෂ්කම්භනය නොකරන ලද දේ පහළවීම් වශයෙන් පුරුද්ද පහළවීම් වශයෙන් හැසිරෙන යනුයි. **විනොදයෙ** යනු සිය සිතින් බැහැර කරන්නේය යනුයි.

සතනියා යනු මේ දේශනා ශීර්ෂය මුවහත් ආදියෙන් එක්වූ ආයුධයෙන් යන අර්ථයයි. **ඔමථෙයා** යනු පහර දෙන ලද යනුයි. ඔමථ, උම්මථ, මථ, විවථ වශයෙන් පහරවල් හතරකි. එහි උඩින් සිට පහතට දුන් පහර ඔමථ නම් වේ. යට සිටි උඩට දුන් පහර උම්මථ නම් වේ. දොරගුළ මෙන් පසාරු කරගෙන ගියේ මථ නම් වේ. සෙසු සියල්ල විමථ නම් වේ. මෙතැන ඔමථයය ගන්නා ලද්දේය. එය වනාහි සියල්ලට වඩා දරුණුය. ඉදිරිමට අපහසු හුලකි. ප්‍රතිකර්ම කළ නොහැකි ඇතුළතකි. නරක් වූ ඇතුළතකි. කුණු ලේ ඇත්තේ වෙයි. කුණු ලේ නොනිකමී වණමුඛය වටකොට සිටියි. කුණු ලේ බැහැර කරනු කැමැත්තවුන් විසින් ඇඳ සමග බැඳ හිස යටට හැරවිය යුතුය. මරණයට හෝ මරණය හා සමාන දුකකට හෝ පැමිණෙයි.

පරිබබජෙ යනු වාසය කරන්නේය යනුයි. මේ ගාථාවෙන් කුමක් කියන ලද ද? යම්සේ සැතකින් පහර දෙන ලද පුරුෂයෙක් නුල ගැළවීම, වණයට ප්‍රතිකාර කිරීම ආදිය සඳහා උත්සාහය අරඹා ද ප්‍රයෝග කෙරේ ද? පරාක්‍රම කෙරේ ද? යම්සේ මුදුන දැවෙන ගිනිගත් හිසක් ඇත්තෙක් එය නිවීම සඳහා උත්සාහය අරඹයි ද ප්‍රයෝග කරයි ද? පරාක්‍රම කරයි ද? එපරිද්දෙන් භික්ෂුවත් කාමරාගය දුරුකරනු පිණිස සිහිඇතිව අප්‍රමාදී වී වාසය කරන්නේයැයි භාග්‍යවතුන් වහන්සේ කියන සේක. මෙසේ දේවතාවා කී කල්හි භාග්‍යවතුන් වහන්සේ සිතූ සේක. මේ දේවතාවා

විසින් උපමාව දැඩිකොට ගෙනෙන ලද්දේය. අර්ථය වනාහි **ස්වල්ප වශයෙන්** ගෙන සිටියාය. නැවත නැවත කියන්නී නමුත් මැය කාමරාගයේ **වික්බම්භන** ප්‍රහාණය ම කියන්නේය. යම්තාක් කාමරාගය මාර්ගයෙන් ඉවත් නොවේ ද ඒතාක් බැඳීම පවතී යනුවෙනි. ඒ උපමාව ම ගෙන පළමු මාර්ගය ලෙසින් දේවතාවාට පෙරලා දක්වමින් **සතතියා විය ඔමට්ඨා** යන දෙවන ගාථාව වදාළහ. එහි අර්ථය මුල් ක්‍රමය ඇසුරින් දතයුතුය.

ලොකාමිසං යනු කාමගුණයයි. **සනතිපෙකෙඛා** යනු සියලු සංස්කාරයන් සන්සිඳුවන නිවන අපේක්ෂා කරන යනුයි.

පඤ්ඤවා යනු ප්‍රඥාවන්තයායි. **පහිතතෙතා** යනු නිවන වෙත යොමුකරන ලද සිත් ඇත්තාය. **විරතෝ කාම සඤ්ඤාය** යනු යම්කිසි කාම සංඥාවෙන් සතරවැනි මාර්ගය හා යෙදුණු බැවින් සමුච්ඡේද විරතියෙන් හැම අයුරින්ම වෙන් වූ යනුයි. **විරතෙතා** යනුවෙන් ද පාඨයක් වේ. කාමසඤ්ඤාය යන්න සත්තමී විභක්ති පදයක් වෙයි. සගාථා වග්ගයෙහි **කාමසඤ්ඤාසු** යනුවෙන් පාඨයක් වේ. සතර මාර්ගයන්ගෙන් වූ දර්ශනය ද සංයෝජනයන් ඉක්මවන ලද බැවින් **සබබ සංයෝජනාතීතෝ** යි යෙදේ. සතරවැනි මාර්ගයෙන් ම හෝ උද්ධංභාගිය සංයෝජන ඉක්මවන ලදී. ඒ ඒ තැන සතුටුවන හෙයින් නන්දිසංඛ්‍යාත වූ තණ්හාවෙන් ත්‍රිවිධ භවයන් ක්ෂයකරන ලද හෙයින් **නන්දිභව පරිකඛීණෝ** සො යි කියනු ලැබේ. එවන් ක්ෂීණාශ්‍රව භික්ෂුවයි. ගැඹුරු වූ සසර සයුරේ නො ගිලෙයි.

සද්දහානෝ යනු යමකු විසින් පූර්ව භාගයේ දී කාය සුචරිත ආදී භේදයෙන් ද අපරභාගයේ දී සත්තිස් බෝධිපාක්ෂික ධර්ම භේදයෙන් ද අර්හත් වූ බුදු පසේබුදු බුද්ධ ශ්‍රාවකයෝ නිවනට පැමිණියාහු ද ඒ අරහතුන්ගේ ධර්ම නිර්වාණ ප්‍රාප්තිය විශ්වාස කරමින් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව ලබයි. එය ශ්‍රද්ධා මාත්‍රයකින් ම ය. යම්හෙයකින් හටගත් ශ්‍රද්ධා ඇතිව එළඹෙයි ද එළඹෙමින් ඇසුරු කරයි ද ඇසුරු කරමින් කන් යොමයි ද යොමන ලද කන් ඇතිව බණ අසයි ද, එහෙයින් එළඹීමේ පටන් ධර්මශ්‍රවණය දක්වා **සුසසූසං ලභතෙ පඤ්ඤං** නම් වේ. කුමක් කියන ලද්දේ වෙයි ද?

ඒ ධර්මය විශ්වාස කොටත් ආචාර්ය උපාධ්‍යායයන් වෙත කලින්

කල පැමිණි සිට වත්පිළිවෙත් ඉටු කිරීමෙන් ඇසුරුකොට යම්විටෙක ඇසුරු කිරීමෙන් සතුටු කරන ලද සිත් ඇතිව කිසිවක් කියනු කැමැත්තාහු වෙත් ද එකල්හි ඇතිකරගත් ශ්‍රවණයට කැමැත්තෙන් කන් යොමා අසන්නේ ලබයි යනුයි. මෙසේ මනාව අසන ලද්ද ද අවිප්පවාසය ඇතිකල්හි අප්‍රමාදී වූ විචක්ෂණ පුද්ගලයා ම සුභාසිත දුර්භාසිත හැඟීම් ඇති බැවින් ලබයි. අනෙකක් නොලබයි. එහෙයින් **අපපමත්තෙනා විචකඛණෝ** යි කියන ලදී.

පතිරූපකාරී යනු දේශකාලාදිය නොනසා ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද ධර්මයට ගැළපෙන අධිගම උපායක් ඇති කෙරේ යන අර්ථයෙන් පතිරූපකාරී නම් වේ. ධුරවා යනු චෛතසික වීර්යය ලෙසින් නොනසන ලද ධුර ඇති යනුයි. **උට්ඨානා** යනු කායික වීර්ය වශයෙන් උත්සාහවත් වූයේ ලිහිල් නොකරන ලද පරාක්‍රම ඇත්තේ යනුයි. **විඳනෙ ධනං** යනු ලෞකික ලෝකෝත්තර ධනය ලබයි යනුයි. **සවෙචන** යනු වාග් සත්‍යයෙන් ද පරමාර්ථ සත්‍යයෙන් ද යනුයි. බුදු පසේ බුදු ආර්ය ශ්‍රාවකයෝ නිවනට පැමිණෙන්නාහු කීර්තියට ද පැමිණෙත් ම ය. **දදං** යනු කැමතිවන, ප්‍රාර්ථනා කරන යම්කිසිවක් අනුන්ට දෙමින් යනුයි. **මිතතානි ගණති** යනු සම්පාදනය කරයි යන අර්ථයයි. නොදෙන්නා දෙමින් බැඳගනියි. දාන මුඛයෙන් සතර සංග්‍රහ වස්තුව ගන්නා ලදැයි දතයුතුය. ඔවුහු මිතුරන් ඇතිකර ගනිත්. **අසමාලොකා පරං ලොකං සවෙ පෙචව න සොචති** යනු යම් පුද්ගලයෙකුට මේ ශ්‍රද්ධා ආදී ධර්ම විද්‍යමාන නොවේ ද ඔහු මේ ලෝකයෙන් පරලොවට ගොස් ශෝක නොකරයි යනුයි. ඔහුට ශෝක කාරණයක් නැත යන අර්ථයයි.

යසෙසතෙ චතුරෝ ධම්මා සද්ධසස ඝරමෙසිනො
සචචං ධමෙමාධිති චාගො ස වෙ පෙචව න සොචති

(සත්‍යය, ධර්මය, ධෛර්යය, පරිත්‍යාගය යන මේ ධර්ම සතර ගෘහවාසී සද්ධාවත් පුද්ගලයෙකු සතු වේනම් ඔහු ඒකාන්තයෙන් පරලොවදී ශෝක නොකරයි.)

යන ගාථාව අවසන්කොට උපුටන ලද ආලවක සූත්‍රයට අයත් මෙම ගාථාවත් ආලවක විසින් **කථංසු ලභතෙ පඤඤං** ආදියෙන් විමසන ලද භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලදී.

යෙන කෙනචි වණ්ණෙන යනු යම්කිසි කාරණයකින් නැතහොත් ආකාරයකිනි. **සංවාසෝ** යනු එක් තැනක එක්ව විසීමයි. සමාගමයයි. **තං** යනු එසේ එක්වූ අනුකම්පා කළයුතු පුරුෂයායි. **මනසා වෙ පසන්නෙන** යනු කරුණාවෙන් මෙහෙයවන ලද ප්‍රසාදවත් වූ පහන් සිතිනි. **න තෙන හොති සංයුත්තෝ** යනු කියන ලද ඒ අනුශාසනාවෙන් කාමච්ඡන්ද ආදියේ සංයෝජන ලෙසින් සංයුක්ත බවක් නම් නොවේ යනුයි. **යානුකම්පා අනුද්දයා** යනු ආර්ය මාර්ගයට පැමිණීම් වශයෙන් යම් කරුණාවක් මෛත්‍රියක් වේ ද එය යන අර්ථයයි.

රාගො ච දොසො ච යනු රාග දෝෂයෙන් යට කියන ලද ක්‍රම ඇත්මය යනුයි. **කුතෝ නිදානා** යනු කුමක් නිදානකොට ඇති ද? කුමක් හේතුකොට ඇති ද? යනුයි. මේ තො ආදේශය ප්‍රථමා විභක්තියටයි. **අරති රති ලොමහංසෝ කුතොජා** යනු සෙනසුන් පැනවූ කල්හි අධිකුසල ධර්මයන්හි (සමථ විපස්සනාවන්හි) යම් නොඇලීමක්, කලකිරීමක් වේ ද පංච කාමගුණයන්හි යම් ඇල්මක්, අභිරතියක්, ආලයක්, ක්‍රීඩාවක්, වේ ද ලොමු නැගීමෙන් ලෝම හංස සංඛ්‍යාත යම් සිත් තැතිගැන්මක් වේද මේ කරුණු තුන කොයින් හටගත්තේ ද? කොයින් නිපන්නේදැයි විමසන ලදී. **කුතෝ සමුට්ඨායා** යනු කොයින් ඉපිද යනුයි. **මනො** යනු කුසල් සිතයි. **විතක්කා** යනු කාම විතර්ක ආදියයි. **කුමාරකා ධංකමිවොසජ්ජනති** යනු සෙල්ලම් කරන කුඩා ළමයි යම්සේ නූලකින් පා බැඳ කපුටෙකු අත්හරින් ද දමත් ද මෙසේ කුසල සිත අකුසල විතර්කයන් කොයින් උපදවා මුදාහරියිදැයි විමසීමයි. **රාගො ච** යන දෙවන ගාථාව එහි විසඳීමයි. එහි **ඉතො** යනු ආත්මභාවය සඳහා කියන ලදී. රාගදෝෂයෝ ආත්මභාවය නිදානකොට ඇත්තාහ. අරතියත් රතියත් ලෝම හර්ෂයත් ආත්මභාවයෙන් හටගත්තේ ය. කාම විතර්ක ආදිය ආත්ම භාවයෙන් ම ඇතිවී කුසල සිත මුදාහරියි. එහෙයින් ඉන් අන්‍ය වූ ප්‍රකෘති ආදී කරුණු ප්‍රතික්ෂේප කරමින් **ඉතො නිදානා ඉතො සමුට්ඨාය** යි කියන ලදී. මුල් ගාථාවෙහි කියන ලද ක්‍රමයෙන් මෙහි පද සිද්ධිය දතයුතුය. දැන් ඉතො නිදානා යනාදියෙහි ආත්ම භාවය නිදානකොට ඇත්තේය. ආත්මභාවයෙන් හටගත්තේය. ආත්ම භාවයෙන් උපන්නේය යන යම් ඒ අර්ථයක් කියන ලද ද එය සාධනය කරමින් කියන ලදී. **සනෙහජා අත්ත සම්භූතා** යනු මේ රාගාදිය විතර්කය කෙළවරකොට ඇත්තාහු තෘෂ්ණා නැමැති ස්නේහයෙන් හටගත්තේය. එසේ හටගන්නාහු පංච

උපාදානස්කන්ධ භේද ඇති ආත්මභාව සංඛ්‍යාත තමා තුළ හටගත්තේය. එහෙයින් **සනෙහජා අනත සමභූතායි** කියන ලදී.

දැන් එහි අර්ථය ප්‍රකාශ කරන උපමාවක් **නිග්‍රොධසෙසව බන්ධජා** යනුවෙන් දක්වයි. එහි **බන්ධජා** යනු කඳන්වල හටගත් අතුවලින් ඇදෙන මුල් ය. මෙය කියන ලද්දේ වෙයි. යම්සේ නුගගසේ කඳෙන් හටගත් මුල් ආපෝ රස සංඛ්‍යාත වූ ස්නේහය ඇතිකල්හි ඇතිකල්හි හටගනිත් ද හටගන්නාහු එම නුග ගසේ ම ඒ ඒ අතු පෙදෙස්වල දක්නා ලැබෙත් ද මෙසේ ඒ රාගාදිහු අධ්‍යාත්මයෙහි තෘෂ්ණා ස්නේහය ඇතිකල්හි හටගනිත්. හටගන්නාහු එම ආත්ම භාවයෙහි ම චක්‍ෂු ආදී ඒ ඒ ප්‍රදේශයන්හි ඉටු අරමුණුවල දක්නා ලැබෙත්. එහෙයින් **නිග්‍රොධසෙසව බන්ධාජා** යි කියන ලදී. **පුථු විසතතා කාමෙසු** යනු යම්හෙයකින් පංච කාමගුණ ආදී වශයෙන් රාගයද වෛරයට හේතුවන කරුණු ආදී වශයෙන් ද්වේෂය ද අරති ආදිය ද යන ඒ ඒ හේතු වශයෙන් ද සර්වප්‍රකාරයෙන් මේ සියලු කෙලෙස් වෙනම නොයෙක් ආකාර ඇතිවී වස්තු ද්වාර ආරම්මණ ආදී වශයෙන් ඒ ඒ කාමයන්හි ඒ ඒ ආකාරයෙනි. ඇලුණාහු ලැගුණාහු එකට එකතුකොට සිටියාහුය. කුමක් මෙන් ද? **මාලුවාව විතතා වනෙ** යම්සේ වනයෙහි පැතිරුණු මාලුවා වැලක් ඒ ඒ ගස්වල අතු, කුඩා අතු ආදී කොටස්වල ඇලුණාහු ලැගුණාහු එකට එකතු වී සිටියාහු වේ ද ඒ කෙලෙස් දහම් ද මෙසේය. එහෙයින් මෙහි බොහෝ ප්‍රභේද ඇති වස්තු කාමයන්හි ඇලීම **ක්ලේශ ග්‍රහණයකි. යෙ නං පජානනති යතො නිදානං තෙ නං විනොදෙනති සුණොහි යකඛ !** මෙහි අර්ථය මෙසේය. යම් සත්ත්වයෝ ඒ ක්ලේශ ග්‍රහණය මෙයින් හට ගැණුනි. එය උපදියැයි දනිත් ද ඔවුහු එය තෘෂ්ණා ස්නේහයෙන් ගිජු වූ ආත්ම භාවයෙහි උපදින්නේයයි දැන ඒ තෘෂ්ණා ස්නේහය ආදීනව දැක්ම ආදී භාවනා ඤාණ නමැති ගින්නෙන් වියළවන්නාහු දුරුකෙරෙත් ද අත්හරිත් ද මෙසේ යක්‍ෂය අපගේ කිම අසව යනුයි.

තෙ දුතතරං ඔඝම්මං තරනති අනිණඝ පුබබං අපුනබභවාය යනු යමෙක් සංකිලේස ග්‍රහණය දුරු කෙරෙත් ද ඔවුහු ඒකාන්තයෙන් මග වඩත් මාර්ග භාවනයෙන් තොර කෙලෙස් දුරුකිරීමක් නොමැත. මෙසේ මාර්ගය වඩන්නා වූ ඔවුහු ප්‍රකෘති ඥානයෙන් එතෙර වීමට අපහසු කාමෝඝ ආදී චතුර්විධ ඕඝයන් මේ දීර්ඝ කාලයෙන් සිහිනෙන්වත්

එතෙර නොවූ විරූය. නොඉක්මවන ලද විරූය. නැවත භවයක් නොලැබීම පිණිස නිවන් පිණිස තරණය කරත් යනුයි.

දුකකරං භගවා යනු පූර්ව යෝගාවචර වූ එක් දේවතාවෙක් කෙලෙස් බහුල බැවින් ප්‍රයෝග සහිතව කෙලෙස් යටපත් කරමින් මහණදම කොට පූර්ව හේතු මද බැවින් ආර්ය භූමියට නොපැමිණ ම කලුරිය කොට දෙව්ලොව උපන්නේය. හෙතෙම තථාගතයන් වහන්සේ වෙත එළඹ දුෂ්කර භාවය දන්වමින් මෙසේ කීය.

එහි **දුකකරං** යනු දසවසක් ද -පෙ- සැටවසක් ද ඒකාන්තයෙන් පිරිසිදු වූ ශ්‍රමණ ධර්මය කිරීම මට දුෂ්කර නැත යනුයි. **සෙකඛා** යනු සප්ත ශෛක්ෂයෝ ය. **සීල සමාහිතා** යනු සීලයෙන් යුක්ත වූ යනුයි. ඨිතතනා යනු පිහිටි ස්වභාව ඇති යනුයි. මෙසේ විමසන ලද ප්‍රශ්න විසඳ මත්තෙහි ප්‍රශ්න ඇතිකරනු පිණිස **අනගාරියුපෙතසස** යනාදිය කියන ලදී. එහි අනගාරියුපෙතසස යනු අනගාරිය වූ හෙවත් නිවෙස් නැති බවට පැමිණි පැවිද්දාගේ යන අර්ථයයි. **තුටඨි** යනු සිව්පස සතුටයි. **භාවනාය** යනු සිත සන්සිඳුවීම් භාවනාවෙනි. **තෙජෙත්වා මචචුනො ජාලං** යනු යමෙක් රූ දාවල් ඉන්ද්‍රිය සංවරයෙහි ඇලුණාහු ද ඔවුහු එක්තැන් කිරීමට අපහසු වූ සිත එක්තැන් කරත්. යමෙක් සමාහිත සිත් ඇත්තෝ වෙත් ද ඔවුහු චතු ප්‍රත්‍ය සන්තෝෂය පුරමින් ක්ලාන්ත නොවෙත්. යමෙක් සතුටු වෙත් ද ඔවුහු සීලය පූරණය කරමින් ක්ලාන්ත නොවෙත්. යමෙක් සීලයෙහි පිහිටියාහු සප්ත ශෛක්ෂයෝ වෙත් ද ආර්ය වූ ඔවුහු මාරයාගේ දැල නම් වූ කෙලෙස් දැල සිඳ දමා යත්.

දුගගමො යනු ස්වාමිනි මෙය සත්‍යයකි. යමෙක් ඉන්ද්‍රිය සංවරයෙහි ඇලුණාහු ද ඔවුහු එක්තැන් කිරීමට අපහසු සිත එක්තැන් කරත්. යමෙක් සමාහිත සිත් ඇත්තාහු ද ඔවුහු චතුප්‍රත්‍ය සන්තෝෂය පූරණය කරමින් ක්ලාන්ත නොවෙත්. යමෙක් සතුටු වූවාහු ද ඔවුහු සීලය පුරමින් ක්ලාන්ත නොවෙත්. යමෙක් සීලයෙහි උතුම් බව ගන්නා වූ ද සප්ත ශෛක්ෂයෝ වෙත්ද ආර්ය වූ ඔවුහු මාරයාගේ ජාල සංඛ්‍යාත වූ කෙලෙස්දැල සිඳ දමා යත්. කුමක් හෙයින් නොයන්නාහු ද? මෙය වනාහි **දුගගමො භගවා! විසමො මගෙගා** යනාදිය කියන ලදී. එහි ආර්ය මාර්ගය කෙසේවත් දුර්ගම නොවේ. විෂම නොවේ. පූර්වභාග ප්‍රතිපදාවෙන් මොහුට බොහෝ වෙහෙස ඇති වේ. එහෙයින් මෙසේ කියන ලදී. **අවංසිරා** යනු ඤාණ

හිසින් පහතට වූ හිස ඇතිව වැටෙත් යනුයි. ආර්ය මාර්ගයට නැග ගන්නට අසමත් බැවින් ම ඔවුහු මග වැටෙතැයි කියනු ලැබේ. **අරියානං සෙ සමෝ මගෙගා** යනු එම මග ම ආර්යයන්ට සමාන වේ යනුයි. **විසමෙ සමා** යනු විෂම වූ සත්ත්වකයෙහි සමාන බව ම ය.

ඉදං හි තං ජෙතවනං යන්න අනාථපිණ්ඩික දිව්‍යපුත්‍රයා **ජේතවනයේත්** බුද්ධාදීන්ගේත් ගුණ කියනු පිණිස පැමිණ කියන ලදී. **ඉසි සංඝනිසෙවිතං** යනු භික්ෂු සංඝයා විසින් ඇසුරු කරන ලද යනුයි. මෙසේ පළමු ගාථාවෙන් ජේතවනයේ වර්ණනාව ප්‍රකාශ කොට දැන් ආර්ය මාර්ගයේ වර්ණනාව ප්‍රකාශ කරනුයේ **කම්මං විජ්ජා** යනාදිය කියන ලදී. එහි **කම්මං** යනු මාර්ග චේතනාවයි. **විජ්ජා** යනු මාර්ග ප්‍රඥාවයි. **ධම්මා** යනු සමාධියයි. නැතහොත් සමාධි පාක්ෂික ධර්මයෝයි. **සීලං ජීවිත මුත්තමං** යනු සීලයෙහි පිහිටියහුගේ ජීවිතය ද උතුම් යැයි දක්වයි. එසේ නැතහොත් **විජ්ජා** යනු දෘෂ්ටි සංකල්පය **ධම්මො** යනු වායාම සති සමාධි ආදියයි. **සීලං** යනු වාචා කම්මන්ත ආජීව යනාදියයි. **ජීවිත මුත්තමං** යනු මේ සීලයෙහි පිහිටි පුද්ගලයාගේ ජීවිතය නම් උතුම්ය යනුයි. **එතෙන මච්චා සුජ්ඣනති** යනු මේ අෂ්ටාංගික මාර්ගයෙන් සත්ත්වයෝ පිරිසිදු වෙත් යනුයි. **නසමා** යනු යම්හෙයකින් මාර්ගයෙන් පිරිසිදු වෙත් ද ගෝත්‍රය ධනය ආදියෙන් නොවෙත් ද එහෙයිනි.

යොනිසො විචිනෙ ධම්මං යනු උපායෙන් බෝධිපාක්ෂික ධර්ම සොයන්නේය යනුයි. **එවං තත්‍ථ විසුජ්ඣති** යනු මෙසේ ඒ ආර්ය මාර්ගයෙහි පිරිසිදු වන්නේය යනුයි. එසේ නැතහොත් **යොනිසො විචිනෙ ධම්මං** යනු උපායෙන් ආර්ය සත්‍ය ධර්මය සොයන්නේය යනුයි. දැන් සැරියුත් තෙරුන්ගේ වර්ණනාව ප්‍රකාශ කරමින් **සාරිපුතෙතා වා** යනාදිය කියන ලදී. එහි **සාරිපුතෙතා වා** යනු අවධාරණ වචනයකි. මේ ප්‍රඥා ආදියෙන් සැරියුත් ම ශ්‍රේෂ්ඨයැයි කියයි. **උපසමෙන** යනු කෙලෙස් සන්සිඳුවීමෙනි. **පාරංගතො** යනු නිවනට ගියේ යනුයි. යම්කිසිවෙක් නිවන් වන් භික්ෂුවක් වේ ද එවන් අයෙක් නැත. **එතාවපරමො සියා** තෙරුන්ට වඩා වැඩි ශ්‍රාවකයෙක් නැතැයි කියයි.

අතීතං යනු අතීත පංචස්කන්ධයෙහි ය. **නාන්වා ගමෙය්‍ය** යනු **තණ්හා** දිට්ඨි ආදියෙන් අනුව නොයන්නේය යනුයි. **නපපටිකංඛෙ** යනු තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොපතන්නේය යනුයි. **යදනීතං** යනු මෙහිදී

හේතු වචනයකි. යම්හෙයකින් යමක් ඉකුත් වී ද එය ප්‍රහීණ විය. නිරුද්ධ විය. අන්තංගත විය. එහෙයින් එය අනුව නොයන්නේය. යම්හෙයකින් යමක් එහි නොපැමිණියේ ද නූපන්නේ ද ඇති නොවූයේ ද එහෙයින් එය ද ප්‍රාර්ථනා නොකරන්නේය. **තඤ්ච තඤ්ච** යනු පවත්නා වූ ධර්මය යම් යම් තැනක ද එය ඇතිවූයේ ඒ ඒ තැනම අනිච්චානුපස්සනා ආදී සප්ත අනුපස්සනාවන්ගෙන් දකියි. අරණ්‍ය ආදියෙහිදී හෝ **ඒ ඒ තැන දකියි. අසංගිරං අසංකුප්පං** යන මෙය විදර්ශනාව හා ප්‍රතිවිදර්ශනාව **දක්වනු** පිණිස කියන ලදී. විදර්ශනාව වනාහි රාගාදීන්ගෙන් නොඇද දමයි. නොකිපෙයි. (එහෙයින්) අසංගිර අකුප්ප වෙයි. එය **අනුබ්‍රූහයෙ** වඩන්නේය. නැතහොත් නිර්වාණය රාගාදීන්ගෙන් නො ඇද වැටෙයි. කෝප නොවෙයි යන අර්ථයෙන් අසංගිර අසංකුප්ප වේ.

තං විදවා පණ්ඩිත භික්ෂුවයි. **අනුබ්‍රූහයෙ** නැවත නැවත ඒ අරමුණ වූ ඵල සමාපත්තියට පැමිණෙන්නේ වර්ධනය කරන්නේය යන අර්ථයයි. ඒ වර්ධනය වන දේය සඳහා **අජ්ජව කිච්චං ආතපපං** යි කියන ලදී. කෙලෙස් තැවීම වෙසෙසින් තැවීම් නිසා ආතප්ප යයි ලබන ලද නම් ඇති වීර්යය අද ම කළ යුතුය. **කො ජඤ්ඤා මරණං සුවෙ** යනු හෙට ජීවිතය හෝ මරණය හෝ වේයැයි කවරෙක් දනී ද? අද ම දන් දෙමි. සිල් හෝ රකිමි. අන්‍ය හෝ කුසලයක් කරමි. අදට ප්‍රපඤ්ච තිබේ. හෙට හෝ ඊළඟ දවසෙහි හෝ දන්නෙමියි සිත් නූපදවා අද ම කරන්නෙමියි වීර්යය කළ යුතුයයි දක්වයි. **මහා සෙනෙන** යනු සර්ප, ගෝනුසු විෂ ආයුධ ආදී නොයෙක් මරණ කරුණු ඔහුගේ සේනාව වේ. ඒ මහත් වූ සේනාව වශයෙන් මහා සෙනෙන නම් වේ. මෙවන් ස්වරූප ඇති මාරයා සමග මම බුද්ධපූජාදී තමාට අවශ්‍ය පින්කමක් කරනතුරු කිහිප දවසක් බලාපොරොත්තු වෙව. මෙසේ මිනු සහටව ආකාර සංඛ්‍යාත දෙයක් හෝ සියයක් හෝ දහසක් ගෙන කිහිප දිනක් බලාපොරොත්තු වෙව. මෙසේ අල්ලස් දීම් සංඛ්‍යාත දෙයක් හෝ මේ බලසමූහයෙන් යටපත් කරන්නෙමියි මෙසේ බලරාශි සංඛ්‍යාත සංගරයක් හෝ නැත. **සංගරො** යනු මිත්‍රත්වය ඇතිකිරීම, අල්ලස්දීම බලරාශිය සැකය වැඩීම ආදියයි. එහෙයින් මේ අර්ථය කියන ලදී. **අතන්දිතං** යනු කම්මැලි නැති වීර්ය ඇති යනුයි. මෙසේ පිළිපන් බැවින් භද්‍ර වූ එක් රාත්‍රියක් මොනුට ඇත යන අර්ථයෙන් **භද්දෙකරත්ත** නම් වේ. **ඉති** යනු මෙසේ පිළිපන් පුද්ගලයා මේ භද්දේක රත්තයෙකි යැයි රාගාදි සිත් ඇති බැවින් ශාන්ත වූ බුද්ධ මුනිවරයා ගැන කියනු ලැබේ.

චකඛුනා පඤ්ඤාය ච යනු ඇසින් ද ප්‍රඥාවෙන් ද යනුයි. නැතහොත් ඇස ම වූ ප්‍රඥාවෙනි. **සතියා පඤ්ඤායච** යනු සිහියෙන් ද ප්‍රඥාවෙන් ද යනුයි. සිහියෙන් විශිෂ්ට වූ ප්‍රඥාවෙනි. **කායෙන** යනු නාම කයිනි. **දිබ්බචකඛු සුවිසුද්ධං** යනු දිව්‍යමය ඇස මනාව පිරිසිදු විය යනුයි. යමක් සාක්ෂාත් කෙරෙයි යන අදහසයි. **පුබ්බෙ නිවාසා** යනු පළමු ජාතීන්හි වසන ලද ස්කන්ධයන් ය. **ඉද්ධිවිධා** යනු ඍද්ධි කොටස් ය. **නිරොධො** යනු නිවනයි. සෙස්ස මනාව දතහැකි ම ය.

යසස සෙලූපමං චිත්තං යනු එකසේ ඝන වූ පර්වතයක් මෙන් ප්‍රකෘති සුළකින් හෝ ලෝක ධර්ම සුළඟින් හෝ අකම්පා නොකළ හැකි බැවින් යමෙකුගේ සිත පර්වතයකට උපමා වේ ද එහෙයින් ඨිතං භානුකම්පතියි කියන ලදී. **රජනීයෙසු** යන ලාභාදියෙහි ය. **කොපනෙය්‍යෙ** යනු අලාභාදියෙහි ය. **කුතොනං දුකඛමෙසසති** යනු මේ වඩන ලද සිත ඉක්මවන ලද ලෝක ධර්මය ඇති ඒ උතුම් පුරුෂයාව ලෝකධර්ම හේතු වූ දුකට නොපමුණුවන්නේය යනුයි.

යො බ්‍රාහ්මණො යනු පව් බැහැර කරන ලද හෙයින් බ්‍රාහ්මණ වූ යනුයි. දක්නා ලද දේ මංගල යයි කියන බැවින් හෝ හුනුංකාර කසාව ආදී පාපධර්ම ඇතිව හුදෙක් උපන් මාත්‍රයෙන් හෝ බමුණෙකැයි නොපිළිගනී. ඒ බ්‍රාහ්මණයා බැහැර කරන ලද පව් ඇති බැවින් හුනුංකාරය ප්‍රහාණය කිරීමෙන් **නිහුනුංක** වේ. රාගාදී කසාවන් නොමැතිකමින් **නිකසාව** නම් වේ. සීල සංවරයෙන් සංයම වූ සිත් ඇති බැවින් **යතත** නම් වේ. සතර මාර්ගඥාන සංඛ්‍යාත වූ ඥානයන්ගෙන් කෙළවර වූ නිවනට හෝ ඥානයන්ගේ කෙළවරට ගිය බැවින් වෙදනතගූ නම් වේ. මාර්ග බ්‍රහ්මචර්යාව වසන ලද බැවින් **වුසිත බ්‍රහමචරිය** නම් වේ. **ධමෙමන සො බ්‍රහමවාදං වදෙය්‍ය** යනු ඒ බ්‍රාහ්මණය, මම වෙමි යන මේ ආදිය කියන්නේය යනුයි. යමෙකුට සියලු ලෝකයෙහි කිසිතැනක එක් අරමුණක හෝ රාගසසද දෝසුසස මානුස්සද දිට්ඨි උස්සද යන මේ උස්සදයෝ නැත්තේ යන අර්ථයයි.

නගාධති යනු නොපිහිටයි යනුයි. **සුකකා** යනු ශුක්ල සංඛ්‍යාත වූ ග්‍රහයෝ ය. ඉදින් සඳ හිරු ආදියේ ආලෝකය නැත්තේ ද අඳුරම වන්නේ යයි සැක කරද්දී ඒ සඳහා **තමො තපථ න විජජති** යි කියන ලදී. **සදා ච අතතනා** වෙදි යනාදියෙහි මෙබඳු වූ නිවන ආත්ම ප්‍රත්‍යක්ෂ

ඥානයෙන් යම්විටෙක විඳි ද එවිට රූප අරූප ධර්මයෙන් ද සැප දුක්වලින් ද ඉවත් වූයේ වෙයි.

සකෙසු ධමෙමසු යනු ස්වකීය ආත්ම භාව සංඛ්‍යාත වූ උපාදාන ස්කන්ධයන්හි ය. බොහෝසෙයින් ආධ්‍යාත්මික විදර්ශනාවට පිවිසීම වෙයි. **එතං පිසාචං** යනු අජකලාපකය. මේ ඔබ විසින් කියන ලද පිසාචයා ද ක්ලේශ පිසාචයා ද (යන දෙදෙනායි) යනුයි. **පකකුලං** යනු ඔබ විසින් කියන ලද අක්කුල පක්කුල අනුකරණයයි. **අතිවතතති** යනු ඉක්මවයි යනුයි.

නාභිනන්දති ආයතනං යනු පැමිණෙන පුරාණ බිරිඳ ගැන හෝ වෙන තැනැත්තියක් ගැන හෝ සතුටු නොවෙයි. සිතින් නොපිළිගනී යනුයි. **පකකමනනිං නසොචති** යනු එය ම ය. **සංගා සංගාමජිං මුතතං** යනු පස්වැදෑරුම් සංගයන්ගෙන් මිදුණු සංගාමජි භික්ෂුවයි.

බවහෙජ යනු බහු එජ යනුයි. **නහායති ජනෝ** යනු එයින් ඒ පිරිසිදු බව නම් ඇති නොවේ යන අදහසයි.

ජාති බලනිසෙධං යනු ජාති බලයේ වැළැක්වීමයි. **සහායා වත** යනු සමථ විදර්ශනා භාවනාවෙන් එක්ව යෑම් වශයෙන් ඒකාන්තයෙන් සහාය වූ යනුයි. කලින් කල යෝග්‍ය වූ ධර්මය ඇසීම් වශයෙන් බොහෝ කලක් වේ. මේවායේ සමාගමය හා යෙදේ යන අර්ථයෙන් **විරරතත සමෙනිකා** නම් වේ. **සිථිල මාරබහ** යනු ලිහිල් වූ උත්සාහය කොට යනුයි.

තතු භිකඛවෙ! කො විසෙසො යනු ශාස්තෘ ශ්‍රාවකයාගේ පංච උපාදානස්කන්ධයන්හි කලකිරීම් ආදිය ද පූර්වභාග ප්‍රතිපදාවෙහි වූ අනුපාදා විමුක්තිය ද යටද මත්තෙහි ද වූ විශේෂ ස්වභාවය ද දක්වයි. විමුක්තියේ නානාත්වයක් නැතැයි එය කියන ලදී. එහි විශේෂභාවය පරාමර්ශනය කෙරේ. එහි කවර විශේෂයක් ද? **අධිපපායාසො** යනු අධික ප්‍රයෝගයයි. **නානාකරණං** යි විශේෂත්වය ම කියන ලදී. **අයං බො භිකඛවෙ විසෙසො** යනු මහණෙනි, ඉදින් ශ්‍රාවකයාගේ ද ශාස්තෘහුගේ ද විමුක්තියෙහි විශේෂත්වයක් නැත්නම් ස්වයම්භූ ඥානයෙන් වාසනාව සහිත සියලු කෙලෙස් ක්ෂය කොට සම්මා සම්බෝධිය අවබෝධ කොට නූපන් ආර්ය මාර්ගය අන්‍ය සිතක ඉපිදවීම ආදී සියලු සර්වඥ ගුණ

සමායෝගයක් වේ. සම්මා සම්බුදුරදුන්ගේ ප්‍රඥා විමුක්තියෙන් මේ වෙසෙස වේ. එහි **අනුපපනනසස** යනු නොපවතින දෙයෙහි ය. ආර්යමාර්ගය වනාහි කාශ්‍යප සම්බුදුන් ඉපිදවී ය. අනතුරුව අන්‍ය වූ ශාස්තෘවරයෙක් ඉපිදවූයේ නොවේ. එහෙයින් මේ භාග්‍යවතුන් වහන්සේ නූපන් මාර්ගයේ උපදවන්නා නම් වේ. **අසඤ්ඤාතසස** යනු එයට ම පර්යාය වචනයකි. **අනකඛාතසස** යනු නොකියන ලද්දහුගේ ය. මාර්ගය දන්නේනුයි **මගඤ්ඤූ** නම් වේ. මාර්ගය දත්තේ ප්‍රකට කළේ නුයි මගග විදූ නම් වේ. මාර්ගයේ ද අමාර්ගයේ ද දක්ෂ වූයේ නුයි **මගගාමගග කොවිදො** නම් වේ. මග්ගානුගා යනු මාර්ගය අනුව යන්නෝ ය. **පචඡා සමනනාගතා** යනු මම පළමුව පැමිණි වූයේ වෙමි. ශ්‍රාවකයෝ පසුව පැමිණියාහු වෙත් යනුයි.

නීච කුලයෙහි උපන්නේය ආදියෙන්, අඳුරෙන් යුක්ත වූයේ නුයි **තමො** නම් වේ. කාය දුශ්චරිත ආදියෙන් නැවත නිරය අන්ධකාරයට පැමිණෙන හෙයින් **තමො පරායණො** නම් වේ. මෙසේ දෙපසින් ම අන්ධකාර සමූහය ම කියන ලද්දේ වෙයි. ආඪ්‍ය කුලයෙක උපන්නේය ආදියෙන් එළියෙන් යුක්ත වූයේ නුයි **ජොති** නම් වේ. ආලෝකමත් වූයේ යැයි කියන ලද්දේ වෙයි. කාය සුචරිත ආදියෙන් නැවත ස්වර්ගයේ උපත වූ භවයට පැමිණෙන හෙයින් **ජොති පරායණ** නම් වේ. මේ ක්‍රමයෙන් අනෙක් දෙක ද දතයුතුය.

නතං දළහං බන්ධනමාහු ධීරා යන මෙහි **ධීරා** යනු බුද්ධාදි පණ්ඩිත පුරුෂයෝ ය. යම් බන්ධනයක් හැකිලි සංඛ්‍යාත වේ ද යකඩින් නිපන් අයෝමය දම්වැල් බන්ධන සංඛ්‍යාත වූවක් වේ ද දාවමය වූවක් වේ ද බුබුස් තණවලින් රැහැනක් කොට කරන ලද රජ්ජු බන්ධනයක් වේ ද එය කඩු ආදියෙන් සිඳින්නට හැකි බැවින් ථීර යැයි නොකියත් යන අර්ථයයි. **සාරත්තරත්තා** යනු රත් වී ඇලුණු යනුයි. දැඩි රාගයෙන් රත් වූ යන අර්ථයයි. **මණිකුණ්ඩලෙසු** යනු මැණික්වල ද කොඩොල්වල ද යනුයි. නැතහොත් මැණික් නමැති සිත්වල හෝ කොඩොල්වල ය. **එතං දළහං** යනු යමෙක් මිණි කොඩොල්හි දැඩිව ඇලුණුහු ද ඔවුන් තුළ යම් රාගයක් වේ ද පුත්‍ර දාරාවන් කෙරෙහි අපේක්ෂාවෙන් වූ යම් තෘෂ්ණාවක් වේ ද ඒ ක්ලේශමය වූ බන්ධනය පණ්ඩිත පුරුෂයෝ දැඩි වේ යැයි කියයි. **ඔහාරිනං** ඇද දමා සතර අපායෙහි හෙලන හෙයින් අවහරති නම් වේ. යටින් ගෙන යානුයි ඔහිරිනං නම්. **සිථිලං** යනු බඳින තැන සම් ආදිය

කෝප නොකොට (නොරිදවා) බඳින බව ද නොහඟවා ඡලමාර්ග බිම් මාර්ග ආදියෙහි වැඩ කරන්නට දෙන්නේය යන අර්ථයෙන් සිථිල නම් වේ. **දුපපමුඤචං** ලෝභ වශයෙන් එක්වරක් හෝ උපන් කෙලෙස් බන්ධනය දෂ්ට කළ තැනින් කැස්බකු මෙන් ඉවත් කළ නොහැකි වේ නුයි දුප්පමුඤච නම් වේ. **එතමපි ඡෙජ්ජාන** යනු මේ දැඩි වූ කෙලෙස් බන්ධනය ඥාන නමැති කඩුවෙන් සිඳ දමා අපේක්ෂා නැතිව යනුයි. **කාමසුබං පහාය පරිබබජජනති** යනු ඉවත්ව යන් පැවිදි වෙත් යන අර්ථයයි.

චෙතෙති යනු අකුසල චේතනා වශයෙන් සිතයි යනුයි. **පකපෙපති** යනු ඒ අකුසල සිතිවිල්ල ම කාය කර්ම වාක් කර්ම බවට පැමිණීම් වශයෙන් විතර්ක කරවයි යනුයි. **අනුසෙති** යනු රාගාදී අනුසයක් ම සිත්හි ප්‍රහීණ වී නොමැති බැවින් සයනය කෙරේ යනුයි.

ආරමමණමෙතං හොති විඤඤාණසස ඨිතියා යනු යම් ඒ චේතනාවක්, කැපකිරීමක් අනුසයනයක් වේ ද එය අභිසංස්කාර විඤඤාණයේ ස්ථිතිය පිණිස, පැවැත්ම පිණිස හේතුවේ යන අර්ථයයි. **ආරමමණෙ සතිපනිටයා නිසස විඤඤාණසස හොති** යනු පෙර කියන ලද ප්‍රත්‍ය ඇතිකල්හි අභිසංස්කාර විඤඤාණයේ ක්‍රියාව දුවවා ප්‍රතිසන්ධිය ඇදගැනීමේ සමත් බව සම්පාදනය කරන හෙයින් ප්‍රතිෂ්ඨාව වෙයි. **ආයති පුනබභවාභිනිබබතති** යනු මත්තෙහි පුනර්භව සංඛ්‍යාත වූ විඤඤාණ ආදියේ පහළවීම වේ යනුයි. **නො චෙ භිකඛවෙ චෙතෙති** යනාදියෙන් අකුසල කර්මයම ප්‍රතික්ෂේප කෙරේ. මෙය වනාහි මෙහි සංක්ෂේප අර්ථයයි. ඉදින් කිසිකලෙක යෝනිසෝ මනසිකාර අකුසල චේතනාව නොපවතී ද අනුසය ප්‍රහීණ වූයේ නොවේ. ඒවා කුසල අභිසංස්කාර විඤඤාණයේ ප්‍රතිෂ්ඨාව වේ ම ය. අභිසංස්කාර විඤඤාණයේ ප්‍රතිෂ්ඨාව වේ ම ය. අභිසංස්කාර විඤඤාණය ඇතිකල්හි ද මත්තෙහි පුනර්භවයක පහළවීම වන්නේයයි කියන්නට සුදුසුමය. තෙවැනි වාරය කියන ලද ප්‍රතිපක්ෂ ක්‍රමයෙන් දතයුතුය.

නෙසො භිකඛවෙ! අරියසස විනයෙ සමුදෙදායා යනු නොපිරිවිය හැකි අර්ථයෙන් ද සන්සිඳීම් අර්ථයෙන් ද ඉක්මවිය නොහැකි අර්ථයෙන් ද සාගරය සමුද්ද යැයි කියන්නේ ද එයින් සීයෙන් කොටසකින් ද දහසින් කොටසකින් ද චක්ෂු ආදියේ ම මේ න්‍යාය ලබන්නේ යයි දක්වන්නට කියන ලදී. එහෙයින් **චකඛු භිකඛවෙ පුරිසසස සමුදෙදා තසසරූපමයො**

වෙගො යි කියන ලදී. රූපයන්හි සත්ත්වයන් එල්ලෙන හෙයින් රූපායතනය ම වේගය වේ. ඇසේ වේගය යන අර්ථයයි. **යො තං රූපමයං වේගං සහති** යනු යම් භික්ෂුවක් විෂය සමග ඇස අනිත්‍ය වශයෙන් දුක්ඛ වශයෙන් අනාත්ම වශයෙන් ස්පර්ශ කරනුයේ එහි කලකිරෙනුයේ නොඇලෙනුයේ ඊට බැඳුණු බැවින් කෙලෙස් දැලින් මිදෙනුයේ **අභිභවනය** කෙරෙයි. අයං වුච්චති **අනාරි චක්ඛු සමුද්දං** යනු මේ භික්ෂුව චක්ෂු සංඛ්‍යාත වූ සමුද්‍රය තරණය කළේ යැයි කියනු ලැබේ යනුයි.

අන්‍ය ක්‍රමයක්ද වේ. **චක්ඛු භික්ඛවෙ! පුරිසස්ස සමුද්දො** යනු ඉදින් නොපිරවිය හැකි අර්ථයෙන් එසේ නැතහොත් සමුදනාර්ථයෙන් සමුද්ද නම් වේ. ඇසම සමුද්‍රයකි. එහි වනාහි පොළොවේ පටන් අකනිට්ඨ බඹලොව දක්වා නීල ආදී වූ අරමුණු එක්රැස් වන්නේ පරිපූර්ණ භාවයක් ඇති කරන්නට නොහැකි වෙයි. මෙසේ නොපිරවිය හැකි අර්ථයෙන් ද සමුද්ද වේ. ඇසද ඒ ඒ සීලාදී අරමුණුවල පහළ වෙයි. අසංඛත වී ඇතුළත් වන්නේ කෙලෙස් ඇතිවීමෙන් කාරණා භාවයෙන් සදෝෂ භාවයෙන් යේ නුයි සමුදනාර්ථයෙන් ද සමුද්ද වේ. එසේම ඇස ද තෘෂ්ණා ශ්‍රෝතාදීන්ගේ පහළවීමට දොරටුවක් බැවින් ඒවා කරණ කොටගෙන සන්තානයේ සමුදනාර්ථයෙන් ද තෙවන අර්ථයෙන් ද සමුද්ද වේ.

තසස රූපමයො වෙගො යනු සමුද්‍රයේ අප්‍රමාණ වූ රළමය වේගය මෙන් ඒ චක්ෂු සමුද්‍රයේ එක්රැස්වන නීලාදී භේද ඇති අරමුණ ලෙසින් අප්‍රමාණ වූ රූපමය වේගය දතයුතුය. **යොතං රූපමය වෙගං සහති** යනු යමෙක් ඒ චක්ෂු සමුද්‍රයෙහි රැස්වන රූපමය වේගය, මනාප රූපයෙහි ඇල්ම, අමනාප රූපයෙහි ද්වේෂය, අසමාන දැකීම් ඇත්තෙහි මෝහය යන මේ ආකාරයෙන් රාගාදී කෙලෙස් නූපදවමින් මැදහත් බැවින් ඉවසයි. **සඤ්ඤං** ආදියෙහි කෙලෙස් නමැති රළ සමග වූයේ **සඤ්ඤං** නම් වේ. කෙලෙස් ආවර්තනයන්ගෙන් යුක්ත වූයේ **සාවටට** නම්. කෙලෙස් ග්‍රහයන්ගෙන් යුක්ත වූයේ **සගහ** නම් වේ. කෙලෙස් රකුසන්ගෙන් යුක්ත වූයේ **සරකබස** නම් වේ. ක්‍රෝධ උපායාස වශයෙන් හෝ **සඤ්ඤ** නම් වේ. කාමගුණ වශයෙන් **ආවට්ට** සහිත වූයේය. මාතුගාම වශයෙන් ග්‍රහයන් සහිත වූයේය. **රකුසන්** සහිත වූයේ ය. මෙය කියන ලදී. 'මහණෙනි, ඌමි භයං යනු ක්‍රෝධ උපායාසවලට වෙනත් වචනයකි. මහණෙනි ආවට්ටගාහ යනු පංචවිධ කාමගුණයන්ට වෙනත් වචනකි. සෙසු දොරටුවලින් **මේ ක්‍රමය** මැයි.

සඋමිභයං දුනතරං අවවතාරි යනු රළ බියෙන් බිය සහිත වූ ඉක්මිය නොහැකි, අනිත්‍යතාදිය ඉක්මවිය යනුයි. **ලොකනතගු** යනු සංස්කාර ලෝකයේ අන්තයට ගිය යනුයි. **පාරංගතො නි වුචචති** යනු නිවනට ගියේ යැයි කියනු ලැබේ යනුයි.

බලිසා යනු සත්ත්වයන්ගේ අනර්ථ හේතුවෙන් බිලියමෙන් වූ බිළිකොක්ක මෙනි. **අනයෝ** යනු අනර්ථයෙනි. **බයාබාධාය** යනු දුක් පිණිසය. **ඉටඨා** යනු සොයන ලද හෝ නොසොයන ලද සුව අරමුණු ඇති බැවින් ඉෂ්ට වූ යනුයි. කැමතිවිය යුතු අර්ථයෙන් **කානනා** නම් වේ. සිත වඩන අර්ථයෙන් මනාපා නම් වේ. ප්‍රියයේ භාවය බැවින් **පියරූප** නම් වේ. ක්ලේශ කාම සහිත බැවින් **කාමූපසංහිත** නම් වේ. රාගය ඇතිකිරීමේ අර්ථයෙන්, සිත සතුටු කිරීම් අර්ථයෙන් **රජනීය** නම් වේ. **තණෙහව** යනු ඒ රූපාරම්මණයයි. නීලාදී වශයෙන් නොයෙක් භේදයන්ට බිඳුණු රූපායතනය රූප අරමුණ ඇතිකමින් ද චක්ඛු විඥෙය බැවින් ද එක්වන් බව නොඉක්මවයි. ඒ ස්වභාවය, මානාත්වය ගෙන තණෙහව යයි කියන ලදි. **අභිනනදති** යනු සතුටු වූ ප්‍රීතියෙන් යුත් තණ්හාව ඉදිරියේ සතුටු වෙයි යනුයි. **අභිවදති** යනු අහෝ සැපතකි. අහෝ සැපතකිය කියවන තෘෂ්ණාව ලෙසින් ප්‍රකාශ කෙරේ. **අජඣොසාය තිටඨති** යනු ගිලදමා නිමවා සිටිය යනුයි. **අයං වුචචති භිකඛවෙ භිකඛු ගිලබළිසො මාරසස** යනු මේ භික්ෂුව ක්ලේශ මාරයාගේ ඇම වූ රූප තණ්හාව ගිලදමා සිටියේ යැයි කියනු ලැබේ. සෙසු වාරයන්හි ද මේ ක්‍රමයෙන් ම අර්ථය දතයුතුය. **අභෙදි** යනු බින්දේය යනුයි. **පරිභෙදි** යනු හැම කොටස් ලෙසින් බිඳුනේය යනුයි. සෙස්ස (කියන ලදමය) ප්‍රකට ම ය.

අයං ලොකො සනතාප ජාතො යනු මේ සත්ත්වලෝකයා හටගත් සන්තාප ඇත්තේ ඤාති ව්‍යසන ආදී වශයෙන් උපන් ශෝක සන්තාප ඇති රාගාදි වශයෙන් උපන් දාහතැවුල් ඇති යන අර්ථයයි. **එසස පරෙතො** යනු නොයෙක් දුක් සහගත ස්පර්ශයන්ගෙන් මඩනා ලද්දේ යනුයි. **රොදං වදති අතතනො** යනු තමා විසින් ස්පර්ශ කරන ලද ඒ ඒ දුක නොවඩන ලද කය ඇති බැවින් ඉවසන්නට නොහැක්කේ අහෝ දුකකි. මෙවන් දුකක් මාගේ සතුරෙකුටවත් නොවේවා ආදියෙන් වැලපෙමින් කියයි යනුයි. කවර හෙයින් ද? **යෙන යෙන හි මඤඤනති තතො නං හොති අඤඤථා** යම්හෙයකින් මේ සත්ත්වයෝ යම් යම් ප්‍රකාරයකින් තමාගේ දුකට ප්‍රතිකාරයක් කල්පනා කෙරෙත් ද ප්‍රාර්ථනා කෙරෙත් ද ඒ දුකට

එයින් අන්‍ය වූ ආකාරයකින් ප්‍රතිකාර කළ යුත්තේ වෙයි. යම් ආකාරයකින් තමාගේ වැඩීම සිතත් ද එයින් අන්‍ය ආකාරයකින් නොවැඩීම වෙයි. මෙසේ අන් ලෙසකින් වඩනා ලද්දේ බලාපොරොත්තු කඩවීමට පැමිණෙයි. **අයං භවසන්තතා** කාමාදී භවයන්හි ඇලුණු සත්ත්ව ලෝකයා ය. එසේ වුවත් භවයේම සතුටුවේ. එහි නොකලකිරෙයි. **යදභිනන්දති තං භයං** යනු යම් කාමාදි භවයක සතුටු වේ ද ඒ දේ ජරා මරණ ආදී නොයෙක් ව්‍යසනවලින් ලුහුබඳනා ලද බැවින් ඉතා භයානක අර්ථයෙන් භය නම් වේ. **යස්‍ස භායති** යනු යම් **ජරාමරණ** ආදියකින් බිය වේ යනුයි. එය දුකෙහි අධිෂ්ඨානය බැවින් ද **දුක්ඛ** දුක්ඛතාවෙන් යුත් බැවින් ද දුකඛං නම් වේ.

භව විපජහානාය යනු භවය දුරුකරනු පිණිස ය. ඛො යනු අවධාරණාර්ථයේ නිපාතයකි. 'ඒකාන්තයෙන්ම සමුදය ප්‍රහාණයෙන් කාමාදි භවය ප්‍රහාණය කරනු පිණිස මා විසින් අවබෝධ කළ මේ මාර්ග බ්‍රහ්ම චර්යාව වසනු ලැබේ යන මෙය කියන ලද්දේ වෙයි.

මෙසේ එක් අංශයකින් ආර්ය මාර්ගයේ නියාණික භාවය දක්වා දැන් අන්‍ය මාර්ගයේ නියාණික භාවය ප්‍රතික්ෂේප කරමින් **යෙ හි කෙචි** යනාදිය කියන ලදී. එහි **භවෙන** යනු රූප භවයෙන් හෝ අරූප භවයෙන් ය. **භවසස** යනු සංසාරයේ ය. **විපජමොකඛං** යනු භවයෙන් මිදීම, සංසාර ශුද්ධිය යන අර්ථයයි. කෙසේ නමුත් මහණ බමුණෙ! එහිදී නිවන් හැඟීම ඇත්තාහු භවගාමී කර්මයෙන් ද රූප අරූප ධ්‍යානයෙන් ද එයින් නිපන් දෙයින් ද උත්පත්ති භවයෙන් ද භවවිසුද්ධිය ප්‍රකාශ කරමින් භවය කරණ කොටගෙන භව විප්‍රමෝක්ෂය කියන්නම් වේ. එහෙයින් **සඛෙඛ තෙ අවිපජමුතතා භවසමා වදාමි** යි කියන ලදී. එසේ නැතහොත් **භවෙන** යනු භව දෘෂ්ටියෙනි. වෙයි සිටියි සදාකාලිකයි යනුවෙන් පවත්නා හෙයින් ශාස්වත දෘෂ්ටිය භවදිට්ඨි යැයි කියනු ලැබේ. භව දිට්ඨිය ම දෙවැනිපදය ලොප් කිරීමෙන් භව යැයි කියන ලදී. භව තණ්හා ආදියේ මෙනි. භව දෘෂ්ටි ලෙසින් ම මෙහිදී ඇතැම්හු භව විශේෂය හා භව විප්‍රමෝක්ෂය හඟිත්. එය බක බ්‍රහ්ම තෙම 'ඉදං නිච්චං ඉදං ධුවං ඉදං සසසතං ඉදං අවිපරිණාම ධම්මං'යි කියන ලදී. **විභවෙන** යනු උච්ඡේද දෘෂ්ටියෙනි. නොවෙයි. විනාශ වෙයි. නැසෙයි යනුවෙන් පවත්නා හෙයින් උච්ඡේද දෘෂ්ටිය කියන ලද පරිදිම විභව යැයි කියනු ලැබේ. භවස්‍ස නිස්සරණමාහංසු යනුවෙන් සංසාර ශුද්ධිය කීහ. මෙලොව ඇතැම්හු

උච්ඡේද දෘෂ්ටි වශයෙන් සංසාර ශුද්ධිය ප්‍රකාශ කරත්. එසේම 'භවත්නි, යම් හෙයකින් මේ රූපී වූ චාතුර්මහා භූතික ආත්මය -පෙ- නේවසංඥා නාසංඥායතනයට පැමිණ වාසය කෙරෙයි ද භවත්නි, එතෙකින් මේ ආත්මය මනාව සිඳිගියේ වෙයි යනුවෙන් කියන ලදී. **අනිසසථා** යනු නොදමන ලද යනුයි. **උපධීහි පටිචච දුකඛමිදං සමෙහාති** යනුවෙන් එහි හේතුව කියන ලදී. එහි **උපධී** යනු ස්කන්ධ ආදී උපධීන් ය. කුමක් කියන ලද්දේ වෙයි ද? යම්තැනක මේ දෘෂ්ටිගතිකයෝ නිවන් හැඟීම් ඇත්තෝ ද එහිදී ස්කන්ධ උපධි ක්ලේශ උපධි අභිසංස්කාර උපධි යනාදිය අවබෝධ කරන ලද්දේය. එහි දුක්ඛ නිස්සරණත්වයක් කොයින් ද? පරමාර්ථ වශයෙන් වූ යම් දුක්ඛ නිස්සරණයක් වේ ද එය දක්වන්නට **සබබූපාදානකඛයා නතථි දුකඛසස සමභවො** යි කියන ලදී.

ලොකමිමං පසස යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ තමාගේ සිතට කථාකරයි. **පුථු** යනු වෙන වෙනම යනුයි. **අවිජජාය පරෙතං** යනු මෝහයෙන් මඩනා ලද යනුයි. **භූතං** යනු ස්කන්ධ පංචකයයි. **භූතරතං** යනු ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි ය. පුරුෂයා ස්ත්‍රිය කෙරෙහි ය යනුවෙන් අනෙහාන්‍ය වශයෙන් සත්ත්වයන් කෙරෙහි ඇලුණු යනුයි. ඒ භවයෙන් ම නොමිදුණේ ය. **යෙහි කෙ චි භවා** යනු ස්වල්ප මොහොතක් සිටින්නෝ හෝ දිගු කලක් සිටින්නෝ හෝ සැපවත් වූවෝ හෝ දුක්ඛිත වූවෝ හෝ වන්නෝ ය. **සබබධි** යනු උඩ යට සිරස යන සියලු තැනයි. **සබබතතතාය** යනු සියලු ස්වරූපයෙනි. **සබබෙ තෙ භවා** යනාදියෙහි සියලු භවයන් අනිත්‍ය යනාදියෙන් විදර්ශනාව සහිත මාර්ග ප්‍රඥාවෙන් නොවෙනස්ව බලන්නා වූ පුද්ගලයාගේ භව තණ්හාව ද ප්‍රහීණ වේ. නිරුද්ධ වේ. **විභවං** උච්ඡේදය ද (ප්‍රහීණ වේ) **නෙතති** නොපතයි. ඔහුගේ සියලු තෘෂ්ණාවන් මාර්ග ප්‍රඥාවෙන් ඉතිරි නැතිව නිරුද්ධ වන හෙයින් **නිබබාණං** නිවීම වෙයි. **නසස එවං නිබබුතසස භිකඛුනො අනුපාදා** ක්ලේශාභි සංස්කාරයන්ගේ දැඩිව අල්ලා නොගැනීමෙන් නොගන්නා බැවින් **පුනබභමො න හොති** පුනර්භවය නොවේ. මෙසේ සිදු වූ දෙයින් මඩනා ලද්දේ පස්වැදෑරුම් මාරයා දිනන ලද්දේ වන්නේය. මේ මාරයා සමග සංග්‍රාමයක් වන්නේය. සියලු භවය ඉක්මවූ තැනැත්තා ඉටු අනිටු දෙයෙහි එවන් ලක්ෂණවලට පැමිණි යනුයි.

අනුසොතගාමි අන්ධ පෘථග්ජනයායි. **පටිසොතගාමි** කල්‍යාණ පෘථග්ජනයායි. **ඨිතතතා** ශෛක්ෂයායි. අනෙකා අශෛක්ෂයායි.

අභිජාතියෝ යනු ජාතීන් ය. **කණ්හාභිජාතිකෝ** කෘෂ්ණ වූ නීච කුලයෙහි උපන්නායි. කණ්හං ධම්මං **අභිජායති** යනු කෘෂ්ණ වූ දසවැදෑරුම් දුශ්ශීල ධර්මය ප්‍රසව කෙරෙයි යනුයි. හෙතෙම එය ප්‍රසව කොට නිරයෙහි උපදී. **සුක්කං** ධම්මං යනු මම පෙරත් පින් නොකරන ලද බැවින් නීච කුලයෙහි උපන්නෙමි. දැන් පින් කරන්නෙමියි පුණ්‍ය සංඛ්‍යාත වූ ශුක්ල වූ පණ්ඩර වූ ධර්මය පහළ කෙරේ. ඔහු එයින් ස්වර්ගයේ උපදී. **අකණ්හං අසුක්කං නිබ්බාණං** ඉදින් නිවන කෘෂ්ණ වන්නේ නම් කෘෂ්ණ විපාක ගෙන දෙන්නේය. ශුක්ල වන්නේ නම් ශුක්ල විපාක ගෙන දෙන්නේය. දෙකම නොදෙන නිසා අකෘෂ්ණ අශුක්ල යැයි කියන ලදී. මෙහි නිවන යනුවෙන් අර්හත්වය අදහස් කරන ලදී. එය කෙලෙස් නිවීම කෙළවර ඇති වූ බැවින් නිබ්බාණ නම් වේ. මොහු එය ප්‍රසව කරයි. රැස්කරයි. **සුක්කාභිජාතිකෝ** යනු පිරිසිදු වූ උසස් කුලයෙහි උපන් යනුයි. සෙස්ස කියන ලද ක්‍රමයෙන් ම දතයුතුයි. කෘෂ්ණය කෘෂ්ණවිපාක ඇත්තේය යනාදී කර්ම චතුෂ්කයේ අර්ථය යට හාර සම්පාත වාරයෙහි බෙදන ලද්දේ ම ය.

මානුසත්තං යනු මිනිසත් බවයි. මනුෂ්‍ය යෝනිය යන අර්ථයයි. දෙව යනු කෘත්‍ය අකෘත්‍ය යන දෙකයි. කළයුතු දේ කළ යුතුය. නොකළ යුතු කිසිවක් නොකළ යුතුයැයි දක්වයි. **සුකිච්චං** යනාදිය කෘත්‍ය යනුවෙන් කියන ලද ඒවායේ ස්වරූපය දැක්වීමයි.

පධානානි යනු උතුම් වූ විශිෂ්ට වූ යනුයි. පූර්ව ගාථාවෙහි **පබබජිතෙසු** යනු විෂයාර්ථයේ සත්තමී විභක්තියයි. දෙවැන්නෙහි අධිකරණ අර්ථයයි. එහි **නිබ්බාණං** යනුවෙන් අර්හත්වය අදහස් කරන ලදී. කවර හෙයින් මෙහිදී ආමිෂ පරිත්‍යාගය අර්හත්වය සමග සුමධුරව දක්වන ලද ද? **දක්ඛිණාර්හයන් කෙරෙහි දක්ඛිණාදීමේ මහත්ඵල භාවය දක්වනු පිණිස ය.**

යෙන යෙන වා පන වත්ථුනා යනු උච්ඡේද ආදී වස්තුවෙනි. අජ්ඣාසිතා යනු භවතණ්හා ආදී වශයෙන් බැසගත් යනුයි. දෙවැන්නෙහි **යෙන යෙන වා වත්ථුනා** යනු අමරා විකෙඛප වස්තු ආදියෙනි. **ඉමිනා අසුභෙන කම්ම විපාකෙන** යනු අසුභ වූ කාය දුශ්චරිත ආදී කර්මයේ විපාක ඇති බැවින් අසුභ වූ අශිව වූ කර්ම විපාකයෙනි. ඉදං බාල ලකඛණං නිබබත්තති යනු පළමු භවයෙහි දුශ්චරිතවලින් යුත් බැවින්

මොහු බාලයෙක් වේයැයි උපලක්ෂණයක් ඇති වේ. **ඉදං සංකිලෙස භාගියං සුත්තං** යනු මෙසේ පැවති ඒ සූත්‍රය සංකිලෙස භාගිය නම් වේ යනුයි.

ඉමිනා සුභෙන යන මෙහි අර්ථය කියන ලද ක්‍රමය අනුසාරයෙන් දතයුතුය. එහි **මහාපුරිස ලකබණං** යනු පණ්ඩිත ලක්ෂණයයි. **කිලෙස භූමීහි** යනු ක්ලේශ ස්ථානවලින් හෝ ක්ලේශ අවස්ථාවන්ගෙන් හෝ ය. **සානුසයසස පරියුට්ඨානං ජායති** යනු ප්‍රහීණ නොවූ අනුසය ධර්මය ප්‍රත්‍ය සමායෝගයේ දී රාගාදිය නැගී සිටීම වශයෙන් පවතී යනුයි. **පරියුට්ඨිතො සංයුජ්ජති** යනු යමෙක් රාගාදියෙන් මඩනා ලද සිත් ඇත්තේ ද හෙතෙම කාමරාගාදිය සමග යෙදෙයි යනුයි. **සංයුජ්ජනෙනා උපාදියති** යනු යමෙක් කාමරාග සංයෝජනාදියෙන් යුක්ත වූයේ ද හෙතෙම කාම උපාදාන ආදී අකුසල කර්මද උපදවයි. සෙස්ස සියලු තැන ප්‍රකට වේ මය.

මෙසේ සොළොස් වැදෑරුම්ව නොයෙක් සූත්‍රයන්ගෙන් උදාහරණ ගෙන සාසන පට්ඨානය බෙදා දක්වා දැන් විසිඅට වැදෑරුම්ව සාසන පට්ඨානය දක්වන්නහු විසින් යම්හෙයකින් මේ පට්ඨාන විභාගය මූල පදයන්ගෙන් සංග්‍රහ කරන ලද ද මෙහි ද ඒවායින් සංග්‍රහ නොකරන ලද පෙදෙසක් නැත. එහෙයින් මූලපදය බෙදිය යුතු බව ද දක්වන්නට **තත්‍ථ කතමෙ අටඨාරස මූලපදා යි** විමසීම් වශයෙන් මූලපද උපුටා **ලොකියං ලොකුනතරං** යනාදියෙන් නව තිකය ද **ඨවො ච** යනුවෙන් විසිඅට වැදෑරුම් සාසන පට්ඨානය ද දක්වන ලදී.

එහි **ලොකියං** යනු ලෝකයෙහි නියුක්ත වූයේ ලෝකයන් දන්නා ලද්දේ ලොකිය වේ යනුයි. මෙහි වනාහි යම් සූත්‍රයක ලෞකික අර්ථය කියන ලද ද ඒ සූත්‍රය **ලෞකික** වේ. ලෝකෝත්තර අර්ථය ද එසේය. යම් සූත්‍රයක එක් පසෙකින් ලෞකික අර්ථය ද එක්පසෙකින් ලෝකෝත්තර අර්ථයද කියන ලද ද එය **ලෞකික ද ලෝකෝත්තර** ද වේ. යමක සත්ත්වයන් අදිටන් කොට සත්ත්ව ප්‍රඥප්ති මුඛයෙන් දේශනා කරන ලදද එය **සතතාධිට්ඨාන** නම් වේ. ධර්ම වශයෙන් දේශනා කරන ලද ද **ධම්මාධිට්ඨාන** නම් වේ. දෙකම ලෙසින් දේශනා කරන ලද්ද සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන ද වේ. මේ ක්‍රමයෙන් සියලු පදයන්හි අර්ථය දතයුතුයි. බුද්ධාදීන්ගේ ගුණ ස්තුති වශයෙන් පැවති සූත්‍රය **ඨව** නම් වේ.

එහි **සඡ්ඣිරං** යනු එකෙණෙහි ම දෙනගේ තනවලින් නික්මෙන උණුසුම් වූ කිරියි. **වුච්චති** යනු පරිණාම වේ යනුයි. මෙය කියන ලද්දේ වෙයි. යම්සේ දෙනගේ තනයෙන් නික්මෙන කිරි එකෙණෙහි ම නොමිදේ ද පරිණාම නොවේ ද දී බවට නොයයි ද මෝරු ආදී ඇඹුල් හා එක්වීමෙන් පසුව කලකින් ප්‍රකෘතිය අත්හරී. දී බවට පැමිණෙයි ද මෙසේ පාප කර්මය ද ක්‍රියා ක්ෂණයෙන්ම විපාක නොදෙයි. ඉදින් විපාක දේ ද නොයෙක් ස්වභාවයන්ගේ සහායෙන් වන්නේය. කිසි පව්කමක් කරන්නට උත්සුක නොවන්නේය. යම්තාක් කුසලයෙන් නිපන් ස්කන්ධ දරයි ද ඒ තාක් ඔවුහු එය රකියි. ඒවා බිඳීමෙන් අපායන්හි ඉපදීම් තැවීම් ලෙසින් විපාක දෙයි. විපාක දෙනු ලබන්නේ ද බාලයා දවමින් අනුව යයි. කුමක් මෙන් ද? **හසමවඡනෙනාව පාවකො** යම්සේ අලුවලින් වැසුණු පහවූ දැල්ල ඇති අඟුර පාගන ලද්දේ නමුත් අලුවලින් පැසුණු බැවින් පළමුව නොපිළිස්සෙයි. අලු රත්කොට සම් ආදිය දැවීම් වශයෙන් මොළය දක්වා දවමින් යයි. මෙසේ පාප කර්මය ද යමකු විසින් කරන ලද ද ඒ බාලයා දෙවන හෝ දෙවන ආත්ම භාවයෙහි නිරය ආදියෙහි නිපන්නේ දැවෙමින් අනුව යයි.

යසසින්ද්‍රියානි මේ එහි සංක්ෂේපාර්ථයයි. දක්ෂ රියදුරෙකු විසින් මනාව දමනය කරන ලද අසුන් මෙන් යම් භික්ෂුවකගේ ඉන්ද්‍රිය සය සන්සුන් බවට දැමුණු බවට සුසීල බවට ගියේ ද ඔහුගේ නවවැදෑරුම් මානය පහව් සිටි බැවින් **පහීණ මානසස** නම් වේ. සතර ආශ්‍රව නැතිකමින් **අනාසව** නම්. තාදී භාවයෙහි සිටි එබඳු පුද්ගලයාට දෙවියෝත් කැමති වෙති. මිනිස්සු ද දැකීමට ද (හමුවට) පැමිණීමට ද ප්‍රාර්ථනා කරත්.

ආහාර සති යනු ආහාරය හා බැඳුණු ඡන්දරාගය ප්‍රහීණ නොවී පැවති කල්හි ය. **සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා** යනු හාත්පසින් දශ දිශාව සිතින් අනුව ගොස් යනුයි. **නෙවජ්ඣගා** යනු නොලබන්නේය යනුයි. **පියතරං** යනු අතිශයින් ප්‍රිය වූ යනුයි. **අතතනා** යනු තමාගෙනි. **එවමපි යො පුථු අතතා පරෙසං** යනු මෙසේ තමාට වඩා ප්‍රිය වූ කිසිවෙකුත් නො දක්නා ලැබීම් වශයෙන් වෙන වෙනම අන්‍ය සත්ත්වයන්ගේ නො දක්නා ලැබීම් වශයෙන් වෙන වෙනම අන්‍ය සත්ත්වයන්ගේ ආත්මය ප්‍රිය වේ යනුයි. යම්හෙයකින් එය ම වේ ද එහෙයින් තමාට සුව කැමැත්තා අනුන්ට හිංසා නො කරන්නේය. තමාට සුව කැමති හෙයිනි.

භූතා යනු උපන් පහළ වූ යනුයි. **භවිසසනති** යනු පහළවෙත් යනුයි. නැතහොත් භූතා යනු ක්ෂීණාශ්‍රවයෝ ය. ඔවුහු ප්‍රහීණ කළ භවය ඇති බැවින් භූතයෝ ම ය. **ගම්සසනති** යනු පරලොවට යත් යනුයි. ක්ෂීණාශ්‍රවයෝ වනාහි අනුපාදිසේස නිවනට ය.

පියො ච හොති යනු ඉතා පිරිසිදු වූ සීල සම්පත්තියෙන් ද ඉතා පිරිසිදු වූ දෘෂ්ටි සම්පත්තියෙන් ද යුක්ත වූ ප්‍රිය පුද්ගලයා ප්‍රිය කළ යුත්තේ වෙයි යනුයි.

සීල දසසන සම්පනනං - ධම්මට්ඨං සච්චවාදිනං
අත්තනො කම්ම කුබ්බානං - නං ජනෝ කුරුතෙ පියං

සීලයෙන් හා දර්ශනයෙන් යුත් ධර්මයෙහි පිහිටි, සත්‍යවාදී වූ, තමාගේ කටයුතු කරන ඒ පුද්ගලයා ප්‍රිය කෙරේ යන්න කියන ලදී.

පාසාණ ඡත්‍යයකට මෙන් ගරු කළ යුතු බැවින් **ගරු** නම් වේ. උතුරු මිනිස්දම් ලෙසින් සම්භාවනා කළයුතු බැවින් **භාවනිය** නම් වේ. සීල ගුණයෙන් හෝ ප්‍රියත්වය ආදී ස්වභාවයන් දතයුතුය. එසේම, 'මහණෙනි, ඉදින් භික්ෂු තෙමේ සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය වේ ද මනාප වේ ද ගරු කළයුතු වේ ද සම්භාවනීය වේ ද ඔහුගේ සීල පරිපූර්ණත්වය කැමති විය යුතුයයි කියන ලදී. **වනතා** යනු සුදුසු කල කියමි යනාදි පංච ධර්මයන් තමා කෙරෙහි එළඹවා සබ්‍රහ්මචාරීන් ඔසවා තැබීම් බවෙහි සිට කියන්නා ය. **වචනකඛමො** යනු සබ්‍රහ්මචාරීන් විසින් යම් කිසිවක් කියනු ලබන්නේ සුවව වී ප්‍රදක්ෂිණා ගනු පිණිස ඔවුන්ගේ වදන් ඉවසානුයි වචනකඛම නම් වේ. නැතහොත් වත්තා යනු ධර්ම කථා වශයෙන් වචන කියනසුලු යනුයි. වචනකඛමො යනු ධර්මය සංවර්ණනා කරමින් අනුන් විසින් පැහැර ගත නොහැකි වී ඔවුන්ගේ විමසීම ඇසීමෙහි දක්ෂ බැවින් වචනක්ෂම වෙයි යනුයි. **ගම්භීරඤ්ච කථං කත්තා** යනු සත්‍ය, ප්‍රතීත්‍ය සමුත්පාද ආදි වෙනත් ගැඹුරු කථාවක් කරන්නා ය. **නොචට්ඨානෙ නියොකො** යනු ධර්ම විනය ආදිය අධර්ම විනය ආදී වශයෙන් නොකියා ධර්ම විනය ආදී වශයෙන් ම දක්වන හෙයින් අස්ථානයෙහි නොයොදවන්නෙක් වේ යනුයි.

මාතරං පිතරං හනත්වා යන මෙහි තෘෂ්ණාව පුරුෂයාව උපදවයි

යන කියමනෙන් තුන් භවයෙහි සත්ත්වයන් උපදවන හෙයින් තණ්හාව මව නාම වේ. මම අසවල් රජුගේ හෝ රාජමහාමාත්‍යයාගේ හෝ පුත්‍රයා වෙමියි පියා නිසා අස්මිමානය උපදින හෙයින් අස්මිමානය පියා නම් වෙයි. ලෝකයා රජු ඇසුරු කරන්නාක් මෙන් යම්හෙයකින් සියලු දෘෂ්ටිගති ශාස්වත උච්ඡේද දෘෂ්ටි දෙක ඇසුරු කෙරෙන් ද එහෙයින් ශාස්වත උච්ඡේද දෘෂ්ටි දෙක ක්ෂත්‍රිය රජවරු දෙදෙනා නම් වේ. දොළොස් ආයතන පැතිරුණු බැවින් අටක් හා සමානවන බැවින් රට නම් වේ. ආදායම සාධනය කරන අයකැමි පුරුෂයෙකු මෙන් ඒ තණ්හාව ඇසුරු කළ නන්දිරාගය අනුචරයා නම් වේ. **අනීඝෝ** යනු දුක් නැති යනුයි. **බ්‍රාහ්මණෝ** යනු ක්ෂීණාශ්‍රවයායි. මෙය කරණ කොටගෙන තෘෂ්ණාදිය අර්හත් මාර්ග ඥානය නමැති කඩුවෙන් නසන ලදී. ඉවත් කරන ලදී. **යාති** යනු ඒ බ්‍රාහ්මණයා නිදුක් වී යයි යනුයි.

කායෙ යනු රළු ශරීරයෙහි ය. **චිත්තං** යනු පදනම් වූ ධ්‍යාන සිතයි. **සමොදහති** යනු බහාලයි යනුයි. යම්විටෙක දෘශ්‍යමාන ශරීරයෙන් යනු කැමති වෙයි ද එවිට කායගතික වූ පාදක ධ්‍යාන සිත අධිෂ්ඨාන කෙරෙයි යන අර්ථයයි. **චිත්තෙපි කායං සමොදහති** යනු යම්විටෙක ඉක්මනින් යනු කැමති වෙයි ද එවිට පාදක ධ්‍යාන සිතෙහි කය ඇතුල් කරයි යනු වේ. චිත්තගතික වූ කය අධිෂ්ඨාන කරයි යන අර්ථයයි. **කායෙ සුබසඤ්ඤඤ්ඤව ලහුසඤ්ඤඤ්ඤව ඔකකමිත්වා** යනු යම්සේ බලවත් පුරුෂයෙක් හකුලන ලද බාහුව දිගහරින්නේ ද දිගහරින ලද බාහුව හකුලන්නේ ද යනුවෙන් කියන ලද ක්‍රමයෙන් ඍද්ධි ඇත්තා කයෙහි සුඛ සංඥාව ද ලහු සංඥාවද වෙත පැමිණ අනුන්ට පෙනෙන සිරුරින් රමණීය ආරාම ආදිය බලමින් චිත්තක්ෂණයකින් ම කැමති තැනට යයි.

යං තං ලොකුත්තරං ඤාණං යනු සියලු ලෝකය තරණය කොට අභිභවා සිටි හෙයින් කියන ලදී. ලෝකෝත්තර භූමියට අයත් බැවින් නොවේ. **සබ්බකාලෙ පවත්තති** යනුවෙන් ආවර්ජනය හා බැඳුණු පැවතුම් ඇති බැවින් කියන ලදී. නිරන්තරයෙන් පවතී යන නිසා නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතා ඥානය සියලු කල්හි ම උපදී යැයි කියන්නට නොහැකිය.

කිත්තයිස්සාමි තෙ සන්තිං යනු සියලු කෙලෙස් සන්සිඳීමට හේතුවන බැවින් ශාන්තිය වූ නිවන දක්වන්නෙමි යනුයි. දිටෙයව ධම්මෙ

යනු දක්නා ලද දුක්ඛාදි ධර්ම ඇති මේ ආත්ම භාවයෙහිම හෝය. **අතීතහං** යනු මෙහි මෙසේ විය යනුවෙන් මෙසේ විලුයි නො පැවති යනුයි. ආත්ම ප්‍රත්‍යක්ෂ යන අර්ථයයි. **යං විදිත්වා සතෝ චරං** යනු සියලු සංස්කාර අනිත්‍යය ආදි ක්‍රමයෙන් සිහි ඇත්තෙක්ව හැසිරෙමින් ආර්ය මාර්ගයෙන් යම් නිවනක් දැනගෙන යනුයි. **තරෙ ලොකෙ විසත්තිකං** යනු සංස්කාර ලෝකයෙහි පැතිරෙන හෙයින් විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරෙ = තරණය කරන්නේය යනුයි. ඉක්මවන්නේය යන අර්ථයයි. **තෘඤ්චාහං** අභිනඳාමි යනු උක්තප්‍රකාර වූ ශාන්තිය වූ නිවන බබුළුවන ඔබලාගේ ඒ වචන මම ප්‍රාර්ථනා කරමි යනුයි. නැතහොත් ඒ ශාන්ත වූ උතුම් වූ නිවනෙහි සතුටුවෙමියි ධොතක කියයි. **උඩ්ඨං අධො තිරියං වාපි මජ්ඣෙ** යන මෙහි **උඩ්ඨං** යනු අනාගතයේ ද මත්තෙහි ද යනුයි. **අධො** යනු අතීතය ද යට ද යනුයි. **තිරියං වාපි මජ්ඣෙ** යනු වර්තමානය ද හාත්පස ද යනුයි. **එතං විදිත්වා** සංගො යනු මේ අනාගත ආදි කෙලෙස් ඇතිවන ස්ථානය දැන ගනුයි. **භවාභවාය** යනු කුඩා වූ ද මහත් වූ ද භවයන්ගේ අර්ථය පිණිසයි. නැතහොත් ශාස්වත උච්ඡේද දෙක පිණිසය.

අරියසච්චානං යනු ආර්යභාවය ඇතිකරන සත්‍යයන්ගේ ය. **අනනුබොධා** යනු අවබෝධ නොකිරීමෙන් නො දැනීමෙන් යනුයි. **අපපටිවෙධා** යනු නොදැනීමෙන් යනුයි. **සන්ධාවිතං** යනු භවයෙන් භවයට යාමෙන් සැරිසරන ලද යනුයි. **සංසරිතං** යනු නැවත නැවත යාම් වශයෙන් හැසිරෙන ලද යනුයි. **මමඤ්චෙව තුම්හාකඤ්ච** යනු මා විසින් ද ඔබලා විසින්ද යනුයි. එසේ නැතහොත් සන්ධාවිතං සංසරිතං යනු සැරිසැරීම හා හැසිරීමයි. මාගේ ද ඔබලාගේ ද (එය) විය යන අර්ථයයි. **භවනෙත්ති** යනු භවයෙන් භවයට පැමිණවීමට සමත් තෘෂ්ණා රැහැනයි. **සංසිතං** යනු හැසිරෙන ලද යනුයි. **සම්මුහනා** යනු මනාව නසන ලදී. සිදින ලදී. නොපවතින බවට පත් කරන ලදී යනුයි.

සබ්බෙ සංඛාරා අනිච්චා යනු ප්‍රත්‍යයන්ගෙන් සංස්කරණය කෙරෙනුයි සංඛාරා නම් වෙතැයි ලබන ලද නම් ඇති පංචස්කන්ධයෝ ආදි කෙළවරක් ඇති බැවින් ද, අනිත්‍යය කෙළවර කොට ඇති බැවින් ද, තාවකාලික බැවින් ද මොහොතක් පාසා වෙනස් වන බැවින් ද නිත්‍ය නොවේ නුයි අනිච්ච නම්. **යදා පඤ්ඤාය පසසති** යනු යම්විටෙක විදර්ශනා ප්‍රඥාවෙන් දකියි යනුයි. අනතුරුව මේ සසර දුකෙහි කලකිරෙයි. කලකිරෙනුයේ දුක දැනීම් ආදි වශයෙන් සත්‍යයන් අවබෝධ කරගනී.

එසමගෙහා විසුද්ධියා යනු කියන ලද ක්‍රමයෙන් යම් මේ සත්‍යාවබෝධයක් වේද එය විශුද්ධිය පිණිස මාර්ගය වේ යනුයි. **සබ්බ සංඛාරා දුක්ඛා** යනු සියලු සංස්කාර නිරන්තර වූ පීළන අර්ථයෙන් ද ක්ෂයවීම් අර්ථයෙන් ද දුක්ඛ වේ යනුයි. සෙස්ස කියන ලද ක්‍රමයෙන් ම ය. **සබ්බ ධම්මා අනත්තා** යනු සියලු තෙත්‍රිහුමික ධර්ම වෙනත් දෙයක් හෙයින් හිස් හෙයින් ශූන්‍ය හෙයින් අසාර හෙයින් වසඟයෙහි නොපවත්නා හෙයින් **අනත්ත වේ යනුයි.** සෙස්ස පළමුවැන්න හා සමාන ම ය.

සෙය්‍යා යනු විශිෂ්ට වූ උතුම් වූ යනුයි. **සදිසා** යනු සමාන වූ යනුයි. **හීනා** යනු ලාමක වූ යනුයි. ඔමානය ද (අනුන්ට පහත්කොට සැලකීම) තමා පිළිබඳ අවංකභාවය ඇතිකිරීම් මුඛයෙන් ද මනාව ග්‍රහණය කිරීම් වශයෙන් ම පවතී. එහෙයින් **හීනමානා හමසමි** යනුවෙන් කියන ලදී. **කිමඤ්ඤත්‍ර යථාභූතඤ්ඤා** යනු වහා කැඩෙනසුලු ඒකාන්තයෙන් ම නොපවත්නා ස්වභාව ඇති රූප ධර්මයන් හා සමාන ආදී වශයෙන් තමාගේ එසවීම කරන ඔවුන්ගේ යථාභූත ආකාරයෙන් නොදකින අඥානය හැර අන් කිසි කාරණයක් වන්නේ ද? ඔහුට අන්කිසි කරුණක් නැත යන අර්ථයයි. වේදනාදියෙහි ද මේ ක්‍රමය ම ය. කියන ලද වෙනසින් ශුක්ල පක්ෂය දතයුතුය.

යෙ අරියසච්චානි විභාවයන්ති යනු දුක්ඛාදී ආර්ය සත්‍ය ප්‍රඥා ලෝකයෙන් සත්‍යය වසා දමන කෙලෙස් අන්ධකාරය දුරුකොට තමාගේ ප්‍රකාශයන් ප්‍රකට කෙරෙත් යනුයි. **ගම්භීර පඤ්ඤත්ත** යනු අප්‍රමාණ වූ ප්‍රඥා ඇති බැවින් දෙවියන් සහිත ලෝකයා විසින් ඥානයෙන් නොලැබිය හැකි පිහිටි ප්‍රඥා වූ සර්වඥතා ඥානයෙනැයි කියන ලද්දේ වෙයි.

සුදෙසිතානි යනු සංක්ෂේප, විස්තර ආදී ඒ ඒ න්‍යායවලින් මනාව දෙසන ලද යනුයි. **කිඤ්චාපිතෙ හොනති භූසපමත්තා** යනු ඒ වඩන ලද ආර්ය සත්‍ය ඇති පුද්ගලයෝ ඒකාන්තයෙන් දෙව්රජකම, සක්විති රජකම ආදී ප්‍රමාද ස්ථානයකට පැමිණ වඩාත් පමා වෙත් යනුයි. එසේම සෝවාන් මාර්ග ඤාණයෙන් අභිසංස්කාර විඥානයේ නිරෝධයෙන් භව සතක් හැර කෙළවරක් නැති සසරෙහි යමෙක් උපදින් ද ඔවුන්ගේ නාමය ද රූපය ද නිරුද්ධ වූ බැවින් අටවෙනි භවයක් නොගනිත්. සත්වැනි භවයේදී ම විදර්ශනාව අරඹා අර්හත්වයට පැමිණෙයි යන අර්ථයයි.

යථින්දඛීලෝ යන මෙහි **යථා** යනු උපමා වචනයකි. ඉන්දඛීලෝ යනු නුවර දොර ස්ථිර කරනු පිණිස එළිපත අතර අට රියනක් හෝ දසරියනක් හෝ පොළව සාරා හිඳුවන ලද සාරවත් දැවමය ටැඹකට මෙය විශේෂ වචනයකි. **පඨවිං සිතෝ සියා** යනු ගැඹුරු **නිම්** ඇති බැවින් ඇතුළට පිවිස භූමිය ඇසුරු කරන ලද්දක් වන්නේය **යන අර්ථයයි. චතුබහි වාතෙහි** යනු සතර දෙසින් ආ සුළඟිනි. **අසම්පකම්පියෝ යනු** කම්පා කරන්නට හෝ සොලවන්නට හෝ නොහැකි වන්නේය. **තථූපමං සපපුරිසං වදාමි යෝ අරියසච්චානි අවෙච්ච පසසති** යනු යමෙක් චතුරාර්ය සත්‍යයන්ට ප්‍රඥාවෙන් බැසගෙන දකී ද ඒ උතුම් වූ සත්පුරුෂයා එසේ දක්නා හෙයින් සියලු තීර්ථක වාද නමැති සුළඟින් නොසෙල්විය හැකි බැවින් ඒ හා සමාන උපමා ඇත්තේ ය. කියන ලද පරිදි ඉන්ද්‍රඛීලයකට බඳු උපමා ඇතැයි කියමි යන අර්ථයයි.

සොතාපතනියංගෙහි යනු ආර්ය ශ්‍රෝතයට පැමිණි පුද්ගලයාට අංග වූ යනුයි. **අරියසාවකෝ** යනු ආර්ය වූ භාග්‍යවත් බුදුරදුන්ගේ සද්ධර්ම ශ්‍රවණය කෙළවර හටගත් බැවින් ආර්ය ශ්‍රාවක වූ යනුයි. **බිණනිරයොමහි** යනු ක්‍ෂය වූ නිරය ඇත්තේ වෙමි යනුයි. **බිණාපාය දුගගති විනිපාතො** යන මෙය නිරය ආදියේ පර්යාය වචන වශයෙන් කියන ලදී. නිරය ආදිය වනාහි වෘද්ධි සංඛ්‍යාත අයෙන් පහවූ බැවින් අපාය නම් වේ. දුක් සහගත ගතීන්ට පිහිටවන බැවින් දුග්ගති නම් වේ. දුෂ්කෘත කරන අය විශේෂයෙන් මෙහි වැටෙතනුයි විනිපාත නම් වේ. ශ්‍රෝතයට, ආර්ය මාර්ගයට මුලින් ම වැටුනේය. අවබෝධ කරන ලද්දේය යන අර්ථයෙන් **සොතාපනන** නම් වේ. නොසෙල්වෙන ධර්ම ඇති බැවින් මාර්ගඵලයන්ගේ පෘථග්ජන භාව සංඛ්‍යාත වූ විරූපත්වයෙහි නොවැටෙන ස්වභාව ඇත්තේ **අවිනිපාතධම්ම** නම් වේ. ඒ ධර්ම නියාමයෙන් නියත වූ බැවින් **නියත** වේ. උපරි මාර්ග සංඛ්‍යාත වූ සම්බෝධියට අවශ්‍යයෙන් පැමිණිය යුතු බැවින් එහි පරතෙරට (කෙළවරට) යෑම ගතියයි. පිළිසරණයි යන අර්ථයෙන් **පටිසරණ** නම් වේ. **නිට්ඨා** ආදී පදයන් අන්‍යොන්‍ය පර්යාය වචනයන් ම ය. **සහධම්මියා** යනු සබ්‍රහ්මචාරීහු ය. **අරිය කනෙතහි** යනු ආර්යයන්ට රුචි වූ ප්‍රිය වූ මනාප වූ එයින් යනුයි. පංච ශීලය ආර්යයන්ට රුචි වෙයි. භවාන්තරයෙහි ද අත්නොහරින හෙයින් ඒවා සඳහා මෙය කියන ලදී. මෙහිදී සියලුම සංවරය ලැබේ ම ය.

සොතාපනෙනා හමසමි යන මෙය දේශනා ශීර්ෂය ම ය. **සකදාගාමී**

ආදියද සකෘදාගාමී වෙමි ආදී ක්‍රමයෙන් ප්‍රකාශ කෙරෙත් ම ය. යම්හෙයකින් සියල්ලේ ම ශික්ෂාපද විරෝධයෙන් සුදුසු තැන ව්‍යාකරණය අනුදන්නා ලද්දේ ම ය.

යසසිද්‍රියානි යනු යම් ආර්ය පුද්ගලයෙකුගේ ශ්‍රද්ධා ආදි ඉන්‍ද්‍රියයන් ය. **සුභාවිතානි** යනු ආර්ය මාර්ගය වැඩීම් වශයෙන් මනාව භාවිතා කරන ලද යනුයි. **අජඤ්ඤතනං බහිද්ධාව** යනු ඕරම්භාගිය හා උද්ධම්භාගිය සංයෝජනයන් ඉවත් කිරීම් වශයෙනි. එහෙයින් **සබ්බලොකෙ** යි කියන ලදී. **නිබ්බිජ්ඣ** යනු කලකිරී, අවබෝධ කොට යනුයි.

ධම්මපදානි යනු දහම් කොටස් ය. අනභිධ්‍යා ධර්ම පදනම් අලෝභය හෝ අලෝභ ශීර්ෂයෙන් ලබන ලද ධ්‍යාන, විදර්ශනා, මාර්ගඵල, නිර්වාණ ආදිය හෝ දස අසුභ වශයෙන් ලබන ලද ධ්‍යානාදිය හෝ **අනභිජ්ඣා ධම්මපද** නමි. සතර බ්‍රහ්ම විහරණ වශයෙන් ලබන ලද්දේ අබ්‍යාපාද ධම්මපදයයි. දස අනුස්සති, ආහාරයෙහි පටික්කූල සංඥාව වශයෙන් ලබන ලද්දේ සම්මා සති ධම්මපදයයි. දස කසිණ ආනාපාන වශයෙන් ලබන ලද්දේ සම්මා සමාධි ධම්මපදයයි.

පඤ්ච ඡින්දෙ යනු යටින් ආපායෙහි ඉපදීම පිණිස පවතින පංච ඕරම්භාගීය සංයෝජනයන් පුරුෂයෙක් පාදයෙහි බඳින ලද රැහැන ආයුධයකින් සිඳින්නාක් මෙන් යට කියන ලද මාර්ග තුනෙන් සිඳ දමන්නේය යනුයි. **පංචඡහෙ** මත්තෙහි දෙව්ලොවට පමුණුවන පංච උද්ධම්භාගිය සංයෝජනයන් පුරුෂයෙක් බෙල්ලෙහි බඳින ලද රැහැනක් (සිඳින්නාක් මෙන්) අර්හත් මාර්ගයෙන් අත්හරින්නේය. සිඳින්නේය යන අර්ථයමැයි. **පංචවුත්තතරි භාවයෙ** යනු උද්ධම්භාගිය සංයෝජනයන් ප්‍රහාණය කරනු පිණිස ශ්‍රද්ධාදි ඉන්‍ද්‍රිය මත්තෙහි වර්ධනය කරන්නේය යනුයි. **පංචසංගොතිගො** යනු මෙසේ ඇතිකල්හි පස්වැදෑරුම් රාග, දෝෂ, මෝහ, මාන, දිට්ඨි යන සංගයන්ගේ ඉක්මවීමෙන් පංච සංගයන් ඉක්මවූවෙක් වී යනුයි. (එනම්) භික්ෂුවයි. **ඔඝතිණ්ණොති වුච්චති** තරණය කරන ලද සතරඕඝය ඇත්තෙක් යන අර්ථයයි.

නොදන්නා ලද අවබෝධ නොකරන ලද චතුසත්‍ය ධර්මය හෝ අමෘත පදය හෝ දැනීමියි පිළිපන්නහුගේ පළමු මාර්ගයේ වූ ඉන්‍ද්‍රිය **අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රිය** නම් වේ. පළමු මාර්ග ඤාණය ම ය. ඊට

පූර්වභාග වශයෙන් මෙසේ කියන ලදී. පළමු මාර්ග ඥානයෙන් දැනගනී, දන්නා ලද සීමාව නොඉක්මවා දන්නේනුයි අඤ්ඤා නම් වේ. එහි ඉන්‍ද්‍රිය යන අර්ථයෙන් අඤ්ඤාන්‍ද්‍රිය නම් වේ. යටින් ඵල තුනෙහි ද උඩින් මාර්ග තුනෙහි ද ඥාණයට මෙය වෙනත් වචනයකි. චතුසත්‍යයන්හි නිමවන ලද කටයුතු ඇති දන්නා වූ අරහතුන්ගේ ඉන්‍ද්‍රිය **අඤ්ඤාතාවින්‍ද්‍රිය** නම් වේ. මෙය අග්‍රඵල ඥානයට අධිවචනයකි. **අනභිසමෙනසස** යනු අවබෝධ නොකළ තැනැත්තාට ය. **අභිසමයාය** යනු අවබෝධ කළ තැනැත්තාට ය.

බාල ලකඛණානි යනු බාලයාගේ ඇති ලක්ෂණවලට හේතූන් ය. **බාලනිමිත්තනානි** යනු මොහු බාලයෙකියි ගන්නට හේතුවූ කරුණු ය. **බාලාපදානානි** යනු බාලයාගේ පැරණි, වැඩුණු කරුණු ය. **දුච්චින්තිත චින්ති** යනාදියෙහි නොසිතය යුතු අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදර්ශනය සිතානුයි **දුච්චිනතිත චිනතී** නම් වේ. බොරුකිම ආදී **දුර්භාෂිත** කියානුයි **දුබභාසිතභාසී** නම් වේ. නොකළ යුතු පරපණ නැසීම ආදී කටයුතු කෙරේනුයි **දුකකටකමමකාරී** නම්. කියන ලද ක්‍රමයෙන් ශුක්ලපක්ෂය දතයුතුයි.

භියෝ යනු මතුමත්තෙහි ය. **පකුජ්ඣයුං** යනු විරුද්ධ වන්නාහ යනුයි. **පකුපෙපයුං** යයි ද පාඨයක් වේ. **භුසෙන** යනු දැඩිසේ යනුයි. **දණ්ඩන** යනු දඬුවමින් ය. **ධීරෝ** යනු පණ්ඩිත වූ ප්‍රඥා සහිත තැනැත්තා ය. **නිසෙධයෙ** යනු වළක්වන්නේය යනුයි. නැවත කිසිවක් කරන්නට හෝ කියන්නට හෝ අසමත් කරන්නේය යන අර්ථයයි. **පරං** යනු ප්‍රතිවිරුද්ධයායි. **යො සනෙ උපසම්මති** යනු යමෙක් සිහි ඇත්තෙකු වී සන්සිඳෙයි යනුයි. මම ඒ බාලයාගේ සන්සිඳීම ම වැළකීමයැයි සිතමි යන අර්ථයයි. **වජ්ජං** යනු දෝෂයයි. **යදා නං මඤ්ඤති** යනු යම්හෙයකින් ඔහු සිතයි යනුයි. **අජ්ඣාරුහති** යනු මඩියි යනුයි. **ගොව භියෝ පලායිනං** යනු යම්සේ ගවරැළක ගවයන් දෙදෙනෙක් යුද කරන කල්හි එක් ගවයකු හෝ යම්තාක් පලා නොයා ද ඒතාක් ගව සමූහයා බලා සිටියි. යම්විටෙක පලායේ ද එවිට පලායන ඔහුව සියලු ගව සමූහයා විසින් වටකරගෙන මැඩලයි ද මෙසේම බියසුළු මෝඩයා කමා කරන්නාව බොහෝසෙයින් මඩියි යන අර්ථයයි. **සදත්ථපරමා** යනු ස්වකීය අර්ථයෙහි දක්ෂ යනුයි. **ඛනන්‍යා භියෝ න විජ්ඣති** යනු ඒ සකත්ථපරම (තමාට වැඩදායක උතුම් වූ) අර්ථයන් අතුරෙන් ක්ෂාන්තියට වඩා උසස් වූ වෙනත් අර්ථයක් නැත

යනුයි. **තමාහු පරමං බනතිං** යනු යම් බලවත් තැනැත්තෙක් ඉවසා ද ඔහුගේ ඒ ඉවසීම උතුම් යැයි කියයි යනුයි. **බලාබලං** නම් අඥාන බලයයි. යමෙකුගේ ඒ බලය බලයක් නොවේ ද එය බලයක් නොවේ යැයි කියත්. ප්‍රකාශ කරත්. දීපනය කරත්. **ධම්ම ගුතතසස** යනු ධර්මයෙන් රක්නා ලද්දහුට හෝ ධර්මය රකින්නාට ය. **පටිවතතා** යනු ආපසු හැරී කියන්නා ය. ආපසු හැරී යම්කිසිවක් හෝ කියන්නේය යනුයි. ධර්මයෙහි සිටි තැනැත්තාව සොලවන්නට සමතෙක් නම් නැත. **තසෙසව තෙන පාපියො** යනු ඒ ක්‍රෝධය කරණ කොටගෙන ඒ පුද්ගලයාට ම පාපයක් වෙයි යනුයි. කවරෙකුට ද? යමෙක් කිපුණු තැනැත්තෙකුට පෙරළා කිපේ ද ඔහුට ය. එහි **කුදධං** යනු චතුර්ථ විභක්තියෙහි ද්විතීයා විභක්ති වචනයකි. කුපුණහුට යන අර්ථයයි. **තිකිචඡනතානං** යනු ඒකවචනයෙහි බහුවචනයකි. පිළියම් කරන්නාට යන අර්ථයයි. **ජනා මඤඤනති** යනු මෙසේ තමාගේ ද අනුන්ගේ ද යන දෙපිරිසේ ම අර්ථය සුවපත් කරන නිපදවන පුද්ගලයාව මොහු බාලයෙකැයි අඤබාල පෘථග්ජනයෝ කල්පනා කරත් යනුයි. **යෙ ධමමසස අකොවිදා** යනු යමෙක් චතුසත්‍ය ධර්මයෙහි අදක්ෂ වේ ද අසමර්ථ වේ ද ඔවුහු මෙසේ කල්පනා කරත් යන අර්ථයයි.

පතතං යනු පැමිණෙන ලද යනුයි. දැන් විඳිනු ලබන කාම උපකරණයයි. **පතතබබං** යනු එයම අනාගතයේ දී අවබෝධ කළ යුතුයි. අනුභව කළ යුතුයි යනුයි.

උභයමෙතං රජානුකිණණං යනු ඒ දෙකම රාග ආදී දූවිලිවලින් ගැවසුණේය යනුයි. **ආතුරසස** යනු රාගාදි කෙලෙස්වලින් ලෙඩ වූ යනුයි. **අනුසිකඛතො** යනු කෙලෙස් බහුල පුද්ගලයින් හික්මවන හෙයින් යනුයි. **යෙ ච සිකඛාසාරා** යනු යමෙක් යම්සේ අල්ලාගත් සිල්වත් භාව සංඛ්‍යාත ශික්ෂාව සාර ලෙස ගෙන සිටියාහු ද ඔවුහු ය. එහෙයින් **සීලං වතං ජීවිතං බ්‍රහමචරියං** යි කියන ලදී. එහි යමක් නොකරමියි වැළකේ ද එය සීලයයි. වෙස්ගැනීම, බොජුන් ගැනීම, කටයුතු කිරීම හැසිරීම ආදී යමක් වේ ද එය වතයයි. ජීවිත යනු ආජීවයයි. බ්‍රහ්මචරිය යනු මෛථුනයෙන් වෙන්වීමයි. **උපටඨානසාරා** යනු මේ සීල ආදියේ නොනැගිටින සුළු යනුයි. මේවායින් ම සංසාර ශුද්ධිය වේ. ඒවා සාර වශයෙන් ගෙන සිටී යන අර්ථයයි. **ඉචචෙතෙ උභො අනතා** යනු මෙසේ ශීල වතයන් ස්පර්ශ කිරීම් මුඛයෙන් අත්තකිලමථානුයෝගය ද කාමයන්හි නිවැරදි හැඟීම් ස්වරූපයෙන් කාම සුඛල්ලිකානුයෝගය ද යන මේ අන්ත දෙකයි. ඒවා ද

පිළිවෙලින් මත්තෙහි පැමිණිය යුතු හා දැන් පැමිණි රාග දුනුවිලි ආදී ගැවසී ගත් කාමගුණයන්හි ඇලුණු කෙලෙස්වලින් ලෙඩ වූවන් අනුව හික්මෙන්නවුන් විසින් කෙලෙස්වලින් ලෙඩ වූවන් සමගම පිළිපැදිය යුතුය. එයින් ද ඒවා සොහොනේ වැඩේ. මතුමත්තෙහි ජරාමරණවලින් සොහොනෙහි වැඩෙනසුළුව ඒකාන්තයෙන් ම සොහොනේ වැඩෙත්. තෙමේ වැඩෙන්නේ අනුන් ද අන්ත දෙකෙහි සමාදන් කරවන්නාහු වර්ධනය කරවන්නාහ යන අර්ථයයි. **උභො අනෙත අනභිඤ්ඤාය** යනු පෙර කියන ලද අන්ත දෙක නොදැන යනුයි. **ඔලීයනති එකෙ** යනු ආත්මය ද ලෝකය ද ශාස්වතය යැයි බැසගන්නා තෘෂ්ණාවට බැසගැනීම් වශයෙන් ඇතැමෙක් එල්බෙත් යනුයි. **අතිධාවනති එකෙ** යනු ඇතැමෙක් ආත්මයද ලෝකය ද සිඳෙයි. නැසෙයි යැයි අතිධාවන අභිනිවේශ වශයෙන් ඉක්මවත් යනුයි. ඒ තණ්හා ආදී මඤ්ඤනාවන් ප්‍රහීණ වූ හෙයින් කල්පනා නොකළහ. එහෙයින්ම අනුපාදා පරිනිර්වාණයෙන් ත්‍රිවිධ වූ දුක ඒවායේ පැනවීමෙන් නැතිවේ.

ඡඤ්ඤා යනු දන්නේය යනුයි. **සංයුජේ** යනු එකතු කරන්නේය යනුයි. **මානුසං** යන තැන මෙය මිනිසුන්ට ඇත්තේනුයි මානුස නම් වේ. මනුෂ්‍ය භවයට අයත් වූ යනුයි. **කිඤ්චි තසස සකං හොති** යනු මාර මුඛයට පිවිසෙන ඒ සත්ත්වයාට යහපත් ක්‍රියාවෙන් අන්‍ය වූ අන් කිසිවක් ස්වකීය නම් වේ ද යනුයි. සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. එහෙයින් **තසමා කරෙය්‍ය කල්‍යාණං** යනාදිය කියන ලදී. එහි **සමපරායිකං** යනු පරලොව ප්‍රතිඵල උපදවන යනුයි.

ඉමෙ ධම්මා යනු මේ කුසල හෝ අකුසල ධර්මයන් ය. **එවං ගහිතා** යනු මෙසේ ගන්නා ලද උපදවන ලද යනුයි. **ඉදං ඵලං** යනු මේ ඉෂ්ට විපාක ඵලයයි. අනිෂ්ට විපාක ඵලය යනුයි. **අයං අත්ථො** යනු මෙය වෘද්ධියයි. මෙය හානියයි යන අර්ථයයි. **අඤ්ඤම්පි එවං ජාතිකං** යනුවෙන් ඒකංස ව්‍යාකරණීය ප්‍රශ්නයක් ප්‍රකාශ කෙරෙයි.

ආකංඛතො න ජානෙය්‍යුං යනු යම් හේතුවක් කරණ කොටගෙන භාග්‍යවතුන් වහන්සේගේ යම් කැමැත්තක් වේ ද එය අනෙක් අයට විෂය නොවේ යනුයි. **කිං තං භගවා ආකංඛති** යි කියන ලදී. මෙය නොවිසඳිය යුත්තකි.

එතතකො යනු මෙපමණ යනුයි. **සීලකබඤ්ඣ** යනු සීල ස්කන්ධ හේතුවයි. **සීලකබඤ්ඣන** යනුවෙන් ද පාඨයක් වේ. සෙසු පදවල ද මේ ක්‍රමය මැයි. **ඉරියායං** යනු කාය වාක් හැසිරීමෙහිය. **පභාවෙ** යනු ආනුභාවයෙහි ය. **හිතෙසිතාය** යනු මෛත්‍රියෙහි ය. **ඉදධිංයං** යනු ඍද්ධිවිධ ඥානයෙහි ය.

මෙපමණ බුදුගුණ වේ. ඒවා ද වෙන වෙනම මෙබඳු ප්‍රභාව ඇත්තෝ ය. එසේම මාර්ගඵල නිර්වාණ සහිත ය. මෙවන් ආනුභාව ඇත්තෝ ය. ආර්ය සංඝයා මෙබඳු ගුණයන්ගෙන් යුක්තය යනුවෙන් ත්‍රිවිධ රත්නයන්ගේ මහානුභාවත්වය සර්වප්‍රකාරයෙන් අන්‍යයන්ට විෂය නොවේ. භාග්‍යවතුන් වහන්සේට ම විෂය වේ යන අර්ථයෙන් බුද්ධ **විසයො අවිසඝජ්ජනීයො** යි කියන ලදී. එයින් අන්‍ය වූ යම් අර්ථයක් බුද්ධවිෂය වේද එය නොවිසඳිය යුතුයැයි දක්වයි. 'බුද්ධ විෂයය අචින්තෘයි. නොසිතිය යුතුය. යමෙක් සිතන්නේ නම් උමතු බවට චිත්ත වික්ෂේපයට බඳුන් වන්නේ යැයි' භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලදී.

කතමා පුරිමා කොටි? අවිසඝජ්ජනීයං යනු මුල් කෙළවර කවරේ ද? කිසිවු විසින් කරන ලද විමසීම නොවිසඳිය යුතුය. කවර හෙයින් ද? සසරේ පෙර කෙළවරක් නොවන හෙයිනි. එහෙයින්ම **පුරිමා හිකබවෙ කොටි න පඤ්ඤායති** යි කියන ලදී. එහි **න පඤ්ඤායති** යනු නොදක්නා ලැබේ යනුයි. නොලැබේ යන අර්ථයයි. නොපෙනේ යනු අනෙකෙකුගේ ඥානයට විෂය නොවේ යන අර්ථය සඳහා **න පඤ්ඤායතීති සාවකානං ඤාණවෙකල්ලෙන** යනාදිය කියන ලදී. එහි **අනතූපනායිකා** යනු මෙයට ආත්මය පැමිණවිය යුත්තේ නුයි අත්තූපනායික නම් වේ. **නත්ථි බුදධානං භගවනතානං අපපජානනා** යන මෙයින් මුල් කෙළවරක් නොමැතිකමින් ම නොපෙනේ. එහි ඤාණයේ වැළැක්මක් නොදක්වයි. යමක් ඇත්තේ ද එය අන්‍යයන්ට අප්‍රමේය වේ. භාග්‍යවතුන් වහන්සේට අප්‍රමේය නොවේ යනුවෙන් සියලු තැන භාග්‍යවතුන් වහන්සේගේ නොවළක්වන ලද ඤාණ ස්වභාවය දක්වන්නට **යථා භගවා කොකාලිකං හිකඛුං** යනු නාමගෝත්‍රයෙන් අප්‍රකට භික්ෂුවකි. **කිවදිසං නු බො හනෙත! පදුමෙ නිරයෙ ආයුපපමාණං** යන ප්‍රශ්නය අසා නුන්නා වූ එක් භික්ෂුවකට මෙසේ වදාළහ. මෙහි මෙය ඉතිරි පාඨයයි. 'භික්ෂුව, පදුම නිරයෙහි ආයු ප්‍රමාණය දීර්ඝය. එය මෙපමණ වර්ෂ වේ. මෙපමණ වර්ෂ සියක් වේ. මෙපමණ වර්ෂ දහසක් වේ. මෙපමණ වර්ෂ සියක් දහසක් වේ යැයි

ගණින්නට පහසු නොවේ. ස්වාමීනි, උපමාවක් දක්වන්නට හැකි ද? මහණ හැකිවේ යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. මහණ මෙසේය. කොසොල් රටේ තල සකක් විසි කිරියකි. පුරුෂයෙක් වසර සියයක් ඇවෑමෙන් එයින් එක් එක් තල ඇටයක් උඩට දමන්නේය. මහණ, ඒ කෝසලයේ තල සකක් මේ උපක්‍රමයෙන් වහාම ක්‍ෂය බවට අවසන් බවට යන්නේ ද එක් අබ්බුද නිරයක් නොවේ. මහණ, එසේ වූ අබ්බුද විස්සකි. එක් නිරබ්බුද නිරයක් මෙසේය. එහි **වීසති චාරිකො** යනු මගධ පතින් සතරපතක් කොසොල් රටේ එක් පතක් වෙයි. ඒ පතින් සතර පතක් ආළ්හකයකි. ආළ්හක සතරක් ද්‍රෝණයකි. ද්‍රෝණ සතරක් මානිකා එකකි. මානිකා සතරක් බාරී එකකි. ඒ කිරියෙන් විසි කිරියක් තල සකකි. **තිල වාහො** යනු තල කරත්තයකි. අබබුදො **නිරයො** යනු අබ්බුද නම් වෙන් වූ එක් නිරයක් නැත. අවීචියෙහි ම අබ්බුද ගණනින් පැසීමේ අවකාශය අබ්බුද නිරය යැයි කියන ලදී. නිරබ්බුද ආදියෙහි ද මේ ක්‍රමය මැයි. එහි වර්ෂ ගණනද මෙසේ දතයුතුය. යම්සේ ලක්‍ෂ සියය කෝටිය වේ ද මෙසේම සියක්දහස් කෝටි සියය ප්‍රකෝටිය නම් වේ. ප්‍රකෝටි සියක් දහස් සියය කෝටි ප්‍රකෝටිය නම් වේ. සියක් දහස් කෝටිප්‍රකෝටි සියය නහුතය නම් වේ. සියක් දහස් නහුත සියය නින්නහුතය නම් වේ. සියක් දහස් නින්නහුත සියය එක් අබ්බුදයකි. එයින් විසි ගුණයක් නිරබ්බුදයකි. සියලු තැන මේ ක්‍රමය වේ. මේ ගණන් කිරීම නුපුහුණු අයට දුෂ්කර වේ යන්න **තං න සුකරං සංඛාතුං** යි කියන ලදී. කිසිවෙක් ඒ ඒ තැන වැලපෙන්නවුන්ට අනුව කටයුතු කරන්නවුන්ට අනුව මේ නම් ලබන ලදැයි කියත්. තවත් අන්‍ය අය මේවා සීත නරක යැයි කියත්. **චිතතං ආභාතෙච්චා** යනු සිත දූෂණය කොට යනුයි.

කථං ජිනො යනු ප්‍රකාරය විමසීමයි. **කෙන ජිනො** යනු කාරණය විමසීමයි. කවර කාරණයකින් කවර හේතුවකින් කවර ප්‍රතිපත්තියකින් ජින වේ දැයි විමසයි. කථං යනු කවර ප්‍රකාරයකින්, අතීත කෙලෙස් නැතහොත් අනාගත කෙළෙස්, වර්තමාන කෙළෙස් ප්‍රහාණය කිරීමෙන් ජින වේ දැයි විමසයි. එහෙයින් එය විසඳිය යුතුයැයි කියන ලදී. **කතමො ජිනො** යනු ජින කවර ස්වරූපී ද? වේදනාව ද? සංඥාව ද? සංස්කාර ද? විඤ්ඤාණය ද? යමක් ආත්මය යැයි කියනු ලැබේ ද රූපාදියෙන් මිදුණු අනෙකක් ජින වේ ද යන මේ අර්ථය සඳහා **අවිසඡජනියං** යි කියන ලදී. **කිතතකො** යනු ප්‍රමාණ වශයෙන් කවර ප්‍රමාණයක් ද යනුයි.

අත්ථි තථාගතො යනු සත්ත්වයෙක් ඇත යනුයි. මේ ආයුෂ්මත් තෙම මෙබඳු නම් ඇත්තේය. මෙබඳු ගෝත්‍ර ඇත්තේය යනුවෙන් පංචස්කන්ධයන් අරමුණුකොට පනවනු ලැබේ ද ඒ පුද්ගලයා අදහස් කරන ලද බැවින් **විඤඤජඤඤියං** යි කියන ලදී. **රූපං තථාගතො** යනු රූපය ආත්මය වෙයි. සක්කාය දෘෂ්ටි වශයෙන් විඤඤයි යැයි සිතා **අවිඤඤජ්ඣඤඤියං** යි කියන ලදී. මේ ක්‍රමයෙන් සියලු පදවල අර්ථය දතයුතුය.

බාලං පීඨසමාරූළහං යනාදිය ස්වාමී (ඡටඨී) අර්ථයේ ද්විතීයා, විභක්ති වචනයන් ය. **කායෙන දුච්චරිතානි** යනු කයින් නොමනා දෙය කරන ලද යනුයි. **ඔලම්බනති** යනු එල්බෙත් යනුයි. වසාගෙන සිටියි. සෙසු පද දෙක ඊට ම පර්යාය වචනයන් ය. එල්බෙන ආකාරයෙන් ඒවා එළඹෙත්. එහෙයින් මෙසේ කියන ලදි. **මහතං** යනු මහත් වූවන්ගේ ය. **පඨවියං ඔලම්බනති** යනු පොළෝ තලයෙහි පැතිරෙත් යනුයි. ඉතිරි පද දෙක ඊට ම පර්යාය පදයයි. එය පැතිරෙන ආකාරය ම ය. **තනු භිකඛවෙ බාලසස** යනු ඒ උපස්ථාන ආකාරයෙහි බාලයාට මෙසේ සිත් වේ යනුයි.

ලාභා වො භිකඛවෙ යනු මහණෙනි, ඔබලා විසින් මිනිසත් බව ශ්‍රද්ධාව ලැබීම ආදී යම් ලාභයක් ලබන ලද ද එය ඔබලාට ලාභයක් ම ය. **සුලද්ධං** යනු පැවිදි වී මේ සිව් පිරිසිදු සීලය සැපයීම ආදි යමක් ලබන ලදද එයත් මනාව ලබන ලද්දකි. **බණො වො පටිලද්ධා** යනු බඹසර වාසය පිණිස අෂ්ටවිධ අක්‍ෂණයෙන් තොර වූ නවවැනි මේ ක්‍ෂණය ලබන ලදී යනුයි. **දිටඨිමායා** යනාදියෙන් එක් දෙයක් දැක්වීමෙන් අෂ්ටවිධ අක්‍ෂණයන් දක්වයි.

යහිං යහිං යනු යමෙක් යම් යම් දුගතියකට යයි යනුයි. **සො නං අධමෙමා** යනු ඔහු විසින් යම් අධර්මයක් කරන ලද ද එය ඒ අධර්මචාරී පුද්ගලයාව යනුයි. **හනානි** යනු බාධා කරයි යනුයි. **අපෙපසඤඤතා** යනු අල්ප වූ ආනුභාව ඇති බවයි. **දුබබණණතා** යනු විරූපී බවයි. පිළිකුල් බවයි. **දුපපඤඤතා** යනු ප්‍රඥා රහිත බවයි. අහේතුක ප්‍රතිසන්ධි වශයෙන් ගොළුබිහිරි බවයි.

වාචානුරක්ඛී යනු සතර වාග් දුශ්චරිතයන් දුරු කිරීමෙන් වචනය රකින්නා යනුයි. අභිධ්‍යා ආදිය නූපදවීමෙන් මනසින් මනාව සංවර වූයේය. පරපණ නැසීම් ආදිය දුරුකරමින් කයින් ද අකුසලයක්

නොකරන්නේය. මේ ත්‍රිවිධ කර්මපථ පිරිසිදු කරන්නේය. මෙසේ සීලස්කන්ධාදිය පිරිසිදු කරන්නා මේ බුද්ධාදී ඍෂීන් විසින් ප්‍රකාශ කරන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගය සතුටු කරන්නේය.

දුක්කටං යන කයින් ද වචනයෙන් ද මනසින් ද **නපුරු ලෙස** කරන ලද සාවද්‍ය වූ දුක් වූ දුගතිය සඳහා පවතින්නා වූ ක්‍රියාවක් **යමෙකුට** නැත්තේ ද යනුයි. **සංවුතං තිහි ඨානෙහි** යනු මේ **තුන් කරුණ කරුණ** කොටගෙන කාය දුශ්චරිතාදියේ ප්‍රවේශ වැළැක්වීම්වලින් වසන ලද යනුයි. මම ඔහු බ්‍රාහ්මණයෙකැයි කියමි.

අවචනත දුසසීලෑං යනු ඒකාන්ත දුශ්ශීල භාවයයි. උපතේ පටන් දස අකුසල කර්මපථ කරන ගිහියා ද උපසපන් දවසේ පටන් ගරුකාපත්තියට පැමිණෙන පැවිද්දා ද ඒකාන්ත දුශ්ශීලයා නම් වේ. මෙහි වනාහි යමෙක් ආත්මභාව දෙක තුනකදී දුශ්ශීල වූයේ ද ඔහුට ස්වභාව ගතියෙන් පැමිණි දුශ්ශීල භාවය සඳහා මෙය කියන ලදී. මෙහි දුශ්ශීල භාවය යනු දුශ්ශීලයාගේ සදොර නිසා උපන් තණ්හාව යැයි දතයුතුය. **මාලුවාසාලම්වොතතං** යනු යම් පුද්ගලයකුගේ තෘෂ්ණා සංඛ්‍යාත වූ දුසිල් බව සල්ගසක එතුණු මාලුවා වැලක් වැසි වසිනවිට කොළවලින් දිය රැගෙන බිඳිම් වශයෙන් හැමතැන ම වෙළාගනියි. ආත්මභාවය වෙළාගෙන සිටි හෙතෙම මාලුවා වැල නිසා බිඳී, බිම වැටෙන ගසක් මෙන් ඒ දුසිල්වත් භාව සංඛ්‍යාත තෘෂ්ණාවෙන් බිඳී අපායවල වැටෙමින් යම්සේ ඔහු අනර්ථකාමී දිශාවක් කැමති වේ ද තමාව එවැනි තත්ත්වයකට පත් කෙරෙයි යන අර්ථයයි.

අතතනා හිකතං යන ගාථාවේ සංක්ෂේපාර්ථය මෙයයි. යම්සේ පාෂාණමය වූ පාෂාණයෙන් හටගත් දියමන්තිය ඒ පාෂාණමය වූ ම මැණිකක් තමාගේ ම නැගිටි තැන් සංඛ්‍යාත වූ මැණික්ගල කාදමා ලොකු කුඩා සිදුරු ලොකු කුඩා කැබලි බවට පත්කොට පරිභෝග නොකළ හැකි බවට පත්කෙරේ ද මෙසේම තමා විසින් කරන ලද තමා තුළ හටගත් තමාගෙන් ම ඇතිවූ පාපය මෝඩ වූ ප්‍රඥා රහිත පුද්ගලයාව සතර අපාය කළඹයි. හාරා දමයි. විනාශ කරයි.

නිසෙවිය යනු කොට යනුයි. **ගරහා** යනු ගැරහිය යුතු යනුයි. **බාලමති** යනු මඳබුද්ධිකයන් ය. **ඛයා කම්මසස** යනු කර්ම ක්‍ෂය කරන

ඥානයෙන් කර්මය ක්ෂය කරන හෙයිනි. **විමුත්තචෙතසො** යනු සමුච්ඡේද (කෙලෙස් සපුරා ඉවත් කළ) විමුක්තියෙන් ද පටිප්පස්සද්ධි (කෙලෙස් සන්සිඳවූ) විමුක්තියෙන් ද මිදුණු සිත් ඇත්තා ය. **නිබ්බනති තෙ ජොතිරිච්චිනකඛයා** යනු යම්සේ දර ආදී ඉන්ධන රහිත ගින්න නිවියා ද එසේම අභිසංස්කාර විඤ්ඤාණයේ ඉතිරි නොකර ක්ෂය කිරීම නිසා නිවෙයි යනුයි.

යථාපි භමරො යන ගාථාවෙහි **භමරො** යනු යම්කිසි මීමැසි ජාතියකි. **පුපඵං** යනු මල්වත්තෙහි හැසිරෙමින් මල් ද ඒ ඒ වර්ණය ද සුවඳ ද යනුයි. **අහෙඨයං** නොතළමින් විනාශ නොකරමින් හැසිරෙයි යන අර්ථයයි. මෙසේ හැසිරී ද **පලෙති රසමාදාය** යනු ඇතිතාක් මධුරස බී වෙනත් මධු වදයක් කරනු පිණිස රසය ගෙන පියඹා යයි යනුයි. ඔහු එක් වනගහණයකට ඇතුල් වී ගස් සිදුරු ආදියෙහි ඒ දූලි මිශ්‍ර වූ රසය තබා පිළිවෙලින් මිහිරි රස ඇති මීවදයක් කෙරෙයි. ඌ මල්වත්තෙහි හැසිරීම් හේතුවෙන් මල හෝ එහි වර්ණය හෝ විනාශ නොවේ. එනම් ප්‍රකෘති මල ම තිබේ. **එවං ගාමෙ මුනී චරෙ** යනු මෙසේ ශෛක්ෂ හෝ අශෛක්ෂ වූ අනගාරික මුනිවරයා කුල පිළිවෙලින් ගමෙහි භික්ෂාව ගනිමින් හැසිරෙන්නේය යන අර්ථයයි. උන්වහන්සේ ගමෙහි හැසිරීම් හේතුවෙන් ශ්‍රද්ධා හානියක් හෝ භෝග විනාශයක් හෝ නොවේ. ශ්‍රද්ධාවත් භෝගයනුත් ප්‍රකෘතිමත් වේ. මෙසේ හැසිර ද ගමින් නික්ම ගමෙන් පිට ජල පහසුකම් ඇති තැනක සඟල සිවුර පනවා එහි හිඳ අකඛබහඤ්ඣන (ඉන්ද්‍රියයන්හි තෙල් ආදිය ගැල්වීම) වණ ලෙපන (තුවාලවල බෙහෙත් තැවරීම) පුනතමාංස (පුතුගේ මස්) ආදී උපමා වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් පිණ්ඩපාතය වළඳ එවන් වන ලැහැබකට පිවිසී ආධ්‍යාත්මික කර්ම ස්ථානයක් ස්පර්ශ කරමින් මාර්ගඵලයන් අත්පත් කරගනියි. අශෛක්ෂ මුනිවරයා වනාහි මේ භවයට අයත් සැප විහරණයේ යෙදෙයි. මොහු මීවද සඳන බඹරාට සමාන වෙයි. මෙහිදී **ඛීණාශ්‍රවයා** අදහස් කරන ලදී.

පාතිමොකඛ සංවර සංවුතො විහරති යමෙක් එය රකි ද ආරක්ෂා කෙරේ ද එය අපායාදි දුක්වලින් ඔහුව නිදහස් කරයි. මුදවයි යන අර්ථයෙන් පාතිමොක්ඛ නම් වේ. කායික වාචසික වැරදි ඉක්මවීම, මුවහ කරන හෙයින් ආවරණය කරන හෙයින් එයම සංවරය වේ. ඒ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වූ යුක්ත වූ අයෙකු වී සියලු ඉරියව්වල හැසිරෙයි. **ආචාරගොචර සම්පනෙනා** යනු හැසිරීමෙන් ද අරමුණෙන් ද යුක්ත වූ

යනුයි. **අණුමත්තෙසු** යනු අල්ප වූ දෙයෙහි ය. **වජ්ජෙසු** යනු අකුසල ධර්මයන්හි ය. **භයදස්සාවී** යනු බිය දක්නා තැනැත්තා ය. **සමාදාය සික්ඛති සික්ඛාපදෙසු** යනු ශික්ෂාපදයන්හි යම් කිසිවක් හික්මිය යුතු ද ඒ සියල්ල මනාව ගෙන හික්මෙයි යනුයි. **කායකම්ම වචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො** යන මෙහි ආචාර ගෝචරත්වය ගැනීමෙන් ම කුසලමය කාය කර්ම ද වාග්කර්ම ද ගත් කල්හි ද යම්හෙයකින් මේ ආජීව පාරිශුද්ධි ශීලය ආකාසාදියෙහි නූපදියි. කාය වාග් ද්වාරයන්හි ම උපදී ද එහෙයින් එහි උත්පත්ති ද්වාරයන් දැක්වීම සඳහා කාය වාග් කර්මයෙන් යුක්ත වූ තැනැත්තා කුසලයෙන් යැයි කියන ලදී. යම්හෙයකින් එයින් යුක්ත වූයේ වේ ද එහෙයින් පිරිසිදු ආජීවය ආජීව පාරිශුද්ධි ශීලයම යැයි දක්වනු පිණිස මෙය කියන ලදී. එය මෙසේ කියන ලද්දේමය. 'ගෘහපතිය, කුසල ශීලය, කුසල කාය කර්මය, කුසල වාග් කර්මය පිරිසිදු ආජීවය කවරේ ද? ගෘහපතිය, මම පිරිසිදු ආජීවය කුසලයෙහි ම ලා ප්‍රකාශ කරමි' යනුවෙනි. **ආරද්ධ විරියො** යමෙක් කායික හා චෛතසික වීර්යය අරඹන ලද්දේ වෙයි ද හෙතෙම අරඹන ලද උත්සාහ ඇති තැනැත්තා යයි කියනු ලැබේ. එහිදී යමෙක් සමූහයා හා එකතුවීම දුරුකොට සතර ඉරියාපථයන්හි අෂ්ටවිධ ආරම්භ වස්තූන් ලෙසින් (එකක් වේ ද) හුදකලා වේද ඔහු කායික වීර්යය අරඹන ලද්දේ වෙයි. යමෙක් චිත්ත සංගණිකතාව දුරුකොට අෂ්ට සමාපත්ති ලෙසින් හුදකලා වේ ද ගමනාදියෙහි හටගත් කෙලෙස් උපන් තැන ම ගරහා ධ්‍යාන උපදවයි ද ඔහුගේ චෛතසික වීර්යය ආරම්භ වූයේ වෙයි. මෙසේ අරඹන ලද උත්සාහය ඇත්තේ වෙයි. **ථාමවා** යනු ශක්තිමත් තැනැත්තා යනුයි. **දළහ පරක්කමො** යනු ස්ථිර වූ පරාක්‍රම ඇති යනුයි. **අනික්ඛිත්තධුරො -පෙ- සච්ඡිකිරියාය** යනු සංකිලේස ධර්මයන් ප්‍රහාණය කරනු පිණිස ද වොදාන ධර්මයන් සම්පාදනය කරනු පිණිස ද ප්‍රත්‍යක්ෂ කරනු පිණිස ද වීර්යය ඉවත් නොකොට වීර්යය උද්‍යොග කරවමින් වාසය කෙරෙයි. **පඤ්ඤවා** යනු පංචස්කන්ධයේ හටගැනීම වැයවීම විමසන ප්‍රඥාවෙන් යුක්ත වූ යනුයි. එහෙයින් **උදයත්ථගාමිනියා** යනාදිය කියන ලදී.

නත්ථි පුත්ත සමං පෙමං යනු මව්පියවරු විරූපී වූ ද ස්වකීය පුත්‍රයන් ස්වර්ණ බිම්බයක් සේ මල්ගොඩක් මෙන් ශීර්ෂාදියේ තබාගෙන පරිහරණය කරමින් කල්පනා කරති යනුයි. ඔවුන් මළපහ කළ විටත් මූත්‍ර කළ විටත් සුවඳ විලවුනක් පිළිගත්තාක් මෙන් සොම්නසට පැමිණෙත්.

එහෙයින් **නත්ථි පුත්තසමං පෙමං** යි කියන ලදී. පුත්‍ර ප්‍රේමය හා සමාන ප්‍රේමයක් නම් නැතැයි කියන ලද්දේ වෙයි. **ගො සමිතං** යනු ගවයන් හා සමාන වූ ගෝ ධනය හා සමාන වූ අන් ධනයක් නම් නැත යනුයි. **සුරිය සමා ආභා** යනු සූර්යාලෝකය හා සමාන අනෙක් ආලෝකයක් නම් නැත යනුයි. **සමුද්ද පරමා** යනු වෙනත් විල් ආදී යමක් වේ නම් ඒ සියල්ල සමුද්‍රය පරමකොට ඇත්තේය. භාග්‍යවතුන් වහන්ස, සමුද්‍රය ඒවා අතරින් උතුම් වෙයි. සමුද්‍රය හා සමාන අනෙක් ජල සම්භාරයක් නම් නැතැයි කියයි. යම්හෙයකින් ආත්ම ප්‍රේමය හා සමාන ප්‍රේමයක් නැත්තේ ද (එහෙයින්) මව්පියවරු දූදරුවන් අතහැර දමා, (ඔවුන් පෝෂණය නොකොට තමාව ම පෝෂණය කෙරෙත්. ධාන්‍ය හා සමාන ධනයක් නම් නැත. එවැනි කලකදී අමුරන් රත්‍රන් ආදියද ගවමහිෂාදිය ද රැගෙන ධාන්‍ය ගැනීම පිණිස ධාන්‍ය හිමියන්ගේ සමීපයටම යත්. ප්‍රඥාව හා සමාන ආලෝකයක් නම් නැත. සූර්යාදීහු එක් ප්‍රදේශයක් ම ආලෝකමත් කෙරෙත්. පවතින්නා වූ ම අඳුර නසත්.

ප්‍රඥාව වනාහි දසදහසක් ලෝකධාතුව ඒකාලෝක කරන්නට හැකිවෙයි. අනිත්‍යය ආදියෙන් වැසුණු අඳුර දුරු කෙරෙයි. වැහිවළාව හා සමාන විලක්නම් නැත. ගඟක් හෝ වේවා පොකුණක් හෝ වේවා වැස්ස හා සමාන විලක් නම් නැත. වැහිවළාවෙන් සිඳදැමුණු මහ සමුද්‍රයෙහි ඇඟිලි පුරුකක් තෙමීම් මාත්‍රික වූත් දියබිඳක් නොවෙයි. වැසි පවතිද්දී ආභස්සර භවන තෙක් එක් දිය කඳක් වෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දේවතාවාගේ වචනය ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් පිළිතුරු ගාථාවක් කියමින් **නත්ථි අතතසමං පෙමං** යනාදිය කියන ලදී.

කිංසුධ ඝීතා යනු කවරහෙයින් බිය වූවාහු ද යනුයි. **මගෙගා ව නෙකායතනෝ පවුතෙතා** යනු අටතිස් අරමුණු වශයෙන් නොයෙක් කරුණුවලින් මාර්ගය කියන ලදී යනුයි. මෙසේ ඇතිකල්හි කවර හේතුවක් නිසා බියවී මේ ජනතාව දෙසැටක් දෘෂ්ටිය අල්ලා ගත්තේදැයි කියයි. **භූරිපඤ්ඤෙසු** යනු බොහෝ ප්‍රඥා ඇති තැනැත්ත, උත්සන්න ප්‍රාඥය, යනුයි. **පරලොකං න භායෙ** යනු මෙලොවින් පරලොව යන්නේ බිය නොවන්නේය යනුයි. **පණිධාය** යනු පිහිටුවා / තබා යනුයි. **සරමාවසනෙනා** යනු අනාථපිණ්ඩිකාදීන් මෙන් බොහෝ ආහාරපාන ඇති ගෙදරක වාසය කරමින් යනුයි. **සංවිභාගි** යනු ඇඟිලි තුඩින් ගත් දෙය ද නියෙන් පලා අනුන්ට ද දී අනුභව කරනසුලු යනුයි. **වදඤ්ඤු** යනු යාචකයන්ට යැදීම්

වශයෙන් කියන ලද වචන ගැන දන්නා තැනැත්තා හෝ කියයුතු තැනැත්තා ය. මෙහි ද **වාචං** යනුවෙන් වාග් සුචරිත සතර ගන්නා ලදී. මේ දශකුසල කර්මපථ පූර්වභාගය පිරිසිදු කරන අංග නම් වේ. **බවහනනපානං සරමාවසනෙතා** යන මෙයින් යඤ්ච උපාඛ්‍යරය ගන්නා ලද්දේ වෙයි. **සදෙධා** යනු එක් අංගයකි. **මුදු** යනු එකකි. **සංවිභාගී** යනු එකකි. **වදඤ්ඤූ** යනු එකකි. මේ අංග සතර සඳහා **එතෙසු ධමෙමසු ඨිතො චතූසු යි** කියන ලදී.

අනෙක් ක්‍රමයක් ද වේ. වාචං යනාදිය අංග තුනයි. **බවහනනපානං** යන මෙයින් යඤ්ච උපාඛ්‍යරය ගන්නා ලද්දේ වෙයි. **සදෙධා මුදු සංවිභාගී වදඤ්ඤූ** යනු එක් අංගයකි. **කායෙන පාපානි අකුබබමානො බවහනනපානං සරමාවසනෙතා** යනු එකකි. **සදෙධා මුදු** යනු එකකි. **සංවිභාගී වදඤ්ඤූ** යනු එකකැයි මේ කරුණු සතරෙහි සිටියේ ධර්මයෙහි සිටියේ නම් වෙයි. හෙතෙම මෙයින් පරලොව යන්නේ බිය නොවේ.

කාය **සමාචාරමපි** යනාදිය ප්‍රාතිමෝක්ෂ සංවරය දැක්වීමකි. එහි ද්විධෙන යනු දෙවැදෑරුම්ව යනුයි. කොටස් දෙකකින් යන අර්ථයයි. ඡඤ්ඤා යනු දන්නේය යනුයි. සීලකථා නම් වූ මෙය කර්මපථ වශයෙන් හෝ ප්‍රඥප්ති වශයෙන් හෝ කිවයුතුය. එහි කර්මපථ වශයෙන් කියන්නා විසින් පළමුව ඇසුරු කළයුතු කාය සමාචාරය ප්‍රාණඝාත, අදින්නාදාන, (කාම) මිථ්‍යාචාරයන්ගෙන් කිවයුතුයි. ප්‍රඥප්ති වශයෙන් කායද්වාරය පිළිබඳව පනවන ලද ශික්ෂාපද ඉක්මවීම් වශයෙන් (කිවයුතුය.) ඇසුරු කළ යුතු කාය සමාචාරය ප්‍රාණඝාතාදියෙන් වැළකීම්වලින් මෙන්ම කාය ද්වාරයෙහි පනවන ලද ශික්ෂාපද නො ඉක්මවීමෙන් ද කිවයුතුය. ඇසුරු නොකළ යුතු වාග් සමාචාරය මුසාවාද ආදි වාග් දුශ්චරිතයෙන් මෙන්ම වාග් ද්වාරයෙහි පනවන ලද ශික්ෂා පද ඉක්මවීමෙන් ද කිව යුතුය. ඇසුරු කළයුතු වාග් සමාචාරය මුසාවාද ආදියෙන් වැළකීම්වලින් මෙන්ම වාග් ද්වාරයෙහි පනවන ලද ශික්ෂාපද නොඉක්මවීමෙන් ද කිවයුතුය. සෙවීම වනාහි කාය වාග් පර්යේෂණය ම ය. එය කාය වාග් සමාචාරයන් ගැනීමෙන් ගන්නා ලද්දේ ද වේ. යම්හෙයකින් ආජීව අෂ්ටමක ශීලය මේ දොරටු දෙකෙහි ඇති වේ ද අහසෙහි ඇති නොවේ ද එහෙයින් ආජීව අෂ්ටමක ශීලය දක්වනු පිණිස වෙන වෙනම කියන ලදී. එහි දී ඇසුරු නොකළ යුතු පර්යේෂණය අනාර්ය පර්යේෂණයෙන් කිවයුතුය. ඇසුරු කළයුතු පර්යේෂණය ආර්ය පර්යේෂණයෙන් කිවයුතුය. එය (මෙසේ)

කියන ලදී. 'මහණෙනි, අනාර්ය පර්යේෂණය කවරේ ද? මහණෙනි, මෙලොව ඇතැමෙක් තමා ඉපදෙන ස්වභාව ඇතිව ඉපදෙන ස්වභාව ඇති දෙය ම සොයයි යනාදියයි. එසේම 'මහණෙනි, ආර්ය පර්යේෂණය කවරේ ද? මහණෙනි, මෙලොව ඇතැමෙක් තමා ඉපදෙන ස්වභාව ඇතිව ජාති ධර්මයෙහි ආදීනව දැන උපතක් **නැති අනුත්තර** වූ යෝගක්ෂේම වූ නිර්වාණය සොයයි යනාදියයි.

මගඟානටයංගිකො යනු අඩිපාරවල් හෝ වේවා දෙසැටක් මිසදිටු මග හෝ වේවා සියලුම මාර්ගයන් අතුරෙන් සම්මා දිට්ඨි ආදී අංග අටකින් යුත් මිථ්‍යාදෘෂ්ටි ආදි අෂ්ටවිධ පාපධර්මයන් ප්‍රහාණ කරන, නිරෝධය අරමුණු කොට සතර සත්‍යයන්හි දුක අවබෝධ කරගැනීම ආදී කටයුතු සාධනය කරන ආර්ය අෂ්ටාංගික මාර්ගය ශ්‍රේෂ්ඨය උතුම්ය යනුයි. **සචචානං චතුරො පදා** යනු සත්‍ය කියන්නේය. නොකිපෙන්නේය යන තැන ආ වාග් සත්‍යය හෝ වේවා සත්‍යවත් බ්‍රාහ්මණයා සත්‍යවත් ක්ෂත්‍රියයා ආදී භේද ඇති සම්මුති සත්‍යය හෝ වේවා මෙය ම සත්‍යය එකක් ම ය. දෙවැන්නක් නැතැයි කියන ලද පරමාර්ථ සත්‍යය හෝ වේවා මේ සියලු සත්‍ය අතුරෙන් දතයුතු අර්ථයෙන් ද ඉවත් කළයුතු අර්ථයෙන්ද සාක්ෂාත් කළයුතු අර්ථයෙන් ද වැඩිය යුතු අර්ථයෙන් ද එක්ව අවබෝධ කළ යුතු අර්ථයෙන් ද සත්‍යාවබෝධ කිරීම් අර්ථයෙන් ද දුක්ඛ ආර්ය සත්‍යය යනාදී පද සතර ශ්‍රේෂ්ඨ වේ. **විරාගො සෙටෙඨා ධම්මානං** 'මහණෙනි, සංඛත හෝ අසංඛත ධර්ම යම්පමණ වේ ද විරාගය ඒ ධර්මයන්ගෙන් ශ්‍රේෂ්ඨයැයි කියනු ලැබේ' යන වචනයෙන් නිර්වාණ සංඛ්‍යාත විරාගය සියලු ධර්මයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වේ. **දවිපදානඤඤ චකඛුමා** යනු දෙව් මිනිස් ආදී භේද ඇති සියලු දෙපා ඇත්තා වූ සත්ත්වයන්ගේ පසැස් කරණ කොටගෙන ඇස් ඇත්තා වූ භාග්‍යවතුන් වහන්සේ ම ශ්‍රේෂ්ඨ වේ.

අගඟානි යනු උතුම් යනුයි. **යාවතා** යනු යම් පමණ යනුයි. **අපදා** යනු පා නැති සර්ප මත්ස්‍ය ආදිහු ය. **දවිපදා** යනු මිනිස්, පක්ෂි වර්ගාදිහු ය. **චතුපපදා** යනු හස්ති අශ්ව ආදිහු ය. **බහුපපදා** යනු පත්තෑ ආදිහු ය. **රූපිනො** යනු කාමාවචර, රූපාවචර ලෝකවල සත්ත්වයෝ ය. **අසඤඤිනො** යනු අසංඥභවයෙහි නිපන් සත්ත්වයෝ ය. **නෙවසඤඤි නාසඤඤිනො** යනු භවාග්‍රයෙහි නිපන් සත්ත්වයෝ ය. **අගගමකඛායති** යනු ගුණවලින් අග්‍රය. උතුම්ය. ශ්‍රේෂ්ඨ වේ යැයි කියනු ලැබේ යනුයි.

අසංඛතා යනුවෙන් නිවන ම කියන ලදී. **විරාගෝ** යනාදිය ද නිවනටම නම් ය. ඊට පැමිණ සියලු කෙලෙස් නොරැඳෙයි. සියලු රාගමදාදිය මදයෙන් තොරවූයේ වෙයි. අභාවයට යයි. සියලු පිපාසයෝ නැතිවෙත්. සියලු ආලයෝ විනාශයට යත්. දුක් සිඳී යයි. තෘෂ්ණාව ක්ෂය වෙයි. සියලු දාහයෝ සන්සිඳෙත්. සංසාර දුක නැති වේ. එහෙයින් ඒ නිවන මේ නාමයන් ලබයි.

ධම්මෝ ච කුසලමකඛතෝ යනු ඒ ශාස්තෘන්ගේ ධර්මය ද කුසලය. නිවැරදිය යනුයි. නිවැරදි බැවින් ම ප්‍රතිපක්ෂ වූ රාගාදි කෙලෙස්වලින් ද සියලු තීර්ථක වාදවලින් ද නොපිරිහෙලන ලද්දේ ය. **නානි තිණි විසිසසරෙ** යනු මේ ත්‍රිවිධ රත්නයන් ලෝකයේ සියලු රත්නවලින් විශිෂ්ට වේ. ගුණ වශයෙන් සියලු ලෝකය අභිභවත් යන අර්ථයයි. **සමණපදුමසඤ්ඤයො** ගණෝ යනු පද්ම හා සමාන ආර්ය ශ්‍රමණයන්ගේ සමූහ සංඛ්‍යාත ගණයයි. පදුම යනු පිරිපුන් පත්‍ර සියයක් ඇති පියුමට නමකි. ආර්ය පුද්ගලයෝ ද සර්වප්‍රකාරයෙන් පිරිපුන් ගුණ ඇත්තෝ වෙතැයි පද්ම හා සමානව කියන ලදි. **විදූනං සකකතො** යනු නුවණැති පණ්ඩිතයන් විසින් සත්කාර කරන ලද යනුයි. **නරවරදමෙකා** යනු මිනිසුන් අතර ශ්‍රේෂ්ඨයා ද දමනය කළයුතු පුද්ගලයන් දමනය කරන විනායකයා ද යන අර්ථයයි.

ලොකසස උතතරි යනු ලෝකය මත්තෙහි සිටී යනුයි. සියලු ලොව උතුම් වූ යන අර්ථයයි. **නිරූපදාහො** යනු රාග, පරිළාහ (දාහය) ආදියෙන් නොදැවෙන යනුයි. **සචචනාමො** යනු නොවෙනස් නාමයයි. සත්‍ය වූ ගුණවලින් පැමිණි නමයි. **සබබාභිභූ** යනු තම ගුණවලින් මුළුලොව මැඩ සිටී යනුයි. **සචච ධමෙමා** යනු ඒකාන්තයෙන් සසරින් නික්මෙන බැවින් නොවෙනස් වූ පර්යාප්තිය සමග නවවිධ ලෝකෝත්තර ධර්මයන් ය. එහෙයින් ම **නත්ථඤ්ඤා නසස උතතරි** යනු ඊට උසස් වූ අධික ගුණ ඇති අන් ධර්මයක් නැත යන අර්ථයයි. ආර්ය සංඝයා ම නිතර සියලු කල නුවණැති සියලු පණ්ඩිතයන් විසින් පුදන ලදී. **එකායනං** යන ගාථාවේ **එකායනං** යනු එක් මගකි.

මගො පනෙථා පථො පජජා අඤ්ජසං වටුමායනං
නාවා උතතර සෙතුව කුලෙලා ච හිසි සංකමොති

මග්ග, පන්ථ, පථ, පජ්ජ, අඤ්ජස, වට්ටම, ආයන, නාවා, උත්තරසෙතු,

කුල්ල, හිසි, සංකම යනුවෙන් මාර්ගයට බොහෝ නම් වේ. එය මෙහිදී ආයන යන නමින් කියන ලදී. එහෙයින් එකායනං යනු එක මගයි. දෙකඩ වූ මාර්ගයක් නොවේ යන අර්ථයයි. එසේ නැතහොත් එකෙකු විසින් යා යුතුය යන අර්ථයෙන් ඒකායන නම් වේ. ගණ සංගණිකතාව දුරුකොට විවේකීව සිටියහු විසින් උතුම් විවේක ඇත්තා විසින් පිළිපැදිය යුතුය යන අර්ථයයි. මෙය කරණ කොටගෙන යේ නුයි අයන නම් වේ. සසරින් නිවනට යන් යන අර්ථයයි. සියලු සත්ත්වයන්ට ශ්‍රේෂ්ඨ වූ එක ම භාග්‍යවතුන් වහන්සේගේ මාර්ගය **යන අර්ථයෙන්** ඒකායන නම් වේ. කෙසේ වුවත් එයින් අන්‍ය**යෝ ද යෙත්. එසේ වුවත්** ඒ මාර්ගය භාග්‍යවතුන් වහන්සේ ම ය. **උන්වහන්සේ විසින්** උපදවන ලද බැවිනි. (එය) මෙසේ කියන ලදී. 'සුභද්දය, මේ ධර්ම විනයෙහි ආර්ය අෂ්ටාංගික මාර්ගය දක්නට ලැබේ' යනුවෙනි. තව ද පූර්ව භාගයෙහි නන්වැදෑරුම් භාවනාවෙහි පැවති දෙය ද අපරභාගයේදී එකම නිවනට ම යන්නේය යන අර්ථයෙන් ඒකායන නම් වේ. එය එක ම මගයි. **ජාතිකඛයනත දසසී** උපත ක්‍ෂය කිරීම් සංඛ්‍යාත අන්තය ජාතිකඛය අන්තයයි. උපතේ අත්‍යන්ත ක්‍ෂය කිරීම නිවනයි. එය දකින්නා ජාතික්ඛයන්ත දස්සී නම් වේ. **මඟං පජානාති හිනානුකම්පි** යනු කියන ලද ආකාර ඇති ඒක මාර්ග සංඛ්‍යාත මාර්ගය භාග්‍යවතුන් වහන්සේ ස්වයම්භූ ඥානයෙන් දනියි. දන්නේ ඒ ඒ හිතවත් දෙයින් සත්ත්වයන්ට අනුකම්පා කෙරෙයි යනුයි. දැන් ඒ මාර්ගයේ ඒකායන භාවය ද තුන්කල්හි ඒකාන්තයෙන් පමුණුවන බව ද දක්වන්නට **එතෙන මගෙගන තරිංසු පුබෙබ තරිසසනති යෙ චාපි තරනති ඔඝං** යන්න කියන ලදී. එහි අර්ථය, යමෙක් අතීත කාලයෙහි කාම ඕඝ ආදී සතර ඕඝය තරණය කළාහු ද යමෙක් අනාගතයේ දී එය තරණය කරන්නාහු ද දැනුදු තරණය කරන් ද ඒ සියල්ලෝ මෙමගින් ම මිස අනෙක් මගකින් තරණය නොකරත්. **විසුද්ධිපෙකඛා** සතර ඕඝ තරණයෙන් ඉතා පිරිසිදු වූ නිවන දකිමින් පිරිනිවනු කැමැත්තෝ වෙති යන අර්ථයයි.

මෙසේ දෙවැදෑරුම් වූ සාසන පට්ඨානය නොයෙක් නොයෙක් සූත්‍රපදයන් ගෙනහැරපාමින් බෙදා දක්වා දැන් සංකිලෙසභාගිය ආදිය සමග සසඳ දක්වන්නට නැවතත් **ලොකියං සුතනං** යනාදිය සමග අරඹන ලදී.

එහි **දසසනභාගියෙන භාවනා භාගියෙන ච** යනු නිබ්බධභාගිය ක්‍රමයෙනි. නිබ්බේධභාගිය ක්‍රමය ම දස්සනභාගිය හා භාවනා භාගිය

වශයෙන් දෙකඩ කොට දක්වන ලදී. **ලොකියඤ්ච ලොකුත්තරඤ්ච** යනු ලෞකික හා ලෝකෝත්තර සූත්‍රයයි. සංකිලෙසභාගිය හා දර්ශනභාගිය යන දෙකින් නිර්දේශ කළ යුත්තය යන අදහසයි. **යසමිං සුත්තෙ** යනාදිය නිර්දේශ කරන ආකාරය දැක්වීමකි. එහි **සංකිලෙසභාගියං** යනු කෙලෙස් කොටස් සහිත යනුයි. සංකිලේශ අර්ථය දක්වන යන අර්ථයයි. සෙසු ඒවායේද මේ ක්‍රමය මැයි.

මෙසේ සංකිලෙසභාගිය ආදිය ආදි පද සතරකින් ලෞකිකත්වයෙහි සැසඳීම ඉදිරිපත්කොට මේ ක්‍රමයෙන් සෙසු තිකවල ද (තුනේ කොටස්වල) සෙසු පදවල ද සැසඳීම මනාව දතයුතුයැයි එය නො උපදුටා සංකිලේසභාගිය ආදී ක්‍රමයන්ගේ ඉක්මවායෑම දක්වන්නට **වාසනාභාගිය සුත්තං** යනාදිය කියන ලදී.

එහිදී සංකිලෙසභාගිය සූත්‍රයත් වාසනාභාගීය සූත්‍රයත් ලෞකිකම වුවත් ලෝකෝත්තර සූත්‍ර මෙන් ලෞකික සූත්‍ර අතුරෙන් වාසනාභාගීය සූත්‍රය සංකිලෙස භාගිය සූත්‍රය ඉක්මවායෑම සඳහා පවතින්නේය යන මේ අර්ථය දක්වන්නට **වාසනාභාගීය සුත්තං සංකිලෙසභාගියස්ස සුත්තස්ස නිග්ඝාතාය** යයි කියන ලදී. එහි **නිග්ඝාතාය** යනු ප්‍රහාණය පිණිස යනුයි. මෙහිදී සූත්‍ර ශීර්ෂයෙන් සූත්‍රාර්ථය ගන්නා ලදැයි දතයුතුය. යම්හෙයකින් පිරිසිදු ධර්මයන් මෙන් අපිරිසිදු ධර්මයන්ගේ දර්ශන භූමිය ඉක්මවා යෑමෙන්ම භාවනාභූමිය අවබෝධ කරගත යුතුද එහෙයින් **භාවනාභාගියං සුත්තං දස්සන භාගියස්ස සුත්තස්ස පටිනිස්සග්ගාය** යි කියන ලදී. යම්හෙයකින් අශෛක්ෂ ධර්ම ඇතිවූ කල්හි මාර්ගභාවනා කෘත්‍යයක් නැත්තේ ද ධ්‍යානභාවනාව ද මෙලොව සැප විහරණ පිණිස ම වේ ද එහෙයින් **අසෙකඛභාගියං සුත්තං භාවනාභාගියස්ස සුත්තස්ස පටිනිස්සග්ගාය අසෙකඛභාගියං සුත්තං දිට්ඨ ධම්මසුඛවිහාරත්ථං** යි කියන ලදී.

දැන් තික පදයන් සමග සසඳ දක්වන්නට **ලොකුත්තරං** යනාදිය කියන ලදී. **එකබීජිනා** යනාදියෙහි යමෙක් සෝවාන් වී එකම ආත්ම භාවයක් උපදවා අර්හත්වයට පැමිණේ ද මේ **ඒකබීජි** නම් වේ. එය මෙසේ කියන ලදී. 'ඒකබීජි පුද්ගලයා යනු කවරේ ද? මෙලොව ඇතැම් පුද්ගලයෙක් සංයෝජන තුනක් ක්‍ෂය කිරීමෙන් සෝවාන් වේ ද නොවැටෙන ස්වභාව ඇත්තේ ද නියත වූයේ සම්බෝධිය පිහිටකොට ඇත්තේ වේ ද

හෙතෙම එකම මිනිස් භවයක් උපදවා දුක කෙළවර කෙරෙයි. මේ ඒකබීජී පුද්ගලයා යැයි කියනු ලැබේ' යනුවෙනි. යමෙක් දෙතුන් කුලයක දුව හැසිර දුක කෙළවර කෙරේ ද ඒ **කෝලංකෝල** නම් වේ. එය මෙසේ කියන ලදී. 'කෝලංකෝල පුද්ගලයා යනු කවරේ ද? මෙලොව ඇතැම් පුද්ගලයෙක් තුන් -පෙ- පිහිටකොට ඇත්තේ වේ ද හෙතෙම දෙතුන් කුලයක දුව හැසිර දුක කෙළවර කෙරෙයි. මේ කෝලංකෝල පුද්ගලයා යැයි කියනු ලැබේ' යනුවෙනි. එහි කුලානි යනු භවයෙහිය. මෙහිදී දෙකතුනක් යන මෙය දේශනා මාත්‍රයක් ම ය. භයවැනි භවය දක්වා හැසිරෙන්නා ද කෝලංකෝල පුද්ගලයා වේ ම ය. යමෙක් භව සතක හැසිරී දුක කෙළවර කෙරෙයි. මේ **සත්තකඛත්තුපරම** නම් වේ. එය මෙසේ කියන ලදී. සත්තකඛත්තුපරම පුද්ගලයා යනු කවරේ ද? මෙලොව ඇතැම් පුද්ගලයෙක් තුන් -පෙ- පිහිටකොට ඇත්තේ වේ ද? හෙතෙම සත්වරක් දෙවියන් අතර ද මිනිසුන් අතර ද දුව හැසිර දුක කෙළවර කෙරෙයි. මේ පුද්ගලයා සත්තක්ඛත්තු පරම පුද්ගලයා යැයි කියනු ලැබේ. ඔවුන්ගේ මේ ප්‍රභේද කවරෙක් සකස් කෙරේ ද? කිසිවෙක් පළමුව පූර්ව හේතුව සකස් කෙරේ යයි කියත්. කිසිවෙක් පළමු මාර්ගය යැයි කියත්. කිසිවෙක් මත්තෙහි මාර්ග තුන යැයි කියත්. කිසිවෙක් මාර්ග තුන අතුරෙන් විදර්ශනාව යැයි කියත්. එහි පූර්ව හේතුව සකස් කෙරෙයි යන වාදයෙහි පළමු මාර්ගයේ ආශ්‍රය ඇතිකරන ලද්දේ නම් වෙයි. මත්තෙහි මාර්ග තුන ආශ්‍රය රහිතව උන්නේ යැයි (අදහසකට) පැමිණෙයි. පළමු මාර්ගය සකස් කෙරේයයි යන වාදයෙහි මත්තෙහි මාර්ග තුනක නිරර්ථකත්වයට පැමිණෙයි. මත්තෙහි මාර්ග තුන සකස් කෙරෙයි යන වාදයෙහි පළමු මාර්ගය නූපන් කල්හි ම මත්තෙහි මාර්ග තුනක් උපන්නේ යැයි (අදහසකට) පැමිණෙයි. පළමු මාර්ගය සකස් කෙරේයයි යන වාදයෙහි මත්තෙහි මාර්ග තුනක නිරර්ථකත්වයට පැමිණෙයි. මත්තෙහි මාර්ග තුන සකස් කෙරෙයි යන වාදයෙහි පළමු මාර්ගය නූපන් කල්හි ම මත්තෙහි මාර්ග තුනක් උපන්නේයැයි (අදහසකට) පැමිණේ. විදර්ශනාව සකස් කෙරෙයි යන වාදය සුදුසු වේ. ඉදින් මත්තෙහි ත්‍රිවිධ මාර්ග අතුරෙන් විදර්ශනාව බලවත් වේ ද (ඔහු) ඒකබීජී නම් වෙයි. එයින් අඩුවූයේ කෝලංකෝල නම් වේ. එයින් අඩුවූයේ සත්තක්ඛත්තුපරම නම් වේ. මෙහිද යමෙක් මිනිසුන් අතර ම සත්වරක් හැසිර රහත්බවට පැමිණෙයි ද යමෙක් දෙවියන් අතර ම සත්වරක් හැසිර රහත්බවට පැමිණෙයි ද ඔවුහු මෙහිදී අදහස් නොකරන ලදී. යමෙක් කලක් දෙවියන් අතර ද කලක් මිනිසුන් අතර ද මිශ්‍ර ක්‍රමයෙන් හැසිර රහත්බවට පැමිණෙයි.

ඔහු **මෙතනදී** අදහස් කරන ලදී. එහෙයින් **සත්තක්ඛත්තුපරම** පුද්ගලයා **මෙලොව** එකට විසීම් සංඛ්‍යාත සංසාර අභිප්‍රාය ලෙසින් දතයුතුය. **සංසාර** අභිප්‍රාය මුල පටන් සදෙව්ලොව පිරිසිදුකොට අකණිට්ඨ බඹලොව සිට පිරිනිවෙන්නේය. එහි යමෙක් සද්ධාව මුල්කොට සෝවාන් මග උපදවයි. ඔහු මාර්ග ක්ෂණයේදී **සද්ධානුසාරී** නම් වෙයි. එල ක්ෂණයෙහිදී සද්ධාවිමුත්තයා නම් වී කියන ලද ක්‍රමයෙන් ඒකබීජී ආදී භේද ඇත්තේ වෙයි. යමෙක් ප්‍රඥාව මුල්කොට සෝවාන් මග නිපදවයි ද හෙතෙම මාර්ග ක්ෂණයෙහි **ධම්මානුසාරී** නම් වෙයි. එල ක්ෂණයෙහිදී දිට්ඨිප්පත්තයා නම් වී ඒකබීජී ආදී භේද ඇත්තේ වෙයි. මෙයද අෂ්ට විමෝක්ෂයන් නොලබන්නන්ගේ වශයෙන් කියන ලදී. ලබන්නා වනාහි එල ක්ෂණයෙහි කායසක්ඛි නම් වෙයි. එහි යමෙක් සද්ධාවිමුත්ත, දිට්ඨිප්පත්ත, කායසක්ඛි නම් වූ සෝවාන් පුද්ගලයන් තිදෙනා ය. ඔවුහු ඒකබීජී ආදි තුනේ ම සංග්‍රහකොට කියන ලදී.

පඤ්චහි පුගලෙහි නිද්දිසිතබ්බ එකබීජිනා -පෙ- ධම්මානුසාරිනා යනු මෙසේ පස්දෙනා සමගය යනුයි. **දඃදසහි පුගලෙහි** යනු සකෘදාගාමී මාර්ගස්ථයා, සකෘදාගාමී පුද්ගලයා අනාගාමී මාර්ගස්ථයා අභේදයෙන් අනාගාමී පුද්ගලයා, අන්තරා පරිනිබ්බායි පුද්ගලයා ආදී පස්දෙනා ද සද්ධාවිමුත්ත, දිට්ඨිප්පත්ත, කාය සක්ඛි ආදී තිදෙනා ද භේද වශයෙන් වූ අටදෙන ද යන මේ ආකාරයෙන් දොළොස් දෙනාගෙනි. එහි යමෙක් අවිහ ආදි බ්‍රහ්ම ලෝකවල ඒ ඒ තැන ආයු මධ්‍යයට නොපැමිණ පිරිනිවෙයි. මේ **අනන්තරා පරිනිබ්බායි** නම් වේ. යමෙක් ආයු මධ්‍යය ඉක්මවා රහත් බවට පැමිණේ ද මේ **උභයවච පරිනිබ්බායී** නම් වේ. එසේම අවිහාදියෙහි උපන්නේ සංස්කාර රහිතව ප්‍රයෝග රහිතව රහත් බව පැමිණේ ද මේ **අසංඛාර පරිනිබ්බායී** නම් වේ. යමෙක් සංස්කාර සහිතව ප්‍රයෝග සහිතව රහත් බවට පැමිණේ ද මේ **සසංඛාර පරිනිබ්බායි** නම් වේ. උඩ මතුමත්තෙහි වූ බඹලොව මොනුගේ උපත ගලායන්නේය යන අර්ථයෙන් **උද්ධංසොත** නම් වේ. ප්‍රතිසන්ධි වශයෙන් අකණිට්ඨ බඹලොවට යේ නුයි **අකණිට්ඨගාමී** නම් වේ. එහි අකණිට්ඨගාමී උද්ධංසෝතයෙක් ඇත. අකණිට්ඨගාමී නොවන උද්ධංසෝතයෙක් ඇත. උද්ධංසෝත නොවන අකණිට්ඨගාමීයෙක් ඇත. උද්ධංසෝත නොවන අකණිට්ඨගාමී නොවන පුද්ගලයෙක් ඇත. එහිදී යමෙක් මෙලොව අනාගාමී ඵලයට පැමිණ අවිහාදියෙහි උපන්නේ එහි ආයු ඇතිතාක් සිට මතුමත්තෙහි ඉපදී අකණිට්ඨ බඹලොවට පැමිණෙයි ද මේ අකණිට්ඨගාමී

උද්ධංසොත පුද්ගලයා නම් වෙයි. යමෙක් අවිහාදි බ්‍රහ්මලෝකවල ඉපිද එහි ම පිරිනිවන් නොපා අකණිටා බඹලොවට ද නොපැමිණ මතුමත්තෙහි වූ බඹලොවක පිරිනිවේ ද මේ අකණිට්ඨගාමී නොවන උද්ධංසොත පුද්ගලයා නම් වෙයි. යමෙක් මෙයින් චුතව අකණිටා බඹලොව ම උපදී ද මේ උද්ධංසෝත නොවන අකණිට්ඨගාමී පුද්ගලයා නම් වේ. යමෙක් වනාහි අවිහාදි බ්‍රහ්මලෝක සතරින් එකක ඉපදී එහි ම පිරිනිවේ ද මේ උද්ධංසෝත නොවන අකණිට්ඨගාමී නොවන පුද්ගලයා නම් වේ. සද්ධාවිමුත්ත ආදී පුද්ගලයින් (පෙර) කියන ලද විභාග ඇත්තේ ම ය.

නවහි පුගලෙහි යන මෙහි අෂ්ට විමෝක්ෂ නොලබන රහතන් වහන්සේ පඤ්ඤාවිමුතත නම් වේ. ඔවුන් අතුරෙන් (අෂ්ටවිමෝක්ෂ) ලබන්නා වික්ඛම්භන හා සමුච්ඡේද ලෙස මිදීම් වශයෙන් උභය කොටසින් ද රූප කාය නාම කාය සංඛ්‍යාත උභය කොටසින් ද මිදුණු හෙයින් උභතොභාග විමුත්ත නම් වේ. **සමසීසිනා** යන මෙහි සමසීසි පුද්ගලයා ත්‍රිවිධය. ඉරියාපථ සමසීසි රෝගසමසීසි ජීවිතසමසීසි යනුවෙනි. එහි යමෙක් සිටීම් ආදී සිවු ඉරියවු අතුරෙන් යම් ඉරියව්වකින් යුක්ත වී විදර්ශනාව අරඹා ද ඒ ඉරියව්වෙන් ම රහත් බවට පැමිණ පිරිනිවේ ද මේ පුද්ගලයා ඉරියාපථ සමසීසි නම් වේ. යමෙක් එක් රෝගයකට පත්ව රෝගය තුළම විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණ ඒ රෝගයෙන් ම පිරිනිවේ ද මේ පුද්ගලයා රෝගසමසීසි නම් වේ. පලිබෝධ ශීර්ෂය තෘෂ්ණාව, බන්ධන ශීර්ෂය වූ මානය, පරාමාස ශීර්ෂය වූ දෘෂ්ටිය, වික්ෂේප ශීර්ෂය වූ උද්ධච්චය, ක්ලේශ ශීර්ෂය වූ අවිද්‍යාව, අධිමෝක්ෂ ශීර්ෂය වූ ශ්‍රද්ධාව, පග්ගහ ශීර්ෂය වූ වීර්යය, උපට්ඨාන ශීර්ෂය වූ සතිය, අවිකෙඛප ශීර්ෂය වූ සමාධිය, දර්ශන ශීර්ෂය වූ ප්‍රඥාව ප්‍රවෘත්ති ශීර්ෂය වූ ජීවිතින්ද්‍රිය, ගෝචර ශීර්ෂය වූ විමෝක්ෂය සංඛාර ශීර්ෂය වූ නිරෝධය යන ශීර්ෂ දහතුන අතුරෙන් ක්ලේශ ශීර්ෂය වූ අවිද්‍යාව අර්හත් මාර්ගය මැඩපවත්වයි. ප්‍රවෘත්ති ශීර්ෂය ජීවිතින්ද්‍රිය වූ චුතිසිත මැඩපවත්වයි. එහි අවිද්‍යාව මැඩපවත්වන සිත ජීවිතින්ද්‍රිය මැඩ පවත්වන්නට නොහැකි වෙයි. ජීවිතින්ද්‍රිය මැඩ පවත්වන සිත අවිද්‍යාව මැඩපවත්වන්නට නොහැකි වෙයි. අවිද්‍යාව මැඩපවත්වන සිත අනෙකකි. ජීවිතින්ද්‍රිය මැඩපවත්වන සිත අනෙකකි. යමෙකුගේ මේ ශීර්ෂද්වය සමව මැඩපවැත්මට යේ ද හෙතෙම ජීවිත සමසීසි නම් වේ. මේ සම බව කෙසේ වේ ද චාර සමත්වයෙනි. යම් වරෙක මාර්ගයෙන් නැගී සිටීම වේ ද සෝවාන් මගෙහි ප්‍රත්‍යවේක්ෂණ පසකි. සකෘදාගාමී මාර්ගයෙහි (ප්‍රත්‍යවේක්ෂණ) පසකි. අනාගාමී මගෙහි

පසකි. අර්හත් මගෙහි සතරකි යන එකුන්විසි ප්‍රත්‍යවේක්ෂණ ඥානයෙහි පිහිටා භවංගයට බැස පිරිනිවෙන්නාගේ මේ වාර සමත්වයෙන් මේ උභයශීර්ෂ මැඩලීම ම සමව වෙයි. එහෙයින් මේ පුද්ගලයා ජීවිත සමසීසි යැයි කියනු ලැබේ. මෙහිදී මෙයම අදහස් කරන ලදී. මෙසේ සුඤ්ඤත විමුත්තාදී තිදෙනා, සද්ධා විමුත්තයා, පඤ්ඤා විමුත්තයා, උභතොභාග විමුත්තයා සමසීසි යන ශ්‍රාවකයෝ සත්දෙනා රහත්හු ය. පසේබුදු සම්මා සම්බුදු යන මේ මේ පුද්ගලයන් නවදෙනා සමග අසේඛභාගිය සූත්‍රය දැක්විය යුතුය.

රාගචරිතෝ රාග සහිත චරිතයක් මොහුට ඇත්තේ නුයි රාගචරිත නම් වේ. රාගයෙන් හැසිරෙන ලද පවතින ලද පුද්ගලයා රාග චරිත නම් වේ. රාග අදහස් ඇති අධික රාගය ඇති යන අර්ථයයි. සෙසු පදවල ද මේ ක්‍රමයමැයි. **රාගමූබෙ ඨිතො** යනු රාගය නැගී සිටීමෙහි යෙදී සිටි යනුයි. නැගී සිටි රාග ඇති යන අර්ථයයි. සෙසු පදවලදී ද මේ ක්‍රමය මැයි.

වාසනාභාගියං සුතනං යනු ලෞකික වූ සත්ත්වයන් විසින් අදිටන් කළ වාසනා භාගීය සූත්‍රයක් යනුයි. ලෞකික වූ සත්ත්වයන් විසින් අදිටන් කළ සංකිලෙස භාගිය සූත්‍රය රාග චරිත ඇති පුද්ගලයන්ට නිර්දේශ කරන ලද්දකි. එහිදී **වාසනාභාගියං** යන පදය ලොකියං සත්තාධිට්ඨානං යන පද දෙක අනුව පවතින්නක් කොට කියන ලදී. **සීලවනෙතහි** යනු සිල්වත් ආදී පුද්ගලයන් විසිනි. **පකති සීලං** යනාදිය ඒ පුද්ගලයෝ යම්දෙයකින් යුක්ත වූවාහුද ඒ පුද්ගලයන්ගේ දැකීමෙන් සලකුණු කළ යනුයි. එසේ නැතහොත් ධම්මාධිට්ඨානය ප්‍රකෘති ශීලාදි වශයෙන් ද සත්තාධිට්ඨානය ප්‍රකෘති ශීලය ඇති පුද්ගලයන් වශයෙන් ද දතයුතුය යන මේ න්‍යාය දක්වනු පිණිස සිල්වතුන් විසින් දැක්විය යුතුයැයි කියා පකතිසීලං යනාදිය කියන ලදී. එය ප්‍රකෘතිශීල ආදී පස් කරුණක ම ගැනීම් නිදසුනක් පමණි. මෙහිදී ප්‍රාප්තදාන, අනුමෝදනා, ධර්ම ශ්‍රවණ, ධර්ම දේශනා, දිට්ඨිජුකර්මාදිය ද ලැබෙන බැවිනි. ඒවා ද මෙහිම සංග්‍රහකොට දක්වනු පිණිස පංච යනාදිය කියන ලදී.

එහි **පකතිසීලං** යනු (තමා) පත්වූ විරති ශීලයයි. **චිත්තපපසාදෝ** යනු කර්මඵල විශ්වාසය හා තුණුරුවන් පිළිබඳ විශ්වාසයයි. **ඤාණං පඤ්ඤාය නිදස්සිතබබං** යනු යම් සූත්‍රයක ප්‍රඥාව ආයේ ද ඒ සූත්‍රය ඥානය යැයි දැක්විය යුතුය යනුයි. හුදෙක් ප්‍රඥා අංශයෙන් ම නොවේ.

එනම් ප්‍රඥා ඉන්ද්‍රිය ආදි ක්‍රමයෙනුත් යම් තැනක ප්‍රඥාව ආයේ ද ඒ සූත්‍රය ඥානය යැයි දැක්විය යුතුයයි දක්වන්නට **පඤ්ඤින්ද්‍රියෙන** යනාදිය කියන ලදී. එහි අර්ථය යට කියන ලද්දේ ම ය. **යං වා පන** යනාදියෙහි ප්‍රඥාවට අධිවචන වූ යම්කිසි අන් පදයක් වේ නම් ඒ සියල්ල යම්කිසි සූත්‍රයක ආයේ ද ඒ සූත්‍රය ඥාණයැයි නිර්දේශ කළ යුතුය **යන අර්ථයයි.** අජ්ඣත්තිකෙහි බාහිරෙහි යනු යම් සූත්‍රයක ආධ්‍යාත්මික ආයතන ද බාහිර ආයතන ද ආයේ ද ඒ සූත්‍රය ඒ ආයතන කරණකොටගෙන ඥාණය ඇති කෙරේ යයි දතයුතුය යන්න නිර්දේශ කළයුතුය. අරමුණු වූ ප්‍රඥාව ද දතයුතු යයි ඥෙයයෙන් වෙන්කොට ප්‍රඥාව ප්‍රකාශ කරන ලදී. එසේම ප්‍රඥාව ඥානයෙන් අන්‍ය වූ දෙයකට අරමුණු වේ යයි කිසි සූත්‍රයක ඥෙය ස්වභාවයෙන් ද කියනු ලැබේ.

යං කිඤ්චි ආරම්මණ භූතං යනු ඥානයට විෂය වූ රූපාදි යම් කිසිවකි. **අජ්ඣත්තිකං බාහිරං වා** යන තැන වා ශබ්දයෙන් ඕළාරිකාදිය ගණන් ගනු ලැබේ. **සබ්බං තං සංඛතෙන අසංඛතෙන ච** යනු ඒ සියල්ල ලැබෙන පරිදි සංඛත ලෙසින් ද අසංඛත ලෙසින් ද දතයුතුයයි දැක්විය යුතුය යනුයි. දතයුතු ධර්ම වශයෙන් ම ඥෙය්‍ය සූත්‍රය ඥෙය්‍ය යැයි කියනු ලැබේ. **යං වා පන කිඤ්චි භගවා අඤ්ඤතරං වචනං භාසති** යනු ලෞකික ලෝකෝත්තරාදි සූත්‍ර අතුරෙන් එක් සූත්‍රයක දෙකක් ද ඒවායින් යම් වෙනත් වචනයක් වේද එය එකකින්ම ප්‍රකාශ කිරීම කියයි. දක්වයි. **සබ්බනතං යථා නිද්දිට්ඨං ධාරයිතබ්බං** යනු යම්සේ සියලු සූත්‍ර ලෞකිකාදියෙහි ද (තනිව) අන්‍යතර වශයෙන් හෝ නැතහොත් දෙකක් ලෙසින් යම් යම් ආකාරයකින් දක්වන ලද ද ඒ ඒ ආකාරයෙන් ගතයුතුය. ඒ ඒ සූත්‍රය පට්ඨාන භාවයෙන් දැක්විය යුතුය යන අර්ථයයි. කෙලෙස් සහිත වූ ම කර්මය විපාකයට හේතු වේ. අනෙක නොවේ. **දුව්ධෝ හෙතු යඤ්ච කම්මං යෙව කිලෙසායි** කියන ලදී. **සමුදයෝ කිලෙසා** යන මෙහි සමුදය යන මෙයින් සමුදය පක්‍ෂයට අයත් දේ ගැන කියන ලදී. කිලෙසා යනු කෙලෙස් ඇත්තා ද කිලිටි වූ යන අර්ථයයි. **යං දිසසති** යනු යමක් යමක් දකී ද එයයි. **තාසු තාසු භූමීසු** පෘථග්ජන භූමි ආදියෙහි ය. **කපසියානුලොමෙන** යනු කැප දෙයින් ද කැප දෙයට ගැළපෙන දෙයින් ද යනුයි. එහි කැප දෙය පාලියෙහි ස්වරූප වශයෙන් දක්වන ලදී. **පටිකඛිතන කාරණෙන** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් යම් හේතුවකින් යමක් ප්‍රතික්‍ෂෙප කරන ලද ද ඒ හේතුවෙන් එය නිර්දේශ කළ යුතුය යනුයි. රාග සහිතව පවතින දේ ම ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින්

ප්‍රතික්ෂේප කරන ලදී. එය රාගය පිණිස පවතින හේතු ආදියෙන් දැක්විය යුතුය. ධම්මසඤ්ඤ යනු අසංඛත ධර්මයට ය. අරිය ධම්මානං යනු මාර්ගඵල ධර්මයන්ට ය. සෙස්ස මනාව දතහැකි ම ය.

මෙහිදී ද යම්සේ සංකිලෙසභාගිය ආදී සූත්‍රවල අන්‍යෝන්‍ය එකතුවෙන් නන්වැදෑරුම් පටිඨානභේදය කැමතිවන ලද්දේ ද මෙසේ ලොකිය සත්තාධිට්ඨාන ආදී එකතුවෙන් ද නන්වැදෑරුම් පටිඨානභේදය ඇතිවේ. පෙළෙහි වනාහි දෙතැන ම ඒකදේශයක් දැක්වීම් වශයෙන් ආබැවින් නය දැක්වීමයැයි දතයුතුය. මේ ක්‍රමය කරණ කොටගෙන නුවණැත්තා විසින් ඒවා වෙන් කරන්නට හැකිය. යම්සේ සංකිලෙස භාගිය ආදී සූත්‍රයන්ගේ ද ලෝකිය ආදී සූත්‍රයන්ගේ ද වෙන් වෙන් වූ එකතුවීමේ ප්‍රභේද වශයෙන් මේ පටිඨාන භේදය නන්වැදෑරුම් වේ ද මෙසේ දෙකෙහි ම එකතුවීම් වශයෙන් මේ න්‍යාය සුදුසු පරිදි ලබා ම ය. ලෝකිය සූත්‍රය කිසි තැනක සංකිලෙස භාගිය ද කිසිතැනක වාසනා භාගිය ද වේ ම ය. එසේම ලෝකුත්තර සූත්‍රය කිසිතැනක නිබ්බේධභාගිය ද කිසිවිටෙක අසෙක්ඛභාගිය ද වේ. සෙසු ඒවායේ ද මේ ක්‍රමය මැයි.

මෙසේ විසිඅටවැදෑරුම් පටිඨානය සොළොස් වැදෑරුම් පටිඨානයෙහි ඇතුළත්කොට සොළොස් වැදෑරුම් පටිඨානය විසිඅට වැදෑරුම් පටිඨානයෙහි ඇතුළත්කොට සුදුසු පරිදි දුක නික ආදී භේදයෙන් ලැබෙන පටිඨාන විභාගය දතයුතුය. යම්හෙයකින් ඒ ඒ සූත්‍රපදයන් උදාහරණ ලෙස වෙන්කොට දක්වා මේ අර්ථයෙහිලා විස්තර කරනු ලබන කල්හි නෙත්ති සංවර්ණනාව ඉතා විශාල ද ඉතා බර ද වන්නේ ය. නුවණැත්තා විසින් මේ ක්‍රමයෙන් මේ අර්ථය දැනගන්නට හැකිවේ. එහෙයින් එය විස්තර නොකරමු. එහෙයින් ම පෙළෙහි අන්‍යෝන්‍ය සංසර්ග වශයෙන් පටිඨාන විභාගය එක් දෙසකින් ම දක්වන ලදී. වෙන ම නොවේ.

සාසන පටිඨාන වාර වර්ණනාව නිමි.

මෙපමණකින් ද,

හාරයන් ද නය්‍යයන් ද පට්ඨානයන් ද මනා වූ විනිශ්චයකින් බෙදා දක්වමින් නවංගයේ අර්ථ සංවර්ණනාව වූ

ගැඹුරු වූ සියුම් වූ යම් නෙත්තිප්පකරණයක් නුවණැති වූ අර්හත් වූ මහාකච්චායන මහතෙරුන් වහන්සේ දේශනා කළ සේක් ද

සද්ධර්මයට බැසගැනීමට ස්ථානයක් වූ නාග නම් පටුනෙහි වූ ධර්මාශෝක මහාරාජ විහාරයෙහි **වාසය කරන** මා විසින්

එම නෙත්තිප්පකරණයේ **චිරස්ථිතිය සඳහා** යම් අර්ථ වර්ණනාවක් (කරන ලද ද) ඒ අර්ථ වර්ණනා තොමෝ සර්වප්‍රකාරයෙන් උදාහරණ සූත්‍රයන්ගේ ද ලක්ෂණයන්ගේ ද

අර්ථය ප්‍රකාශ කරන්නී නිරවුල් විනිශ්චය ඇති පෙළින් යුතුව සත්විසි බණවරකින් සමාප්ත විය.


මෙසේ ඒ අර්ථ සංවර්ණනාව සකස් කරන මා විසින් යම් ඒ පිනක් ලබන ලද ද ඒ පුණ්‍යානුභාවයෙන් ලෝකනාථයන් වහන්සේගේ ශාසනයට බැසගෙන පිරිසිදු වූ ශීලාදී ප්‍රතිපත්තියෙන් සියලු සත්ත්වයෝ විමුක්ති රසයට හිමිකරුවෝ වෙත්වා!

සම්මා සම්බුද්ධ ශාසනය ලෝකයෙහි බොහෝ කාලයක් පවතීවා. සියලු සත්ත්වයෝ නිරන්තරයෙන් ඒ ශාසනය කෙරෙහි ගෞරව සහිත වෙත්වා!

වැස්ස ද සුදුසු කාලයෙහි මනාව වසීවා. සදහම්හි නිරත වූ රජතෙමේ ධර්මයෙන් ම ලොවට අනුශාසනා කෙරේවා.

බදරතීර්ථවාසී ආචාර්ය ධම්මපාල තෙරුන් විසින් කරන ලද නෙත්තිප්පකරණයෙහි අර්ථ සංවර්ණනාව සමාප්ත විය.

භදන්තාචාර්ය ධම්මපාල තෙරුන්ගේ නෙත්තිප්පකරණ අටුවාවට රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති මැදගම්පිටියේ විජිතධම්ම ස්ථවිරයන් විසින් ලියන ලද සිංහල සන්නය ද නිමාවිය.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝෝෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාළියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-38-7